පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා **http://pitaka.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# සංයුත්ත නිකාය

# 6

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඥාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මාභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඥාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුඩාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

# සංයුත්ත නිකාය

## 6

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1955
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**සංයුත්ත නිකාය 6**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මග පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 මැයි

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ දහහතරවෙනිවූ මේ පොතට සංයුත්ත නිකායේ සළායතන වර්ගයේ ඉතුරු කොටස් සහ මහාවර්ගයේ බොජ්ඣංග සංයුත්තයේ අවසානය දක්වා අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. පළමුවෙනි සඞ්ගායනාවේදී සංයුත්ත නිකාය භාරකරන ලද්දේ මහා කාශ්‍යප ශ්‍රාවක තෙරුන්වහන්සේට වේ. මේ නිකාය සගාථ වර්ගය, නිදාන වර්ගය, ඛන්ධක වර්ගය, සළායතන වර්ගය, මහා වර්ගයයි කොටස් පහකට බෙදා තිබේ. එහි ඇති සංයුත්ත පනස් හතරෙහි සූත්‍ර 7762 ක් වෙත්.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඩ්රත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඩ්රත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙනේ ආචාර්ය මණ්ඩලයද, පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

9 - 4 - 55

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - 'අකුරු' අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිගාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | පිට |
|---|---|
| **4. සළායතන වර්ගය** | |
| 2. මාතුගාම සංයුත්තය | 2349 |
| (1) පළමුවැනි වර්ගය | 2349 |
| (2) දෙවැනි වර්ගය | 2356 |
| (3) බල වර්ගය | 2360 |
| 3. ජම්බුඛාදක සංයුත්තය | 2366 |
| 4. සාමණ්ඩක සංයුත්තය | 2379 |
| 5. මොග්ගල්ලාන සංයුත්තය | 2380 |
| 6. චිත්ත සංයුත්තය | 2403 |
| 7. ගාමණී සංයුත්තය | 2432 |
| 8. අසංඛත සංයුත්තය | 2502 |
| 9. අව්‍යාකත සංයුත්තය | 2518 |
| **5. මහා වර්ගය** | |
| 1. මාර්ග සංයුත්තය | 2568 |
| (1) අවිජ්ජා වර්ගය | 2568 |
| (2) විහාර වර්ගය | 2583 |
| (3) මිච්ඡත්ත වර්ගය | 2593 |
| (4) පටිපත්ති වර්ගය | 2599 |
| (5) අඤ්ඤතිත්ථිය පෙය්‍යාල වර්ගය | 2605 |
| (6) සූරිය පෙය්‍යාල වර්ගය | 2611 |
| (7) ඒකධම්ම පෙය්‍යාල වර්ගය | 2621 |
| (8) ඒකධම්ම පෙය්‍යාල 2 වර්ගය | 2630 |
| (9) ගංගා පෙය්‍යාල වර්ගය (1) | 2640 |
| (10) අප්පමාද වර්ගය (1) | 2646 |
| (11) බල කරණීය වර්ගය (1) | 2652 |
| (12) ඒසනා වර්ගය (1) | 2662 |
| (13) ඕඝ වර්ගය (1) | 2670 |
| 2. බොජ්ඣංග සංයුත්තය | 2680 |
| (1) පබ්බත වර්ගය | 2680 |


මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.        http://pitaka.lk

| | |
|---|---|
| (2) ගිලාන වර්ගය | 2704 |
| (3) උදායි වර්ගය | 2715 |
| (4) නීවරණ වර්ගය | 2730 |
| (5) චක්කවත්ති වර්ගය | 2743 |
| (6) සාකච්ඡා වර්ගය | 2750 |
| (7) ආණාපාණ වර්ගය | 2785 |
| (8) නිරෝධ වර්ගය | 2793 |
| (9) ගංගා පෙයයාල 2 වර්ගය | 2797 |
| (10) අප්පමාද 2 වර්ගය | 2798 |
| (11) බල කරණිය 2 වර්ගය | 2798 |
| (12) එසනා 2 වර්ගය | 2798 |
| (13) ඔඝ 2 වර්ගය | 2798 |
| (14) පුනගඞගා පෙයයාල 3 වර්ගය | 2798 |
| (15) පුන අප්පමාද 3 වර්ගය | 2798 |
| (16) පුන බල කරණිය 3 වර්ගය | 2799 |
| (17) පුන එසනා 3 වර්ගය | 2799 |
| (18) පුන ඔඝ 3 වර්ගය | 2799 |

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංයුත්ත නිකාය

## 4. සළායතන වර්ගය.

## 2. මාතුගාම සංයුත්තය.

### පළමුවෙනි වර්ගය.

#### 1. මනාපා'මනාප සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ස්ත්‍රිය පුරුෂයාට ඒකාන්තයෙන් අමනාපවේ. කවර කරුණු පසකින්දයත්, රූමත් නොවේද? ධනවත් නොවේද? සිල්වත් නොවේද? අලස වෙයිද? දරුවන් නොලබයිද? මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ ස්ත්‍රිය පුරුෂයාට ඒකාන්තයෙන් අමනාප වේ.

3. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ස්ත්‍රිය පුරුෂයාට ඒකාන්තයෙන් මනාප වේ. කවර පසකින්ද යත් රූමත් වේද, ධනවත් වේද, සිල්වත් වේද, අලස නොවූයේ දක්ෂ වේද, දරුවන් ලබයිද, මහණෙනි, මේ අඞ්ග පසින් යුක්තවූ ස්ත්‍රිය පුරුෂයාට ඒකාන්තයෙන් මනාප වේ.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 2. මනාපා'මනාප සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ පුරුෂයා ස්ත්‍රියට ඒකාන්තයෙන් අමනාප වේ. කවර පසකින්දයත්, රූමත් නොවේද, ධනවත් නොවේද, දුස්සීලද, අලසද, දරුවන් නොලබාද, මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ පුරුෂතෙම ස්ත්‍රියට ඒකාන්තයෙන් අමනාප වේ.

3. "මහණෙනි කරුණු පසකින් යුක්තවූ පුරුෂතෙම ස්ත්‍රියට ඒකාන්තයෙන් මනාප වේ. කවර පසකින්ද යත්, රූමත් වේද, ධනවත් වේද, සිල්වත් වේද, අලස නොවූයේ දක්ෂවේද, දරුවන් ලබාද, මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ පුරුෂතෙම ස්ත්‍රියට ඒකාන්තයෙන් මනාප වේ.

---

## 3. ආවේණික සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දෙශනා කරනලදී.)

2. "මහණෙනි, පුරුෂයන් හැර ස්ත්‍රියටම සාධාරණවූ ස්ත්‍රියම විඳින්නාවූ මේ දුක් පසක් වෙයි. කවර පසක්ද යත්, මහණෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රිය ළාබාල කාලයෙහිම ස්වාමිකුලයට යයි. නෑයින්ගෙන් වෙන් වෙයි. මහණෙනි, පුරුෂයන් හැර ස්ත්‍රියටම සාධාරණවූ මේ පළමුවැනි දුක ස්ත්‍රිය විඳියි.

3. "තවද මහණෙනි, ස්ත්‍රිය ඍතුනියක් වෙයි. මහණෙනි, මේ ස්ත්‍රියටම සාධාරණවූ දෙවෙනි දුක පුරුෂයන් හැර ස්ත්‍රියම විඳියි. තවද, මහණෙනි, ස්ත්‍රිය ගර්භනී වෙයි. මහණෙනි, මේ ස්ත්‍රියටම සාධාරණවූ තුන් වැනි දුක පුරුෂයන් හැර ස්ත්‍රියම විඳියි. තවද මහණෙනි, ස්ත්‍රිය දරුවන් වදයි. මහණෙනි, මේ ස්ත්‍රියටම සාධාරණවූ සතරවැනි දුක පුරුෂයන් හැර ස්ත්‍රියම විඳියි. තවද මහණෙනි, ස්ත්‍රිය පුරුෂයාට උපස්ථාන කරන්නියක් බවට

පැමිණෙයි. මහණෙනි, මේ ස්ත්‍රියටම සාධාරණවූ පස්වැනි දුක පුරුෂයන් හැර ස්ත්‍රියම අනුභව කරයි."

---

## 4. අනුරුද්ධ සූත්‍රය. (1)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි, කරුණු තුනකින් යුක්තවූ ස්ත්‍රිය බොහෝ සෙයින් කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව වැටෙන නිරයෙහි උපදියි. කවර තුනකින්ද යත්, මහණෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රිය පෙරවරු කාලයෙහි මසුරු මළින් යුත් සිතින් ගෙයි වාසයකරයිද මැදි දවල් කාලයෙහි ඊර්ෂ්‍යාවෙන් යුත් සිතින් ගෙයි වාසය කරයිද, සවස් කාලයෙහි කාම රාගයෙන් යුත් සිතින් ගෙයි වාසය කරයිද, මේ අඞ්ග තුනින් යුක්තවූ ස්ත්‍රිය බොහෝ සෙයින් කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොර, දුර්ගතිවූ විසමව පතිතවන නිරයේ උපදී".

---

## 5. අනුරුද්ධ සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසල අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

2. "ස්වාමීනි, මම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිවැ'සින් මේ ලෝකයෙහි ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොර නපුරු ගති ඇති, විසමව වැටෙන නරකයෙහි උපදින ස්ත්‍රියක් දකිමි.

3. "ස්වාමීනි, කෙතෙක් ධර්මයන්ගෙන් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදින්නේද"?

4. "අනුරුද්ධය, කරුණු පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදී. කවර පසකින්ද යත්, ශ්‍රද්ධාව නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද, ක්‍රොධ කරන්නියක් වේද, නුවණ නැත්තියක් වේද, අනුරුද්ධය මේ ධර්ම පසින් යුක්තවූ නපුරු ගති ඇති ස්ත්‍රිය කය බිඳීමෙන් මරණින් මතු සැප නැති, විසමව වැටෙන නිරයේ උපදී."

---

## 6. කෝධන සූත්‍රය.

1. (මෙතැන් සිට මේ වර්ගයේ සූත්‍ර සියල්ලම පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදී. කවර පසකින්දයත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද, ක්‍රොධ කරන්නියක් වේද, නුවණ නැත්තියක් වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්ත ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොර නපුරු ගති ඇති විසමව පතිතවන නරකයෙහි උපදී."

---

## 7. උපනාහී සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නරකයෙහි උපදී. කවර කරුණු පසකින්දයත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද, බද්ධවෛර ඇත්තියක් වේද, නුවණ නැත්තියක් වේද, මහණෙනි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදී."

---

## 8. ඉස්සුකී සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදී. කවර පසකින්ද යත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද, ඊර්ෂ්‍යා ඇත්තියක් වේද, නුවණ නැත්තියක් වේද, මහණෙනි, මේ ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි."

---

## 9. මච්ඡෙර සූත්‍රය

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි. කවර කරුණු පසකින්ද යත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද, මසුරු වේද, නුවණ නැත්තියක් වේද, මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි."

---

## 10. අතිචාරී සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි. කවර කරුණු පසකින්ද යත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද, ස්වාමියා ඉක්මවා හැසිරෙන්නියක් වේද, නුවණැත්තියක් වේද, මහණෙනි,

මේ කරුණු පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි."

---

## 11. දුස්සීල සූත්‍රය.

**2.** "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි. කවර කරුණු පසකින්ද යත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද දුස්සීල වේද, නුවණ නැත්තියක් වේද මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි."

---

## 12. අප්පස්සුත සූත්‍රය.

**2.** "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි. කවර කරුණු පසකින්ද යත් ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක් වේද, බොහෝ ඇසූ පිරූ තැන් නැත්තියක් වේද, නුවණ නැත්තියක් වේද, මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි."

---

## 13. කුසීත සූත්‍රය.

**2.** "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි. කවර කරුණු පසකින්දයත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක්වේද, කුසීතවේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නුවණ නැත්තියක්වේද, මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි.”

---

## 14. මුට්ඨස්සති සූත්‍රය.

2. “මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි. කවර කරුණු පසකින්දයත්, ශ්‍රද්ධා නැත්තියක් වේද, ලජ්ජා නැත්තියක් වේද, භය නැත්තියක්වේද, සිහි මුළාවූ නැත්තියක් වේද, නුවණ නැත්තියක් වේද, මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව පතිතවන නිරයෙහි උපදියි.”

---

## 15. පඤ්චවේර සූත්‍රය

2. “මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ නපුරු ගති ඇති විසමව වැටෙන නිරයෙහි උපදී. කවර කරුණු පසකින්ද යත්, සතුන් මරන්නියක් වේද, නුදුන් දෙය ගන්නියක් වේද, කාමයන්හි වරදවා හැසිරෙන්නියක් වේද, බොරු කියන්නියක් වේද, මදයට හා ප්‍රමාදයට හේතුවූ රහමෙර පානය කරන්නියක් වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොර නපුරු ගති ඇති විසමව වැටෙන නිරයෙහි උපදී.”

(පළමුවෙනි වර්ගය නිමි.)

---

# 2. වර්ගය.

## 1. අනුරුද්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙකහුන් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, මම මිනිස් ඇස් ඉක්ම පවතින දිවැසින් මේ ලෝකයෙහි ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින ස්ත්‍රිය දකිමි. ස්වාමීනි, කවර ධර්මයන්ගෙන් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි උපදීදැයි" ඇසූයේය.

2. "අනුරුද්ධය, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්දයත්, ශ්‍රද්ධා ඇත්තියක්වේද, ලජ්ජා ඇත්තියක්වේද, භය ඇත්තියක්වේද, ක්‍රොධ නොකරන්නියක් වේද, නුවණ ඇත්තියක් වේද, අනුරුද්ධය, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

## 2. අක්කෝධන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්දයත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක්වේද, භය ඇත්තියක්වේද, ක්‍රොධ නොකරන්නියක් වේද, නුවණ ඇත්තියක් වේද, මහණෙනි, මේ ධර්පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

## 3. අනුපානාහී සූත්‍රය.

1. (මෙතැන් සිට මේ වර්ගයේ සියලු සූත්‍ර මෙහි දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක් වේද, භය ඇත්තියක් වේද, බද්ධ වෛර නැත්තියක්වේද, නුවණ ඇත්තියක්වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

## 4. අනුස්සුකී සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක් වේද, භය ඇත්තියක් වේද, ඊර්ෂ්‍යා නැත්තියක් වේද, නුවණ ඇත්තියක්වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 5. අමච්ඡරී සූත්‍රය.

**2.** "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක් වේද, භය ඇත්තියක් වේද, මසුරු මළ නැත්තියක් වේද, නුවණ ඇත්තියක්වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

## 6. අනතිචාරී සූත්‍රය

**2.** "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදී. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක් වේද, භය ඇත්තියක් වේද, ස්වාමියා ඉක්ම නොපවතීද, නුවණ ඇත්තියක් වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

## 7. සීලවා සූත්‍රය

**2.** "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක්වේද, භය ඇත්තියක්වේද සිල්වත්වේද, නුවණ ඇත්තියක්වේද මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 8. බහුස්සුත සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක්වේද, භය ඇත්තියක්වේද, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තියක් වේද, නුවණ ඇත්තියක් වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

## 9. විරිය සූත්‍රය

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක් වේද, ලජ්ජා ඇත්තියක් වේද, භය ඇත්තියක් වේද, පටන්ගත් වීර්ය ඇත්තියක් වේද, නුවණ ඇත්තියක් වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදී."

---

## 10. සති සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියි. කවර ධර්ම පසකින්ද යත්, ශ්‍රද්ධා ඇත්තියක්වේද, ලජ්ජා ඇත්තියක් වේද, භය ඇත්තියක් වේද, එළඹ සිටි සිහි ඇත්තියක් වේද, නුවණ ඇත්තියක් වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලෝකයෙහි උපදීයයි" වදාළසේක.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 11. පඤ්චසීල සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදී. කවර ධර්ම පසකින්ද යත්, සතුන් මැරීමෙන් වැළකුනී වේද, නුදුන් දේ ගැනීමෙන් වැළකුනී වෙයිද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනී වෙයිද, බොරු කීමෙන් වැළකුනී වෙයිද, මදයට හා ප්‍රමාදයට හේතුවූ රහමෙර බීමෙන් වැළකුනී වෙයිද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදීයයි" වදාළසේක.

(දෙවෙනි වර්ගය නිමි.)

---

# 3. බල වර්ගය

## 1. සුද්ධ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ස්ත්‍රියගේ මේ බල පසකි. කවර පසක්ද යත්? රූපබලය, ධනබලය, ඤාතිබලය, පුත්‍රබලය සීලබලය, යන මොහුයි. මහණෙනි, මේ ස්ත්‍රියගේ බල පස වෙත්."

---

## 2. විසාරද සූත්‍රය (1)

(මේ වර්ගයේ සූත්‍ර සියල්ලම පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ස්ත්‍රියගේ මේ බල පසකි. කවර බල පසක්දයත්? රූපබලය, ධනබලය, ඥාතිබලය, පුත්‍රබලය සීලබලය යන පසයි. මහණෙනි, මොවුහු ස්ත්‍රියගේ බල පස වෙත්. මහණෙනි, මේ බල පසින් යුක්තවූ ස්ත්‍රිය නිර්භයව ගෙයි වාසය කරයි".

---

### 3. පසය්හ සූත්‍රය

"මහණෙනි, ස්ත්‍රියගේ මේ බල පසකි. කවර පසක්ද යත්, රූපබලය, ධනබලය, ඥාතිබලය, පුත්‍රබලය, සීලබලය යන මොහුයි. මහණෙනි, මේ ස්ත්‍රියගේ බලපස වෙති. මේ බලපසින් යුක්ත ස්ත්‍රිය ස්වාමියා මැඩපවත්වා ගෙයි වාසය කරයි."

---

### 4. අභිභූය්‍ය සූත්‍රය

"මහණෙනි, ස්ත්‍රියගේ මේ බලපසකි. රූපබලය, ධනබලය, ඥාතිබලය, පුත්‍රබලය, සීලබලය, යන මොහුයි මහණෙනි, මේ ස්ත්‍රියගේ බලපස වෙති. මහණෙනි, මේ බල පසින් යුක්ත ස්ත්‍රිය ස්වාමියා මැඩපවත්වා වසයි. මහණෙනි, මේ එක්බලයකින් යුක්ත පුරුෂතෙම ස්ත්‍රිය මැඩපවත්වා වසයි. කවර එකකින්ද, 'අධිපතිභාවයෙනි' අධිපති භාවයෙන් බලයෙන් මඩනාලද ස්ත්‍රිය රැකීමට රූපබලය සමත් නොවේ, ධනබලය සමත්නොවේ. ඥාතිබලය සමත් නොවේ, පුත්‍රබලය සමත් නොවේ. සීලබලය සමත්නොවේ."

---

### 5. අඞ්ග සූත්‍රය

"මහණෙනි, ස්ත්‍රියගේ මේ බලපසක් වෙත්. කවර බල පසක්ද යත්, රූපබලය, ධනබලය, ඥාතිබලය, පුත්‍රබලය, සීලබලය යන පසයි. මහණෙනි, ස්ත්‍රිය රූපබලයෙන් යුක්තවේද, ධනබලයෙන් යුක්තනොවේද, මෙසේ ඕතොමෝ ඒ අඞ්ගයෙන්

අසම්පූර්ණ වෙයි. මහණෙනි, ස්ත්‍රිය යම් හෙයකින් රූපබලයෙන්ද ධනබලයෙන්ද, යුක්තවේද, මෙසේ ඕතොමෝ ඒ අඞ්ගයෙන් සම්පූර්ණවෙයි. මහණෙනි, ස්ත්‍රිය රූපබලයෙන්ද යුක්තවේද, ධනබලයෙන්ද, යුක්තවේද, ඤාතිබලයෙන් යුක්තනොවේද, මෙසේ ඕතොමෝ ඒ අඞ්ගයෙන් අසම්පූර්ණ වෙයි. මහණෙනි, යම් හෙයකින් ස්ත්‍රිය රූපබලයෙන්ද, යුක්තවේද, ධනබලයෙන්ද යුක්තවේද, ඤාති බලයෙන්ද යුක්ත වේද, මෙසේ ඕතොමෝ ඒ අඞ්ගයෙන් සම්පූර්ණවේ. මහණෙනි, ස්ත්‍රිය රූපබලයෙන්ද යුක්තවේද, ධනබලයෙන්ද යුක්ත වේද, ඤාතිබලයෙන්ද යුක්තවේද, පුත්‍ර බලයෙන් යුක්ත නොවේද, මෙසේ ඕතොමෝ ඒ අඞ්ගයෙන් අසම්පූර්ණවෙයි මහණෙනි, යම්හෙයකින් ස්ත්‍රිය රූප බලයෙන්ද, ධනබලයෙන්ද, ඤාතිබලයෙන්ද, පුත්‍රබලයෙන්ද, යුක්තවේද, මෙසේ ඕතොමෝ ඒ අංගයෙන් සම්පූර්ණවෙයි. මහණෙනි, ස්ත්‍රිය රූපබලයෙන්ද, ධනබලයෙන්ද, ඤාති බලයෙන්ද, පුත්‍රබලයෙන්ද, යුක්තවේද, සීලබලයෙන් යුක්ත නොවේද මෙසේ ඕතොමෝ ඒ අඞ්ගයෙන් අසම්පූර්ණ වේ. මහණෙනි, යම්හෙයකින් ස්ත්‍රිය රූපබලයෙන්ද, ධන බලයෙන්ද, ඤාතිබලයෙන්ද, පුත්‍රබලයෙන්ද, සීලබලයෙන්ද, යුක්තවේද, මෙසේ ඕතොමෝ ඒ අඞ්ගයෙන් සම්පූර්ණ වෙයි. මහණෙනි, මොව්හු ස්ත්‍රියගේ බලපස වෙත්.”

---

## 6. නාසයිතබ්බ සූත්‍රය

2. “මහණෙනි, ස්ත්‍රියගේ මේ බල පසෙකි. කවර පසක්ද යත්, රූපබලය, ධනබලය, ඤාතිබලය, පුත්‍රබලය, සීලබලය, යන පසයි. මහණෙනි ස්ත්‍රිය රූපබලයෙන් යුක්තවේද, සීල බලයෙන් යුක්තනොවේද, ඇය නසන්නාහුමය. එළවා දමත්. ගෘහයෙහි වාසය නොකරවත් මහණෙනි, ස්ත්‍රිය රූපබලයෙන්ද ධනබලයෙන්ද යුක්තවේද, සීලබලයෙන් යුක්ත නොවේද, ඇය නසන්නාහුමය. ගෘහයෙහි වාසය නොකරවත්. මහණෙනි, ස්ත්‍රිය රූපබලයෙන්ද, ධනබලයෙන්ද, ඤාති බලයෙන්ද යුක්තවේද සීලබලයෙන් යුක්ත නොවේද, ඇය නසන්නාහුමය. ගෘහයෙහි

වාසය නොකරවත්. මහණෙනි, ස්ත්‍රිය රූපබලයෙන්ද, ධනබලයෙන්ද, ඥාතිබලයෙන්ද, පුත්‍ර බලයෙන්ද, යුක්තවේද, සීලබලයෙන් යුක්ත නොවේද, ඇය නසන්නාහුය. ගෘහයෙහි වාසය නොකරවත්. මහණෙනි, යම්තැනක පටන් ස්ත්‍රිය රූපබලයෙන්ද, ධනබලයෙන්ද, ඥාතිබලයෙන්ද, පුත්‍රබලයෙන්ද, සීලබලයෙන්ද, යුක්තවේද, ඔහු ගෘහයෙහි වාසය කරවත්, නොනසවත්. මහණෙනි, ස්ත්‍රිය සීලබලයෙන් සමන්විත වේද රූපබලයෙන් යුක්ත නොවේද, ඇය කුලයෙහි වාසය කරවත් නොනසත්. මහණෙනි, ස්ත්‍රිය සීලබලයෙන් යුක්තවේද, ධනබලයෙන් යුක්ත නොවේද, ඇය නොනසත්. ගෘහයෙහි වාසය කරවත්.

3. "මහණෙනි, ස්ත්‍රිය සීලබලයෙන් යුක්ත වේද, ඥාති බලයෙන් යුක්ත නොවේද ඇය ගෘහයෙහි වාසය කරවත් නොනසත්. මහණෙනි, ස්ත්‍රිය සීලබලයෙන් යුක්තවේද පුත්‍ර බලයෙන් යුක්ත නොවේද ඇය ගෘහයෙහි වාසය කරවත් නොනසත්. මහණෙනි, මොව්හු ස්ත්‍රියගේ බලපස වෙත්."

---

## 7. හේතු සූත්‍රය

"මහණෙනි, ස්ත්‍රියගේ මේ බලපසකි. ඒ කවර පසක්ද යත් රූපබලය, ධනබලය, ඥාතිබලය, පුත්‍රබලය, සීලබලය යන පසයි. මහණෙනි, රූපබල හේතුවෙන් හෝ ධනබල හේතුවෙන් හෝ ඥාතිබල හේතුවෙන් හෝ පුත්‍රබල හේතුවෙන් හෝ කායයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි නූපදී. මහණෙනි, ස්ත්‍රියගේ සීලබල හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදී. මහණෙනි, මොව්හු වනාහි ස්ත්‍රියගේ බල පස වෙත්."

---

## 8. ඨාන සූත්‍රය

"මහණෙනි, නොකළ පින් ඇති ස්ත්‍රිය විසින් මේ කරුණු පසක් දුකසේ ලැබිය යුත්තාහ. මහණෙනි, කවර පසක්ද යත්

සුදුසු කුලයක උපදින්නෙමියි යන මෙය නොකළ පින් ඇති ස්ත්‍රිය විසින් ලැබීමට දුර්ලභවූ පළමුවෙනි කරුණවෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට යන්නෙමි යන මෙය නොකළ පින් ඇති ස්ත්‍රිය විසින් ලැබීමට දුර්ලභ දෙවෙනි කාරණය වෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සැතිරියක් නැතිව ගෙයි වාසය කරන්නෙමි යන මේ කාරණය නොකළ පින් ඇති ස්ත්‍රිය විසින් ලැබීමට දුර්ලභ තුන්වෙනි කාරණය වෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සැතිරියක් නැතිව ගෙයි වසන්නී පුත්‍රයන් ඇත්තියක් වන්නෙමි යන මෙය නොකළ පින් ඇති ස්ත්‍රිය විසින් ලැබීමට දුර්ලභ සතරවන කාරණය වෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකටගොස් සැතිරියක් නැතිව ගෙයි වසන්නී පුත්‍රයන් ඇත්තියක්ව ස්වාමියා මැඩපවත්වා පවතින්නෙමියි යන මෙය නොකළ පින් ඇත් ස්ත්‍රිය විසින් ලැබීමට දුර්ලභවූ පස්වෙනි කාරණය වෙයි. මහණෙනි, මේ කරුණු පස නොකළ පින් ඇති ස්ත්‍රිය විසින් ලැබීමට දුර්ලභ කරුණු පසවෙත්. මහණෙනි, කරනලද පින් ඇති ස්ත්‍රිය විසින් පහසුවෙන් ලැබිය හැකි මේ කරුණු පසක් වෙත්. කවර පසක්ද යත් මහණෙනි සුදුසු කුලයක උපදින්නෙමි යන මෙය කළ පින් ඇති ස්ත්‍රිය විසින් සුවසේ ලැබිය හැකි පළමුවෙනි කරුණ වෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට යන්නෙමියි යන මෙය කළ පින් ඇති ස්ත්‍රිය විසින් සුවසේ ලැබිය හැකි දෙවෙනි කාරණය වෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සැතිරියක් නැතිව ගෙයි වසන්නෙමියි යන මෙය කළ පින් ඇති ස්ත්‍රිය විසින් සුවසේ ලැබිය හැකි තුන්වෙනි කාරණය වෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සැතිරියක් නැතිව ගෙයි වසන්නී පුත්‍රයන් ඇත්තියක් වන්නෙමියි යන මෙය කළ පින් ඇති ස්ත්‍රිය විසින් සුවසේ ලැබිය හැකි සතරවෙනි කාරණය වෙයි. මහණෙනි, සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සැතිරියක් නැතිව ගෙයි වසන්නී පුත්‍රයන් ඇත්තියක්ව ස්වාමියා මැඩපවත්වා වසන්නෙමියි යන මෙය කළ පින් ඇති ස්ත්‍රිය විසින් සුවසේ

ලැබිය හැකි පස්වෙනි කරුණ වෙයි. මහණෙනි, මේ කළ පින් ඇති ස්ත්‍රිය විසින් සුවසේ ලැබිය හැකි කරුණුපස වෙත්."

---

## 9. විසාරද සූත්‍රය (2)

**2.** "මහණෙනි, කරුණු පසකින් යුක්ත ස්ත්‍රිය නිර්භීතව ගෙයි වාසය කරයි. කවර කරුණු පසකින්ද යත්, සතුන් මැරීමෙන් වැළකුනියක් වේද, නුදුන් දෙය ගැනීමෙන් වැළකුනියක්වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනියක් වේද, බොරු කීමෙන් වැළකුනියක් වේද, රහමෙර පීමෙන් වැළකුනියක් වේද, මහණෙනි, මේ ධර්ම පසින් යුක්තවූ ස්ත්‍රිය ගෘහයෙහි නිර්භීතව වාසය කෙරේයයි" වදාළ සේක.

---

## 10. වඩ්ඪන සූත්‍රය

**2.** "මහණෙනි, මේ කරුණු පසකින් වැඩෙන ආර්ය ශ්‍රාවිකා තොමෝ ආර්ය වැඩීමෙන් වැඩෙයි. ජීවිතයේ සාරය ගන්නියක් වෙයි. උතුම් දෙය ගන්නියක් වෙයි. කවර පසකින්ද යත්, ශ්‍රද්ධාවෙන් වැඩෙයිද, සීලයෙන් වැඩෙයිද, ශ්‍රැතයෙන් (අසා දැනීමෙන්) වැඩෙයිද ත්‍යාගයෙන් වැඩෙයිද, ප්‍රඥාවෙන් වැඩෙයිද, මහණෙනි, මේ වැඩීම් පසින් වැඩෙන්නාවූ ආර්යශ්‍රාවිකා තොමෝ ආර්ය වැඩීමෙන් වැඩෙයි. ශරීරයාගේ සාරය ගන්නියක් වෙයි. උතුම් දෙය ගන්නියක් වෙයි.

"ශ්‍රද්ධාවෙන්ද, සීලයෙන්ද, මේ ලෝකයෙහි වැඩේද, ප්‍රඥාවෙන්ද, ශ්‍රැතයෙන්ද, (අසාදැනීමෙන්) යන දෙකින් වැඩේද, එවැනි සිල්වත් උපාසිකා තොමෝ මෙලොවදීම තමන්ගේ ජීවිතයේ සාරය ගනියි.

**(තුන්වෙනි බල වර්ගය නිමි.)**

---

**(මාතුගාම සංයුත්තය සමාප්තයි.)**

---

# 3. ජම්බුඛාදක සංයුත්තය.

## 1. නිබ්බාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මගධ ජනපදයෙහි නාලක ගම වාසය කෙරෙති. එකල්හි ජම්බුඛාදක පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ජම්බුඛාදක පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය සැළකෙළේය.

"ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, නිර්වාණය නිර්වාණයයි කියනු ලැබේ. ඇවැත්නි, කුමක් නිර්වාණය වේද" යනුයි.

"ඇවැත්නි, රාගය ක්ෂය කිරීමට හේතුවූ යමක් වේද, ද්වේෂය ක්ෂය කිරීමට හේතුවූ යමක් වේද, මොහය ක්ෂය කිරීමට හේතුවූ යමක් වේද, මේ නිර්වාණයයි කියනු ලැබේ.

2. "ඇවැත්නි, මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීමට මාර්ගයක් ඇත්තේද? ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේය."

"ඇවැත්නි, මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නාවූ මාර්ගය කුමක්ද? ප්‍රතිපදාව කවරීද?"

"ඇවැත්නි, මේ අඞ්ග අටකින් යුත් ආර්යමාර්ගයම නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වන්නේය. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුය, ඇවැත්නි, මේ මාර්ගය මේ ප්‍රතිපදාව නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නේය.

"ඇවැත්නි, මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීමට යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත් ශාරීපුත්‍රය අප්‍රමාදයට සුදුසුය."

---

## 2. අරහත්ත සූත්‍රය

1. (මේ වර්ගයේ සූත්‍ර සියල්ල පළමුවෙනි සූත්‍රය මෙන් මගධ ජනපදයෙහි නාලක ගමෙහිදී දේශනා කරනලදී.)

"ඇවැත් ශාරිපුත්‍රය, රහත් බව රහත් බවයයි කියනු ලැබේ ඇවැත්නි, රහත් බව නම් කවරේද?"

"ඇවැත්නි, යම් රාගය ක්ෂය කිරීමක් වේද, ද්වේෂය ක්ෂය කිරීමක් වේද, මොහය ක්ෂය කිරීමක් වේද, මේ රහත් බවයයි කියනු ලැබේ."

"ඇවැත්නි, මේ රහත් බව ප්‍රත්‍යක්ෂ කිරීමට මාර්ගයක් ඇත්තේද? ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි මේ රහත් බව ප්‍රත්‍යක්ෂ කිරීමට මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේය."

"ඇවැත්නි මේ රහත් බව ප්‍රත්‍යක්ෂ කිරීමට ඇති මාර්ගය කුමක්ද? ප්‍රතිපදාව කවරීද?"

"ඇවැත්නි, මේ රහත් බව ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මේ අංග අටක් ඇති ආර්ය මාර්ගය වෙයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. ඇවැත්නි, මේ රහත් බව ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මේ මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි." "ඇවැත්නි, රහත් බව ප්‍රත්‍යක්ෂකිරීම පිණිස මෙය යහපත් මාර්ගයයි. යහපත් ප්‍රතිපදාවකි.

"ඇවැත් ශාරිපුත්‍රය, මෙය අප්‍රමාදය පිණිස සුදුසු ද වේ."

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 3. ධම්මවාදී සූත්‍රය.

"ඇවැත් ශාරිපුත්‍රය, ලෝකයෙහි ධර්මවාදීහු කවරහුද? ලෝකයෙහි මනාකොට පිළිපදින්නෝ කවරහුද? ලෝකයෙහි කවරෙක් යහපත් මාර්ගයෙහි ගියාහුද?"

"ඇවැත්නි, යම්කිසි කෙනෙක් රාගය ප්‍රහීණ කිරීම පිණිස ධර්මය දෙශනා කරත්ද, ද්වේෂය ප්‍රහීණ කිරීම පිණිස ධර්මය දෙශනා කරත්ද, මොහය ප්‍රහීණ කිරීම පිණිස ධර්මය දෙශනා කරත්ද, ඔව්හු ලෝකයෙහි ධර්මවාදීහුය. ඇවැත්නි, යම්කිසි කෙනෙක් රාගය ප්‍රහීණ කිරීම පිණිස පිළිපදින්නාහුද ද්වේෂය ප්‍රහීණ කිරීම පිණිස පිළිපදින්නාහුද, මොහය ප්‍රහීණ කිරීම පිණිස පිළිපදින්නාහුද, ඔව්හු ලොකයෙහි නොකොට පිළිපදින්නෝය. ඇවැත්නි, යම්කිසි කෙනෙකුන් විසින් රාගය ප්‍රහීණ කරණ ලද ද, සිඳින ලද මුල් ඇත්තේ වේද, කරටිය සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේද, අභාවයට යවන ලද්දේද, මතු නූපදින ස්වභාවයට පමුණුවන ලද්දේද, ද්වේෂය ප්‍රහීණ කරණ ලද්දේද, සිඳිනලද මුල් ඇත්තේද? මුදුන සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දේද, අභාවයට යවන ලද්දේද, මතු නූපදින තත්ත්වයට පමුණුවන ලද්දේද, මොහය ප්‍රහීණ කරණ ලද්දේද සිඳිනලද මුල් ඇත්තේ වේද? කරටිය සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේද, අභාවයට යවන ලද්දේද, මතු නූපදින ස්වභාවයට පමුණුවන ලද්දේද, ඔව්හු ලෝකයෙහි යහපත් මාර්ගයේ ගමන් කළෝ වෙත්.

"ඇවැත්නි, මේ ලෝභයාගේ රාගයාගේ ද්වේෂයාගේ මොහයාගේ ප්‍රහාණයට මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?

"ඇවැත්නි, මේ රාගයාගේ ද්වෙෂයාගේ මොහයාගේ ප්‍රහාණයට මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේය.

"ඇවැත්නි, ලෝභයාගේ ද්වෙෂයාගේ මොහයාගේ ප්‍රහාණයට මාර්ගය කවරේද? ප්‍රතිපදාව කවරේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, මේ රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වෙයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුය. ඇවැත්නි, මේ රාගයාගේ, ද්වේෂයාගේ, මෝහයාගේ ප්‍රහාණය පිණිස මේ මාර්ගය වෙයි. ප්‍රතිපදාව වෙයි.

"ඇවැත්නි, රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ ප්‍රහාණයට මේ යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත් ශාරිපුත්‍රය, අප්‍රමාදයට සුදුසුද වේ."

---

## 4. දුක්ඛ සූත්‍රය.

"ඇවැත් ශාරිපුත්‍රය, කුමක් පිණිස ශ්‍රමණ භවත් ගෞතමයන් සමීපයෙහි බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නේද?"

"ඇවැත්නි, දුක පිරිසිඳ දැනීම සඳහා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නෙමි."

"ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මාර්ගයක් ඇද්ද? ප්‍රතිපදාවක් ඇද්ද?"

"ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මාර්ගයක් ඇත, ප්‍රතිපදාවක් ඇත."

"ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස කවර ප්‍රතිපදාවක් කවර මාර්ගයක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මේ අඞ්ග අටකින් යුත් ආර්ය මාර්ගය වෙයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේය. ඇවැත්නි, මේ මාර්ගය මේ ප්‍රතිපදාව මේ දුක පිරිසිඳ දැනීම පිණිස වේ."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිසවූ මාර්ගය යහපත්ය. ප්‍රතිපදාවද යහපත්ය. ඇවැත් ශාරිපුත්‍රය, අප්‍රමාදයට සුදුසුද වෙයි."

---

## 5. අස්සාස සූත්‍රය

"ඇවැත් ශාරිපුත්‍රය, සැනසීමට පත්වූයේය. සැනසීමට පත්වූයේයයි කියනු ලැබේ. ඇවැත් ශාරිපුත්‍රය, කොපමණකින් සැනසීමට පත්වූයේ වේද?"

"ඇවැත්නි යම් තැනක පටන් ස්පර්ශායතන සදෙනාගේ පහළවීමද, දුරුවීමද, ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දනීද, එපමණකින් ඇවැත්නි, සැනසීමට පත්වූයේයයි කියනු ලැබේ.

"ඇවැත්නි, මේ සැනසීම ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මාර්ගයක් ඇද්ද, ප්‍රතිපදාවක් ඇද්ද?"

"ඇවැත්නි, මේ සැනසීම ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මාර්ගයක් ඇත ප්‍රතිපදාවක් ඇත."

"ඇවැත්නි, මේ සැනසීම ප්‍රත්‍යක්ෂකර ගැනීමට කවර මාර්ගයක් කවර ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, ඒ සැනසීම ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මේ අඞ්ග අටක් ඇති ආර්යමාර්ගයම වේ. ඒ කවරේද? සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මෙය සැනසීම ප්‍රත්‍යක්ෂ කිරීමට මාර්ගයයි මේ ප්‍රතිපදාවයි.

"ඇවැත්නි, මේ සැනසීම ප්‍රත්‍යක්ෂ කිරීමට මේ යහපත් මාර්ගයක්ය, මේ යහපත් ප්‍රතිපදාවක්ය, ඇවැත් ශාරිපුත්‍රය, අප්‍රමාදයට සුදුසුද වේ.

---

## 6. පරමස්සාස සූත්‍රය.

"ඇවැත්නි ශාරිපුත්‍රය, අතිශයින් සැනසීමට පත්වූයේය. අතිශයින් සැනසීමට පත්වූයේයයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් අතිශයින් සැනසීමට පැමිණියේ වේද?"

"ඇවැත්නි, භික්ෂුව යම් තැනක පටන් ස්පර්ශායතන, සයදෙනාගේ පහළවීමද දුරුවීමද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන උපාදානයන්ගෙන් මිදුනේ වේද ඇවැත්නි, එපමණකින් අතිශයින් සැනසීමට පැමිණියේයයි කියනු ලැබේ.

"ඇවැත්නි, මේ අතිශයින් සැනසීමට පැමිණීමට මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ පරම සැනසීම ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මාර්ගයක් ඇත. ප්‍රතිපදාවක් ඇත."

"මේ අතිශයින් සැනසීම ප්‍රත්‍යක්ෂකර ගැනීමට මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"මේ පරම සැනසීම ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයම වෙයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේය. මේ අතිශයින් සැනසීම ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මාර්ගය වෙයි, ප්‍රතිපදාව වෙයි."

"ඇවැත්නි, මේ අතිශයින් සැනසීම ප්‍රත්‍යක්ෂකර ගැනීමට යහපත් මාර්ගයකි, යහපත් ප්‍රතිපදාවකි. ඇවැත් ශාරිපුත්‍රය, අප්‍රමාදයට සුදුසුද වේ.

---

## 7. වේදනා සූත්‍රය.

"ඇවැත් ශාරිපුත්‍රය, වේදනාව වේදනාවයයි කියනු ලැබේ. ඇවැත්නි, වේදනාව කවරේද?"

"ඇවැත්නි, මේ වේදනා තුනෙකි. සැප වේදනාය, දුක් වේදනාය, උපෙක්ෂා වේදනාය යන මොහුය. ඇවැත්නි, මේ වේදනා තුනයි.

"ඇවැත්නි, මේ වේදනා පිරිසිඳ දැනීම පිණිස මාර්ගයක් ඇත්තේද? ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ වේදනා පිරිසිඳ දැනීම පිණිස මාර්ගයක් ඇත, ප්‍රතිපදාවක් ඇත."

"මේ වේදනා පිරිසිඳ දැනීම පිණිස මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි මේ වේදනාවන්ගේ පිරිසිඳ දැනීමට සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය වෙයි ඇවැත්නි, මේ වේදනාවන්ගේ පිරිසිඳ දැනීමට මේ මාර්ගයයි මේ ප්‍රතිපදාවයි."

"ඇවැත්නි, මේ වේදනාවන්ගේ පිරිසිඳ දැනීමට යහපත් මාර්ගයකි, යහපත් ප්‍රතිපදාවකි. ඇවැත්නි, ශාරිපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුයි."

---

## 8. ආසව සූත්‍රය.

"ඇවැත්නි, ශාරිපුත්‍රය, ආශ්‍රවය ආශ්‍රවයයි කියනු ලැබේ ඇවැත්නි, ආශ්‍රවය කවරේද?"

"ඇවැත්නි, කාමාශ්‍රවය, භවාශ්‍රවය, අවිද්‍යාශ්‍රවයයි මේ ආශ්‍රවයෝ තිදෙනෙකි. ඇවැත්නි, මොවුහු වනාහි ආශ්‍රවයෝයි.

"ඇවැත්නි, මේ ආශ්‍රවයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇද්ද, ප්‍රතිපදාවක් ඇද්ද?"

"ඇවැත්නි, මේ ආශ්‍රවයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත, ප්‍රතිපදාවක් ඇත."

"ඇවැත්නි, මේ ආශ්‍රවයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි, සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය මේ ආශ්‍රවයන්ගේ ප්‍රහාණය පිණිස වේ. ඇවැත්නි, මේ ආශ්‍රවයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි."

"ඇවැත්නි, මේ ආශ්‍රවයන්ගේ ප්‍රහාණයට යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත්නි, ශාරීපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

---

## 9. අවිජ්ජා සූත්‍රය.

"ඇවැත් ශාරීපුත්‍රය, අවිද්‍යාව අවිද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව කවරීද, ඇවැත්නි, යම් දුකෙහි නොදැනීමක් වේද, දුකට හේතුවෙහි යම් නොදැනීමක් වේද? දුක් නැතිකිරීමෙහි යම් නොදැනීමක් ඇද්ද, දුක් නැති කරන මාර්ගයෙහි යම් නොදැනීමක් වේද, ඇවැත්නි, මේ අවිද්‍යාවයි."

"ඇවැත්නි, මේ අවිද්‍යාවගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ අවිද්‍යාවගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත. ප්‍රතිපදාවක් ඇත."

"අවැත්නි, මේ අවිද්‍යාවගේ ප්‍රහාණය පිණිස ඇති මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි, මේ අවිද්‍යාවගේ ප්‍රහාණය පිණිස යම් මේ සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන ආර්යඅෂ්ටාඞ්ක මාර්ගය වෙයි. මේ අවිද්‍යාවගේ ප්‍රහාණය පිණිස මේ මාර්ගයයි. මේ ප්‍රතිපදාවයි."

"ඇවැත්නි, මේ අවිද්‍යාවගේ ප්‍රහාණයට යහපත් මාර්ගයකි, යහපත් ප්‍රතිපදාවකි, ඇවැත් ශාරීපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

---

## 10. තණ්හා සූත්‍රය.

"ඇවැත්නි ශාරිපුත්‍රය, තණ්හාව තණ්හාවයයි කියනු ලැබේ. ඇවැත්නි, තණ්හාව කවරේද?"

"ඇවැත්නි, මේ තෘෂ්ණා තුනකි. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යන තුනයි. ඇවැත්නි, මේ ත්‍රිවිධ තෘෂ්ණාවෝය.

"ඇවැත්නි, මේ තෘෂ්ණාවන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇද්ද, ප්‍රතිපදාවක් ඇද්ද?

"මේ තෘෂ්ණාවන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත්තේය, ප්‍රතිපදාවක් ඇත්තේය."

"මේ තෘෂ්ණාවන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගය කවරේද ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය මේ තෘෂ්ණාවන්ගේ ප්‍රහාණය පිණිස වේ. ඇවැත්නි, තෘෂ්ණාවන්ගේ ප්‍රහාණය පිණිස මේ මාර්ගය වෙයි. ප්‍රතිපදාව වෙයි."

"ඇවැත්නි, මේ තෘෂ්ණාවන්ගේ ප්‍රහාණය පිණිස යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත්නි, ශාරිපුත්‍රය අප්‍රමාදයටද සුදුසුය."

---

## 11. ඕඝ සූත්‍රය.

"ඇවැත්නි, ශාරිපුත්‍රය, ඕඝය (සැඩපහර) ඕඝයයි කියනු ලැබේ. ඇවැත්නි ඕඝය කවරේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, කාමඕඝ, භවඕඝ දිට්ඨිඕඝ, අවිජ්ජාඕඝ යන මේ ඕඝ සතරකි. ඇවැත්නි, මොවුහු සතර ඕඝයෝය."

"ඇවැත්නි, මේ ඕඝයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ ඕඝයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත්තේය ප්‍රතිපදාවක් ඇත්තේය."

"ඇවැත්නි, මේ ඕඝයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගය කවරේද? ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි, සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයම මේ ඕඝයන්ගේ ප්‍රහාණය පිණිස වෙයි. ඇවැත්නි, මේ ඕඝයන්ගේ ප්‍රහාණය පිණිස මේ මාර්ගය වෙයි ප්‍රතිපදාව වෙයි. ඇවැත්නි, "මේ ඕඝයන්ගේ ප්‍රහාණය පිණිස යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත්නි, ශාරිපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

---

## 12. උපාදාන සූත්‍රය.

"ඇවැත්නි ශාරිපුත්‍රය, උපාදානය උපාදානයයි කියනු ලැබේ. ඇවැත්නි, උපාදානය කවරේද?"

"ඇවැත්නි, උපාදාන සතර දෙනෙකි. කාමූපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතඋපාදානය, අත්තවාදූපාදානය කියායි. ඇවැත්නි, මේ සතර උපාදනයෝයි"

"ඇවැත්නි, මේ උපාදානයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ උපාදානයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේය."

"ඇවැත්නි, මේ උපාදානයන්ගේ ප්‍රහාණය පිණිස මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය මේ උපාදානයන්ගේ ප්‍රහාණය පිණිස වේ. ඇවැත්නි, මේ උපාදානයන්ගේ ප්‍රහාණය පිණිස මේ මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි."

"ඇවැත්නි, උපාදානයන්ගේ ප්‍රහාණය පිණිස මේ මාර්ගය යහපත්ය. ප්‍රතිපදාව යහපත්ය. ඇවැත්නි, ශාරීපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

## 13. භව සූත්‍රය.

"ඇවැත්නි, ශාරීපුත්‍රය, භවය භවයයි කියනු ලැබේ. ඇවැත්නි, භවය කවරේද?"

"ඇවැත්නි, මේ භව තුනකි. කාම භවය, රූප භවය, අරූප භවය යන තුනයි. ඇවැත්නි, මේ තුන් භවයෝයි."

"ඇවැත්නි, මේ භවයන් පිරිසිඳ දැනීම පිණිස මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ භවයන්ගේ පිරිසිඳ දැනගැනීමට මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේය." "මේ භවයන්ගේ පිරිසිඳ දැනීම පිණිස මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද,"

"මේ භවයන්ගේ පිරිසිඳ දැනීමට සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය වෙයි. ප්‍රතිපදාව වෙයි. ඇවැත්නි, මේ භවයන් පිරිසිඳ දැනීම පිණිස මේ මාර්ගය වෙයි. ප්‍රතිපදාව වෙයි." "ඇවැත්නි, මේ භවයන්ගේ පිරිසිඳ දැනීම පිණිස යහපත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මාර්ගයක්ය, හොඳ ප්‍රතිපදාවක්ය. ඇවැත්නි ශාරිපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

---

## 14. දුක්ඛ සූත්‍රය.

"ඇවැත්නි ශාරිපුත්‍රය, දුක දුකයයි කියනු ලැබේ. ඇවැත්නි, දුක කවරේද?"

"ඇවැත්නි, දුක්ඛ දුකය, සඞ්ඛාර දුකය, විපරිණාම දුකයයි දුක් ස්වභාවයෝ තුනකි. ඇවැත්නි, මේ දුක් ස්වභාවයෝ තුන වෙති."

"ඇවැත්නි මේ දුක් ස්වභාවයන්ගේ පිරිසිඳ දැනීම පිණිස මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?"

"මේ දුක් පිරිසිඳ දැනගැනීමට මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේය."

"ඇවැත්නි, මේ දුක් පිරිසිඳ දැනීම පිණිස මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය මේ දුක් ස්වභාවයන්ගේ පිරිසිඳ දැනීම පිණිස වේ."

"ඇවැත්නි, මේ දුක් ස්වභාවයන්ගේ පිරිසිඳ දැනීම පිණිස යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත් ශාරිපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

---

## 15. සක්කාය සූත්‍රය.

"ඇවැත්නි, ශාරිපුත්‍රය, සක්කාය සක්කාය යයි කියනු ලැබේ. ඇවැත්නි, සක්කාය කවරේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් රූපඋපාදාන ස්කන්ධය, වේදනා උපාදාන ස්කන්ධය, සඤ්ඤා උපාදාන ස්කන්ධය, සංඛාර උපාදාන ස්කන්ධය, විඤ්ඤාණ උපාදාන ස්කන්ධය යන මේ පඤ්ච උපාදාන ස්කන්ධයෝ සක්කායයයි වදාරණ ලදී. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ උපාදාන ස්කන්ධයෝ පස්දෙන සක්කායයයි වදාරණ ලදී."

"ඇවැත්නි, මේ සක්කායයන් පිරිසිඳ දැනගැනීමට මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?"

"ඇවැත්නි, මේ සක්කාය පිරිසිඳ දැනගැනීමට මාර්ගයක් ඇත. ප්‍රතිපදාවක් ඇත."

"ඇවැත්නි, මේ සක්කායයාගේ පිරිසිඳ දැනීම පිණිස මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි, මේ සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය මේ සක්කායයාගේ පිරිසිඳ දැනීම පිණිසවේ. ඇවැත්නි, මේ සක්කායයයාගේ පිරිසිඳ දැනීම පිණිස මේ මාර්ගය වෙයි. ප්‍රතිපදාවවෙයි."

"ඇවැත්නි, මේ සක්කායයාගේ පිරිසිඳදැනීම පිණිස යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත් ශාරිපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

---

## 16. දුක්කර සූත්‍රය.

"ඇවැත් ශාරිපුත්‍රය, මේ ධර්ම විනය සංඛ්‍යාත ශාසනයෙහි කුමක් දුෂ්කරද? "ඇවැත්නි, පැවිදිවීම මේ ධර්ම විනයෙහි දුෂ්කරය."

"ඇවැත්නි, පැවිද්දාට කුමක් දුෂ්කරද?"

"ඇවැත්නි, පැවිද්දාට සස්නෙහි ඇලීම දුෂ්කරය."

"සස්නෙහි ඇලුනහුට කුමක් දුෂ්කරද?"

"ශාසනයෙහි ඇලුනහුට ධර්මානුධර්ම ප්‍රතිපත්තිය දුෂ්කරය."

"ඇවැත්නි, ධර්මානුධර්ම ප්‍රතිපන්න භික්ෂුව කොපමණ කාලයකින් රහත් වන්නේද?"

"ඇවැත්නි, නොබෝ කලකින්යයි" වදාළසේක.

**(ජම්බුඛාදක සංයුත්තය නිමි.)**

---

# 4. සාමණ්ඩක සංයුත්තය.

## 1. නිබ්බාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වැදෑරට උක්කචේලා නම් ගඞ්ගා නදී තීරයෙහි වැඩසිටිනසේක. එකල්හි වනාහි සාමණ්ඩක පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් භාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ සාමණ්ඩක පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය සැළකළේය. "ඇවැත්නි, ශාරීපුත්‍රය, නිර්වාණය නිර්වාණයයි කියනු ලැබේ. ඇවැත්නි, නිර්වාණය කුමක්ද?"

"ඇවැත්නි, යමක් රාගය ක්ෂය කිරීමට හේතුවේද, ද්වේෂ ක්ෂය කිරීමට හේතු වේද, මොහය ක්ෂය කිරීමට හේතු වේද, මේ නිර්වාණයයයි කියනු ලැබේ."

"ඇවැත්නි, මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීමට මාර්ගයක් ඇත්තේද? ප්‍රතිපදාවක් ඇත්තේද?" ඇවැත්නි, මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීමට මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේය."

"ඇවැත්නි, ඒ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීමට මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද?"

"ඇවැත්නි මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය වෙයි. ඇවැත්නි, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මේ මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි."

"මේ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස යහපත් මාර්ගයකි. යහපත් ප්‍රතිපදාවකි. ඇවැත්නි, ශාරිපුත්‍රය, අප්‍රමාදයටද සුදුසුය."

---

2 - 16 වැනි සූත්‍ර

(ජම්බුඛාදක සංයුත්තයේ 2 - 16 සූත්‍ර මෙනි.)

---

(සාමණ්ඩක සංයුත්තය නිමි.)

---

## 5. මොග්ගල්ලාන සංයුත්තය.

### 1. සවිතක්ක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු මහසිටාණන්ගේ ජේතවන නම් ආරාමයෙහි වාසය කරයි. එකල්හි වනාහි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම 'ඇවැත්නි, මහණෙනි'යි කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නි'යි "ආයුෂ්මත් මහාමුගලන් තෙරුන්ට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම, මෙසේ වදාළසේක ඇවැත්නි, මෙහි රහසිගතවූ හුදකලාවූ මට මෙසේ සිතට විතර්කයක් පහළවිය.

2. "ප්‍රථමධ්‍යානය ප්‍රථමධ්‍යානයයි කියනු ලැබේ. ප්‍රථම ධ්‍යානය කවරේද? කියායි. ඇවැත්නි, ඒ මට මේ සිත විය. මහණ, මේ ශාසනයෙහි කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත, විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද? මේ ප්‍රථමධ්‍යානයයි කියනු ලැබේ.

3. "ඇවැත්නි, ඒ මම වනාහි කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරමි. ඇවැත්නි, මේ විහරණයෙන් වාසය කරන්නාවූ මාහට කාම සහගතවූ හැඟීම් මෙනෙහි කිරීම් පහළවෙති. ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ සෘද්ධියෙන් මා කරා පැමිණ, මෙසේ වදාළසේක. "මොග්ගල්ලානය මොග්ගල්ලානය බ්‍රාහ්මණය, ප්‍රථමධ්‍යානයෙහි ප්‍රමාද නොවව. ප්‍රථමධ්‍යානයෙහි සිත පිහිටුව, ප්‍රථමධ්‍යානයෙහි සිත එකඟ කරව, ප්‍රථමධ්‍යානයෙහි සිත තබාගනුව කියායි.

4. "ඇවැත්නි, ඒ මම පසුව කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. ඇවැත්නි, යමෙකුට ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවකයෙක් මහත් නුවණැති බවට පැමිණියේයයි මනාකොට කියන්නේ නම් ශාස්තෲන්වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි ඒ මා උදෙසාම මනාකොට කියන්නේය."

---

## 2. අවිතක්ක සූත්‍රය.

1. (මෙතැන් සිට 9 වෙනි සූත්‍රය දක්වා 1 ඡේද මෙහි 1 වෙනි සූත්‍රයේ මෙන් යොදාගන්න.)

2. "ද්විතීයධ්‍යානය ද්විතීයධ්‍යානයයි කියනු ලැබේ. ද්විතීයධ්‍යානය කවරේද?

"ඇවැත්නි, ඒ මට මෙසේ සිත්විය. මේ ශාසනයෙහි මහණතෙම විතර්ක විචාරයන්ගේ සන්සිඳ වීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇති සිත හා එකග කරන්නාවූ විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙරේද, මේ ද්විතීයධ්‍යානයයි'' කියනු ලැබේ. ඇවැත්නි, ඒ මම විතර්ක විචාරයන් සන්සිඳවීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇති සිතේ එකග බව ඇති විතර්කය නැති විචාරය නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරමි.

3. "මේ විහරණයෙන් වාසය කරන්නාවූ ඒ මට විතර්ක සහිතවූ හැඟීම් මෙනෙහි කිරීම් පහළ වෙත්. ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ මා කරා ඉර්ධියෙන් පැමිණ මෙසේ වදාළසේක. "මොග්ගල්ලානය, මොග්ගල්ලානය, බ්‍රාහ්මණය, ද්විතීයධ්‍යානයෙහි ප්‍රමාද නොවව. ද්විතීයධ්‍යානයෙහි සිත පිහිටව. ද්විතීයධ්‍යානයෙහි සිත එකග කරව. ද්විතීයධ්‍යානයෙහි සිත තබව කියායි. ඇවැත්නි, පසුව ඒ මම විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතේ එකගබව ඇති විතර්ක නැති විචාර නැති, සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි.

4. "ඇවැත්නි, යම් ශ්‍රාවකයෙකුට ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවක තෙම මහත් නුවණැති බවට පැමිණියේයයි කියන්නේ නම්, ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවක තෙම මහත් නුවණැති බවට පැමිණියේයයි ඒ මා උදෙසා මනාකොට කියන්නේය."

---

## 3. සුබ සූත්‍රය.

2. "තෘතීයධ්‍යානය තෘතීයධ්‍යානයයයි කියනු ලැබේ. තෘතීයධ්‍යානය කවරේද?

"ඇවැත්නි, ඒ මට මෙසේ සිත් විය. 'මේ ශාසනයෙහි මහණතෙම ප්‍රීතියෙන් වෙන්ව උපෙක්ෂාවෙන් යුක්තවූයේ වාසය

කරයිද, සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපය විඳියිද, යමෙකුට උපෙක්ෂා සිහි ඇත්තේ සැපසේ වාසය කෙරේයයි ආර්යයෝ කියත් නම් ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද, මේ තෘතීයධ්‍යානයයි කියනු ලැබේ.

3. "ඇවැත්නි, ඒ මම ප්‍රීතියෙන් වෙන්වීමෙන් උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරමි. සිහියෙන් හා ප්‍රඥාවෙන් යුක්තවූ කයින් සැපය විඳිමි. උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප සේ වාසය කෙරේයයි යමෙකුට ආර්යයෝ කියත් නම් ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරමි.

4. "ඇවැත්නි, ඒ විහරණයෙන් වාසය කරන්නාවූ මට ප්‍රීති සහගතවූ හැඟීම් මෙනෙහි කිරීම් පහළ වෙති. ඇවැත්නි එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඉර්ධියෙන් මාවෙත පැමිණ මෙසේ වදාළ සේක. මොග්ගල්ලානය, මොග්ගල්ලානය, බ්‍රාහ්මණය, තෘතීයධ්‍යානයෙහි ප්‍රමාද නොවව. තෘතීයධ්‍යානයෙහි සිත පිහිටුවව. තෘතීයධ්‍යානයෙහි සිත එකඟ කරව. තෘතීයධ්‍යානයෙහි සිත තබව කියායි.

5. "ඇවැත්නි, ඒ මම පසුව ප්‍රීතියෙන් වෙන්වීමෙන් උපෙක්ෂාවෙන් යුක්තව වාසය කෙළෙමි. සිහියෙන් යුක්තව ප්‍රඥාවෙන් යුක්තව කයින් සැපයද වින්දෙමි. උපෙක්ෂාවෙන් යුක්තව සිහියෙන් යුක්තව සැපසේ වාසය කෙරේ යයි යමෙකුට ආර්යයෝ කියත්නම් ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි.

"ඇවැත්නි, යම් ශ්‍රාවකයෙකුට ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවක තෙම මහත් නුවණැති බවට පැමිණියේයයි කියන්නේනම්, ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවක තෙම මහත් නුවණැති බවට පැමිණියේයයි ඒ මා උදෙසා මනාකොට කියන්නේය."

---

## 4. උපෙක්ඛා සූත්‍රය.

2. චතුර්ථධ්‍යානය චතුර්ථධ්‍යානයයි කියනු ලැබේ. චතුර්ථධ්‍යානය කවරේද? ඇවැත්නි ඒ මට මෙසේ සිත් විය.

මේ ශාසනයෙහි මහණතෙම සුඛය පහ කිරීමෙන්ද, දුක පහකිරීමෙන්ද පළමුව සොම්නස දොම්නස දෙදෙනා දුරු කිරීමෙන් දුක්ද නැති සැපද නැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරෙයිද මේ චතුර්ථධ්‍යානයයි කියනු ලැබේ.

3. "ඇවැත්නි, ඒ මම සුඛය පහකිරීමෙන්ද, දුක පහකිරීමෙන්ද, පළමුව සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරුකිරීමෙන් දුකද නැති සැපද නැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරමි.

4. "ඇවැත්නි, මේ විහරණයෙන් වාසය කරන්නාවූ ඒ මට සුඛ සහගතවූ හැඟීම් මෙනෙහි කිරීම් උපදිත්, ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ මා කරා ඉර්ධියෙන් පැමිණ මට මෙසේ වදාළසේක, 'මොග්ගල්ලානය, මොග්ගල්ලානය, බ්‍රාහ්මණය, චතුර්ථධ්‍යානයෙහි ප්‍රමාද නොවව. චතුර්ථධ්‍යානයෙහි සිත පිහිටුව. චතුර්ථධ්‍යානයෙහි සිත එකඟ කරව. චතුර්ථධ්‍යානයෙහි සිත තබව කියායි.

5. "ඇවැත්නි. ඒ මම පසුව සුඛය පහකිරීමෙන්ද, දුක පහකිරීමෙන්ද, පළමුව සොම්නස් දොම්නස් දෙදෙනා දුරුකිරීමෙන් දුක්ද නැති, සැපද නැති, උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි.

"ඇවැත්නි, යම් ශ්‍රාවකයෙකුට ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරණලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි කියන්නේනම්, ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි ඒ මා උදෙසා මනාකොට කියන්නේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 5. ආකාසානඤ්චායතන සූත්‍රය.

2. "ආකාසානඤ්චායතනය ආකාසානඤ්චායතනයයි කියනුලැබේ. ආකාසානඤ්චායතනය කවරේද? ඇවැත්නි, ඒ මට මෙසේ සිත්විය. මහණෙනි, "මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් රූප සංඥා ඉක්මීමෙන් ද්වාරාරම්මණ ගැටීම් දුරු කිරීමෙන් නානත්ත සංඥාවන් නොමෙනෙහි කිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයිද, මේ අකාසානඤ්චායතනයයි කියනු ලැබේ.

ඇවැත්නි, ඒ මම රූපසංඥා ඉක්මවීමෙන් ද්වාරාරම්ම ගැටීම් සංඥා දුරුකිරීමෙන් නොයෙක් සංඥා මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයෙහි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමි.

3. "ඇවැත්නි, මේ විහරණයෙන් යුක්තව වසන්නාවූ මට රූප සහගතවූ සංඥා මනසිකාරයෝ පහළවෙත්. ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඉර්ධියෙන් මා කරා පැමිණ මෙසේ වදාළසේක. 'මොග්ගල්ලානය, මොග්ගල්ලානය, බ්‍රාහ්මණය, ආකාසානඤ්චායතනයෙහි ප්‍රමාද නොවව, ආකාසානඤ්චායතනයෙහි සිත පිහිටුවව. ආකාසානඤ්චායතනයෙහි සිත එකග කරව. ආකාසානඤ්චායතනයෙහි සිත තබව.

4. "ඇවැත්නි, ඒ මම පසුව සියලු ආකාරයෙන් රූපසංඥා ඉක්මීමෙන් ද්වාරාරම්මණ ගැටීම් දුරුකිරීමෙන් නානත්ත සංඥා නොමෙනෙහි කිරීමෙන් ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමි.

"ඇවැත්නි, යම් ශ්‍රාවකයෙකුට ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවක තෙම මහත් නුවණැති බවට පැමිණියේයයි කියන්නේ නම්, ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි. ඒ මා උදෙසා මනාකොට කියන්නේය."

---

## 6. විඤ්ඤාණඤ්චායතන සූත්‍රය

2. "විඤ්ඤාණඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනයයි කියනු ලැබේ. විඤ්ඤාණඤ්චායතනය කවරේද? ඇවැත්නි, ඒ මට මෙසේ සිත්විය. මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ පැමිණ වාසය කරයිද, මේ විඤ්ඤාණඤ්චායතනයයි කියනු ලැබේ.

3. "ඇවැත්නි, ඒ මම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරමි. ඇවැත්නි, මේ විහරණයෙන් වාසය කරන්නාවූ ඒ මට ආකාසානඤ්චායතන සහගතවූ සංඥා මනසිකාරයෝ උපදිත්.

4. "ඇවැත්නි, ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඍද්ධියෙන් මා කරා පැමිණ මෙසේ වදාළසේක. මොග්ගල්ලානය, මොග්ගල්ලානය බ්‍රාහ්මණය, විඤ්ඤාණඤ්චායතනයෙහි ප්‍රමාද නොවව. විඤ්ඤාණඤ්චායතනයෙහි සිත පිහිටුව. විඤ්ඤාණඤ්චායතනයෙහි සිත එකඟ කරව. විඤ්ඤාණඤ්චායතනයෙහි සිත තබව.

5. "ඇවැත්නි, ඒ මම පසුව සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරමි. ඇවැත්නි, යම් ශ්‍රාවකයෙකුට ශාස්තෘන්වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි කියන්නේ නම්, ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවක තෙම මහත් නුවණැති බවට පැමිණියේයයි ඒ මා උදෙසා මනාකොට කියන්නේය."

---

## 7. ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය.

2. "ආකිඤ්චඤ්ඤාතනය, ආකිඤ්චඤ්ඤායතනයයි කියනු ලැබේ. ආකිඤ්චඤ්ඤායතනය කවරේද? ඇවැත්නි, ඒ මට මේ

සිත විය. මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයිද, මේ ආකිඤ්චඤ්ඤායතනයයි කියනු ලැබේ.

3.“ඇවැත්නි, ඒ මම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරමි. මේ විහරණයෙන් වාසය කරන්නාවූ ඒ මට විඤ්ඤාණඤ්චායතන සහගතවූ සංඥා මනසිකාරයෝ උපදිත්.

4. “ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා කරා පැමිණ මෙසේ වදාළසේක. මොග්ගල්ලානය මොග්ගල්ලානය, බ්‍රාහ්මණය, ආකිඤ්චඤ්ඤායතනයෙහි ප්‍රමාද නොවව. ආකිඤ්චඤ්ඤායතනයෙහි සිත පිහිටුවව. ආකිඤ්චඤාඤායතනයෙහි සිත එකඟ කරව. ආකිඤ්චඤ්ඤායතනයෙහි සිත තබව කියායි.

5. “ඇවැත්නි ඒ මම පසුව සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කෙළෙමි.

6. “ඇවැත්නි, යම් ශ්‍රාවකයෙකුට ශාස්තෲන්වහන්සේ විසින් අනුග්‍රහ කරණ ලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේ යයි කියන්නේ නම්, ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි ඒ මා උදෙසා මනාකොට කියන්නේය.”

---

## 8. නෙවසඤ්ඤානාසඤ්ඤා යතන සූත්‍රය

2.“නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, නෙවසඤ්ඤානා-සඤ්ඤායතනයයි කියනු ලැබේ. ඇවැත්නි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයිද මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයයි කියනු ලැබේ.

3. "ඇවැත්නි, ඒ මම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරමි. ඇවැත්නි, මේ විහරණයෙන් වාසය කරන්නාවූ ඒ මට ආකිඤ්චඤ්ඤායතන සහගතවූ සංඥා මනසිකාරයෝ උපදිත්.

4. "ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ මා කරා ඍද්ධියෙන් පැමිණ මෙය වදාළසේක. 'මොග්ගල්ලානය, මොග්ගල්ලානය, බ්‍රාහ්මණය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි අප්‍රමාදවව. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සිත පිහිටුව. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සිත එකඟ කරව. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සිත තබව' කියායි.

5. "ඇවැත්නි, ඒ මම පසුව සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරමි.

6. "ඇවැත්නි, යම් ශ්‍රාවකයෙකුට ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහය කරන ලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි කියන්නේ නම්, ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරනලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි ඒ මා උදෙසා මනාකොට කියන්නේය."

---

## 9. අනිමිත්ත සූත්‍රය.

2. "අනිමිත්තචිත්ත සමාධිය, අනිමිත්තචිත්ත සමාධිය (විදර්ශනා සමාධිය) යයි කියනු ලැබේ. අනිමිත්තචිත්ත සමාධිය (විදර්ශනා සමාධිය) කවරේද? ඇවැත්නි, ඒ මට මේ අදහස පහළවිය. මේ ශාසනයෙහි මහණතෙම සියලු නිමිති මෙනෙහි

නොකිරීමෙන් (නිත්‍ය සුඛ ආත්මයන්) මෙනෙහි නොකිරීමෙන් අනිමිත්ත චිත්ත සමාධියට පැමිණ වාසය කරයිද මේ අනිමිත්තචිත්ත සමාධියයි කියනු ලැබේ.

3. "ඇවැත්නි, ඒ මම සියලු නිමිති මෙනෙහි නොකිරීමෙන් අනිමිත්තචිත්ත සමාධියට පැමිණ වාසය කරමි. ඇවැත්නි, මේ විහරණයෙන් වසන්නාවූ ඒ මට විදර්ශනාවන්හි ඇලෙන්නාවූ සිත උපදියි.

4. "ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත පැමිණ මෙසේ වදාළසේක. 'මොග්ගල්ලානය, මොග්ගල්ලානය, බ්‍රාහ්මණය, අනිමිත්තචිත්ත සමාධියෙහි ප්‍රමාද නොවව. අනිමිත්තචිත්ත සමාධියෙහි සිත පිහිටුවව. අනිමිත්තචිත්ත සමාධියෙහි සිත එකඟ කරව. අනිමිත්ත චිත්ත සමාධියෙහි සිත තබව.

5. "ඇවැත්නි, ඒ මම පසුව සියලු නිමිති මෙනෙහි නොකිරීමෙන් අනිමිත්තචිත්ත සමාධියට පැමිණ වාසය කෙළෙමි.

6. "ඇවැත්නි, යමෙකුට ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහත් නුවණැති බවට පැමිණියේයයි මනාකොට කියත් නම් ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකතෙම මහත් නුවණැති බවට පැමිණියේයයි මා උදෙසාම කියන්නේය."

## 10. සක්ක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම සැවැත්නුවර ජේතවන නම් අනේපිඬු මහසිටාණන්ගේ ආරාමයෙහි වාසය කරයි. එකල්හි වනාහි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේ යම්සේ වනාහි බලවත් පුරුෂයෙක් හකුළනලද අතක් යම්සේ දිගහරීද,

දිගහරිනලද අතක් යම්සේ හකුළාද එසේම ජේතවනයෙහි අතුරුදහන් වූයේ තව්තිසා වැසි දෙවියන් කෙරෙහි පහළවිය.

2. එකල්හි සක්දෙව් රජතෙම පන්සියයක් දෙවියන් සමග ආයුෂ්මත් මහ මුගලන් තෙරුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක හුන් සක්දෙව් රජුට ආයුෂ්මත් මහමුගලන් තෙරුන්වහන්සේ මෙය වදාළහ.

3. "දෙවානමින්දය, බුදුන් සරණයාම යහපත් වේ. දෙවානමින්දය, බුදුන් සරණ යාම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්. දෙවානමින්දය, ධර්මය සරණයාම යහපත් වේ. දෙවානමින්දය, ධර්මය සරණයාම හේතුකොටගෙන මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදිත්. දෙවානමින්දය, සංඝයා සරණ යාම යහපත් වේ. දෙවානමින්දය, සංඝයා සරණයාම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්යයි" වදාළසේක.

4. "නිදුකාණෙනි, මොග්ගල්ලානය, බුදුන් සරණයාම යහපත් වේ. නිදුකාණෙනි මොග්ගල්ලානය, බුදුන් සරණයාම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදිත්. නිදුකාණෙනි, මොග්ගල්ලානය, ධර්මය සරණයාම යහපත්වේ. නිදුකාණෙනි, මොග්ගල්ලානය, ධර්මය සරණයාම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදිත්. නිදුකාණෙනි, මොග්ගල්ලානය, සංඝයා සරණයාම යහපත් වෙයි. නිදුකාණෙනි, මොග්ගල්ලානය, සංඝයා සරණයාම හේතු කොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්යයි' කීයේය.

**5-6-7.** (මෙහි මේ සූත්‍රයේ 2, 3, 4 වෙනි ඡේද යොදාගත යුතුයි. 'පන්සියයක් දෙවියන්' වෙනුවට 'දේවතාවන් හය සියයක්' විය යුතුයි.)

**8-9-10.** (මෙහි මේ සූත්‍රයේ 2, 3, 4 වෙනි ඡේද යොදාගත යුතුයි. 'පන්සියයක් දෙවියන්' වෙනුවට 'දේවතාවන්' හත් සියයක්' විය යුතුයි.)

**11-12-13.** (මෙහි මේ සූත්‍රයේ 2, 3, 4 වෙනි ඡේද යොදාගත යුතුයි. 'පන්සියයක් දෙවියන්' වෙනුවට' 'දේවතාවන් අට සියයක්' විය යුතුයි.)

**14.** ඉක්බිති සක්දෙව් රජතෙම අසූදහසක් දෙවියන් සමග ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට වැඳ, එක්පසෙක සිටියේය. එකත්පසෙක සිට සක්දෙව් රජහට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ.

"දෙවානමින්දය, බුදුන් සරණ යාම යහපත් වේ. දෙවානමින්දය, බුදුන් සරණයාම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදිත්. දෙවානමින්දය, ධර්මය සරණයාම යහපත්වේ. දෙවානමින්දය, ධර්මය සරණයාම හේතුකොටගෙණ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්. දෙවානමින්දය, සංඝයා සරණයාම යහපත්වේ. දෙවානමින්දය, සංඝයා සරණ යාම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදිත්."

**15.** "නිදුකානෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, බුදුන් සරණයාම යහපත් වේ. නිදුකානෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, බුදුන් සරණයාම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්. නිදුකානෙනි,

මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, ධර්මය සරණයාම යහපත්වේ. නිදුකානෙනි මොග්ගල්ලානය, ධර්මය සරණ යාම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්. නිදුකානෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සංඝයා සරණ යාම යහපත්වේ. නිදුකානෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සංඝයා සරණයාම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්.

**16.** "ඉක්බිති ශක්‍ර දෙවෙන්ද්‍රතෙම පන්සියයක් දෙවතාවන් සමග ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වැඳ, එකත්පසෙක සිටියේය. එක්පසෙක සිටි සක්දෙව් රජුට ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ මෙය වදාළසේක. දෙවානමින්දය, බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපත්වේ. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුත්, අර්හත්ය. සම්‍යක් සම්බුද්ධය. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තය. සුගතය, ලොකවිදූය, පුරුෂයන් දමනය කිරීමෙහි අනුත්තර සාරථියෙකි. දෙව් මිනිසුන්ගේ අනුශාසකය. බුද්ධය භාග්‍යවත්ය, කියායි. දෙවානමින්දය බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවී ඒ හේතුකොටගෙන මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

**17.** "දෙවානමින්දය, ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපත්වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා කොට වදාරණ ලදී. ප්‍රත්‍යක්ෂව දැකිය හැකි ගුණ ඇත්තේය. කල් නොයවා ලැබිය හැකි ඵල ඇත්තේය. එව, බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමා තුළ උපදවාගත යුත්තේය ඤාණවන්තයින් විසින් තමා කෙරෙහිලා දතයුතුය දෙවෙන්ද්‍රය, ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්ත වීමෙන් මෙසේ මේ

ලොකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදිත්.

18. දෙවෙන්ද්‍රය, සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපත්වේ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යහපත්ව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ඍජුව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා නිවනට සුදුසු ආකාරයෙන් පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ගරු බුහුමනට යෝග්‍යව පිළිපන්නේය. පුරුෂ යුග සතරක්වූ, පුරුෂ පුද්ගලයන් අටදෙනෙක්වූ භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා ආගන්තුකයන් උදෙසා පිළියෙල කරනලද ප්‍රත්‍යයන් පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිළියෙල කළ ප්‍රත්‍ය පිළිගැනීමට සුදුසු වූයේය. කම් ඵල අදහාදෙන දන් පිළිගැනීමට සුදුසු වූයේය. ඇඳිළිබැඳ නමස්කාර කිරීමට සුදුසු වූයේය. ලොකයාගේ නිරුත්තර පින් කෙත වන්නේය. දෙවෙන්ද්‍රය මෙසේ සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්ත වීම හේතුකොටගෙන මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

දෙවෙන්ද්‍රය, කඩතොලු නොවූ, සිදුරු නොවූ, කබර නොගැසුනු, කිලුටු නැති, තෘෂ්ණාවෙන් නිදහස්වූ, ඥාණ වන්තයන් විසින් පසසනලද, තෘෂ්ණා මාන දෘෂ්ටීන් විසින් අල්වාගනු නොලැබූ සමාධිය පිණිස පවත්නාවූ ආර්යයන් විසින් කැමතිවන්නාවූ ශීලයෙන් යුක්තවීම යහපත් වේ. දෙවෙන්ද්‍රය, ආර්යයන් කැමති වන්නාවූ ශීලයෙන් යුක්තවීම හේතුකොටගෙන මෙසේ මෙලොව ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

19. "නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් නම් වනසේක. සම්‍යක් සම්බුද්ධය. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තය. සුගතය, ලොකවිදූය, පුරුෂයන් දමනය කිරීමෙහි අනුත්තර සාරථියෙකි, දෙව් මිනිසුන්ගේ අනුශාසකය, බුද්ධය, භාග්‍යවත්යයි, කියායි ඒ

භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපති (කෙසේද?) මොග්ගල්ලානය, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම හේතුකොටගෙන මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

**20.** නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනා කරණලදී. ප්‍රත්‍යක්ෂව දැකියහැකි ගුණ ඇත්තේය. කල් නොයවා ලැබියහැකි ඵල ඇත්තේය. එව බලව යයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමා තුළ උපදවා ගතයුත්තේය. ඥාණවන්තයින් විසින් තමා කෙරෙහිලා දතයුතුය. නුවණැත්තන් විසින් වෙනවෙනම දතයුතුයයි ධර්මයකෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපති. නිදුකාණෙනි, ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම හේතුකොටගෙන මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්."

**21.** "නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම මනාව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා නිවනට සුදුසු ආකාරයෙන් පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. පුරුෂයුග සතරක් වූ, පුරුෂ පුද්ගලයන් අටදෙනෙක්වූ භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා ආගන්තුකයන් උදෙසා පිළියෙල කරනලද ප්‍රත්‍යයන් පිළිගැනීමට සුදුසු වූයේය. කම් පල අදහා දෙන දන් පිළිගැනීමට සුදුසු වූයේය. ඇඳිලිබැඳ නමස්කාර කිරීමට සුදුසු වූයේය. ලෝකයාගේ නිරුත්තර පුණ්‍යක්ෂේත්‍රය වන්නේයයි සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපති නිදුකාණෙනි, මොග්ගල්ලායන ස්ථවිරයන් වහන්ස, සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්ත වීම හේතුකොටගෙන මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්.

**22.** "නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, කඩනොවූ සමාධිය පිණිස පවත්නාවූ ආර්යයන් කැමති වන්නාවූ සීලයෙන් සමන්විත වීම යහපති. නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස ආර්යයන් විසින් කැමති වන්නාවූ සීලයෙන් සමන්විතවීම හේතුකොටගෙන මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

**23, 24, 25, 26, 27, 28, 29.** (මෙහි මේ සූත්‍රයේ 16, 17, 18, 19, 20, 21, 22 ඡෙද යොදා ගතයුතුයි. දේවතාවන් 500 ක් වෙනුවට 600 ක් විය යුතුයි.)

**30, 31, 32, 33, 34, 35, 36.** (මෙහි මේ සූත්‍රයේ 16, 17, 18, 19, 20, 21, 22 ඡෙද යොදා ගතයුතුයි. දේවතාවන් 500 ක් වෙනුවට 700 ක් වියයුතුයි.)

**37, 38, 39, 40,41, 42, 43.** (මෙහි මේ සූත්‍රයේ 16, 17, 18, 19, 20, 21, 22 ඡෙද යොදා ගතයුතුයි. දේවතාවන් 500 ක් වෙනුවට 800 ක් විය යුතුයි.)

**44, 45, 46, 47, 48, 49, 50.** (මෙහි මේ සූත්‍රයේ 16, 17, 18, 19, 20, 21, 22, ඡෙද යොදා ගතයුතුයි. දේවතාවන් 500 ක් වෙනුවට 8000 ක් විය යුතුයි.)

**51.** එකල්හි සක්දෙව් රජතෙම පන්සියයක් දෙවතාවන් සමග ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වැඳ එක් පසෙක සිටියේය. එක් පසෙක හුන් සක්දෙව් රජුට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ මෙය වදාළසේක. දෙවේන්ද්‍රය, බුදුන් සරණයාම යහපත්වේ. දේවේන්ද්‍රය, බුදුන් සරණයාම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

ඔවුහු දිව්‍ය ආයුෂයෙන්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන කරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

**52.** දෙවෙන්ද්‍රය, ධර්මය සරණයාම යහපති. දෙවෙන්ද්‍රය ධර්මය සරණයාම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්.

ඔව්හු දිව්‍ය ආයුෂයෙන්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන කරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

**53.** දෙවෙන්ද්‍රය, සංඝයා සරණයාම යහපති. දෙවෙන්ද්‍රය සංඝයා සරණයාම හෙතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදිත්.

ඔව්හු දිව්‍ය ආයුෂයෙන්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන කරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

**54.** "නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, බුදුන් සරණයාම යහපත්වේ. නිදුකාණෙනි, මොග්ගල්ලානය, බුදුන් සරණයාම හෙතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්.

ඔවුහු දිව්‍ය ආයුෂයෙන්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද යන කරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**55.** "නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, ධර්මය සරණ යාම යහපති. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, ධර්මය සරණයාම හේතුකොටගෙන මෙසේ මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුෂයෙන්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද, යන කරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

**56.** (මෙහි මේ සූත්‍රයේ 53 ඡේදය, 'දෙවෙන්ද්‍රය' වෙනුවට 'නිදුකාණෙනි' කියා යොදාගතයුතුයි.)

**57, 58, 59, 60, 61, 62.** (මේ සූත්‍රයේ 51, 52, 53, 54, 55, 56 ඡේදය මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට 'දෙවියන් 600 ක්' යයි කියා යොදාගත යුතුයි.)

**63, 64, 65, 66, 67, 68.** (මේ සූත්‍රයේ 51, 52, 53, 54, 55, 56 ඡේද මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට 'දෙවියන් 700 ක් යයි යොදාගත යුතුයි.)

**69, 70, 71, 72, 73, 74.** (මේ සූත්‍රයේ 51, 52, 53, 54, 55, 56 ඡේද මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට දෙවියන් 800 ක්' යයි යොදාගත යුතුයි.)

**75, 76, 77, 78, 79, 80.** (මේ සූත්‍රයේ 51, 52, 53, 54, 55, 56 ඡේද මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට 'දෙවියන් 80000 ක් යයි යොදාගත යුතුයි.)

**81.** ඉක්බිති සක්දෙව් රජතෙම පන්සියයක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වැඳ එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි සක්දෙව් රජුට මහමුගලන් තෙරණුවෝ මෙසේ කීය.

"දෙවෙන්ද්‍රය, බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපත්වේ. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුත්

අර්හත්ය. සම්‍යක් සම්බුද්ධය, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තය සුගතය, ලොකවිදූය පුරුෂයන් දමනය කිරීමෙහි අනුත්තර සාරථීයෙකි. දෙව් මිනිසුන්ගේ අනුශාසකය, බුද්ධය, භාග්‍යවත්ය.

"දෙවෙන්ද්‍රය, බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුෂයෙන්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද, යන කරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

82. "ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපත්වේ. ප්‍රත්‍යක්ෂව දැකිය හැකි ගුණ ඇත්තේය. කල්නොයවා ලැබිය හැකි ඵල ඇත්තේය. එව, බලවයයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමා තුළ උපදවා ගත යුත්තේය. ඥාණවන්තයින් විසින් තමා කෙරෙහි ලා දත යුතුයි.

"දෙවෙන්ද්‍රය, ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුෂයෙන්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යනකරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

81. "දෙවේන්ද්‍රය, සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපති භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සෘජුව පිළිපන්නේය භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා නිවනට සුදුසු ආකාරයෙන් පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. පුරුෂ යුග සතරක්වූ, පුරිස පුද්ගලයන් අටදෙනෙක්වූ භාග්‍යවතුන්

වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා ආගන්තුකයන් උදෙසා පිළියෙල කරන ලද ප්‍රත්‍යයන් පිළිගැනීමට සුදුසු වූයේය. තුටුපඬුරු පිණිස පිළියෙල කළ ප්‍රත්‍ය පිළිගැනීමට සුදුසුවූයේ කම් පල අදහා දෙන දන් පිළිගැනීමට සුදුසු වූයේය. ඇදිලිබැඳ නමස්කාර කිරීමට සුදුසු වූයේය. ලෝකයාගේ නිරුත්තර පින් කෙත වන්නේය.

"දෙවෙන්ද්‍රය, සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්ත වීම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුෂයෙන්ද දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද, යන කරුණු දසයකින් අන්‍ය දෙවියන් යටපත් කරත්.

"දෙවෙන්ද්‍රය, කඩතොලු නොවූ, සිදුරු නොවූ, කබර නොගැසුණු, කිලුටු නැති, තෘෂ්ණාවෙන් නිදහස්වූ, ඥාණවන්තයන් විසින් පසසන ලද, තෘෂ්ණා මාන දෘෂ්ටීන් විසින් අල්වා ගනු නොලැබූ සමාධිය පිණිස පවත්නාවූ ආර්යයන් විසින් කැමැති වන්නාවූ ශීලයෙන් යුක්තවීම යහපත්වේ.

"දෙවෙන්ද්‍රය, ආර්යයන් කැමැති වන්නාවූ ශීලයෙන් සමන්විතවීම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුෂින්ද දිව්‍ය වර්ණයෙන්ද දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන දශවිධ කරුණින් සෙසු දෙවියන් ඉක්මවා සිටිත් යනුවෙනි.

**82.** "නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, මේ කාරණයෙනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්ය. සම්‍යක් සම්බුද්ධය. අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තය, සුගතය, ලොකවිදූය, පුරුෂයන් දමනය කිරීමෙහි අනුත්තර

සාරථියෙකි. දෙව්මිනිසුන්ගේ ශාස්තෘවරය, බුද්ධය භාග්‍යවත්යයි බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපති.

'නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුසින්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන දස කරුණින් සෙසු දෙවියන් ඉක්මවා සිටිත්.

83. "නිදුකාණෙනි මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලදී. දෙවෙන්ද්‍රය, කඩතොලු නොවූ සිදුරු නොවූ කබර නොගැසුනු, කිලුටු නැති තෘෂ්ණාවෙන් නිදහස්වූ, ඥාණවන්තයන් විසින් තමතමන් විසින් වෙන වෙනම දතයුතුයි. ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපත්වේ.

"නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම හේතුකොටගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුෂින්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද දිව්‍ය ශබ්දයෙන්ද, දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන දස කාරණයකින් සෙසු දෙවියන් ඉක්මවා සිටිත්.

84. "නිදුකාණෙනි මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සෘජුව පිළිපන්නේය භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා නිවනට සුදුසු ආකාරයෙන් පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. පුරුෂ යුග සතරක්වූ පුරිස පුද්ගලයන් අටදෙනෙක්වූ භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා ආගන්තුකයන් උදෙසා පිළියෙල

කරනලද ප්‍රත්‍යයන් පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම් පල අදහා දෙන දන් පිළිගැනීමට සුදුසු වූයේය. ඇඳිලි බැඳ නමස්කාර කිරීමට සුදුසු වූයේය. ලෝකයාගේ නිරුත්තර පින්කෙතයයි සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම යහපත්වේ.

"නිදුකාණෙනි, මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවීම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදිත්. ඔව්හු දිව්‍ය ආයුෂින්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද, දිව්‍ය ශබ්දයෙන්ද දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන දස කරුණින් සෙසු දෙවියන් ඉක්මවා සිටිත්.

"නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස කඩතොලුනොවූ, සිදුරු නොවූ, කබර නොගැසුනු, කිලුටු නැති, තෘෂ්ණාවෙන් නිදහස්වූ, ඥාණවන්තයන් විසින් පසසන ලද තෘෂ්ණා මාන දෘෂ්ටීන් විසින් අල්වාගනු නොලැබූ සමාධිය පිණිස පවත්නා ආර්යයන් කැමැත්තාවූ ශීලයෙන් යුක්තවීම යහපත්වේ.

"නිදුකාණෙනි, මොග්ගල්ලානයන් වහන්ස, ආර්යයන් කැමැතිවන්නාවූ ශීලයෙන් යුක්තවීම හේතුකොට ගෙන මෙසේ මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදිත් ඔව්හු දිව්‍ය ආයුෂින්ද, දිව්‍ය වර්ණයෙන්ද, දිව්‍ය සැපයෙන්ද, දිව්‍ය යසසින්ද, දිව්‍ය අධිපති භාවයෙන්ද, දිව්‍ය රූපයෙන්ද දිව්‍ය ශබ්දයෙන්ද දිව්‍ය ගන්ධයෙන්ද, දිව්‍ය රසයෙන්ද, දිව්‍ය ස්පර්ශයෙන්ද යන දස කරුණින් සෙසු දෙවියන් ඉක්මවා සිටිත්යයි කීහ.

**85, 86, 87, 88, 89, 90.** (මේ සූත්‍රයේ 79, 80, 81, 82, 83, 84 ඡෙද මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට 'දෙවියන් 600 ක්' යයි යොදාගත යුතුයි.)

**91, 92, 93, 94, 95, 96.** (මේ සූත්‍රයේ 79, 80, 81, 82, 83, 84 ඡේද මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට 'දෙවියන් 700 ක්' යයි යොදාගත යුතුයි.)

**97, 98, 99, 100, 101, 102.** (මේ සූත්‍රයේ 79, 80, 81, 82, 83, 84 ඡේද මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට 'දෙවියන් 800 ක්' යයි යොදාගත යුතුයි.)

**103, 104, 105, 106, 107, 108.** (මේ සූත්‍රයේ 79, 80, 81, 82, 83, 84 ඡේද මෙහි යොදාගත යුතුයි. 'දෙවියන් 500 ක්' වෙනුවට 'දෙවියන් 80,000 ක්' යයි යොදාගත යුතුයි.)

---

## 11. නන්දන සූත්‍රය.

(මේ සූත්‍රය මේ වර්ගයේ 10 වෙනි සූත්‍රය මෙනි. 'ශක්‍ර දේවේන්ද්‍රය' වෙනුවට 'නන්ද දේවපුත්ත' යොදාගත යුතුයි.)

---

## 12. සුයාම සූත්‍රය.

(මේ සූත්‍රය මේ වර්ගයේ 10 වෙනි සූත්‍රය මෙනි. 'ශක්‍ර දේවෙන්ද්‍රය' වෙනුවට 'සුයාම දේවපුත්ත' යොදාගත යුතුයි.)

---

## 13. සන්තුසිත සූත්‍රය.

(මේ සූත්‍රය මේ වර්ගයේ 10 වෙනි සූත්‍රය මෙනි 'ශක්‍ර දේවේන්ද්‍රය' වෙනුවට 'සන්තුසිත දේවපුත්ත' යොදාගත යුතුයි.)

---

## 14. සුනිම්මිත සූත්‍රය

(මේ සූත්‍රය මේ වර්ගයේ 10 වෙනි සූත්‍රය මෙනි. 'ශක්‍ර දේවේන්ද්‍රය' වෙනුවට 'සුනිම්මිත දේවපුත්ත' යොදාගත යුතුයි.)

---

## 15. වසවත්ති සූත්‍රය

(මේ සූත්‍රය මේ වර්ගයේ 10 වෙනි සූත්‍රය මෙනි. 'ශක්‍ර දේවේන්ද්‍රය' වෙනුවට 'වසවත්ති දේවපුත්ත' යොදාගත යුතුයි.)

---

(මොග්ගල්ලාන සංයුත්තය නිමි.)

---

# 6. චිත්ත සංයුත්තය.

## 1. සංයොජන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි බොහෝ ස්ථවිර භික්ෂූහු අම්බාටක වනයෙහිවූ මච්ඡිකාසණ්ඩ නම් වනලැහැබෙහි වාසය කරත්. එකල්හි වනාහි සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණාවූ මණ්ඩල මාලයෙහි රැස්ව හුන්නාවූ බොහෝ ස්ථවිරභික්ෂූන් අතර 'ඇවැත්නි, සංයොජන සංයොජනීය ධර්ම යන මේ ධර්මයෝ වෙන් වෙන්වූ අර්ථ ඇත්තාහුද වෙන් වෙන්වූ ව්‍යඤ්ජන ඇත්තාහුද නොහොත් සමාන අර්ථ ඇත්තාහුද, සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද,' යන මේ කථාව පහළවිය.

2. එහි ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් 'ඇවැත්නි, සංයොජන නම් වූද, සංයොජනීය ධර්ම නම් වූද, මේ ධර්මයෝ නානාර්ථ ඇත්තාහුද, නානාව්‍යඤ්ජන ඇත්තාහුද, වෙත්යයි' කියන ලදී. ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් 'ඇවැත්නි, සංයොජන නම් වූද, සංයොජනීය ධර්ම නම් වූද මේ ධර්මයෝ සමාන අර්ථ ඇත්තාහුද, සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද,' වෙත් යයි කියන ලදී.

3. එකල්හි වනාහි චිත්ත ගෘහපතිතෙම කිසියම් කටයුත්තක[P] සඳහා මිගපථක නම් ගමට පැමිණියේය චිත්ත ගෘහපතිතෙම සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණාවූ මණ්ඩල මාලයෙහි රැස්වූ බොහෝ ස්ථවිර භික්ෂූන් අතර 'ඇවැත්නි සංයොජන

නම් වූද, සංයොජනීය ධර්ම නම් වූද මේ ධර්මයෝ වෙන් වෙන්වූ අර්ථ ඇත්තාහුද, වෙන් වෙන්වූ ව්‍යඤ්ජන ඇත්තාහුද, නොහොත් සමානාර්ථ ඇත්තාහුද, සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද' යන මේ අතුරු කථාව පහළවීය එහිදී ඇතැම් තෙරුන් විසින් 'ඇවැත්නි, සංයොජන නම් වූද, සංයොජනීය ධර්ම නම් වූද මේ ධර්මයෝ වෙන් වෙන්වූ අර්ථ ඇත්තාහුද, වෙන් වෙන්වූ ව්‍යඤ්ජන ඇත්තාහුද වෙත්යයි' කියනලදී. ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් 'ඇවැත්නි සංයෝජන නම්වූද, සංයොජනීය ධර්ම නම්වූද, යන මේ ධර්මයෝ සමානාර්ථ ඇත්තාහුද, සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද වෙත්යයි කියන ලදැයි' ඇසූයේය.

**4.** ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූහු යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, ස්ථවිර භික්ෂූන් වැඳ, එක්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම, ස්ථවිර භික්ෂූන්ට, "ස්වාමීනි, සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණාවූ මණ්ඩල මාලයෙහි රැස්ව බොහෝ ස්ථවිර භික්ෂූන් අතර, 'ඇවැත්නි, සංයොජන නම්වූද සංයොජනීය ධර්ම නම් වූද, ධර්මයෝ වෙන් වෙන්වූ අර්ථ ඇත්තාහුද, වෙන් වෙන්වූ ව්‍යඤ්ජන ඇත්තාහුද, නොහොත් සමානාර්ථ ඇත්තාහුද සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද යන මේ අතුරු කථාවක් පහළවිය. ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් 'ඇවැත්නි, සංයොජන නම්වූද, සංයොජනීය ධර්ම නම්වූද මේ ධර්මයෝ වෙන් වෙන්වූ අර්ථ ඇත්තාහුය. වෙන් වෙන්වූ ව්‍යඤ්ජන ඇත්තාහුයයි' කියන ලදැයි' ද ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් 'ඇවැත්නි, සංයොජන නම් වූද සංයොජනීය ධර්ම නම් වූද මේ ධර්මයෝ සමානාර්ථ ඇත්තාහුය. සමාන ව්‍යඤ්ජන ඇත්තාහු යයිද, කියන ලදැයි මා විසින් අසන ලද්දේයයි' කීය. 'ගෘහපතිය, එසේයයි" භික්ෂූහු කීහ.

**5.** "ස්වාමීනි, සංයොජන නම්වූද, සංයොජනීය ධර්ම නම් වූද, මේ ධර්මයෝ වෙන් වෙන්වූ අර්ථ ඇත්තාහුය. වෙන් වෙන්වූ ව්‍යඤ්ජන ඇත්තාහුය. ස්වාමීනි, එහෙයින් ඔබවහන්සේලාට උපමාවක් දක්වන්නෙමි. උපමාවෙන්ද මේ ලොකයෙහි ඥාණවන්ත පුරුෂයෝ කියන ලද කාරණයාගේ අර්ථය

දැනගනිත්. "ස්වාමීනි යම් කළු ගොනෙක්ද සුදු ගොනෙක්ද එක දම්වැලකින් හෝ ලණුවකින් හෝ බඳින ලද්දාහු වෙත්ද, යමෙක් කළු ගොනා සුදු ගොනාගේ බැම්මය සුදු ගොනා කළු ගොනාගේ බැම්මයයි. මෙසේ කියන්නේනම් ඔහු මනාව කියන්නේද?" "ගෘහපතිය, එය එසේ නොවේ ගෘහපතිය, කළු ගොනා සුදු ගොනාගේ බැම්ම නොවේ. සුදු ගොනා කළු ගොනාගේ බැම්ම නොවේ. ඔව්හු යම් එක දම්වැලකින් හෝ ලණුවකින් හෝ බඳින ලද්දාහුද එය එහි බැම්මයි."

"ස්වාමීනි. එසේම ඇස රූපයෙහි සංයොජනය නොවේ. රූප ඇසේ සංයොජනය නොවේ. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද එය සංයොජනයයි.

"කන ශබ්දයන්ගේ සංයෝජනය නොවේ. ශබ්ද කනේ සංයෝජනය නොවේ. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය සංයොජනයයි.

"නාසය ගන්ධයන්ගේ සංයොජනය නොවේ. ගන්ධ නාසයේ සංයොජනය නොවේ. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය සංයොජනයයි.

"දිව රසයන්ගේ සංයොජනය නොවේ. රස දිවෙහි සංයොජනය නොවේ. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය සංයොජනයයි.

"කය ස්පර්ශයන්ගේ සංයොජන නොවේ. ස්පර්ශ කයේ සංයෝජන නොවේ. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද එය සංයෝජනයයි.

"සිත ධර්මයන්ගේ සංයෝජනය නොවේ. ධර්මය සිතේ සංයොජනය නොවේ. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය එහි සංයෝජනයයි කීය.

**6.** ගෘහපතිය, ගැඹුරු බුද්ධ වචනයෙහි තොපගේ ප්‍රඥා චක්ෂුස පැවැත්මෙන් තොපට මහත් ලාභයක් විය. තොප විසින් යහපත් ලාභයක් ලබන ලදැයි' ඒ භික්ෂූහු කීහ.

---

## 2. ඉසිදත්ත සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි බොහෝ ස්ථවිර භික්ෂූහු අම්බාටක වනයෙහිවූ මච්ඡිකාසණ්ඩ නම් වනලැහැබෙහි වාසය කරත්. එකල්හි චිත්ත ගෘහපති තෙම ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ස්ථවිර භික්ෂූන් වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූන්ට 'ස්වාමීනි, තෙරුන් වහන්සේලා හෙට දවස පිණිස මගේ බත (දානය) ඉවසාවායි' කීයේය. ස්ථවිර භික්ෂූහු තුෂ්ණිම්භාවයෙන් ඉවසූහ.

එකල්හි චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූන්ගේ ඉවසීම දැන හුන් අස්නෙන් නැගිට ස්ථවිර භික්ෂූන් වැඳ ගෞරවකොට ගියේය. ඉක්බිති ස්ථවිර භික්ෂූහු ඒ රාත්‍රියගේ ඇවෑමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන චිත්ත ගෘහපතියාගේ ගෘහය යම් තැනෙක්හිද, එතැනට පැමිණියෝය. පැමිණ පණවන ලද අස්නෙහි හිඳගත්තාහුය.

3. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ස්ථවිර භික්ෂූන් වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ස්ථවිරනමකට, 'තෙරුන් වහන්ස, ධාතුනානත්වය ධාතුනානත්වයයි කියනු ලැබේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණකින් ධාතුනානත්වය වදාරණ ලද්දේදැයි?" ඇසීය. මෙසේ කී කල්හි ආයුෂ්මත් ස්ථවිරතෙමේ නිශ්ශබ්ද විය.

4. දෙවනුවත් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ස්ථවිරයන්ට 'ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, ධාතුනානත්වය ධාතුනානත්වයයි කියනු ලැබේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණකින් ධාතුනානත්වය වදාරණ ලද්දේදැයි" කීයේය. දෙවනුවත් ආයුෂ්මත් ස්ථවිරතෙම නිශ්ශබ්දවිය.

5. තුන් වෙනුවත් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ස්ථවිරයන්ගෙන් "ස්වාමීනි, තෙරුන් වහන්ස ධාතුනානත්වය

ධාතුනානත්වයයි කියනු ලැබේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණකින් ධාතුනානත්වය වදාරණ ලද්දේවේදැයි?” ඇසීය. තුන්වෙනුවත් ආයුෂ්මත් ස්ථවිරතෙම නිශ්ශබ්දවිය.

**6.** එකල්හි වනාහි ආයුෂ්මත් ඉසිදත්ත ස්ථවිරතෙමේ ඒ භික්ෂුසංඝයා අතර සියල්ලන්ට බාල වූයේ වෙයි. එකල්හි ආයුෂ්මත් ඉසිදත්ත ස්ථවිරතෙමේ ආයුෂ්මත් ස්ථවිරයන්ට “ස්වාමීනි, තෙරුන්වහන්ස, චිත්ත ගෘහපතිහුගේ මේ ප්‍රශ්නය මම ප්‍රකාශ කරමියි” කීයේය. “ඇවැත්නි, ඉසිදත්තය, චිත්ත ගෘහපතිහුගේ මේ ප්‍රශ්නය ඔබ ප්‍රකාශ කරව.”

“ගෘහපතිය, ස්වාමිනි තෙරුන්වහන්ස, ධාතුනානත්වය ධාතුනානත්වයයි කියනු ලැබේ. ‘ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණකින් ධාතුනානත්වය වදාරණ ලද්දේදැයි’ මෙසේ ප්‍රශ්න කරන්නෙහිද?”

“එසේය, ස්වාමීනි.”

“ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ධාතුනානත්වය වදාරණලදී. කෙසේද? චක්ෂුධාතු, රූපධාතු චක්ඛුවිඥ්ඥාණධාතු, සොතධාතු, සද්දධාතු, සොත විඥ්ඥාණ ධාතු, ඝානධාතු, ගන්ධධාතු, ඝාන විඥ්ඥාණධාතු, ජිව්හා ධාතු, රසධාතුය, ජිව්හා විඥ්ඥාණධාතු, කාය ධාතුය, ස්පර්ශධාතු, කාය විඥ්ඥාණධාතු, මනොධාතු, ධම්මධාතු, මනොවිඥ්ඥාණධාතු යනුවෙනි. ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙපමණකින් ධාතුනානත්වය වදාරණලදී.”

**8.** ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ඉසිදත්ත ස්ථවිරයන්ගේ කීමට සතුටුව අනුමෝදන්ව ස්ථවිර භික්ෂූන් ප්‍රණීතවූ කෑ යුතු බුදියයුතු දෙයින් සියතින් වැළඳවිය. පැවරවිය. ඉක්බිති වළඳා පාත්‍රයෙන් ඉවත්කළ අත් ඇති ස්ථවිර භික්ෂූහු හුනස්නෙන් නැගිට ගියාහුය. ඉක්බිති ආයුෂ්මත් ස්ථවිරතෙමේ ආයුෂ්මත් ඉසිදත්ත ස්ථවිරයන්ට “ඇවැත් ඉසිදත්තය, මේ ප්‍රශ්නය තොපට වැටහුණසැටි ඉතා යහපත්ය. ඒ ප්‍රශ්නය මට නොවැටහුනේය. ඇවැත් ඉසිදත්තය. එහෙයින් යම් අන් දිනකද

මෙබඳු ප්‍රශ්නයක් එන්නේනම් තොපටම වැටහෙන්නේය. (තෙපිම ප්‍රකාශ කරත්වා)යි” කීය.

---

## 3. ඉසිදත්ත සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි බොහෝ ස්ථවිර භික්ෂූහු අම්බාටක වනයෙහිවූ මච්ඡිකාසණ්ඩ නම් වනලැහැබෙහි වාසය කෙරෙත්. ඉක්බිති චිත්ත ගෘහපති තෙම ස්ථවිර භික්ෂූන් යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ස්ථවිර භික්ෂූන් වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූන්ට ‘ස්වාමීනි, තෙරුන් වහන්සේලා හෙට දවස පිණිස මගේ බත ඉවසත්වායි කීයේය. ස්ථවිර භික්ෂූහු නිශ්ශබ්ද භාවයෙන් ඉවසූහ. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූන්ගේ ඉවසීම දැන හුන් අස්නෙන් නැගිට, ස්ථවිර භික්ෂූන් වැඳ ගෞරවකොට ගියේය. ඉක්බිති ස්ථවිර භික්ෂූහු ඒ රාත්‍රියගේ ඇවෑමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිව්රු ගෙන චිත්ත ගෘහපතීහුගේ ගෘහය යම් තැනෙක්හිද එතැනට පැමිණියෝය. පැමිණ පණවනලද අස්නෙහි වැඩසිටියාහුය.

2. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ස්ථවිර භික්ෂූන් වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ස්ථවිරයන්ට ‘ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස යම් මේ නානාප්‍රකාර දෘෂ්ටීහු ලොකයෙහි උපදිත්ද, ලොකය ශාස්වතය කියාද, ලොකය අශාස්වතය කියාද, ලොකය අන්තයක් ඇත්තේය කියාද, ලොකය අන්තයක් නැත්තේය කියාද, එයම ජීවය වෙයි. එයම ශරීරය වෙයි. කියාද, අනිකක් ජීවය වෙයි, අනිකක් ශරීරය වෙයි කියාද, සත්වයා මරණින් මතු වන්නේය කියාද, සත්වයා මරණින් මතු නොවන්නේය කියාද, සත්වයා මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද, සත්වයා මරණින් මතු නොවෙයි. නොවන්නේත්

නොවෙයි කියාද, බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදාරණ ලද යම් මේ දෙසැට දෘෂ්ටි කෙනෙක් ඇද්ද, ස්වාමීනි, මේ දෘෂ්ටීහු කුමක් ඇති කල්හි වෙත්ද, කුමක් නැති කල්හි නොවෙත්දැයි,” මෙසේ කීයේය.

3. මෙසේ කී කල්හි ආයුෂ්මත් ස්ථවිරතෙමේ නිශ්ශබ්ද විය. දෙවනුවත් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ස්ථවිරයන්ට ‘ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, යම් මේ නානාප්‍රකාර දෘෂ්ටීහු ලොකයෙහි උපදිත්ද ලොකය ශාස්වතය කියාද ලොකය අශාස්වතය කියාද, ලොකය අන්තයක් ඇත්තේය කියාද, ලොකය අන්තයක් නැත්තේය කියාද, එයම ජීවය වෙයි. එයම ශරීරය වෙයි කියාද, අනිකක් ජීවය වෙයි, අනිකක් ශරීරයවෙයි කියාද, සත්වයා මරණින් මතු වන්නේය කියාද, සත්වයා මරණින් මතු නොවන්නේය කියාද, සත්වයා මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වයා මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවෙයි කියාද, බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදාරණලද යම් මේ දෙසැට දෘෂ්ටි කෙනෙක් ඇද්ද, ස්වාමීනි, මේ දෘෂ්ටීහු කුමක් ඇතිකල්හි වෙත්ද, කුමක් නැතිකල්හි නොවෙත්දැයි” මෙසේ කීයේය. දෙවනුවත් ආයුෂ්මත් ස්ථවිරතෙම නිශ්ශබ්ද විය.

4. තුන්වෙනුවත් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ස්ථවිරයන්ට “ස්වාමීනි ස්ථවිරයන් වහන්ස ලොකයෙහි යම් මේ අනේකප්‍රකාර දෘෂ්ටීහු උපදිත්ද, ලොකය ශාස්වතය කියාද, ලොකය අශාස්වතය කියාද, ලොකය කෙළවරක් ඇත්තේය කියාද, කෙළවරක් නැත්තේය කියාද, එයම ජීවය වෙයි එයම ශරීරය වෙයි කියාද, ජීවිය අනිකකි ශරීරය අනිකකි කියාද, සත්වයා මරණින් මතු වෙයි කියාද, සත්වයා මරණින් මතු නොවෙයි කියාද, සත්වයා මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද, සත්වයා මරණින් මතු නොවන්නේද වෙයි නොවන්නේත් නොවේ කියාද බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදාරණලද යම් මේ දෙසැට දෘෂ්ටි කෙනෙක් ඇද්ද ස්වාමීනි මේ දෘෂ්ටීහු කුමක් ඇතිකල්හි වෙත්ද, කුමක් නැති කල්හි නොවෙත්දැයි” මෙය කීයේය. තුන්වෙනුවත් ආයුෂ්මත් ස්ථවිරතෙමේ නිශ්ශබ්ද විය.

**5.** එකල්හි වනාහි ආයුෂ්මත් ඉසිදත්ත තෙමේ ඒ භික්ෂු සංඝයා කෙරෙහි සියල්ලන්ට බාල වූයේ වෙයි. එකල්හි ආයුෂ්මත් ඉසිදත්ත තෙමේ ආයුෂ්මත් ස්ථවිරයන්ට "ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, චිත්ත ගෘහපතිහුගේ මේ ප්‍රශ්නය මම ප්‍රකාශ කරන්නෙමියි" කීයේය.

"ඇවැත්නි, ඉසිදත්තය, චිත්ත ගෘහපතීහුගේ මේ ප්‍රශ්නය ඔබ ප්‍රකාශ කරව,"

"ගෘහපතිය, ස්වාමීනි ස්ථවිරයන් වහන්ස යම් මේ නානාප්‍රකාර දෘෂ්ටීහු ලොකයෙහි උපදිත්. ලොකය ශාස්වතය කියාද, ලොකය අශාස්වතය කියාද, ලොකය අන්තයක් ඇත්තේය කියාද, ලොකය අන්තයක් නැත්තේය කියාද, එයම ජීවය වෙයි. එයම ශරීරය වෙයි කියාද, අනිකක් ජීවය වෙයි. අනිකක් ශරීරය වෙයි කියාද, සත්වයා මරණින් මතු වන්නේය කියාද, සත්වයා මරණින් මතු නොවන්නේය කියාද, සත්වයා මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වයා මරණින් මතු නොවෙයි. නොවන්නේත් නොවෙයි කියාද, බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදාරණ ලද යම් මේ දෙසැට දෘෂ්ටි කෙනෙක් ඇද්ද, ස්වාමීනි, මේ දෘෂ්ටීහු කුමක් ඇති කල්හි වෙත්ද, කුමක් නැතිකල්හි නොවෙත්දැයි විචාළෙහිද?"

"ස්වාමීනි, එසේය."

"ගෘහපතිය, ලොකයෙහි මේ නොයෙක් දෘෂ්ටීහු වෙත්ද, ලොකය ශාස්වතය කියාද, ලොකය අශාස්වතය කියාද, ලොකය කෙළවරක් ඇත්තේය කියාද, ලොකය කෙළවරක් නැත්තේය කියාද, එයම ජීවය වෙයි. එයම ශරීරය වෙයි කියාද, ජීවය අනිකකි. ශරීරය අනිකකි කියාද සත්වයා මරණින් මතු වෙයි කියාද, සත්වයා මරණින් මතු නොවෙයි කියාද, සත්වයා මරණින්මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වයා මරණින් මතු නොවේ නොවන්නේද නොවේ කියාද, බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදාරණලද යම් මේ දෙසැට දෘෂ්ටි කෙනෙක් ඇද්ද ගෘහපතිය, මේ දෘෂ්ටීහු සක්කාය දෘෂ්ටිය ඇති කල්හි වෙත්. සක්කාය දෘෂ්ටිය නැති කල්හි නොවෙත්යයි කීය.

6. "ස්වාමීනි, කෙසේ නම් සක්කාය දෘෂ්ටිය වේද?"

"ගෘහපතිය, මේ ලොකයෙහි ආර්යයන් නොදක්නාවූ ආර්යධර්මයෙහි අදක්ෂවූ, ආර්යධර්මයෙහි නොහික්මුණු, සත්පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු අශ්‍රැතවත් පෘථග්ජනතෙම රූපය ආත්මයයි දකීද, රූ ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි රූපය ඇතැයි කියා හෝ රූපයෙහි ආත්මය ඇතැයි කියා හෝ දකියිද, වේදනාව ආත්මයයි දකීද, වේදනා ඇතියහු ආත්මය කියා හෝ ආත්මයෙහි වේදනාව ඇතැයි කියා හෝ වේදනාවෙහි ආත්මය ඇතැයි කියා හෝ දකියිද, සංඥාව ආත්මයයි දකීද, සංඥා ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි සංඥාව ඇතැයි කියා හෝ සංඥාවෙහි ආත්මය ඇතැයි කියා හෝ දකියිද, සංස්කාරය ආත්මයයි දකීද, සංස්කාර ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි සංස්කාර ඇතැයි කියා හෝ සංස්කාරයෙහි ආත්මය ඇතැයි කියා හෝ දකියිද, විඤ්ඤාණය ආත්මයයි දකීද, විඤ්ඤාණය ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි විඤ්ඤාණය ඇතැයි කියා හෝ විඤ්ඤාණයෙහි ආත්මය ඇතැයි කියා හෝ දකීද, ගෘහපතිය, මෙසේ සක්කාය දෘෂ්ටිය වේ.

7. "ස්වාමීනි, සක්කාය දෘෂ්ටිය කෙසේ නොවේද?" "ගෘහපතිය, මේ ලොකයෙහි ආර්යයන් දක්නා ආර්ය ධර්මයෙහි දක්ෂවූ ආර්ය ධර්මයෙහි හික්මුණාවූ සත්පුරුෂයන් දක්නා සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණාවූ ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙම රූපය ආත්මය වශයෙන් නොදකියිද, රූපය ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි රූපය ඇතැයි කියා හෝ රූපයෙහි ආත්මය ඇතැයි කියා හෝ නොදකීද, වේදනාව ආත්මය වශයෙන් නොදකියිද, වේදනාව ඇතියහු ආත්මය කියා හෝ ආත්මයෙහි වේදනාව ඇතැයි කියා හෝ වේදනාවෙහි ආත්මය ඇතැයි කියා හෝ නොදකීද, සංඥාව ආත්මය වශයෙන් නොදකියිද, සංඥාව ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි සංඥාව ඇතැයි කියා හෝ සංඥාවෙහි ආත්මය

ඇතැයි කියා හෝ නොදකීද, සංස්කාර ආත්මය වශයෙන් නොදකියිද, සංස්කාර ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි සංස්කාරය ඇතැයි කියා හෝ සංස්කාරයෙහි ආත්මය ඇතැයි කියා හෝ නොදකීද විඤ්ඤාණය ආත්මය වශයෙන් නොදකීද, විඤ්ඤාණය ඇතියහු ආත්මයයි කියා හෝ ආත්මයෙහි විඤ්ඤාණය ඇතැයි කියා හෝ විඤ්ඤාණයෙහි ආත්මය ඇතැයි කියා හෝ නොදකීද ගෘහපතිය, මෙසේ සක්කාය දෘෂ්ටිය නොවේ.

8. "ස්වාමීනි, ආර්ය ඉසිදත්ත ස්ථවිර තෙමේ කොහි සිට එන්නේද?"

"ගෘහපතිය, මම අවන්ති රට සිට එමි."

"ස්වාමීනි, අවන්තියෙහි ඉසිදත්ත නම්වූ අපගේ අදෘෂ්ට මිත්‍ර (නොදැක මිත්‍රවූ) පැවිද්දෙක් ඇත්තේය, ආයුෂ්මතුන් වහන්සේ විසින් එතෙම දක්නා ලද්දේද?"

"ගෘහපතිය, එසේය."

"ස්වාමීනි, ඒ ආයුෂ්මත්තෙම දැන් කොහි වාසය කෙරේද? මෙසේ කී කල්හි ආයුෂ්මත් ඉසිදත්ත තෙමේ තුෂ්ණිම්භූත විය.

"ස්වාමීනි, ආර්යයන් වහන්සේ අපගේ ඉසිදත්ත ස්ථවිරයෝද?"

"ගෘහපතිය, එසේය."

"ස්වාමීනි, ආර්ය ඉසිදත්ත ස්ථවිරයන් වහන්සේ මච්ඡිකාසණ්ඩයෙහි විසීමට කැමති වෙත්වා. අම්බාටක වනය සිත්කලුය. මම ආර්ය ඉසිදත්ත ස්ථවිරයන් වහන්සේට චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර සැපයීමට උත්සාහ කරන්නෙමි.

"ගෘහපතිය (තොප විසින්) යහපතක් කියනු ලැබෙයයි" කීය.

8. "ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ඉසිදත්ත, ස්ථවිරයන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව ස්ථවිර

භික්ෂූන් ප්‍රණීතවූ කෑයුතු දෙයින් බුදියයුතු දෙයින් සියතින් වැළඳවිය. ඇතැයි ප්‍රතික්ෂේප කරවීය. ඉක්බිති වළඳා පාත්‍රයෙන් ඉවත්කරන ලද අත් ඇති ස්ථවිර භික්ෂූහු ආසනයෙන් නැගිට ගියාහුය. ඉක්බිති ආයුෂ්මත් ප්‍රධාන ස්ථවිර තෙම ආයුෂ්මත් ඉසිදත්ත ස්ථවිරයන්ට "ඇවැත් ඉසිදත්තය, තොපට මේ ප්‍රශ්නය වැටහීම යහපතකි. මේ ප්‍රශ්නය මට නොවැටහුණේය. ඇවැත්නි ඉසිදත්තය, එහෙයින් යම් අන් දවසෙක්හිද මෙබඳු ප්‍රශ්නයක් පැමිණෙන්නේ නම් මෙහි තොපිම කියන්නේයයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ඉසිදත්තතෙමේ සෙනසුන හකුළුවා පාත්‍ර සිවුරුගෙන මච්ඡිකාසණ්ඩයෙන් වැඩියේය. යම්හෙයකින් මච්ඡිකාසණ්ඩයෙන් ගියේද එසේ ගියේම විය නැවත ආපසු නොආයේය.

---

## 4. මහක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි බොහෝ ස්ථවිර භික්ෂූහු අම්බාටක වනයෙහිවූ මච්ඡිකාසණ්ඩ නම් වනලැහැබෙහි වාසය කෙරෙත්. එකල්හි චිත්ත ගෘහපති තෙම ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ස්ථවිර භික්ෂූන් වැඳ එක්පසෙක උන්නේය. එකත් පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූන්ට, "ස්වාමීනි, තෙරුන් වහන්සේලා සෙට දවස පිණිස මාගේ ගව කුලහෙි බත ඉවසත්වායි" ආරාධනා කළේය, ස්ථවිර භික්ෂූහු තුෂ්ණිම්භාවයෙන් ඉවසූහ. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූන්ගේ ඉවසීම දැන, හුනස්නෙන් නැගිට, ස්ථවිර භික්ෂූන් වැඳ ගෞරවකොට ගියේය.

2. ඉක්බිති ස්ථවිර භික්ෂූහු ඒ රාත්‍රියගේ ඇවෑමෙන් උදය වරුයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන චිත්ත ගෘහපතිහුගේ ගව කුලය යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ පණවන ලද අස්නෙහි වැඩහුන්නාහුය. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම ස්ථවිර භික්ෂූන් ප්‍රණීතවූ ගිතෙල් සහිත කිරිබතින්

සියතින් වැළඳවිය. ඇතැයි ප්‍රතික්ෂේප කරවීය. ඉක්බිති වළඳා පාත්‍රයෙන් බැහැර කරනලද අත් ඇති ස්ථවිර භික්ෂූහු හුන් අස්නෙන් නැගිට ගියාහුය. චිත්ත ගෘහපතිතෙමේද, කිරිබත් අනුභව කරමින් සිට ඉතිරිය ඉවත් කරවයි කියා ස්ථවිර භික්ෂූන් පිටුපසින් ගියේය. එකල්හි ශරීරය දැවෙන තරම් උෂ්ණය ඉතා අධිකය, ඒ යහපත් ආහාර වැළඳූ ස්ථවිර භික්ෂූහු හැකිලෙමින් යත්.

3. එකල්හි වනාහි ආයුෂ්මත් මහක ස්ථවිරතෙම ඒ භික්ෂු සංඝයා අතර සියල්ලන්ට බාලවූයේවේ. එකල්හි ආයුෂ්මත් මහක ස්ථවිරතෙම ආයුෂ්මත් ප්‍රධාන ස්ථවිරයන්ට, "ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, යම් සීත වාතයක් හමුවන්නේ නම් වළාකුල් නගින්නේ නම් වැහි පොද එක දෙක වැටෙන්නේ නම් හොඳනේදැයි" කීය.

"ඇවැත්නි, මහක සීත වාතයක් හමන්නේනම් වළාකුල් නගින්නේ නම් වැහිපොද එක දෙක වැටෙන්නේ නම් හොඳයයි කීය. ඉක්බිති ආයුෂ්මත් මහක ස්ථවිරතෙමේ යම් සේ සිහිල් වාතය හමන්නේද, වලාකුල් නගින්නේද වැහි පොද එක දෙක වැටෙන්නේද, එවැනි ඍද්ධියක් දැක්වීය.

4. ඉක්බිති චිත්ත ගෘහපතිහට මේ භික්ෂු සංඝයා අතර යම් මේ සියල්ලන්ට බාලවූ භික්ෂුවක් ඇද්ද ඔහුගේ ඍද්ධි ආනුභාවය මෙබඳුයයි සිත්විය. ඉක්බිති ආයුෂ්මත් මහක ස්ථවිරතෙම ආරාමයට පැමිණ ආයුෂ්මත් ප්‍රධාන ස්ථවිරයන්ට ස්වාමීනි, ස්ථවිරයෙනි, මෙපමණක් ප්‍රමාණදැයි" කීය. "ඇවැත් මහකය, මෙපමණක් ප්‍රමාණය. ඇවැත් මහකය, මෙපමණකින් කරනලදී. ඇවැත් මහකය, මෙපමණකින් පුදනලදීය"යි කියනලදී. ඉක්බිති ස්ථවිර භික්ෂූහු යම් සේ විහාරයන් කරා වැඩියාහුය. ආයුෂ්මත් මහකය තමාගේ වෙහෙරට ගියේය.

5. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම, ආයුෂ්මත් මහක ස්ථවිරයන් වෙත පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහක ස්ථවිරයන් වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් මහක ස්ථවිරයන්ට "ස්වාමීනි ආර්ය මහකයන්වහන්ස,

මට මනුෂ්‍ය ධර්මයන්ට වඩා උතුම් ඍද්ධිප්‍රාතිහාර්යයක් දක්වන්නේ නම් යහපතැයි” කීයේය.

“ගෘහපතිය, ඔබ එසේ වීනම් පිළෙහි උතුරු සළුව අතුරා තණ මිටියක් විසුරුවයයි කීය. “ස්වාමීනි, එසේයයි” කියා චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් මහක ස්ථවිරයන්ගේ වචනය පිළිගෙන පිළෙහි උතුරුසළුව දමා ඊපිට තණ මිටියක් විසුරුවේය.

**6.** ඉක්බිති ආයුෂ්මත් මහක ස්ථවිරතෙම විහාරයට ප්‍රවිෂ්ටව යතුරු අගුල දමා යම්සේ යතුරු කපල්ලෙන්ද අගුල අතරින්ද ගිනි දැල් නික්ම තෘණ දැවෙන්නේද, උතුරුසළුව නොදැවෙන්නේද, එබඳු ඍද්ධියක් පෑයේය. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම උතුරුසළුව ගසා දමා සංවේගයෙන් ලොමු ඩැහැගත්තෙක්ව එක් පසෙක සිටියේය. ඉක්බිති ආයුෂ්මත් මහක ස්ථවිරතෙම විහාරයෙන් නික්ම ‘ගෘහපතිය මෙපමණක් සෑහේදැයි” කීයේය.

“ස්වාමීනි, මහක ස්ථවිරයන්වහන්ස, මෙපමණක් සෑහෙයි ස්වාමීනි මහක ස්ථවිරයන් වහන්ස, මෙපමණකින් කරන ලද්දේ වෙයි. මෙපමණකින් පුදන ලද්දේවෙයි. ස්වාමීනි, මහක ස්ථවිරයෙනි, ආර්යයන් වහන්සේ මච්ඡිකාසණ්ඩයෙහි විසීමට කැමැති වේවා, අම්බාටක වනය සිත්කලුය. මම ආර්යයන් වහන්සේට චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර සැපයීමට උත්සාහ කරන්නෙමි.”

“ගෘහපතිය, යහපතක් කියනු ලැබෙයයි” කීය. ඉක්බිති ආයුෂ්මත් මහක ස්ථවිරතෙම සෙනසුන හකුලා පා සිවුරුගෙන මච්ඡිකාසණ්ඩයෙන් ගියේය. යම් හෙයකින් මච්ඡිකාසණ්ඩයෙන් ගියේද, එසේ ගියේම විය. ආපසු නැවත නොආයේය.

---

## 5. කාමභූ සූත්‍රය. (1)

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් කාමභූ ස්ථවිරයන් වහන්සේ මච්ඡිකාසණ්ඩයෙහි අම්බාටක වනයෙහි වාසය කරති. ඉක්බිති චිත්ත ගෘහපති තෙම ආයුෂ්මත්

කාමභූස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් කාමභූ ස්ථවිරයන් වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් චිත්ත ගෘහපති තෙම ආයුෂ්මත් කාමභූ ස්ථවිරතෙම මෙසේ කීය. "ගෘහපතිය, "පිරිසිදු අංග ඇත්තාවූ සුදුවැස්මක් ඇත්තාවූ එක් අලවංගුවක් නොහොත් වක් දැත්තක් ඇති රථයක් පවත්නේය. සිඳිනලද ශ්‍රොතය ඇති බන්ධන රහිතවූ කෙළවරට ගියාවූ දුක් නැත්තහු බලව." ගෘහපතිය, සැකෙවින් කියන ලද මේ ගාථාවේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දත යුත්තේ දැයි" කීය.

"ස්වාමීනි, කිමෙක්ද, මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දක්ද?"

"ගෘහපතිය, එසේය."

"ස්වාමීනි, එසේනම් මෙහි අර්ථය මෙනෙහි කරන තුරු මොහොතක් ඉවසන සේක්වා."

**2.** ඉක්බිති චිත්ත ගෘහපතිතෙම මොහොතක් තුෂ්ණිම්භූතව සිට ආයුෂ්මත් කාමභූ තෙරුන්ට "ස්වාමීනි, පිරිසිදු අඞ්ග යන මෙය සීලයන්ට නමකි. සුදු වැස්ම යන මෙය අර්හත් ඵලයට නමකි. ස්වාමීනි, අලවංගුව නොහොත් දත්ත යන මෙය සිහියට නමකි. ස්වාමීනි, පැවැත්ම යන මෙය ඉදිරියට යාම ආපසු ඒම යන මීට නමකි. ස්වාමීනි, රථය යන මෙය මව්පියන්ගෙන් බත් කොමුපිඩු වලින් වැඩුණු අනිත්‍යවූ, ඉලීම, මැඩීම, බිඳීම, විනාශය ස්වභාවය කොට ඇති සතර මහා භූතයන්ගෙන් උපන් ශරීරයට නමකි. ස්වාමීනි, රාගය දුකකි. ද්වේෂය දුකකි. මොහය දුකකි. ඒ රාග දොෂ මෝහයෝ ක්ෂීණාශ්‍රව භික්ෂුවට ප්‍රහීණ වූවාහුය. සිඳින ලද මුල් ඇත්තාහුය. (මුදුන සිඳිනලද) තල් ගසක් මෙන් කරන ලද්දාහ. අභාවයට පමුණුවන ලද්දාහ. නැවත නූපදින තත්ත්වයට පමුණුවන ලද්දාහ. එසේ හෙයින් ක්ෂීණාශ්‍රව භික්ෂුවට දුක් නැත්තේයයි කියනු ලැබේ. ස්වාමීනි, කෙළවරට ගිය යනු රහතන් වහන්සේට නමකි. ස්වාමීනි ශ්‍රොතය යනු තෘෂ්ණාවට මෙය නමකි. ඒ තෘෂ්ණාව ක්ෂීණාශ්‍රව භික්ෂුව විසින් ප්‍රහීණ කරණ ලද්දීය. සිඳින ලද මුල් ඇත්තීය. කරටිය සිඳිනලද

තල් ගසක් මෙන් කරන ලද්දීය. අභාවයට යවන ලද්දීය. මතු නූපදින ස්වභාවයට පමුණුවන ලද්දීය. එසේ හෙයින් ක්ෂීණාශ්‍රව භික්ෂුව සිඳින ලද ශ්‍රොතය ඇත්තේයයි කියනු ලැබේ.

3. "ස්වාමීනි, රාගය වනාහි බන්ධනයකි. ද්වේෂය බන්ධනයකි. මොහය බන්ධනයකි. ඒ රාග දොෂ මෝහයෝ ක්ෂණාශ්‍රව භික්ෂුව විසින් ප්‍රහීණ කරන ලද්දාහ. සිඳිනලද මුල් ඇත්තාහ. තල් ගසක් මෙන් කරන ලද්දාහ. අභාවයට යවන ලද්දාහ. මතු නූපදින තත්ත්වයට පමුණුවන ලද්දාහ. එනිසා ක්ෂීණාශ්‍රව භික්ෂුවට බන්ධන රහිතයයි කියනු ලැබේ.

"ස්වාමීනි, මෙසේ වනාහි භාග්‍යවතුන්වහන්සේ විසින් 'පිරිසිදු අඞ්ග ඇත්තාවූ සුදු වැස්මක් ඇත්තාවූ එක් අලවංගුව නොහොත් දැත්තක් ඇත්තාවූ රථයක් පවතියි සිඳින ලද ශ්‍රොතය ඇත්තාවූ බන්ධන රහිතවූ කෙළවරට ගියාවූ දුක් නැති යහු බලව' යන යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ සංක්ෂේපයෙන් වදාරන ලද්දේ මෙහි අර්ථය විස්තර වශයෙන් මෙසේ දනිමියි" කීය. "ගෘහපතිය, මෙබඳු තොපගේ ප්‍රඥාචක්ෂුස ගැඹුරු බුද්ධ වචනයෙහි ගමන් කෙරේද, එය තොපට ලාභයකි. ගෘහපතිය තොප විසින් යහපත් ලැබීමකි"යි කීය.

---

## 6. කාමභූ සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක ආයුෂ්මත් කාමභූ ස්ථවිරයන් වහන්සේ අම්බාටක වනයෙහිවූ මච්ඡිකා සණ්ඩනම් වන ලැහැබෙහි වාසය කරති. එකල්හි චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූ ස්ථවිරයන් යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ කාමභූ ස්ථවිරයන් වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන් "ස්වාමීනි, සංස්කාරයෝ කෙතෙක්දැයි" ඇසීය.

"ගෘහපතිය, කාය සංස්කාරය, වචී සංස්කාරය, චිත්ත සංස්කාරයයි සංස්කාර තිදෙනෙකි."

2. "ස්වාමීනි, යහපතැයි" චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූ තෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන්, "ස්වාමීනි, කාය සංස්කාරය කවරේද, වචී සංස්කාරය කවරේද, චිත්ත සංස්කාරය කවරේදැයි" තවත් ප්‍රශ්නයක් ඇසීය.

"ගෘහපතිය, ආශ්වාස ප්‍රශ්වාසය වනාහි කාය සංස්කාර නම්, විතර්ක විචාරය වචී සංස්කාර නම්, සංඥාවද වේදනාවද චිත්ත සංස්කාර නමියි" කීයේය.

3. "ස්වාමීනි, යහපතැයි චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූ තෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව, ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන්, ස්වාමීනි, ආශ්වාස ප්‍රශ්වාසයෝ කවර හෙයකින් කාය සංස්කාරද, කවර හෙයකින් විතර්ක විචාරයෝ වචී සංස්කාරද, කවර හෙයින් සංඥාවද වේදනාවද වාක් සංස්කාරදැයි' තවත් ප්‍රශ්නයක් ඇසීය.

"ගෘහපතිය ආශ්වාස ප්‍රශ්වාසයෝ කායිකය මේ ධර්මයෝ කය පිළිබඳය, එසේ හෙයින් ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය සංස්කාර වෙත්. ගෘහපතිය, පළමුකොට කල්පනාකොට විචාරනය කොට පසුව වචන පිටකරයි. එහෙයින් විතර්ක විචාරයෝ වාක් සංස්කාරවෙති. සංඥාවද වේදනාවද චෛතසිකයෝය. මේ ධර්මයෝ සිත පිළිබඳය. එසේ හෙයින් සංඥාවද, වේදනාවද චිත්ත සංඛාර වෙත්."

4. "ස්වාමීනි, යහපතැයි චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූතෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව, ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන්, ස්වාමීනි, කෙසේ වනාහි සංඥා වෙදයිත නිරෝධ සමාපත්තිය වේදැයි" තවත් ප්‍රශ්නයක් ඇසීය.

"ගෘහපතිය, සංඥාවෙදයිත නිරෝධයට සමවදින භික්ෂුවට මම සංඥාවෙදයිත නිරෝධයට සම වදින්නෙමියි' කියා හෝ 'මම සංඥාවෙදයිත නිරෝධයට සමවදිමි' කියා හෝ 'මෙ සංඥා

වෙදයිත නිරෝධයට සමවැදුනෙමියි’ කියා හෝ මෙසේ අදහස් නොවේ. හුදෙක් ඔහු විසින් යම් ඒ සිතක් ඒ බවට පැමිණෙයිද ඔහු විසින් පළමුකොටම ඒ ආකාරයෙන් පුරුදුකරන ලද්දේ වේයයි කීය.

**5.** “චිත්ත ගෘහපතිතෙම, ස්වාමීනි, යහපතැයි ආයුෂ්මත් කාමභූතෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව, ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන්, සංඥාවෙදයිත නිරෝධයට සමවදින භික්ෂුවට කාය සංස්කාරය හෝ වචී සංස්කාරය හෝ චිත්ත සංස්කාරය හෝ කවර ධර්ම කෙනෙක් පළමුවෙන් නිරුද්ධවෙත් දැයි” තවත් ප්‍රශ්නයක් විචාළේය.

“ගෘහපතිය, සංඥාවෙදයිත නිරෝධයට සමවදින භික්ෂුවට වචී සංස්කාරය පළමුව නිරුද්ධවේ. ඉක්බිති කාය සංස්කාරයද ඉක්බිති චිත්ත සංස්කාරයද නිරුද්ධ වෙයි.

**6.** “ස්වාමීනි, යහපතැයි” ආයුෂ්මත් කාමභූතෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව, ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන්, ගෘහපතිතෙම, ස්වාමීනි, යමෙක් මළේද, කළුරිය කෙළේද යම් මේ භික්ෂුවක් සංඥා වෙදයිත නිරෝධයට සම වැදුනේද මොවුන්ගේ වෙනස කවරේදැයි” තවත් ප්‍රශ්නයක් විචාළේය.

“ගෘහපතිය යමෙක් මළේද, කළුරිය කළේද, ඔහුගේ කාය සංස්කාරය නිරුද්ධවූයේය. සංසිඳුනේය, වචී සංස්කාරය නිරුද්ධවූයේය, සංසිඳුනේය, චිත්ත සංස්කාරය නිරුද්ධවූයේය, සංසිඳුනේය. ප්‍රාණය නිරුද්ධවිය, උෂ්ණය සංසිඳුනේය, ඉන්ද්‍රියයෝ බිඳුනාහ. ගෘහපතිය, යම් මේ භික්ෂුවක් වනාහි සංඥාවෙදයිත නිරෝධයට සමවැදුනේද, ඔහුගේද කාය සංස්කාරය නිරුද්ධ වූයේය, සංසිඳුනේය. වාක් සංස්කාරයද නිරුද්ධවූයේය, සංසිඳුනේය. චිත්ත සංස්කාරයද නිරුද්ධවූයේය, සංසිඳුනේය. ප්‍රාණය නිරුද්ධ නොවීය. උෂ්ණය නොසංසිඳුනේය. ඉන්ද්‍රියයෝ ප්‍රසන්නයහ. ගෘහපතිය, යමෙක් වනාහි මළේද කාලක්‍රියා කළේද, යම් මේ භික්ෂුවක් සංඥා වෙදයිත නිරෝධයට පැමිණියේද මේ ඔවුන්ගේ වෙනසයයි” කීය.

7. "ස්වාමීනි, යහපතැයි" චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූතෙරුන්ගේ වනයට සතුටුව අනුමෝදන්ව, ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන්, ස්වාමීනි. කෙසේ වනාහි සංඥාවෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටීම වේදැයි තවත් ප්‍රශ්නයක් විචාළේය.

'ගෘහපතිය, සංඥාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගිටින භික්ෂුවට 'මම සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටින්නෙමියි' කියා හෝ 'මම සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටිමියි' කියා හෝ 'මම සංඥා වෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගිට්ටෙමියි' කියා හෝ මෙසේ අදහස් නොවේ. හුදෙක් යම්සේ සිත ඒ බවට පැමිණෙයිද ඔහු විසින් පළමුකොටම එසේ පුරුදු කරන ලදැයි කීය.

8. "ස්වාමීනි, යහපතැයි, චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූතෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව, ආයුෂ්මත් කාමභූ තෙරුන්ගෙන්, ස්වාමීනි, සංඥාවෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටින භික්ෂුවට කාය සංස්කාරය හෝ වචීසංස්කාරය හෝ චිත්ත සංස්කාරය හෝ කවර ධර්මකෙනෙක් පළමුව උපදිත් දැයි" තවත් ප්‍රශ්නයක් විචාළේය.

"ගෘහපතිය, සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටින්නාවූ භික්ෂුවට පළමුව චිත්ත සංස්කාරය උපදී. ඊට පසු කාය සංස්කාරය උපදී. ඉක්බිති වාක් සංස්කාරය උපදී යයි" කීයේය.

9. ස්වාමීනි, යහපතැයි" චිත්තගෘහපතිතෙම, ආයුෂ්මත් කාමභූතෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආයුෂ්මත් කාමභූතෙරුන්ගෙන්, ස්වාමීනි, සංඥාවෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටින භික්ෂු කෙතෙක් ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්දැයි" තවත් ප්‍රශ්නයක් විචාළේය.

"ගෘහපතිය සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටි භික්ෂුව සුඤ්ඤතඵස්සය, අනිමිත්ත ඵස්සය, අප්පණිහිත ඵස්සය යන තුන් ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්යයි" කීයේය.

10. "ස්වාමීනි. යහපතැයි" චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූතෙරුන්ගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආයුෂ්මත් කාමභූතෙරුන්ගෙන්, "ස්වාමීනි, සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටි භික්ෂුවගේ සිත කුමකට නැමුණේ වෙයිද, යොමුවූයේ වෙයිද, බරවූයේ වෙයිදැයි" තවත් ප්‍රශ්නයක් විචාළේය.

"ගෘහපතිය, සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි භික්ෂුවගේ සිත නිවනට නැමුණේ වෙයි, නිවනට යොමුවූයේ වෙයි. නිවනට බරවූයේ වෙයි."

11. "ස්වාමීනි, යහපතැයි" චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් කාමභූ ස්ථවිරයන්ගේ වචනයට සතුටුව කැමැතිව ස්වාමීනි සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියට කවර ධර්ම කෙනෙක් බොහෝ උපකාර වෙත්දැයි" ආයුෂ්මත් සාමභූ ස්ථවිරයන්ගෙන් තවත් ප්‍රශ්නයක් විචාළේය.

"ගෘහපතිය, ඔබ ඒකාන්තයෙන් පළමුව ඇසිය යුත්ත පසුව අසන්නෙහිය, නමුත් තොපට මම ප්‍රකාශ කරන්නෙමි ගෘහපතිය, සංඥා වෙදයිත නිරෝධ සමාපත්තියට සමථය හා විදර්ශනාව යන ධර්ම දෙකක් බොහෝ උපකාරයහ."

---

## 7. ගෝදත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ගොදත්ත ස්ථවිරයන් වහන්සේ අම්බාටක වනයෙහිවූ මච්ඡිකාසණ්ඩනම් වනලැහැබෙහි වාසය කරණසේක. එකල්හි චිත්ත ගෘහපතිතෙම ආයුෂ්මත් ගොදත්ත ස්ථවිරතෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ගොදත්ත තෙරුන් වැඳ එකත්පසෙක හුන්නේය. එක්පසෙක හුන් චිත්ත ගෘහපතිහට ආයුෂ්මත් ගොදත්ත ස්ථවිරතෙම "ගෘහපතිය, යම් මේ අප්පමාණ චෙතො විමුක්තියක් වේද යම් ආකිඤ්චඤ්ඤා චෙතො විමුක්තියක් වේද, යම් සුඤ්ඤාතා චෙතො විමුක්තියක් වේද

යම් අනිමිත්ත චෙතො විමුක්තියක් වේද මේ ධර්මයෝ වෙන්වූ අර්ථ ඇත්තාහුද වෙන්වූ ව්‍යඤ්ජන ඇත්තාහු නොහොත් සමානාර්ථ ඇත්තාහුද සමාන ව්‍යඤ්ජන ඇත්තාහු දැයි” ඇසීය.

**2.** “ස්වාමීනි, යම් කරුණකට පැමිණ මේ ධර්මයෝ නොයෙක් අර්ථයහ. නොයෙක් ව්‍යඤ්ජන ඇත්තාහුද එවැනි ආකාරයක් ඇත්තේය. යම් කරුණකට පැමිණ මේ ධර්මයෝ සමානාර්ථ සහ සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද එවැනි ආකාරයක්ද ඇත්තේය. ස්වාමීනි, යම් කරුණකට පැමිණ නොයෙක් අර්ථ සහ නොයෙක් ව්‍යඤ්ජන ඇත්තාහුද, ඒ ආකාරය කවරේද? ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයිද එසේම දෙදිසාවක්, තෙදිසාවක්, සතර දිසාවක් මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් සියලු තැන සියලු ලෝකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයිද කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයිද එසේම දෙදිසාවක්, තෙදිසාවක්, සතර දිසාවක්, මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් සියලු තැන සියලු ලෝකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයිද මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයිද, එසේම දෙදිසාවක් තෙදිසාවක්, සතරදිසාවක්, මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් සියලු තැන සියලු ලෝකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයිද උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයිද එසේම දෙදිසාවක්, තුන් දිසාවක්, සතර දිසාවක් මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් සියලු තැන සියලු ලෝකය මහත්වූ මහත් බවට ගියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරයිද ස්වාමීනි, මේ අප්‍රමාණ චෙතො විමුක්තියයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "ස්වාමීනි, ආකිඤ්චඤ්ඤා චෙතො විමුක්තිය කවරේද? ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයිද, ස්වාමීනි, මේ ආකිඤ්චඤ්ඤාචෙතො විමුක්තියයයි කියනු ලැබේ.

4. "ස්වාමීනි, සුඤ්ඤතා චෙතො විමුක්තිය කවරේද, ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම ආරණ්‍යයකට ගියේ හෝ වෘක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ මේ පඤ්චස්කන්ධය මමය මාගේයයි ගතයුත්තකින් ශූන්‍යයයි මෙසේ මෙනෙහි කරන්නේද ස්වාමීනි, මෙය සුඤ්ඤතා චෙතො විමුක්තියයි කියනු ලැබේ.

5. "ස්වාමීනි, අනිමිත්ත චෙතො විමුක්තිය කවරේද? ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම සියලු රාගාදී නිමිතින් නොමෙනෙහි කිරීමෙන් අනිමිත්ත චෙතො සමාධියට පැමිණ වාසය කරයිද, ස්වාමීනි, මේ අනිමිත්ත චෙතො සමාධියයි කියනු ලැබේ.

6. "ස්වාමීනි, යම් ආකාරයකට පැමිණ මේ ධර්මයෝ නොයෙක් අර්ථයහ. නොයෙක් ව්‍යඤ්ජන ඇත්තාහුද මේ ඒ ආකාරයයි.

"ස්වාමීනි, යම් ආකාරයකට පැමිණ මේ ධර්මයෝ සමානාර්ථයහ. සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද ඒ ආකාරය කවරේද? ස්වාමීනි. රාගය ප්‍රමාණකර වෙයි, ද්වේෂය ප්‍රමාණ කරවෙයි, මොහය ප්‍රමාණ කරවෙයි ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ ඔව්හු ප්‍රහීණ වූවාහුය. සිඳිනලද මුල් ඇත්තාහ. අග සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දාහ. නැවත ඇතිවීම නැති කරන ලද්දාහ. මතු නූපදින ස්වභාව ඇත්තාහ. ස්වාමීනි, යම්තාක් අප්පමාණ චෙතො විමුක්ති ඇත්තාහුද ඔවුන් අතුරෙන් අර්හත්ඵල චෙතො විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත්ඵල චෙතො විමුක්තිය රාගයෙන් ශූන්‍යය, ද්වේෂයෙන් ශූන්‍යය, මොහයෙන් ශූන්‍යය.

7. "ස්වාමීනි, රාගය පීඩාවකි. ද්වේෂය පීඩාවකි. මොහය පීඩාවකි. ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ ඔව්හු පහවූවාහුය. සිඳිනලද

මුල් ඇත්තාහ. අග සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දාහ. අභාවයට යවන ලද්දාහ. මතු නූපදින ස්වභාවය ඇත්තාහ.

8. "ස්වාමීනි, යම්තාක් ආකිඤ්චඤ්ඤා චෙතො විමුක්ති වෙත්ද, ඔවුන් අතුරෙන් අර්හත්ඵල චෙතො විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත්ඵල චෙතො විමුක්තිය රාගයෙන් ශූන්‍යය, ද්වේෂයෙන් ශූන්‍යය, මොහයෙන් ශූන්‍යය. ස්වාමීනි, රාගය සත්වයා සලකුණු කරන්නකි. ද්වේෂය සලකුණු කරන්නකි. මොහය සලකුණු කරන්නකි. ක්ෂීණාශ්‍රව භික්ෂුවගේ ඔව්හු පහවූහ. සිඳිනලද මුල් ඇත්තාහ. අග සිඳින ලද තල්ගසක් මෙන් කරන ලද්දාහ. මතු නූපදින ස්වභාවය ඇත්තාහ.

9. "ස්වාමීනි, යම්තාක් අනිමිත්ත චෙතො විමුක්ති ඇත්තාහුද, ඔවුන් අතුරෙන් අර්හත්ඵල චෙතො විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත්ඵල චෙතො විමුක්ති රාගයෙන් ශූන්‍යය. ද්වේෂයෙන් ශූන්‍යය. මොහයෙන් ශූන්‍යය. ස්වාමීනි, යම් ආකාරයකට පැමිණ මේ ධර්මයෝ සමානාර්ථ සහ සමාන ව්‍යඤ්ජන ඇත්තාහුද, මේ ඒ ආකාරය වෙයි."

10. "ගෘහපතිය, ගැඹුරුවූ බුද්ධ වචනයෙහි යම්බදුවූ තොපගේ ප්‍රඥාචක්ෂුස බැස ගනීද ගෘහපතිය එය තොපට ලාභයකි. ගෘහපතිය, ඔබට යහපත් ලැබීමකියි" වදාළේය.

---

## 8. නිගණ්ඨ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එකල්හි වනාහි නිගණ්ඨනාත පුත්‍රතෙම මහත් නිගණ්ඨ පිරිසක් සමග මච්ඡිකාසණ්ඩයට පැමිණියේය. චිත්ත ගෘහපතිතෙම නිගණ්ඨනාත පුත්‍රතෙම මහත් නිගණ්ඨ පිරිසක් සමග මච්ඡිකාසණ්ඩයට පැමිණියේයයි ඇසුවේය. එකල්හි චිත්ත ගෘහපතිතෙම බොහෝ උපාසක පිරිසක් සමග නිගණ්ඨනාත පුත්‍ර තෙම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ නිගණ්ඨනාත පුත්‍රයා සමග සතුටුවිය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් චිත්ත ගෘහපතිහට නිගණ්ඨනාත පුත්‍රතෙම

ගෘහපතිය ශ්‍රමණ ගෞතමයන්ගේ අවිතර්ක අවිචාර සමාධියක් ඇත, විතර්ක විචාරයන්ගේ නිරෝධයක් ඇත යන මෙය ඔබ අදහන්නෙහිදැයි” ඇසීය.

“ස්වාමීනි, මම අවිතර්ක අවිචාර සමාධියක් ඇත, විතර්ක විචාරයන්ගේ නිරෝධයක් ඇතැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් නොඅදහමියි” කීයේය.

**2.** මෙසේ කී කල්හි නිගණ්ඨනාත පුත්‍රතෙම සිය පිරිස බලා “පින්වත්හු මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ ඍජුද, මේ චිත්ත ගෘහපතිතෙම කෛරාටික නොවන්නේද, මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ මායා නැත්තෙක්දැයි බලත්වා. යමෙක් විතර්ක විචාරයන් නිරුද්ධ කළයුතුකොට සිතන්නේ නම් හෙතෙම වාතය දැලෙන් බඳින්නට සිතන්නේය. යමෙක් විතර්ක විචාරයන් නිරුද්ධකළයුතුකොට සිතන්නේනම් හෙතෙම තම මිටින් ගඞ්ගා ජලය වළක්වන්නට සිතන්නේයයි” කීයේය.

**3.** “ස්වාමීනි, ඒ කිමැයි සිතන්නෙහිද? ඥාණය ශ්‍රද්ධාව යන දෙකින් කවරක් වනාහි අතිශයින් ප්‍රණීතද?”

“ගෘහපතිය ශ්‍රද්ධාවට වඩා ඥාණය අතිශයින් ප්‍රණීතය.”

“ස්වාමීනි, මම වනාහි යම් විටෙක කැමැත්තෙම් නම් කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරමි. ස්වාමීනි, මම යම් විටෙක කැමැත්තෙම් නම් විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරමි. ස්වාමීනි, මම යම් විටෙක කැමැත්තෙම් නම් ප්‍රීතියද දුරු කිරීමෙන් අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරමි. ස්වාමීනි, මම යම් විටෙක කැමැත්තෙම් නම් සැප දුරු කිරීමෙන්ද දුක දුරු කිරීමෙන්ද, පළමුව සොම්නස් දොම්නස් දෙදෙනාගේ පහකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ

උපෙක්ඛා සති දෙදෙනාගේ පිරිසිදුකම ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වාසය කරමි. ස්වාමීනි, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මම වනාහි අන් කවර ශ්‍රමණයකු කෙරෙහි හෝ බ්‍රාහ්මණයකු කෙරෙහි හෝ ශ්‍රද්ධාවෙන් අවිතර්ක අවිචාර සමාධිය ඇත්තේය. විතර්ක විචාරයන්ගේ නිරෝධය ඇත්තේයයි අදහන්නෙම්ද?"

4. මෙසේ කී කල්හි නිගණ්ඨනාත පුත්‍රතෙම සිය පිරිස බලා "පින්වත්හු මේ චිත්ත ගෘහපතිතෙම කොතරම් වංකද, කොපමණ කෛරාටිකද, මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ මායාකාරයෙක්දැයි බලත්වා."

"ස්වාමීනි, දැන්ම වනාහි අපි ඔබවහන්සේ විසින් 'පින්වත්හු මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ ඍජුද, මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ කෛරාටික නොවන්නේද, මේ චිත්ත ගෘහපතිතෙම මායාකාරයෙක් නොවන්නේදැයි' කියන ලද්ද දනිමු. ස්වාමීනි, දැන්ම අපි 'පින්වත්හු මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ වංකද, මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ කෛරාටිකද, මේ චිත්ත ගෘහපතිතෙම කොපමණ මායා ඇත්තේදැයි කියන ලද්ද' මෙසේ දනිමු. ස්වාමීනි ඉදින් නුඹවහන්සේ විසින් මුලින් කියන ලද්ද සත්‍යනම් ඔබ වහන්සේ විසින් පසුව කියන ලද්ද බොරුය. ස්වාමීනි ඉදින් ඔබවහන්සේ විසින් පසුව කියන ලද්ද සත්‍යනම් පළමුව කියන ලද්ද අසත්‍යය.

5. "ස්වාමීනි, මේ කරුණු සහිත ප්‍රශ්න දහයක් වෙත්. ඔවුන්ගේ අර්ථය යම් කලෙක තේරුම් ගන්නේද, එකල්හි නිගණ්ඨ පිරිස සමග මා කරා පැමිණ දැන්වුව මැනව. එනම් එක් ප්‍රශ්නයකි. එක් උදෙසීමකි (තේරුම් කරන හෝ සිහි කරන) එක් වෙය්‍යාකරණයකි. ප්‍රශ්න දෙකකි. උද්දෙශ දෙකකි. වෙය්‍යාකරණ දෙකකි. ප්‍රශ්න තුනෙකි උද්දෙශ තුනෙකි. වෙය්‍යාකරණ තුනෙකි ප්‍රශ්න සතරකි. උද්දෙශ සතරකි. වෙය්‍යාකරණ සතරකි. ප්‍රශ්න පසකි. උද්දෙශ පසකි වෙය්‍යාකරණ පසකි. ප්‍රශ්න සයකි. උද්දෙශ සයකි. වෙය්‍යාකරණ සයකි. ප්‍රශ්න සතකි. උද්දෙශ සතකි. වෙය්‍යාකරණ සතකි. ප්‍රශ්න අටකි. උද්දෙශ අටකි. වෙය්‍යාකරණ අටකි. ප්‍රශ්න නවයකි උද්දෙශ

නවයකි වෙයයාාකරණ නවයකි. ප්‍රශ්න දසයකි. උද්දෙශ දසයකි. වෙයයාාකරණ දසයකි" යනුයි. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම නිගණ්ඨනාත පුත්‍රයාගෙන් කරුණු සහිත මේ ප්‍රශ්න දසය අසා හුනස්නෙන් නැගිට ගියේය.

---

## 9. අචේල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එකල්හි වනාහි චිත්ත ගෘහපතියාගේ පෙර ගිහි යහළුවෙකුවූ අචෙල කාශ්‍යපතෙම මච්ඡිකාසණ්ඩයට පැමිණියේය. චිත්ත ගෘහපතිතෙම අපගේ පෙර ගිහි යහළුවූ අචෙල කාශ්‍යප තෙම මිච්ඡිකාසණ්ඩයට පැමිණියේයයි ඇසුයේය. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම අචෙල කාශ්‍යපතෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ අචෙල කාශ්‍යප සමග සතුටුවිය. සතුටුවියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් චිත්ත ගෘහපතිතෙම අචෙල කාශ්‍යපට, "ස්වාමීනි, කාශ්‍යපය පැවිදිවී කොපමණ කල් වන්නේදැයි' ඇසීය.

2. "ගෘහපතිය මා පැවිදිව තිස් වර්ෂයක් පමණ වන්නේ යයි කීයේය."

"ස්වාමීනි, මේ තිස් වර්ෂයක් පමණ කාලය තුළ ඔබ විසින් මනුෂ්‍ය ධර්මයන්ට වඩා උසස්වූ ආර්ය ඥාන දර්ශන විශෙෂයක්වූ සැප විහරණයක් අවබොධ කරන ලද්දේදැයි" ඇසීය.

"ගෘහපතිය, මා විසින් මේ වර්ෂ තිසක් පමණ කාලය තුළ නග්නබව, මුඩුබව වැලිපිසින මොණර පිල් කලඹද හැර එයින් අන්‍යවූ ආර්ය බව සිදුකිරීමෙහි සමත් ඥාන දර්ශන විශෙෂයක්වූ පහසු විහරණයක්වූ කිසි උත්තරී මනුෂ්‍ය ධර්මයක් අවබොධ නොකරන ලදැයි" කීය.

3. 'මෙසේ කීකල්හි චිත්ත ගෘහපතිතෙම අචේල කාශ්‍යපට 'පින්වත, නග්න බවද මුඩුබවද වැලිපිසින මොණරපිලද හැර එයින් අන්‍යවූ ආර්යභාවය සිදුකිරීමට සමත් ඥාණ දර්ශනයක්වූ

පහසු විහරණයක්වූ කිසි උත්තරී මනුෂ්‍ය ධර්මයක් අවබොධ නොකරනලද්දේ නම්, තොපගේ ධර්මය යහපත්කොට දෙශනාකරන ලද බව ආශ්චර්යයකි. අද්භූතයකියි" කීය.

4. "ගෘහපතිය, තොප උපාසක බවට පැමිණ කෙතෙක් කල් වන්නේද?"

"ස්වාමීනි, මාද උපාසක බවට පැමිණ අවුරුදු තිසක් පමණ වේයයි" කීය.

"ගෘහපතිය, මේ තිස් වර්ෂය තුළ තොප විසින් ආර්යබවට සුදුසුවූ ඥාන දර්ශන විශෙෂයක්වූ පහසු විහරණය ඇති උත්තරී මනුෂ්‍ය ධර්මයක් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කුමක් හෙයින් නැත්තේද? ස්වාමීනි, මම වනාහි යම් විටෙක කැමැත්තේ නම් කාමයෙන් වෙන්ව අකුසලයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරන්නෙමි. ස්වාමීනි, මම වනාහි යම් විටෙක කැමැත්තෙම් නම් විතර්ක විචාරයන් සංසිඳීමෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරමි. ස්වාමීනි, මම වනාහි යම්විටෙක කැමැත්තෙම් නම් ප්‍රීතියගේ වෙන්වීමෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරමි. ස්වාමීනි, මම වනාහි යම් විටෙක කැමැත්තෙම් නම් සැපයාගේ ප්‍රහාණයෙන්ද හටගත් ප්‍රීතිය හා සැපය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරමි. ස්වාමීනි, ඉදින් මම භාග්‍යවතුන් වහන්සේට පළමුව කාලක්‍රියා කරන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ යම් සංයොජනයකින් යුක්තවූ චිත්ත ගෘහපතිතෙම නැවත මේ ලොකයට එන්නේනම් ඒ සංයොජනය නැතැයි යම්බඳු මට මෙසේ ප්‍රකාශකරන්නේනම් එය පුදුම නොවේයයි" කීයේය.

5. මෙසේ කීකල්හි අචේල කාශ්‍යපතෙම චිත්ත ගෘහපතියාට, "යම්හෙයකින් වනාහි සුදු වස්ත්‍ර හඳින්නාවූ ගිහියෝ මෙබඳු මනුෂ්‍ය ධර්මයට වඩා උතුම්වූ ආර්යභාවය කිරීමට සමර්ථවූ ඤාණ දර්ශන විශෙෂවූ පාසු විහරණය ලබන්නේ නම් ඒ

ධර්මයාගේ ස්වාක්ඛාතබව ආශ්චර්යය අද්භූතයයි” කීයේය. “ගෘහපතිය, මේ ධර්ම විනයෙහි මම පැවිද්ද ලබන්නෙමි උපසම්පදාව ලබන්නෙමියි” කීය.

**6.** එකල්හි චිත්ත ගෘහපතිතෙම අචෙල කාශ්‍යප රැගෙන ස්ථවිර භික්ෂූහු යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ ස්ථවිර භික්ෂූන්ට “ස්වාමීනි මෙ අචෙල කාශ්‍යපතෙම අපගේ පැරණි යහලුවෙකි. ස්ථවිරයන් වහන්සේලා මොහු පැවිදිකරත්වා මම ඔහුට චීවර, පිණ්ඩපාත, සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකර යන දේ ගැන උත්සාහවත් වන්නෙමියි” කීයේය.

**7.** අචේල කාශ්‍යපතෙම මේ ධර්ම විනයෙහි පැවිද්ද ලැබුයේය. උපසම්පදාව ලැබුයේය, ආයුෂ්මත් කාශ්‍යපතෙමේ උපසපන් නොබෝකල් ඇත්තේ හුදකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව ආත්ම ආශාව අත්හැර වාසය කරන්නේ නොබෝ කලකින් කුලපුත්‍රයෝ යමක් සඳහා වහා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවෙත්ද නිරුත්තරවූ බ්‍රහ්මචරියාව අවසන්කොට ඇති ඒ නිවණ තමන් විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙළේය. ඉපදීම ක්ෂයවිය. බ්‍රහ්මචර්ය වැස නිමවනලදී. කළයුත්ත කරනලදී. මින්මතු ආත්මයක් නැතැයි දැනගත්තේය. කාශ්‍යප තෙම රහතුන්ගෙන් කෙනෙක් විය.

---

## 10. ගිලාන සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එකල්හි වනාහි චිත්ත ගෘහපතිතෙම රෝගීව දුක් සහිතව දැඩි ගිලන්වූයේය. එකල්හි බොහෝ ආරාම දේවතාවෝද වන දේවතාවෝද වෘක්ෂ දේවතාවෝද ඖෂධ ගස් වැල් ආදියටද අධිගෘහිත දේවතාවෝද එක්වී චිත්ත ගෘහපතිහට, ගෘහපතිය, අනාගත කාලයෙහි චක්‍රවර්ති රජෙක් වන්නෙමියි ප්‍රාර්ථනා කරවයි’ කීවාහුය.

**2.** මෙසේ කීකල්හි චිත්ත ගෘහපතිතෙම ඒ ආරාම දේවතාවන්ටද, වන දේවතාවන්ටද, වෘක්ෂ දේවතාවන්ටද ඖෂධ

ගස් වැල් ආදියට අධිගෘහිත දේවතාවන්ටද ‘එයද අනිත්‍යය, එයද අනියතය. එයද අත්හැර යායුතුයයි” කීයේය.

මෙසේ කීකල්හි චිත්ත ගෘහපතියාගේ යාළු මිත්‍රයෝද සහලේනෑයෝද චිත්ත ගෘහපතිහට “ආර්යපුත්‍රය, සිහිය එළවව. නොදොඩවයි” කීවාහුය.

“ආර්ය පුත්‍රය, සිහිය එලවව නොදොඩවයි’ තෙපි මට මෙසේ කියන්නේ මම තොපට කුමක් කීයෙම්දැයි? කීය.

“ආර්යපුත්‍රය, එයද අනිත්‍යය. එයද අනියතය. එයද හැර යායුතුයයි” නුඹ මෙසේ කියන්නෙහියයි” කීවාහුය.

“මට ආරාම දෙවතාවෝද, වන දෙවතාවෝද වෘක්ෂ දෙවතාවෝද, ඖෂධ ගස් වැල්වලට අධිගෘහිත දෙවතාවෝද, ‘ගෘහපතිය, අනාගත කාලයෙහි චක්‍රවර්ති රජෙක් වන්නෙමියි,” ප්‍රාර්ථනා කරවයි කීවාහුය. මම ඔවුන්ට එයද අනිත්‍යය එයද අනියතය. එයද හැර යායුතුයයි” මෙසේ කියමි.

4. “ආර්යපුත්‍රය, ආරාම දෙවතාවෝද, වනදෙවතාවෝද, වෘක්ෂදෙවතාවෝද, ඖෂද ගස් වැල්වලට අධිගෘහිත දෙවතාවෝද කවර අර්ථයක් දකිමින්, ‘ගෘහපතිය, අනාගත කාලයෙහි චක්‍රවර්ති රජෙක් වන්නෙමියි ප්‍රාර්ථනා කරවයි කීවහුද?”

“ඒ ආරාම දෙවතාවන්ට වන දෙවතාවෝද වෘක්ෂ දෙවතාවෝද, ඖෂධ ගස්වැල්වලට අධිගෘහිත දෙවතාවෝද, මේ චිත්ත ගෘහපතිතෙම සිල්වත්ය, යහපත් ස්වභාව ඇත්තේය. ඉදින් අනාගත කාලයෙහි චක්‍රවර්ති වන්නෙමියි ප්‍රාර්ථනා කරන්නේ නම් සීලවන්තයාගේ ප්‍රාර්ථනාව සම්පූර්ණ වන්නේය. සීලය පිරිසිදු බැවිනි. එසේ සම්පූර්ණවී ධාර්මිකව ධර්මයෙන් රාජ්‍යය කරන රජෙක්ව ධාර්මික පුද දෙන්නේයයි ආරාමදෙවතාවෝද, වන දෙවතාවෝද, වෘක්ෂ දෙවතාවෝද, ඖෂධ ගස් වැල්වලට අධිගෘහිත දෙවතාවෝද, මේ කාරණය දකිමින් ගෘහපතිය, අනාගත කාලයෙහි චක්‍රවර්ති රජ වන්නෙමියි ප්‍රාර්ථනා කරවයි’ කීවාහුය. මම ඔවුන්ට එයද අනිත්‍යය එයද අනියතය එයද අත්හැර යායුතුයයි” කියමි.

5. "ආර්ය පුත්‍රය, එසේ වීනම් අපටද අවවාද කරවයි" කීවාහුය.

"එසේ නම් මෙහි තොප විසින් බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූවෝ වන්නෙමු මේ කාරණයෙනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්‍ය, සම්‍යක් සම්බුද්ධය, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තය, සුගතය, ලෝකය දත් සේක. පුරුෂයන් දමනය කරන නිරුත්තර සාරථිය, දෙවි මිනිසුන්ට ශාස්තෘය, බුද්ධය, භාග්‍යවත්යයි මෙසේ හික්මිය යුතුය.

"ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූවෝ වන්නෙමු. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනාකරන ලදී. සාන්දෘෂ්ටික ඵල ඇත්තේය. කල් නොයවා දෙන ඵල ඇත්තේය. එව, බලව, කියන විධියට සුදුසුය. තමා කෙරෙහි එලවියයුතු ගුණ ඇත්තේය. නුවණැත්තන් විසින් තමා කෙරෙහි ලා දතයුතුයයි මෙසේ හික්මිය යුතුය.

"සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූවෝ වෙමු. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝයා මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පිළිපන්නේය. ගෞරවයට සුදුසු සේ පිළිපන්නේය. පුරුෂ යුග සතරක්වූ පුද්ගලයන් වශයෙන් අටදෙනෙක්වූ භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා ආගන්තුක දානයට සුදුසු වූයේය. දුරසිට ගෙනෙන දානයට සුදුසු වූයේය. නමස්කාරයට සුදුසු ලෝකයාගේ නිරුත්තර පින්කෙත වන්නේයයි මෙසේ හික්මිය යුතුය. ගෙදොර යම්කිසි දියයුතු දෙයක් ඇද්ද ඒ සියල්ල සීලවන්තයන් හා සාධාරණ දෙයක්ම වන්නේයයි තොප විසින් මෙසේ හික්මිය යුතුයයි" කීය. ඉක්බිති චිත්ත ගෘහපතිතෙම යාළු මිත්‍රයන් සහ නෑදෑයන් බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද සංඝයා කෙරෙහිද, පැහැදීමෙහි පිහිටුවා ත්‍යාග ගුණයෙහිද සමාදන් කරවා මැරුණේය.

**චිත්ත සංයුත්තය සමාප්තයි.**

---

# 7. ගාමණී සංයුත්තය.

## 1. චණ්ඩ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු මහසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එකල්හි චණ්ඩ ගාමණීතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් ගාමණීතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් 'ස්වාමීනි, යම් කාරණයෙකින් මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් නපුරුය යන සංඛ්‍යාවට යේද ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද, යම් කාරණයෙකින් මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් මෘදුය යන සංඛ්‍යාවට යේද, ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍ය කවරේදැයි?" ඇසීය.

2. ගාමණිය, මේ ලොකයෙහි ඇතැමෙකුගේ රාගය දුරු නොවූයේ වේද, රාගය දුරු නොවීම නිසා අන්‍යයෝ ඔහු කෝප කරවත්. අනුන් විසින් කෝප කරවනු ලබන්නේ කෝපය පහළකරයි. හෙතෙම නපුරුය යන සංඛ්‍යාවට පැමිණෙයි. ද්වේෂය දුරු නොවූයේ වේද, ද්වේෂය දුරු නුවූ බැවින් අන්‍යයෝ ඔහු කෝප කරවත්, අනුන් විසින් කොප කරවනු ලබන්නේ කොපය පහළකරයි. හෙතෙම නපුරුය යන සංඛ්‍යාවට පැමිණෙයි. මොහය දුරු නොවූයේ වෙයි. මොහය දුරු නුවූ බැවින් අන්‍යයෝ කෝප කරවත්. අනුන් විසින් කොපකරවනු ලබන්නේ කොපය පහළකරයි. හෙතෙම නපුරුය යන සංඛ්‍යාවට පැමිණෙයි. ගාමිණිය, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැමෙක් චණ්ඩය යන සංඛ්‍යාවට පැමිණේද මේ ඊට හේතුවයි මේ ඊට ප්‍රත්‍යයයි.

3. "ගාමණිය, මේ ලොකයෙහි ඇතැමෙකුගේ රාගය දුරු වූයේවේද රාගය දුරුවූ බැවින් අන්‍යයෝ කොප නොකරවත්.

අන්‍යයන් විසින් කොප නොකරවනු ලබන්නේ කොපය පහළ නොකරයි. හෙතෙම මෘදුය යන සංඛ්‍යාවට පැමිණෙයි. ද්වේෂය දුරුවූයේ වෙයි. ද්වේෂය දුරුවූ බැවින් අන්‍යයෝ කොප නොකරවත්. අන්‍යයන් විසින් කොප නොකරවනු ලබන්නේ කොපය පහළ නොකරයි. හෙතෙම මෘදුය යන සංඛ්‍යාවට පැමිණෙයි. මොහය දුරුවූයේ වෙයි. මොහය දුරුවූ බැවින් අන්‍යයෝ කොප නොකරවත්. අන්‍යයන් විසින් කොප නොකරවනු ලබන්නේ කොපය පහළ නොකරයි. හෙතෙම මෘදුය යන සංඛ්‍යාවට පැමිණෙයි. ගාමණිය, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැමෙක් මෘදුය යන සංඛ්‍යාවට පැමිණේද මේ ඊට හේතුවයි මේ ප්‍රත්‍යයයි වදාළේය.

4. මෙසේ වදාළකල්හි චණ්ඩ ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, යහපත, ස්වාමීනි, යහපත, ස්වාමීනි, යම්සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුන දෙයක් විවෘත කරන්නේද, මුළාවූවෙකුට මගකියන්නේද ඇස් ඇත්තාහු රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දේශනා කරනලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂු සංඝයාද සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යෙමි. අද පටන් ජීවිතාන්තය දක්වා සරණගිය උපාසකයෙකු කොට මා දරණසේක්වායි කීයේය.

---

## 2. තාලපුට සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙන්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දකනිවාප නම් වෙළුවනාරාමයෙහි වාසය කරණසේක. එකල්හි තාලපුට ගාමිණී නම් නළුවෙක් (නැටුම් කරුවෙක්) භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් තාලපුට ගාමිණී නම් නළුවා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

'ස්වාමීනි යම් නළුවෙක් රඟ මැද, නෘත්‍ය මැද, ඇත්තෙන්ද, බොරුවෙන්ද, ජනයා සතුටු කරයිද, ඇලුම් කරවයිද, හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු පහාස නම් දෙවියන් හා සහභාවයට යන්නේයයි පුරාණ නාටක ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසනලදී. භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයේදී කුමක් කියන්නේද යනුයි.

2. "ගාමිණිය, කම් නැත. මෙය තිබේවා. මෙය මගෙන් නොඅසවයි" වදාළේය. දෙවනුවත් තාලපුට ගාමිණි නම් නළුවා භාග්‍යවතුන් වහන්සේගෙන් "ස්වාමීනි, යම් ඒ නළුවෙක් රඟ මැද නෘත්‍ය මැද ඇත්තෙන්ද බොරුවෙන්ද ජනයා සතුටු කරවයිද ඇලුම්කරවයිද හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු පහාස නම් දෙවියන් හා සහභාවයට යන්නේයයි පුරාණ නාටක ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසනලදී. භාග්‍යවතුන් වහන්සේ මෙහිදී කුමක් කියන්නේදැ"යි ඇසීය.

3. "ගාමිණිය, කම්නැත. මෙය තිබේවා. මෙය මගෙන් නොඅසවයි" වදාළේය. තුන්වෙනුවත් තාලපුට ගාමිණි නළුවා භාග්‍යවතුන් වහන්සේගෙන් "ස්වාමීනි, යම් ඒ නළුවෙක් රඟ මැද නෘත්‍ය මැද ඇත්තෙන්ද බොරුවෙන්ද, ජනයා සතුටු කරවයිද ඇලුම් කරවයිද හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පහාස නම් දෙවියන් හා සහභාවයට යන්නේයයි පුරාණ නාටක ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ මෙහිදී කුමක් කියන්නේදැයි" ඇසීය.

4. "ගාමණිය, ගාමණිය කම් නැත. මෙය තිබේවා. මෙය මගෙන් නොවිචාරවයි" යන මෙය ඒකාන්තයෙන් නොලබමි. එනිසා මම තොපට ප්‍රකාශ කරන්නෙමි.

ගාමණිය, පූර්වයෙහි රාගය පහනොකළ රාගයෙන් බැඳුණ සත්වයෝ වෙත්ද, ඔවුන්හට නළුවා රඟ මැද නෘත්‍ය මැද ඇලීම පිණිස පවත්නාවූ යමක් වෙයි නම් එය බොහෝ සෙයින් දක්වත්. ගාමිණිය පූර්වයෙහි පහනොකළ ද්වේෂ ඇත්තාවූ ද්වේෂයෙන් බැඳුණාවූ සත්වයෝ වෙත්ද, ඔවුන්ට නළුවා රඟ මැද නෘත්‍ය මැද ද්වේෂය පිණිස පවත්නා යමක් වෙත් නම් ඒ දේ බොහෝ

සෙයින් පෙන්වයි. ගාමිණිය පෙර මොහය පහ නොකළාවූ මොහයෙන් බැඳුණ සත්වයෝ වෙත්ද, ඔවුන්ට නළුවා රඟ මැද නෘත්‍ය මැද මොහය පිණිස පවත්නා යමක් වෙයි නම් එය බොහෝ සෙයින් පෙන්වයි. හෙතෙම තමන් මත් ප්‍රමාදව අන්‍යයන් මත්කොට ප්‍රමාදකොට ශරීරයේ බිඳීමෙන් මරණින් මතු පහාස නම් නිරයක් වේද, එහි උපදියි. ඉදින් වනාහි යමෙකුට යම් ඒ නළුවෙක් රඟමැද නෘත්‍ය මැද බොරු සැබෑ දෙකින් ජනයා සතුටු කරවයි නම්, ඇලුම් කරවයි නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පහාස නම් දෙවියන් හා සහවාසයට පැමිණෙයි යන මෙවැනි දෘෂ්ටියක් වේද ඒ ඔහුගේ මිථ්‍යාදෘෂ්ටියක්වේ. ගාමණිය, මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාට නිරය තිරිසන් අපාය යන දෙගතීන් අතුරින් එක්තරා ගතියක්යයි’ මම කියමි.”

**5.** මෙසේ වදාළ කල්හි තාලපුට නම් ගාමිණිතෙම හැඬුවේය. කඳුළු හෙලුයේය. ‘ගාමණිය, කම් නැත. මෙය තිබේවා. මෙය මගෙන් නොඅසවයි’ කියන ලද්දේ මෙහෙයිනි. එය වනාහි තොපගෙන් මම නොලැබුවෙමි.

“ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීම ගැන මම ඊට නොහඬමි. ස්වාමීනි, එතකුදු වුවත් පෙර නාටක ආචාර්ය ප්‍රාචාර්යයන් විසින් බොහෝ කලක් මුළුල්ලෙහි යම් ඒ නළුවෙක් රඟමැද නෘත්‍යමැද බොරු සැබෑ දෙකින් ජනයා සතුටු කරවයිද, ඇලුම් කරවයිද, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පහාස නම් දෙවියන් හා සහවාසයට යන්නේයයි මුළාකරන ලදී. වංචාකරනලදී. පොළඹවන ලදී. ස්වාමීනි යහපත ස්වාමීනි යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුනු දෙයක් විවෘත කරන්නේද, මුළාවූවකුට මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරන ලදී. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද සරණකොට යමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිබව ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමියයි” කීයේය.

**6.** තාලපුට ගාමණී නළුතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිබව ලැබුයේය. උපසම්පදාව ලැබුවේය. උපසම්පදාවූ නොබෝ කල් ඇති ආයුෂ්මත් තාලපුට තෙමේ හුදකලාව වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව ජීවිත පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ නොබෝ කලකින් යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවරකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කළේය.

ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. සතර මගින් කළ යුත්ත කරන ලදී. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් තාලපුට ස්ථවිරතෙමේ වනාහි රහතුන්ගෙන් එක්තරා කෙනෙක්ද වූයේයයි වදාළේය.

---

## 3. යෝධාජීව සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වසනසේක. එකල්හි යුද්ධයෙන් ජීවිකාව කරන ගාමිණීතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එක්පසෙක හුන් යොධාජීව ගාමණී තෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් ඒ යුද්ධයෙන් ජීවත් වන්නෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේද වෑයම් කෙරේද උත්සාහ කරන වෑයම් කරන ඔහු අන්‍යයෝ නසත්ද මරත්ද හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදිත්යයි පෙර යුද්ධයෙන් ජීවත්වූ ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසනලදී. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ කුමක් කියන්නාහුද, ගාමණිය, කම්නැත, මෙය තිබේවා මෙය මගෙන් නොඅසාවා."

2. දෙවනුවත් "ස්වාමීනි, යම් ඒ යුද්ධයෙන් ජීවත් වන්නෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේද, වෑයම් කෙරේද, උත්සාහ කරණ වෑයම් කරණ ඔහු අන්‍යයෝ නසත්ද, මරත්ද, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදිත්යයි පෙර යුද්ධයෙන් ජීවත්වුන ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසනලදී. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ කුමක් කියන්නාහුද, ගාමණිය, කම්නැත, මෙය තිබේවා. මෙය මගෙන් නොඅසාවා.

3. තුන්වෙනුවත් යොධාජීව ගාමණි තෙම ස්වාමීනි, යම් ඒ යොධාජීවයෙක් යුද්ධයෙහි උත්සාහ කරයිද, වෑයම් කරයිද, උත්සාහ කරන්නාවූ වෑයම් කරන්නාවූ ඔහු අන්‍යයන් නසත්ද, මරත්ද, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදීයයි පෙර යුද්ධයෙන් ජීවත්වුන ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසන ලදී. මෙහි භාග්‍යවතුන් වහන්සේ කුමක් කියන්නාහුදැයි ඇසීය.

4. ගාමණිය, කම්නැත, මගෙන් මෙය නොවිචාරව යන මෙය නොලබමි. එනිසා තොපට මම කියන්නෙමි. ගාමණිය යම් ඒ යුද්ධයෙන් ජීවත් වන්නෙක් යුද්ධයෙහි උත්සාහ කෙරෙයිද වෑයම් කෙරෙයිද ඔහුගේ සිත පළමුව හීනය. (කෙසේද?) මේ සත්වයෝ නැසෙත්වා, බැඳෙත්වා, මැරෙත්වා, වැනසෙත්වා, නොවෙත්වායි කියායි. නපුරුකොට කරනලදී. නපුරුකොට තබනලදී. ඒ උත්සාහ කරන්නාවූ, වෑයම් කරන්නාවූ ඔහු අන්‍යයෝ නසත්ද, මරත්ද, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් නිරයක් වේද එහි උපදී. ඉදින් වනාහි යම් ඒ යුද්ධයෙන් ජීවත් වන්නෙක් යුද්ධයේදී උත්සාහ කෙරේද, වෑයම් කෙරේද, උත්සාහ කරන්නාවූ, වෑයම් කරන්නාවූ ඔහු අන්‍යයෝ නසත්ද, මරත්ද, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදීයයි ඔහුට මේ දෘෂ්ටිය වේද, ඔහුගේ ඒ මිථ්‍යා දෘෂ්ටියකි. ගාමණිය, මිථ්‍යා දෘෂ්ටික පුද්ගලයාට නිරය හෝ තිරිසන් අපාය හෝ දෙගතීන් අතුරෙන් එක්තරා ගතියක් කියමියි වදාළසේක. මෙසේ වදාළ කල්හි යොධාජීව ගාමිණි

තෙම හැඬුයේය. කඳුළු හෙළුයේය. ගාමණිය මෙසේ හෙයින් මම තොපට මෙය තිබේවා මෙය මගෙන් නොඅසවයි කීයෙමි. ගාමණිය එය මම තොපගෙන් නොලැබුවෙමියි වදාළේය. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ වදාළ හෙයින් නොඅඬමි. එතකුදු වුවත් යම් ඒ යොධාජීවයෙක් යුද්ධයෙහි උත්සාහ කරයිද, වෑයම් කරයිද, උත්සාහ කරන වෑයම් කරන ඔහු අන්‍යයෝ මරත්ද, නසත්ද, හෙතෙම කයබිඳීමෙන් මරණින්පසු සරාජිත නම් දෙවියන් හා එක්වීමට පැමිණේයයි පූර්ව යොධාජීව ආචාර්ය ප්‍රාචාර්යයන් විසින් මුළා කරනලදී. වංචා කරනලදී. පොළඹවනලදැයි කීය.

5. "ස්වාමීනි, ඉතා යහපති ස්වාමීනි, ඉතා යහපති. ස්වාමීනි, යම්සේ යටිකුරු කරනලද්දක් උඩුකුරු කරන්නේද වැසුන දෙයක් විවෘත කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තාහු රූප දකිත්වායි අඳුරෙහි තෙල්පහනක් දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරනලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂුසංඝයාද, සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යෙමි. අද පටන් ජීවිතාන්තය දක්වා සරණගිය උපාසකයෙකුකොට මා දරණසේක්වායි" කීයේය.

---

## 4. හත්ථාරුහ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙනි 'යෝධාජීව' යන තැන් 'හත්ථාරුහ' කියා වෙනස් කරගන්න.)

---

## 5. අස්සාරුහ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වසනසේක. ඉක්බිති අස්සාරුහ ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය.

පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් අස්සාරූහ ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට, ස්වාමීනි, යම් ඒ අසුන් නගින්නෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේද වෑයම් කෙරේද, උත්සාහ කරන වෑයම් කරන ඔහු අන්‍යයෝ නසත්ද, මරත්ද හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදීයයි අසුන් පිට යන පූර්ව ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසන ලදී. මෙහි භාග්‍යවතුන් වහන්සේ කුමක් කියන්නාහුද?" "ගාමණිය, කම්නැත මෙය තිබේවා, මෙය මගෙන් නොඅසව."

2. "දෙවනුවත් "ස්වාමීනි, යම් ඒ අසුන් නගින්නෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේද, වෑයම් කෙරේද, උත්සාහ කරන වෑයම් කරන ඔහු අන්‍යයෝ නසත්ද, මරත්ද හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදීයයි කියන්නාවූ මෙය මා විසින් අසන ලදී. මෙහි භාග්‍යවතුන් වහන්සේ කුමක් කියන්නාහුද?" "ගාමණිය, කම් නැත මෙය තිබේවා. මෙය මගෙන් නොඅසව."

3. තුන්වෙනුවත් අස්සාරූහ ගාමණිතෙම, භාග්‍යවතුන් වහන්සේගෙන්, "ස්වාමීනි, යම් ඒ අසුන් පිට නගින්නෙක් යුද්ධයෙහි උත්සාහ කරයිද, වෑයම් කරයිද උත්සාහ කරන වෑයම් කරන ඔහු අන්‍යයෝ නසත්ද මරත්ද හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත දෙවියන් අතර උපදීයයි පූර්ව අසුන් පිට නැගී යුද්ධකරන පූර්ව ආචාර්ය ප්‍රාචාර්යයන් කියන්නාවූ මෙය මා විසින් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ මෙහි කුමක් කියන්නාහුදැයි" ඇසීය.

4. "ගාමණිය, කම්නැත මෙය තිබේවා. මෙය මගෙන් නොවිචාරවයි යන මෙය තොපගෙන් මම ඒකාන්තයෙන් නොලබමි. එනිසා මම තොපට ප්‍රකාශ කරන්නෙමි. ගාමණිය, යම් ඒ අසුන් පිට නැගී යුද්ධ කරන්නෙක් යුද්ධයෙහි උත්සාහ කරයිද, වෑයම් කරයිද, ඔහුගේ සිත පළමුකොටම හීනය නපුරුකොට කරණලදී. නපුරුකොට තබනලදී. මේ සත්වයෝ නැසෙත්වා, බැඳෙත්වා, මැරෙත්වා, නසිත්වා, නොවෙත්වා කියායි

(කෙසේද?) ඒ උත්සාහ කරන්නාවූ වෑයම් කරන්නාවූ ඔහු අන්‍යයෝ නසත්ද, මරත්ද හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් නිරයක් වේද එහි උපදී.

යම් ඒ අශ්වාරෝහකයෙක් යුද්ධයෙහි උත්සාහ කරයිද, වෑයම් කරයිද, උත්සාහ කරන්නාවූ වෑයම් කරන්නාවූ ඔහු අන්‍යයෝ නසත්ද මරත්ද හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදීයයි මෙසේ දෘෂ්ටියක් ඇත්තේද ඒ ඔහුගේ මිථ්‍යා දෘෂ්ටියයි. ගාමණිය, මිථ්‍යා දෘෂ්ටියෙන් යුත් පුද්ගලයාට නිරය තිරිසන් අපාය යන දෙගතීන් අතුරෙන් එක්තරා ගතියක් කියමි.”

**5.** මෙසේ වදාළ කල්හි අස්සාරෝහ ගාමණිතෙම හැඬුයේය. කඳුළු වැගිරවූයේය. ‘ගාමණිය, මෙසේ හෙයින් කම්නැත මෙය තිබේවා. මෙය මගෙන් නොවිචාරවයි කීයෙමි. එය මම තොපගෙන් නොලැබුවෙමි.”

“ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හෙයින් මම නොහඬමි. ස්වාමීනි, එසේවුවත් බොහෝ කාලයක් මුළුල්ලෙහි යම් ඒ අශ්වාරෝහකයෙක් යුද්ධයෙහි උත්සාහ කරයිද වෑයම් කරයිද, උත්සාහ කරන්නාවූ වෑයම් කරන්නාවූ ඔහු අන්‍යයෝ නසත්ද, මරත්ද, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සරාජිත නම් දෙවියන් අතර උපදීයයි පූර්ව අශ්වාරෝහක ආචාර්ය ප්‍රාචාර්යයන් විසින් මුළාකරන ලදී. වංචාකරන ලදී. පොළඹවන ලදී. ස්වාමීනි, යහපති, ස්වාමීනි යහපති ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුන දෙයක් විවෘත කරන්නේද, මුළා වූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තාහු රූප දකිත්වායි, අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරන ලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂු සංඝයාද සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යමි. අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයෙකුකොට මා දරණසේක්වායි” කීය.

---

## 6. මතක සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාලන්දා නුවර පාවාරික නම් අඹ වනයෙහි වාසය කරති. එකල්හි අසිබන්ධක පුත්ත ගාමණී තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් අසිබන්ධක පුත්ත ගාමණීතෙම භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, පච්ඡාභූමිවාසීවූ කෙණ්ඩි දරන්නාවූ දිය සෙවෙල් මාලා දරන්නාවූ දියට බසින්නාවූ ගිනි පුදන්නාවූ බ්‍රාහ්මණයෝ වෙත්ද? ඔව්හු ස්වර්ගයට යවත්. කාලක්‍රියා කළහු මළහු ස්වර්ගය පෙන්වත්. ස්වර්ගයට නංවත්.

"ස්වාමීනි, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ යම්සේ සියලු ලෝකයා කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදින්නේ නම් එසේ කිරීමට සමර්ථ වන්නේ දැයි කීය.

"ගාමණිය, එසේනම් මෙය තොපගෙන්ම අසමි. යම් ආකාරයකින් තොපට වැටහේ නම් එය එසේ ප්‍රකාශ කරන්නෙහිය.

2. "ගාමණිය, ඒ කුමකැයි සිතන්නෙහිද? මේ ලෝකයෙහි පුරුෂයෙක් සතුන් මරන්නේ වේද, නුදුන් දෙය ගන්නේවේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වේද, බොරු කියන්නේ වේද, කේළාම් කියන්නේ වේද, ඵරුෂ වචන කියන්නේ වේද ප්‍රලාප කියන්නේ වේද, දැඩි ලොභ ඇත්තේ වේද, ක්‍රොධ සිත් ඇත්තෙක් වේද, මිථ්‍යා දෘෂ්ටියෙක් වේද, ඔහු කරා මහජන සමූහයා එක්ව රැස්වී මේ පුරුෂතෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදීවායි යාඥා කරන්නේද, ස්තුති කරන්නේද, ඇඳිලි බැඳ ඔහු වට කර ගන්නේද, ඒ පුරුෂතෙම මහජනයාගේ යාඥාව නිසා හෝ ස්තුතිය නිසා හෝ ඇඳිලි බැඳ වටකර ගැනීම නිසා හෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවේ."

3. "ගාමිණිය, පුරුෂයෙක් තෙම මහත්වූ ලොකු ගලක් ගැඹුරු ජලයෙහි දමන්නේද මහජන සමූහයා එක්ව රැස්ව පින්වත් ගල මතු කරව. පින්වත් මහ ගල, ඉල්පුව, පින්වත් මහගල මතුවෙව. පින්වත්, මහගල ඉල්පෙව, පින්වත් මහගල ගොඩට එව යනුවෙන් යාඥා කරන්නේ නම්, ස්තුති කරන්නේ නම්, ඇඳිලි බැඳ අනුව යන්නේ නම් ඒ මහ ගල මහජනයාගේ යාඥාව නිසා හෝ ස්තුතිය නිසා හෝ ඇඳිලිබැඳ වටකර ගැනීම නිසා හෝ මතුවන්නේද, ඉල්පෙන්නේද ගොඩට පැමිණෙන්නේද?" -"ස්වාමීනි, එසේ නොවේ."

"ගාමණිය, එසේම යම් ඒ පුරුෂයෙක් සතුන් මරන්නේද, නුදුන් දෙය ගන්නේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේද, බොරු කියන්නේද, කේළාම් කියන්නේද ඵරුෂ වචන කියන්නේද, ප්‍රලාප කියන්නේද, දැඩි ලෝභ ඇත්තේද ක්‍රොධ සිත් ඇත්තේද, මිථ්‍යා දෘෂ්ටික වන්නෝද, මහජනයා ඔහුවෙත රැස්ව එක්ව මේ පුරුෂතෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදීවායි ඉල්වූයේවී නමුත් ස්තුති කළේවී නමුත් ඇඳිලි බැඳ වටකර ගත්තේවී නමුත් ඒ පුරුෂතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇත්තාවූ විසමව වැටෙන්නාවූ නිරයෙහි උපදින්නේය.

4. "ගාමණිය, ඒ කුමකැයි සිතන්නෙහිද? මේ ලෝකයෙහි පුරුෂයෙක් සතුන් මැරීමෙන් වැළකුණේද, නුදුන් දෙය ගැනීමෙන් වැළකුණේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේද, බොරු කීමෙන් වැළකුණේද, කේළාම් කීමෙන් වැළකුණේද, ඵරුෂ වචන කීමෙන් වැළකුණේද, ප්‍රලාප කීමෙන් වැළකුණේද, දැඩි ලොභය නැත්තේද, සම්‍යක් දෘෂ්ටික වේද, ක්‍රොධය නැත්තේද, ඔහු කරා මහජන සමූහයා එක්ව රැස්ව මේ පුරුෂතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව වැටෙන්නාවූ නරකයෙහි උපදීවායි යාඥා කරන්නේද, ස්තුති කරන්නේද, ඇඳිලි බැඳ වටකර ගන්නේද? "ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද, ඒ පුරුෂතෙම මහජනයාගේ යාඥා කිරීම නිසා හෝ ස්තුති කිරීම නිසා හෝ ඇඳිලි බැඳ වටකර ගැනීම නිසා

හෝ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව වැටෙන්නාවූ නිරයෙහි උපදින්නේද?" - "ස්වාමීනි, එය නොවේය."

**5.** "ගාමණිය, පුරුෂයෙක් තෙම ගිතෙල් කළයක් හෝ තෙල් කළයක් හෝ ගැඹුරු දියකට බැස බිඳින්නේය. එහි යම් කැට හෝ කැබලිති ඇද්ද ඒ යටට බසින්නේය. එහි යම් ගිතෙලක් හෝ තෙලක් හෝ ඇද්ද එය උඩ මතුවන්නේය. එය කරා මහජන සමූහයා එක්ව රැස්ව පින්වත් ගිතෙල තෙල ගිලෙව, පින්වත් ගිතෙල තෙල යටට කිඳෙව, පින්වත් ගිතෙල තෙල යටට යවයි යාඥා කරන්නේය. ස්තුති කරන්නේය. ඇඳිලිබැඳ පිරිවරන්නේය. ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද, මහජනයාගේ ඉල්ලීම නිසා හෝ ස්තුතිය නිසා හෝ ඇඳිලි බැඳ පිරිවැරීම නිසා හෝ ඒ ගිතෙල් තෙල් ගිලාබහින්නේද, කිඳා බහින්නේද, යටට හෝ යන්නේද?" - "ස්වාමීනි, එසේ නොවේ."

"ගාමණිය, එසේම යම් ඒ පුරුෂයෙක් ප්‍රාණඝාතයෙන් වෙන්වූයේවේද, අදින්නාදානයෙන් වෙන්වූයේද, මිථ්‍යාචාරයෙන් වෙන්වූයේද, බොරු කීමෙන් වෙන්වූයේද, කේළාම් කීමෙන් වෙන්වූයේද, ඵරුෂ වචනයෙන් වෙන්වූයේද, ප්‍රලාප කීමෙන් වෙන් වූයේද, දැඩි ලොභය නැත්තේද, ක්‍රොධය නැත්තේද, සම්‍යක් දෘෂ්ටිකද, හුදෙක් ඔහු කරා මහජන සමූහයා එක්ව රැස්ව මේ පුරුෂතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති විසමව වැටෙන නිරයෙහි උපදීවායි යාඥා කරන්නේවී නමුත් ස්තුති කරන්නේවී නමුත් ඇඳිලිබැඳ පිරිවරන්නේවී නමුත් ඒ පුරුෂතෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදින්නේය."

**6.** මෙසේ වදාළ කල්හි අසිබන්ධක පුත්ත ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට, ස්වාමීනි, යහපති ස්වාමීනි, යහපති ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරුකරන්නේද, වැසුණු දෙයක් විවෘත කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තාහු රූප දකිත්වයි. අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය

දේශනාකරන ලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂු සංඝයාද සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යෙමි. අද පටන් දිවි හිමියෙන් සරණ ගිය උපාසකයෙකු කොට මං දරණ සේක්වායි” කීයේය.

---

## 7. දේසනා සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාලන්දානුවර පාවාරික අඹවනයෙහි වාසය කරණසේක. එකල්හි අසිබන්ධක පුත්ත ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නේය. එකත්පසෙක හුන් අසිබන්ධකපුත්ත ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරණසේක් නොවේ දැයි” ඇසීය.

2. “ගාමණිය එසේය තථාගතයන් වහන්සේ සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පීව වාරය කරයි. එසේ නම් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් සමහරුන්ට සකස්කොට ධර්ම දේශනා කරන්නේද, ඇතැමුන්ට සකස් කොට ධර්මදේශනා නොකරන්නේද, එසේ වීනම් මෙහිදී තොපගෙන්ම අසමි. යම්සේ තොපට වැටහේද එසේ ප්‍රකාශ කරන්නෙහිය.

“ගාමණිය, මේ ලොකයෙහි ගොවිතැන් කරන ගෘහපතියෙකුට කුඹුරු තුනක් වෙත්. එකක් අග්‍රය. එකක් මධ්‍යමය එකක් කර්කශය. කරදිය සහිතය මුඩු බිමකි. ගාමණිය,’ ඒ කුමකැයි සිතන්නෙහිද ඒ ගොවිතැන් කරන ගෘහපති තෙම බිජු වපුරණු කැමැත්තේ යම් ඒ කෙතක් අග්‍ර වෙයිද, යම් ඒ කෙතක් මධ්‍යමද, යම් ඒ කෙතක් කර්කශද කරදිය සහිතද, මුඩු බිමක්වේද එයින් කවර කෙතක පළමුකොට බිජු වපුරන්නේද?”

“ස්වාමීනි බිජු වපුරනු කැමැත්තාවූ ඒ ගෘහපතිතෙම යම් කෙතක් අග්‍රද එහි පළමුව වපුරන්නේය. එහි වපුරා යම් කුඹුරක්

මධ්‍යමද එහි වපුරන්නේය. එහි වපුරා යම් කෙතක් රළුද කරදිය සහිතද, මුඩු බිමක්ද, එහි යටත් පිරිසෙයින් ගවයන්ට කෑම පිණිසවත් වන්නේයයි වපුරන්නේ හෝ වෙයි. නො වපුරන්නේ හෝ වෙයි."

3. "ගාමණිය යම්සේ යම් ඒ කෙතක් අග්‍රද මගේ භික්ෂු භික්ෂුණීහුද එසේමය. මම ඔවුන්ට මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද, අර්ථ සහිතවූද, ව්‍යඤ්ජන සහිත වූද, සර්වප්‍රකාරයෙන් සම්පූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරමි. ඊට හේතු කවරේද? ගාමණිය, මොව්හු මා පිහිටකොට ඇත්තාහ. මා සැඟවෙන තැන්කොට ඇත්තාහ. මා ආරක්ෂා ස්ථානකොට ඇත්තාහ. මා පිළිසරණකොට ඇත්තාහ.

4. "ගාමණිය, යම්සේ යම් ඒ කෙතක් මධ්‍යමද, මගේ උපාසක උපාසිකාවෝ එසේමය. මම ඔවුන්ටද මුල යහපත්වූ මැද යහපත්වූ අග යහපත්වූ, අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ හාත්පසින් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්ය ප්‍රකාශකරමි. ඊට හේතු කවරේද ගාමණිය මොව්හු පිහිටකොට ඇත්තාහ. මා සැඟවෙන තැන්කොට ඇත්තාහ. මා ආරක්ෂා ස්ථානකොට ඇත්තාහ. මා පිළිසරණකොට ඇත්තාහ.

5. "ගාමණිය, යම්සේ යම් ඒ රළු කරදිය ඇති මුඩු බිමක්වූ කෙතක්වේද මගේ අන්‍ය තීර්ථක ශ්‍රමණ බ්‍රාහ්මණ පරිබ්‍රාජකයෝත් එසේවෙත් මම ඔවුන්ටද මුල යහපත්වූ මැද යහපත්වූ අග යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ හාත්පසින් සම්පූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශකරමි. ඊට හේතු කවරේද?

එකපදයක් නමුත් දැනගන්නේ නම් යහපත. එය ඔවුන්ට බොහෝ කාලයක් හිත පිණිසද සැප පිණිසද වන්නේය කියායි.

6. "ගාමණිය, යම්සේ පුරුෂයෙකුට කළගෙඩි තුනක් ඇත්තාහුද? එක් එක් කළගෙඩියක් සිදුරු නැත්තේය. ජලය ගන්නේය. ජලය නොසිඳෙන්නේය. එක් කළයක් සිදුරු නැත්තේය. ජලය ගන්නේය. ජලය සිඳෙන්නේය. එක් කළයක්

සිදුරු සහිතය. වතුර නොඅල්ලන්නේය. වතුර සිඳෙන්නේය. ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? මේ පුරුෂතෙම ජලය වත්කරනු කැමැත්තේ යම් ඒ කළයක් සිදුරු නැත්තේද වතුර නොසිඳෙන්නේද යම් ඒ කළයක් සිදුරු නැත්තේද වතුර ගන්නේද සිඳෙන්නේද, යම් ඒ කළයක් සිදුරු සහිතද වතුර නොඅල්ලන්නේද වතුර සිඳෙන්නේද එයින් කවර කළයකට පළමුවෙන් වතුර වත්කරන්නේද?"

"ස්වාමීනි, ජලය වත්කරනු කැමති පුරුෂතෙම යම් ඒ කළයක් සිදුරු නැත්තේද වතුර අල්ලන්නේද එහි වත්කරන්නේය. වතුර නොසිඳෙන්නේද, එහි වත්කොට යම් ඒ කළයක් සිදුරු නැත්තේද ජලය ගන්නේද ජලය සිඳෙන්නේද එහි වත්කරන්නේය. එහි වත්කොට යම් ඒ කළයක් සිදුරු සහිතද ජලය ගන්නේද ජලය සිඳෙන්නේද එහි වත්කරන්නේ හෝ වෙයි. නොවත්කරන්නේ හෝ වෙයි. ඊට හේතු කවරේද, යටත් පිරිසෙයින් භාණ්ඩ සෝදන පමණටවත් වන්නේය කියයි."

7. "ගාමණිය, යම් සේ යම් ඒ කළයක් සිදුරු නැත්තේද ජලය ගන්නේද ජලය නොසිඳෙන්නේද මගේ භික්ෂු භික්ෂුණීහුද එසේමය. මම ඔවුන්ට මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද, අර්ථ සහිතවූද, ව්‍යඤ්ජන සහිත වූද, හාත්පසින් සම්පූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරමි. ඊට හේතු කවරේද? ගාමණිය, ඔව්හු මා පිහිටකොට ඇතිව, මා සැඟවෙන තැන්කොට ඇත්තන්ව, මා ආරක්ෂා ස්ථානකොට ඇත්තන්ව, මා පිළිසරණකොට ඇත්තන්ව හැසිරෙත්.

8. "ගාමණිය, යම් සේ යම් ඒ කළයක් සිදුරු නැත්තේද, ජලය ගන්නේද, ජලය සිඳෙන්නේද, මගේ උපාසක උපාසිකාවෝද එසේමය. මම ඔවුන්ටද මුල යහපත් වූද මැද යහපත්වූද, අග යහපත්වූද අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත හාත්පසින් සම්පූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරමි. ඊට හේතු කවරේද? ගාමණිය මොව්හු මා පිහිටකොට ඇත්තන්ව, මා සැඟවෙන තැන්කොට ඇත්තන්ව, මා ආරක්ෂා ස්ථානකොට ඇත්තන්ව, මා පිහිටකොට ඇත්තන්ව වාසය කරත්.

"ගාමණිය, යම් සේ යම් ඒ කළයක් සිදුරු සහිතද ජලය නොඅල්ලන්නේද, ජලය සිඳෙන්නේද, මගේ අන්‍යතීර්ථක ශ්‍රමණ බ්‍රාහ්මණ පරිබ්‍රාජකයෝද එබඳුය. මම ඔවුන්ටද මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද, අර්ථ සහිතවූද ව්‍යඤ්ජන සහිතවූද, සර්වාකාරයෙන් සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරමි. ඊට හේතු කවරේද? එක පදයක් නමුත් දැනගන්නාහු නම් එය ඔවුන්ට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය" කියායි.

**9.** මෙසේ වදාළ කල්හි අසිබන්ධක පුත්ත ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යහපත, ස්වාමීනි, යහපත. ස්වාමීනි යම් සේ යටිකුරු කරනලද්දක් උඩුකුරු කරන්නේද, වැසුණ දෙයක් විවෘත කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද ඇස් ඇත්තාහු රූප දකිත්වයි, අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරනලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂු සංඝයාද සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යමි. අද පටන් දිවිහිම්කොට සරණගිය උපාසකයෙකුකොට දරණ සේක්වායි' කීය.

---

## 8. සංඛ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාලන්දානුවර පාවාරික අඹ වනයෙහි වාසය කරණසේක. එකල්හි නිගණ්ඨ ශ්‍රාවකවූ අසිබන්ධක පුත්ත ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් අසිබන්ධක පුත්ත ගාමණිගෙන් භාග්‍යවතුන්වහන්සේ "ගාමණිය, නිගණ්ඨනාත පුත්‍රතෙම කෙසේ ශ්‍රාවකයන්ට ධර්ම දේශනා කෙරේදැයි" ඇසූසේක.

**2.** "ස්වාමීනි, නිගණ්ඨනාත පුත්‍රතෙම යම් කිසිවෙක් සතුන් මරයිද, ඒ හැමදෙන අපායට යන්නේය. නිරයට යන්නේය. යම්

කිසිවෙක් නුදුන් දේ ගනීද ඒ හැමදෙන අපායට යන්නේය. නිරයට යන්නේය. යම් කිසිවෙක් කාමයන්හි වරදවා හැසිරෙන්නේද ඒ සියල්ලෝ අපායට යන්නේය. නිරයට යන්නේය. යම් කිසිවෙක් බොරු කියයිද ඒ සියල්ලෝ අපායට යන්නෝය. නිරයට යන්නෝය. යමක් යමක් බහුලව කෙරෙමින් වාසය කරයිද එයින් එයින් පැමිණේයයි මෙසේ ශ්‍රාවකයන්ට ධර්ම දේශනා කෙරේයයි කීයේය.

3. "ගාමණිය, යමක් යමක් බහුලකොට කරමින් වාසය කෙරේද, ඒ ඒ දෙයින් යන්නේ නම් එසේ ඇති කල්හි නිගණ්ඨනාත පුත්‍රයාගේ වචනය පරිදි කිසිවෙක් අපායට නොයන්නේය. නිරයට නොයන්නේය. ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද?

"යම් ඒ පුරුෂයෙක් සතුන් මරන්නේ නම් කල් නොකල් දෙක අනුව බලන කල්හි රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කලෙක ඔහු සතුන් මරන්නේද, යම් කලෙක ඔහු සතුන් නොමරන්නේද, ඒ දෙකින් වැඩි කාලය කුමක්ද?"

"ස්වාමීනි කල් නොකල් දෙක අනුව බලන කල්හි යම් ඒ පුරුෂයෙක් රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කාලයක සතුන් මරන්නේද යම් කාලයක හෙතෙම සතුන් නොමරන්නේද ඒ කාල දෙකින් ඔහු සතුන් මරන්නාවූ කාලයම ටිකය. ඔහු සතුන් නොමරන්නාවූ කාලයම වැඩිය." "ගාමණිය, යමක් යමක් බහුලව වාසය කරන්නේද එයින් එයින් යන්නේයයි කියන්නේ නම් මෙසේ ඇති කල්හි නිගණ්ඨනාත පුත්‍රයාගේ වචනය අනුව අපායට යන නිරයට යන කිසිවෙක් නැත.

4. "ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද කල් නොකල් දෙකට අනුව බලන කල්හි යම් ඒ පුරුෂයෙක් රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කලෙක නුදුන් දෙය ගන්නේද යම් කලෙක හෙතෙම නුදුන් දෙය නොගන්නේද ඒ කාල දෙකින් කුමක් වැඩි කාලය වන්නේද?"

"ස්වාමීනි, කල් නොකල් දෙකට අනුව බලන කල්හි යම් ඒ පුරුෂයෙක් තෙම රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කලෙක

නුදුන් දෙය ගනීද, යම් කාලයක නුදුන් දෙය නොගනීද, ඒ කාල දෙකින් ඔහු නුදුන් දෙය ගන්නා කාලය ස්වල්ප වන්නේය. හෙතෙම යම් කලෙක නුදුන් දෙය නොගන්නේද ඒ කාලයම වැඩිය."

"ගාමණිය, යමක් යමක් බහුලව කරමින් වසයිද එයින් එයින් යන්නේයයි කියන්නේ නම් මෙසේ ඇති කල්හි නිගණ්ඨනාත පුත්‍රයාගේ වචනය අනුව අපායට යන නිරයට යන කිසිවෙක් නැත්තේය.

**5.** "ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද කල් නොකල් දෙකට අනුව යම් ඒ පුරුෂයෙක් රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කලක හෙතෙම කාමයන්හි වරදවා හැසිරෙන්නේද, යම් කලක හෙතෙම කාමයන්හි වරදවා නොහැසිරෙන්නේද ඒ කාල දෙකින් වැඩි කාලය කවරේද?"

"ස්වාමීනි, යම් ඒ පුරුෂයෙක් තෙම රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කලක හෙතෙම කාමයන්හි වරදවා හැසිරේද යම් කලක හෙතෙම කාමයන්හි වරදවා නොහැසිරේද, ඒ කාල දෙකින් ඔහු කාමයන්හි වරදවා හැසිරෙන කාලය ස්වල්පය. හෙතෙම කාමයන්හි වරදවා නොහැසිරෙන කාලයම අධිකය."

"ගාමණිය, යමක් යමක් බහුලව කරමින් වාසය කරයිද, එයින් එයින් යේයයි කියන්නේ නම් එසේ ඇති කල්හි නිගණ්ඨනාත පුත්‍රගේ වචනය පරිදි අපායට, නිරයට යන කිසිවෙක් නැත.

**6.** "ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද, කල් නොකල් දෙක අනුව යම් ඒ පුරුෂයෙක් රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කලෙක බොරු කියන්නේ වේද, යම් කලෙක හේ බොරු නොකියන්නේද, එයින් කවර කාලයක් වැඩි කාලය වන්නේද?"

"ස්වාමීනි, යම් ඒ පුරුෂයෙක් තෙම රාත්‍රියෙහි හෝ දවල් හෝ යම් කලක හෙතෙම බොරු කියන්නේද, යම් කලෙක හෙතෙම බොරු නොකියන්නේද, ඒ දෙකින් ඒ කාලය ටිකය. හෙතෙම යම් කාලයක බොරු නොකියන්නේද, ඒ කාලයම ඉතා වැඩිය.

"ගාමණිය, යමක් යමක් බහුලව කරමින් වාසය කරයිද, එයින් එයින් යේයයි කියන්නේනම් එසේ ඇති කල්හි මේ නිගණ්ඨනාත පුත්‍රගේ වචනය පරිදි අපායට, නිරයට යන කිසිවෙක් නැත.

7. "ගාමණිය, මේ ලොකයෙහි ඇතැම් ශාස්තෲවරයෙක් යම් කිසිවෙක් ප්‍රාණඝාත කෙරෙයිද, ඒ සියල්ලම අපායට යන්නේය. නිරයට යන්නේය යම් කිසිවෙක් සොරකම් කෙරේද, ඒ සියල්ලම අපායට යන්නේය. නිරයට යන්නේය. යම් කිසිවෙක් කාමයෙහි වරදවා හැසිරෙන්නේද ඒ සියල්ලම අපායට යන්නේය. නිරයට යන්නේය. යම්කිසිවෙක් බොරු කියන්නේද, ඒ සියල්ලම අපායට යන්නේය. නිරයට යන්නේය යන මේ වාද ඇත්තේවේද, දෘෂ්ටි ඇත්තේවේද, ගාමණිය, ඒ ශාස්තෲවරයා කෙරෙහි ශ්‍රාවකතෙමේ පැහැදුනේ වෙයිද, යම් ඒ කිසිවෙක් සතුන් මරයිද, ඒ සියල්ල අපායට යන්නේය නිරයට යන්නේය යන වාද ඇත්තේය. දෘෂ්ටි ඇත්තේය. 'මා විසින් සතුන් මරණ ලද්දේය. මමද අපායට යන්නෙමි. නරකයට යන්නෙමි' යන දෘෂ්ටිය ඇතිවෙයි. ගාමණිය, හෙතෙම ඒ වචනය අත් නොහැර ඒ සිත අත්නොහැර ඒ දෘෂ්ටිය අත්නොහැර ගෙනඑන ලද්දක් යම්සේ බිම තබන්නේද, එසේ නරකයෙහි උපදී. මගේ ශාස්තෲතෙම යම් කිසිවෙක් නුදුන්දෙය ගනීද, ඒ සියල්ල අපායට යන්නේය. නිරයට යන්නේය යන වාද ඇත්තේ වෙයි. දෘෂ්ටි ඇත්තේ වෙයි. 'මා විසින් නුදුන්දෙය ගන්නා ලදී. මමද අපායට යන්නෙක් වෙමි. නිරයට යන්නෙක් වෙමි' යන දෘෂ්ටිය ඇතිවෙයි ගාමණිය, ඒ වචනය අත්නොහැර, ඒ සිත අත්නොහැර, ඒ දෘෂ්ටිය අත්නොහැර, හෙතෙම ගෙනඑන ලද්දක් බිම තබන්නේ යම්සේද එමෙන් නිරයෙහි උපදින්නේය. 'මගේ ශාස්තෲ තෙම යම් කිසිවෙක් කාමයන්හි වරදවා හැසිරේද, ඒ සියල්ල අපායට යන්නේය. නිරයට යන්නේය.' යන වාද ඇත්තේ දෘෂ්ටි ඇත්තේ වෙයි. 'මා විසින් කාමයන්හි වරදවා හැසිරෙන ලදී. මමද අපායට යන්නෙක් වෙමි. නිරයට යන්නෙක් වෙමි' යන දෘෂ්ටිය ඇත්තේ වෙයි. ගාමණිය, ඒ වචනය අත්නොහැර ඒ සිත අත්නොහැර ඒ දෘෂ්ටිය අත්නොහැර ගෙනඑන ලද්දක් බිම තබන්නේ යම්සේද

එමෙන් නිරයෙහි උපදින්නේය. 'මගේ ශාස්තෘතෙමේ යම් කිසිවෙක් බොරු කියයිද, ඒ සියල්ල අපායට යන්නේය නිරයට යන්නේය' යන වාද ඇත්තේ දෘෂ්ටි ඇත්තේ වෙයි. මා විසින් බොරු කියන ලද්දේ වෙයි. මමද අපායට යන්නෙක් වෙමි නිරයට යන්නෙක් වෙමි යන දෘෂ්ටිය ඇතිවෙයි. ගාමණිය, ඒ වචනය අත්නොහැර ඒ සිත අත්නොහැර ඒ දෘෂ්ටිය බැහැර නොකර හෙතෙම ගෙනඑන ලද්දක් යම්සේ බිම තබන්නේද, එමෙන් නරකයෙහි උපදියි.

8. "ගාමණිය, ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විද්‍යාචරණ සම්පන්නවූ, සුගතවූ, ලොකවිදූවූ, අනුත්තර පුරිෂ ධම්මසාරථීවූ, දෙවිමිනිසුන්ට ශාස්තෘවූ භාග්‍යවත්වූ තථාගත තෙම ලොකයෙහි උපදී. හෙතෙම නොයෙක් ආකාරයෙන් සතුන්මැරීම ගරහයි. නින්දා කරයි. ප්‍රාණඝාතයෙන් වළකිව්යයි කියයි. සොරකම් කිරීම ගරහයි. නින්දාකරයි. සොරකම් කිරීමෙන් වළකිව්යයි කියයි. කාමයන්හි වරදවා හැසිරීම ගරහයි. නින්දා කරයි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වළකිව් යයි කියයි. බොරුකීම ගරහයි. නින්දාකරයි. බොරුකීමෙන් වළකිව්යයි කියයි. ගාමණිය, ඒ ශාස්තෘවරයා කෙරෙහි ශ්‍රාවක තෙම පැහැදුනේ වෙයිද' හෙතෙම මෙසේ සිතයි 'භාග්‍යවතුන් වහන්සේ වනාහි නොයෙක් අයුරින් සතුන් මැරීම ගරහයි. නින්දා කරයි. සතුන් මැරීමෙන් වළකිව්යයි ප්‍රකාශ කරති. 'යම් මා විසින් යම් ඒ ප්‍රමාණයකින් සතුන් මරණ ලද්දේ වේ. යම් ඒ ප්‍රමාණයකින් මා විසින් සතුන් මරණ ලද්දේ, එය නරකය. එය යහපත් නොවේයයි ඒ හේතුවෙන් මම පසුතැවෙන්නෙමි මා විසින් ඒ පාපකර්මය නොකරන ලද්දේ නොවේය' කියායි. හෙතෙම මෙසේ සිතා ඒ සතුන් මැරීම අත්හරියි. මත්තෙහිද සතුන් මැරීමෙන් වෙන් වූයේ වේ. මෙසේ මේ පාපකර්මයාගේ ප්‍රහාණය ඉක්මවීම වේ. මෙසේ ඒ පාපකර්මයාගේ ඉක්මීම වේ.

9. "භාග්‍යවතුන් වහන්සේ වනාහි නොයෙක් අයුරින් සොරකම් ගරහයි. නින්දාකරයි. සොරකමින් වළකිව්යයි ප්‍රකාශ කරති 'යම් ඒ ප්‍රමාණයකින් මා විසින් සොරකම් කරන ලද්දේය.

මා විසින් යම් ඒ ප්‍රමාණයකින් සොරකම් කරන ලද්දේද, එය නරකය යහපත් නොවේයයි මම පසුතැවෙන්නෙම් නම් ඒ හේතුවෙන් මා විසින් පාපකර්මය නොකරන ලද්දේ නොවෙයි. හෙතෙම මෙසේ සිතා ඒ සොරකම අත් හරියි. මත්තෙහිද සොරකමින් වෙන්වූයේ වේ. මෙසේ මේ පාපකර්මයාගේ ප්‍රහාණයවේ. මෙසේ ඒ පාපකර්මයාගේ ඉක්මීම වේ.

**10.** භාග්‍යවතුන් වහන්සේ වනාහි නොයෙක් අයුරින් කාමයෙහි වරදවා හැසිරීම ගරහයි. නින්දා කරයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වළකිව්යයි' ප්‍රකාශ කරති. 'යම් ඒ පරිද්දෙකින් මා විසින් කාමයන්හි වරදවා හැසිරෙන ලදී. මා විසින් යම් ඒ පරිද්දෙකින් කාමයන්හි වරදවා හැසිරෙන ලද්දේද, එය නරකය. එය යහපත් නොවේයයි මම ඒ හේතුවෙන් පසුතැවෙන්නෙම් නම් මා විසින් ඒ පාපකර්මය නොකරන ලද්දේ නොවෙයි.' හෙතෙම මෙසේ සිතා ඒ කාමයෙහි වරදවා හැසිරීම අත්හරියි. මත්තෙහිද කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වූයේ වේ. මෙසේ මේ පාපකර්මය ප්‍රහීණ වේ. මෙසේ මේ පාපකර්මයාගේ ඉක්මීම වේ.

**11.** "භාග්‍යවතුන් වහන්සේ වනාහි නොයෙක් අයුරින් බොරුකීම ගරහයි. නින්දාකරයි. බොරුකීමෙන් වළකිව්යයි ප්‍රකාශ කරති 'මා විසින් යම් ඒ ප්‍රමාණයකින් බොරු කියා ඇත. මා විසින් යම් ඒ ප්‍රමාණයකින් බොරු කියන ලද්දේද, එය නරකය. එය යහපත් නොවේයයි පසුතැවෙන්නෙම් නම් ඒ හේතුවෙන් ඒ පාපකර්මය මා විසින් නොකරන ලද්දේ නොවෙයි' හෙතෙම මෙසේ සිතා ඒ බොරුකීම අත්හරියි. මත්තෙහිද බොරුකීමෙන් වෙන්වූයේවේ. මෙසේ ඒ පාපකර්මයාගේ ප්‍රහාණය වේ. මෙසේ ඒ පාපකර්මයාගේ ඉක්මවීම වේ.

**12.** "හෙතෙම සතුන් මැරීම අත්හැර සතුන් මැරීමෙන් වෙන්වූයේවේ. සොරකම් අත්හැර සොරකමින් වෙන්වූයේවේ. කාමයෙහි වරදවා හැසිරීම අත්හැර කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වූයේ වේ. බොරුකීම අත්හැර බොරුකීමෙන් වෙන්වූයේ වේ. කේළාම් කීම අත්හැර කේළාම් කීමෙන්

වෙන්වූයේ වේ. ඵරුෂවචන කීම අත්හැර ඵරුෂවචන කීමෙන් වෙන්වූයේ වේ. ප්‍රලාපකීම අත්හැර ප්‍රලාප කීමෙන් වෙන්වූයේ වේ දැඩි ලොභය අත්හැර දැඩි ලොභ නැත්තේ වේ. ව්‍යාපාදය අත්හැර ව්‍යාපාද නැත්තෙක්වේ. මිථ්‍යාදෘෂ්ටිය අත්හැර සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වේ.

13. "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ අභිධ්‍යාව පහකළේ ව්‍යාපාදය පහකළේ මුළා නොවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ මෛත්‍රීසහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙවෙනි දිසාවක් එසේ තුන්වෙනි දිසාවක්, එසේ සතරවෙනි දිසාවක්, මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් හැමතැන සියල්ල සහිත ලොකය විශාලවූ මහද්ගතවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි.

14. "ගාමණිය, බලවත් සක්පිඹින්නෙක් අපහසුවක් නැතිවම සතර දිසාවට දන්වන්නේද, එසේම ගාමිණිය මෙසේ වඩනලද මෙසේ බහුල වශයෙන් කරනලද මෛත්‍රීසහගත සමාධිය කාමාවචර කර්මයෙන් මැඩ පැවැත්විය නොහේ. යටකළ නොහේ.

15. "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම් මෙසේ අභිධ්‍යාව පහකළේ ව්‍යාපාදය පහකළේ මුළානොවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ කරුණාසහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙවෙනි දිසාවක් එසේ තුන්වෙනි දිසාවක්, එසේ සතරවන දිසාවක්. මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් හැමතැන සියල්ල සහිත ලොකය විශාලවූ මහද්ගතවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ කරුණාසහගත සිතින් පතුරුවා වාසය කරයි.

16. "ගාමණිය, බලවත් සක් පිඹින්නෙක් අපහසුවක් නැතිවම සතර දිසාවට දන්වන්නේද, එසේම ගාමිණිය මෙසේ වඩනලද, මෙසේ බහුල වශයෙන් කරනලද කරුණාසහගත සමාධිය කාමාවචර කර්මයෙන් මැඩ පැවැත්විය නොහේ. යටකළ නොහේ.

**17.** "ගාමණිය, ඒ ආර්යශ්‍රාවක තෙම මෙසේ අභිධ්‍යාව පහකළේ ව්‍යාපාදය පහකළේ මුළානොවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙවෙනි දිසාවක්, එසේ තුන්වෙනි දිසාවක්, එසේ සතරවන දිසාවක්, මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් හැමතැන සියල්ල සහිත ලොකය විශාලවූ මහද්ගතවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ, මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

**18.** "ගාමණිය, බලවත් සක් පිඹින්නෙක් අපහසුවක් නැතිවම සතර දිසාවට දන්වන්නේද, එසේම ගාමිණිය මෙසේ වඩනලද මෙසේ බහුල වශයෙන් කරනලද මුදිතාසහගත සමාධිය කාමාවචර කර්මයෙන් මැඩ පැවැත්විය නොහේ. යටකළ නොහේ.

**19.** "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ අභිධ්‍යාව පහකළේ ව්‍යාපාදය පහකළේ මුළානොවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙවන දිසාවක්, එසේ තුන්වන දිසාවක්, එසේ සතරවන දිසාවක්. මෙසේ උඩ යට සරස සර්වප්‍රකාරයෙන් හැම තැන සියල්ල සහිත ලොකය විශාලවූ මහද්ගතවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ උපෙක්ෂාසහගත සිතින් පතුරුවා වාසය කරයි.

**20.** "ගාමණිය, බලවත් සක් පිඹින්නෙක් අපහසුවක් නැතිවම සතර දිසාවට දන්වන්නේද, එසේම ගාමිණිය මෙසේ වඩනලද මෙසේ බහුල වශයෙන් කරනලද උපෙක්ෂා සහගත සමාධිය කාමාවචර කර්මයෙන් මැඩපැවැත්විය නොහේ. යට කළ නොහේ."

**21.** මෙසේ වදාළ කල්හි අසිබන්ධක පුත්‍රවූ ගාමණීතෙම භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, යහපත, ස්වාමීනි, යහපත ස්වාමීනි යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද වැසුණු දෙයක් විවෘතකරන්නේද, මංමුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තාහු රූප දකිත්වයි අඳුරෙහි තෙල් පහනක්

දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරන ලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂු සංඝයාද සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යමි. අද පටන් ජීවිතාන්තය දක්වා සරණගත උපාසකයෙකු කොට මා දරණසේක්වායි” කීයේය.

---

## 9. කුල සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සමූහයක් සමග කොසොල් රට සැරිසරණසේක් නාලන්දාව යම් තැනෙක්හිද එහි වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ නාලන්දා නුවර පාවාරික අඹවනයෙහි වාසය කරයි. ඒ කාලයෙහි නාලන්දාවෙහි (ජීවත් වෙමුද, නොවෙමුදැයි) සැක සිතෙන (මළ මිනිසුන්ගේ) සුදුවූ ඇට (තැනින් තැන) ඇති, (වපුරණ ලද්දේ) කෝටු පමණක් ඇති දුර්භික්ෂයක් වූයේය.

**2.** ඒ කාලයෙහි නිගණ්ඨනාත පුත්‍ර තෙමේද මහත් නිගණ්ඨ පිරිසක් සමග නාලන්දා නුවර වාසය කරයි. ඉක්බිති නිගණ්ඨනාත ශ්‍රාවකවූ අසිබන්ධක පුත්‍ර ගාමණිතෙම නිගණ්ඨනාත පුත්‍රතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ නිගණ්ඨනාතපුත්‍ර වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් අසිබන්ධකපුත්‍ර ගාමණීට නිගණ්ඨනාත පුත්‍රතෙම “ගාමණිය, ඔබ මෙහි එන්න ශ්‍රමණ භවත් ගෞතමයන් හා වාදයක් නගව, ‘මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති ශ්‍රමණභවත් ගෞතමයන්ට අසිබන්ධකපුත්‍ර ගාමණී විසින් වාදයක් නගන ලද්දේයයි’ මෙසේ තොපගේ යහපත් කීර්ති ශබ්දය පැනනගින්නේයයි කීය.

“ස්වාමීනි, මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති ශ්‍රමණ භවත් ගෞතමයන්ට මම කෙසේ වාදයක් නගන්නෙම්ද?

“ගාමණිය, එම ශ්‍රමණ ගෞතමතෙම යම් තැනෙක්හිද එතැනට යව ගොස් ශ්‍රමණ ගෞතමයන්ට ‘ස්වාමීනි, භාග්‍යවතුන්

වහන්සේ නොයෙක් අයුරින් කුලයන්ට දයාව ආරක්ෂාව අනුකම්පාව වර්ණනා කරන්නේ නොවේදැයි' අසව. ඉදින් ගාමණිය, මෙසේ අසන ලද ශ්‍රමණ ගෞතමතෙම 'ගාමණිය, එසේය, තථාගතතෙම නොයෙක් අයුරින් කුලයන්ට දයාව, ආරක්ෂාව, අනුකම්පාව, වර්ණනා කෙරේයයි' මෙසේ ප්‍රකාශ කරයි නම් ඔහුට ඔබ 'ස්වාමීනි, ඉදින් එසේ නම් භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් ජීවත්වෙමුද නොවෙමුදැයි සැක සිතෙන මළවුන්ගේ සුදු ඇට තැනින් තැන ඇති වපුරණ ලද්දේ කෝටු පමණක් ඇති දුර්භික්ෂයෙහි මහත් භික්ෂු සමූහයක් සමග කුමක් හෙයින් චාරිකාවෙහි හැසිරේද? භාග්‍යවතුන් වහන්සේ කුලයන්ගේ නැසීම පිණිස පිළිපන්නෝය. භාග්‍යවතුන් වහන්සේ කුලයන්ගේ විනාශය පිණිස පිළිපන්නෝය. භාග්‍යවතුන් වහන්සේ කුලයන්ගේ හානිය පිණිස පිළිපන්නෝයයි' කියව. ගාමිණිය, තොප විසින් මේ උභතොකොටික ප්‍රශ්නය අසනලද ශ්‍රමණ ගෞතමයන්ට ගිලින්ට හෝ වමාරන්ට හෝ නොහැකිවේයයි" කීයේය.

4. "ස්වාමීනි, එසේයයි" අසිබන්ධක පුත්‍ර ගාමණිතෙම නිගණ්ඨනාත පුත්‍රයාට පිළිතුරු දී හුනස්නෙන් නැගිට නිගණ්ඨනාත පුත්‍රයා වැඳ ගරුකොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි අසිබන්ධක පුත්‍ර ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් අයුරින් කුලයන්ට දයාව, ආරක්ෂාව, අනුකම්පාව වර්ණනා කරන්නේ නොවේද?"

"ගාමණිය, එසේය."

"තථාගතතෙමේ නොයෙක් අයුරින් කුලයන්ට දයාව, ආරක්ෂාව, අනුකම්පාව වර්ණනා කරයි. ස්වාමීනි, එසේනම්, භාග්‍යවතුන් වහන්සේ ජීවත් වෙමුද, නොවෙමුදැයි, සැක සිතෙන මළවුන්ගේ සුදු ඇට තැනින් තැන ඇති වපුරණ ලද්දේ කෝටු පමණක් ඇති මේ දුර්භික්ෂයෙහි මහත් භික්ෂු සමූහයක් සමග චාරිකාවෙහි හැසිරේද, භාග්‍යවතුන්වහන්සේ කුලයන්ගේ සිඳීම

පිණිස පිළිපන්නෝය. කුලයන්ගේ විනාශය පිණිස පිළිපන්නෝය. කුලයන්ගේ හානිය පිණිස පිළිපන්නෝ යයි” කීයේය.

**5.** “ගාමණිය මම මෙයින් අනූඑක්කල්පයක් සිහිකරමි. ඒ කාලය තුළ ඉදුණු යමක් දීමෙන් විනාශවුණු එක කුලයක් වත් නොදනිමි. තවද ආඪ්‍යවූ මහත් ධන ඇති මහත් භොග ඇති බොහෝ රන් රිදී ඇති බොහෝ උපකරණ ඇති බොහෝ ධන ධාන්‍ය ඇති යම් ඒ කුලයෝ වෙත්ද, ඒ සියලු කුලයෝ දානයෙන් ඇතිවූහ. සත්‍යයෙන් ඇතිවූහ. සංයමයෙන් ඇති වූහ. ගාමණිය, කුලයන් විනාශයට හේතු අටක් වෙත්. ප්‍රත්‍යය අටක් වෙත්. රජුන්ගෙන් හෝ කුලයෝ විනාශයට යත්. සොරුන්ගෙන් හෝ කුලයෝ විනාශයටයත්. ගින්නෙන් හෝ කුලයෝ විනාශයට යත්. ජලයෙන් හෝ කුලයෝ විනාශයට නිදහන් කරන ලද්දේ හෝ නොලැබෙත්. නපුරුකොට යොදනලද සේවකයෝ හෝ කර්මාන්ත අත් හරිත්. ඒ වස්තු වියදම් කරන විනාශකරන නැතිකරන කුලයට අඟුරක් වැනියෙක් හෝ පහළවෙයි. අනිත්‍යතාව අටවැනි කාරණය වෙයි. ගාමණිය, මේ හේතු අට ප්‍රත්‍යය අට ඇති කල්හි විද්‍යමාන කල්හි යමෙක් මට භාග්‍යවත් තෙමේ කුලයන්ගේ සිඳීම පිණිස පිළිපන්නේය. භාග්‍යවත්තෙමේ කුලයන්ගේ විනාශය පිණිස පිළිපන්නේය. භාග්‍යවත්තෙමේ කුලයන්ගේ හානිය පිණිස පිළිපන්නේයයි මෙසේ කියන්නේ නම් ගාමණිය, ඒ වචනය අත්නොහැර ඒ සිත අත්නොහැර ඒ දෘෂ්ටිය බැහැර නොකොට හෙතෙමේ ගෙන එන ලද්දක් බිම තබන්නේ යම්සේද එසේ නරකයෙහි උපදින්නේයයි” වදාළේය.

**6.** මෙසේ වදාළ කල්හි අසිබන්ධක ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට “ස්වාමීනි, යහපත. ස්වාමීනි, යහපත ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුණ දෙයක් විවෘත කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තාහු රූප දකිත්වයි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද මෙසේ භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරන ලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද, භික්ෂුසංඝයාද සහිත භාග්‍යවතුන්වහන්සේ පිහිටකොට යෙමි. අද පටන්

දිවිහිමියෙන් සරණගිය උපාසකයෙකුකොට මා දරණසේක්වා”යි කීයේය.

---

## 10. මණිචූළ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වෙළුවනයෙහි වාසය කරණසේක. ඒ කාලයෙහි රජුගේ ඇතුළු නුවරෙහි රාජ පිරිසෙහි රැස්වූවන් අතරෙහි මේ කථාව ඇතිවිය. ‘ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට රන් රිදී කහවණු කැපද ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන් රිදී කහවණු ඉවසත්ද ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණු පිළිගනිත්ද?” යනුයි.

2. ඒ කාලයෙහි මණිචූළක ගාමණි තෙම ඒ පිරිසෙහි හුන්නේ විය. එකල්හි මණිචූළකතෙම, “ආචාර්යයෝ මෙසේ නොකියත්වා ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට රන් රිදී කහවණු කැප නැත. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණු නොඉවසත්. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණු නොපිළිගනිත්. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණුවලින් දුරුවූවෝයයි” කීය. මණිචූළක ගාමණි ඒ පිරිසට අවබොධ කරවන්ට නොහැකිවිය.

3. “ඉක්බිති මණිචුලක ගාමණිතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් මණිචූලක ගාමණි තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. “ස්වාමීනි, මෙහි රජුගේ ඇතුල් නගරයෙහි රජ පිරිසෙහි රැස්වූවන් අතර ‘ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට රන් රිදී කහවණු කැපද? ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණු ඉවසත්ද? ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණු පිළිගනිත්ද?” යන මේ කථාව පහළවිය. ස්වාමීනි, මෙසේ කී ඒ පිරිසට මම ‘ආර්යයෙනි එසේ නොකියනු මැනව. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට රන් රිදී කහවණු අකැපය. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණු නොඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන් රිදී කහවණු නොපිළිගනිත්. ශ්‍රමණ ශාක්‍ය

පුත්‍රයෝ බහාතබනලද රන් රුවන් ඇත්තාහ. ඉවත්කළ රන් රිදී කහවණු ඇත්තාහයි' කීවෙමි. ඒ පිරිසට අවබොධ කරවන්නට නොහැකිවිය. ස්වාමීනි, කිමෙක්ද මෙසේ කියන්නාවූම භාග්‍යවතුන් වහන්සේ කියන ලද්දක් කියන්නෙක් වූයෙම්ද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චොදනා නොකෙරෙම්ද? ධර්මයට අනුකූල දෙයක් ප්‍රකාශකෙරෙම්ද? කිසියම් කරුණු සහිත, වාදයකින් ගැරහිය යුතු තැනට නොපැමිණෙම්ද? යනුයි.

"ගාමණිය, මෙසේ ප්‍රකාශ කරණු ලැබූ ඔබ ඒකාන්තයෙන් මා විසින් කියනලද්දක්ම කියන්නෙක් වූයෙහිය. ඔබ බොරුවෙන් චොදනා නොකරන්නෙහිය. ධර්මයට අනුකූල දෙයක් ප්‍රකාශ කෙළෙහිය. කිසියම් කරුණු සහිත වාදයකින් ගැරහියයුතු තැනට නොපැමිණියේයි ගාමණිය, ශ්‍රමණශාක්‍ය පුත්‍රයන්ට රන් රිදී කහවණු අකැපය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන් රිදී කහවණු නොඉවසත්. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රන් රිදී කහවණු පිළිනොගනිත්. ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ බහාතබනලද රන් රුවන් ඇත්තාහ. ඉවත්කළ රන් රිදී කහවණු ඇත්තාහ. ගාමණිය, යමෙකුට රන් රිදී කහවණු කැපනම් ඔහුට පස්කම් සැපම කැප වෙත්. ඔහුටම රන් රිදී කහවණු කැපය. ගාමණිය මෙය ඒකාන්තයෙන් අශ්‍රමණ ධර්මයකැයිද අශාක්‍ය පුත්‍ර ධර්මයකැයිද දැනගන්නෙහිය. එහෙත් ගාමණිය මම මෙසේ කියමි. තෘණකැමැත්තවුන් විසින් තෘණ සෙවිය යුතුය. ලී දඬු කැමැත්තන් විසින් ලී දඬු සෙවිය යුතුය. ගැල්වලින් ප්‍රයොජන ඇත්තන් විසින් ගැල් සෙවිය යුතුය. පුරුෂයන්ගෙන් ප්‍රයෝජන ඇත්තන් විසින් පුරුෂයන් සෙවිය යුතුය. ගාමණිය, මම කිසිම ආකාරයකින් රන් රිදී මසු සෙවිය යුතුයයි ඉවසිය යුතුයැයි නොකියමියි." වදාළසේක.

---

## 11. භද්‍රක සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මල්ල ජනපදයන්හි උරුවෙල කප්ප නම් මල්ල රජවරුන්ගේ නියම් ගමෙහි වාසය කරණසේක. එකල්හි භද්‍රග

ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන් භද්‍රභ ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට දුකට හේතුවද දුක නැතිකිරීමද, දේශනා කරන්නේ නම් යහපතැයි කීයේය.

2. "ඉදින් ගාමණිය, මම ඔබට අතීත කාලයෙහි මෙසේ වීයයි අතීත කාලය අරබයා දුකට හේතුවද දුක නැතිකිරීමද දෙශනා කරන්නෙම් නම් එහි ඔබට සැකයක් විමතියක් වන්නේය. ගාමණිය, මම ඔබට අනාගත කාලය අරබයා අනාගත කාලයෙහි මෙසේ වන්නේ යයි දුකට හේතුවත් දුක නැතිකිරීමත් ඉදින් දෙශනා කරන්නෙම් නම් එහිද ඔබට සැකයක් විමතියක් වන්නේය. ගාමණිය, මෙහි ඉන්නාවූ මම මෙහි ඉන්නාවූ තොපට දුකට හේතුවද දුක නැතිකිරීමද, දෙශනා කරන්නෙමි. එය අසව යහපත්සේ මෙනෙහි කරව. දෙශනා කරන්නෙමියි" වදාළේය.

"එසේයයි ස්වාමීනි, භද්‍රග ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළේය.

"ගාමණිය, ඒ කුමකැයි සිතන්නෙහිද යම් කෙනෙකුන්ගේ මරණයෙන් හෝ හිරකිරීමකින් හෝ ධනහානියකින් හෝ නින්දාවකින් හෝ ශොකය, වැළපීම, කායික චෛතසික දුක දොම්නස දැඩි ආයාසය යන දුක් උපදින්නාහු නම් එවැනි මනුෂ්‍යයෝ තොපට මේ උරුවෙලකප්පයෙහි ඇත්තාහුද?"

"ස්වාමීනි. මට උරුවෙලකප්පයෙහි යම් කෙනෙකුන්ගේ මරණයෙන් හෝ හිරකිරීමකින් හෝ ධන හානියකින් හෝ නින්දාවකින් හෝ ශොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපයාසයෝ උපදිත් නම් එබඳු මනුෂ්‍යයෝ මට ඇත්තාහුය." "ගාමණිය, යම් කෙනෙකුන්ගේ මරණයෙන් හෝ හිරකිරීමකින් හෝ ධන හානියෙන් හෝ නින්දාවකින් හෝ ශොකපරිදෙවදුක්ඛ දොමනස්සය උපායාසයෝ නූපදින්නාහුද එබඳු මනුෂ්‍යයෝ තොපට මේ උරුවෙලකප්පයෙහි ඇත්තාහුද?"

"ස්වාමීනි, මට යම් කෙනෙකුන් මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ නින්දාවෙන් හෝ ශොක පරිදෙවදුක්ඛ දොමනස්සයෝ නූපදිත්ද?, එවැනි මනුෂ්‍යයෝද මට උරුවෙලකප්පයෙහි ඇත"

"ගාමණිය, ඇතැම් උරුවෙලකප්පවාසී මනුෂ්‍යයන්ගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ නින්දාවෙන් හෝ ශොකපරිදෙවදුක්ඛ දොමනස්ස උපායාසයන් උපදින්නාහුද? ඊට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? ගාමණිය, ඇතැම් උරුවෙලකප්පවාසී මනුෂ්‍යයන්ගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ නින්දාවෙන් හෝ සොකපරිදෙව දුක්ඛදොමනස්ස උපායාසයෝ නූපදින්නාහුද ඊට හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද?"

"ස්වාමීනි, මට යම් උරුවෙලකප්පවාසී මනුෂ්‍යයන්ගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ හානියෙන් හෝ නින්දාවෙන් හෝ සොකපරිදෙව දුක්ඛදොමනස්ස උපායාසයෝ උපදින්නාහුද ඔවුන් කෙරෙහි මගේ ආශාවක් ඇත්තේය. ස්වාමීනි, මට යම් උරුවෙලකප්පවාසී මනුෂ්‍යයන්ගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ නින්දාවෙන් හෝ සොකපරිදෙව දුක්ඛදොමනස්ස උපායාසයෝ නූපදින්නාහු නම් ඔවුන් කෙරෙහි මට ආශාවක් නැත්තේය."

**4.** "ගාමණිය, ඔබ දක්නාලද ප්‍රකට කරනලද පැමිණෙනලද බැසගන්නාලද මේ ධර්මයෙන් අතීත, අනාගත දෙකක් දැනගනුව. අතීත අනාගතවූ යම් දුකක් උපදීද ඒ සියල්ලද ආශාව මුල්කොට ඇත්තේය. ආශාව හෙතුකොට ඇත්තේය. ආශාව දුකට මුල්වෙයි. යම් කිසි අනාගත දුකක් උපදින්නේද ඒ සියල්ල ආශාව මුල්කොට ඇත්තේය. ආශාව හෙතුකොට ඇත්තේය. ආශාව දුකට මුලයයි වදාළසේක.

**5.** "ස්වාමීනි, ආශ්චර්යය, ස්වාමීනි අද්භූතය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ යම්කිසි අතීත අනාගත දුකක් උපදීද ඒ සියල්ල ආශාව මුල්කොට ඇත්තේය. ආශාව

හෙතුකොට ඇත්තේය. ආශාව දුකට මුලයයිද යම්කිසි අනාගත දුකක් උපදින්නේද ඒ සියල්ල ආශාව මුල්කොට ඇත්තේය. ආශාව හෙතුකොට ඇත්තේය, ආශාව දුකට මුලයයි වදාළ වචනය ඉතා යහපත්කොට වදාරණලදැයි" කීය.

**6.** "ස්වාමීනි, මට නුවරින් පිට වාසය කරන්නාවූ චිරවාසී නම් කුමරෙක් ඇත ස්වාමීනි, ඒ මම වේලාසනින්ම නැගිට 'බොල යව, චිරවාසී කුමාරයාගේ සුවදුක් දැන එවයි' පුරුෂයකු යවන්නෙමි. ස්වාමීනි, යම්තාක් ඒ පුරුෂතෙම නොඑයිද චිරවාසී කුමාරයාට කිසි ආබාධයක්වත් දැයි මගේ සිත වෙනස්වෙයි.

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නෙහිද ඔබගේ චීරවාසී කුමාරයාගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ නින්දාවෙන් හෝ ශොක පරිදෙවදුඃඛ දොමනස්ස උපායාසයෝ උපදින්නාහුද?"

"ස්වාමීනි, මගේ චිරවාසී කුමාරයාගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ නින්දාවෙන් හෝ ජීවිතයාගේ වෙනසක් වන්නේය. කුමක් හෙයින් ශොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසයෝ නූපදින්නාහුද?"

"ගාමණිය, මේ ආකාරයෙන්ද යම් කිසි දුකක් උපදී නම් ඒ සියල්ල ආශාව මුල්කොට ඇත්තේය. ආශාව හෙතුකොට ඇත්තේය දුකට ආශාව මුලයයි දතයුතුයි.

**7.** "ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? යම් (කිසි) කලෙක්හි තොප විසින් චිරවාසී කුමාරයාගේ මව නොදක්නා ලද්දීද? නොඅසන ලද්දීද? එකල්හි චිරවාසී කුමාරයාගේ මව කෙරෙහි කැමැත්තක් හෝ ආශාවක් හෝ ප්‍රෙමයක් හෝ වූයේද?" "ස්වාමීනි, එසේ නොවීය."

"ගාමණිය තොපට දැකීම නිසා හෝ ගාමණිය තොපට ඇසීම නිසා හෝ චිරවාසී කුමාරයාගේ මව කෙරෙහි කැමැත්ත හෝ ආශාව හෝ ප්‍රේමය හෝ වූයේද?" "ස්වාමීනි, එසේය."

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? තොපට චිරවාසී කුමාරයාගේ මවගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන

හානියෙන් හෝ නින්දාවෙන් හෝ ශෝකපරිදෙව දුක් දොම්නස් උපායාසයන් උපදින්නාහුද?”

“ස්වාමීනි. මට චිරවාසී කුමාරයාගේ මවගේ මරණයෙන් හෝ බන්ධනයෙන් හෝ ධන හානියෙන් හෝ නින්දාවෙන් හෝ ජීවිතයේ වෙනසක්ද වන්නේය. කුමක් නිසා මට ශෝක පරිදෙව දුක් දොම්නස් උපායාසයෝ නූපදින්නාහුද?

‘ගාමණිය, මේ කරුණින්ද යම්කිසි දුකක් උපදී නම් ඒ සියල්ල ආශාව මුල්කොට ඇත්තේය. ආශාව හෙතුකොට ඇත්තේය. ආශාව දුකට මුලයයි දතයුතුයයි වදාළේය.

---

## 12. රාසිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති රාසිය නම් ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් රාසිය ගාමණිතෙම භාග්‍යවතුන්සේට “ස්වාමීනි, ‘ශ්‍රමණ ගෞතමතෙම සියලු තපස්වලට ගර්හා කරති. රූක්ෂව ජීවත් වන සියලු තපස් ඇත්තන්ට ඒකාන්තයෙන් දොස් කියත්. ආක්‍රොශ කෙරෙත් යයි,’ මෙය මා විසින් අසන ලදී. ස්වාමීනි, යම් ඒ කෙනෙක් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සියලු තපස්වලට ගරහති. රූක්ෂව ජීවත්වන සියලු තපස් ඇත්තන්ට දොස් කියති. ආක්‍රොශ කරතිය’යි යමෙක් කීවාහුද, කිමෙක්ද ඔව්හු භාග්‍යවතුන් වහන්සේ කියන ලද්දක් කියන්නහුද භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චොදනා නොකරන්නාහුද? ධර්මයට අනුකූල දෙයක් ප්‍රකාශ කරත්ද? කිසියම් කරුණු සහිත වාදයකින් ගැරහිය යුතු තැනට නොපැමිණේ දැයි” ඇසුයේය.

2. “ගාමණිය, යම් ඒ කෙනෙක් ‘ශ්‍රමණ ගෞතමතෙම සියලු තපස් ගරහති. රූක්ෂව ජීවත්වන සියලු තපස් ඇත්තන්ට

ඒකාන්තයෙන් දොස් කියත්. ආක්‍රොශ කරත්"යයි මෙසේ කියන්නාහුද ඔව්හු මා විසින් කියන ලද්දක් කියන්නාහු නොවෙති. ඔව්හු මාහට බොරුවෙන් චොදනා කරන්නාහුය.

"ගාමිණිය, පැවිද්දා විසින් සෙවනය නොකළ යුතු මේ අන්ත දෙකක් වෙයි. යම් මේ හීනවූ ග්‍රාම්‍යවූ පෘථග්ජනයන්ට අයත් ආර්ය නොවූ අනර්ථය පිණිස පවත්නාවූ කම්සැපෙහි ඇලී වාසය කිරීමක් වෙයිද යම් මේ දුක්වූ අනාර්යවූ අනර්ථය පිණිස පවත්නාවූ ශරීරයට දුක්දීමෙහි යෙදී වාසය කිරීමක් වෙයිද මේ අන්ත දෙක වෙයි.

"ගාමණිය, මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරනලද මධ්‍යම ප්‍රතිපදාව ප්‍රඥා චක්ෂුස ඇතිකරන්නේය, ඤාණය ඇති කරන්නේය. කෙලෙස් සංසිඳුවීම පිණිස විශෙෂයෙන් දැනීම පිණිස යහපත් අවබොධය පිණිස නිවන පිණිස පවත්නේය. ගාමණිය, තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරන ලද්දාවූ ප්‍රඥාචක්ෂුස ඇති කරන්නාවූ ඤාණය උපදවන්නාවූ කෙලෙස් සංසිඳවීම පිණිස පවත්නාවූ විශෙෂ ඥානය පිණිස පවත්නාවූ යහපත් අවබොධය පිණිස පවත්නාවූ නිවන පිණිස පවත්නාවූ ඒ මධ්‍යම ප්‍රතිපදාව කවරීද, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමය. ගාමණිය, මේ වනාහි තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරන ලද ප්‍රඥාචක්ෂුස ඇති කරන්නාවූ ඤාණය ඇති කරන්නාවූ කෙලෙස් සංසිඳුවීම පිණිස පවත්නාවූ විශෙෂ ඥානය පිණිස පවත්නාවූ යහපත් අවබොධය පිණිස පවත්නාවූ නිවන පිණිස පවත්නාවූ මධ්‍යම ප්‍රතිපදාවයි.

3. "ගාමණිය, කාමභොගීන් තුන්දෙනෙක් ලොකයෙහි ඇත්තාහුය. කවර තුන්දෙනෙක්ද යත්. ගාමණිය, මේ ලොකයෙහි ඇතැම් කාමභොගියෙක්තෙම අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයි. අධර්මයෙන් සාහසිකව වස්තුව සපයා තමාද සැප නොවිඳියි. නොපිණවයි. අනුන්ටද බෙදා නොදෙයි පින්

නොකෙරෙයි. මේ ලෝකයෙහි ඇතැම් කාම භොගියෙක් තෙම අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයි. අධර්මයෙන් සාහසිකව වස්තුව සපයා තමා සැප විඳියි. පිණවයි. අනුන්ට බෙදා නොදෙයි. පින් නොකෙරෙයි. ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම් කාමභොගියෙක් තෙම අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයි. අධර්මයෙන් හාහසිකව වස්තුව සපයා තමාද සුවපත් වෙයි. පිණවයි. බෙදා දෙයි. පින් කරයි.

**4.** "ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම් කාමභොගියෙක් තෙම ධර්මයෙන්ද, අධර්මයෙන්ද සාහසිකවද, අසාහසිකවද, වස්තුව සපයයි ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සාහසිකවද, අසාහසිකවද වස්තුව සපයා තමාද සැප නොවිඳියි නොපිණවයි. බෙදා නොදෙයි පින් නොකරයි. ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම් කාමභොගියෙක් තෙම ධර්මයෙන්ද අධර්මයෙන්ද, සාහසිකවද, අසාහසිකවද වස්තුව සපයයි. ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සාහසිකවද, අසාහසිකවද වස්තු සපයා තමා සැප විඳියි. පිණවයි. බෙදා නොදෙයි. පින් නොකරෙයි. ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම් කාමභොගියෙක් තෙම ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සාහසිකවද, අසාහසිකවද, වස්තුව සපයා තමා සැප විඳියි. බෙදා දෙයි පින් කෙරෙයි.

**5.** "ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම් කාමභොගියෙක් තෙම ධර්මයෙන් අසාහසිකව වස්තුව සපයයි. ධර්මයෙන් අසාහසිකව වස්තුව සපයා තමා සැප නොවිඳියි. නොපිණවයි. බෙදා නොදෙයි. පින් නොකරයි. ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම් කාමභොගියෙක් තෙම ධර්මයෙන් අසාහසිකව වස්තුව සපයයි. ධර්මයෙන් අසාහසිකව වස්තුව සපයා තමා සැප විඳියි. පිණවයි බෙදා නොදෙයි. පින් නොකෙරෙයි. ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම් කාමභොගියෙක් තෙම ධර්මයෙන් අසාහසිකව වස්තුව සපයයි. ධර්මයෙන් අසාහසික වස්තුව සපයා තමා සැප විඳියි. පිණවයි බෙදාදෙයි. පින් කරයි. ඒ වස්තුව ඇලී ගැලී මුසපත්ව ආදීනව නොදැක නිස්සරණ ප්‍රඥාවෙන් තොරව පරිභොග කරයි. ගාමණිය, මේ ලෝකයෙහි ඇතැම්

කාමභෝගී පුද්ගලයෙක් ධර්මයෙන් අසාහසිකව වස්තුව සපයයි. ධර්මයෙන් අසාහසිකකමින් වස්තුව සපයා තමා සැප විඳියි, පිණවයි. බෙදා දෙයි, පින් කරයි ඒ වස්තුව නොඇලී නොගිලී මුසපත් නොවී පරිභෝග කරයි.

**6.** "ගාමණිය, මොවුන් අතුරෙන් යම් මේ කාමභෝගියෙක් අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයිද, අධර්මයෙන් සාහසිකව වස්තුව සපයා තමා සැපනොවිඳියිද, නොපිණවයිද, බෙදා නොදෙයිද, පින් නොකරයිද, ගාමණිය, මේ කාමභෝගී තෙම කරුණු තුනකින් ගැරහිය යුතු වන්නේය. කවර කරුණු තුනකින් ගැරහිය යුත්තේද යත්, අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයි යන මේ පළමුවෙනි කරුණින් ගැරහිය යුතුවේ. තමා සැප නොවිඳියි, නොපිණවයි, යන මේ දෙවෙනි කරුණින් ගැරහිය යුතුවේ. බෙදා නොදෙයි. පින් නොකෙරෙයි, යන මේ තුන්වෙනි කරුණින් ගැරහිය යුතුවේ. ගාමණිය, මේ කාමභෝගි පුද්ගලතෙම මේ කරුණු තුනින් ගැරහිය යුතුවේ.

**7.** "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් ඒ මේ කාමභෝගි පුද්ගලයෙක් ධර්මයෙන් සාහසිකව වස්තුව සපයයිද, අධර්මයෙන් සාහසිකව වස්තුව සපයා තමා සැප විඳියිද, බෙදා නොදෙයිද පින් නොකරයිද, ගාමණිය, මේ කාමභෝගිතෙම කරුණු දෙකකින් ගැරහිය යුතුවෙයි. එක් කරුණකින් පැසසිය යුතුවේ. කවර කරුණු දෙකකින් ගැරහිය යුතුද අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයි යන මේ පළමුවෙනි කරුණින් ගැරහිය යුතුවෙයි. බෙදා නොදෙයි. පින් නොකරයි යන මේ දෙවැනි කරුණින් ගැරහිය යුතුවෙයි. කවර එක් කරුණකින් පැසසිය යුත්තේද, තමා සැප විඳියි. පිණවයි යන මේ එක් කරුණකින් පැසසිය යුතුවෙයි. ගාමණිය මේ කාමභෝගීතෙම මේ කරුණු දෙකින් ගැරහිය යුතුවෙයි. මේ එක් කරුණකින් පැසසිය යුතු වෙයි.

**8.** "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභෝගියෙක් තෙම අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයිද, අධර්මයෙන් සාහසිකව වස්තුව සපයා තමා සැප විඳියිද, පිණවයිද, බෙදා දෙයිද, පින්කරයිද, ගාමණිය, මේ කාම භෝගීතෙම එක්

කරුණකින් ගැරහිය යුතු වෙයි. කරුණු දෙකකින් පැසසිය යුතුවෙයි. කවර එක් කරුණකින් ගැරහිය යුත්තේද, අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයි යන මේ එක් කරුණින් ගැරහිය යුතු වෙයි. කවර කරුණු දෙකකින් පැසසිය යුත්තේද යත් තමා සැප විඳියි. පිනවයි යන මේ පළමුවෙනි කරුණින් පැසසිය යුතුවෙයි. බෙදා දෙයි පින් කෙරෙයි මේ යන දෙවෙනි කරුණින් පැසසිය යුතු වෙයි. ගාමණිය මේ කාමභෝගිතෙම එක් කරුණකින් ගැරහිය යුතුවෙයි. මේ කරුණු දෙකකින් පැසසිය යුතුවෙයි.

**9.** "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභෝගියෙක් තෙම ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සාහසිකවද, අසාහසිකවද වස්තුව සපයයිද, තමා සැප නොවිඳියිද, නොපිණවයිද, බෙදා නොදෙයිද පින් නොකරයිද, ගාමණිය මේ කාමභොගීතෙම එක් කරුණකින් පැසසිය යුතුවෙයි. කරුණු තුනකින් ගැරහිය යුතුවෙයි. කවර එක් කරුණකින් පැසසිය යුතුද? ධර්මයෙන් අසාහසිකව වස්තුව සපයයි යන මේ කරුණකින් පැසසිය යුතුවේ. කවර තුන් කරුණකින් ගැරහිය යුතුද? අධර්මයෙන් සාහසිකව වස්තුව සපයයි. මේ පළමුවන කරුණින් ගැරහිය යුතුවෙයි. තමා සැප නොවිඳියි, නොපිණවයි යන දෙවෙනි කරුණින් ගැරහිය යුතුවෙයි. බෙදා නොදෙයි, පින් නොකරයි යන තුන්වෙනි කරුණින් ගැරහිය යුතුවෙයි. ගාමණිය, මේ කාමභෝගිතෙම මේ එක් කරුණකින් පැසසිය යුතු වෙයි. මේ කරුණු තුනකින් ප්‍රශංසා කටයුතු වෙයි.

**10.** "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභොගියෙක් තෙම ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සැහැසිවද, නොසැහැසිවද වස්තුව සපයයිද, ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සැහැසිවද, නොසැහැසිවද වස්තුව සපයා තමා සැප විඳියිද, පිණවයිද, බෙදා නොදෙයිද, පින් නොකරයිද, ගාමණිය මේ කාමභොගි තෙමෙ කරුණු දෙකකින් පැසසිය යුතුවේ. කරුණු දෙකකින් ගැරහිය යුතුවේ. කවර කරුණු දෙකකින් පැසසිය යුතුද? ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයි යන මේ පළමුවැනි

කරුණකින් පැසසිය යුතුවෙයි. තමා සැපවිඳියි. පිණවයි යන මේ දෙවෙනි කරුණින් පැසසුම් ලැබියයුතු වෙයි. කවර කරුණු දෙකකින් ගැරහිය යුතුද? අධර්මයෙන් සැහැසිව වස්තුව සපයයි යන මේ පළමුවෙනි කරුණින් ගැරහිය යුතුවේ බෙදා නොදෙයි පින් නොකෙරේයයි යන මේ දෙවෙනි කරුණින් ගැරහිය යුතුවේ. ගාමණිය මේ කාමභොගි තෙම මේ කරුණු දෙකින් පැසසිය යුතුවේ. මේ කරුණු දෙකින් ගැරහිය යුතුවේ.

11. "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභොගියෙක් තෙම ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සැහැසිවද, නොසැහැසිවද, වස්තුව සපයයිද, ධර්මයෙන්ද, අධර්මයෙන්ද, සැහැසිවද නොසැහැසිවද වස්තුව සපයා තමා සැප විඳියිද, පිණවයිද, බෙදා දෙයිද, පින් කරයිද, ගාමණිය මේ කාමභොගී තෙම කරුණු තුනකින් පැසසිය යුතුවෙයි.

"එක් කරුණකින් ගැරහිය යුතුවෙයි. කවරකරුණු තුනකින් පැසසිය යුතුද? ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයියන මේ පළමුවැනි කරුණකින් පැසසිය යුතුවේ. තමා සැප විඳියි පිණවයි යන මේ දෙවැනි කරුණින් පැසසිය යුතුවෙයි. බෙදා දෙයි පින් කරයි යන මේ තුන්වැනි කරුණින් පැසසිය යුතුවෙයි. කවර එක් කරුණකින් ගැරහිය යුතුද? අධර්මයෙන් සැහැසිව වස්තුව සපයයි යන මේ එක් කරුණකින් ගැරහිය යුතුවෙයි. ගාමණිය මේ කාමභොගී තෙම මේ කරුණු තුනින් පැසසිය යුතුවෙයි. මේ එක් කරුණකින් ගැරහිය යුතුවෙයි.

12. "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභොගියෙක් තෙම ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයිද, ධර්මයෙන් නොහැසිව වස්තුව සපයා තමා සැප නොවිඳියිද නොපිණවයිද, බෙදා නොදෙයිද, පින් නොකරයිද, ගාමණිය මේ කාමභොගී තෙම එක් කරුණකින් ප්‍රශංසා කටයුතු වෙයි. කරුණු දෙකකින් ගැරහිය යුතුවෙයි. කවර එක් කරුණකින් පැසසිය යුතුවෙයිද? ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයි යන මේ එක් කරුණින් පැසසිය යුතුවෙයි. කවර කරුණු දෙකකින් ගැරහිය යුතුද? තමා සැප නොවිඳියි නොපිණවයි යන මේ පළමුවන කරුණින්

ගැරහිය යුතු වෙයි. නොබෙදයි පින් නොකෙරෙයි යන මේ දෙවෙනි කරුණින් ගැරහිය යුතු වෙයි. ගාමණිය මේ කාමභොගීතෙම මේ එක් කරුණකින් පැසසිය යුතුවේ. මේ කරුණු දෙකින් ගැරහිය යුතුවේ.

13. "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභොගියෙක් ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයිද, ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයා සැප විඳියිද, පිණවයිද, නොබෙදයිද, පින් නොකරයිද, ගාමණිය මේ කාමභොගීතෙම කරුණු දෙකකින් පැසසිය යුතුවේ. එක් කරුණකින් ගැරහිය යුතුවේ. කවර කරුණු දෙකකින් පැසසිය යුතුවේද? ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයිද යන මේ පළමුවෙනි කරුණින් පැසසිය යුතුය. තමා සැපවිඳියි පිණවයි යන දෙවෙනි කරුණින් පැසසිය යුතුවෙයි. කවර එක් කරුණකින් ගැරහිය යුතුද? බෙදා නොදෙයි පින් නොකරයි යන මේ එක් කරුණින් ගැරහිය යුතුය. ගාමණිය මේ කාමභොගීතෙම මේ කරුණු දෙකකින් පැසසිය යුතුය" මේ එක් කරුණකින් ගැරහිය යුතුය.

14. "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභොගියෙක් තෙම ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයිද, ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයා සුවපත්වෙයිද, පිණවයිද බෙදාදෙයිද, පින්කරයිද, හෙතෙම ඒ වස්තුව ඇලීගැලී මුසපත්ව ආදීනව නොදක්නේ නිස්සරණ ප්‍රඥාවෙන් තොරව පරිභොග කරයි. ගාමණිය මේ කාමභොගීතෙම කරුණු තුනකින් පැසසිය යුතුවේ. එක් කරුණකින් ගැරහිය යුතුවේ. කවර කරුණු තුනකින් පැසසිය යුතුද? ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයි යන මේ පළමුවන කරුණින් පැසසිය යුතුවෙයි. තමා සැප විඳියි පිණවයි යන මේ දෙවෙනි කරුණින් ප්‍රසංසා කටයුතු වෙයි. බෙදයි පින් කෙරේයයි මේ තුන්වෙනි කරුණින් පැසසිය යුතු වෙයි. කවර එක් කරුණකින් ගැරහිය යුතුද? ඒ වස්තුව ඇලී ගැලී මුසපත්ව පරිභොග කරයි යන මේ එක් කරුණකින් ගැරහිය යුතුවෙයි. ගාමණිය මේ කාමභොගීතෙම මේ කරුණු තුනින් පැසසිය යුතුවෙයි. මේ එක් කරුණකින් ගැරහිය යුතු වෙයි.

**15.** "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කාමභෝගියෙක් තෙම ධර්මයන් නොසැහැසිව වස්තුව සපයයිද, ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයා සැප විඳියිද, පිණවයිද, බෙදා දෙයිද, පින් කරයිද, ඒ වස්තුව නොඇලී නොගිලී මුසපත් නොවී ආදීනව දක්නේ නිස්සරණ ප්‍රඥාවෙන් යුක්තව පරිභොග කරයිද, ගාමණිය, මේ කාමභෝගී තෙම කරුණු සතරකින් පැසසිය යුතු වෙයි. කවර කරුණු සතරකින් පැසසිය යුතුවෙයිද, ධර්මයෙන් නොසැහැසිව වස්තුව සපයයිද, මේ පළමුවෙනි කරුණින් පැසසිය යුතු වෙයි. සැප විඳියි පිණවයි යන මේ දෙවෙනි කරුණින් පැසසිය යුතු වෙයි. බෙදයි. පින් කරයි යන මේ තුන්වෙනි කරුණින් පැසසිය යුතුවෙයි. ඒ වස්තුව නොඇලී නොගිලී මුසපත් නොවී ආදීනව දක්නේ නිස්සරණ ප්‍රඥාවෙන් යුක්තව පරිභොග කෙරෙයි යන මේ සතරවෙනි කරුණින් පැසසිය යුතුවෙයි. ගාමණිය, මේ කාමභොගීතෙම මේ කරුණු සතරින් පැසසිය යුතුවෙයි.

**16.** "ගාමණිය, ලොකයෙහි කටුක ජීවිතයක් ඇත්තාවූ තාපසයෝ තුන්දෙනෙක් ඇත්තාහුය. කවර තුන්දෙනෙක්ද යත්, ගාමණිය, මේ ලොකයෙහි කටුකව ජීවත්වන තාපසයෙක් කුශල ධර්ම රැස්කරගන්නෙම් නම් යහපත. මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිදුකරන ඥාණ දර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂ කරන්නෙම්නම් යෙහෙකැයි සිතා ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම අනගාරිකව පැවිදිවූයේ නම් හෙතෙම තමා තවයි, හාත්පසින් තවයි. කුශල ධර්මයන්ද රැස් නොකරයි. මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිදුකරන ඥාණ දර්ශන විශෙෂයක්ද ප්‍රත්‍යක්ෂ නොකරයි.

"ගාමණිය, මේ ලෝකයෙහි කටුක ජීවිකාව ඇති එක් තාපසයෙක් කුශල ධර්මයක් උපදවා ගන්නෙම් නම් යහපත. මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිදු කිරීමට සමර්ථ ඥාණ දර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් යහපතැයි ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම අනගාරිකව පැවිදිවූයේ වෙයි. හෙතෙම තමා තවයි. හාත්පස තවයි. කුසල්ද රැස්කරගනියි.

මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිදු කිරීමෙහි සමර්ථ ඥානදර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂ නොකරයි. ගාමණිය, ලෝකයෙහි කටුක ජීවිතය ඇති ඇතැම් තාපසයෙක් කුශල ධර්මයක් රැස්කරන්නෙම් නම් යෙහෙක. මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිදුකිරීමෙහි සමර්ථ ඥාණ දර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂකරන්නෙම් නම් මැනවැයි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම අනගාරිකව පැවිදි වෙයි. හෙතෙම තමන් තවයි. හාත්පස තවයි. කුසල්ද රැස්කරයි. මනුෂ්‍යධර්මයට වඩා උසස් ආර්යභාවයක් සිදු කිරීමට සමර්ථ ඥාණ දර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂ කරයි.

17. "ගාමණිය, ඔවුන් අතුරෙන් යම් මේ කටුක ජීවිතයක් ඇති තාපසයෙක් තමන් තවයිද විශෙෂයෙන් තවයිද කුශල ධර්ම රැස් නොකරයිද, මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිදුකරන සමර්ථ ඥාණදර්ශනයක් ප්‍රත්‍යක්ෂ නොකරයිද ගාමණිය රූක්ෂව ජීවත්වන මේ තවුස්තෙමේ කරුණු තුනකින් ගැරහිය යුතුවේ. කවර කරුණු තුනකින් ගැරහිය යුතු වේද, තමන් තවයි, විශෙෂයෙන් තවයි මේ පළමුවන කරුණින් ගැරහිය යුතුය. කුශල ධර්ම රැස් නොකරයි, යන මේ දෙවෙනි කරුණින් ගැරහිය යුතුය. මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්ය භාවය සිදුකරන ඥාණදර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂ නොකරයිද, මේ තුන්වැනි කරුණින් ගැරහිය යුතුය. රූක්ෂව ජීවත්වන මේ තපස්වී තෙම මේ කරුණු තුනින් ගැරහිය යුතුය.

18. "ගාමණිය, එහි යම් මේ රූක්ෂව ජීවත්වන තාපසයෙක් තමන් තවයිද, විශෙෂයෙන් තවයිද, කුශල ධර්මයන් රැස්කරයිද, මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්ය භාවය සිදුකරන විශෙෂ ඥාණයෙන් ප්‍රත්‍යක්ෂ නොකරයිද, ගාමණිය, රූක්ෂව ජීවත්වන මේ තපස්වීතෙම කරුණු දෙකකින් ගැරහිය යුතු වෙයි. එක් කරුණකින් පැසසියයුතු වෙයි. කවර කරුණු දෙකකින් ගැරහිය යුත්තේද? තමන් තවයි විශෙෂයෙන් තවයි යන මේ පළමුවන කරුණින් ගැරහිය යුතු වෙයි. මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිද්ධකරන විශෙෂ ඥාණයක් ප්‍රත්‍යක්ෂ නොකෙරෙයි යන මේ දෙවැනි කරුණින් ගැරහියයුතු වෙයි. කවර එක්

කරුණකින් පැසසිය යුතු වෙයිද? කුශල ධර්මයන් රැස්කරයි යන මේ එක් කරුණකින් පැසසිය යුතු වෙයි. ගාමණිය, රූක්ෂව ජීවත්වන මේ තපස්වීතෙම මේ කරුණු දෙකකින් ගැරහිය යුතු වෙයි. මේ එක් කරුණකින් පැසසියයුතු වෙයි.

**19.** "ගාමණිය, ඔවුන් අතුරෙන් රූක්ෂව ජීවත්වන යම් තපස්වියෙක් තමන් තවයිද, හාත්පසින් තවයිද, කුශල ධර්මයන්ද ලබයිද, මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්යභාවය සිද්ධකරන විශෙෂ ඥාණයක් ප්‍රත්‍යක්ෂ කරයිද, ගාමණිය, රූක්ෂව ජීවත්වන මේ තපස්වීතෙම එක් කරුණකින් ගැරහිය යුතුවෙයි. කරුණු දෙකකින් පැසසිය යුතුවෙයි. කවර එක් කරුණකින් ගැරහිය යුතුද? තමන් තවයි. හාත්පසින් තවයි යන මේ එක් කරුණින් ගැරහිය යුතු වෙයි. කවර කරුණු දෙකකින් පැසසිය යුතු වේද, කුශල ධර්ම රැස්කෙරෙයි. යනමේ පළමුවන කරුණින් පැසසිය යුතුවෙයි. මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්ය භාවය සිද්ධකරන විශෙෂ ඥාණයක් ප්‍රත්‍යක්ෂ කෙරෙයි. යන මේ දෙවැනි කරුණින් පැසසිය යුතු වෙයි. ගාමණිය, රූක්ෂව ජීවත්වන මේ තපස්වීතෙම මේ එක් කරුණකින් ගැරහිය යුතු වෙයි. මේ කරුණු දෙකින් පැසසිය යුතු වෙයි.

**20.** "ගාමණිය, මේ ආත්මයෙහි විපාක දෙන්නාවූ කල් නොයවා දෙන ඵල ඇත්තාවූ 'එව, බලව' යයි පෙන්විය හැකි ඵල ඇත්තාවූ නුවණැත්තන් විසින් වෙන වෙනම තමන් තුළ ඵළවාගත යුතුවූ කෙලෙස් දුරවීම් තුනක් ඇත්තාහ. කවර තුන්දෙනෙක්ද යත්?

රාගයෙන් මත්වූ යමෙක් රාගය හෙතුකොටගෙන තමන්ට විපත් පිණිස සිතයි. අනුන්ට විපත් පිණිස සිතයි. දෙපක්ෂයටම විපත් පිණිස සිතයි. රාගය ප්‍රහීණවූ කල්හි තමන්ට විපත් පිණිසද නොසිතයි. අනුන්ට විපත් පිණිසද නොසිතයි. තමන්ටද, අනුන්ටද, විපත් පිණිසද නොසිතයි. මේ මේ ආත්මයෙහි විපාක දෙන්නාවූ කල් නොයවා දෙන ඵල ඇත්තාවූ 'එව බලව' යයි පෙන්විය හැකි ඵල ඇත්තාවූ නුවණැත්තන් විසින් තමන් කෙරෙහි වෙන වෙනම ලා දතයුතුවූ කෙලෙස් දිරවීමයි.

යම්හෙයකින් ද්වෙෂයෙන් දුෂ්ටවූ පුද්ගලතෙමේ තමන් විපත් පිණිසද සිතයි. අනුන් විපත් පිණිසද සිතයි. තමන්ටද, අනුන්ටද, විපත් පිණිසද සිතයි. ද්වෙෂය ප්‍රහීණවූ කල්හි තමන්ට විපත් පිණිසද නොසිතයි. අනුන්ට විපත් පිණිසද නොසිතයි. තමන්ටද අනුන්ටද විපත් පිණිස නොසිතයි. මේ මේ ආත්මයෙහි එලදෙන්නාවූ කල් නොයවා එල දෙන්නාවූ 'එව බලවයි' පෙන්වියහැකි එල ඇත්තාවූ නුවණැත්තන් විසින් තමන් කෙරෙහි වෙන වෙනම ලා දතයුතුවූ කෙලෙස් දිරවීමයි. මුළාවූ පුද්ගලයා මෝහ හේතුවෙන් තමන්ටද විපත් පිණිස සිතයි. අනුන්ට විපත් පිණිසද සිතයි. තමන්ට හා අනුන්ට විපත් පිණිසද සිතයි. මොහය ප්‍රහීණවූ කල්හි තමන්ට විපත් පිණිසද නොසිතයි. අනුන්ට විපත් පිණිසද නොසිතයි. තමන්ටද අනුන්ටද විපත් පිණිස නොසිතයි. මේ මේ ආත්මයෙහි එලදෙන්නාවූ කල් නොයවා එලදෙන්නාවූ එව බලවයයි පෙන්වියහැකි එල ඇත්තාවූ නුවණැත්තන් විසින් තමන් කෙරෙහි වෙන වෙනම ලා දත යුතුවූ කෙලෙස් දිරවීමයි මෙසේ වදාළ කල්හි රාශිය ගාමණි තෙම භාග්‍යවතුන් වහන්සේට

21. "ස්වාමීනි යහපත ස්වාමීනි, යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුණ දෙයක් විවෘත කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තාහු රූප දකිත්වයි, අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරනලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂු සංඝයාද සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යෙමි. අද පටන් දිවි හිමියෙන් සරණ ගිය උපාසකයෙකු කොට මා දරණ සේක්වායි" කීය.

---

## 13. මනාප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ කොලිය රටෙහි උත්තරක නම් කොලියයන්ගේ නියම්ගමෙහි වාසය කරණසේක. එකල්හි පාටලිය ගාමණිතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද

එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් පාටලිය ගාමිණිතෙම 'ස්වාමීනි, මා විසින් ශ්‍රමණ ගෞතමතෙම මායා දනීයයි අසනලදී. ස්වාමීනි, යම් ඒ කෙනෙක් ශ්‍රමණ ගෞතමතෙම මායා දනීයයි කීවාහුද? ස්වාමීනි, කිමෙක්ද ඔව්හු භාග්‍යවතුන් වහන්සේ වදාරණ ලද්දක් කියන්නාහුද භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චෝදනා කරන්නාහු නොවෙත්ද? ධර්මයට අනුකූලවූ දෙයක් කියන්නාහුද, කරුණු සහිත වාදයකින් ගැරහිය යුතු තැනට නොපැමිණෙයිද? ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේට චෝදනා කිරීමට නොකැමැත්තෝ වෙමුයි" කීය.

"ගාමණිය, යම් ඒ කෙනෙක් 'ශ්‍රමණ ගෞතමතෙම මායා දනීයයි' කීවාහුද, ඔව්හු මා විසින් කියන ලද්දක්ම කියන්නාහුය. මා බොරුවෙන් චොදනා කරන්නහු නොවෙත් ධර්මයට අනුකූල දෙයක් කියන්නාහුය. කිසියම් කරුණු සහිත වාදයක් ගැරහිය යුතු තැනට නොපැමිණෙයි. 'පින්වත ශ්‍රමණ ගෞතමතෙම මායාදනී ශ්‍රමණ ගෞතමතෙම මායා ඇත්තෙකැයි' ඒ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ කීම ඇත්තක්ම වුවත් නොඅදහවු. ගාමණිය, මම මායා දනිමියි යමෙක් කියයි නම් හෙතෙමද මම මායා ඇත්තෙකැයිද, මෙසේ කියන්නේද? "භාග්‍යවතුන් වහන්ස, එය එසේමය සුගතයන් වහන්ස එය එසේමවෙයි", "ගාමණිය, එසේනම් මෙය තගෙන්ම අසමි. තොපට යම්සේ වැටහේ නම් එසේ ප්‍රකාශ කරන්නෙහිය.

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? ගාමණිය, ඔබ කොලිය රජදරුවන්ගේ ලම්බචූලක නම් භටයන් දන්නෙහිද?" "ස්වාමීනි, මම කොලිය රජ දරුවන්ගේ ලම්බචූලක භටයන් දන්නෙමි."

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? කොලිය රජ දරුවන්ගේ ලම්බචූලක භටයෝ කුමක් සඳහාද?" - "ස්වාමීනි, යම් කොලියරට සොරුන් වෙත්ද, ඔවුන් වැළැක්වීමත් කොලිය රජ දරුවන්ගේ යම් පණිවුඩ පණත් ඇත්ද එය ගෙනයාම සඳහාත් යන මේ කරුණු පිණිස කොලියයන්ගේ භටයෝ වෙති."

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද?" "කොලියයන්ගේ ලම්බචූලක භටයන් සීලවන්තද, දුශ්ශීලදැයි ඔබ දන්නෙහිද?" "ස්වාමීනි, මම කොලියයන්ගේ ලම්බචූලක භටයන් දුශ්ශීල පාපයන් යයි දනිමි." "ලොකයෙහි දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇති යම් කෙනෙක්වේද කොලියයන්ගේ ලම්බචූලක භටයෝ ඔවුන්ගෙන් එක්තරා කොටසකි." "ගාමණිය, යමෙක් පාටලිය ගාමණිතෙම කොලියයන්ගේ දුශ්ශීලවූ ලාමකස්වභාව ඇති ලම්බචූලක භටයන් දනී. පාටලී ගාමණිතෙමේද දුශ්ශීලයෙහි ලාමක ධර්ම ඇත්තෙකැයි මෙසේ කියන්නේ නම් ඔහුගේ කීම හරිදැයි" ඇසූහ. "ස්වාමීනි, නැත කොලියයන්ගේ ලම්බචූලක භටයෝ අන්‍යයෝය. මම අනිකෙක්වෙමි. කොලියයන්ගේ ලම්බචූලක භටයෝ අන්‍ය ස්වභාව ඇත්තාහ. මම අනික් ස්වභාවයක් ඇත්තෙක්මි" "ගාමණිය, ඔබ දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇත්තාවූ කොලිය භටයන් පාටලිය ගාමණිතෙම දනියි. පාටලිය ගාමණිතෙම දුශ්ශීල නොවූ ලාමක ස්වභාව නැත්තෙක යන මෙය ලබන්නෙහි නම් තථාගත තෙමේ මායා දනී තථාගත තෙමේ මායා ඇත්තෙක් නොවේය යන මෙය කුමක් හෙයින් තථාගතතෙම නොලබන්නේද?

"ගාමණිය, මම මායාද දනිමි. මායාවගේ විපාකයන් දනිමි. යම්සේ පිළිපන් මායා සහිත පුද්ගලතෙමේ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය මම ප්‍රාණඝාතයද දනිමි. ප්‍රාණඝාතයාගේ විපාකයන් දනිමි. යම්සේ පිළිපන් ප්‍රාණඝාතක පුද්ගලතෙමේ කය බිඳීමෙන් මරණින් මතුසැපයෙන් පහවූ නපුරු ගතිඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද එයද දනිමි. ගාමණිය, මම අදින්නාදානයද දනිමි. අදින්නාදානයේ විපාකත් දනිමි. යම්සේ පිළිපන් අදින්නාදානයෙන් යුත් පුද්ගලයා කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය, මම කාමයන්හි වරදවා හැසිරීමත් දනිමි. කාමමිථ්‍යාචාරයාගේ විපාකයත් දනිමි යම්සේ පිළිපන් කාමමිථ්‍යාචාරී පුද්ගල තෙමේ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

උපදීද, එයද දනිමි. ගාමණිය, මම මුසාවාදයද දනිමි. මුසාවාදයේ විපාකයත් දනිමි. යම්සේ පිළිපන් මුසාවාදී පුද්ගලතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරුගති ඇති දුකට පැමිණෙන, නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය මම කේළාම් කීමද දනිමි. කේළාම් කීමේ විපාකත් දනිමි. යම්සේ පිළිපන් කේළාම් කියන පුරුෂතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය, මම ඵරුෂ වචනයද, දනිමි. ඵරුෂ වචනයේ විපාකත් දනිමි යම්සේ පිළිපන් ඵරුෂවචන කියන පුද්ගලතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය, මම ප්‍රලාපකීමද දනිමි. ප්‍රලාපකීමේ විපාකත් දනිමි. යම්සේ පිළිපන් ප්‍රලාප කියන පුද්ගලතෙම කය බිඳීමෙන් මරණින්මතු සැපයෙන් පහවූ නපුරු ගතිඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය, මම දැඩිලොභයත් දනිමි. දැඩි ලොභයාගේ විපාකත් දනිමි. යම්සේ පිළිපන් දැඩිලොභයාගෙන් යුත් පුද්ගලතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය, මම ව්‍යාපාද ද්වේෂයත් දනිමි. ව්‍යාපාද ද්වේෂයේ විපාකත් දනිමි. යම්සේ පිළිපන් ව්‍යාපාද ද්වේෂයෙන් යුත් පුද්ගලයා කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි. ගාමණිය, මම මිථ්‍යා දෘෂ්ටියද දනිමි. මිථ්‍යා දෘෂ්ටියේ විපාකත් දනිමි. යම්සේ පිළිපන් මිථ්‍යාදෘෂ්ටියෙන් යුත් පුද්ගල තෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති දුකට පැමිණෙන නිරයෙහි උපදීද, එයද දනිමි.

"ගාමණිය, යම් කිසිවෙක් සතුන් මරයිද ඒ හැමදෙනා මෙලොවම දුකත් දොම්නසත් විඳිත්, යම් කිසිවෙක් සොරකම් කරයිද ඒ හැමදෙන මෙලොවම දුකත් දොම්නසත් විඳිත්, යම් කිසිවෙක් කාමයන්හි වරදවා හැසිරෙයිද, ඒ හැමදෙන මෙලොවම දුකත් දොම්නසත් විඳිත්. යමෙක් බොරු කියයිද ඒ හැමදෙන

මෙලොවම දුකත් දොම්නසත් විඳිත්. මෙසේ කියන්නාවූ, මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහුය.

"ගාමණිය, මේ ලෝකයෙහි මාලා පැළඳගෙන කුණ්ඩලාභරණ පැළඳගෙන මනාකොට ස්නානය කළ සුවඳ විලවුන් ගැල්වූ කපනලද හිසකෙස් දැලිරැවුල් ඇති රජුන් මෙන් ස්ත්‍රීන් සමග කම්සැප විඳින පුරුෂයෙක් දක්නා ලැබේ. ඔහු ගැන 'පින්වත්නි, මේ පුරුෂතෙම මාලා පැළඳ කුණ්ඩලාභරණ පැළඳ මනාකොට ස්නානය කොට සුවඳ විලවුන් ගල්වා කපන ලද කෙස් දැලිරැවුල් ඇතිව රජෙකු මෙන් ස්ත්‍රීන් සමග සැප විඳින පුරුෂතෙමේ කුමක් කෙළේදැයි' අසන්නහු නම් 'පින්වත්නි, මේ පුරුෂතෙම රජහුගේ සතුරෙකු යටත් කර ජීවිතයෙන් තොර කළේ යයි' කියන්නාහුය. 'රජු ඔහුට සතුටුව වස්තුව දුන්නේය. එහෙයින් මේ පුරුෂතෙම මාලා පැළඳ කුණ්ඩලාභරණ පැළඳ මනාකොට ස්නානය කොට සුවඳ විලවුන් ගල්වා කපනලද කෙස් දැලිරැවුල් ඇතිව රජකු මෙන් ස්ත්‍රීන් සමග සැප විඳින්නේයයි' කියන්නාහුය.

"ගාමණිය, මේ ලෝකයෙහි ඇතැමෙක් දැඩි රැහැණකින් දෙඅත් පිටිකරට දැඩිකොට බැඳ හිස මුඩුකොට රළු ශබ්දය ඇති බෙර හඬින් වීථියෙන් වීථියට සන්ධියෙන් සන්ධියට ගෙන ගොස් දකුණු දොරටුවෙන් නික්මවා නුවරට දකුණු දිසාවෙහි හිස සිඳිනු ලබන්නෙක් දක්නා ලැබේ.

"පින්වත්නි, දැඩි රැහැණින් අත් පිටිකරට තබා බැඳ හිස මුඩුකොට ක්‍රෑර ශබ්ද ඇති බෙර හඬින් වීථියෙන් වීථියට සන්ධියෙන් සන්ධියට ගෙන ගොස් දකුණු දොරටුවෙන් නික්මවා නුවරට දකුණු දිශාවෙහි හිස සිඳිනු ලබන මේ පුරුෂයා කුමක් කෙළේදැයි කියන්නාහු නම් පින්වත්නි, මේ පුරුෂතෙම රජුන්ගේ සතුරෙකි. ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ ජීවිතයෙන් තොර කළේය. එහෙයින් ඔහු රජහු අල්වා ගෙන මෙබඳු දඬුවමක් කරවත්යයි කියන්නාහුය.

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? තොප විසින් මෙබන්දක් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වෙයිද?"

- "ස්වාමීනි, අප විසින් දක්නා ලද්දේද වෙයි. අසන ලද්දේද වෙයි. අසනු ලබන්නේද වේයයි" කීය.

**5.** "ගාමණිය, යම් කිසිවෙක් ප්‍රාණඝාත කරයිද, ඒ හැමදෙන මෙලොවම දුකක් දොම්නසක් විඳිත්යයි මෙසේ කියන්නාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද, ඔව්හු සත්‍යයක් හෝ බොරුවක් හෝ කීවාහුද?" - "ස්වාමීනි. බොරුවකි."

"යම්බඳු ඔව්හු හිස්වූවක් මුසාවක් කියත් නම් ඔව්හු සීලවන්තයෝද, දුශ්ශීලයෝද?" - "ස්වාමීනි, දුශ්ශීලයෝය."

"දුශ්ශීල ලාමක ස්වභාව ඇති ඔව්හු වරදවා පිළිපන්නාහුද, යහපත්ව පිළිපන්නාහුද?" - "ස්වාමීනි, වරදවා පිළිපන්නාහුය."

"වරදවා පිළිපන් ඔව්හු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුද සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුද?" - "ස්වාමීනි, මිථ්‍යා දෘෂ්ටි ඇත්තාහු."

"යම් කෙනෙක් මිථ්‍යාදෘෂ්ටික නම් ඔවුන් කෙරෙහි පහදින්නට සුදුසුද?" - "ස්වාමීනි, නුසුදුසුය."

"ගාමණිය, මේ ලෝකයෙහි මාලා පැළඳ කුණ්ඩලාභරණ පැළඳ, මනාකොට ස්නානය කළ, සුවඳවලින් ගැල්වූ, කපන ලද හිස කෙස් දැලි රැවුල් ඇති රජකු මෙන් ස්ත්‍රීන් හා පස්කම් සැප විඳින ඇතැම් පුද්ගලයෙක් දක්නා ලැබේ.

'පින්වත, මාලා පැළඳ, කුණ්ඩලාභරණ පැළඳ, මනා කොට සුවඳවලින් ගැල්වූ, කපන ලද හිසකෙස් දැලිරැවුල් ඇති රජකුමෙන් ස්ත්‍රීන් හා කම්සැප විඳින ඒ පුරුෂතෙමේ කුමක් කෙළේදැයි අසන්නාහු නම්, පින්වත්නි, මේ පුරුෂතෙම රජුගේ සතුරකු යටපත්කර ධනය ගත්තේය.

'රජතෙම ඔහුට සතුටුව වස්තුව දුන්නේය. එහෙයින් මේ පුරුෂතෙම මාලා පැළඳ, කුණ්ඩලාභරණ පැළඳ, මනාකොට සුවඳවලින් ගැල්වූ, කපන ලද හිස කෙස් දැලිරැවුල් ඇති රජකු මෙන් ස්ත්‍රීන් සමග කම්සැප විඳින්නේ යයි' කියන්නාහුය.

"ගාමණිය, මේ ලෝකයෙහි ඇතැමෙක් දැඩි රැහැණින් දෙඅත් පිටිකරට දැඩිකොට බැඳ, හිස් මුඩුකොට, රළු ශබ්දය ඇති බෙරහඬින්, වීථියෙන් වීථියට, සන්ධියෙන් සන්ධියට, ගෙන ගොස් දකුණු දොරටුවෙන් නික්මවා නුවරට දකුණු දිශාවෙහි හිස සිඳිනු ලබන්නෙක් දක්නා ලැබේ.

'පින්වත්නි, දැඩි රැහැණින් අත් පිටිකරට තබා බැඳ, හිස මුඩුකොට, කෘූර ශබ්ද ඇති බෙර හඬින්, වීථියෙන් වීථියට, සන්ධියෙන් සන්ධියට ගෙන ගොස් දකුණු දොරටුවෙන් නික්මවා නුවරට දකුණු දිශාවෙහි හිස සිඳිනු ලබන මේ පුරුෂයා කුමක් කෙළේදැයි' කියන්නාහු නම් 'පින්වත්නි මේ පුරුෂතෙම ගමින් හෝ වනයෙන් හෝ නුදුන් දෙය හොරෙන් ගත්තේය. එහෙයින් ඔහු රජහු අල්වා ගෙන මෙබඳු දඬුවමක් කරවත්යයි' කියන්නාහුය.

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? තොප විසින් මෙබන්දක් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වෙයිද?" - " ස්වාමීනි, අප විසින් දක්නා ලද්දේද වෙයි අප අසන ලද්දේද, වෙයි. අසනු ලබන්නේද වේයයි" කීය.

**6.** "ගාමණිය, එහි යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් යම් කිසිවෙක් සොරකම් කරයිද ඒ හැමදෙන මෙලොවටම දුකක් දොම්නසක් විඳිත්යයි මෙසේ කියන්නාහුද මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද ඔව්හු සත්‍යයක් හෝ බොරුවක් හෝ කීවාහුද?" - "ස්වාමීනි බොරුවකි."

"යම්බඳු ඔව්හු හිස්වූවක් මුසාවක් කියත් නම් ඔව්හු ශීලවන්තයෝද, දුශ්ශීලයෝද?" - "ස්වාමීනි දුශ්ශීලයෝය."

"දුශ්ශීල ලාමක ස්වභාව ඇති ඔව්හු වරදවා පිළිපන්නාහුද යහපත්ව පිළිපන්නාහුද?" - "ස්වාමීනි, වරදවා පිළිපන්නාහුය."

"වරදවා පිළිපන් ඔව්හු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුද, සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුද?" - "ස්වාමීනි, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුය."

"යම් කෙනෙක් මිථ්‍යාදෘෂ්ටික නම් ඔවුන් කෙරෙහි පහදින්නට සුදුසුද?" - "ස්වාමීනි නුසුදුසුය."

"ගාමණිය, මේ ලෝකයෙහි මාලා පැළඳ කුණ්ඩලාභරණ පැළඳ, මනාකොට ස්නානය කළ, සුවඳවලින් ගැල්වූ කපන ලද හිස කෙස් දැලිරැවුල් ඇති රජකු මෙන් ස්ත්‍රීන් හා කම්සැප විඳින ඇතැම් පුරුෂයෙක් දක්නා ලැබේ.

"පින්වත්නි, මාලා පැළඳ කුණ්ඩලාභරණ පැළඳ, මනා කොට ස්නානය කළ, සුවඳවලින් ගැල්වූ, කපන ලද හිසකෙස් දැලි රැවුල් ඇති රජකු මෙන් ස්ත්‍රීන් හා කම්සැප විඳින මේ පුරුෂයා කුමක් කෙළේදැයි' අසන්නාහු නම්, පින්වත්නි, මේ පුරුෂතෙම රජුගේ පසමිතුරන්ගේ භාර්යාවන් දූෂ්‍ය කෙළේය. රජු ඔහුට සතුටුව වස්තුව දුන්නේයයි" කියන්නාහුය.

"එහෙයින් මේ පුරුෂතෙම මාලා පැළඳ කුණ්ඩලාභරණ පැළඳ, මනාකොට ස්නානය කළ, සුවඳවලින් ගැල්වූ, කපන ලද හිසකෙස් දැලිරැවුල් ඇති රජකු මෙන් ස්ත්‍රීන් සමග කම්සැප විඳින්නේයයි' කියන්නාහුය.

"ගාමණිය මේ ලෝකයෙහි දැඩි රැහැණින් දෙඅත් පිටිකරට දැඩිකොට බැඳ, හිස මුඩුකොට, රළුශබ්දය ඇති බෙර හඬින් වීථියෙන් වීථියට, සන්ධියෙන් සන්ධියට ගෙන ගොස් දකුණු දොරටුවෙන් නික්මවා නුවරට දකුණු දෙස හිස සිඳිනු ලබන ඇතැම් පුරුෂයෙක් දක්නා ලැබේ.

"පින්වත්නි, දැඩි රැහැණින් අත් පිටිකරට තබා බැඳ, හිස මුඩුකොට, කෲර ශබ්ද ඇති, වීථියෙන් වීථියට, සන්ධියෙන් සන්ධියට ගෙන ගොස් දකුණු දොරටුවෙන් නික්මවා නුවරට දකුණු දෙස හිස සිඳිනු ලබන මේ පුරුෂයා කුමක් කෙළේදැයි අසන්නාහු නම් 'මේ පුරුෂතෙම කුල ස්ත්‍රීන්, කුල කුමාරිකාවන් දූෂ්‍ය කෙළේය. එහෙයින් රජහු ඔහු අල්වාගෙන මෙබඳු දඬුවම් කරවත්යයි" කියන්නාහුය.

"ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? තොප විසින් මෙබන්දක් දක්නා ලද්දේද? අසන ලද්දේද?" - "ස්වාමීනි, අප විසින් දක්නා ලද්දේද වෙයි. අසන ලද්දේද වෙයි. අසනු ලබන්නේද වෙයි."

7. "ගාමණිය, එහි යම් කිසිවෙක් කාමයන්හි වරදවා හැසිරෙයිද? ඒ හැමදෙන මෙලොව දුකක් දොම්නසක් විඳිත් යයි මෙසේ කියන්නාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද? ඔව්හු සත්‍යයක් කීවාහුද, බොරුවක් කීවාහුද?" - "ස්වාමීනි, බොරුවකි."

"යම් බඳු ඔව්හු හිස්වූවක් මුසාවක් කියත් නම් ඔව්හු ශීලවන්තයෝද, දුශ්ශීලයෝද?" - "ස්වාමීනි, දුශ්ශීලයෝය."

"දුශ්ශීල ලාමක ස්වභාව ඇති ඔව්හු වරදවා පිළිපන්නාහුද, යහපත්ව පිළිපන්නාහුද?" - "ස්වාමීනි, වරදවා පිළිපන්නාහුය."

"වරදවා පිළිපන් ඔව්හු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුද, සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුද?" - "ස්වාමීනි, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුය."

"යම් කෙනෙක් මිථ්‍යාදෘෂ්ටික නම් ඔවුන් කෙරෙහි පහදින්නට සුදුසුද?" - "ස්වාමීනි, සුදුසු නැත."

"ගාමණිය, මේ ලොකයෙහි මාලා දරන්නාවූ කොඬොල් පළඳින්නාවූ මනාකොට ස්නානය කළාවූ මනාකොට සුවඳ විලවුන් ගැලවූ කපනලද කෙස් හා රැවුල් ඇත්තාවූ රජෙකු මෙන් ස්ත්‍රීන් හා කම් සැප විඳින්නාවූ ඇතැම් පුරුෂයෙක් දක්නාලැබේ.

"පින්වත, මේ මාලාදරන්නාවූ කුණ්ඩලාභරණ දරන්නාවූ මනාකොට ස්නානය කළාවූ, මනාකොට සුවඳ විලවුන් ගැල්වූ කපනලද කෙස් හා රැවුල් ඇත්තාවූ රජකුමෙන් ස්ත්‍රීන් හා කම් සැප විඳින්නාවූ මේ පුරුෂතෙමේ කුමක් කෙළේදැයි' අසන්නාහු නම්, 'පින්වත්නි, මේ පුරුෂතෙම බොරු කීමෙන් රජුන් සතුටුකළේය. රජු ඔහුට සතුටුව වස්තුව දුන්නේය. එහෙයින් මේ පුරුෂතෙම මාලා පැළඳගෙන, කුණ්ඩලාභරණ පැළඳගෙන, මනාකොට ස්නානයකොට, මනාකොට සුවඳ විලවුන් ගල්වා, කපනලද කෙස් හා රැවුල් ඇතිව රජෙකු මෙන් ස්ත්‍රීන් හා කම් සැප විඳින්නේයයි' කියන්නාහුය.

"ගාමණිය, මේ ලොකයෙහි දැඩි රැහැණින් අත් පිටිකරට දැඩි බැම්මෙන් බැඳ මුඩු කර රළු ශබ්ද ඇති බෙර හඬින්

වීථියෙන් වීථිය සන්ධියෙන් සන්ධියට ගෙන ගොස් දකුණු දොරින් නික්මවා නුවරට දකුණුදෙස හිස සිඳිනු ලබන ඇතැමෙක් දක්නට ලැබේ. පින්වත්නි, දළ රැහැණින් දෙඅත් පිටිකරට දැඩි බැම්මෙන් බැඳ හිස මුඩුකර රළු ශබ්ද ඇති බෙර හඬින් වීථියෙන් වීථියට සන්ධියෙන් සන්ධියට ගෙන ගොස් දකුණු දොරින් නික්මවා නුවරට දකුණුදෙස හිස සිඳිනු ලබන මේ පුරුෂයා කුමක් කෙළේදැයි අසන්නාහුය. 'පින්වත්නි, මේ පුරුෂතෙමේ බොරු කීමෙන් ගෘහපතියෙකු හෝ ගෘහපති පුත්‍රයෙකු හෝ අර්ථය විනාශ කළේය. එහෙයින් රජහු ඔහු අල්වාගෙන මෙබඳු දඬුවම් කරවත්යයි' කියන්නාහුය. ගාමණිය, ඒ කුමකැයි හඟින්නේද? තොප විසින් මෙබන්දක් දක්නා ලද්දේ. අසන ලද්දේද?" - "ස්වාමීනි, අප විසින් දක්නා ලද්දේද වෙයි. අසන ලද්දේද වෙයි. අසනු ලබන්නේද වෙයි."

8. "ගාමණිය, එහි තොප විසින් ඒ යම් කිසිවෙක් බොරු කියයිද ඒ හැමදෙන මෙලොවම දුකක් දොම්නසක් විඳිත්යයි මෙසේ කියන්නාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද, ඔව්හු ඇත්තක් කීවාහුද, බොරුවක් කීවාහුද?" - "ස්වාමීනි බොරුවකි."

"යම් කෙනෙක් හිස්වූ බොරු කීවාහුද? ඔව්හු සීලවන්තයෝද, දුශ්ශීලයෝද?" - "ස්වාමීනි, දුශ්ශීලයෝය."

"දුශ්ශීලවූ ලාමක ධර්ම ඇති යම්බඳු ඔව්හු වරදවා පිළිපන්නාහුද, මනාව පිළිපන්නාහුද?" - "ස්වාමීනි, වරදවා පිළිපන්නාහුය."

"යම් කෙනෙක් වනාහි වරදවා පිළිපන්නාහුද, ඔව්හු මිථ්‍යා දෘෂ්ටිකයෝද? සම්‍යක් දෘෂ්ටිකයෝද?" - "ස්වාමීනි, මිථ්‍යා දෘෂ්ටිකයෝය.

"යම් ඒ කෙනෙක් මිථ්‍යාදෘෂ්ටිකද, ඔවුන් කෙරෙහි පැහැදීමට සුදුසුද?" - "ස්වාමීනි නැත."

"ස්වාමීනි. ආශ්චර්යය ස්වාමීනි, පුදුමයි. ස්වාමීනි. මගේ විවේක ගෘහයක් ඇත්තේය. එහි ඇඳන් තිබේ. ආසන තිබේ.

පැන් සැළි ඇත්තේය තෙල් පහන් ඇත්තේය. එහි යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වාසයට පැමිණේද? මම එයින් ශක්තිය ඇති පමණින් පුළුවන් පමණින් සංග්‍රහ කරමි.

**9.** "ස්වාමීනි, පෙර සිදුවූවක් කියමි. නොයෙක් දෘෂ්ටිගත්, නොයෙක් මත ඇති, නොයෙක් අදහස් ඇති, ශාස්තෘවරයෝ සතර දෙනෙක් ඒ විවේකාගාරයෙහි වාසයට පැමිණියාහුය. එක් ශාස්තෘවරයෙක් මෙවැනි වාද මෙවැනි දෘෂ්ටි ඇත්තේය. දීමෙහි විපාක නැත. පිදීමෙහි විපාක නැත. මහා දානයෙහි විපාක නැත. යහපත්කොට කරනලද, අයහපත්කොට කරනලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. මෙලොව නැත. පරලොව නැත. මවු නැත පියා නැත. ඕපපාතික සත්වයෝ නැත. යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙත්ද, එවැනි මනාව පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ලොකයෙහි නැත්තේයයි මෙසේ කියන්නේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි.

"එක ශාස්තෘවරයෙක් දීමෙහි විපාක ඇත. පිදීමෙහි විපාක ඇත. මහා දානයෙහි විපාක ඇත මනාකොට කරන ලද නපුරුකොට කරන ලද කර්මයන්ගේ ඵලවිපාක ඇත මෙලොව ඇත. පරලොව ඇත. මවු ඇත. පියා ඇත ඕපපාතික සත්වයෝ ඇත. යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙත්ද මනාව පිළිපන් එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහයි' මෙබඳු වාද මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි.

"එක් ශාස්තෘවරයෙක් 'කරන්නාහට කරවන්නාහට සිඳින්නාහට, සින්දවන්නාහට, පිසන්නාට, පිසවන්නාට, ශොක කරන්නාහට, ක්ලාන්ත කරන්නාහට, කම්පා කරන්නාහට, කම්පා කරවන්නාහට, සතුන් මරන්නාට සොරකම් කරන්නාහට, ගෙවල් බිඳින්නාහට, මං පහරන්නාහට, එක් ගෙයක්වටකර බඩු පැහැරගන්නාහට, මාර්ගයෙහි රැකසිට පැහැරගන්නාහට, පරදාරාවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, කරවන්නාහට, පාපයක් නොවේ. ආයුධ සහිත චක්‍රයකින් යමෙක්

මේ පෘථිවියෙහි ප්‍රාණීන් එක් මස් ගොඩක් එක් මස් රැසක් කරන්නේ නම් ඒ හේතුවෙන් පාපයක් නැත. පව් රැස්වීමක් නැත. හිංසා කරමින්, මරමින් සිඳිමින් සින්දවමින් පිසිමින්, පිසවමින්, ගංගා නදියෙහි දකුණු තීරයට ගියත් ඒ හෙතුවෙන් පව් නැත. පාපයන්ගේ පැමිණීමක් නැත. දෙමින් දෙවමින් පුදමින් පුදවමින් ගංගා නදියෙහි උතුරු තීරයට ගියත් ඒ හේතුවෙන් පිනක් නැත. පින් රැස්වීමක් නැත. දීමෙන් දමනයෙන්, සංයමයෙන්, සත්‍ය වචනයෙන් පිනක් නැත. පින් රැස්වීමක් නැතැයි' වාද ඇත්තේ දෘෂ්ටි ඇත්තේ වෙයි.

"එක් ශාස්තෘවරයෙක් 'කරන්නාට, කරවන්නාට, සිඳින්නාට, සින්දවන්නාට, පිසන්නාට, පිසවන්නාට, ශොක කරවන්නාට, ක්ලාන්ත කරවන්නාට, කම්පා කරන්නාට, කම්පාකරවන්නාට ප්‍රාණඝාත කරන්නාට. නුදුන්දේ ගන්නාහට, ගෙවල් බිඳින්නාට, මං පහරන්නාහට, එක් ගෙයක් වටකර බඩු පැහැර ගන්නාහට, මග රැක සිට බඩු පැහැර ගන්නාහට අන් අඹුවන්කරා යන්නාහට, බොරු කියන්නා හට, කරන්නා හට පාපය වෙයි. ආයුධ සහිත චක්‍රයකින් යමෙක් මේ පෘථිවියෙහි ප්‍රාණීන් එක් මස් ගොඩක්, එක් මස් පිඩක් කරන්නේය. ඒ හේතුවෙන් පාපයක් ඇත හිංසා කරමින් මරමින්, සිඳිමින්, සින්දවමින්, පිසමින්, පිසවමින්, ගංගා නදියෙහි දකුණු තෙරටද යන්නේය. ඒ හේතුවෙන් පාපයක් ඇත. පාපයාගේ පැමිණීමක් ඇත. දෙමින්, දෙවමින්, පුදමින්, පුදවමින්, ගංගා නදියෙහි උතුරු තෙරටද යන්නේය. ඒ හේතුවෙන් පිනක් ඇත්තේය පින් පැමිණීමක් ඇත්තේය. දීමෙන් දමනයෙන් සංයමයෙන් සත්‍ය වචනයෙන් පිනක් ඇත පින පැමිණීමක් ඇත්තේයයි මෙබඳු වාද, මෙබඳු දෘෂ්ටි ඇත්තේය."

"ස්වාමීනි, ඒ මට මේ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතුරින් කවරෙක් සත්‍යයක් කීයේද? කවරෙක් මුසා කීයේදැයි විමතියක් විය. විචිකිච්ඡාවක් පහළ වූයේමය."

"ගාමණිය, තොප විසින් විමති ඉපදවීමට, සැක කිරීමට සුදුසුය. සැක කළ යුතු තැන තොපට සැක පහළවිය."

"ස්වාමීනි, යම් සේ මම මේ සැකය දුරුකරන්නෙම්ද, මට භාග්‍යවතුන් වහන්සේ එසේ ධර්ම දෙශනා කිරීමට සමර්ථ වේ නම් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මම එසේ පැහැදුනේ වෙමි."

10. "ගාමණිය, දශ කුශල ධර්ම සමාධිය ඇත්තේය. ධර්ම සමාධියෙහි සිටි ඔබ චිත්තසමාධිය ලබන්නෙහිය. මෙසේ ඔබ මේ සැකකරන ස්වභාවය දුරුකරන්නෙහිය. ගාමණිය, ධර්ම සමාධිය නම් කවරේද? ගාමණිය, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකතෙම සතුන් මැරීම අත්හැර, සතුන් මැරීමෙන් වෙන්වූයේ වේද, බහා තබනලද දඬු ඇත්තේ තබනලද ආයුධ ඇත්තේ, පාපයෙහි ලජ්ජා ඇත්තේ, දයාවට පැමිණියේ සියලු ප්‍රාණීන් කෙරෙහි හිතවත් අනුකම්පාවෙන් වාසය කරයිද, නුදුන් දෙය ගැනීමෙන් වෙන්ව, නුදුන් දෙය ගැනීමෙන් වෙන්වූයේවේද, කාමයන්හි වරදවා හැසිරීම අත්හැර කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූයේවේද? මුසාවාදය අත්හැර මුසාවාදයෙන් වෙන්වූයේවේද, කේලාම් කීම අත්හැර කේලාම් කීමෙන් වෙන්වූයේවේද? ඵරුෂවචනය අත්හැර ඵරුෂ වචනයෙන් වෙන්වූයේවේද ප්‍රලාප කීම අත්හැර ප්‍රලාප කීමෙන් වෙන්වූයේවේද, දැඩි ලොභය අත්හැර දැඩි ලොභය නැත්තේවේද, ව්‍යාපාද සංඛ්‍යාත ද්වේෂය හැර අව්‍යාපාද සිත් ඇත්තේවේද, මිථ්‍යාදෘෂ්ටිය අත්හැර සම්‍යක් දෘෂ්ටිය ඇත්තේවේද,

11. "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහකළ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක් මෙසේ උඩ යට සරහ හැමතැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත ලොකය මහත්වූ මහද්භාවයට ගියාවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයිද, හෙතෙමේ යම් මේ ශාස්තෘවරයෙක් දීමෙහි විපාක නැත. පිදීමෙහි විපාක නැත. මහා දානයෙහි විපාක නැත. මනාකොට කරනලද, නපුරු කොට කරනලද කර්මයන්ගේ ඵල විපාක නැත. මෙලොව නැත.

පරලොව නැත. මවක් නැත. පියෙක් නැත ඕපපාතික සත්වයෝ නැත. යමෙක් මෙලොවද, පරලොවද, තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරත්ද, එබඳු මනාව පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ලොකයෙහි නැතැයි කියන්නේද මෙබඳු දෘෂ්ටි ඇත්තේද, ඉදින් ඒ භවත් ශාස්තෘවරයාගේ වචනය සත්‍ය නම් ඒ මම භය සහිතවූ හෝ භය නැත්තාවූ හෝ කිසිවෙකුට පීඩා නොකෙළෙම් නම් එය මට අපරාධයක් නොවීම පිණිස වෙයි. යම් හෙයකින් මම කයින් සංවරවූයෙමි. වචනයෙන් සංවර වූයෙමි. සිතින් සංවර වූයෙමි. කියාද කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින්නෙම්ද මේ දෙකට බැසගත්තේ වෙමියි ඔහුට ප්‍රමොදය (තරුණ ප්‍රීතිය) උපදී. ප්‍රමුදිතවූවහුට ප්‍රීතිය (බලවත් සතුට) පහළවේ. ප්‍රීති සිත ඇත්තාගේ නාම කය සංසිඳුනේවේ. නාමකය සංසිඳුනේ සැප විඳී. සැප ඇත්තාගේ සිත සමාධියට පැමිණෙයි.

"ගාමණිය, ඒ මේ වනාහි ධර්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ ඒ සැක කරන ස්වභාවය දුරුකරන්නෙහිය.

**12.** "ගාමණිය, ඒ මේ ආර්යශ්‍රාවක තෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේ තුන් දිසාවක් එසේ සතර දිසාවක් මෙසේ උඩයට සරස හැමතැන සර්වප්‍රකාරයයන් සියල්ල සහිත ලොකය මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ මෛත්‍රිසහගත සිතින් පතුරවා වාසය කරයි. හෙතෙම යම් මේ ශාස්තෘවරයෙක් දුන් දෙයෙහි විපාක ඇත. පුදනලද්දෙහි විපාක ඇත, මහාදානයෙහි විපාක ඇත. යහපත්කොට කරනලද නපුරු කොට කරන ලද කර්මයන්ගේ ඵලවිපාක ඇත මෙලොව ඇත, පරලොව ඇත. මවක් ඇත, පියෙක් ඇත, ඕපපාතික සත්වයන් ඇත, යහපත් මාර්ගයෙහි පිළිපන් මෙලොවද පරලොවද තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශකළ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇතැයි

ප්‍රත්‍යක්ෂ කරයිද ඉදින් ඒ පින්වත් ශාස්තෘහුගේ වචනය සත්‍යනම් එය මගේ නිරපරාධය පිණිස පවතියි තැතිගන්නාවූද, නොගන්නාවූද, කිසිවෙකු මම නොපෙළෙමි. යම් හෙයකින් මම කයින් සංවර වූයෙමි වචනයෙන් සංවර වූයෙමි. සිතින් සංවර වූයෙමි. කියාද කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නෙමි කියාද, මේ දෙකින් ඔහුට ප්‍රමොදය පහළවෙයි. ප්‍රමොදවූවහුට ප්‍රීතිය පහළවේ. ප්‍රීතිසිත් ඇත්තාගේ නාමකය සංසිඳුනේ වේ. සංසිඳුනු නාමකය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තාගේ සිත එකඟවේ. ගාමණිය මේ ධර්ම සමාධියයි. ඔබ එහි චිත්තසමාධිය ලබන්නෙහි නම් මෙසේ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නෙහිය.

13. "ගාමණිය, ඒ මේ ආර්යශ්‍රාවක තෙමේ මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක් එසේ තුන්දිසාවක් එසේ සතරදිසාවක් මෙසේ උඩයට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි. හෙතෙම මෙසේ සිතයි. යම් මේ ශාස්තෘ කෙනෙක් කරන්නාට කරවන්නාට සිඳින්නාට සින්දවන්නාට පිසන්නාට පිසවන්නාට ශොකකරන්නාට ක්ලාන්ත කරවන්නාට කම්පා කරන්නාට කම්පාකරවන්නාට සතුන් මරන්නාහට නුදුන්දේ ගන්නාහට ගෙවල් බිඳින්නාහට මංපහරන්නාහට එක්ගෙයක් වටකර බඩුපැහැර ගන්නාට මග රැක සිට බඩු පැහැරගන්නාහට අන් අඹුවන් කරායන්නාට බොරු කියන්නාට කරන්නාට පාපයක් නැත. යමෙක් ආයුධ චක්‍රයකින් මේ පෘථුවියෙහි ප්‍රාණීන් එක්මස් ගොඩක් එක්මස් රැසක් කරන්නේද, ඒ හේතුවෙන් පාපයක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. නසමින් මරමින් සිඳිමින් සින්දවමින් පිසමින් පිසවමින් ගංගා නදියෙහි දකුණු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පාපයක් නැත්තේය. පාපයාගේ පැමිණීමක් නැත්තේය. දෙමින් දෙවමින්

පුදමින් පුදවමින් ගංගානදියෙහි උතුරු තෙරට යන්නේද ඒ හේතුවෙන් පිනක් නැත පින පැමිණීමක් නැත දීමෙන් දමනයෙන් සංයමයෙන් සත්‍ය වචනයෙන් පිනක් නැත පින් රැස්වීමක් නැතැයි මෙසේ කීය. මෙසේ කියන්නේද මෙබඳු දෘෂ්ටි ඇත්තේද ඉදින් ඒ පින්වත් ශාස්තෘවරයාගේ වචනය සත්‍යනම් මට නිරපරාධ පිණිස පවතියි. යම්බඳු මම යම් හෙයකින් කයින් සංවර වූයෙම්ද, වචනයෙන් සංවර වූයෙම්ද, මනසින් සංවරවූයෙමි කියාද, ස්ථාවර කිසිවෙක් තැතිගන්නාවූද, තැති නොගන්නාවූද, කිසිවෙකු නොපෙළම්ද යම්හෙයකින් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදිම් කියාද, මෙහි මේ දෙකට බැසගත්තේ වෙමියි ඕහට ප්‍රමොදය පහළවේ. ප්‍රමොදවූ ඔහුට ප්‍රීතිය පහළවේ. ප්‍රීතිසිත් ඇත්තහුගේ නාමකය සංසිඳුනේවේ. සංසිඳුනු නාමකය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තාහුගේ සිත එකඟවේ. ගාමණිය මේ ධර්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්තසමාධිය ලබන්නෙහිනම් මෙසේ ඔබ මේ පාප කටයුතු ධර්මය දුරුකරන්නෙහිය.

14. "ගාමණිය, ඒ මේ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහිඇත්තේ මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරෙයි. එසේ දෙදිසාවක් එසේ තුන්දිසාවක් එසේ සතර දිසාවක් මෙසේ උඩයට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි. හෙතෙමේ යම් මේ ශාස්තෘතෙම කරන්නාට, කරවන්නාට, සිඳින්නාට, සිඳවන්නාට, පිසන්නාට, පිසවන්නාට, ශොක කරන්නාට, ක්ලාන්ත කරවන්නාට, කම්පාකරන්නාට කම්පාකරවන්නාහට, සතුන් මරන්නාහට, නුදුන් දේ ගන්නාහට, ගෙවල් බිඳින්නාට, මං පහරන්නාට, එක් ගෙයක් වටකර බඩු පැහැර ගන්නාහට, මගරැක සිට බඩු පැහැරගන්නාහට, අන්අඹුවන් කරා යන්නා හට, බොරුකියන්නාට, කරවන්නාහට පාපය සිදුවෙයි. ආයුධ සහිත චක්‍රයෙන් යමෙක් මේ පෘථුවියෙහි සත්වයන් එක් මස් ගොඩක්

එක් මස්පිඩක් කරන්නේද ඒ හේතුවෙන් පාපයක් ඇත පාපයාගේ පැමිණීමක් ඇත. සිඳිමින් සිඳවමින් මරමින් මරවමින් පිසමින් පිසවමින් ගංගා නදියෙහි දකුණු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පාපයක් ඇත. පාපයාගේ පැමිණීමක් ඇත. දෙමින් දෙවමින් පුදමින් පුදවමින් ගංගා නදියෙහි උතුරුතෙරට යන්නේද, ඒ හේතුවෙන් පිනක් ඇත. පින් රැස්වීමක් ඇත. දීමෙන් දමනයෙන් සංයමයෙන් සත්‍ය වචනයෙන් පිනක් ඇත. පින් රැස්වීමක් ඇත මෙසේ කියන්නේද මෙබඳු දෘෂ්ටි ඇත්තේද, ඉදින් ඒ භවත් ශාස්තෘවරයාගේ වචනය සත්‍ය නම් මට නිරපරාධ පිණිස පවතී. තැතිගන්නාවූ හෝ තැති නොගන්නාවූ හෝ කිසිවෙකු මම නොපෙළෙම්ද, යම් හෙයකින් කයින් සංවර වූයෙමි. වචනයෙන් සංවර වූයෙමි. සිතින් සංවර වූයෙමි කියාද යම් හෙයකින් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදින්නෙමි කියාද, මේ දෙකට බැසගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තාහුගේ ශරීරය සංසිඳුනේවේ. සංසිඳුනු ශරීර ඇත්තේ සැපයක් විඳියි. සැප ඇත්තාගේ සිත එකඟවේ. ගාමණිය, මේ ධර්ම සමාධියයි ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ සැක කරන ස්වභාවය දුරු කරන්නෙහිය.

15. "ගාමණිය, ඒ මේ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ, පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ, යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ, සිහිඇත්තේ, කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක් එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක් මෙසේ උඩයට සරස හැමතැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

හෙතෙම මෙසේ සිතයි යම් මේ ශාස්තෘ කෙනෙක් දෙන ලද්දෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. මහා දානයෙහි විපාක නැත. යහපත්කොට කරනලද නපුරුකොට කරන ලද කර්මයන්ගේ ඵල විපාක නැත. මෙලොව නැත. පරලොව නැත.

මවු නැත. පියා නැත. ඕපපාතික සත්වයෝ නැත. යහපත් මාර්ගයෙහි පිළිපන් යමෙක් මෙලොවත් පරලොවත් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කෙරෙත්ද, එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැතැයි මෙබඳු වචන කියන්නේද, මෙබඳු දෘෂ්ටි ඇත්තේද, ඉදින් ඒ පින්වත් ශාස්තෘන්ගේ වචනය සත්‍යනම් මට නිරපරාධ පිණිස පවතී. මම නැති ගන්නාවූද, නැති නොගන්නාවූද, කිසිවෙකු නොපෙළම්. ඒ මම කයින් සංවරවූයෙමි. වචනයෙන් සංවර වූයෙමි. සිතින් සංවරවූයෙමි කියාද, කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නෙමියි කියාද මේ දෙකට බැසගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය උපදී, ප්‍රමොදවූ මට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ නාම කය සංසිඳෙයි. සංසිඳුනු නාමකය ඇත්තේ සැප ඇත්තාගේ සිත සමාධියට පැමිණෙයි. ගාමණිය, මේ ඒ ධර්ම සමාධියයි. ඔබ එහි ඉදින් චිත්ත සමාධිය ලබන්නෙහි නම් ඔබ මෙසේ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නේය.

**16.** "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක් මෙසේ උඩ යට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද රහිත ලොකය කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"හෙතෙම යම් මේ ශාස්තෘවරයෙක් දෙන ලද්දෙහි විපාක ඇත. පුදන ලද්දෙහි විපාක ඇත. මහාදානයෙහි විපාක ඇත. යහපත්කොට කරන ලද නපුරුකොට කරන ලද කර්මයන්ගේ ඵල විපාක ඇත මෙලොව ඇත පරලොව ඇත. මවෙක් ඇත. පියෙක් ඇත. ඔපපාතික සත්වයෝ ඇත. යමෙක් මෙලොවද, පරලොවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙත්ද, යහපත් මාර්ගයෙහි පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ කියන මෙබඳු ලොකයෙහි ඇතැයි මෙසේ

කියන්නේ වේද, මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේද, ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වචනය ඇත්ත නම් මගේ නිරපරාධය පිණිස පවතී. මම තැතිගන්නාවූ හෝ තැති නොගන්නාවූ හෝ කිසිවෙක් නොපෙළමි. යම් ඒ මම කයින් සංවර වූයෙමි. වචනයෙන් සංවර වූයෙමි. සිතින් සංවරවූයෙමි කියාද, කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින්නෙමි කියාද, මෙහි මේ දෙකටම බැසගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය උපදී, ප්‍රමෝදවූවහුට ප්‍රීතිය පහළවෙයි. ප්‍රීතිසිත් ඇත්තාහුගේ නාමකය සංසිඳෙයි. සංසිඳුණු නාම කය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. ගාමණිය, මේ ධර්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නේය.

17. "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ අභිධ්‍යා ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙදිසාවක්, එසේ තුන් දිසාවක් එසේ සතර දිසාවක් මෙසේ උඩ යට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත ලොකය මහත්වූ මහත් ගතවූ අප්‍රමාණවූ අවෛරවූ අව්‍යාපාදවූ ලොකය කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"හෙතෙම යම් මේ ශාස්තෘවරයෙක් කරන්නාට, කරවන්නාට, සිඳින්නාට, සින්දවන්නාට, පිසින්නාට, පිසවන්නාට, ශොක කරන්නාට, ක්ලාන්ත කරවන්නාට, කම්පාකරන්නාට, කම්පා කරවන්නාහට, සතුන් මරන්නාට, නුදුන් දේ ගන්නාහට ගෙවල් බිඳින්නාට, මං පහරන්නාට, එක්ගෙයක් වටකර බඩු පැහැරගන්නාට, මග රැක සිට බඩු පැහැර ගන්නාට, අන් අඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, කරන්නාහට පාපයක් නැත. ආයුධ සහිත චක්‍රයකින් යමෙක් මේ පෘථුවියෙහි ප්‍රාණීන් එක් මස් ගොඩක් එක් මස් පිඩක් කරන්නාහට ඒ හේතුවෙන් පාපයක් නැත පාපයාගේ පැමිණීමක් නැත හිංසා කරමින්, මරවමින්, සිඳිමින්, සින්දවමින්, පිසමින්, පිසවමින්,

ගංගානදියෙහි දකුණු තෙරට යන්නේද ඒ හේතුවෙන් පාපයක් නැත. පාපයාගේ රැස්වීමක් නැත. දෙමින්, දෙවමින්. පුදමින් පුදවමින් ගංගානදියෙහි උතුරු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පිනක් නැත. පින් රැස්වීමක් නැත. දීමෙන්, දමනයෙන්, සංයමයෙන් සත්‍ය වචනයෙන් පිනක් නැත. පින් රැස්වීමක්නැත. ඉදින් ඒ පින්වත් ශාස්තෲහුගේ වචනය සත්‍යනම් මට නිපරාධය පිණිස පවතී. මම නැති ගන්නාවූ හෝ නොගන්නාවූ හෝ කිසිවෙක් නොපෙළම්ද, ඒ මම කයින් සංවරවූයෙමි වචනයෙන් සංවරවූයෙමි. සිතින් සංවරවූයෙමි කියාද, ඒ මම යම්හෙයකින් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නෙමි කියාද, දෙපක්ෂයටම බැස ගත්තෙමි. ඒ මට ප්‍රමොදය උපදී. ප්‍රමුදිත ඔහුට ප්‍රීතිය පහළ වෙත්. ප්‍රීති සිත් ඇත්තහුගේ නාම කය සංසිඳුනේ වේ. සංසිඳුණු නාම කය ඇත්තේ සැපක් විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණේ. ගාමණිය, මේ ධර්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ මේ සැක ස්වභාවය දුරු කරන්නෙහිය.

18. "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක්, මෙසේ උඩ යට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද රහිත ලොකය කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"හෙතෙමේ යම් මේ ශාස්තෲතෙම කරන්නාට, කරවන්නාට, සිඳින්නාට, සින්දවන්නාට, පිසන්නාට, පිසවන්නාට, ශොක කරන්නාට, ක්ලාන්ත කරවන්නාට, කම්පා කරන්නාට, කම්පා නොකරන්නාහට, සතුන් මරන්නාහට, නුදුන් දේ ගන්නාහට, ගෙවල් බිඳින්නාහට, මං පහරන්නාට, එක් ගෙයක් වටකර බඩු පැහැරගන්නාහට, මගරැක සිට බඩු පැහැර ගන්නාට අන් අඹුවන්

කරා යන්නාහට, බොරු කියන්නාට, කරන්නාහට, පාපය සිදු වෙයි. ආයුධ සහිත චක්‍රයෙන් යමෙක් මේ පෘථුවියෙහි සත්වයන් එක් මස් ගොඩක් එක් මස් පිඩක් කරන්නේද, ඒ හේතුවෙන් පාපයක් ඇත පාපයාගේ පැමිණීමක් ඇත. සිඳිමින්, සිඳවමින්, මරමින්, මරවමින් පිසමින් පිසවමින් ගංගානදියෙහි දකුණු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පාපයක් ඇත. පාපයාගේ පැමිණීමක් ඇත. දෙමින්, දෙවමින් පුදමින් පුදවමින් ගංගානදියෙහි උතුරු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පිනක් ඇත. පින් රැස්වීමක් ඇත. දීමෙන්, දමනයෙන්, සංයමයෙන්, සත්‍ය වචනයෙන් පිනක් ඇත. පින් රැස්වීමක් ඇත. මෙසේ කියන්නේද, මෙබඳු දෘෂ්ටි ඇත්තේද? ඉදින් ඒ භවත් ශාස්තෘවරයාගේ වචනය සත්‍ය නම් මට නිරපරාධ පිණිස පවතී, තැතිගන්නාවූ හෝ තැති නොගන්නාවූ හෝ කිසිවෙකු මම නොපෙළම්ද, යම් හෙයකින් කයින් සංවරවූයෙමි. වචනයෙන් සංවරවූයෙමි. සිතින් සංවරවූයෙමි කියාද, යම් හෙයකින් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නෙම් කියාද, මේ දෙකට බැස ගත්තේ වෙයි. ඒ මට ප්‍රමොදය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ ශරීරය සංසිඳුනේවේ. සංසිඳුණු ශරීරය ඇත්තේ සැපක් විඳියි. සැප ඇත්තාගේ සිත එකඟවේ. ගාමණිය, මේ ධර්ම සමාධියයි. ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ සැක කරන ස්වභාවය දුරු කරන්නෙහිය.

**19.** "ගාමණිය, ඒ මේ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ, පහවූ ව්‍යාපාද ඇත්තේ, නොමුළාවූයේ, යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ, සිහි ඇත්තේ. මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක් මෙසේ උඩ යට සරස හැමතැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"හෙතෙම මෙසේ සිතයි. යම් මේ ශාස්තෘකෙනෙක් දෙන ලද්දෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත. මහා දානයෙහි

විපාක නැත. යහපත්කොට කරනලද නපුරුකොට කරනලද කර්මයන්ගේ ඵල විපාක නැත මෙලොව නැත. පරලොව නැත. මවු නැත. පියා නැත. ඕපපාතික සත්වයෝ නැත. යහපත් මාර්ගයෙහි පිළිපන් යමෙක් මෙලොවත් පරලොවත් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කෙරෙත්ද? එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැතැයි මෙබඳු වචන කියන්නේද, මෙබඳු දෘෂ්ටි ඇත්තේද ඉදින් ඒ පින්වත් ශාස්තෲන්ගේ වචනය සත්‍යනම් මට නිරපරාධ පිණිස පවතී. මම තැති ගන්නාවූද, තැති නොගන්නාවූද, කිසිවෙකු නොපෙලමි. ඒ මම කයින් සංවරවූයෙමි. වචනයෙන් සංවර වූයෙමි. සිතින් සංවර වූයෙමි කියාද කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින්නෙමියි කියාද, මේ දෙකට බැසගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය උපදී, ප්‍රමෝදවූ මට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තාගේ නාම කය සංසිඳෙයි. සංසිඳුනු නාම කය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තාගේ සිත සමාධියට පැමිණෙයි. ගාමණිය, මේ ඒ ධර්ම සමාධියයි. ඔබ එහි ඉදින් චිත්ත සමාධිය ලබන්නෙහි නම් ඔබ මෙසේ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නේය.

**20.** "ගාමණිය, ඒ ආර්ය ශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක්, මෙසේ උඩ යට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද රහිත ලොකය මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"හෙතෙම යම් මේ ශාස්තෲවරයෙක් දෙන ලද්දෙහි විපාක ඇත. පුදන ලද්දෙහි විපාක ඇත. මහාදානයෙහි විපාක ඇත. යහපත්කොට කරනලද, නපුරුකොට කරනලද කර්මයන්ගේ ඵලවිපාක ඇත. මෙලොව ඇත. පරලොව ඇත. මවු ඇත. පියා ඇත. ඕපපාතික සත්වයෝ ඇත. යමෙක් මෙලොවද, පරලොවද, තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ

කෙරෙත්ද යහපත් මාර්ගයෙහි පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ කියන මෙබඳු ලොකයෙහි ඇතැයි මෙසේ කියන්නේවේද මෙබඳු දෘෂ්ටි ඇත්තේවේද, ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වචනය ඇත්තනම් මගේ නිරපරාධය පිණිස පවතී. මම තැති ගන්නාවූ හෝ තැති නොගන්නාවූ හෝ කිසිවෙක් නොපෙළමි. යම් ඒ මම කයින් සංවර වූයෙමි. වචනයෙන් සංවරවූයෙමි. සිතින් සංවරවූයෙමි. කියාද, කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නෙමියි කියාද, මෙහි මේ දෙකටම බැසගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය උපදී. ප්‍රමොද වූවහුට ප්‍රීතිය පහළවෙයි. ප්‍රීතිසිත් ඇත්තාහුගේ නාමකය සංසිඳෙයි. සංසිඳුන නාම කය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. ගාමණිය මේ ධර්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහිනම් මෙසේ ඔබ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නේය.

21. "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ අභිධ්‍යා ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙදිසාවක්, එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක් මෙසේ උඩයට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත ලොකය මහත්වූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

හෙතෙම යම් මේ ශාස්තෘවරයෙක් කරන්නාට, කරවන්නාට, සිඳින්නාට, සිඳවන්නාට, පිසින්නාට, පිසවන්නාට, ශොක කරන්නාට, ක්ලාන්ත කරවන්නාට, කම්පා කරන්නාට, කම්පා කරවන්නාට, සතුන් මරන්නාට. නුදුන්දේ ගන්නාහට, ගෙවල් බිඳින්නාට, මංපහරන්නාට, එක් ගෙයක් වටකර බඩු පැහැරගන්නාට, මගරැක සිට පැහැර ගන්නාට, අන් අඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, කරන්නාහට පාපයක් නැත. ආයුධ සහිත චක්‍රයකින් යමෙක් මේ පෘථිවියෙහි ප්‍රාණීන් එක් මස් ගොඩක් එක් මස් පිඩක් කරන්නාහට ඒ හේතුවෙන්

පාපයක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. හිංසා කරමින් මරවමින්, සිඳිමින්, සින්දවමින්, පිසමින්, පියවමින්, ගංගානදියෙහි දකුණු දෙසට යන්නේද, ඒ හේතුවෙන් පාපයක් නැත. පාපයාගේ රැස්වීමක් නැත. දෙමින්, දෙවමින්, පුදමින් පුදවමින් ගංගානදියෙහි උතුරු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පිනක් නැත. පින් රැස්වීමක් නැත දීමෙන්, දමනයෙන් සංයමයෙන් සත්‍යවචනයෙන් පිනක් නැත. පින් රැස්වීමක් නැත. ඉදින් ඒ පින්වත් ශාස්තෘහුගේ වචනය සත්‍යනම් මට නිරපරාධය පිණිස පවතී. මම තැති ගන්නාවූ හෝ නොගන්නාවූ හෝ කිසිවෙක් නොපෙළෙම්ද, ඒ මම කයින් සංවරවූයෙමි. වචනයෙන් සංවරවූයෙමි. සිතින් සංවර වූයෙමි කියාද, ඒ මම යම්හෙයකින් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නෙමි කියාද දෙපක්ෂයටම බැස ගත්තෙමි. ඒ මට ප්‍රමොදය උපදී. ප්‍රමුදිතවූ ඔහුට ප්‍රීතිය පහළ වෙත්. ප්‍රීති සිත් ඇත්තහුගේ නාමකය සංසිඳුනේ වේ. සංසිඳුණු නාම කය ඇත්තේ සැපක් විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණේ. ගාමණිය, මේ ධර්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නෙහිය.

23. "ගාමණිය, ඒ මේ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ දඩිලොභ ඇත්තේ, පහවූ ව්‍යාපාද ඇත්තේ, නොමුළාවූයේ, යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ, සිහි ඇත්තේ, මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්. එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක් මෙසේ උඩ යට සරස හැමතැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"හෙතෙම යම් මේ ශාස්තෘතෙම කරන්නාට කරවන්නාට සිඳින්නාට, සින්දවන්නාට, පිසන්නාට, පිසවන්නාට, ශොක කරන්නාට, ක්ලාන්ත කරවන්නාට, කම්පාකරන්නාට, කම්පා නොකරන්නාහට, සතුන් මරන්නාහට නුදුන් දේ ගන්නාහට,

ගෙවල් බිඳින්නාට, මංපහරන්නාට, එක් ගෙයක් වටකර බඩු පැහැර ගන්නාහට, මග රැක සිට පැහැර ගන්නාට අන් අඹුවන්කරා යන්නාහට, බොරු කියන්නාට, කරන්නාහට, පාපය සිදුවෙයි. ආයුධ සහිත චක්‍රයෙන් යමෙක් පෘථුවියෙහි සත්වයන් එක් මස් ගොඩක් එක් මස් පිඩක් කරන්නේද ඒ හේතුවෙන් පාපයෙක් ඇත පාපයාගේ පැමිණීමක් ඇත. සිඳිමින් සින්දවමින්. මරමින්. මරවමින්, පිසමින්, පිසවමින්, ගංගා නදියෙහි දකුණු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පාපයක් ඇත. පාපයාගේ පැමිණීමක් ඇත. දෙමින්, දෙවමින්, පුදමින්, පුදවමින් ගංගා නදියෙහි උතුරුතෙරට යන්නේද, ඒ හේතුවෙන් පිනක් ඇත. පින් රැස්වීමක් ඇත. දීමෙන් දමනයෙන් සංයමයෙන් සත්‍ය වචනයෙන් පිනක් ඇත. පින් රැස්වීමක් ඇත. මෙසේ කියන්නේද මෙබඳු දෘෂ්ටි ඇත්තේද? ඉදින් ඒ භවත් ශාස්තෲවරයාගේ වචනය සත්‍යනම් මට නිරපරාධ පිණිස පවතී තැති ගන්නාවූ හෝ තැති නොගන්නාවූ හෝ කිසිවෙකු මම නොපෙළම්ද, යම් හෙයකින් කයින් සංවරවූයෙමි වචනයෙන් සංවරවූයෙමි සිතින් සංවරවූයෙමියි කියාද, යම්හෙයකින් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නෙමි කියාද, මේ දෙකට බැස ගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී ප්‍රීති සිත් ඇත්තාහුගේ ශරීරය සංසිඳුනේවේ සංසිඳුණු ශරීර ඇත්තේ සැපක් විඳියි, සැප ඇත්තාගේ සිත එකගවේ. ගාමණිය, මේ ධර්ම සමාධියයි ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ සැක කරන ස්වභාවය දුරු කරන්නෙහිය.

**24.** "ගාමණිය ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ අභිධ්‍යා ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේම තුන් දිසාවක්, එසේ සතර දිසාවක්, මෙසේ උඩ යට සරස හැමතැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"හෙතෙම මෙසේ සිතයි. යම් මේ ශාස්තෘ කෙනෙක් දෙනලද්දෙහි විපාක නැත. පුදන ලද්දෙහි විපාක නැත මහා දානයෙහි විපාක නැත. යහපත්කොට කරන ලද නපුරු කොට කරන ලද කර්මයන්ගේ ඵල විපාක නැත. මෙලොව නැත. පරලොව නැත. මවු නැත පියා නැත. ඔපපාතික සත්වයෝ නැත. යහපත් මාර්ගයෙහි පිළිපන් යමෙක් මෙලොවත් පරලොවත් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කෙරේද? එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැතැයි මෙබඳු වචන කියන්නේද, මෙබඳු දෘෂ්ටි ඇත්තේද, ඉදින් ඒ පින්වත් ශාස්තෘන්ගේ වචනය සත්‍යනම් මට නිරපරාධ පිණිස පවතී. මම තැති ගන්නාවූද, තැති නොගන්නාවූද, කිසිවෙකු නොපෙලමි. ඒ මම කයින් සංවරවූයෙමි වචනයෙන් සංවරවූයෙමි. සිතින් සංවරවූයෙමි කියාද, කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින්නෙමියි කියාද, මේ දෙකට බැසගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය උපදී, ප්‍රමොදවූ මට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තාගේ නාම කය සංසිඳෙයි. සංසිඳුනු නාම කය ඇත්තේ සැප විඳියි, සැප ඇත්තාගේ සිත සමාධියට පැමිණෙයි. ගාමණිය මේ ඒ ධර්ම සමාධියයි. ඔබ එහි ඉදින් චිත්ත සමාධිය ලබන්නෙහි නම් ඔබ මෙසේ මේ සැක කරන ස්වභාවය දුරුකරන්නේය.

**25.** "ගාමණිය, ඒ ආර්ය ශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ මුළානොවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක් එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක් මෙසේ උඩ යට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ මුළුලොකය උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසයකරයි.

"හෙතෙම යම් මේ ශාස්තෘවරයෙක් දෙන ලද්දෙහි විපාක ඇත. පුදන ලද්දෙහි විපාක ඇත මහාදානයෙහි විපාක ඇත. යහපත්කොට කරනලද, නපුරුකොට කරනලද කර්මයන්ගේ ඵල විපාක ඇත. මෙලොව ඇත. පරලොව ඇත. මවු ඇත.

පියා ඇත. ඕපපාතික සත්වයෝ ඇත. යමෙක් මෙලොවද, පරලොවද තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙත්ද, යහපත් මාර්ගයෙහි පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙසේ කියන මෙබඳු ලොකයෙහි ඇතැයි මෙසේ කියන්නේ වේද, මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේද, ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වචනය ඇත්ත නම් මගේ නිරපරාධය පිණිස පවතී. මම තැති ගන්නාවූ හෝ තැති නොගන්නාවූ හෝ කිසිවෙක් නොපෙළමි. යම් ඒ මම කයින් සංවරවූයෙමි. වචනයෙන් සංවරවූයෙමි. සිතින් සංවරවූයෙමි කියාද, කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින්නෙමි කියාද, මෙහි මේ දෙකටම බැසගත්තේ වෙමි ඒ මට ප්‍රමොදය උපදී, ප්‍රමොදවූවහුට ප්‍රීතිය පහළවෙයි. ප්‍රීති සිත් ඇත්තාහුගේ නාම කය සංසිඳෙයි. සංසිඳුණු නාම ඇත්තේ සැප විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. ගාමණිය, මේ ධම්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නේය.

**26.** "ගාමණිය, ඒ ආර්ය ශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරෙයි. එසේ දෙදිසාවක් එසේ තුන් දිසාවක් එසේ සතර දිසාවක් මෙසේ උඩ යට සරස හැමතැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහද්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද නැත්තාවූ ලොකය උපෙක්ෂා සහගත සිතින් වාසය කරයි.

"හෙතෙම යම් මේ ශාස්තෘවරයෙක් කරන්නාට, කරවන්නාට, සිඳින්නාට, සින්දවන්නාට, පිසින්නාට, පිසවන්නාට, ශොක කරන්නාට, ක්ලාන්ත කරන්නාට, කම්පාකරන්නාට, කම්පා කරවන්නාහට, සතුන් මරන්නාට, නුදුන් දේ ගන්නාහට, ගෙවල් බිඳින්නාට, මං පහරන්නාට, එක් ගෙයක් වටකර බඩු පැහැරගන්නාට, මග රැක සිට පැහැරගන්නාට අන් අඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, කරන්නාහට පාපයක්

නැත. ආයුධ සහිත චක්‍රයකින් යමෙක් මේ පෘථුවියෙහි ප්‍රාණීන් එක් මස් ගොඩක් එක් මස් පිඩක් කරන්නාහට ඒ හේතුවෙන් පාපයක් නැත පාපයාගේ පැමිණීමක් නැත. හිංසා කරමින්, මරවමින්, සිඳිමින්, සින්ඳවමින් පිසමින්, පිසවමින්, ගංගානදියෙහි දකුණු තෙරට යන්නේද ඒ හේතුවෙන් පාපයක් නැත. පාපයාගේ රැස්වීමක් නැත දෙමින්, දෙවමින්, පුදමින් පුදවමින් ගංගානදියෙහි උතුරු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පිනක් නැත. පින් රැස්වීමක් නැත. දීමෙන්, දමනයෙන්, සංයමයෙන් සත්‍ය වචනයෙන් පිනක්නැත. පින් රැස්වීමක් නැත. ඉදින් ඒ පින්වත් ශාස්තෘහුගේ වචනය සත්‍යනම් මට නිපරාධය පිණිස පවතී. මම තැති ගන්නාවූ හෝ නොගන්නාවූ හෝ කිසිවෙක් නොපෙළම්ද, ඒ මම කයින් සංවරවූයෙමි. වචනයෙන් සංවරවූයෙමි. සිතින් සංවරවූයෙමි කියාද, ඒ මම යම්හෙයකින් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නෙමි කියාද, දෙපක්ෂයටම බැස ගත්තෙමි. ඒ මට ප්‍රමොදය උපදී. ප්‍රමුදිතවූ ඔහුට ප්‍රීතිය පහළ වෙත්. ප්‍රීති සිත් ඇත්තහුගේ නාම කය සංසිඳුනේ වේ. සංසිඳුණු නාම කය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණේ. ගාමණිය, මේ ධර්ම සමාධියයි. ඉදින් ඔබ එහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ මේ සැක කරන ස්වභාවය දුරු කරන්නෙහිය.

**27.** "ගාමණිය, ඒ ආර්යශ්‍රාවකතෙම මෙසේ පහවූ දැඩි ලොභ ඇත්තේ පහවූ ව්‍යාපාද ඇත්තේ නොමුළාවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ උපෙක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙදිසාවක්, එසේ තුන් දිසාවක්, එසේ සතර දිසාවක්, මෙසේ උඩ යට සරස හැම තැන සර්වප්‍රකාරයෙන් සියල්ල සහිත මහත්වූ මහත්ගතවූ අප්‍රමාණවූ අවෛරවූ ව්‍යාපාද රහිත ලොකය උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

හෙතෙම මෙසේ සිතයි. යම් මේ ශාස්තෘවරයෙක් කරන්නාට, කරවන්නාට, සිඳින්නාට, සින්දවන්නාට, පිසින්නාට,

පිසවන්නාට, ශොකකරන්නාට, ක්ලාන්ත කරවන්නාට, කම්පා කරන්නාට, කම්පා නොකරන්නාහට, ප්‍රාණඝාතකරන්නාට, නුදුන්දේ ගන්නාහට, ගෙවල්බිඳින්නාට, මංපහරන්නාට, එක් ගෙයක් වටකර බඩු පැහැර ගන්නාට, මගරැකසිට පැහැර ගන්නාට පරදාරාවන් කරා යන්නාට, බොරු කියන්නාහට, කරන්නාහට පාපය සිදුවේ. ආයුධ සහිත චක්‍රයකින් යමෙක් මේ පෘථුවියෙහි ප්‍රාණීන් එක් මස් ගොඩක් එක් මස් පිඩක් කරන්නේද ඒ හේතුවෙන් පාපයක් ඇත පාපයාගේ රැස්වීමක් ඇත. හිංසා කරමින්, මරවමින්, සිඳිමින්, සින්ඳවමින් පිසමින්, පිසවමින්, ගංගානදියෙහි දකුණුතෙරට යන්නේද, ඒ හේතුවෙන් පාපයක් ඇත. පාපයාගේ පාපයාගේ පැමිණීමක් ඇත. දෙමින් දෙවමින් ගංගානදියෙහි උතුරු තෙරට යන්නේද, ඒ හේතුවෙන් පිනක් ඇත. පින් රැස්වීමක් ඇතැයි මෙසේ කියන මෙවැනි දෘෂ්ටි ඇතිවේද, ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වචනය සත්‍යය නම් මට නිපරාධය පිණිස පවතී. මම තැතිගන්නාවූ හෝ තැති නොගන්නාවූ හෝ කිසිවෙකු නොපෙළමි. යම්හෙයකින් මම කයින් සංවර වූයෙමි. වචනයෙන් සංවර වූයෙමි. සිතින් සංවර වූයෙමි. කියාද කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නෙමි කියාද, මේ දෙකට බැසගත්තේ වෙමි. ඒ මට ප්‍රමොදය පහළවේ. ප්‍රමොද වූවහුට ප්‍රීතිය පහළවේ. ප්‍රීති සිත් ඇත්තාගේ නාමකය සංසිඳුනේවේ. සංසිඳුණු නාමකය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට පැමිණෙයි.

28. "ගාමණිය, මේ ධර්මසමාධියයි ඉදින් ඔබ මෙහි චිත්ත සමාධිය ලබන්නෙහි නම් මෙසේ ඔබ මේ සැක කරන ස්වභාවය දුරුකරන්නෙහිය." මෙසේ වදාළකල්හි පාටලිය ගාමණීතෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමිනි, යහපත ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද වැසුණ දෙයක් විවෘතකරන්නේද, මංමුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තාහු රූප දකිත්වයි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දෙශනා කරන ලදී. ස්වාමීනි, ඒ මම ධර්මයද භික්ෂු සංඝයාද සහිත භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට යමි. අද පටන්

ජීවිතාන්තය දක්වා සරණගත උපාසකයෙකුකොට මා දරණසේක්වායි” කීයේය.

(ගාමණි සංයුත්තය නිමි.)

---

# 8. අසංඛත සංයුත්තය.

## පළමුවෙනි වර්ගය.

### 1. කායගතාසති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු මහසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි තොපට අසංඛත (නිර්වාණයද,) අසංඛත ගාමී (නිවනට පැමිණෙන) මගද දේශනා කරන්නෙමි එය අසව්. මහණෙනි, අසංඛතය කවරේද? මහණෙනි, යම් රාගය ක්ෂයවීමක් වේද, යම් දොෂය ක්ෂයවීමක් වේද, මෝහය ක්ෂයවීමක් වේද මහණෙනි, මේ අසංඛතයයි කියනු ලැබේ.

3. “මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ කායගතාසතිය අසංඛතගාමී මාර්ගයයි.

4. “මහණෙනි, මා විසින් මෙසේ තොපට අසංඛතයත් දේශනා කරනලදී. අසංඛතගාමී මගත් දෙශනා කරනලදී. මහණෙනි, ශ්‍රාවකයන්ගේ හිතවැඩ කැමැත්තාවූ අනුකම්පා කරන්නාවූ ශාස්තෲවරයකු විසින් කටයුතුද, එය මා විසින් තොපට කරනලදී. මහණෙනි, අර වෘක්ෂමූලයෝ වෙත්. ශුන්‍යාගාරයෝ වෙත් භාවනා කරව්. මහණෙනි, ප්‍රමාද නොවව්. පසුව විපිළිසර නොවව්. තොපට මේ අපගේ අනුශාසනයයි.”

## 2. සමථ විපස්සනා සූත්‍රය.

(මේ වර්ගයේ සූත්‍ර සියල්ලේම 1, 2, 4 වෙනි ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 1, 2, 4 වෙනි ඡේද මෙන් වේ.)

3. "මහණෙනි, අසංඛතගාමි මාර්ගය කවරේද? මහණෙනි, (සමථ) සිත එකඟකිරීමද, (විපස්සනා) සිත පිරිසිදු අසංඛතගාමි මාර්ගයයි.

## 3. සවිතක්ක සවිචාර සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමි මාර්ගය කවරේද? විතර්ක සහිත විචාර සහිත සමාධියද අවිතර්ක විචාරමාත්‍ර සමාධියද අවිතර්ක අවිචාර සමාධියද, යන මේ මහණෙනි, අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 4. සුඤ්ඤත සමාධි සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? සුඤ්ඤත සමාධිය, අනිමිත්ත සමාධිය, අප්පණිහිත සමාධිය යන මේ අසංඛතගාමී මාර්ගයයි කියනුලැබේ.

## 5. සතිපට්ඨාන මග්ග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, සතර සතිපට්ඨාන යන මෙය අසංඛත මාර්ගයයි කියනු ලැබේ.

## 6. සම්මප්පධානමග්ග සූත්‍රය

3. "මහණෙනි, අසංඛතමාර්ගය කවරේද? මහණෙනි, සතර සම්‍යක් ප්‍රධාන යන මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 7. ඉද්ධිපාද මග්ග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, සතර ඍද්ධිපාද යන මෙයද අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 8. ඉන්ද්‍රිය මග්ග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛත මාර්ගය කවරේද? පඤ්ච ඉන්ද්‍රිය යන මෙය අසංඛතගාමී මාර්ගයයි කියනුලැබේ.

## 9. බලමග්ග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, පඤ්චබල යන මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 10. බොජ්ක්ධංග මග්ග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, සප්තබොධ්‍යංග යන මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 11. මග්ගංග මග්ග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

---

# දෙවෙනි වර්ගය

## 1. සමථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තොපට අසංඛතයත් අසංඛතගාමී මාර්ගයක් දෙසන්නෙමි. එය අසව්. මහණෙනි, අසංඛතය කවරේද? මහණෙනි යම් රාගය ක්ෂයවීමක්වේද, දොෂය ක්ෂයවීමක්වේද, මොහය ක්ෂයවීමක්වේද, මහණෙනි, මේ අසංඛතයයි කියනුලැබේ.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, සමථය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

4. "මහණෙනි, මෙසේ මම තොපට අසංඛතයත් දෙසන ලදී. අසංඛතගාමී මාර්ගයත් දෙශනා කරනලදී. මහණෙනි,

ශ්‍රාවකයන්ට හිතවත් අනුකම්පා කරන ශාස්තෲවරයෙකු විසින් යමක් කළ යුතු නම් එය මා විසින් තොපට අනුකම්පා උපදවා කරන ලදී. මහණෙනි, අර වෘක්ෂමූලයෝයි. අර ශූන්‍යාගාරයෝයි. මහණෙනි, භාවනා කරව්. ප්‍රමාද නොවව්. පසුව පසුතැවිලි නොවව්. මේ තොපට අපගේ අනුශාසනාවයි.

(මේ වර්ගයේ හැම සූත්‍රයේම 1, 2, 4 වෙනි ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 1, 2, 4 වෙනි ඡේද මෙනි.)

## 2. විපස්සනා සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, සිත පිරිසිදු කිරීමයි. මහණෙනි, මේ අසංඛතගාමි මාර්ගයයි කියනු ලැබේ.

## 3. සවිතක්ක සවිචාර සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, සවිතර්ක සවිචාර සමාධියයි. මහණෙනි, මේ අසංඛත මාර්ගයයි කියනු ලැබේ.

## 4. අවිතක්ක විචාරමත්ත සූත්‍රය

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, අවිතර්ක විචාරමාත්‍ර සමාධියයි මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 5. අවිතක්ක අවිචාර සූත්‍රය

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, අවිතර්ක අවිචාර සමාධියයි. මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 6. සුඤ්ඤත සමාධි සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, සුඤ්ඤත සමාධියයි. මහණෙනි, සුඤ්ඤත සමාධිය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 7. අනිමිත්ත සමාධි සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, අනිමිත්ත සමාධියයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි. කියනු ලැබේ.

## 8. අප්පණිහිත සමාධි සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, අප්පණිහිත සමාධියයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 9. කායානුපස්සී සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණ කෙලෙස් තවන වීර්ය ඇතිව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව පඤ්චස්කන්ධ ලොකයෙහි තෘෂ්ණා ව්‍යාපාද දෙක මැඩපවත්වා කයෙහි කය අනුව නැවත නැවත බලමින් වාසය කරයිද? මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 10. වේදනානුපස්සී සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්ය ඇතිව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව පඤ්චස්කන්ධ ලෝකයෙහි තෘෂ්ණා ව්‍යාපාද දෙක මැඩපවත්වා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කරයිද, මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 11. චිත්තානුපස්සී සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්ය ඇතිව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව පඤ්චස්කන්ධ ලොකයෙහි සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරයිද, මහණෙනි. මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 12. ධම්මානුපස්සී සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්ය ඇතිව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව පඤ්චස්කන්ධ ලෝකයෙහි ධර්මයෙහි ධර්මය නැවත නැවත බලමින් වාසය කරයිද, මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 13. පඨම සම්මප්පධාන සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්යය පටන්ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 14. දුතීය සම්මප්පධාන සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළාබව පිණිස, බොහෝවීම පිණිස, විපුලත්වය පිණිස, භාවනාවෙන් සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 15. තතිය සම්මප්පධාන සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්යය පටන් ගනියි. සිත ඔසවයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 16. චතුත්ථ සම්මප්පධාන සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උපන් කුසලධර්මයන්ගේ ස්ථිතිය පිණිස නුමුළාබව පිණිස බොහෝවීම පිණිස භාවනාවෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 17. ඡන්දිද්ධිපාද සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන්ද, සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාදය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 18. විරියිද්ධිපාද සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වීර්යය අධිපතිකොට ඇති සමාධියෙන්ද සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුක්තවූ ඍද්ධිපාදය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 19. චිත්තිද්ධිපාද සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිත අධිපතිකොට ඇති සමාධියෙන් සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුත් ඍද්ධිපාද වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 20. වීමංසිද්ධිපාද සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ප්‍රඥාව (විමසීම) අධිපතිකොට ඇති සමාධියෙන්ද සම්‍යක් ප්‍රධාන වීර්යයෙන්ද යුත් ඍද්ධිපාද වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 21. සද්ධින්ද්‍රිය සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ නිවනකරා නැමුණු සද්ධින්ද්‍රිය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 22. විරියින්ද්‍රිය සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, නිවනකරා නැමුණු විරියින්ද්‍රිය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 23. සතින්ද්‍රිය සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සතින්ද්‍රිය වඩයි. මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 24. සමාධින්ද්‍රිය සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සමාධින්ද්‍රිය වඩයි. මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 25. පඤ්ඤින්ද්‍රිය සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන කරා නැමුණු පඤ්ඤින්ද්‍රිය වඩයි. මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 26. සද්ධාබල සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන කරා නැමුණු ශ්‍රද්ධා බලය බඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 27. විරියබල සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු විරිය බලය වඩයි. මහණෙනි, මෙය අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 28. සතිබල සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සතිබලය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 29. සමාධිබල සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සමාධිබලය වඩයි. මහණෙනි, මේ අසංඛත මාර්ගයයි කියනු ලැබේ.

## 30. පඤ්ඤාබල සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු ප්‍රඥාබලය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 31. සතිසම්බොජ්ඣංග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සති සම්බොජ්ක්ධංගය වඩයි. මහණෙනි, මේ අසංඛත මාර්ගයයි. කියනු ලැබේ.

## 32. ධම්මවිචයසම්බොජ්ඣංග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ නිවන කරා නැමුණු ධම්මවිචය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සම්බොජ්ඣංගය වඩයි. මහණෙනි, මේ අසංඛත මාර්ගයයි කියනු ලැබේ.

## 33. විරියසම්බොජ්ඣංග සූත්‍රය.

3 "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ, නිවන කරා නැමුණු විරිය සම්බොජ්ඣංගය වඩයි. මහණෙනි, මේ අසංඛත මාර්ගයයි කියනු ලැබේ.

## 34. පීතිසම්බොජ්ඣංග සූත්‍රය.

3. " මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන කරා නැමුණු ප්‍රීති සම්බොජ්ඣංගය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 35. පස්සද්ධිසම්බොජ්ඣංග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන කරා නැමුණු පස්සද්ධිසම්බොජ්ඣංගය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 36. සමාධිසම්බොජ්ඣංග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ නිවන කරා නැමුණු සමාධි සම්බොජ්ඣංගය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 37. උපෙක්ඛාසම්බොජ්ඣංග සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු උපෙක්ෂාසම්බොජ්ඣංගය වඩයි. මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

### 38. සම්මාදිට්ඨි සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සම්‍යක් දෘෂ්ටිය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

### 39. සම්මාසංකප්ප සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සම්‍යක් සංකල්පනය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

### 40. සම්මාවාචා සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සම්‍යක් වචනය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

### 41. සම්මාකම්මන්ත සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සම්‍යක් කර්මාන්තය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

### 42. සම්මාජීව සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සම්‍යක් ආජීවය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 43. සම්මාවායාම සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සම්‍යක් ව්‍යායාමය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 44. සම්මාසති සූත්‍රය.

"මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ නිවන කරා නැමුණු සම්‍යක් සතිය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

## 45. සම්මාසමාධි සූත්‍රය.

3. "මහණෙනි, අසංඛතගාමී මාර්ගය කවරේද? මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවන කරා නැමුණු සම්‍යක් සමාධිය වඩයි. මහණෙනි, මේ අසංඛතගාමී මාර්ගයයි කියනු ලැබේ.

(මෙහිදී අසංඛත සංයුත්තයේ 1 වර්ගයේ 1 - 11 සහ 2 වර්ගයේ 1 - 45 තෙක් ඇති සූත්‍රවලට මුලින් අන්ත යන නම යොදාගැනීමෙන් අන්ත සූත්‍ර 56 සැදේ. එසේම අනාසව, සච්ච, පාර, නිපුණ, සුදුද්දස, අජර, ධුව, අපලොකිත, අනිදස්සන, නිප්පපඤ්ච, සතත, අමත, පණීත සිව, ඛෙම, තණ්හක්ඛය, අච්ඡරිය, අබ්භුත, අනීතික, අනීතිකධම්ම, නිබ්බාණ, අබ්‍යාපජ්ඣ, විරාග, සුද්ධි, මුත්ති, අනාලය, දීපාලෙණ, තාණ, සරණ සහ පරායණ යන නම් යොදාගැනීමෙන් වෙන වෙන සූත්‍ර 56 බැගින් සැදේ.)

## 46 - 102. අන්ත සූත්‍ර.

"මහණෙනි, තොපට සසර කෙළවරද දෙශනා කරමි. සසර කෙළවරට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි. ඒ අසව්.

## 101 - 157 අනාසව සූත්‍ර.

"මහණෙනි, තොපට ආශ්‍රවයන්ගේ කෙළවර කිරීමද දෙශනා කරන්නෙමි. ආශ්‍රවයන් කෙළවර කිරීමේ මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 158 - 213. සච්ච සූත්‍රය.

"මහණෙනි, තොපට සත්‍යයද දෙශනා කරන්නෙමි. සත්‍යයට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 214 - 269. පාර සූත්‍ර.

"මහණෙනි, තොපට පරතෙරද පරතෙරට යන මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 270 - 325. නිපුණ සූත්‍ර.

"මහණෙනි, තොපට සියුම් ධර්මයද, දෙශනා කරන්නෙමි. සියුම් ධර්මයට පැමිණෙන මාර්ගයද, දෙශනා කරන්නෙමි.

## 326 - 381. සුදුද්දස සූත්‍ර.

"මහණෙනි, තොපට දැකීමට දුෂ්කර ධර්මයද, දෙශනා කරන්නෙමි. දැකීමට දුෂ්කර ධර්මයට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 382 - 437. අජර සූත්‍ර.

මහණෙනි, තොපට ජරාවක් ඇති ධර්මයද දෙශනා කරන්නෙමි. ජරාවක් නැති ධර්මයට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 438 - 493. ධුව සූත්‍ර.

"මහණෙනි, තොපට නිත්‍යභාවයද, දෙශනා කරන්නෙමි. නිත්‍ය ස්වභාවයට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 494 - 549. අපලොකිත සූත්‍ර.

"මහණෙනි, තොපට විනාශ නොවන ස්වභාවයද, දෙශනා කරන්නෙමි. විනාශ නොවන ස්වභාවයට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 550 - 605. අනිදස්සන සූත්‍ර.

"මහණෙනි, තොපට ඇසින් නොදැක්කහැකි ස්වභාවයද දෙශනා කරන්නෙමි. ඇසින් නොදැක්කහැකි ස්වභාවයට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

## 606 - 661. නිප්පපඤ්ච සූත්‍රය.

"මහණෙනි තොපට (තෘෂ්ණා දෘෂ්ටි මාන) යන ප්‍රපඤ්ච ධර්මයන්ගෙන් මිදුනාවූ ස්වභාවයද දෙශනා කරන්නෙමි. ප්‍රපඤ්ච ධර්මයන්ගෙන් මිදුනු ස්වභාවයට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

## 662 - 717. සන්ත සූත්‍ර.

"මහණෙනි, මම තොපට ශාන්ත ස්වභාවයද දෙශනා කරන්නෙමි. ශාන්තතත්ත්වයට පැමිණෙන මගද දෙසන්නෙමි.

## 718 - 773. අමත සූත්‍ර.

"මහණෙනි, මම තොපට නොමැරෙන ස්වභාවයක්ද දෙශනා කරන්නෙමි. නොමැරෙන ස්වභාවයට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

## 774 - 829. පණීත සූත්‍ර.

"මහණෙනි, මම තොපට ප්‍රණීත ධර්මයද දෙශනා කරන්නෙමි. ප්‍රණීත ධර්මයට පැමිණෙන මගද දෙසන්නෙමි.

## 830 - 885. සිව සූත්‍ර.

"මහණෙනි, මම තොපට නිර්භය ස්ථානයද දෙශනා කරන්නෙමි. නිර්භය ස්ථානයට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි.

### 886 - 941. ඛෙම සූත්‍ර.

"මහණෙනි මම තොපට ක්ෂෙම ස්ථානයද, දෙශනාකරන්නෙමි. ක්ෂෙම ස්ථානයට පැමිණෙන මගද දෙසන්නෙමි.

### 942 - 997. තණ්හක්ඛය සූත්‍ර.

"මහණෙනි, මම තොපට තෘෂ්ණාව ක්ෂය කිරීමද දෙසන්නෙමි. තෘෂ්ණාව ක්ෂය කිරීමට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

### 998 - 1053 අච්ඡරිය සූත්‍ර.

"මහණෙනි, මම තොපට ආශ්චර්යයද දෙශනා කරන්නෙමි. ආශ්චර්ය ධර්මයට පැමිණෙන මගද දෙසන්නෙමි.

### 1054- - 1109. අබ්භූත සූත්‍ර.

"මහණෙනි, මම තොපට හටගැන්මක් නැති ස්වභාවයද දෙසන්නෙමි. හටගැනීමක් නැති ස්වභාවයට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

### 1110 - 1165. අනීතික සූත්‍ර.

"මහණෙනි, තොපට දුක් නැති තැනද දෙසන්නෙමි. දුක් නැති තැනට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

### 1166 - 1221. අනීතිකධම්ම සූත්‍ර.

"මහණෙනි, මම තොපට දුක් නැති ස්වභාවයද දෙසන්නෙමි. දුක් නැති ස්වභාවයට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

### 1222 - 1277. නිබ්බාණ සූත්‍ර.

"මහණෙනි, මම තොපට නිර්වාණයද නිර්වාණයට පැමිණෙන මගද දෙසන්නෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 1278 - 1333. අබ්‍යාපජ්ඣ සූත්‍ර

"මහණෙනි, මම තොපට පීඩා නැති තැනද දෙශනා කරන්නෙමි. පීඩා නැති තැනට පැමිණෙන මගද දෙසන්නෙමි.

## 1334 - 1389. විරාග සූත්‍ර.

"මහණෙනි, මම තොපට රාගයෙන් පහවූ තැනද දෙශනා කරන්නෙමි. රාගය පහවූ තැනට පැමිණෙන මාර්ගයද දෙශනා කරන්නෙමි.

## 1390 - 1445. සුද්ධි සූත්‍ර

"මහණෙනි මම තොපට පිරිසිදු තැනද දෙශනා කරන්නෙමි. පිරිසිදු තැනට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

## 1466 - 1501. මුත්ති සූත්‍ර.

"මහණෙනි, මම තොපට දුකින් මිදුණු තැනද දෙශනා කරන්නෙමි. දුකින් මිදුණු තැනට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

## 1502 - 1557. අනාලය සූත්‍ර

"මහණෙනි, මම තොපට ආලය රහිත ධර්මයද දෙශනා කරන්නෙමි. ආලය රහිත ධර්මයට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

## 1558 - 1612. දීප සූත්‍ර

"මහණෙනි, මම තොපට පිහිටවූ ධර්මයද දෙශනා කරන්නෙමි. පිහිටවූ ධර්මයට පැමිණෙන මගද දෙසන්නෙමි.

## 1614 - 1669. ලෙණ සූත්‍ර

"මහණෙනි, මම තොපට සැඟවෙන නියාද දෙශනා කරන්නෙමි. සැඟවෙන තැනට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

### 1670 - 1725. තාණ සූත්‍ර

"මහණෙනි, මම තොපට ආරක්ෂක ස්ථානයද දෙශනා කරන්නෙමි. ආරක්ෂක ස්ථානයට පැමිණෙන මාර්ගයද දෙසන්නෙමි.

### 1726 - 1781 සරණ සූත්‍ර

"මහණෙනි, මම තොපට භය නැති කිරීමද, භය නැති කරන මාර්ගයද දේශනා කරන්නෙමි.

### 1782 - 1837 පරායණ සූත්‍ර.

"මහණෙනි, මම තොපට පිහිටද, පිහිටවන මාර්ගයද දේශනා කරන්නෙමි.

**(දෙවෙනි වර්ගය නිමි.)**

---

**(අසංඛත සංයුත්තය නිමි)**

---

## 9. අව්‍යාකත සංයුත්තය

### 1. ඛෙම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඬු මහ සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි ඛෙමා භික්ෂුණිය කොසොල් ජනපදයෙහි ඇවිදින්නී සැවැත් නුවරටද, සාකෙත නුවරටද අතර තොරණවත්ථු නම් ස්ථානයෙහි වාසයට පැමිණියාය එකල්හි පසේනදී කොසොල් රජතෙමේ සාකෙතනුවරින් සැවැත්නුවරට යන්නේ සැවැත් නුවරටද, සාකෙතනුවරටද අතර පිහිටි තොරණවත්ථුවෙහි එක් රැයක් විසීමට පැමිණියේය. එකල්හි පසේනදීකොසොල් රජතෙමේ එක්තරා පුරුෂයෙකුට කතාකළේය. කථාකොට "එම්බල පුරුෂය, යව ඔබ අද මට (පයුරුපාසනය කිරීමට) සේවනය කිරීමට

සුදුසුවූ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ දනුවයි” කීයේය. ඒ පුරුෂතෙම “එසේය දේවයන් වහන්සැයි” පසෙනදී කොසොල් රජුට උත්තරදී තොරණවත්ථුව මුළුල්ලෙහි පිළිවෙළින් ඇවිදින්නේ පසේනදී කොසොල් රජුහට පයුරුපාසනය කිරීමට (සේවනය කිරීමට) සුදුසු ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ නුදුටුයේය.

2. ඒ පුරුෂතෙම තොරණ වත්ථුවෙහි වාසයට පැමිණි ඛෙමා භික්ෂුණිය දුටුයේය. දැක පසේනදී කොසොල් රජතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ පසේනදී කොසොල්රජුට “දේවයන් වහන්සේට සේවනය කිරීමට සුදුසුවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ තොරණවත්ථුවෙහි නැතැයි” කීයේය. “දේවයන් වහන්ස, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රාවිකාවක්වූ ඛෙමා නම් භික්ෂුණියක් ඇත්තේය. පණ්ඩිතය ව්‍යක්තය, නුවණැත්තිය, බහුශ්‍රැතය, විසිතුරු කථා ඇත්තීය. යහපත් වැටහෙණ නුවණ ඇත්තීයයි ඒ ආර්යාවගේ මෙබඳු යහපත් කීර්ති ශබ්දයක් පැනනැංගේය. දේවයන් වහන්සේ ඈ ආශ්‍රය කරණ සේක්වායි” කීය.

3. ඉක්බිති පසේනදී කොසොල් රජතෙම ඛෙමා භික්ෂුණිය යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ඛෙමා භික්ෂුණිය වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් පසේනදී කොසොල් රජතෙමේ ඛෙමා භික්ෂුණියට “ආර්යාවෙනි’ කිමෙක්ද තථාගතයන් මරණින්මතු වේදැයි” ඇසීය. - “මහරජ, තථාගතයන් වහන්සේ මරණින්මතු වේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය ප්‍රකාශ නොකරන ලදී.”

“ආර්යාවෙනි, කිමෙක්ද, තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේද?” - “මහරජ, තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙයද නොවදාරණ ලදී.”

“කිමෙක්ද ආර්යාවෙනි, තථාගතයන් වහන්සේ මරණින් මතු වේද නොවේද?”

"මහරජ, තථාගතයන් වහන්සේ මරණින් මතු වෙයිද නොවෙයිද කියා භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවදාරණ ලදී."

"ආර්යාවෙනි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයිද නොවන්නේ නොවෙයිද?" "මහරජ තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවෙයි කියා භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරණ ලදී."

"ආර්යාවෙනි, කිමෙක්ද තථාගතයන් වහන්සේ මරණින් මතු වේදැයි විචාරණ ලද්දේ 'මහරජ තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද්දේයයි' කීයෙහිය.

"කිමෙක්ද? ආර්යයන් වහන්ස, තථාගතයන් වහන්ස මරණින් මතු නොවේදැයි මෙසේ විචාරණ ලද්දේ. මහරජ තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද්දේයයි කීයෙහිය.

"කිමෙක්ද? ආර්යාවෙනි, තථාගතයන්වහන්සේ මරණින් මතු වෙයිද නොවෙයිදැයි. මෙසේ අසන ලද්දේ 'මහරජ භග්‍යවතුන් වහන්සේ විසින් මරණින් මතු වෙයිද නොවෙයි දැයි මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි' කීයෙහිය.

"ආර්යාවෙනි, කිමෙක්ද? තථාගතයන්වහන්සේ මරණින් මතු නොවෙයිද, නොවන්නේ නෙවෙයිදැයි මෙසේ විචාරණ ලද්දේ, 'මහරජ, තථාගතයන්වහන්සේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවේයයි මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි" කීයෙහිය.

"ආර්යාවෙනි, යමක් නිසා එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේනම්, ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍ය කවරේද?

4. "මහරජ, එසේනම් මෙහි තොපම විචාරන්නෙමි. යම්සේ තොපට වැටහේනම් එසේ එය ප්‍රකාශ කරන්නෙහිය. මහරජ,

ඒ කුමකැයි හඟින්නෙහිද? තොපගේ ගණන් තබන්නෙක් හෝ (ඇඟිලි) මුද්‍රාවෙන් ගණන් කිරීමට දක්ෂයෙක් හෝ කොටස් ගණනින් ගණන් කිරීමට දක්ෂයෙක් හෝ වැලි මෙපමණයයි කියා හෝ මෙතෙක් වැලි සියයක්ය කියා හෝ මෙපමණ වැලි දහසක්ය කියා හෝ මෙපමණ වැලි ලක්ෂයක්ය කියා හෝ ගඟෙහි වැලි ගණන් කිරීමට සමර්ථවූ කිසිවෙක් ඇත්තේද?

"ආර්යාවෙනි, නැත.

"තොපගේ ගණන් කරන්නෙක් හෝ (ඇඟිලි) මුද්‍රාවෙන් ගණන් කරන්නෙක් හෝ කොටස් ගණනකින් ගණන් කරන්නෙක් හෝ මෙපමණ ජල ලාස්යයි කියා හෝ මෙපමණ ජල ලාස් සියයක්ය කියා හෝ මෙපමණ ජල ලාස් දහසක්ය කියා හෝ මෙපමණ ජල ලාස් ලක්ෂයක්ය කියා හෝ මහා සමුද්‍රයෙහි ජලය මනින්ට සමර්ථවූ කිසිවෙක් ඇත්තේද?"-"ආර්යාවෙනි නැත."

"ඊට හේතු කවරේද?"-"ආර්යාවෙනි, සමුද්‍රය විශාලය - ගැඹුරුය, අප්‍රමාණය, දැන ගැනීමට අපහසුය"

**5.** "මහරජ, 'එසේම යම් රූපයක් කරනකොටගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ රූපය තථාගතයන් වහන්සේ විසින් පහ කරන ලදී. මුල් සිඳින ලදී. කරටිය සිඳි තල් ගසක්මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්වයට කරන ලදී. මහරජ රූප සංඛ්‍යාවෙන් මිදුනාවූ තථාගතයන් වහන්සේ ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ මරණින් මතුවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද නොවේයයිද කීමට නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි. නොවන්නේ නොවෙයි කියා කියා කීමටද නුසුදුසුයි.

"මහරජ, එසේම යම් වේදනාවක් කරණකොට ගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ වේදනාව

තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳිනලදී. කරටිය සිඳි තල් ගසක්මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්ත්වයට කරන ලදී. මහරජ, වේදනා සංඛ්‍යාවෙන් මිදුනාවූ තථාතයන් වහන්සේ ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ 'මරණින්මතු වේයයි කීමටද නුදුසුය. තථාගතයන් වහන්සේ මරණින්මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද, නොවේයයිද කීමට නුසුදුසුය තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි. නොවන්නේ නොවෙයි කියා කීමටද නුසුදුසුයි.

"මහරජ, එසේම යම් සංඥාවක් කරණකොට ගෙන තථාගතයන්වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ සංඥාව තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳින ලදී. කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්ත්වයට කරන ලදී. මහරජ, සංඥා සංඛ්‍යාවෙන් මිදුනාවූ තථාගතයන් වහන්සේ ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයි කීමටද නුසුදුසුය තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද නොවේයයිද කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි. නොවන්නේ නොවෙයි කියා කීමටද නුසුදුසුයි.

"මහරජ, එසේම යම් සංස්කාරයක් කරනකොට ගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ සංස්කාරය තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳින ලදී. කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්වයට කරන ලදී. මහරජ, සංස්කාර සංඛ්‍යාවෙන් මිදුනාවූ තථාගතයන් වහන්සේ ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ 'මරණින් මතු වේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද,නොවේයයිද කීමට

නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි’ නොවන්නේ නොවෙයි කියා කීමටද නුසුදුසුය.

“මහරජ, එසේම යම් විඥ්ඥාණයක් කරනකොට ගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ විඥ්ඥාණය තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳින ලදී. කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරනලදී. මතු නූපදින තත්වයට කරන ලදී. මහරජ, විඥ්ඥාණය සංඛ්‍යාවෙන් මිදුනාවූ තථාගතයන් වහන්සේ ගැඹුරුය, අප්‍රමාණය, දැන ගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ ‘මරණින් මතු වේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද නොවේයයිද කීමට නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි. නොවන්නේ නොවෙයි කීමටද නුසුදුසුයි.

ඉක්බිති පසේනදී කොසොල් රජතෙම ඛෙමා භික්ෂුණියගේ වචනයට සතුටුව අනුමෝදන්ව හුන් අස්නෙන් නැගිට ඛෙමා භික්ෂුණිය වැඳ ගරුකොට ගියේය.

**6.** “ඉක්බිති පසෙනදී කොසොල්රජ පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් පසෙනදී කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් ‘ස්වාමීනි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ මරණින් මතු වන්නේදැයි” ඇසීය.

“මහරජ, තථාගත තෙමේ මරණින් මතු වේයයි මෙය මා විසින් ප්‍රකාශ නොකරන ලදී.”

“ස්වාමීනි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙත්ද?”

“මහරජ, තථාගත තෙමේ මරණින් මතු නොවේයයිද මා විසින් ප්‍රකාශ නොකරනලදී.”

"ස්වාමීනි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ මරණින් මතු වන්නේත් නොවෙත්ද, නොවන්නේත් නොවෙත්ද?"

"මහරජ, තථාගතයන් වහන්සේ මරණින් මතු වන්නේත් නොවෙත්, නොවන්නේත් නොවෙත් කියාද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"ස්වාමීනි, කිමෙක්ද? 'තථාගතයන් වහන්සේ මරණින් මතු වේදැයි' මෙසේ විචාරණ ලද්දේ 'මහරජ, මා විසින් තථාගත තෙමේ මෙසේ මරණින් මතු වන්නේය යන මෙයද මා විසින් නොවදාරණ ලද්දේයයි' කීයෙහිය.

"ස්වාමීනි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙත්දැයි මෙසේ විචාරණ ලද්දේ, 'මහරජ, මා විසින් තථාගතතෙම මරණින් මතු නොවන්නේය යන මෙයද මා විසින් නොවදාරණ ලද්දේයයි' කීයෙහිය.

"ස්වාමීනි, කිමෙක්ද? තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයිද නොවන්නේ නොවෙයිදැයි මෙසේ විචාරණ ලද්දේ, 'මහරජ, තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවේමයි මෙයද මා විසින් නොවදාරණ ලද්දේයයි' කීයෙහිය.

"යමක් නිසා එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේද? ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍ය කවරේද?"

7. "මහරජ, එසේවීනම් මෙහි තොපම විචාරමි. යම්සේ තොපට යම්සේ වැටහේනම් එසේ එය ප්‍රකාශ කරන්නෙහිය. මහරජ, ඒ කුමකැයි හඟින්නේද? යමෙක් ගංගාවෙහි මෙතෙක් වැලියයි කියා හෝ මෙතෙක් වැලි සියයක්ය කියා මෙපමණ වැලි දහසක්ය කියා හෝ මෙපමණ වැලි ලක්ෂයක්ය කියා හෝ ගඟෙහි වැලි ගණන් කිරීමට සමර්ථ තොපගේ කිසියම් ගණකයෙක් හෝ ඇඟිලි මුද්‍රිකාවෙන් ගණින්නෙක් හෝ කොටස් වශයෙන් ගණන්කරන්නෙක් හෝ වේද? "ස්වාමීනි, නැත."

"තොපගේ ගණන් කරන්නෙක් හෝ (ඇඟිලි) මුද්‍රාවෙන් ගණන් කරන්නෙක් හෝ කොටස් ගණනකින් ගණන් කරන්නෙක්

හෝ මහා සමුද්‍රයෙහි ජලය මෙපමණ ජල ලාස් ගණනක්ය කියා හෝ මෙපමණ ජල ලාස් සියයක්ය කියා හෝ මෙපමණ ජල ලාස් දහසක්ය කියා හෝ මෙපමණ ජල ලාස් ලක්ෂයක්ය කියා හෝ ප්‍රමාණ කරන්නට සමර්ථ වේද? "ස්වාමීනි, නැත."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි. සමුද්‍රය විශාලය, ගැඹුරුය, අප්‍රමාණය, බැසගැන්මට නොහැක."

8. "මහරජ, 'එසේම යම් රූපයක් කරණකොටගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ රූපය තථාගතයන් වහන්සේ විසින් පහ කරන ලදී, මුල් සිඳින ලදී. කරටිය සිඳි තල් ගසක්මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්ත්වයට කරන ලදී. මහරජ රූප සංඛ්‍යාවෙන් මිදුණාවූ තථාගතයන් වහන්සේ සමුද්‍රය මෙන් ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ 'මරණින් මතුවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද නොවේයයිද කීමට නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි, නොවන්නේ නොවෙයි කියා කීමටද නුසුදුසුයි.

"මහරජ, එසේම යම් වේදනාවක් කරණකොට ගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ වේදනාව තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳිනලදී. කරටිය සිඳි තල් ගසක්මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්ත්වයට කරන ලදී. මහරජ, වේදනා සංඛ්‍යාවෙන් මිදුණාවූ තථාගතන් වහන්සේ සමුද්‍රය මෙන් ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ 'මරණින්මතු වේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද, නොවේයයිද කීමට නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි. නොවන්නේ නොවෙයි කියා කීමටද නුසුදුසුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහරජ, එසේම යම් සංඥාවක් කරණකොට ගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ සංඥාව තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳින ලදී. කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්ත්වයට කරන ලදී. මහරජ, සංඥා සංඛ්‍යාවෙන් මිදුණාවූ තථාගතයන් වහන්සේ සමුද්‍රය මෙන් ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද නොවේයයිද කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි. නොවන්නේ නෙවෙයි කියා කීමටද නුසුදුසුයි.

"මහරජ, එසේම යම් සංස්කාරයක් කරණකොට ගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ සංස්කාරය තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳින ලදී. කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරන ලදී. අභාවයට යවන ලදී. මතු නූපදින තත්වයට කරන ලදී. මහරජ, සංස්කාර සංඛ්‍යාවෙන් මිදුනාවූ තථාගතයන් වහන්සේ සමුද්‍රය මෙන් ගැඹුරුය, අප්‍රමාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ 'මරණින් මතු වේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද නොවේයයිද කීමට නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි. නොවන්නේ නොවෙයි කියා කීමටද, නුසුදුසුය.

"මහරජ, එසේම යම් විඤ්ඤාණයක් කරණකොට ගෙන තථාගතයන් වහන්සේ සත්වයකු වශයෙන් පෙනේද, ඒ විඤ්ඤාණය තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදී. මුල් සිඳින ලදී. කරටිය සිඳිනලද තල් ගක් මෙන් කරනලදී. මතු නූපදින තත්ත්වයට කරන ලදී. මහරජ, විඤ්ඤාණ සංඛ්‍යාවෙන් මිදුණාවූ තථාගතයන් වහන්සේ සමුද්‍රය මෙන් ගැඹුරුය, අප්‍රාණය, දැනගැනීමට අපහසුය. ඒ හෙයින් තථාගතයන් වහන්සේ

මරණින් මතු වේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවේයයි කීමටද නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයිද නොවේයයිද කීමට නුසුදුසුය. තථාගතයන් වහන්සේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවෙයි කීමටද නුසුදුසුයි."

9. "ස්වාමීනි, ආශ්චර්යයය ස්වාමීනි, අද්භූතය යම් හෙයකින් ශාස්තෘන් වහන්සේගේද, ශ්‍රාවිකාවගේද දෙශනාවෙහි අර්ථයෙන් අර්ථයද, ව්‍යංජනයෙන් ව්‍යංජනයද, වචනයෙන් වචනයද, සංසන්දනය වෙයි. සමවෙයි. ස්වාමීනි, මම එක් අවස්ථාවක ඛෙමා භික්ෂුණිය කරා පැමිණ මේ කරුණ ප්‍රශ්න කෙළෙමි. මට ඒ ආර්යාතොමෝද භාග්‍යවතුන් වහන්සේ යම්සේද, මේ පදයන්ගෙන් මේ ව්‍යංජනයන්ගෙන් මේ කාරණය ප්‍රකාශ කළාය. ස්වාමීනි, ආශ්චර්යයි. ස්වාමීනි, අද්භූතයි. ශාස්තෘන් වහන්සේගේද, ශ්‍රාවිකාවන්ගේද දෙශනාවෙහි අර්ථයෙන් අර්ථයද ව්‍යංජනයෙන් ව්‍යංජනයද, වචනයෙන් වචනයද සංසන්දනය වන්නේය. සමවන්නේය.

10. "ස්වාමීනි, දැන් අපි යන්නෙමු. අපි බොහෝ වැඩ ඇත්තෝවෙමු. බොහෝ කටයුතු ඇත්තෝ වෙමුයි" කීය. "මහරජ, දැන් ඔබ ඊට කාලය දනුවයි" වදාළසේක. ඉක්බිති පසෙනදී කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගරුකොට ගියේය.

---

## 2. අනුරාධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ සිටින සේක. එකල්හි වනාහි ආයුෂ්මත් අනුරාධ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට නුදුරුවූ වනකුටියක වාසය කරයි. ඉක්බිති බොහෝ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ ස්ථවිරයන් වහන්සේ යම්තැනකද එතැනට

පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් අනුරාධ ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූවාහුය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක හුන්නාහුය. එක්පසෙක හුන් ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ගෙන් ඇවැත් අනුරාධයෙනි, උත්තම පුරුෂවූ පරම පුරුෂවූ ශ්‍රේෂ්ඨ පැමිණීමට පැමිණියාවූ යම් ඒ තථාගත කෙනෙක් වේද, ඔහු තථාගතතෙමේ මරණින් මතු වේයයි කියා හෝ තථාගත තෙමේ මරණින් මතු නොවේයයි කියා හෝ තථාගත තෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියා හෝ තථාගත තෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවෙයි කියා හෝ මේ සතර කාරණයන්හි පණවන්නාහුදැයි” ඇසූහ.

2. “ඇවැත්නි, යම් ඒ උත්තම පුරුෂවූ ශ්‍රේෂ්ඨ පුරුෂවූ ශ්‍රේෂ්ඨ පැමිණීමට පැමිණියාවූ යම් ඒ තථාගත කෙනෙක් වේද ඔහු තථාගතයන් වහන්සේ මරණින් මතු වේයයි කියා හෝ තථාගත තෙමේ මරණින් මතු නොවෙයි කියා හෝ තථාගත තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියා හේ තථාගත තෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවෙයි කියා හේ මේ කරුණු සතරින් වෙන්වම පණවන්නාහුයයි” ආයුෂ්මත් අනුරාධ ස්ථවිරතෙම කීහ.

3. මෙසේ කීකල්හි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට මේ භික්ෂුව නවකයෙක් වන්නේය. පැවිදිවී වැඩිකල් නැත්තේය. තෙරකෙනෙක් වේවා බාලයෙක, අව්‍යක්තයෙකැයි” කීවාහුය. එකල්හි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට අලුත් වාදයෙන්ද බාලවාදයෙන්ද අවමන් කොට හුනස්නෙන් නැඟිට ගියාහුය.

4. ඉක්බිති ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන් ගිය නොබෝ වේලාවකින් ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට මෙසේ සිත්විය. “ඉදින් ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මගෙන් මත්තෙහි අසන්නාහු නම් කෙසේ ප්‍රකාශ කළ කල්හි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට භාග්‍යවතුන් වහන්සේ වදාරණ ලද්දක් කියන්නේ වෙම්ද, භාග්‍යවතුන් වහන්සේ බොරුවෙන් චොදනා

නොකෙරෙම්ද, ධර්මයට අනුකූල ධර්මයක් ප්‍රකාශ කරන්නෙම්ද කිසියම් කරුණු සහිත වාදාරොපණයක් ගැරහිය යුතු බවට නොපැමිණෙන්නේදැයි’ මේ සිතවිය.

4. ඉක්බිති ආයුෂ්මත් අනුරාධ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන් ආයුෂ්මත් අනුරාධ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන් ‘ස්වාමීනි, මෙහි මම භාග්‍යවතුන් වහන්සේට නුදුරු ආරණ්‍ය කුටියෙහි වාසය කරමි. ස්වාමීනි, එකල්හි බොහෝ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ මා යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, මා සමග සතුටු වූවාහුය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක්පසෙක සිටියාහුය.

“ස්වාමීනි, එක්පසෙක සිටි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ මට ‘ඇවැත් අනුරාධය, උතුම් පුරුෂවූ ශ්‍රෙෂ්ඨ පුරුෂවූ උතුම් බවට පැමිණියාවූ යම් තථාගත කෙනෙක් වේද, ඔහු තථාගත තෙමේ මරණින් මතුවෙයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු නොවෙයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු වන්නේය කියා හෝ නොවන්නේය කියා හෝ තථාගතතෙමේ මරණින් මතු නොවෙයි. නොවන්නේද නොවෙයි කියා හෝ තථාගතයන් වහන්සේ පණවන්නාහුදැයි” ඇසූහ.

“ස්වාමීනි, මෙසේ අසන ලද මම ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට ඇවැත්නි, උත්තම පුරුෂවූ ශ්‍රෙෂ්ඨ පුරුෂවූ උතුම් තැනට පැමිණියාවූ යම් ඒ තථාගත කෙනෙක් වේද, ඔහු තථාගතතෙමේ මරණින් මතුවෙයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු නොවෙයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු වන්නේය කියා හෝ නොවෙයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු නොවෙයි. නොවන්නේද නොවෙයි කියා හෝ මේ සතර කාරණයන් තථාගතයන් වහන්සේ නොපණවත් යයි කීයෙමි.

“ස්වාමීනි, මෙසේ කීකල්හි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ‘මේ භික්ෂුව නවකයෙක් වන්නේය. පැවිදිවූ නොබෝකල් ඇත්තේය.

තෙර කෙනෙක් හෝ වේවා, බාලයෙක අව්‍යක්තයෙකැයි' කීවාහුය. ස්වාමීනි, ඉක්බිති ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ මට නවක වාදයෙන්ද, බාලවාදයෙන්ද අගෞරව කොට හුනස්නෙන් නැගිට ගියාහුය.

"ස්වාමීනි, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් ගිය නොබෝ වේලාවකින් මට 'ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ඉදින් මගෙන් මත්තෙහි ප්‍රශ්න විචාරන්නාහු නම් ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට කෙසේ ප්‍රකාශ කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නෙම් වෙම්ද, භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චොදනා නොකරන්නෙම්ද, ධර්මයට අනුකූල ධර්මයක් ප්‍රකාශකරන්නෙම්ද, කිසියම් කරුණු සහිත වාදයක් ගැරහිය යුතු බවට නොපැමිණෙන්නේදැයි' මෙසේ සිත්විය.

**5.** "අනුරාධය, ඒ කුමකැයි හඟින්නෙහිද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද පෙරලෙන සුළුද, මේ මාගේය, මේ මම වෙමි. මේ මගේ ආත්මයයි. දැකීමට සුදුසුද?" - "ස්වාමීනි, නැත."

"වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද පෙරලෙනසුළුද, මේ මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මයයි. දැකීම සුදුසුද?" - "ස්වාමීනි, නැත."

"සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද පෙරලෙනසුළුද, මේ මාගේය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මේ මම වෙමි, මේ මාගේ ආත්මයයි. දැකීම සුදුසුද?" - "ස්වාමීනි, නැත."

"සංස්කාර නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍යනම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරලෙනසුළුද, මේ මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මයයි දැකීම සුදුසුද?" - "ස්වාමීනි, නැත."

"විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" - "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුකද, සැපද?" - "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරලෙනසුළුද, මේ මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි. දැකීම සුදුසුද?" - " ස්වාමීනි, නැත."

**6.** "අනුරාධය, එසේ නම් මෙහි අතීතවූද, අනාගත වූද, වර්තමානවූද අධ්‍යාත්මවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ආසන්නවූ හෝ යම්කිසි රූපයක් වේද, ඒ සියළු රූපය මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේ. මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුත්තාහ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ආසන්නවූ හෝ යම්කිසි වේදනාවක් වේද, ඒ සියළු වේදනාව මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේ. මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දතයුත්තාහ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ආසන්නවූ හෝ යම්කිසි සංඥාවක් වේද, ඒ

සියළු සංඥාව මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේ මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුත්තාහ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ දුරවූ හෝ ආසන්නවූ හෝ යම්කිසි සංස්කාරයක් වේද, ඒ සියළු සංස්කාර මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේ. මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුත්තාහ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සියම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ යම්කිසි විඤ්ඤාණයක් වේද, ඒ විඤ්ඤාණය මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේයයි තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුයි.

7. "අනුරාධය, මෙසේ දක්නාවූ ආර්යශ්‍රාවකතෙම රූපයෙහිද, කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි නොඇලීමෙන් මිදෙයි. මිදුන කල්හි මිදුනේය යන ඥානය වේ. ඉපදීම ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මින්මතු අනික් භවයක් නැතැයි දනී.

8. "අනුරාධ, ඒ කුමකැයි හඟින්නෙහිද? රූපය තථාගත තෙමේයයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"වේදනාව තථාගත තෙමේයයි දක්නෙහිද?" - "නැත. ස්වාමීනි."

"සංඥාව තථාගත තෙමේයයි දක්නෙහිද?" - නැත, ස්වාමීනි."

"සංස්කාර තථාගත තෙමේයයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"විඤ්ඤාණය තථාගතතෙමේයයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

**9.** "අනුරාධය, ඒ කුමකැයි හඟින්නෙහිද? තථාගත තෙමේ රූපයෙහි ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"තථාගත තෙමේ රූපයෙන් පිට ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"තථාගතතෙමේ වේදනාවෙහි ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"තථාගතතෙමේ වේදනාවෙන් පිට ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"තථාගතතෙමේ සංඥාවෙහි ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි'

"තථාගතතෙමේ සංඥාවෙන් පිට ඇතැයි දක්නෙහිද?" - නැත, ස්වාමීනි."

"තථාගතතෙමේ සංස්කාරයන්හි ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"තථාගතතෙමේ සංස්කාරයෙන් පිට ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"තථාගතතෙමේ විඤ්ඤාණයෙහි ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"තථාගත තෙමේ විඤ්ඤාණයෙන් පිට ඇතැයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

**10.** "අනුරාධය, ඒ කුමකැයි හඟින්නේද? රූපය, වේදනාව, සංඥාව, සංස්කාරය, විඤ්ඤාණය, තථාගත තෙමේ යයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"අනුරාධය. ඒ කුමකැයි හඟින්නෙහිද? රූපය නොවන වේදනාව නොවන, සංඥාව නොවන, සංස්කාරයන් නොවන,

විඤ්ඤාණය නොවන, යමෙක් තථාගත තෙමේයයි දක්නෙහිද?" - "නැත, ස්වාමීනි."

"අනුරාධය, තොප විසින් මේ ආත්මයෙහි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් තථාගතයකු නොලබන කල්හි ඇවැත්නි, උත්තම පුරුෂවූ ශ්‍රෙෂ්ඨ පුරුෂවූ උතුම් බවට පැමිණියාවූ යම් ඒ තථාගත කෙනෙක් වේද, ඔහු තථාගතතෙමේ මරණින් මතු වේයයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු නොවේ යයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියා හෝ තථාගතතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවෙයි කියා හෝ මේ සතර කාරණයන්හි තථාගතයන් වහන්සේ පණවත් කියා ප්‍රකාශ කරන්ට සුදුසුද?" - "නැත, ස්වාමීනි."

11. "අනුරාධය, යහපත. අනුරාධය, මම මීට පෙරද දැන්ද දුකද පණවමි. දුකෙහි නිරෝධයන්ද පණවමියි' වදාළේය.

---

## 3. උපගත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේද බරණැස මිගදාය නම් ඉසිපතනයෙහි වාසය කරත්.

එකල්හි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් වේලාවෙහි විවේකයෙන් නැගීසිටියේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් සමග සතුටුවූහ. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්හ. එක්පසෙක හුන් ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරතෙම ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට, "කිමෙක්ද ඇවැත් ශාරිපුත්‍රය සත්වතෙමේ මරණින් මතුවේද?"

"ඇවැත්නි, සත්වයා මරණින් මතුවේයයි යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේද?"

"ඇවැත්නි, සත්ව තෙමේ මරණින් මතු නොවේය යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"ඇවැත්නි, කිමෙක්ද, සත්වතෙමේ මරණින් මතු වන්නේත් නොවන්නේත් වේද?"

"ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු වන්නේත් වෙයි. නොවන්නේත් වෙයි යන මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේද නොවන්නේත් නොවේද?"

"ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු නොවේ නොවන්නේද නොවේ යන මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වේදැයි මෙසේ විචාරණ ලද්දේ, සත්වතෙමේ මරණින් මතු වේය යන මෙය තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි කීයෙහිය.

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේ දැයි මෙසේ විචාරණ ලද්දේද, සත්වතෙමේ මරණින් මතු නොවේය යන මෙය තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි කීයෙහිය.

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වන්නේත් නොවන්නේත් නොවේදැයි මෙසේ විචාරණ ලද්දේද, සත්වතෙමේ මරණින් මතු වන්නේත් වෙයි. නොවන්නේත් වෙයි යන මෙය තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි කීයෙහිය.

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේද, නොවන්නේත් නොවේයයි මෙසේ විචාරණ ලද්දේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සත්වතෙමේ මරණින් මතු නොවෙයිද නොවන්නේත් නොවේයයි යන මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි’ කීයෙහිය.

“ඇවැත්නි, යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවදාරණ ලද්දේ නම් ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?”

**2.** “ඇවැත්නි සත්වතෙමේ මරණින් මතු වේය යන මෙය රූප මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවේ යන මෙයද රූප මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි යන මෙයද රූප මාත්‍රයකි. සත්ව තෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේත් නොවෙයි යන මෙයද රූප මාත්‍රයකි.

“ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු වේය යන මෙය වේදනා මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවේයයි යන මෙයද වේදනා මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි යන මෙයද වේදනා මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේත් නොවෙයි. යන මෙයද වේදනා මාත්‍රයකි.

“ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු වේය යන මෙය සංඥා මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවේය යන මෙයද සංඥා මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි යන මෙයද සංඥා මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවෙයි යන මෙයද සංඥා මාත්‍රයකි.

“ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු වෙයි යන මෙය සංස්කාර මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි යන මෙයද සංස්කාර මාත්‍රයකි. සත්වතෙම මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි යන මෙයද සංස්කාර මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවෙයි යන මෙයද සංස්කාර මාත්‍රයකි.

"ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු වෙයි යන මෙය විඤ්ඤාණ මාත්‍රයකි. සත්වතෙම මරණින් මතු නොවෙයි යන මෙයද විඤ්ඤාණ මාත්‍රයකි සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි යන මෙයද විඤ්ඤාණ මාත්‍රයකි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේත් නොවෙයි යන මෙයද විඤ්ඤාණ මාත්‍රයකි.

"ඇවැත්නි, යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවදාරණ ලද්දේද, ඊට හේතු මේය. ඊට ප්‍රත්‍යය මේය."

---

## 4. සමුදය සූත්‍රය.

(මෙහි පළමුවෙනි ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ පළමුවෙනි ඡේදය මෙනි.)

2. "ඇවැත්නි, රූපය තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට රූපයට හේතුව තත්වූ පරිද්දෙන් නොදන්නා හට නොදක්නාහට රූප නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට රූප නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සත්වතෙමේ මරණින් මතුවේයයිද, සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතේ. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි. කියාද සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවේයයිද සිතෙයි.

2. "ඇවැත්නි, වේදනාව තත්වූ පරිද්දෙන් නොදන්නා හට නොදක්නාහට වේදනා හෙතුව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට වේදනා නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට වේදනා නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සත්වතෙමේ මරණින් මතුවේයයිද සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවේයයිද සිතෙයි.

"ඇවැත්නි, සංඥාව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සංඥා හෙතුව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සංඥා නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නා හට නොදක්නාහට සංඥා නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයි සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවේයයිද සිතෙයි.

"ඇවැත්නි, සංස්කාරය තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සංස්කාරයට හේතුව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සංස්කාර නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සංස්කාර නිරෝධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සත්වතෙම මරණින් මතු වේයයිද සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද සිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවේයයිද සිතෙයි.

"ඇවැත්නි, විඤ්ඤාණ තත්වූපරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට විඤ්ඤාණයට හෙතුව තත්වූපරිද්දෙන්

නොදන්නා හට නොදක්නාහට විඤ්ඤාණ නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට විඤ්ඤාණ නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේදවෙයි, නොවන්නේද වේයයි සිතයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේත් නොවේයයිද සිතෙයි.

3. "ඇවැත්නි, රූපය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට රූපයට හේතුව තත්වූ පරිදි දන්නාහට දක්නාහට රූප නිරොධය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට රූප නිරුද්ධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයි නොසිතේ. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියා නොසිතෙයි. සත්ව තෙමේ මරණින්මතු නොවෙයි නොවන්නේත් නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, වේදනාව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට වේදනාව තත්වූ පරිදි දන්නාහට දක්නාහට වේදනා නිරොධය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට වේදනා නිරුද්ධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයි නොසිතේ.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේදවෙයි නොවන්නේදවෙයි කියා නොසිතෙයි.

"සත්වතෙමේ මරණින්මතු නොවෙයි. නොවන්නේත් නොවේයයිද නොසිතයි.

"ඇවැත්නි, සංඥාව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සංඥාවට හේතුව තත්වූ පරිදි දන්නාහට දක්නාහට සංඥා නිරොධය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සංඥා

නිරුද්ධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයි නොසිතේ.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතයි. සත්ව තෙමේ මරණින්මතු වන්නේදවෙයි නොවන්නේදවෙයි කියාද නොසිතයි. සත්වතෙමේ මරණින්මතු නොවදියි නොවන්නේද වේයයි නොසිතෙයි.

"ඇවැත්නි, සංස්කාරය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සංස්කාරයට හේතුව තත්වූ පරිදි දන්නාහට දක්නාහට සංස්කාර නිරොධය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සංස්කාර නිරුද්ධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයි නොසිතේ.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතයි, සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියා නොසිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේත් නොවේයයිද නොසිතෙයි.

"විඥ්ඥාණය තත්වූ පරිද්දෙන් දක්නාහට විඥ්ඥාණයට හෙතුව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට විඥ්ඥාණ නිරොධය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට විඥ්ඥාණ නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වයා මරණින් මතු වේයයි නොසිතයි. සත්ව තෙමේ මරණින් මතු නොවේයයි නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වේයයිද නො සිතෙයි සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවේයයිද නොසිතයි. ඇවැත්නි, යම් කාරණයකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරණ ලද්දේද මේ ඊට හේතුවයි. මේ ප්‍රත්‍යයයි."

## 5. පේම සූත්‍රය

(මෙහි පළමුවෙනි ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ පළමුවෙනි ඡේදය මෙනි.)

**2.** "ඇවැත්නි, රූපයෙහි පහනොවූ රාගය ඇති, පහ නොවූ කැමැත්ත ඇති, පහනොවූ ආශාව ඇති, පහනොවූ පිපාසය ඇති, පහනොවූ දාහය ඇති, පහනොවූ තණ්හාව ඇති පුද්ගලයාට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද සිතෙයි.

"ඇවැත්නි, වේදනාවෙහි පහනොවූ රාගය ඇති, පහ නොවූ කැමැත්ත ඇති, පහනොවූ ආශාව ඇති, පහනොවූ පිපාසය ඇති, පහනොවූ දාහය ඇති, පහනොවූ තණ්හාව ඇති පුද්ගලයාට සත්වතෙමේ මරණින්මතු වේයයිද සිතෙයි.

"සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද සිතෙයි.

"ඇවැත්නි, සංඥාවෙහි පහනොවූ රාගය ඇති, පහනොවූ කැමැත්ත ඇති, පහනොවූ ආශාව ඇති, පහනොවූ පිපාසය ඇති, පහනොවූ දාහය ඇති, පහනොවූ තණ්හාව ඇති පුද්ගලයාට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි.

"සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද සිතෙයි.

"ඇවැත්නි, සංස්කාරයන්හි පහනොවූ රාගය ඇති පහනොවූ කැමැත්ත ඇති, පහනොවූ ආශාව ඇති පහනොවූ පිපාසය ඇති, පහනොවූ දාහය ඇති, පහනොවූ තණ්හාව ඇති පුද්ගලයාට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද සිතෙයි.

"ඇවැත්නි, විඤ්ඤාණයෙහි පහනොවූ රාගය ඇති, පහ නොවූ කැමැත්ත ඇති පහනොවූ ප්‍රේමය ඇති, පහනොවූ පිපාසය ඇති, පහනොවූ දාහය ඇති, පහනොවූ තෘෂ්ණාව ඇති පුද්ගලයාහට සත්වයා මරණින් මතු වේයයි සිතේ.

"සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද සිතෙයි.

3. "ඇවැත්නි, රූපයෙහි පහවූ ආශා ඇති, පහවූ කැමැත්ත ඇති, පහවූ ප්‍රේමය ඇති, පහවූ පිපාසය ඇති, පහවූ දාහය ඇති, පහවූ තෘෂ්ණාව ඇති පුද්ගලයාට සත්ව තෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි.

"සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, වේදනාවෙහි පහවූ ආශා ඇති, පහවූ කැමැත්ත ඇති පහවූ ප්‍රේමය ඇති, පහවූ පිපාසය ඇති, පහවූ දාහය ඇති, පහවූ තෘෂ්ණාව ඇති, පුද්ගලයාට සත්ව තෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි.

"සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, සංඥාවෙහි පහවූ ආශා ඇති, පහවූ කැමැත්ත ඇති, පහවූ ප්‍රේමය ඇති, පහවූ පිපාසය ඇති, පහවූ දාහය

ඇති, පහවූ තෘෂ්ණාව ඇති පුද්ගලයාට සත්ව තෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, සංස්කාරයන්හි පහවූ ආශාව ඇති, පහවූ කැමැත්ත ඇති, පහවූ ප්‍රේමය ඇති, පහවූ පිපාසය ඇති, පහවූ දාහය ඇති, පහවූ තෘෂ්ණාව ඇති පුද්ගලයාට සත්ව තෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි.

"සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"විඤ්ඤාණයෙහි පහවූ රාග ඇති, පහවූ කැමැත්ත ඇති, පහවූ ප්‍රේමය ඇති, පහවූ පිපාසය ඇති, පහවූ දාහය ඇති, පහවූ තෘෂ්ණාව ඇති පුද්ගලයාට සත්වතෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි.

සත්වතෙමේ මරණින් මතු නොවේයයිද, නොසිතේ. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතේ.

"සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවේයයි නොසිතෙයි. ඇවැත්නි යම් කරුණකින් තථාගතයන් වහන්සේ විසින් මෙය නොවදාරණ ලද්දේද, මේ ඊට හේතුවයි මේ ඊට ප්‍රත්‍යයයි."

---

## 6. ආරාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා කොට්ඨිත

ස්ථවිරයන් වහන්සේද බරණැස මිගදාය නම් ඉසිපතනයෙහි වාසය කරත්.

එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් වේලාවෙහි විවේකයෙන් නැගීසිටියේ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් සමග සතුටුවූහ. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්හ. එක්පසෙක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරුන්ට මෙසේ කීයෙහිය. "කිමෙක්ද ඇවැත් කොට්ඨිතය, සත්වතෙමේ මරණින් මතු වේද?"

"ඇවැත්නි, සත්වයා මරණින් මතුවේයයි යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේද?"

"ඇවැත්නි, සත්ව තෙමේ මරණින් මතු නොවේය යන මෙයද භාග්‍යවතුන්වහන්සේ විසින් නොවදාරණ ලදී."

"ඇවැත්නි, කිමෙක්ද, සත්වතෙමේ මරණින් මතු වන්නේත් නොවන්නේත් වේද?"

"ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු වන්නේත් වෙයි. නොවන්නේත් වෙයි යන මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලදී"

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේද නොවන්නේත් නොවේද?"

"ඇවැත්නි, සත්වතෙමේ මරණින් මතු නොවේ නොවන්නේද නොවේ යන මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වේදැයි මෙසේ විචාරණ ලද්දේද, සත්වතෙමේ මරණින් මතු වේය යන

මෙය තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි කීයෙහිය.

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේ දැයි මෙසේ විචාරණ ලද්දේද, සත්වතෙමේ මරණින් මතු නොවේය යන මෙය තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි කීයෙහිය.

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වන්නේත් නොවන්නේත් නොවේදැයි මෙසේ විචාරණ ලද්දේද, සත්වතෙමේ මරණින් මතු වන්නේත් වෙයි, නොවන්නේත් වෙයි යන මෙය තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි කීයෙහිය.

"ඇවැත්නි, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේද, නොවන්නේත් නොවේයයි මෙසේ විචාරණ ලද්දේද, සත්වතෙමේ මරණින් මතු නොවෙයිද නොවන්නේත් නොවේයයි යන මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි' කීයෙහිය.

"ඇවැත්නි, යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවදාරණ ලද්දේ නම් ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?"

**2.** "ඇවැත්නි, රූපයට කැමතිවූ රූපයට ඇලුණාවූ රූපයට සතුටුවූ රූප නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාවූ නොදක්නාවූ පුද්ගලයාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වේයයි සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේත් නොවේ යයිද සිතෙයි.

"ඇවැත්නි, වේදනාවට කැමතිවූ වේදනාවට ඇලුණාවූ වේදනාවට සතුටුවූ වේදනා නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාවූ නොදක්නාවූ පුද්ගලයාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද

සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වේයයි සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේත් නොවේ යයිද සිතෙයි.

"ඇවැත්නි, සංඥාවට කැමතිවූ සංඥාවට ඇලුණාවූ සංඥාවට සතුටුවූ සංඥා නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාවූ නොදක්නාවූ පුද්ගලයාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වේයයි සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේත් නොවේ යයිද සිතෙයි.

"ඇවැත්නි, සංස්කාරයෙහි කැමතිවූ සංස්කාරයට ඇලුණාවූ සංස්කාරයට සතුටුවූ සංස්කාර නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාවූ නොදක්නාවූ පුද්ගලයාහට සත්ව තෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වෙයි නොවන්නේද වේයයි සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේත් නොවේ යයිද සිතෙයි.

"ඇවැත්නි, විඤ්ඤාණයට කැමතිවූ විඤ්ඤාණයට ඇලුනාවූ විඤ්ඤාණයෙහි සතුටුවූ විඤ්ඤාණ නිරොධය තත්වූ පරිද්දෙන් නොදන්නාවූ නොදක්නාවූ සත්ව තෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්වතෙම මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු නොවේයයි සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේද නොවේයයි සිතෙයි.

3. "ඇවැත්නි, "රූපයට කැමති නොවූ රූපයට නොඇලුණාවූ රූපයට සතුටුනොවූ රූප නිරොධය තත්වූපරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වයා මරණින් මතු වේයයි නොසිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද

නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, වේදනාවට කැමති නොවූ වේදනාවට නොඇලුනාවූ වේදනාවට සතුටුනොවූ වේදනා නිරොධය තත්වූපරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වයා මරණින් මතු වේයයි නොසිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, සංඥාවට කැමති නොවූ සංඥාවට නොඇලුනාවූ සංඥාවට සතුටුනොවූ සංඥා නිරොධය තත්වූපරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වයා මරණින්මතු වේයයි නොසිතෙයි

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, සංස්කාරයට කැමති නොවූ සංස්කාරයට නොඇලුනාවූ සංස්කාරයට සතුටු නොවූ සංස්කාර නිරොධය තත්වූපරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වයා මරණින් මතු වේයයි නොසිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, විඤ්ඤාණයට කැමති නොවූ විඤ්ඤාණයට නොඇලුනාවූ විඤ්ඤාණයට සතුටුනොවූ විඤ්ඤාණ නිරොධය තත්වූපරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වයා මරණින් මතු වේයයි නොසිතෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේදවෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේ නොවේයයිද නොසිතෙයි.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් කරුණකින් මෙය නොවදාරණ ලද්දේද මේ ඊට හේතුවයි මේ ඊට ප්‍රත්‍යයි"

**4.** "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් එය යම් කරුණකින් නොවදාරණ ලද්දේනම් ඊට අනිකුත් ක්‍රමයක් ඇත්තේද?" - "ඇවැත්නි, ඇත්තේය."

"ඇවැත්නි, භවයට කැමතිවූ භවයට ඇලුණාවූ භවයට සතුටුවූ තත්වූපරිද්දෙන් භවනිරොධය නොදන්නාහට නොදක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතේ.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්ව තෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද සිතෙයි.

**5.** "ඇවැත්නි, භවයට කැමති නොවූ භවයට නොඇලුණාවූ භවයට සතුටු නොවූ තත්වූ පරිද්දෙන් භව නිරොධය දන්නාහට දක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි.

"සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේදවෙයි, නොවන්නේදවෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවේයයි නොසිතෙයි.

"ඇවැත්නි, යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරණලද්දේ නම් මේද ඊට එක් ක්‍රමයකි.

**6.** "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් එය යම් කරුණකින් නොවදාරණ ලද්දේ නම් ඊට අනිකුත් ක්‍රමයක් ඇත්තේද?" - "ඇවැත්නි, ඇත්තේය."

"ඇවැත්නි, උපාදානයට කැමතිවූ උපාදානයට ඇලුණාවූ උපාදානයට සතුටුවූ තත්වූ පරිද්දෙන් උපාදාන නිරොධය නොදන්නාහට නොදක්නාහට සත්වතෙමේ මරණින් මතුවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේ නොවෙයි කියාද සිතෙයි."

7. "ඇවැත්නි, උපාදානයට කැමති නොවූ උපාදානයට නොඇලුණාවූ උපාදානයට සතුටු නොවූ තත්වූ පරිද්දෙන් උපාදාන නිරොධය දන්නාහට දක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින්මතු නොවෙයි, නොවන්නේ නොවෙයිද කියා නොසිතෙයි. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් කරුණකින් එය නොවදාරණ ලද්දේනම් මේද ඊට (එක්) ක්‍රමයකි.

8. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් එය නොවදාරණ ලද්දේ නම් ඊට අනිකුත් කාරණයක් ඇත්තේද?" - "ඇවැත්නි, ඇත."

"ඇවැත්නි, තණ්හාවට කැමතිවූ තෘෂ්ණාවට ඇලුණාවූ තණ්හාවට සතුටුවූ තෘෂ්ණා නිරෝධය තත්වූ පරිද්දෙන් නොදන්නාහට නොදක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේයයිද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද සිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේ නොවේයයිද සිතෙයි.

9. "ඇවැත්නි, තණ්හාවට කැමති නොවූ තණ්හාවට නොඇලුණාවූ තණ්හාවට සතුටු නොවූ තෘෂ්ණා නිරෝධය තත්වූ පරිද්දෙන් දන්නාහට දක්නාහට සත්වතෙමේ මරණින් මතු වේයයිද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවේ යයිද

නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද නොසිතෙයි. සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේ නොවෙයියයිද නොසිතෙයි. ඇවැත්නි, යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය නොවදාරණ ලද්දේ නම් ඇවැත්නි, මේද ඊට (එක්) ක්‍රමයකි.

**10.** "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් එය යම් කාරණයකින් නොවදාරණ ලද්දේ නම් ඊට අනික් ක්‍රමයක් ඇත්තේද?" ඇවැත් ශාරිපුත්‍රය, මෙහිලා මීට වැඩියෙන් තවත් කුමක් කැමැත්තෙහිද? ඇවැත් ශාරීපුත්‍රය, තෘෂ්ණා සංඛ්‍යාවෙන් මිදුනහුට සත්වයායයි පැනවීමට වෘත්තයක් නැත."

---

## 7. ආයතන සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරුන්ට, "පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, ලෝකය ශාස්වතද?"

**2.** "වච්ඡගොත්තය, ලොකයශාස්වතය යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලදැයි" කීයේය.

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, කිමෙක්ද? ලෝකය අශාස්වතද?"

"වච්ඡගොත්තය, ලෝකය අශාස්වාතය යන මෙයද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, ලෝකය කෙළවරක් ඇත්තේද?"

"වච්ඡගොත්තය, ලෝකය කෙළවරක් ඇත්තේය යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, කිමෙක්ද? ලෝකය කෙළවරක් නැත්තේද?"

"වච්ඡය, ලෝකය කෙළවරක් නැත්තේයයි මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, කිමෙක්ද? එය ජීවයද, එයම ශරීරයද?"

"වච්ඡය, එය ජීවය එයම ශරීරය යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"පින්වත් මොග්ගල්ලානය, කිමෙක්ද? ජීවය අනිකක්ද? ශරීරය අනිකක්ද?"

"වච්ඡය, ජීවය අනිකක්ය, ශරීරය අනිකක්ය යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

3. "පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වේද?"

"වච්ඡය, සත්වතෙමේ මරණින් මතු වේය යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන්වහන්ස, කිමෙක්ද? සත්වතෙම මරණින් මතු නොවේද?"

"වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවේය යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන්වහන්ස, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වේද, නොවේද?"

"වච්ඡය, සත්වතෙමේ මරණින් මතු වේද, නොවේද යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන්වහන්ස, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේද, නොවන්නේත් නොවේද?

"වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවේද, නොවන්නේත් නොවේද යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි" කීය.

4. "පින්වත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, යම් කාරණයකින් මෙසේ අසන ලද්දාවූ අන්‍යතීර්ථකයන්ගේ ලෝකය ශාස්වතයයි හෝ ලෝකය අශාස්වතයයි හෝ ලෝකය අන්තයක් ඇත්තේයයි හෝ ලෝකය අන්තයක් නැත්තේයයි හෝ එය ජීවය එයම ශරීරයයි හෝ අනිකක් ජීවය අනිකක් ශරීරයයි හෝ සත්වයා මරණින් මතු වේයයි හෝ සත්වයා මරණින් මතු නොවේයයි හෝ සත්වයා මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියා හෝ සත්වයා මරණින් මතු නොවේ, නොවන්නේ නොවේයයි කියා හෝ මෙසේ ප්‍රකාශ කිරීමක් ඇත්තේද, ඊට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද?"

"පින්වත් මොග්ගල්ලාන ස්ථවිරය, මෙසේ අසන ලද්දාවූ ශ්‍රමණ ගෞතමයන්ගේ ලෝකය ශාස්වතයයි කියාද, ලෝකය අශාස්වතයයි කියාද, ලෝකය අන්තයක් ඇත්තේයයි කියාද ලෝකය අන්තයක් නැත්තේයයි කියාද, එය ජීවය එය ශරීරයයි කියාද, අනිකක් ජීවය අනිකක් ශරීරය කියාද, සත්වතෙමේ මරණින් මතු වේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද සත්වතෙමේ මරණින් මතු නොවේ නොවන්නේ නොවේයයි කියාද මෙසේ ප්‍රකාශ කිරීමක් නැත්තේද? ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?"

5. "වච්ඡය, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ වනාහි ඇස මේ මගේය, මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි දකිත්.

"කන මේ මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි දකිත්.

"නාසය මේ මගේය මේ මම වෙමි මේ මාගේ ආත්මයයි දකිත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"දිව මේ මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිත්.

"කය මේ මගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි දකිත්.

"සිත මේ මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිත්.

"එසේ හෙයින් මෙසේ අසනලද අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ ලෝකය ශාස්වතය කියාද, ලෝකය අශාස්වතයයි කියාද, ලොකය අන්තයක් ඇත්තේයයි කියාද, ලෝකය අන්තයක් නැත්තේයයි කියාද, එය ජීවය එය ශරීරයයි කියාද, අනිකක් ජීවය, අනිකක් ශරීරයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි, නොවන්නේද වෙයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවේ. නොවන්නේද නොවේයයි කියාද ප්‍රකාශ කෙරෙත්.

**6.** "වච්ඡය, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ඇස මේ මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේයයි දකිත්.

"කන මේ මගේ නොවේ මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේ යයි දකිත්.

"නාසය මේ මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේයයි දකිත්.

"දිව මේ මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේයයි දකිත්.

"කය මේ මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේයයි දකිත්.

"සිත මේ මගේ නොවේ. මේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේයයි දකිත්.

"එසේ හෙයින් මෙසේ අසන ලද තථාගතයන් වහන්සේගේ සත්වතෙම ලෝකය ශාස්වතයයි කියාද, ලෝකය අශාස්වතයයි කියාද, ලෝකය අන්තයක් ඇත්තේයයි කියාද, ලෝකය අන්තයක් නැත්තේයයි කියාද, එය ජීවය, එය ශරීරයයි කියාද, අනිකක් ජීවය, අනිකක් ශරීරයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවේ. නොවන්නේද නොවේයයි කියාද ප්‍රකාශ නොකෙරෙත්.

7. ඉක්බිති වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙකහුන් වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? ලෝකය ශාස්වතද?"

8. "වච්ඡය, ලෝකය ශාස්වතය යන මෙය මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"භවත් ගෞතමන් වහන්ස, කිමෙක්ද, ලෝකය අශාස්වතද?" - "වච්ඡය, ලෝකය අශාස්වතය යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, ලෝකයේ අන්තයක් ඇත්තේද?" - "වච්ඡය, ලෝකයේ අන්තයක් ඇත්තේය යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරනලදී."

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, ලෝකයේ අන්තයක් නැත්තේද?" - "වච්ඡය, ලෝකයේ අන්තයක් නැත්තේය යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, එය ජීවය වූයේ එයම ශරීරය වේද?" - "වච්ඡය, එය ජීවය වූයේ, එයම ශරීරය වේ යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, ජීවය අනිකක් වූයේ, ශරීරය අනිකක් වේද?" - "වච්ඡය, ජීවය අනිකක් වූයේ, ශරීරය අනිකක් වේ යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, සත්වතෙමේ මරණින් මතු වේද?" - "වච්ඡය, සත්වතෙමේ මරණින් මතු වේ යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරනලදී."

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, සත්වතෙමේ මරණින් මතු නොවේද?" - "වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවේ යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"භවත් ගෞතමයන් වහන්ස, සත්වතෙමේ මරණින් මතු වන්නේත් නොවන්නේත් වේද?" - "වච්ඡය, සත්වතෙමේ වන්නේත් නොවන්නේත් වේ යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

"භවත් ගෞතමයන් වහන්ස, සත්වතෙමේ මරණින් මතු නොවෙයි. නොවන්නේත් නොවේද?" - "වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවෙයි. නොවන්නේත් නොවෙයි යන මෙයද මා විසින් ප්‍රකාශ නොකරන ලදී."

**9.** "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ අසනලද අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ගේ ලොකය ශාස්වතයයි හෝ ලෝකය අශාස්වතයයි කියාද, ලොකය අන්තයක් ඇත්තේයයිද, ලොකය අන්තයක් නැත්තේයයිද, එය ජීවය එයම ශරීරය යයි කියාද, ජීවය අනිකකි ශරීරය අනිකකියි කියාද, සත්ව තෙමේ මරණින් මතු වේයයිද, සත්වතෙමේ මරණින්මතු නොවේයයිද සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවන්නේද වෙයි නොවන්නේත් නොවෙයි කියාද, මෙසේ ප්‍රකාශ කිරීමක් ඇද්ද, ඊට හේතුව කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?

"මෙසේ අසනලද්දාවූ භවත් ගෞතමයන්ගේ ලොකය ශාස්වතයයිද, ලොකය අශාස්වතයයි කියාද, ලොකය අන්තයක් ඇත්තේයයිද, ලොකය අන්තයක් නැත්තේ යයිද, එය ජීවය

එයම ශරීරයයි කියාද, ජීවය අනිකකි ශරීරය අනිකයි කියාද, සත්වතෙමේ මරණින් මතු වේයයිද, සත්වතෙමේ මරණින් මතු නොවේයයිද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවෙයි. නොවන්නේත් නොවෙයි කියාද, මෙසේ ප්‍රකාශ නොකිරීමක් ඇත්ද, ඊට හෙතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?"

**10.** "වච්ඡය, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ඇස මෙය මගේය මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිත්.

"කන මෙය මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිත්.

"නාසය මෙය මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිත්.

"දිව මෙය මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිත්.

"කය මෙය මගේය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිත්.

"සිත මේ මමය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි. දකිත්.

"එසේ හෙයින් මෙසේ අසනලද අන්‍ය තීර්ථකයන්ගේ ලෝකය ශාස්වතයයි හෝ ලොකය අශාස්වතයයි කියාද, ලොකය අන්තයක් ඇත්තේයයිද, ලොකය අන්තයක් නැත්තේයයිද, එය ජීවය එයම ශරීරයයි කියාද ජීවය අනිකකි ශරීරය අනිකකියි කියාද, සත්වතෙමේ මරණින් මතු වේයයිද, සත්වතෙමේ මරණින් මතු නොවේයයිද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවෙයි, නොවන්නේත් නොවෙයි කියාද මෙසේ ප්‍රකාශ කිරීමවේ.

**11.** "වච්ඡය, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙමේ ඇස මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේයි දකියි.

"කන මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේයයි දකියි.

"නාසය මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේයයි දකියි.

"දිව මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේයයි දකියි.

"කය මෙය මගේ නොවේ. මේ මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේයයි දකියි.

"සිත මෙය මගේ නොවේ මේ මම නොවෙමි මෙය මගේ ආත්මය නොවේයයි දකියි.

"එහෙයින් මෙසේ අසනලද තථාගතයන්ගේ ලොකය ශාස්වතයයි කියාද, ලොකය අශාස්වතයයි කියාද ලොකය අන්තයක් ඇත්තේයයිද, ලොකය අන්තයක් නැත්තේයයිද, එය ජීවය එයම ශරීරයයි කියාද, ජීවය අනිකකි ශරීරය අනිකකියි කියාද, සත්වතෙමේ මරණින් මතු වේයයිද, සත්ව තෙමේ මරණින් මතු නොවේයයිද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේත් නොවෙයි කියාද මෙසේ ප්‍රකාශ කිරීමක් නැත.

12. "භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්යයි. භවත් ගෞතමයන් වහන්ස අද්භූතයි. මේ ධර්මපදයෙහි ශාස්තෲහුගේද, ශ්‍රාවකයාගේද, අර්ථයෙන් අර්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය වචනයෙන් වචනය සංසන්දනය වන්නේය. සමවන්නේය. වෙනස් නොවන්නේය. භවත් ගෞතමයන් වහන්ස, දැන් මම මොග්ගල්ලාන ශ්‍රමණයන් කරා පැමිණ මේ අර්ථය ඇසුවෙමි.

"භවත් ගෞතමතෙමේ යම්සේද එමෙන් ශ්‍රමණ මොග්ගල්ලාන තෙමේද මේ පදයන්ගෙන් මේ ව්‍යඤ්ජනයන්ගෙන් මේ අර්ථය ප්‍රකාශ කළේය.

"භවත් ගෞතමයන්වහන්ස, ආශ්චර්යයි. භවත් ගෞතමයන් වහන්ස, අද්භූතයි. යම් ධර්ම පදයෙක්හි ශාස්තෲහුගේද,

ශ්‍රාවකයාගේද, අර්ථයෙන් අර්ථය ව්‍යංජනයෙන් ව්‍යංජනය වචනයෙන් වචනය සංසන්දනය වන්නේය, සමවන්නේය, වෙනස් නොවන්නේයයි" කීය.

---

## 8. ඛන්ධ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු විය යුතු සිහිකටයුතු කථාවකොට නිමවා එක්පසෙක හුන්නේය. වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේගෙන්, "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? ලෝකය ශාස්වතදැයි" ඇසීය.

2,3. (මේ ඡේද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 8,9 වෙනි ඡේද මෙනි.)

4. "වච්ඡය, අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ රූපය ආත්මයයි දකිත්. රූපය ඇතියහු ආත්මයයි කියා හෝ දකිත්. ආත්මය කෙරෙහි රූපය ඇතැයි කියා හෝ දකිත්. රූපයෙහි ආත්මය ඇතැයි කියා හෝ දකිත්.

"වේදනාව ආත්මයයි දකිත්. වේදනාව ඇතියහු ආත්මයයි කියා හෝ දකිත්. ආත්මය කෙරෙහි වේදනාව ඇතැයි කියා හෝ දකිත්. වේදනාවෙහි ආත්මය ඇතැයි කියා හෝ දකිත්.

"සංඥාව ආත්මයයි දකිත්. සංඥාව ඇතියහු ආත්මයයි කියා හෝ දකිත්. ආත්මය කෙරෙහි සංඥාව ඇතැයි කියා හෝ දකිත්. සංඥාවෙහි ආත්මය ඇතැයි කියා හෝ දකිත්.

"සංස්කාරය ආත්මයයි දකිත්. සංස්කාරය ඇතියහු ආත්මයයි කියා හෝ දකිත්. ආත්මය කෙරෙහි සංස්කාරය ඇතැයි කියා හෝ දකිත්. සංස්කාරයෙහි ආත්මය ඇතැයි කියා හෝ දකිත්.

"විඤ්ඤාණය ආත්මයයි දකිත් විඤ්ඤාණය ඇතියහු ආත්මයයි කියා හෝ දකිත්. ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇතැයි කියා හෝ දකිත්. විඤ්ඤාණයෙහි ආත්මය ඇතැයි කියා හෝ දකිත්.

**5.** "එසේහෙයින් මෙසේ විචාරණලද අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ලෝකය ශාස්වතය කියාද ලොකය අශාස්වතයයි කියාද ලොකය අන්තයක් ඇත්තේයයි කියාද, ලොකය අන්තයක් නැත්තේයයි කියාද, එය ජීවය එයම ශරීරයයි කියාද, අනිකක් ජීවය අනිකක් ශරීරයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවේ නොවන්නේද නොවේයයි කියාද, මෙසේ ප්‍රකාශ කිරීම වෙයි.

**6.** "අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ රූපය ආත්මය වශයෙන් නොදකිත්. රූපය ඇත්තහු ආත්මයයි හෝ නොදකිත්. ආත්මය කෙරෙහි රූපය ඇතැයි හෝ නොදකිත්. රූපයෙහි ආත්මය ඇතැයි හෝ නොදකිත්.

"වේදනාව ආත්මය වශයෙන් නොදකිත් වේදනාව ඇත්තහු ආත්මයයි හෝ නොදකිත්. ආත්මය කෙරෙහි වේදනාව ඇතැයි හෝ නොදකිත්. වෙදනාවෙහි ආත්මය ඇතැයි හෝ නොදකිත්.

"සංඥාව ආත්මය වශයෙන් නොදකිත්. සංඥාව ඇත්තහු ආත්මයයි හෝ නොදකිත්. ආත්මය කෙරෙහි සංඥාව ඇතැයි හෝ නොදකිත්. සංඥාවෙහි ආත්මය ඇතැයි හෝ නොදකිත්.

"සංස්කාරය ආත්මය වශයෙන් නොදකිත්. සංස්කාරය ඇත්තහු ආත්මයයි හෝ නොදකිත්. ආත්මය කෙරෙහි සංස්කාරය ඇතැයි හෝ නොදකිත්. සංස්කාරයෙහි ආත්මය ඇතැයි හෝ නොදකිත්.

"විඤ්ඤාණය ආත්මවශයෙන් හෝ නොදකිත්. විඤ්ඤාණ ඇත්තහු ආත්මය වශනේ හෝ නොදකිත්. ආත්මයෙහි

විඤ්ඤාණය ඇතැයි හෝ නොදකිත්. විඤ්ඤාණයෙහි ආත්මය ඇතැයි හෝ නොදකිත්.

7. "එසේ හෙයින් මෙසේ අසන ලද තථාගතයන් වහන්සේගේ ලොකය ශාස්වතයයි කියාද, ලොකය අශාස්වතයයි කියාද, ලොකය අන්තයක් ඇත්තේයයි කියාද, ලොකය අන්තයක් නැත්තේයයි කියාද, එය ශරීරය එයම ජීවයයි කියාද, ජීවය අනිකකි ශරීරය අනිකකැයි කියාද, සත්ව තෙමේ මරණින් මතු වේයයි කියාද, සත්ව තෙමේ මරණින් මතු නොවේයයි කියාද, සත්වතෙමේ මරණින් මතු වන්නේද වෙයි නොවන්නේද වෙයි කියාද, සත්වතෙමේ මරණින් මතු නොවෙයි නොවන්නේද නොවෙයි කියාද මෙසේ ප්‍රකාශ නොකිරීම වේයයි" කීය.

8. ඉක්බිති වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම අසුනෙන් නැගිට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහාමුගලන් ස්ථවිරයන් සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහි කටයුතු කථාවකොට නිමවා එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්ගෙන් "පින්වත් මොග්ගල්ලායනයෙනි ලොකය ශාස්වතදැයි ඇසීය.

9, 10. (මේ ඡෙද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 2, 3 ඡෙදය මෙනි.)

11, 12, 13, 14, (මේ ඡෙද මේ සූත්‍රයේ 4, 5, 6, 7 ඡෙද මෙන් වේ.)

15. "පින්වත් මොග්ගල්ලානයෙනි, ආශ්චර්යය. පින්වත් මොග්ගල්ලානයෙනි, අද්භූතය. යම් කරුණෙක්හි ශාස්තෲහුගේද ශ්‍රාවකයාගේද යම් මේ ධර්මපදයෙහි අර්ථයෙන් අර්ථය, ව්‍යංජනයෙන් ව්‍යංජනය සැසඳෙයි සමවෙයි. වෙන් නොවෙයි. පින්වත් මොග්ගල්ලානයෙනි, දැන් මම ශ්‍රමණ ගෞතමයන් කරා පැමිණ මේ කාරණය විචාළෙමි. මට පින්වත් මොග්ගල්ලාන තෙමේ යම්සේද එමෙන් ශ්‍රමණ ගෞතම තෙමේද මේ පදයන්ගෙන් මේ ව්‍යංජනයන්ගෙන් මේ කාරණය ප්‍රකාශ

කෙළේය. පින්වත් මොග්ගල්ලානය, ආශ්චර්යයයි. පින්වත් මොග්ගල්ලානය, අද්භූතයි යම් මේ ධර්ම පදයෙක්හි ශාස්තෲහුගේද, ශ්‍රාවකයාගේද අර්ථයෙන් අර්ථය ව්‍යංජනයෙන් ව්‍යංජනය වචනයෙන් වචනය සැසඳෙන්නේය. සමවන්නේය. වෙන් නොවන්නේය"යි කීය.

---

## 9. කුතුහලසාලා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, පසුගිය දවස්වල කුතුහල* ශාලාවෙහි හුන්නාවූ රැස්වූ බොහෝවූ නොයෙක් තීර්ථක ශ්‍රමණ බ්‍රාහ්මණ පරිබ්‍රාජකයන් අතර මේ අතුරු කථාව ඇති විය. 'මේ පූර්ණ කාශ්‍යපතෙම සමූහයක් ඇත්තෙකි. ගණයා ඇත්තෙකි. පිරිසක ආචාර්යයෙකි. ප්‍රසිද්ධය. යසස ඇත්තේය. තීර්ථයක් මෙනි. බොහෝදෙනා විසින් යහපතැයි සම්මතය. හෙතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කළුරිය කළ ශ්‍රාවකයකු උපන් ස්ථාන ප්‍රකාශ කරන්නේය. උතුම් පුරුෂවූ ශ්‍රේෂ්ඨ පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ ඔහුගේ ශ්‍රාවකයෙක් වේද, ඒ ශ්‍රාවක තෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කාලක්‍රියා කළාවූ ශ්‍රාවකයෙකු උපන් ස්ථානය ප්‍රකාශ කෙරෙයි.

---

* නොයෙක් දෙනා එක්වී, අසන්නන්ගේ කුහුල ඇවිස්සෙන කථා උපද්දන ශාලාවකි. (අම්බලමකි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. මේ මක්ඛලිගොසාලද සමූහයක් ඇත්තෙකි. ගණයා ඇත්තෙකි. පිරිසක ආචාර්යයෙකි. ප්‍රසිද්ධය. යසස ඇත්තේය. තීර්ථයක් මෙනි බොහෝදෙනා විසින් යහපතැයි සම්මතය. හෙතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කළුරිය කළ ශ්‍රාවකයකු උපන් ස්ථාන ප්‍රකාශ කරන්නේය. උතුම් පුරුෂවූ ශ්‍රෙෂ්ඨ පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ ඔහුගේ ශ්‍රාවකයෙක් වේද, ඒ ශ්‍රාවකතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කාලක්‍රියා කළාවූ ශ්‍රාවකයෙකු උපන් ස්ථානය ප්‍රකාශය කෙරෙයි.

3. "මේ නිගණ්ඨනාතපුත්‍රද සමූහයක් ඇත්තෙකි. ගණයා ඇත්තෙකි. පිරිසක ආචාර්යයෙකි. ප්‍රසිද්ධය, යසස ඇත්තේය. තීර්ථයක් මෙනි. බොහෝදෙනා විසින් යහපතැයි සම්මතය. හෙතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කළුරිය කළ ශ්‍රාවකයකු උපන් ස්ථාන ප්‍රකාශ කරන්නේය. උතුම් පුරුෂවූ ශ්‍රෙෂ්ඨ පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ ඔහුගේ ශ්‍රාවකයෙක් වේද ඒ ශ්‍රාවක තෙමේද අසවලා අසවල්තැන උපන්නේය අසවලා අසවල්තැන උපන්නේයයි අතීතවූ කාලක්‍රියා කළාවූ ශ්‍රාවකයෙකු උපන් ස්ථානය ප්‍රකාශ කෙරෙයි."

4. "මේ සඤ්ජය බෙල්ලට්ඨි පුත්‍රද සමූහයක් ඇත්තෙකි. ගණයා ඇත්තෙකි. පිරිසක ආචාර්යයෙකි. ප්‍රසිද්ධය. යසස ඇත්තේය. තීර්ථයක් මෙනි. බොහෝදෙනා විසින් යහපතැයි සම්මතය. හෙතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කළුරිය කළ ශ්‍රාවකයකු උපන් ස්ථාන ප්‍රකාශ කරන්නේය. උතුම් පුරුෂවූ ශ්‍රෙෂ්ඨ පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ ඔහුගේ ශ්‍රාවකයෙක් වේද, ඒ ශ්‍රාවක තෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල්තැන උපන්නේයයි අතීතවූ කාලක්‍රියා කළාවූ ශ්‍රාවකයෙකු උපන් ස්ථානය ප්‍රකාශ කෙරෙයි."

5. "මේ පකුධකච්චායනද සමූහයක් ඇත්තෙකි. ගණයා ඇත්තෙකි පිරිසක ආචාර්යයෙකි. ප්‍රසිද්ධය. යසස ඇත්තේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තීර්ථයක් මෙනි. බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතය. හෙතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කළුරිය කළ ශ්‍රාවකයකු උපන් ස්ථාන ප්‍රකාශ කරන්නේය. උතුම් පුරුෂවූ ශ්‍රෙෂ්ඨ පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ ඔහුගේ ශ්‍රාවකයෙක් වේද ඒ ශ්‍රාවකතෙමේද අසවලා අසවල්තැන උපන්නේය. අසවලා අසවල්තැන උපන්නේයයි අතීතවූ කාලක්‍රියා කළාවූ ශ්‍රාවකයෙකු උපන් ස්ථානය ප්‍රකාශ කෙරෙයි.”

**6.** “මේ අජිතකෙසකම්බලීද සමූහයක් ඇත්තෙකි ගණයා ඇත්තේය. සමූහයකට ආචාර්යය. ප්‍රසිද්ධය. යසස් ඇත්තේය. තීර්ථයක් මෙනි. බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතය. හෙතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල් තැන උපන්නේයයි අතීතවූ කළුරිය කළ ශ්‍රාවකයෙකු උපන් ස්ථානය ප්‍රකාශ කරයි. උත්තම පුරුෂවූ පරම පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ ඔහුගේ යම් ශ්‍රාවකයෙක් වේද, ඒ ශ්‍රාවකතෙමේද අසවලා අසවල්තැන උපන්නේය. අසවලා අසවල්තැන උපන්නේයයි අතීතවූ කාලක්‍රියා කළාවූ ශ්‍රාවකයෙකු උපන් ස්ථානය ප්‍රකාශ කරයි.

**7.** “මේ ශ්‍රමණ ගෞතම තෙමේද සමූහයක් ඇත්තෙකි. ගණයක් ඇත්තෙකි. ගණාචාර්යය. ප්‍රසිද්ධය. යසස් ඇත්තේය. තීර්ථවරය. බොහෝදෙනා විසින් යහපතැයි සම්මතය. හෙතෙමේද කළුරිය කළ ඉකුත් ශ්‍රාවකයකු අසවලා අසවල් අසවල් තැන උපන්නේය, අසවලා අසවල් තැන උපන්නේ යයි උපන් තැන ප්‍රකාශ කරයි. උතුම් පුරුෂවූ පරම පුරුෂවූ උතුම් පැමිණීමට පැමිණියාවූ උන්වහන්සේගේ යම් ශ්‍රාවකයෙක් වේද, ඒ ශ්‍රාවකතෙමේද අසවලා අසවල් තැන උපන්නේය. අසවලා අසවල්තැන උපන්නේයයි අතීතවූ කාලක්‍රියා කළාවූ ශ්‍රාවකයෙකු උපන්තැන ප්‍රකාශ නොකරන්නේය. එතකුදුවුවත් ‘ඔහු තෘෂ්ණාව සින්දේය සංයොජනය පෙරලා දැම්මේය. මනාකොට මානය පහකිරීම් වශයෙන් අවබොධකොට දුක කෙළවර කෙළේයයි’ මෙසේ ප්‍රකාශ කරයි. පින්වත් ගෞතමයන් වහන්ස, ඒ මට

ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ධර්මය කෙසේ නම් දැනගන්නෙම්දැයි සැකයක් වූයේය. විචිකිච්ඡාවක් වූයේයයි” කීය.

8. “වච්ඡය, තොප විසින් සැක කිරීමට සුදුසුය. සැක ඉපදවීමට සුදුසුය. තොපට සැක කටයුතු තැන්හි සැක උපන්නීය. වච්ඡය, මම උපාදාන සහිත වූවහුට උත්පත්තිය පනවමි. උපාදානය නැත්තහුට නොපනවමි. වච්ඡය, යම්සේ ගින්න දර ඇති කල්හිම දැල්වෙයිද දර නැති කල්හි නොදැල්වේද, වච්ඡය, එසේම මම උපාදාන සහිතවූවහුට උත්පත්තිය පනවමි. උපාදාන රහිතවූවහුට නොපනවමි.” “භවත් ගෞතමයන්වහන්ස, යම් කාලයෙක්හි ගිනි සිළු වාතයෙන් ගෙනයනු ලැබ දුරටද යන්නේය. භවත් ගෞතමතෙමේ මේ ගින්නට කුමක් උපාදානයයි පනවන්නෙහිද?”

“වච්ඡය, යම් කාලයක ගිනිසිළු වාතයෙන් ගෙන යනු ලැබ දුරටද යන්නේද, මම ඒ ගින්නට වාතය උපාදානයයි කියමි. වච්ඡය, ඒ කාලයෙහි ඊට වාතය උපාදානය වේ.” “භවත් ගෞතමන් වහන්ස, යම් වේලාවක මේ කය බහා තබයිද (චුතිය පහළවෙයිද) සත්වයා ඒ චුතික්ෂණයෙහිම අනිත් කයකට පැමිණේද, භවත් ගෞතමතෙමේ මොහුට කිනම් උපාදානයක් පනවයිද?” “වච්ඡය, යම්කලෙක මේ ශරීරය බහා තබයිද, සත්වයා අනික් කයකට නොපැමිණේද, ඔහුට මම තණ්හාව උපාදානයයි කියමි. වච්ඡය, තණ්හාවෙන් යුත් පුද්ගලයාහට ඒ අවස්ථාවෙහි උපාදානය වේයයි” වදාළේය.

---

## 10. අත්ථත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. ඉක්බිති වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව

කොට නිමවා එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් මෙය ඇසීය.

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? ආත්මයක් ඇත්තේ දැයි" මෙසේ ඇසූ කල්හි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූහ. ඉක්බිති "භවත් ගෞතමයන් වහන්ස ආත්මයක් නැත්තේදැයි" ඇසීය. දෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූහ. ඉක්බිති වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම අසුනෙන් නැගිට ගියේය.

2. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වච්ඡගොත්ත පරිබ්‍රාජකයා ගිය නොබෝකලකින් භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, කිමෙක්ද? භාග්‍යවතුන් වහන්සේ වච්ඡගොත්ත පරිබ්‍රාජකයාට අසන ලද ප්‍රශ්නය ප්‍රකාශ නොකළසේක් දැයි" සැලකෙළේය.

"ආනන්දය, "වච්ඡගොත්ත පරිබ්‍රාජකයා විසින් ආත්මයක් ඇත්තේ දැයි' අසන ලද්දාවූ මම ආත්මය ඇත්තේයයි ප්‍රකාශ කරන්නෙම් නම්, ආනන්දය, යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ශාස්වතවාදීහු වෙත්ද, එය ඔවුන්ගේ ලබ්ධිය හා සමාන වන්නේය. ආනන්දය, ආත්මයක් නැද්දැයි අසන ලද්දාවූ මම වච්ඡගොත්ත පරිබ්‍රාජකයාට ආත්මය නැත්තේයයි ප්‍රකාශ කරන්නෙම් නම්, ආනන්දය, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් උච්ඡේදවාදීහු වෙත්ද, එය ඔවුන්ගේ ලබ්ධිය හා සමාන වන්නේය. ආනන්දය, ආත්මයක් ඇත්දැයි අසන ලද මම වච්ඡගොත්ත පරිබ්‍රාජකයාට ආත්මය ඇතැයි ප්‍රකාශ කරන්නෙම් නම් කිමෙක්ද? ආනන්දය, එය සියලු ධර්මයෝ අනාත්මයහ යන ඥානය ඉපදීම පිණිස එය සුදුසුවන්නේද?" - "නැත, ස්වාමීනි,"

"ආනන්දය, ආත්මය නැත්දැයි අසන ලද්දාවූ මම ආත්මයක් නැතැයි ප්‍රකාශ කරන්නේ නම්, ආනන්දය, මාගේ ආත්මය පෙර ඒකාන්තයෙන් වූයේය. එය දැන් නැත්තේයයි මුළාවූ වච්ඡගොත්ත පරිබ්‍රාජකයාගේ වැඩියත් මුළාව පිණිස පවත්නේය."

---

## 11. සභිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් සභියකච්චාන ස්ථවිරතෙමේ ඥාතිකයෙහිවූ ගිඤ්ජකාවසථයෙහි (උළුගෙයි) වසනසේක. එකල්හි වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් සභිය කච්චාන ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් සභිය කච්චාන ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටුවිය සිහි කළයුතු සතුටු විය යුතු කථාව කොට නිමවා එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් වච්ඡගොත්ත පරිබ්‍රාජකතෙම ආයුෂ්මත් සභියකච්චාන ස්ථවිරයන්ගෙන් "භවත් කච්චානය, කිමෙක්ද සත්වතෙමේ මරණින්මතු වේදැ?යි" ඇසීය.

"වච්ඡය, සත්වතෙමේ මරණින්මතු වේය යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරනලදී." "භවත් කච්චානය, සත්වතෙමේ මරණින් මතු නොවේද?" "වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවේය යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරනලදී."

"භවත් කච්චානය, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වන්නේත් වෙයි නොවන්නේත් වෙයිද?"

"වච්ඡය, සත්වතෙමේ මරණින් සතු මතු වන්නේත් වෙයි නොවන්නේත් වෙයි යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරනලදී."

"භවත් කච්චානය, සත්වතෙමේ මරණින් මතු නොවන්නේත් වෙයි නොවන්නේත් නොවෙයිද?"

"වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවන්නේත් වෙයි නොවන්නේත් නොවෙයි යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරණලදී."

2. "භවත් කච්චානය, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වේදැයි මෙසේ විචාරණ ලද්දේ 'වච්ඡය, සත්වතෙමේ මරණින්මතු වේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය ප්‍රකාශ නොකරණ ලද්දේයයි කීයේය. භවත් කච්චානය, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවේදැයි, මෙසේ විචාරණ ලද්දේද, 'වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවේයයි යන මෙයද

භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි’ කීයෙහිය. භවත් කච්චානය, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු වන්නේත් වෙයි නොවන්නේත් වේදැයි මෙසේ විචාරණ ලද්දේද, “වච්ඡය, සත්වතෙමේ මරණින් මතු වන්නේත් වෙයි නොවන්නේත් වෙයි යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි” කීයෙහිය.

“භවත් කච්චානය, කිමෙක්ද? සත්වතෙමේ මරණින් මතු නොවන්නේත් වෙයි නොවන්නේත් නොවේදැයි මෙසේ විචාරණ ලද්දේද “වච්ඡය, සත්වතෙමේ මරණින් මතු නොවන්නේත් වෙයි නොවන්නේත් නොවෙයි යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේයයි’ කීයෙහිය.

“භවත් කච්චානය, ශ්‍රමණ ගෞතමයන් විසින් යම් කරුණකින් එය ප්‍රකාශ නොකරන ලද නම් ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?”

3. “රූපයෙන් යුක්තයයි කියා හෝ රූපය නැත්තේ සංඥාව ඇත්තෙකැයි කියා හෝ රූප නැත්තෙකැයි කියා හෝ සංඥාව ඇත්තේත් නැත, සංඥාව නැත්තේත් නැත, කියා හෝ පැනවීමට යම් හේතුවක් වේද, යම් ප්‍රත්‍යයක් වේද, ඒ හේතුව සියලු ආකාරයෙන් සර්වප්‍රකාරයෙන් සියල්ල ඉතිරි නැතිව නිරුද්ධ වන්නේ නම් කිනම් හේතුවකින් රූප ඇත්තේයයි කියා හෝ රූප නැත්තේයයි කියා හෝ සංඥා ඇත්තේයයි කියා හෝ සංඥා නැත්තේයයි කියා හෝ සංඥා ඇත්තේත් නැත නැත්තේත් නැත කියා හෝ පණවන්නේද?” “භවත් කච්චානය, පැවිදිවී කොපමණ කල් ඇත්තේද?”

“ඇවැත්නි, වැඩි කල් නැත. තුන් වර්ෂයකි. ඇවැත්නි, යමෙකුගේ මෙපමණ කලකින් මෙපමණක් ප්‍රකාශ කිරීමද වැඩිය. දෙශනාවට සතුටුවූ කල්හි කවර කතාදැයි” කියා ගියේය.

**අබ්‍යාකත සංයුත්තය නිමි.**
**(සළායතන වර්ගය නිමි.)**

---

# 5. මහා වර්ගය.

## 1. අවිජ්ජා වර්ගය.

"නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස."

### 1. අවිජ්ජා පුබ්බංගම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, අවිද්‍යාව අහිරික අනොත්තප්පයන් සමග අකුසල ධර්මයන්ගේ උත්පත්තිය පිණිස (සමග ඉපදීම් වශයෙන් හෝ බලවත් හේතු වශයෙන් හෝ) පූර්වංගමවෙයි. මහණෙනි, අවිද්‍යාවෙන් යුක්ත අඥානයාට වැරදි දෘෂ්ටිය උපදී, වැරදි දෘෂ්ටියෙන් යුත් තැනැත්තාට මිත්‍යා සංකල්පය උපදී. මිථ්‍යා සංකල්පයෙන් යුක්තවූවහුට මිථ්‍යාවචනය උපදී මිථ්‍යා වචනයෙන් යුක්තවූවහුට මිථ්‍යා කර්මාන්තය උපදී. මිථ්‍යා කර්මාන්තයෙන් යුක්තවූවහුට මිථ්‍යා ආජීවය උපදී. මිථ්‍යා ආජීවයෙන් යුක්තවූවහුට මිථ්‍යා වායාමය උපදී. මිථ්‍යා වායාමයෙන් යුක්තවූවහුට මිථ්‍යා සතිය (සිහිය) උපදී. මිථ්‍යා සතියෙන් යුක්තවූවහුට මිථ්‍යා සමාධිය උපදී.

3. "මහණෙනි, විද්‍යාව වනාහි (කම්මස්සකතාඥානය) වනාහි හිරි ඔත්තප්ප (ලජ්ජා භය) යන් සමග කුසල ධර්මයන්ගේ උත්පත්තිය පිණිස (සහජාත උපනිශ්‍රය වශයෙන්) පූර්වංගම වෙයි. මහණෙනි, විද්‍යාසංඛ්‍යාත කම්මස්සකතා ඥානයෙන් යුක්ත නුවණැත්තාහට යහපත් දෘෂ්ටිය උපදී. සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූවහුට සම්‍යක් සංකල්පය උපදී. සම්‍යක් සංකල්පයෙන්

යුක්තවූවහුට සම්‍යක් වචනය උපදී. සම්‍යක් වචනයෙන් යුක්තවූවහුට සම්‍යක් කර්මාන්තය උපදී. සම්‍යක් කර්මාන්තයෙන් යුක්තවූවහුට සම්‍යක් ආජීවය උපදී. සම්‍යක් ආජීවයෙන් යුක්තවූවහුට සම්‍යක් ව්‍යායාමය උපදී. සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවහුට සම්‍යක් සතිය උපදී. සම්‍යක් සතියෙන් යුක්තවූවහුට සම්‍යක් සමාධිය උපදීයයි" වදාළසේක.

---

## 2. උපඩ්ඪ බ්‍රහ්මචරිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි නාගරක නම් ශාක්‍යයන්ගේ නියම්ගමෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

"ස්වාමීනි, යම් ඒ කල්‍යාණ මිත්‍රයන් ඇති බවය, කල්‍යාණ මිත්‍රයන් සහායකොට ඇති බවය, කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි සිත නැමී පවත්නා බවය යන මෙය මාර්ගබ්‍රහ්මචර්යාව ලැබීම පිණිස කොටසක් (බාගයක්) වෙයි" යනුයි. "ආනන්දය, එය එසේ නොවෙයි. ආනන්දය, එය එසේ නොවෙයි.

"ආනන්දය, යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇති බවක් වේද, කල්‍යාණ මිත්‍රයින් සහායකොට ඇති බවක්වේද, කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි සිත නැමී පවත්නා බවක් වේද, මුළු මාර්ග බ්‍රහ්මචර්යාවම එය නිසා පවත්නේය.

"ආනන්දය, කල්‍යාණ මිත්‍රයින් ඇති, කල්‍යාණ මිත්‍රයින් සහායකොට ඇති, කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුනු සිත් ඇති භික්ෂුවට ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය, ආර්ය අෂ්ටාංගික මාර්ගය බහුල වශයෙන් වඩන්නේයයි කැමති විය යුතුය. ආනන්දය, කල්‍යාණ මිත්‍රයින් ඇති කල්‍යාණ මිත්‍රයින් සහයකොට ඇති, කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුනු සිත් ඇති

භික්ෂුව කෙසේනම් ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩාද, ආර්ය අෂ්ටාංගික මාර්ගය බහුල වශයෙන් කෙරේද?

2. "ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුතෙම (තදංගවික්ඛම්භන සමුච්ඡේද පටිප්පස්සද්ධි නිස්සරණ) නම් පඤ්චවිධ විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, (පරිච්චාග පක්ඛන්දන) වශයෙන් දෙවැදෑරුම්වූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් සංකල්පය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරු කළ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුණු සම්‍යක් වචනය වඩයි. විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරු කළ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරුකළ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයි. විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් සතිය වඩයි. විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ කෙලෙස් ප්‍රහාණය පිණිස සම්‍යක් සමාධිය වඩයි.

3. "ආනන්දය, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයින් ඇත්තාවූ කල්‍යාණ මිත්‍රයින් සහායකොට ඇත්තාවූ කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුනු සිත් ඇත්තාවූ මහණතෙම ආර්යඅෂ්ටාංගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය බහුලකොට වඩයි. ආනන්දය, මේ සියලුම ආර්ය මාර්ගය කල්‍යාණ මිත්‍රයින් ඇතිබව නිසාම, කල්‍යාණමිත්‍ර සහායත්වය නිසාම, කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුනු සිත් ඇතිබව නිසාම, පවත්නාබව මේ ආකාරයෙන් දත යුතුය. ආනන්දය, කල්‍යාණ මිත්‍රවූ මා නිසා ඉපදීම ස්වභාවකොට ඇති සත්වයෝ ඉපදීමෙන් මිදෙති. ජරාව ස්වභාවකොට ඇති සත්වයෝ ජරාවෙන් මිදෙති. මරණය

ස්වභාව කොට සත්වයෝ මරණයෙන් මිදෙති. සෝක, වැළපීම්, දුක්, දොම්නස්, උපායාසයන් ස්වභාවකොට ඇති සත්වයෝ ඒ සෝක වැලපීම් දුක් දොම්නස්, උපායාසයන්ගෙන් මිදෙත්.

"ආනන්දය, සියලු ආර්ය මාර්ගයම යම් මේ කල්‍යාණ මිත්‍රයින් ඇති බව කල්‍යාණ මිත්‍රයින් සහායකොට ඇති බව කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුනු සිත් ඇති බව නිසාම පවත්නාබව මේ ක්‍රමයෙන් දතයුතුය."

## 3. කල්‍යාණ මිත්ත සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළේය.

"ස්වාමීනි, යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇතිබවක්වේද කල්‍යාණමිත්‍රයින් සහායකොට ඇති බවක් වේද, කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුනු සිත් ඇතිබවක් වේද එය මේ සියලු ආර්යමාර්ගය පිණිස පවත්නේය."

"සාදු! සාදු! ශාරිපුත්‍රය! ශාරිපුත්‍රය! යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇති බවක් වේද, කල්‍යාණ මිත්‍රයින් සහායකොට ඇතිබවක් වේද, කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුනු සිත් ඇති බවක් වේද, එය සියලු ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය පිණිස වෙයි.

"ශාරිපුත්‍රය, කල්‍යාණ මිත්‍රයින් ඇති කල්‍යාණ මිත්‍රයින් සහායකොට ඇති කල්‍යාණ මිත්‍රයින් කෙරෙහි නැමුණු සිත් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේයයි කැමති විය යුතුය.

(මේ සූත්‍රයේ 2, 3 වෙනි ඡේද මේ වර්ගයේ 2 වැනි සූත්‍රයේ 2, 3 වෙනි ඡේද මෙනි. ආමන්ත්‍රණ වචනය 'ආනන්ද' වෙනුවට 'ශාරිපුත්‍ර' විය යුතුයි.)

---

## 4. ජානුස්සොණිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක.

එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍රා සිවුරු ගෙන සැවැත් නුවර පිඬු පිණිස වැඩියහ.

2. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සුදු වෙළඹුන් (සතර) දෙනෙකුන් යෙදූ සියල්ල සුදුවූ රථයකින් සැවැත් නුවර යන්නාවූ ජානුස්සොණි බ්‍රාහ්මණයා දුටුවේය. (එකී රථයෙහි) සුදු අශ්වයෝ යොදන ලද්දාහු වෙත්. ආභරණද සුදුය. රථයද සුදුය. ඇතිරිළිද සුදුය. රැහැන්ද සුදුය. කෙවිටද සුදුය. (රථයෙහි නැංවූ) ඡත්‍රයද සුදුය. හිස් වෙළුමද සුදුය. (හැඳි) වස්ත්‍රද සුදුය. පාවහන්ද සුදුය. සුදු විජිනිපතින් පවන් සලයි. මිනිසුන් එය දැක 'පින්වත්නි, මෙය උතුම් යානයකි. පින්වත්නි, ඒකාන්තයෙන් උතුම් යානයක ස්වභාවය ඇත්තේයයි" කීහ.

එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස වැඩ පස්වරුවෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය.

3. "ස්වාමීනි, පෙරවරුවෙහි මම හැඳ පොරවා පාසිවුරු ගෙන සැවැත්නුවරට පිඬු පිණිස ගියෙමි. ස්වාමීනි, සුදු වෙළඹුන් (සතර) දෙනෙකුන් යෙදූ සියල්ල සුදු රථයකින් සැවැත් නුවර

යන්නාවූ ජානුස්සොණී බ්‍රාහ්මණයා මම දුටුවෙමි. (එම රථයෙහි) සුදු අශ්වයෝ යොදන ලද්දාහු වෙති. ආභරණද සුදුය රථයද සුදුය. ඇතිරිළිද සුදුය. රැහැන්ද සුදුය. කෙවිටද සුදුය. (රථයෙහි නැංවූ) ඡත්‍රයද සුදුය. සුදු විජිනිපත්වලින් පවන් සලයි. එය දුටු මිනිස්සු 'පින්වත්නි, ඒකාන්තයෙන් මේ උතුම් යානයකි. පින්වත්නි, ඒකාන්තයෙන් මෙය උතුම් යානයක ස්වභාවය ඇත්තේයයි' කීහ. ස්වාමීනි, මේ (ධර්මවිනය නම්) ශාසනයෙහි උතුම් යානයක් පනවන්ට හැක්කේද?

"ආනන්දයෙනි, හැකියයි," භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

4. "ආනන්දය, මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයටම උතුම් යයි කියාද ධර්මයානයයි කියාද නිරුත්තර සංග්‍රාම විජයයි කියාද නමකි.

"වඩන ලද බහුල කරනලද සම්‍යක් දෘෂ්ටිය රාගය දුරු කිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. දොසය දුරු කිරීම කෙළවරකොට ඇත්තේ වෙයි මොහය දුරුකිරීම කෙළවර කොට ඇත්තේ වෙයි.

"ආනන්දය, වඩනලද බහුල කරනලද සම්‍යක් සංකල්පය රාගය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. මොහය දුරු කිරීම කෙළවරකොට ඇත්තේ වෙයි.

"ආනන්දය, වඩනලද බහුල කරනලද සම්‍යක් වචනය රාගය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. ද්වෙෂය පහකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. මොහය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි.

"ආනන්දය, වඩනලද බහුල කරනලද සම්‍යක් කර්මාන්තය රාගය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. මොහය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි.

"ආනන්දය, වඩනලද බහුල කරනලද සම්‍යක් ආජීවය රාගය දුරු කිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. ද්වේෂය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. මොහය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි.

"ආනන්දය, වඩනලද බහුල කරනලද සම්‍යක් ව්‍යායාමය රාගය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. ද්වේෂය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. මොහය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි.

"ආනන්දය, වඩනලද බහුලකරනලද සම්‍යක් සතිය රාගය පහකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. ද්වේෂය පහකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. මොහය පහකිරීම කෙළවර කොට ඇත්තේ වෙයි.

"ආනන්දය, වඩනලද බහුලකරනලද සම්‍යක් සමාධිය රාගය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි, ද්වේෂය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි. මොහය දුරුකිරීම කෙළවරකොට ඇත්තේ වෙයි.

**5.** "ආනන්දය, යම් ආකාරයකින් මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට බ්‍රහ්මයාන යයි කියාද, ධර්මයානයයි කියාද, අනුත්තර සංග්‍රාම විජයයි කියාද කියන්නේ නම් ඒ මේ ආකාරයෙන් දතයුතුය."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. සුගතයන් වහන්සේ මෙසේ වදාරා නැවතද මෙසේ වදාළසේක.

'යම් ආර්යමාර්ග සංඛ්‍යාත යානහුගේ ශ්‍රද්ධාවද ප්‍රඥාවද යන ධර්ම දෙක වියගසෙහි යොදනලද ගවයන් දෙදෙනා වෙති. හිරි ඔතප් දෙක රථ හිස වෙයි. විදර්ශනා සිත රැහැණය. සිහිය රථය රක්නා සහ පදවන රියදුරු වෙයි. රථය ශීල නමැති අලංකාරයෙන් යුක්තය. ධ්‍යාන නමැති කඩඇණයෙන් යුක්තය. කායිකවීර්ය, චෛතසික වීර්ය යන රෝද දෙකින් යුක්තය. තත්‍රමජ්ඣත්තතා උපෙක්ෂාව වියදණ්ඩෙහි සම බව වෙයි. ඇතිරිල්ලය ආලොකය. මෛත්‍රී

කරුණාව ත්‍රිවිධ විවේකය යන ධර්ම පස රථයෙහි සිටින කුලපුත්‍රයාගේ ආයුධ පස වෙති. ඉවසීම යුද්ධ ඇඳුම් වෙයි. මේ යානය නිවනට අභිමුඛව ගමන් කරයි. තමන් තුළ පහළවූ මේ යානය අනුත්තර වෙයි. ශ්‍රේෂ්ඨ යානයක් වෙයි. (යමෙකුන්ට මේ යානය ඇත්තේද) ඒ පණ්ඩිතයෝ ඒකාන්තයෙන් කෙලෙසුන් ජය ගනිමින් ලොකයෙන් නික්ම යන්නාහ."

---

## 5. බ්‍රහ්මචරිය කිමත්ථීය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්හ. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළහ.

"ස්වාමීනි, මේ සැවැත්නුවර අන්‍ය තීර්ථක පරිබ්‍රාජිකයෝ අපගෙන් මෙසේ විචාරත්. 'ඇවැත්නි, කුමක් පිණිස ශ්‍රමණ භවත් ගෞතමයන් ළඟ බඹසර වෙසේද?' කියායි. "ස්වාමීනි, මෙසේ විචාළකල්හි අපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ උත්තර දෙමු. 'ඇවැත්නි, දුක අවබොධ කිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය.' කියායි කිම! ස්වාමීනි. මෙසේ විචාලකල්හි මෙසේ උත්තරදෙනු ලබන්නාවූ අපි භාග්‍යවතුන් වහන්සේ විසින් කියනලද්දක් කියන්නෝ වෙමුද, භාග්‍යවතුන්වහන්සේට බොරුවෙන් දොස් කියන්නෝ නොවෙමුද? ධර්මය අනුව කියන්නෝ වෙමුද? කිසියම් කරුණු සහිතවූ කීමක් නින්දාකටයුතු ස්වභාවයකට නොපැමිණෙන්නේද?"

2. "මහණෙනි, ඒකාන්තයෙන් මෙසේ විචාළ කල්හි මෙසේ උත්තර දෙනු ලබන්නාවූ තෙපි මා විසින් කියනලද්දක්

කියන්නෝද වන්නහුය. මාහට බොරුවෙන් දොස්කියන්නෝද නොවන්නහුය. ධර්මයට අනුව කියන්නෝද වන්නහුය. කරුණු සහිතවූ කිසියම් කීමක් නින්දා කටයුතු ස්වභාවයටද නොපැමිණෙන්නේය. මහණෙනි, දුක අවබොධකිරීම පිණිසම මා කෙරෙහි බඹසර වෙසේ. මහණෙනි, ඉදින් තොපගෙන් අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ 'ඇවැත්නි, මේ දුක දැනගැනීම පිණිස මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේද?" මෙසේ අසන්නාහු නම් මහණෙනි, මෙසේ අසනලද්දාවූ තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයනට මෙසේ කියව්. 'මේ දුක දැනගැනීම පිණිස මාර්ගයක් ඇත්තේය, ප්‍රතිපදාවක් ඇත්තේය' කියායි මහණෙනි, ඒ දුක දැනගැනීම පිණිස පවත්නාවූ මාර්ගය කවරේද, ප්‍රතිපදාව කවරේද? මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයයි. ඒ කවරහුද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සමාධිය'යි, මහණෙනි, මේ මාර්ගය මේ ප්‍රතිපදාව මේ දුක දැනගැනීම පිණිස වේයයි වදාළහ. මහණෙනි, මෙසේ අසනලද තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරව්යයි" වදාළසේක.

---

## 6. බ්‍රහ්මචරිය පඤ්හ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, බ්‍රහ්මචරියාව බ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ස්වාමීනි, බ්‍රහ්මචරියාව යනු කුමක්ද? බ්‍රහ්මචරියාවගේ කෙළවර කුමක්ද?"

2. "මහණ මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයම බ්‍රහ්මචරියාවයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය,

සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යනුයි. මහණ යම් රාගය ක්ෂයවීමක්, ද්වෙෂය ක්ෂයවීමක්, මෝහය ක්ෂයවීමක් වේද මෙය බ්‍රහ්මචරියාවේ කෙළවරයි.”

---

## 7. නිබ්බාණ ධාතු සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. “ස්වාමීනි, රාග විනය, ද්වේෂ විනය මෝහ විනය යනු කුමකට නමක්ද? “මහණ රාගවිනය, ද්වෙෂවිනය, මොහවිනය යන මෙය නිර්වාණ ධාතුවට නමකි ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම එයින් කියනු ලැබේ.”

2. “මෙසේ කී කල්හි ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. “ස්වාමීනි, අමෘතයයි අමෘතයයි කියයි. ස්වාමීනි, අමෘතය යනු කුමක්ද? අමෘතගාමී මාර්ගය කුමක්ද?” - “මහණ යම් ඒ රාගය ක්ෂය කිරීමක් වේද? ද්වෙෂය ක්ෂය කිරීමක් වේද මෝහය ක්ෂය කිරීමක් වේද? මෙය අමෘතයයි කියනු ලැබේ. මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයම අමෘතගාමී මාර්ගයයි. ඒ කවරේද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධියයි” වදාළසේක.

---

## 8. අට්ඨංග විභාග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවා

පිළිගන්වන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

“මහණෙනි, තොපට ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය දෙශනා කරන්නෙමි. බෙදා දක්වන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි.” ඒ භික්ෂූහු “එසේය. ස්වාමීනි’යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

**2.** භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. “මහණෙනි, ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය නම් කුමක්ද? ඒ මෙසේයි සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය සහ සම්‍යක් සමාධියයි.

**3.** “මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය කවරීද යත්, මහණෙනි යම් දුක දන්නාවූ ඥානයක් වේද, දුකට හෙතුව දන්නාවූ ඥානයක් වේද, දුක් නැතිකිරීම දන්නා ඥානයක් වේද දුක් නැති කිරීමට පැමිණෙන මාර්ගය දන්නා ඥානයක් වේද මහණෙනි මේ සම්‍යක් දෘෂ්ටියයි කියනු ලැබේ.

**4.** “මහණෙනි, සම්‍යක් සංකල්පය කුමක්ද? යම් නෛෂ්ක්‍රම්‍ය කල්පනාවක් වේද අව්‍යාපාද කල්පනාවක් වේද අවිහිංසා කල්පනාවක් වේද මහණෙනි මෙය සම්‍යක් සංකල්ප යයි කියනු ලැබේ.

**5.** “මහණෙනි, සම්‍යක් වචනය නම් කවරේද? මහණෙනි, යම් බොරුකීමෙන් වෙන්වීමක් වේද කේලාම් කීමෙන් වෙන් වීමක් වේද එරුස වචනයෙන් වෙන්වීමක් වේද හිස් වචන කීමෙන් වෙන්වීමක් වේද මහණෙනි, මෙය සම්‍යක් වචනයයි කියනු ලැබේ.

**6.** “මහණෙනි, සම්‍යක් කර්මාන්තය නම් කුමක්ද? මහණෙනි, යම් ප්‍රාණඝාතයෙන් වෙන්වීමක් වේද සොරකම්

කිරීමෙන් වෙන්වීමක් වේද අබ්‍රහ්මචරියාවෙන් වෙන්වීමක් වේද මහණෙනි, මෙය සම්‍යක් කර්මාන්තයයි කියනු ලැබේ.

7. "මහණෙනි, සම්‍යක් ආජීවය නම් කුමක්ද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවක තෙමේ වැරදි ජීවිකාවෙන් වෙන්ව යහපත් ජීවිකාවෙන් ජීවිකාව කෙරේද? මහණෙනි, මේ සම්‍යක් ආජීවයයි කියනු ලැබේ.

8. "මහණෙනි, සම්‍යක් ව්‍යායාමය නම් කුමක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වීර්‍ය කෙරෙයි වීර්‍ය පටන් ගනියි. සිත ඔසවයි, උත්සාහ කෙරෙයි, උපන්නාවූ ලාමක අකුසල ධර්මයන්ගේ නැතිකිරීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කෙරෙයි. වීර්‍ය කෙරෙයි වීර්‍ය පටන්ගනියි. සිත ඔසවයි උත්සාහ කෙරෙයි. නූපන් කුසල ධර්මයන්ගේ ඉපදවීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කෙරෙයි වීර්‍ය පටන් ගනියි. සිත ඔසවයි, උත්සාහ කෙරෙයි. උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස, සිහි නැතිනොවීම පිණිස, බොහෝ බව පිණිස, මහත් බව පිණිස, වැඩීම පිණිස, සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කරයි. වීර්‍ය පටන්ගනී. සිත ඔසවයි. උත්සාහ කරයි, මහණෙනි, මේ සම්‍යක් ව්‍යායාමයයි කියනු ලැබේ.

9. "මහණෙනි, සම්‍යක් සතිය කවරීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය ඇතිව ඥාණයෙන් යුක්තව සිහියෙන් යුක්තව කාය සංඛ්‍යාත ලොකයෙහි ලොභ ද්වෙෂයන් සන්සිඳුවා කයෙහි කය අනුව නැවත නැවත බලමින් වාසය කරයිද, කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්තව ඥාණයෙන් යුක්තව සිහියෙන් යුක්තව වේදනා සංඛ්‍යාත ලොකයෙහි ලොභ දොසයන් සන්සිඳුවා වෙදනාවන්හි වෙදනාව අනුව නැවත නැවත බලමින් වාසය කරයිද, කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්තව ඥාණයෙන් යුක්තව සිහියෙන් යුක්තව චිත්ත සංඛ්‍යාත ලොකයෙහි ලොභයද ද්වෙෂයද සන්සිඳුවන චිත්තයන්හි සිත නැවත නැවත බලමින් වාසය කරයිද, කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්තව ඥාණයෙන් යුක්තව සිහියෙන් යුක්තව ධර්ම සංඛ්‍යාත ලොකයෙහි ලොභ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දොසයන් සන්සිඳුවා ධර්මයන්හි ධර්මයන් අනුව නැවත නැවත බලමින් වාසය කරයිද, මහණෙනි, මේ සම්‍යක් සතියයි කියනු ලැබේ.

10. "මහණෙනි, සම්‍යක් සමාධිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම පඤ්චකාමයෙන් වෙන්වම අකුසලයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපය ඇති පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් තමා තුළ පැහැදීම කරන්නාවූ චිත්තයාගේ එකඟ බව වූ විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන්නාවූ ප්‍රීතිය හා සැපය ඇති දෙවන ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, ප්‍රීතියෙහිද නොඇල්මෙන් ධ්‍යාන උපෙක්ෂාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ නුවණ ඇත්තේ කයින් සුව විඳීද, යම් ධ්‍යානයක් උපෙක්ෂාවෙන් යුක්තව සිහියෙන් යුක්තව සැපවිහරණ ඇත්තේයයි ආර්යයෝ කියත්, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, සැප නැතිකිරීමෙන්ද දුක නැතිකිරීමෙන්ද ධ්‍යානය ලැබීමට පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරුකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ඛා සති දෙකින් පිරිසිදුවූ සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ සම්මා සමාධියයි කියනු ලැබේ යයි' වදාළෝය.

---

## 9. සූකොපම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්සේ වරදවා තබන ලද (උඩුකුරු නොකොට) හැල් වී නණ්ඩුවක් හෝ යව වී නණ්ඩුවක් හෝ අතින් හෝ පයින් හෝ මඩින්නේ අත හෝ පය හෝ සිඳින්නේය.

ලේ හෝ උපදවන්නේය යන මීට හෙතුවක් නැත. ඊට කාරණා කිම්ද? මහණෙනි, නණ්ඩුව වරදවා තබන ලද හෙයිනි. මහණෙනි, එමෙන්ම ඒ මහණතෙම එකාන්තයෙන් වරදවා තබන ලද දැකීම, වරදවා තබන ලද මාර්ග භාවනාව කරණකොට අවිද්‍යාව සිඳියි, විද්‍යාව උපදවන්නේය යන මීට හෙතු නැත්තේය. ඊට කාරණා කවරේද? දැකීම වරදවා තබන ලද හෙයිනි.

3. "මහණෙනි, යම්සේ මනාකොට තබන ලද හැල් වී නණ්ඩුවක් හෝ යව වී නණ්ඩුවක් හෝ අතින් හෝ පයින් හෝ මඩනා ලද්දේ අත හෝ පය හෝ නොසිඳියි. ලේ හෝ නො උපදවයි යන මීට හෙතු ඇත්තේය. ඊට කාරණා කවරේද? මහණෙනි, නණ්ඩුව මනාකොට තබන ලද බැවිනි. මහණෙනි, එමෙන්ම ඒ මහණතෙම ඒකාන්තයෙන් මනාකොට තබනලද දෘෂ්ටිය මනාකොට තබන ලද මාර්ග භාවනාව කරණ කොට අවිද්‍යාව සිඳියි. විද්‍යාව උපදවන්නේය. නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මීට හෙතු ඇත්තේය. ඊට කාරණා කවරේද? මහණෙනි, දෘෂ්ටිය මනාව තබන ලද හෙයිනි.

4. "මහණෙනි, මහණතෙම මනාකොට තබන ලද දෘෂ්ටියෙන් තබන ලද මාර්ග භාවනාවෙන් කෙසේ නම් අවිද්‍යාව බිඳීද? විද්‍යාව උපදවයිද? නිවන ප්‍රත්‍යක්ෂකෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරෝධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් දෘෂ්ටිය වඩයි.

5. විවෙකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් සංකල්පය වඩයි.

6. "විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් වචනය වඩයි.

7. "විවෙකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් කර්මාන්තය වඩයි.

8. "විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් ආජීවය වඩයි.

9. "විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් ව්‍යායාමය වඩයි.

10. "විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් සතිය වඩයි.

11. "විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරෝධය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනාවූ සම්‍යක් සමාධිය වඩයි.

12. "මහණෙනි, මෙසේ මේ මහණතෙම මනාකොට තබන ලද දෘෂ්ටිය මාර්ගය භාවනාව කරණකොට අවිද්‍යාව සිඳියි විද්‍යාව උපදවයි. නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේයයි" වදාළේය.

---

## 10. නන්දිය පරිබ්බාජක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි නන්දිය නම් පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ නන්දිය පරිබ්‍රාජතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "භවත් ගෞතමයන් වහන්ස, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ කෙතෙක් ධර්මයෝ නිවනට පැමිණෙන්නාහු පිහිටකොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙත්ද?"

"නන්දිය, වඩන ලද බහුල කරන ලද ධර්ම අටක් නිවනට පැමිණෙන්නාහු නිවන පිහිටකොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙත්. කවර නම් අටක්ද? එනම් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. නන්දිය, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ ධර්මයෝ අටදෙන නිවනට පැමිණෙන්නාහු නිවන පිහිටකොට ඇත්තාහු නිවන කෙළවරකොට ඇත්තාහු වෙත්.

3. "මෙසේ වදාළ කල්හි නන්දිය පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය 'යහපති, භවත් ගෞතමයන් වහන්ස යහපති, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු හෝ කෙරේද, සැඟවූවක් විවෘත හෝ කෙරේද, මංමුළාවූවෙකුට මාර්ගය හෝ කියයිද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් හෝ දරාද, එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් දේශනා කරන ලදී. ස්වාමීනි, ඒ මම අද පටන් දිවිහිමියෙන් භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණ යමි. භවත් ගෞතමයන් වහන්සේ මා උපාසකයෙකු කොට දරන සේක්වා" යනුයි.

---

## 2. විහාර වර්ගය.

### අඩ්ඪමාස පටිසල්ලාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදාළසේක.

2. "මහණෙනි, මම අඩ මසක් හුදකලාව විසීමට කැමැත්තෙමි. පිණ්ඩපාතය ගෙණෙන එක භික්ෂුවක් හැර කිසිවෙක් නොපැමිණිය යුතුය" යනුයි. "ස්වාමීනි, එසේයයි" ඒ

භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පිණ්ඩපාතය ගෙන යන එක භික්ෂුවක් හැර අන් කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ කරා නොපැමිණෙයි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ අඩමස ඇවෑමෙන් හුදකලා වාසයෙන් වෙන්වූයේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, ප්‍රථමාසම්බොධිය ඇති (බුදුවී එකුන් පනස් දින ඇතුළත) ඒ මම යම් ධර්මයක් මෙනෙහි කරමින් විසුයෙම්ද? ඒ ධර්මයන් අතුරෙන් වේදනා සංඛ්‍යාත එක්තරා ධර්මයක් සිහි කරමින් විසුවෙමි. ඒ මම මෙසේ දැනගතිමි. මිථ්‍යාදෘෂ්ටිය නිසා උපදින (කුසලා'කුසල විපාක වේදනාවද) දැනගතිමි. සම්‍යක් දෘෂ්ටිය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැන ගතිමි. මිථ්‍යා සංකල්පය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි සම්‍යක් සංකල්පය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි. මිථ්‍යාවචනය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාවද දැනගතිමි, සම්‍යක් වචනය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැන ගතිමි. මිථ්‍යා කර්මාන්තය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැන ගතිමි. සම්‍යක් කර්මාන්තය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි. මිථ්‍යා ආජීවය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැන ගතිමි. සම්‍යක් ආජීවය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනා ද දැන ගතිමි. මිථ්‍යා ව්‍යායාමය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි සම්‍යක් ව්‍යායාමය නිසා උපදින (කුසලා කුසල විපාක) වේදනාද දැනගතිමි මිථ්‍යා සතිය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි. සම්‍යක් සතිය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි. මිථ්‍යා සමාධිය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි. සම්‍යක් සමාධිය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාද දැනගතිමි.

4. "ඡන්දය නිසා උපදින (අට වැදෑරුම් ලොභ සහගත) වේදනාද දැනගතිමි. විතර්කය නිසා උපදින (ප්‍රථමධ්‍යාන) වේදනාද දැනගතිමි. සංඥාව නිසා උපදින (සවැදෑරුම් සඤ්ඤා

සමාපත්ති) වේදනාද දැනගතිමි. ඡන්දයද නොසන්සිඳුනේ වෙයිද, විතර්කයෝද නොසන්සිඳුනාහු වෙත්ද, සංඥාවෝ නොසන්සිඳුනාහු වෙත්ද, ඒ නිසා උපදින (අෂ්ට ලොභ සහගත) වේදනාද දැනගතිමි.

"ඡන්දය සන්සිඳුනේ වෙයිද, විතර්කයෝ සංසිඳුනාහු වෙත්ද, සංඥාවෝ සන්සිඳුනාහු වෙත්ද ඒ නිසා උපදින (ප්‍රථමධ්‍යාන) වේදනාද දැනගතිමි. ඡන්දයද සන්සිඳුනේ වෙයිද විතර්කයෝද සන්සිඳුනාහු වෙත්ද සංඥාවෝ නොසන්සිඳුනාහු වෙත්ද, ඒ නිසා උපදින (ද්‍රුතියජ්ඣාන) වේදනාද දැනගතිමි.)

"ඡන්දය සන්සිඳුනේ වෙයිද විතර්කයෝද සන්සිඳුනාහු වෙත්ද, සංඥාවෝද සන්සිඳුනේ වෙත්ද ඒ නිසා උපදින (නෙවසඤ්ඤානාසඤ්ඤායතන) වේදනාද දැනගතිමි. අර්හත් ඵලයට පැමිණීම පිණිස උත්සාහ ඇත. ඊට කරුණ නොපැමිණි කල්හි ඊට හේතුවන්නාවූ (සතර මාර්ගයෙන් හා යෙදුනාවූ) වේදනාවද දැනගතිමියි" වදාළේය.

---

## 2. තෙමාස පටිසල්ලාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු සිටුහු විසින් කරවන ලද විහාරයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදාළසේක.

2. "මහණෙනි, මම තෙමසක් හුදකලාව විසීමට කැමැත්තෙමි. පිණ්ඩපාතය ගෙනෙන එක් භික්ෂුවක් හැර කිසිවෙක් නොපැමිණිය යුතුයි." ඒ භික්ෂූහු "එසේය, ස්වාමීනියි" කියා භාග්‍යවතුන් වහන්සේට උත්තර දී පිණ්ඩපාතය ගෙන යන එක භික්ෂුවක් හැර කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ කරා නොපැමිණෙයි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ තුන් මස ඇවෑමෙන් හුදකලා වාසයෙන් වෙන්වූයේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි,

ප්‍රථමාසම්බොධිය ඇති (බුදුවී පළමුවන එකුන් පනස් දින ඇතුළත) ඒ මම යම් ධර්මයක් මෙනෙහි කරමින් විසුයෙම්ද ඒ ධර්ම අතුරෙන් වේදනා සංඛ්‍යාත එක්තරා ධර්මයක් මෙනෙහි කරමින් විසුයෙමි.

4. "ඒ මම මෙසේ දැනගතිමි. මිථ්‍යාදෘෂ්ටිය නිසා උපදින (කුසලා'කුසල විපාක) වේදනාවද දැනගතිමි. මිථ්‍යාදෘෂ්ටිය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් දෘෂ්ටිය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් දෘෂ්ටිය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා සංකල්පය නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා සංකල්පය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් සංකල්පය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් සංකල්පය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා වචනය නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා වචනය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් වචනය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් වචනය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා කර්මාන්තය නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා කර්මාන්තය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් කර්මාන්තය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් කර්මාන්තය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා ආජීවය නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා ආජීවය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් ආජීවය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් ආජීවය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා ව්‍යායාමය නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා ව්‍යායාමය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි, සම්‍යක් ව්‍යායාමය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් ව්‍යායාමය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා සතිය නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා සතිය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් සතිය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් සතිය සංඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා සමාධිය නිසා උපදින වේදනාවද දැනගතිමි. මිථ්‍යා සමාධිය

සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් සමාධිය නිසා උපදින වේදනාවද දැනගතිමි. සම්‍යක් සමාධිය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි.

5. "ඡන්දය නිසා උපදින වේදනාවද දැනගතිමි. ඡන්දය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. විතර්කය නිසා උපදින වේදනාවද දැනගතිමි. විතර්කය සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. සංඥාව නිසා උපදින වේදනාවද දැනගතිමි. සංඥාව සංසිඳීම නිසා උපදින වේදනාවද දැනගතිමි. ඡන්දයද නොසන්සිඳුනේ වෙයි. විතර්කයෝද නොසන්සිඳුනාහු වෙත්, සංඥාවෝද නොසන්සිඳුනාහු වෙත්, ඒ නිසා උපදින වේදනාවද දැනගතිමි.

"ඡන්දයද සංසිඳුනේ වෙයි, විතර්කයෝද නොසන්සිඳුනාහු වෙත්, සංඥාවෝද නොසන්සිඳුනාහු වෙත්, ඒ නිසා උපදින වේදනාවද දැනගතිමි. ඡන්දයද සංසිඳුනේ වෙයි, විතර්කයෝද සංසිඳුනාහු වෙත්. සංඥාවෝද නොසන්සිඳුනාහු වෙත්, ඒ නිසා උපදින වේදනාවද දැනගතිමි.

"ඡන්දයද සංසිඳුනේ වෙයි, විතර්කයෝද සංසිඳුනාහු වෙත්, සංඥාවෝද සංසිඳුනාහු වෙත්, ඒ නිසා උපදින වේදනාවද දැනගතිමි. නොපැමිණි අර්හත් ඵලයට පැමිණීම පිණිස උත්සාහය ඇත. ඒ අර්හත් ඵලයට කරුණු නොපැමිණි කල්හි ඒ නිසා උපදින හේතුවද දැනගතිමි.

---

## 3. සෙඛ පඤ්හ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුව වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, සෙඛය සෙඛයයි කියනු ලැබේ. ස්වාමීනි, කෙසේ වනාහි සෙඛයෙක් වෙයිද?" කියායි.

"මේ ශාසනයෙහි මහණතෙම (සෝවාන් ආදී ඵල තුන හා මාර්ග සතර සමග උපන්) සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූයේ වෙයිද, (සෝවාන් ආදී ඵල තුන හා මාර්ග සතර සමග උපන්) සම්‍යක් සංකල්පයෙන් යුක්තවූයේ වෙයිද, (සෝවාන් ආදී ඵල තුන හා මාර්ග සතර සමග උපන්) සම්‍යක් වචනයෙන් යුක්තවූයේ වෙයිද, (සෝවාන් ආදී ඵල තුන හා සමග උපන්) සම්‍යක් කර්මාන්තයෙන් යුක්තවූයේ වෙයිද, (සෝවාන් ආදී ඵල තුන හා මාර්ග සතර සමග උපන්) සම්‍යක් ආජීවයෙන් යුක්තවූයේ වෙයිද, (සෝවාන් ආදී ඵල තුන හා මාර්ග සතර සමග උපන්) සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූයේ වෙයිද, (සෝවාන් ආදී ඵල තුන හා මාර්ග සතර සමග උපන්) සම්‍යක් සතියෙන් යුක්තවෙයිද, (සෝවාන් ආදී ඵල තුන හා මාර්ග සතර සමග උපන්) සම්‍යක් සමාධියෙන් යුක්තවූයේ වෙයිද, මහණ, මෙපමණකින් වනාහි (ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන බැවින්) සෙඛනම් වේයයි" වදාළසේක.

---

## 4. අට්ඨධම්මුප්පාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තථාගත අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ පහළවීමෙන් හැර වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ නූපන්නාවූ මේ ධර්මයෝ අට නූපදිත්.

"ඒ කවරහුද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක්

ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුය. මහණෙනි, තථාගත අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ පහළවීමෙන් හැර වඩන ලද්දාවූ බහුලකරන ලද්දාවූ නූපන්නාවූ මේ ධර්මයෝ නූපදිත්යයි" වදාළසේක.

---

## 5. දුතිය අට්ඨධම්මුප්පාද සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ හතරවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දෙශනා කරනලදී.)

2. "මහණෙනි සුගත විනය නම් මේ ශාසනය හැර අන් තැනක වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ නූපන්නාවූ මේ ධර්මයෝ නූපදිත්.

ඒ කවර ධර්ම අටක්ද? ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුය. මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ නූපන්නාවූ මේ ධර්ම අට සුගත විනය සංඛ්‍යාත ශාසනයෙහි හැර අන් තන්හි නූපදිත්යයි" වදාළසේක.

---

## 6. අට්ඨධම්ම පරිසුද්ධ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ හතරවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ස්වභාවයෙන් පිරිසිදු අතිශයින් පිරිසිදු රාගාදි කෙලෙස් රහිත උපක්ලේශ රහිත නූපන්නාවූ මේ ධර්ම අට අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් හැර නූපදිත්. කවර නම් ධර්ම අටක්ද යත්? හේ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය සහ සම්‍යක් සමාධියයි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහලවීමෙන් හැර ස්වභාවයෙන්

පිරිසිදු විශෙෂයෙන් පිරිසිදු රාගාදී කෙලෙස් රහිත උපක්ලේශ රහිත නූපන්නාවූ මේ ධර්මයෝ නූපදිත්යයි" වදාළසේක.

---

## 7. දුතිය අට්ඨධම්මපරිසුද්ධ සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ හතරවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි, ස්වභාවයෙන් පිරිසිදුවූ විශෙෂයෙන් පිරිසිදුවූ රාගාදී කෙලෙස් රහිත උපක්ලේශ රහිත නූපන්නාවූ මේ ධර්ම අට සුගත විනය නම් මේ ශාසනයෙහි හැර අන් තැනක නූපදිත්. කවර නම් ධර්ම අටක්ද යත්? හේ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුය. මහණෙනි, ස්වභාවයෙන් පිරිසිදු විශෙෂයෙන් පිරිසිදු රාගාදි කෙලෙස් රහිත උපක්ලේශ රහිත නූපන්නාවූ මේ ධර්ම අට සුගත විනය සංඛ්‍යාත ශාසනයෙහි හැර අන්තැනක නූපදිත්යයි" වදාළේය.

---

## 8. පළමුවෙනි කුක්කුටාරාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් භද්‍ර ස්ථවිරයන් වහන්සේද පැළලුප් නුවර කුක්කුටාරාමයේ වැඩ වසති. එකල්හි වනාහි ආයුෂ්මත් භද්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවෙකයෙන් නැගිටියේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාවකොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් භද්‍ර ස්ථවිරයන් වහන්සේ වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය.

2. "ඇවැත් ආනන්දයෙනි, අබ්‍රහ්මචරියාව අබ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ඇවැත්නි, කුමක් වනාහි අබ්‍රහ්මචරියාවද?

"ආයුෂ්මත් භද්‍රයෙනි, යහපති, යහපති, ආයුෂ්මත් භද්‍රය, තාගේ ප්‍රශ්නය වනාහි යහපත්ය. වැටහීම යහපති, විචාරීම යහපති. 'ඇවැත් ආනන්දයෙනි, අබ්‍රහ්මචරියාව, අබ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. අබ්‍රහ්මචරියාව නම් කුමක්ද?' කියා අසන්නෙහිද?'

"ඇවැත්නි, එසේය."

"ඇවැත්නි, මේ අංග අටක් ඇති මිථ්‍යා මාර්ගය අබ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ඒ කවරහුද? මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යා සංකල්පය, මිථ්‍යා වචනය, මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය, මිථ්‍යා ව්‍යායාමය, මිථ්‍යා සතිය, මිථ්‍යා සමාධිය, යන මොහුයි."

---

## 9. දෙවෙනි කුක්කුටාරාම සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ අටවෙනි සූත්‍රය මෙන් කුක්කුටාරාමයේදී දේශනා කරන ලදී.)

2. "ඇවැත්නි ආනන්දය, බ්‍රහ්මචරියාවය බ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ඇවැත්නි, බ්‍රහ්මචරියාව යනු කුමක්ද? බ්‍රහ්ම චරියාවගේ කෙළවර කුමක්ද?

"ආයුෂ්මත් භද්‍රය, යහපති, යහපති, ආයුෂ්මත් භද්‍රය, තාගේ ප්‍රශ්නය වනාහි යහපති, වැටහීම යහපති, විචාරීම යහපති. ඇවැත් භද්‍රය, නුඹ මෙසේ අසන්නෙහිද? 'ඇවැත් ආනන්දයෙනි, බ්‍රහ්මචරියාවය බ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ඇවැත්නි, බ්‍රහ්මචරියාව නම් කුමක්ද? බ්‍රහ්මචරියාවේ කෙළවර කුමක්ද කියායි.

"ඇවැත්නි, එසේය."

"ඇවැත්නි, මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයම බ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ඒ කවරහුද? සම්‍යක් දෘෂ්ටිය,

සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. ඇවැත්නි, යම් ඒ රාගය නැති කිරීමක් වේද? දෝෂය නැති කිරීමක් වෙත්ද? මෝහය නැති කිරීමක් වේද? මෙය බ්‍රහ්මචරියාවගේ කෙළවරයයි කියනු ලැබේ."

---

## 10. තුන්වෙනි කුක්කුටාරාම සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ අටවෙනි සූත්‍රය මෙන් කුක්කුටාරාමයේදී දේශනා කරන ලදී.)

2. "ඇවැත් ආනන්දයෙනි, බ්‍රහ්මචරියාවය, බ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ඇවැත්නි, බ්‍රහ්මචරියාව නම් කුමක්ද? බ්‍රහ්මචාරී නම් කවරෙක්ද? බ්‍රහ්මචරියාවගේ කෙළවර කුමක්ද?

"ඇවැත් භද්‍රයෙනි, එසේය."

"ඇවැත් භද්‍රයෙනි, තාගේ ප්‍රශ්නය වනාහි යහපති වැටහීම යහපති, විචාරීම යහපති, ඇවැත් භද්‍රයෙනි, නුඹ මෙසේ අසන්නෙහිද? 'ඇවැත් ආනන්දයෙනි, බ්‍රහ්මචර්යාව බ්‍රහ්මචර්යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, බ්‍රහ්මචර්යාව නම් කුමක්ද? බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නා නම් කවරෙක්ද? බ්‍රහ්මචරියාවෙහි කෙළවර කුමක්ද? කියායි.

"ඇවැත්නි, එසේය."

"ඇවැත්නි, මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයම වනාහි බ්‍රහ්මචරියාවයයි කියනු ලැබේ. ඒ කවරහුද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. ඇවැත්නි, යමෙක් වනාහි මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යුක්තවේද? මොහු බඹසර හැසිරෙන්නායයි කියනු ලැබේ. ඇවැත්නි, යම් රාගය නැති කිරීමක් වේද, ද්වේෂය නැති කිරීමක් වේද, මෝහය නැති කිරීමක් වේද? මෙය බ්‍රහ්මචරියාවගේ කෙළවරයයි කියනු ලැබේයයි" වදාළේය.

---

# 3. මිච්ඡත්ත වර්ගය.

## 1. මිච්ඡත්ත සූත්‍රය

1. (මේ වර්ගයේ සූත්‍ර දහවෙනි සූත්‍රය හැර අනික් සූත්‍ර දෙවෙනි වර්ගයේ 4 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, තොපට වැරදි ස්වභාවයද දෙශනා කරන්නෙමි. යහපත් ස්වභාවයද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, වැරදි ස්වභාවය කුමක්ද? ඒ මෙසේයි. මිථ්‍යාදෘෂ්ටිය, මිථ්‍යා සංකල්පය, මිථ්‍යා වචනය, මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය, මිථ්‍යා ව්‍යායාමය, මිථ්‍යා සතිය, මිථ්‍යා සමාධිය යන මොහුයි. මහණෙනි, මේ වැරදි ස්වභාවයයි කියනු ලැබේ.

3. "මහණෙනි, යහපත් ස්වභාවය කෙසේද? ඒ මෙසේයි සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ සම්‍යක් ස්වභාවයයි කියනු ලැබේ.

---

## 2. අකුසල සූත්‍රය

2. "මහණෙනි, තොපට අකුසල ධර්මයන්ද කුසල ධර්මයන්ද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, අකුසල ධර්මයෝ කවරහුද? ඒ මෙසේයි. මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යා සංකල්පය, මිථ්‍යා වචනය, මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය, මිථ්‍යා ව්‍යායාමය, මිථ්‍යා සතිය, මිථ්‍යා සමාධිය යන මොහුය. මහණෙනි, මොව්හු අකුසල ධර්මයෝයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කුසල ධර්මයෝ කවරහුද? ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය,

සම්‍යක් සමාධිය යන මොහුය. මහණෙනි, මොව්හු කුසල ධර්මයෝයයි කියනු ලැබෙත්.

---

## 3. පඨම පටිපදා සූත්‍රය.

2. "මහණෙනි, තොපට වැරදි පිළිපැදීමද දෙශනා කරන්නෙමි. යහපත් පිළිපැදීමද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, වැරදි පිළිපැදීම කවරේද යත් ඒ මෙසේයි. මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යා සංකල්පය, මිථ්‍යා වචනය, මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය, මිථ්‍යා ව්‍යායාමය, මිථ්‍යා සතිය, මිථ්‍යා සමාධිය යන මොහුය. මහණෙනි, මේ වැරදි පිළිපැදීමයයි කියනු ලැබේ.

3. "මහණෙනි, යහපත් පිළිපැදීම කවරේද? ඒ මෙසේයි සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ යහපත් පිළිපැදීමයයි කියනු ලැබේ.

---

## 4. දුතිය පටිපදා සූත්‍රය.

2. "මහණෙනි, මම ගිහියාගේ හෝ පැවිද්දාගේ හෝ වැරදි පිළිපැදීම වර්ණනා නොකරමි. මහණෙනි. වරදවා පිළිපදින ගිහියා හෝ පැවිද්දා හෝ වැරදි පිළිපැදීම හෙතු කොට ගෙන කුසලවූ ආර්ය මාර්ගය සම්පූර්ණ කරන්නෙක් නොවේ. මහණෙනි, වැරදි පිළිපැදීම කවරේද? ඒ මෙසේයි. මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යා සංකල්පය, මිථ්‍යා වචනය, මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය, මිථ්‍යා ව්‍යායාමය, මිථ්‍යා සතිය, මිථ්‍යා සමාධිය යන මොහුය. මහණෙනි, මේ වැරදි පිළිපැදීම යයි කියනු ලැබේ. මහණෙනි, මම ගිහියාගේ හෝ පැවිද්දාගේ හෝ වැරදි පිළිපැදීම වර්ණනා නොකරමි. මහණෙනි, වැරදිසේ පිළිපදින ගිහියා හෝ පැවිද්දා හෝ වැරදි පිළිපැදීම හෙතුකොට ගෙන කුසලවූ ආර්ය මාර්ග ධර්මය සම්පූර්ණ කරන්නෙක් නොවන්නේය.

2. "මහණෙනි, මම ගිහියාගේ හෝ පැවිද්දාගේ හෝ යහපත් පිළිපැදීම වර්ණනා කරමි. මහණෙනි, යහපත්ව පිළිපදින්නාවූ ගිහියා හෝ පැවිද්දා හෝ යහපත් පිළිපැදීම හෙතු කොට ගෙන කුසල්වූ ආර්ය මාර්ග ධර්මය සම්පූර්ණ කරන්නේ වෙයි. මහණෙනි, යහපත් පිළිපැදීම කුමක්ද? ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මේය. මහණෙනි, මේ යහපත් පිළිපැදීම යයි කියනු ලැබේ. මහණෙනි, මම ගිහියාගේ හෝ පැවිද්දාගේ හෝ යහපත් පිළිපැදීම වර්ණනා කරමි. මහණෙනි, යහපත්ව පිළිපදින්නාවූ ගිහියා හෝ පැවිද්දා හෝ යහපත් පිළිපැදීම හෙතුකොට ගෙන කුසලවූ ආර්ය මාර්ගය සම්පූර්ණ කරන්නෙක් වන්නේය.

## 5. පඨම අසප්පුරිස සූත්‍රය.

2. "මහණෙනි, තොපට අසත්පුරුෂයාද සත්පුරුෂයාද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, අසත්පුරුෂයා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතමෙක් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේවේද මිථ්‍යා සංකල්පය ඇත්තේ වේද මිථ්‍යා වචනය ඇත්තේ වේද මිථ්‍යා කර්මාන්තය ඇත්තේවේද මිථ්‍යා ආජීවය ඇත්තේවේද මිථ්‍යා ව්‍යායාමය ඇත්තේවේද මිථ්‍යා සතිය ඇත්තේවේද මිථ්‍යා සමාධිය ඇත්තේවේද, මහණෙනි, මේ තෙමේ අසත්පුරුෂයා යයි කියනු ලැබේ.

3. "මහණෙනි, සත්පුරුෂයා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙක් සම්‍යක් දෘෂ්ටිය ඇත්තේ වෙයිද සම්‍යක් සංකල්පය ඇත්තේ වෙයිද සම්‍යක් වචනය ඇත්තේ වෙයිද සම්‍යක් කර්මාන්තය ඇත්තේ වෙයිද, සම්‍යක් ආජීවය ඇත්තේ වෙයිද සම්‍යක් ව්‍යායාමය ඇත්තේ වෙයිද සම්‍යක් සතිය ඇත්තේ වෙයිද සම්‍යක් සමාධිය ඇත්තේ වෙයිද මහණෙනි, මේ තෙමේ සත්පුරුෂයායයි කියනු ලැබේ.

## 6. දුතිය අසප්පුරිස සූත්‍රය.

2. "මහණෙනි, තොපට අසත්පුරුෂයාද අසත්පුරුෂයාට වඩා අතිශයින් අසත්පුරුෂයාද දෙශනා කරන්නෙමි. සත්පුරුෂයාද සත්පුරුෂයාට වඩා අතිශයින් සත්පුරුෂයාද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, අසත්පුරුෂයා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතමෙක් මිථ්‍යාදෘෂ්ටිය ඇත්තේවේද මිථ්‍යා සංකල්පය ඇත්තේ වේද මිථ්‍යා වචනය ඇත්තේවේද මිථ්‍යා කර්මාන්තය ඇත්තේ වේද මිථ්‍යා ආජීවය ඇත්තේ වේද මිථ්‍යා ව්‍යායාමය ඇත්තේ වේද මිථ්‍යා සතිය ඇත්තේ වේද මිථ්‍යා සමාධිය ඇත්තේ වේද මහණෙනි, මේ තෙම අසත්පුරුෂයා යයි කියනු ලැබේ. මහණෙනි, අසත්පුරුෂයාට වඩා අතිශයින් අසත්පුරුෂයා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙක් මිථ්‍යා දෘෂ්ටිය ඇත්තේ වේද මිථ්‍යා සංකල්පය ඇත්තේ වේද මිථ්‍යා වචනය ඇත්තේ වේද මිථ්‍යා කර්මාන්තය ඇත්තේවේද මිථ්‍යා ආජීවය ඇත්තේ වේද මිථ්‍යා ව්‍යායාමය ඇත්තේ වේද මිථ්‍යා සතිය ඇත්තේ වේද මිථ්‍යා සමාධිය ඇත්තේවේද මිථ්‍යා ඤාණය ඇත්තේ වේද මිථ්‍යා විමුක්තිය ඇත්තේ වේද මහණෙනි, මේ තෙමේ අසත්පුරුෂයාට වඩා අතිශයින් අසත්පුරුෂයායයි කියනු ලැබේ.

3. "මහණෙනි, සත්පුරුෂයා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතමෙක් සම්‍යක් දෘෂ්ටිය ඇත්තේ වේද සම්‍යක් සංකල්පය ඇත්තේ වේද සම්‍යක් වචනය ඇත්තේ වේද සම්‍යක් කර්මාන්තය ඇත්තේ වේද සම්‍යක් ආජීවය ඇත්තේ වේද සම්‍යක් ව්‍යායාමය ඇත්තේ වේද සම්‍යක් සතිය ඇත්තේ වේද සම්‍යක් සමාධිය ඇත්තේ වේද මහණෙනි, මේ තෙම සත්පුරුෂයා යයි කියනු ලැබේ. මහණෙනි, සත්පුරුෂයාට වඩා අතිශය සත්පුරුෂයා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතමෙක් සම්‍යක් දෘෂ්ටිය ඇත්තේ වේද සම්‍යක් සංකල්පය ඇත්තේ වේද සම්‍යක් වචනය ඇත්තේ වේද සම්‍යක් කර්මාන්තය ඇත්තේ වේද සම්‍යක් ආජීවය ඇත්තේ වේද සම්‍යක් ව්‍යායාමය ඇත්තේ වේද සම්‍යක් සතිය ඇත්තේ වේද සම්‍යක් සමාධිය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තේ වේද සම්‍යක් ඥානය ඇත්තේ වේද සම්‍යක් විමුක්තිය ඇත්තේ වේද මහණෙනි, මේ තෙමේ සත්පුරුෂයාට වඩා අතිශය සත්පුරුෂයා යයි කියනු ලැබේ.”

---

## 7. කුම්භූපම සූත්‍රය.

2. “මහණෙනි, යම් සේ ආධාරයක් මත නොතබන ලද කළය කැමති කැමති දිසාවකට පහසුවෙන් පෙරලෙන්නේ වෙයිද ආධාරයක් මත තබන ලද කළය කැමති දිගකට පහසුවෙන් නොපෙරලෙන්නේ වෙයිද මහණෙනි, එමෙන්ම වනාහි ආධාර රහිත සිත පහසුවෙන් පෙරලෙන්නේය. ආධාර සහිත සිත පහසුවෙන් නොපෙරලෙන්නේය.

3. “මහණෙනි, සිතට ආධාරය නම් කුමක්ද? මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයයි. ඒ කවරේද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ සිතට ආධාර යයි කියනු ලැබේ. මහණෙනි, යම් සේ ආධාර රහිත කළය කැමති කැමති දිගකට පහසුවෙන් පෙරලෙන්නේද ආධාර සහිත කළය පහසුවෙන් නොපෙරලෙන්නේද එමෙන් මහණෙනි, ආධාර රහිත සිත පහසුවෙන් පෙරලෙන්නේ වේ. ආධාර සහිත සිත පහසුවෙන් නොපෙරළෙන්නේ වේයයි” වදාළසේක.

---

## 8. අරිය සමාධි සූත්‍රය

2. “මහණෙනි, ප්‍රත්‍යය සහිත පිරිවර සහිත ආර්යවූ සම්‍යක් සමාධිය දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, ප්‍රත්‍යය සහිත පිරිවර සහිත ආර්ය සමාධිය කුමක්ද? ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යනුයි. මහණෙනි, යම්බඳුවූ මේ අංග සතින්

යුක්තවූ චිත්තයාගේ එකඟ බවක් පිරිවර සහිත බවක් වේද? මහණෙනි, ආර්ය සමාධිය ප්‍රත්‍යය සහිත යයි කියාද පිරිවර සහිතයයි කියාද කියනු ලැබේ.

---

## 9. වෙදනා පරිඤ්ඤා සූත්‍රය.

2. "මහණෙනි, මේ වේදනාවෝ තිදෙනෙකි. කවරනම් තිදෙනෙක්දයත්? සුඛ වේදනාය, දුක් වේදනාය, උපෙක්ෂා වේදනාය කියායි. මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ වෙදනාවෝයි. මහණෙනි, මේ ත්‍රිවිධ වේදනාවන් පිළිබඳ දැනීම සඳහා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. ඒ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය කුමක්ද? ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ ත්‍රිවිධ වේදනාවන් පිරිසිඳ දැනීම සඳහා මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 10. උත්තිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් උත්තිය ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් උත්තිය ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, රහසිගතව විවේකීව හුන්නාවූ මාගේ සිතෙහි මෙබඳු අදහසක් පහළවිය. "භාග්‍යවතුන් වහන්සේ විසින් පඤ්චකාම ගුණයෝ වදාරණ ලදහ' භාග්‍යවතුන් වහන්සේ විසින් කවර නම් පඤ්චකාම ගුණයක් වදාරණ ලද්දේද?"

"උත්තිය, යහපති, යහපති, උත්තිය, මා විසින් මේ කාමගුණයෝ පසක්ම වදාරණ ලදහ. කවරනම් පසක්ද? චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රියවූ, ඇලීම පිණිස පවත්නාවූ, ඇලිය යුතුවූ රූපයෝ වෙද්ද ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රියවූ, ඇලීම පිණිස පවත්නාවූ, ඇලිය යුතුවූ රසයෝ වෙද්ද, කායවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රියවූ, ඇලීම පිණිස පවත්නාවූ, ඇලිය යුතුවූ ඵොට්ඨබ්බයෝ වෙද්ද, උත්තිය, මේ පඤ්චකාම ගුණයෝ මා විසින් කියන ලදහ. උත්තිය, මේ පඤ්චකාමයන්ගේ ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නම් කුමක්ද? ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය සහ සම්‍යක් සමාධියයි. උත්තිය, මේ පඤ්චකාම ගුණයන්ගේ ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

# 4. පටිපත්ති වර්ගය

## 1 පටිපත්ති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා ඒ භික්ෂූහු ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තොපට මිථ්‍යා ප්‍රතිපත්තියද සම්‍යක් ප්‍රතිපත්තියද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, මිථ්‍යා ප්‍රතිපත්තිය නම් කවරීද?

3. ඒ මෙසේයි. මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යා සංකල්පය, මිථ්‍යා වචනය, මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය, මිථ්‍යා ව්‍යායාමය, මිථ්‍යා සතිය සහ මිථ්‍යා සමාධියයි. "මහණෙනි, මේ මිථ්‍යා ප්‍රතිපත්තියයි කියනු ලැබේ. මහණෙනි, සම්‍යක් ප්‍රතිපත්තිය නම් කුමක්ද? ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මෙයයි.

"මහණෙනි, මේ සම්‍යක් ප්‍රතිපත්තියයි කියනු ලැබේ.

## 2. පටිපන්න සූත්‍රය.

1. (මෙතැන් සිට මේ වර්ගයේ සියලුම සූත්‍රවල 1 ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, තොපට වරදවා පිළිපදින්නාද නිවැරදිව පිළිපදින්නාද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, වරදවා පිළිපදින්නා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතමෙක් මිථ්‍යා දෘෂ්ටි ඇත්තේ වෙයිද? මිථ්‍යා සංකල්පය ඇත්තේවේද, මිථ්‍යා වචනය ඇත්තේවේද, මිථ්‍යා කර්මාන්තය ඇත්තේවේද, මිථ්‍යා ආජීවය ඇත්තේවේද, මිථ්‍යා ව්‍යායාමය, ඇත්තේවේද, මිථ්‍යා සතිය ඇත්තේවේද, මිථ්‍යා සමාධිය ඇත්තේවේද, මහණෙනි, මේතෙම වරදවා පිළිපදින්නාහුයයි කියනු ලැබේ.

3. "මහණෙනි, නිවැරැදිව පිළිපදින්නා නම් කවරෙක්ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැමෙක් සම්‍යක් දෘෂ්ටිය ඇත්තේවේද, සම්‍යක් සංකල්පය ඇත්තේවේද, සම්‍යක් වචනය ඇත්තේවේද, සම්‍යක් කර්මාන්තය ඇත්තේවේද, සම්‍යක් ආජීවය ඇත්තේවේද, සම්‍යක් ව්‍යායාමය ඇත්තේවේද, සම්‍යක් සතිය ඇත්තේවේද, සම්‍යක් සමාධිය ඇත්තේවේද? මහණෙනි, මේතෙම නිවැරැදිව පිළිපදින්නාහුයයි කියනු ලැබේයයි" වදාළසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 3. මග්ගවිරද්ධ සූත්‍රය.

2. "මහණෙනි, යම්කිසි කෙනෙකුන් විසින් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය පටන් නොගන්නාලද්දේද? ඔහු විසින් මනාකොට දුක් කෙළවර කරන මාර්ගය පටන්නොගන්නා ලද්දේවේ. මහණෙනි, යම් කිසි කෙනෙකුන් විසින් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය පටන්ගන්නා ලද්දේද? ඔහු විසින් මනාකොට දුක් කෙළවර කරණ මාර්ගය පටන්ගන්නා ලද්දේවේ. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්දයත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය සහ සම්‍යක් සමාධියයි.

4. "මහණෙනි, යම්කිසි කෙනෙකුන් විසින් මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය පටන්නොගන්නා ලද්දේද? ඔවුන් විසින් මනාකොට දුක් කෙළවර කරණ මාර්ගය පටන් නොගන්නා ලද්දේ වේ. මහණෙනි, යම් කිසිකෙනෙකුන් විසින් මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය පටන්ගන්නා ලද්දේද? ඔවුන් විසින් මනාකොට දුක් කෙළවර කරන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය පටන්ගන්නාලද්දේ වේයයි වදාළසේක.

---

## 4. පාරංගම සූත්‍රය

2. "මහණෙනි, වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ ධර්මයෝ අටදෙනෙක් සසරින් එතෙරට යාම පිණිස පවතිත්. කවරනම් ධර්ම අටක්ද?

3. "ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යනුයි. මහණෙනි, වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ ධර්ම අට සසරින් එතරට පැමිණීම පිණිස පවතිත්යයි භාග්‍යවතුන් වහන්සේ

මෙය වදාළසේක. මෙය වදාරා අනතුරුව සුගතයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

4. "මිනිසුන් අතුරෙන් යම් ජන කෙනෙක් එතෙරට පැමිණෙන්නාහුද ඔව්හු ස්වල්ප දෙනෙකි. එයින් අන්‍යවූ ප්‍රජාව සසරම ඇවිදින්නීය."

"යම් කෙනෙක් මනාකොට වදාළ ධර්මයෙහි ඒ ධර්යට අනුව පවතින්නාහුද ඔව්හු එතෙරවීමට දුෂ්කරවූ මරුවාට අයත්වූ මේ ලෝකයෙන් එතරට පැමිණෙන්නාහුය."

"නුවණැති පුරුෂතෙමේ සසරින් එතෙරව නිවන් පැමිණෙනු පිණිස අකුශල ධර්ම දුරුකොට කුශල ධර්ම වඩන්නේය. කැමතිවීමට දුෂ්කරවූ නිවනෙහි කැමැත්ත උපදවන්නේය. පණ්ඩිතතෙමේ කාමයන් දුරුකොට පලිබොධ රහිතවූයේ තමන්ගේ සිත නීවරණයන්ගෙන් පිරිසිදු කරන්නේය."

"යමෙකුගේ සිත ධර්මයන් විෂයෙහි මනාකොට වඩන ලද්දේද සතර උපාදානයන්ගෙන් අල්වා නොගෙන උපාදානයන් දුරුකළාවූ නිවනෙහි ඇලුනේද එබඳු අනුභාව ඇති ආශ්‍රව රහිත උත්තමයෝ පිරිනිවියාහු වෙත්" යයි වදාළේය.

---

## 5. සාමඤ්ඤඵල සූත්‍රය

2. "මහණෙනි, තොපට ශ්‍රමණ භාවයද, ශ්‍රමණ භාවයේ ඵලයන්ද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, ශ්‍රමණභාවය නම් කුමක්ද? ඒ මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයයි. ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය සහ සම්‍යක් සමාධියයි. මහණෙනි, මෙය ශ්‍රමණ භාවයයි කියනු ලැබේ. මහණෙනි, ශ්‍රමණ භාවයේ ඵලයෝ නම් කවරහුද?

සෝවාන් ඵලය, සකෘදාගාමි ඵලය, අනාගාමි ඵලය, අර්හත් ඵලය යන මොහුයි.

මහණෙනි, මොව්හු ශ්‍රමණභාවයේ ඵලයෝයයි කියනු ලැබෙත් යයි” වදාලසේක.

---

## 6. සාමඤ්ඤත්ථ සූත්‍රය

2. “මහණෙනි, තොපට ශ්‍රමණභාවයද ශ්‍රමණ භාවයාගේ අර්ථයද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, ශ්‍රමණභාවය නම් කුමක්ද? මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි. ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ ශ්‍රමණ භාවයයි කියනු ලැබේ.

3. “මහණෙනි, ශ්‍රමණභාවයාගේ අර්ථය නම් කුමක්ද? මහණෙනි, යම් රාගය නැතිකිරීමක්වේද, ද්වෙෂය නැති කිරීමක් වේද, මොහය නැතිකිරීමක් වේද, මහණෙනි, මෙය ශ්‍රමණභාවයාගේ අර්ථයයි කියනු ලැබේ”යයි වදාළසේක.

---

## 7. බ්‍රහ්මඤ්ඤඵල සූත්‍රය

2. “මහණෙනි, තොපට ශ්‍රෙෂ්ඨභාවයද ශ්‍රෙෂ්ඨභාවයාගේ ඵලයද දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, ශ්‍රෙෂ්ඨභාවය නම් කුමක්ද? මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි. ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ ශ්‍රෙෂ්ඨභාවයයි කියනු ලැබේ.

3. “මහණෙනි, ශ්‍රෙෂ්ඨභාවයාගේ ඵලය නම් කවරේද? සෝවාන් ඵලය, සකෘදාගාමි ඵලය, අනාගාමි ඵලය, අර්හත්

ඵලය, යන මොහුයි. මහණෙනි, මොව්හු ශ්‍රෙෂ්ඨභාවයාගේ ඵලයයි කියනු ලැබේයයි' වදාළසේක.

---

## 8. බ්‍රහ්මඤ්ඤත්ථ සූත්‍රය.

2. "මහණෙනි, තොපට ශ්‍රෙෂ්ඨ බවද ශ්‍රෙෂ්ඨභාවයාගේ අර්ථයද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, ශ්‍රෙෂ්ඨ බව නම් කුමක්ද? මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි. ඒ කෙසේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, මේ ශ්‍රෙෂ්ඨ බවයයි කියනු ලැබේ.

3. "මහණෙනි, ශ්‍රෙෂ්ඨභාවයාගේ අර්ථය නම් කුමක්ද? මහණෙනි, රාගය නැතිකිරීමට නිමිත්තවූ ද්වෙශය නැති කිරීමට නිමිත්තවූ මොහය නැතිකිරීමට නිමිත්තවූ යම් නිර්වාණයක් වේද? එය ශ්‍රෙෂ්ඨ භාවයාගේ අර්ථයයි කියනු ලැබේයයි" වදාළසේක.

---

## 9. බ්‍රහ්මචරිය ඵල සූත්‍රය

2. "මහණෙනි, තොපට මම බ්‍රහ්මචරියාව දෙශනා කරන්නෙමි. බ්‍රහ්මචරියාවේ ඵලයන්ද දෙශනා කරන්නෙමි. එය අසව්.

"මහණෙනි, බ්‍රහ්මචරියාව නම් කුමක්ද? මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සමයක් සතිය සහ සම්‍යක් සමාධියයි. මහණෙනි, මෙය බ්‍රහ්ම චරියාවයයි කියනු ලැබේ.

3. "මහණෙනි, බ්‍රහ්මරියාවේ ඵලයෝ නම් කවරහුද? සෝවාන් ඵලය, සකෘදාගාමි ඵලය, අනාගාමි ඵලය, අර්හත්

ඵලය යන මොහුයි. මහණෙනි, මොව්හු බ්‍රහ්මරියාගේ ඵලයෝ යයි කියනු ලැබෙතියි” වදාළසේක.

---

## 10. බ්‍රහ්මචරියත්ථ සූත්‍රය

2. “මහණෙනි, තොපට මම බ්‍රහ්මචරියාවද බ්‍රහ්ම චරියාවේ අර්ථයද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, බ්‍රහ්මචරියාව නම් කුමක්ද? මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි. ඒ මෙසේයි. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය සහ සම්‍යක් සමාධියයි. මහණෙනි, මෙය බ්‍රහ්ම චරියාවයයි කියනු ලැබේ.

3. “මහණෙනි, බ්‍රහ්මචරියාවේ අර්ථය නම් කවරේද? මහණෙනි, රාගය ක්ෂය කිරීමට නිමිත්තවූ ද්වෙෂය ක්ෂය කිරීමට නිමිත්තවූ මොහය ක්ෂය කිරීමට නිමිත්තවූ යම් නිර්වාණයක් වේද මෙය බ්‍රහ්මචරියාවේ අර්ථයයි කියනු ලැබේයයි” වදාළසේක.

---

# 5. අඤ්ඤතිත්ථිය පෙයාල වර්ගය

## 1. රාග විරාග සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක හුන්හ. එක්පසෙක හුන්නාහු ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

**2.** "මහණෙනි, ඉදින් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ තොපගෙන් 'ඇවැත්නි, ශ්‍රමණ භවත් ගෞතමයින් වහන්සේ වෙත කුමක් පිණිස බ්‍රහ්මචරියාවෙහි වෙසෙන්නේද?"

**3.** "මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, රාගය නැතිකිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචරියාවෙහි වසන්නේයයි" කියව්.

**4.** "මහණෙනි, ඉදින් වනාහී තොපගෙන් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ 'ඇවැත්නි, රාගය නැතිකිරීම පිණිස මාර්ගයක් තිබේද? ප්‍රතිපදාවක් තිබේදැයි' මෙසේ අසන්නාහු නම් මෙසේ අසනලද තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, රාගය නැතිකිරීම පිණිස මාර්ගයක් ඇත, ප්‍රතිපදාවක්ද ඇතැයි' කියව්. මහණෙනි, රාගය නැති කිරීම පිණිස පවත්නා මාර්ගය නම් කුමක්ද? ප්‍රතිපදාව නම් කුමක්ද? මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි.

**5.** ඒ කෙසේද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මේයි.

**6.** "මහණෙනි, රාගය නැති කිරීම පිණිස පවත්නා මාර්ග මෙයයි. ප්‍රතිපදාව මෙයයි. මෙසේ අසන ලද්දාදවූ තෙපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියව්යයි" වදාළසේක.

---

## 2. සංයොජන පහාණ සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2, 5 ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2, 5 ඡේද මෙන් වේ.)

**3.** "මහණෙනි, මෙසේ අසන ලද තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, සංයොජනයන් පහකරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නේ යයි' කියව්.

**4.** "මහණෙනි, ඉදින් වනාහි තොපගෙන් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ 'ඇවැත්නි, සංයෝජනයන් පහකරනු පිණිස මාර්ගයක් තිබේද? ප්‍රතිපදාවක් තිබේදැයි' මෙසේ අසන්නහුනම් මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි 'ඇවැත්නි, සංයෝජනයන් පහකරනු පිණිස මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේයයි' කියව්. මහණෙනි, කිනම් මාර්ගයක් කිනම් ප්‍රතිපදාවක් සංයෝජන පහකිරීම පිණිස පවත්නේද? මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි.

**6.** "මහණෙනි, මෙය සංයෝජනයන්ගේ පහකිරීම පිණිස පවත්නා මාර්ගය වෙයි. ප්‍රතිපදාව වෙයි. මහණෙනි, මෙසේ අසන ලද තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට මෙසේ කියව්යයි' වදාළසේක.

---

## 3. අනුසය සමුග්ඝාත සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2, 5 ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2, 5 ඡේද මෙන් වේ.)

**3.** "මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට ඇවැත්නි, අනුසය ධර්මයන් නැසීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නේයයි' කියව්

**4.** "මහණෙනි, ඉදින් වනාහි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ තොපගෙන් 'ඇවැත්නි, අනුසය ධර්මයන් නැසීම පිණිස මාර්ගයක් ඇත්තේද, ප්‍රතිපදාවක් ඇත්තේදැයි මෙසේ අසන්නාහු නම් මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට 'අනුසය ධර්මයන් නැසීම පිණිස මාර්ගයක් ඇත, ප්‍රතිපදාවක්ද ඇතැයි' කියව්. මහණෙනි, අනුසය ධර්මයන් නැසීම පිණිස පවත්නා මාර්ගය කුමක්ද? ප්‍රතිපදාව කුමක්ද? මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි.

**6.** "මහණෙනි, අනුසය නැසීම පිණිස මේ මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාවවෙයි. මහණෙනි, මෙසේ අසන ලද තෙපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියව්යයි" වදාළසේක.

---

## 4. අද්ධාන පරිඤ්ඤා සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2, 5 ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2, 5 ඡේද මෙනි.)

**3.** "මහණෙනි, මෙසේ අසන ලද තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට ඇවැත්නි, සංසාර ගමන නැති කිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර හැසිරෙන්නේය' කියව්.

**4.** "මහණෙනි, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ඉදින් වනාහි තොපගෙන් 'ඇවැත්නි, සසර ගමන නැති කිරීම පිණිස මාර්ගයක් තිබේද? ප්‍රතිපදාවක් තිබේදැයි මෙසේ අසන්නාහු නම්, මහණෙනි, මෙසේ අසන ලද තෙපි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට, 'ඇවැත්නි, සසර ගමන නැතිකිරීම පිණිස මාර්ගක් ඇත ප්‍රතිපදාවක්ද ඇතැයි' මෙසේ කියව්. මහණෙනි, සසර ගමන නැති කිරීම පිණිස පවත්නා මාර්ගය කුමක්ද? ප්‍රතිපදාව කුමක්ද? ඒ මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි.

**6.** "මහණෙනි, සසර ගමන නැති කිරීම පිණිස මේ මාර්ගය, මේ ප්‍රතිපදාව වෙයි මහණෙනි, මෙසේ අසනලද තොපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට මෙසේ කියව්යයි" වදාළසේක.

---

## 5. ආසවක්ඛය සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2, 5 ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2, 5 ඡේද මෙනි.)

**3.** "මහණෙනි, ඒ මෙසේ අසන ලද තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස

භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වෙසෙන්නේයයි' කියව්. මහණෙනි, ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ තොපගෙන් 'ඇවැත්නි ආශ්‍රව නැති කිරීම පිණිස මාර්ගයක් තිබේද? ප්‍රතිපදාවක් තිබේදැයි."

**4.** "මහණෙනි, මෙසේ අසන්නාහු නම් මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට ඇවැත්නි ආශ්‍රවයන් නැතිකිරීම පිණිස මාර්ගයක් ඇත. ප්‍රතිපදාවක් ඇත. මහණෙනි, ආශ්‍රවයන් නැතිකිරීම පිණිස පවත්නා මාර්ගය කුමක්ද? ප්‍රතිපදාව කුමක්ද? ඒ මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයමැයි.

**6.** "මහණෙනි, ආශ්‍රව නැති කිරීම පිණිස මේ මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි. මහණෙනි, මෙසේ අසනලද තෙපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට මෙසේ කියව්යයි" වදාළ සේක.

---

## 6. විජ්ජාවිමුත්ති සූත්‍රය

(මේ සූත්‍රයේ 1, 2, 5 ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2, 5 ඡේද මෙනි.)

**3.** "මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, විජ්ජා විමුක්ති ඵලය (රහත් බව) අවබෝධ කිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර හැසිරෙන්නේයයි' කියව්.

**4.** "මහණෙනි, ඉදින් වනාහි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ තොපගෙන් 'ඇවැත්නි, විද්‍යා විමුක්ති ඵලය (රහත් බව) අවබෝධ කිරීම පිණිස පවත්නාවූ මාර්ගයක් තිබේද? ප්‍රතිපදාවක් තිබේදැයි' මෙසේ අසන්නාහු නම් මෙසේ අසන ලද්දාවූ තෙපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, විද්‍යා විමුක්ති ඵලය (රහත් බව) අවබෝධ කිරීම පිණිස මාර්ගයක් ඇත. ප්‍රතිපදාවක් ඇතැයි' කියව්. මහණෙනි, විද්‍යා විමුක්ති ඵලය (රහත් බව) ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නා මාර්ගය කුමක්ද? ඒ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය මැයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

6. "මහණෙනි, මේ විද්‍යා විමුක්ති ඵලය (රහත් බව) අවබෝධකිරීම පිණිස මාර්ගය වෙයි. ප්‍රතිපදාව වෙයි, මහණෙනි, මෙසේ අසන ලද තෙපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට මෙසේ කියව්යයි" වදාළසේක.

---

## 7. ඤාණදස්සන සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 2, 5 ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 1, 2, 5 ඡේද මෙනි.)

3. "මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, ඤාණදර්ශනය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර හැසිරෙන්නේයයි' කියව්.

4. "මහණෙනි, ඉදින් වනාහි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ තොපගෙන් 'ඇවැත්නි, ඤාණදර්ශනය පිණිස මාර්ගයක් තිබේද? ප්‍රතිපදාවක් තිබේදැයි' මෙසේ අසන්නාහු නම් මහණෙනි, මෙසේ අසනලද්දාවූ තෙපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට ඤාණදර්ශනය පිණිස මාර්ගයක් ඇත්තේය. ප්‍රතිපදාවක් ඇත්තේයයි කියව්. මහණෙනි, ඤාණදර්ශනය පිණිස පවත්නා මාර්ගය කුමක්ද? ප්‍රතිපදාව කුමක්ද? ඒ මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය මැයි.

6. "මහණෙනි, ඤාණදර්ශනය පිණිස මේ මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි. මහණෙනි, මෙසේ අසනලද තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට මෙසේ කියව්යයි" වදාළසේක

---

## 8. අනුපාදාපරිනිබ්බාණ සූත්‍රය.

(මේ සූත්‍රයේ 1, 3, 5 ඡේද මේ සූත්‍රයේ පළමුවෙනි 1, 3, 5 ඡේද මෙනි.)

3. "මහණෙනි මෙසේ අසන ලද තෙපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට ඇවැත්නි, 'අනුපාදාපරිනිර්වාණය පිණිස

භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රාහ්මචර්යාවෙහි හැසිරෙන්නේ යයි කියව්.

4. "මහණෙනි, ඉදින් වනාහි තොපගෙන් ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ 'ඇවැත්නි, අනුපාදා පරිනිර්වාණය පිණිස මාර්ගයක් තිබේද? ප්‍රතිපදාවක් තිබේදැයි' මෙසේ අසන්නාහු නම් මහණෙනි, මෙසේ අසනලද තෙපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්ට 'ඇවැත්නි, අනුපාදා පරිනිර්වාණය පිණිස මාර්ගයක් තිබේ. ප්‍රතිපදාවක් තිබේයයි' කියව්. මහණෙනි, අනුපාදා පිරිනිවීම පිණිස පවත්නා මාර්ගය කුමක්ද? ප්‍රතිපදාව කුමක්ද? ඒ මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයයි.

6. "මහණෙනි, මේ අනුපාදා පරිනිර්වාණය පිණිස මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි. මෙසේ අසන ලද තෙපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියව්යයි" වදාළසේක.

---

## 6. සූරිය පෙය්‍යාල වර්ගය

### 1. කල්‍යාණමිත්ත සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි,' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක් වේද, එය උදාවන සූර්යයාට පෙරටු වන්නේය. එය පෙරනිමිත්ත වන්නේය. මහණෙනි, එමෙන්ම යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇති බවක් වේද? එය භික්ෂුවට ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදීම පිණිස

පූර්වංගම වන්නේය. එය පූර්වනිමිත්ත වන්නේය. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව විසින් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය කෙසේ වඩාද? නැවත නැවත කෙසේ වඩාද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුණාවූ සම්‍යක් දෘෂ්ටිය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුණාවූ සම්‍යක් සංකල්පය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරු කළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස සම්‍යක් වචනය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරු කළාවූ නිරෝධය ඇසුරුකළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් ආජීවය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුණු සම්‍යක් ව්‍යායාමය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් සතිය වඩයිද, විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ කෙලෙස් ප්‍රහාණය පිණිස නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේයයි" වදාළසේක.

---

## 2. සීලසම්පදා සූත්‍රය.

1. (මේ වර්ගයේ සියලු සූත්‍රවල පළමුවෙනි ඡෙද මේ වර්ගයේම පළමුවෙනි සූත්‍රයේ පළමුවෙනි ඡෙදය මෙන් වේ.)

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක් වේද, මෙය උදාවන සූර්යයාට පූර්වංගමය. පූර්වනිමිත්තය. මහණෙනි, එමෙන්ම මහණහට යම් ඒ සීලසම්පත්තියක් වේද, එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදීම පිණිස එය පූර්වංගමය පූර්ව නිමිත්තය. මහණෙනි, සීලසම්පන්න භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. නැවත නැවත වඩන්නේය යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, චතුපාරිශුද්ධි සීලයෙන් යුක්ත භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය කෙසේ වඩන්නේද? කෙසේ නැවත නැවත වඩන්නේද?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ තුන්වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි සීලයෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 3. ඡන්දසම්පදා සූත්‍රය.

2. "මහණෙනි, යම්බඳු අරුණෝදයක් වේද, එය උදාවන සූර්යයාට පූර්වංගමවේ. පූර්වනිමිත්ත වේ. මහණෙනි, එමෙන්ම යම් ඡන්ද සම්පත්තියක් වේද, එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නාවූ භික්ෂුවට පූර්වංගමය. පූර්වනිමිත්තය. මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය, යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුක්තවූ මහණතෙම කෙසේ නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේද?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඡන්ද සම්පත්තියෙන් යුක්තවූ මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 4. අත්තසම්පදා සූත්‍රය

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක් වේද එය උදාවන සූර්යයාට පූර්වංගමවේ, පූර්වනිමිත්තවේ. මහණෙනි, එමෙන්ම යම් ඒ චිත්ත සම්පත්තියක්වේද, එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නාවූ භික්ෂුවට පූර්වංගමය, පූර්වනිමිත්තය. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය. යන මෙය කැමති විය යුතුයි. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි චිත්ත සම්පත්තියෙන් යුක්තවූ මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 5. දිට්ඨිසම්පදා සූත්‍රය.

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක්වේද, එය උදාවන සූර්යයාට පූර්වංගමවේ. පූර්වනිමිත්තවේ. මහණෙනි, එමෙන්ම යම් ඒ ඥාණ සම්පත්තියක් වේද, එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය

වඩන්නාවූ භික්ෂුවට පූර්වංගම වේ. පූර්ව නිමිත්ත වේ. මහණෙනි, ඥාණසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, ඥාණසම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේද? කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේද?

**3.** (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

**4.** "මහණෙනි, මෙසේ වනාහි ඥාණ සම්පත්තියෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 6. අප්පමාද සම්පදා සූත්‍රය

**2.** "මහණෙනි, යම් ඒ අරුණෝදයක්වේද, එය උදාවන සූර්යයාට පූර්වංගම වේ. පූර්ව නිමිත්තවේ මහණෙනි එමෙන්ම යම් ඒ අප්‍රමාද සම්පත්තියක්වේද එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ භික්ෂුවට පූර්වංගමවේ, පූර්ව නිමිත්ත වේ. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද

**3.** (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

**4.** "මහණෙනි, මෙසේ වනාහී අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 7. යොනිසොමනසිකාර සම්පදා සූත්‍රය

2. “මහණෙනි, යම් ඒ අරුණෝදයක් වේද එය උදාවන සූර්යයාට පූර්වංගම වේ. පූර්ව නිමිත්තවේ. මහණෙනි, එමෙන්ම යම් ඒ උපායමනසිකාරයක් වේද? එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නාවූ භික්ෂුවට පූර්වංගම වේ. පූර්වනිමිත්තවේ. මහණෙනි, උපායමනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, උපායමනසිකාරයෙන් යුත් භික්ෂුව කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. “මහණෙනි, මෙසේ වනාහි උපායමනසිකාරයෙන් යුත් මහණ තෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි” වදාළසේක.

---

## 8. කළ්‍යාණමිත්තතාපුබ්බංගම සූත්‍රය

2. “මහණෙනි, යම් ඒ අරුණෝදයක්වේද? එය උදාවන සූර්යයාට පූර්වාංගමවේ. පූර්ව නිමිත්තවේ. මහණෙනි, එමෙන්ම යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇතිබවක්වේද එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උදාවන්නාවූ භික්ෂුවට පූර්වංගමය පූර්ව නිමිත්තය. මහණෙනි, කළ්‍යාණමිත්‍රයින් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි. යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, කළ්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. “මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රාගය දුරු කිරීම කෙළවරකොට ඇති ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට

ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් දෘෂ්ටිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් සංකල්පය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරු කිරීම කෙළවරකොට ඇති සම්‍යක් වචනය වඩයි. රාගය දුරු කිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් කර්මාන්තය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් ආජීවය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් ව්‍යායාමය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් සතිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් සමාධිය වඩයි.

**4.** "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 9. සීල පුබ්බංගම සූත්‍රය

**2.** "මහණෙනි, යම් ඒ අරුණෝදයක්වේද එය උදාවන සූර්යයාට පූර්වංගමවේ පූර්ව නිමිත්තවේ. මහණෙනි, යම් ඒ සීල සම්පත්තියක්වේද එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උදාවන්නාවූ මහණහට පූර්වංගම වේ. පූර්වනිමිත්ත වේ. මහණෙනි, සීල සම්පත්තියෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, සීල

සම්පත්තියෙන් යුත් භික්ෂුව කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි සීල සම්පත්තියෙන් යුත් මහණ තෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි වදාළසේක.

## 10. ඡන්දපුබ්බංගම සූත්‍රය

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක්වේද එය උදාවන සූර්යයාට පූර්වංගම වේ පූර්ව නිමිත්තවේ. මහණෙනි, එමෙන්ම යම් ඒ ඡන්ද සම්පත්තියක්වේද, එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නාවූ මහණහට පූර්වංගම වේ. පූර්ව නිමිත්ත වේ. මහණෙනි ඡන්දසම්පත්තියෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යන මෙය කැමති වියයුතුයි මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඡන්දසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

## 11. අත්තපුබ්බංගම සූත්‍රය

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක් වේද එය උදාවන සූර්යයාට පූර්වංගම වේ. පූර්ව නිමිත්ත වේ. මහණෙනි, එමෙන්ම යම් ඒ චිත්ත සම්පත්තියක් වේද? එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය

උපදවන්නාවූ මහණහට පූර්වංගම වේ, පූර්ව නිමිත්ත වේ. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යන මෙය කැමතිවිය යුතුය. මහණෙනි, චිත්තසම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද,

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මෙසේ වනාහී මහණතෙම චිත්ත සම්පත්තියෙන් යුක්තවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 12. දිට්ඨිපුබ්බංගම සූත්‍රය

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක් වේද එය උදාවන සූර්යයාට පූර්වංගම වේ. පූර්ව නිමිත්තවේ. මහණෙනි, එමෙන්ම යම් ඒ ඥාණසම්පත්තියක් වේද එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නාවූ මහණහට පූර්වංගමවේ. පූර්වනිමිත්තවේ. මහණෙනි, ඥාණසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නේය, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත උපදවන්නේය යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි ඥාණ සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද,

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහී ඥාණ සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි වදාළසේක.

---

## 13. අප්පමාද පුබ්බංගම සූත්‍රය

2. "මහණෙනි, යම් ඒ අරුණෝදයක් වේද එය උදාවන සූර්යයාට පූර්වංගමවේ. පූර්ව නිමිත්තවේ. මහණෙනි, එමෙන්ම යම් ඒ අප්‍රමාදසම්පත්තියක්වේද එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නාවූ මහණහට පූර්වංගමවේ. පූර්වනිමිත්තවේ. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත උපදවයි යන මෙය කැමති වියයුතුයි. මහණෙනි, අප්‍රමාදසම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවයිද ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත උපදවයිද,

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 14. යොනිසොමනසිකාර පුබ්බංගම සූත්‍රය.

2. "මහණෙනි, යම් ඒ අරුණොදයක් වේද එය උදාවන සූර්යයාට පූර්වංගමය පූර්වනිමිත්තය. මහණෙනි, එමෙන්ම යම් ඒ උපායමනසිකාරයක් වේද එය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදවන්නාවූ මහණහට පූර්වංගමවේ. පූර්වනිමිත්තවේ. මහණෙනි, උපායමනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, උපාය මනසිකාරයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහී උපායමනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 7. එකධම්ම පෙයයාල වර්ගය.

### 1. කල්‍යාණමිත්ත විවෙක නිස්සිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්හ. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළහ.

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීමට එක ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වෙයි. කවර නම් එක් ධර්මයක්ද යත්? යම් ඒ යම් කල්‍යාණ මිත්‍රයින් ඇති බවක් වේද එයයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යන මෙය කැමති විය යුතුයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්‍යක්

සංකල්පය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 2. සීලවිවෙක නිස්සිත සූත්‍රය.

1. (මේ වර්ගයේ සූත්‍ර සියල්ල ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "එක ධර්මයක් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය ඉපදවීමට බොහෝ උපකාරවෙයි. කවරනම් එකධර්මයක්ද? යම් ඒ සීල සම්පත්තියක් වේද එයයි. මහණෙනි, සීල සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ යන මෙය කැමති විය යුතුයි. මහණෙනි, සීල සම්පත්තියෙන් යුත් භික්ෂුව කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, මෙසේ වනාහී සීල සම්පත්තියෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

## 3. ඡන්දවිවෙක නිස්සිත සූත්‍රය.

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාර වෙයි. කවර එක ධර්මයක්ද? යම් ඒ ඡන්ද සම්පත්තියක් වේද එයයි. මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යන මෙය කැමති විය යුතුයි. මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඡන්ද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

## 4. අත්තවිවෙක නිස්සිත සූත්‍රය

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එකධර්මයක් බොහෝ උපකාර වෙයි. කවරනම් එක ධර්මයක්ද යත්? යම් ඒ චිත්ත සම්පත්තියක් වේද එයයි. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි' වදාළසේක.

---

## 5. දිට්ඨිවිවෙක නිස්සිත සූත්‍රය

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාර වේ. කවර එක ධර්මයක්ද යත්? යම් ඒ ඤාණ සම්පත්තියක්වේද එයයි. මහණෙනි, ඤාණ සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, ඤාණසම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඤාණ සම්පත්තියෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 6. අප්පමාදවිවෙක නිස්සිත සූත්‍රය

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයෙක් බොහෝ උපකාරවේ. කවර නම් එක ධර්මයක්දයත්? යම් ඒ අප්‍රමාද සම්පත්තියක්වේද එයයි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, අප්‍රමාද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි වදාළසේක.

---

## 7. යොනිසොවිවෙක නිස්සිත සූත්‍රය.

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාරවේ. කවරනම් එක ධර්මයක්දයත්? යම් ඒ උපායමනසිකාරයක් වේද එයයි. මහණෙනි, උපායමනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති වියයුතුයි. මහණෙනි, උපාය මනසිකාරයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි උපායමනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 8. කළ්‍යාණමිත්තවිරාග නිස්සිත සූත්‍රය

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාරය. කවරනම් එක

ධර්මයක්දයත්? යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇතිබවක් වේද එයයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති වියයුතුයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති භික්ෂුව කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවර කොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් දෘෂ්ටිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවර කොට ඇති, සම්‍යක් සංකල්පය වඩයි. රාගය දුරුකිරීම කෙළවර කොටඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති. සම්‍යක් වචනය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවර කොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් කර්මාන්තය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් ආජීවය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් ව්‍යායාමය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් සතිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරු කිරීම කෙළවරකොට ඇති සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 9. සීලවිරාග නිස්සිත සූත්‍රය.

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාර වෙයි. කවරනම් එක ධර්මයක්ද? යම් ඒ සීල සම්පත්තියක් වේද එයයි. මහණෙනි, සීල සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යන මෙය කැමති වියයුතුයි. මහණෙනි, සීලසම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි සීල සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 10. ඡන්දවිරාග නිස්සිත සූත්‍රය

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක් ධර්මයක් බොහෝ උපකාරවේ. කවර නම් එක ධර්මයක්ද? යම් ඒ ඡන්දසම්පත්තියක් වේද එයයි. මහණෙනි, ඡන්දසම්පත්තියෙන් යුත් භික්ෂුව ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුත් භික්ෂුව කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහී ඡන්දසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයියයි" වදාළසේක.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 11. අත්තවිරාග නිස්සිත සූත්‍රය

**2.** "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාරවේ. කවර නම් එක ධර්මයක්ද? යම් ඒ චිත්ත සම්පත්තියක් වේද එයයි. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, චිත්තසම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

**3.** (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

**4.** "මහණෙනි, මෙසේ වනාහි චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 12. දිට්ඨිවිරාග නිස්සිත සූත්‍රය.

**2.** "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාරවේ. කවරනම් එක ධර්මයක්ද? යම් ඒ ඤාණ සම්පත්තියක් වේද එයයි. මහණෙනි, ඤාණසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යනු කැමතිවිය යුතුයි. මහණෙනි, ඤාණසම්පත්තියෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

**3.** (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, මෙසේ වනාහි ඤාණ සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 13. අප්පමාද විරාග නිස්සිත සූත්‍රය.

2. "මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එක ධර්මයක් බොහෝ උපකාරවෙයි. කවර නම් එක ධර්මයක්ද යත්? යම් ඒ අප්‍රමාද සම්පත්තියක් වේද එයයි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 14. යොනිසො විරාග නිස්සිත සූත්‍රය

2. "මහණෙනි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ඉපදවීම පිණිස එකධර්මයක් බොහෝ උපකාරවෙයි. කවරනම් එක ධර්මයක්ද? යම් ඒ උපායමනසිකාරයක් වේද? එයයි. මහණෙනි, උපායමනසිකාර සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යනු කැමතිවිය යුතුයි. මහණෙනි, උපාය මනසිකාර සම්පත්තියෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයිද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි උපායමනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 8. එකධම්ම පෙය්‍යාල 2 වර්ගය

### 1. කල්‍යාණමිත්ත සම්පදා එකධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නූපදීද, උපදින්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇති බවක් වේද, එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොදකිමි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේද, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේද?

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය

ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සංකල්පය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයි විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේයයි" වදාළසේක.

---

## 2. සීල (1 වෙනි) සම්පදා එකධම්ම සූත්‍රය.

(මෙතැන් සිට ඇති මේ වර්ගයේ අනිත් සූත්‍රවල 1 ඡේද මේ වර්ගයේ මුල් සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නූපදීද උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ සීල සම්පදාවක් වේද, එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොදකිමි. මහණෙනි, සීල සම්පදාවෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, සීලසම්පදාවෙන් යුත් මහණ තෙම මෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ තුන්වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි සීල සම්පදාවෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේයයි" වදාළසේක.

---

## 3. ඡන්ද (1 වෙනි) සම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ ඡන්ද සම්පදාවක් වේද, එබඳුවූ අන් එක ධර්මයකුදු නුවණැසින් මම නොදකිමි. මහණෙනි, ඡන්ද සම්පදාවෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ තුන්වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඡන්ද සම්පදාවෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේයයි" වදාළසේක.

---

## 4. අත්ත (1 වෙනි) සම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, යම් ඒ චිත්ත සම්පදාවක් වේද, එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොම දකිමි. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි,

චිත්ත සම්පත්තියෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ තුන්වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 5. දිට්ඨි (1 වෙනි) සම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ ඤාණ සම්පත්තියක් වේද? එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොම දකිමි. ඤාණ සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි ඤාණ සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ තුන්වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඤාණ සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 6. අප්පමාද (1 වෙනි) සම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ අප්‍රමාද සම්පත්තියක් වේද, එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොම දකිමි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ තුන්වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි මෙසේ වනාහි අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 7. යොනිසො (1 වැනි) මනසිකාර සම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොටගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, යම් ඒ උපාය මානසිකාර සම්පත්තියක් වේද, එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොදකිමි. මහණෙනි, උපාය මනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යනු කැමතිවිය යුතුයි. උපායමනසිකාරයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ තුන්වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි උපායමනසිකාරයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේයයි" වදාළසේක.

---

## 8. (2 වෙනි) කල්‍යාණමිත්තසම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද? මහණෙනි, යම් ඒ කල්‍යාණ මිත්‍රයින් ඇති බවක් වේද, එබඳුවූ අන් ධර්මයකුදු නුවණැසින් මම නොමදකිමි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේය යනු කැමතිවිය යුතුයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රාගය දුරු කිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මෝහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් දෘෂ්ටිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මෝහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් සංකල්පය වඩයි. රාගය දුරුකිරීම, කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරු කිරීම කෙළවරකොට ඇති සම්‍යක් වචනය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවර කොට ඇති, මෝහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් කර්මාන්තය වඩයි. රාගය දුරුකිරීම කෙළවර කොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මෝහය දුරුකිරීම කෙළවරකොට ඇති,

සම්‍යක් ආජීවය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති ද්වෙෂය දුරු කිරීම කෙළවරකොට ඇති, මෝහය දුරුකිරීම කෙළවර කොට ඇති සම්‍යක් ව්‍යායාමය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති මෝහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් සතිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති, මෝහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයින් ඇති මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි වදාළසේක.

---

## 9. (2 වෙනි) සීලසම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොටගෙන නූපන්නාහු ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද? උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ සීලසම්පත්තියක් වේද? එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොමදකිමි. මහණෙනි, සීලසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, සීල සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය කෙසේ වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි කල්‍යාණමිත්ත සම්පදා ඒකධම්ම සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි සීලසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 10. ඡන්දසම්පදා (2 වෙනි) එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොටගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද? උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ ඡන්ද සම්පත්තියක් වේද? එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොදකිමි. මහණෙනි, ඡන්ද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, ඡන්දසම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි කල්‍යාණමිත්ත සම්පදා එකධම්ම සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඡන්දසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 11. අත්ත සම්පදා (2 වෙනි) එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොටගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ චිත්තසම්පත්තියක් වේද, එබඳු අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොම දකිමි. මහණෙනි, චිත්තසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි කල්‍යාණමිත්ත සම්පදා එකධම්ම සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, මෙසේ වනාහි චිත්ත සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

## 12. දිට්ඨි සම්පදා නිස්සිත (2 වෙනි) එකධම්ම සූත්‍රය

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොටගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද, උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද, මහණෙනි, යම් ඒ ඥාණසම්පත්තියක් වේද, එබඳු අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොම දකිමි. මහණෙනි, ඥාණසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, ඥාණ සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ දෙවෙනි කල්‍යාණමිත්ත සම්පදා එකධම්ම සූත්‍රයේ තුන්වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ඥාණසම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

## 13. (2 වෙනි) අප්පමාද සම්පදා එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද මහණෙනි, යම් ඒ අප්‍රමාද සම්පත්තියක් වේද, එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොදකිමි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය

අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි කල්‍යාණ මිත්ත සම්පදා, ඒකධම්ම සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි අප්‍රමාද සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 14. (2 වෙනි) යොනිසො මනසිකාර එකධම්ම සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්මයක් හේතුකොට ගෙන නූපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය උපදීද? උපන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේද මහණෙනි, ඒ මේ උපායමනසිකාර සම්පත්තියයි, එබඳුවූ අන් එකම ධර්මයකුදු නුවණැසින් මම නොමදකිමි. මහණෙනි, උපායමනසිකාර සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, උපාය මනසිකාර සම්පත්තියෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි කල්‍යාණ මිත්ත සම්පදා, ඒකධම්ම සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි උපායමනසිකාර සම්පත්තියෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

**දෙවන එකධම්මපෙය්‍යාලයයි.**

---

## 9. ගංගාපෙය්‍යාල වර්ගය

### පඨම පාචීනනින්න සූත්‍රය

1. මේ වර්ගයේ සූත්‍ර සියල්ල ජේතවනාරාමයේදී දේසනා කරන ලදී. - 8 වෙනි වර්ගයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "මහණෙනි, ගංගානම් ගඟ පෙරදිගට නැමී පෙර දිගට හැරී පෙරදිගට බරව පවත්නේ යම්සේද? මහණෙනි, එසේම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ මහණතෙම නිවනට නැමුණේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වෙයි. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ මහණතෙම කෙසේ නිවනට නැමුණේද නිවනට හැරුණේ නිවනට බරවූයේවේද?

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයිද, විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් සංකල්පය වඩයිද, විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයිද විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයිද, විවේකය අසුරු කළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයිද, විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයිද, විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයිද විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයිද

4. "මහණෙනි, මෙසේ වනාහී ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණ තෙම නිවනට නැමුණේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වේයයි වදාළසේක.

---

## 2. දුතිය පාචීනනින්න සූත්‍රය.

2. "මහණෙනි, යමුනා නම් ගඟ පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට බරව පවත්නේ යම්සේද? මහණෙනි, එසේම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක්, නිවනට බරවූවෙක් වෙයි. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ මහණතෙම කෙසේ නිවනට හැරුණෙක්, නිවනට නැමුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද,

3, 4. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡේද මෙන් වේ.)

---

## 3. තතිය පාචීනනින්න සූත්‍රය.

2. "මහණෙනි, අචිරවතී නම් ගඟ පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට බරව පවත්නේ යම්සේද? මහණෙනි, එසේම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේය.

"මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ මහණතෙම කෙසේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වන්නේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3, 4. (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡේද මෙන්වේ.)

---

## 4. චතුත්ථ පාචීනනින්න සූත්‍රය

2. "මහණෙනි, සරභූ ගඟ පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට බරව පවත්නේ යම්සේද? මහණෙනි, එසේම මහණතෙම ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේය. මහණෙනි, ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ මහණතෙම කෙසේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද?

3, 4. (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡේද මෙන් වේ.)

---

## 5. පඤ්චම පාචීනනින්න සූත්‍රය

2. "මහණෙනි, මහී නම් ගඟ පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට බරව පවත්නේ යම්සේද? මහණෙනි, එසේම මහණතෙම ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වන්නේය.

"මහණෙනි, ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ මහණතෙම කෙසේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද?

3, 4. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡේද මෙන් වේ.)

---

## 6. ඡට්ඨ පාචීනනින්න සූත්‍රය

**2.** "මහණෙනි, යම් ඒ මහා ගංගාවෝ වෙද්ද? එනම් ගංගා, යමුනා, අචිරවතී, සරභූ මහී යන මොහුය. යම්සේ ඒ සියලු ගංගාවෝ පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට බරව පවත්නාහුද?

"මහණෙනි, එමෙන්ම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වෙයි. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ මහණතෙම කෙසේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වන්නේ ද,

**3, 4.** (මේ ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡෙද මෙන් වේ.)

---

## 7. පඨම සමුද්දනින්නි සූත්‍රය.

**2.** "මහණෙනි, යම්සේ ගංගානම් ගඟ මුහුදට නැමී මුහුදට හැරී, මුහුදට බරව, පවත්නේවේද? මහණෙනි, එමෙන්ම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වෙයි. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද?

**3, 4.** (මේ ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡෙද මෙන් වේ.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 8. දුතිය සමුද්දනින්න සූත්‍රය

2. "මහණෙනි, යම්සේ යමුනා ගඟ මුහුදට නැමී මුහුදට හැරී මුහුදට බරව පවත්නේවේද? මහණෙනි, එමෙන්ම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේය. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වන්නේද?

3, 4. (මේ ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡෙද මෙන් වේ.)

---

## 9. තතිය සමුද්දනින්න සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ අචිරවතී ගඟ මුහුදට නැමී මුහුදට හැරී මුහුදට බරව පවත්නේ වේද, මහණෙනි, එමෙන්ම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වෙයි. මහණෙනි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද?

3, 4. (මේ ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡෙද මෙන් වේ.)

---

## 10. චතුත්ථ සමුද්දනින්න සූත්‍රය.

2. "මහණෙනි, යම් සේ සරභූ ගඟ මුහුදට නැමී, මුහුදට හැරී මුහුදට බරව පවත්නේවේද, මහණෙනි, එමෙන්ම මහණ තෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික

මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේය. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද?

3, 4. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡේද මෙන් වේ.)

---

## 11. පඤ්චම සමුද්දනින්න සූත්‍රය

2. "මහණෙනි, යම්සේ මහී නම් ගඟ මුහුදට නැමී මුහුදට හැරී, මුහුදට බරව පවත්නේවේද? මහණෙනි, එමෙන්ම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වන්නේය. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද?

3, 4. (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡේද මෙන් වේ.)

---

## 12. ඡට්ඨ සමුද්ද නින්න සූත්‍රය

2. "මහණෙනි, යම්සේ යම් ඒ මහා ගංගාවෝ වෙත්ද එනම් ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන මොහුය. යම් සේ ඒ සියලු ගංගාවෝ මුහුදට නැමී, මුහුදට හැරී මුහුදට බරව පවත්නාහුද? මහණෙනි, එසේම වනාහි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම නිවනට නැමුණෙක්, නිවනට හැරුනෙක්, නිවනට බරවූවෙක් වන්නේය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ

නිවනට නැමුණෙක්, නිවනට හැරුණෙක්, නිවනට බරවූවෙක් වන්නේද?

3, 4. (මේ ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි 4 වෙනි ඡෙද මෙන් වේ.)

---

## 10. අප්පමාද වර්ගය

### 1. පඨම අප්පමාද සූත්‍රය.

1. (මේ වර්ගයේ සූත්‍ර සියල්ල ජේතවනාරාමයේදී දේශනා කරන ලදී. - 8 වෙනි වර්ගයේ 1 වෙනි ඡෙදය මෙනි)

2. "මහණෙනි, පා නැත්තාවූ හෝ දෙපා ඇත්තාවූ හෝ සිව්පාවූ හෝ බොහෝ පා ඇත්තාවූ හෝ රූපීවූ හෝ අරූපී හෝ සඤ්ඤීවූ හෝ අසඤ්ඤීවූ හෝ නෙවසඤ්ඤී නාසඤ්ඤීවූ හෝ යම් පමණ සත්වයෝ වෙද්ද, ඔවුන් අතුරෙන් අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙමේ ශ්‍රේෂ්ඨයයි කියයි. මහණෙනි, එසේම වනාහී යම් ඒ කුසල ධර්මයෝ වෙද්ද, ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි ඇතුළත් වෙත්. ඒ කුසල ධර්මයන්ට අප්‍රමාදය අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි අප්‍රමාදයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවේකය අසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක්

සංකල්පය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහී අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළ සේක.

---

## 2. දුතිය අප්පමාද සූත්‍රය.

1. (මෙතැන් සිට මේ වර්ගයේ 1 ඡෙද මේ වර්ගයේ මුල් සූත්‍රයේ 1 ඡෙදය මෙනි)

2. "මහණෙනි, ගොඩ ඇවිදින සත්වයන්ගේ යම් පාදයෝ වෙත්ද ඒ සියල්ල ඇත්පියවරෙහි ඇතුළත් වෙත්. මහත් කමින් ඒ සියලු පාදයන් අතුරෙන් ඇත්පිය අග්‍රයයි කියයි. මහණෙනි, එසේ වනාහී යම් ඒ කුසල ධර්මයෝ වෙද්ද? ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි සංග්‍රහ වෙත්. ඒ කුසල ධර්මයන්ට අප්‍රමාදය අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණ තෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3, 4. (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේද මෙන් වේ.)

---

## 3. තතිය අප්පමාද සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ කූටාගාරයාගේ යම් ඒ පරාලවෙද්ද ඒ සියල්ල මුදුන අනුව ගියාහු වෙත්. මුදුනට නැමුණාහු වෙත්. මුදුනෙහි සංග්‍රහ වේ. ඒ පරාලවලට මුදුන අග්‍රයයි කියයි. මහණෙනි, එසේම වනාහි යම් ඒ කුසල ධර්මයෝ වෙද්ද, ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි සංග්‍රහ වෙත්. ඔවුන්ට අප්‍රමාදය අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3, 4. (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේද මෙන් වේ)

---

## 4. චතුත්ථ අප්පමාද සූත්‍රය.

2. "මහණෙනි, යම්කිසි සුවඳැති මුල් වර්ග වෙද්ද? ඔවුන් අතුරෙන් කලුවැල් මුල් අග්‍රයයි කියයි. මහණෙනි, එමෙන්ම යම් ඒ කුසල ධර්මයෝ වෙද්ද? ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. ඒ සියල්ල අප්‍රමාදයෙහි ඇතුළත් වෙත්. අප්‍රමාදය ඒ කුසල ධර්මයන්ට අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3, 4. (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේද මෙන් වේ)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 5. පංචම අප්පමාද සූත්‍රය.

**2.** "මහණෙනි, යම්සේ යම්කිසි සුවඳැති අරටු වෙත්ද ඔවුන් අතුරෙන් රත් සඳුන් අග්‍රයයි කියයි. මහණෙනි, එමෙන්ම වනාහී යම් ඒ කුසල ධර්මයෝ වෙත්ද? ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. ඒ සියල්ල අප්‍රමාදයෙහි ඇතුළත් වෙත්. ඒ ධර්මයන්ට අප්‍රමාදය අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණ තෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

**3, 4.** (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේද මෙන් වේ.)

---

## 6. ඡට්ඨ අප්පමාද සූත්‍රය

**2.** "මහණෙනි, යම්සේ වනාහි යම් ඒ සුවඳ මල් ජාතීහු වෙත්ද? ඒ සියලු සුවඳ මල් අතුරෙන් දෑසමන් මල් අග්‍රයයි කියයි. මහණෙනි, එසේම වනාහී යම් ඒ කුසල ධර්මයෝ වෙත්ද? ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි ඒ සියල්ල ඇතුළත් වෙත්. අප්‍රමාදය ඒ සියලු කුසල ධර්මයන්ට අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණ තෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමතිවිය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

**3, 4.** (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේද මෙන් වේ.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 7. සත්ත අප්පමාද සූත්‍රය

**2.** "මහණෙනි, යම් සේ යම් ඒ කුඩා රජවරු වෙද්ද? ඒ සියලුදෙනා සක්විති රජුට අනුව පවත්නාහු වෙත්. ඔවුන් අතුරෙන් සක්විති රජතෙම අග්‍රයයි කියයි. මහණෙනි, එසේම වනාහි යම් කුසල ධර්මයෝ වෙද්ද? ඒ සියල්ල අප්‍රමාදය මුල් කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි ඒ සියල්ල ඇතුළත් වෙත් අප්‍රමාදය ඒ සියලු කුසල ධර්මයන්ට අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

**3, 4.** (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේදමෙන් වේ.)

---

## 8. අට්ඨම අප්පමාද සූත්‍රය

**2.** "මහණෙනි, යම්සේ යම් ඒ තාරකාවන්ගේ ආලොකයක් වේද? ඒ සියල්ල චන්ද්‍රාලොකයෙන් සොළොස්වැනි කලාවකටද නොඅගී. චන්ද්‍රාලෝකය ඒ සියල්ල අතරෙන් අග්‍රයයි කියයි. මහණෙනි, එසේම වනාහි යම් ඒ කුසල ධර්මයෝ වෙද්ද? ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි ඒ සියල්ල ඇතුළත් වෙත්. අප්‍රමාදය ඒ සියලු කුසල ධර්මයන්ට අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණ තෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, මේ අප්‍රමාදයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

**3, 4.** (මේ ඡේද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේද මෙන් වේ)

---

## 9. නවම අප්පමාද සූත්‍රය.

**2.** "මහණෙනි, යම්සේ සරත් කාලයෙහි වළාකුල් හා වර්ෂාව පහවීමෙන් පිරිසිදුවූ අහසට නැඟී සූර්යයා අහසෙහිවූ සියලු අන්ධකාරය පහකොට ආලෝක කරන්නේද දිලිසෙන්නේද බබලන්නේද වෙයි. මහණෙනි, එමෙන්ම වනාහී යම් ඒ කුසල ධර්මයෝ වෙද්ද? ඒ සියල්ල වනාහී අප්‍රමාදය මුල් කොට ඇත්තාහ. අප්‍රමාදයෙහි ඒ සියල්ල ඇතුළත් වෙත්. අප්‍රමාදය ඒ සියලු කුසල ධර්මයන්ට අග්‍රය. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

**3, 4.** (මේ ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡෙද මෙන් වේ)

---

## 10. දසම අප්පමාද සූත්‍රය.

**2.** "මහණෙනි, යම්සේ යම් ඒ නූල්වලින් වියනලද වස්ත්‍ර අතුරෙන් කසී වස්ත්‍ර අග්‍රයයි කියයි. මහණෙනි, එසේම වනාහී යම් ඒ කුසල ධර්මයෝ වෙද්ද? ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. ඒ සියල්ල අප්‍රමාදයෙහි ඇතුළත් වෙත්. අප්‍රමාදය ඒ කුසල ධර්මයන්ට අග්‍රයයි කියයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය නැවත නැවත වඩයි යනු කැමති විය යුතුයි. මහණෙනි, අප්‍රමාදයෙන් යුත් මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාංගික මාර්ගය නැවත නැවත වඩාද?

3, 4 (මේ ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡෙද මෙන් වේ)

---

# 11. බලකරණීය වර්ගය.

## 1. පඨවි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහු විසින් කරන ලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා ඒ භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "යම්සේ මහණෙනි, යම්කිසි ශරීර බලයෙන් කළයුතු ක්‍රියා ඇද්ද, ඒ සියලු ශරීර බලයෙන් කළ යුතු ක්‍රියා පොළොව නිසා පොළොවෙහි පිහිටාම කරත්. මහණෙනි, එසේම මහණතෙම සීලය නිසා සීලයෙහි පිහිටාම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩයි. මහණෙනි, මහණතෙම සීලය නිසා සීලයෙහි පිහිටාම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්‍යක් සංකල්පය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයි විවේකය ඇසුරු කළ විරාගය ඇසුරුකළ නිරෝධය

ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම සීලය නිසා සීලයෙහි පිහිටාම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය නැවත නැවත වඩායයි" වදාළසේක.

---

## 2. බීජගාම භූතගාම සූත්‍රය.

1. (මේ සූත්‍ර සියල්ලේම ඡෙද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ මෙනි.)

2. මහණෙනි, යම්කිසි ගස්වැල් ජාතීහු වැඩීමට මහත් බවට පැමිණේද ඒ සියල්ල ගස්වැල් ජාතීහු පොළොව නිසාම පොළොවෙහි පිහිටාම යම්සේ වැඩෙත්ද, මහණෙනි, එසේම මහණතෙම සීලය නිසාම සීලයෙහි පිහිටාම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ධර්මයන්හි වැඩීමට නැගීමට මහත් බවට පැමිණෙයි. මහණෙනි, මහණතෙම කෙසේ සීලය නිසා ශුද්ධිසීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ධර්මයන්හි වැඩීමට නැගීමට මහත් බවට පැමිණෙයිද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම සීලය නිසා සීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ධර්මයන්හි වැඩීමට නැගීමට මහත් බවට පැමිණේයයි" වදාළසේක.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 3. හිමවන්ත සූත්‍රය.

**2.** මහණෙනි, හිමවත් පර්වත රාජ්‍ය නිසා නාගයෝ කය වඩා ගනිත්. බලගන්වත්. ඔව්හු එහිදී කය වඩාගෙන බලගන්වා කුඩා වලවල්වලට බසිත්. කුඩා වලවල්වලට බැස මහවලවල්වලට බසිත්. මහවලවල්වලට බැස කුඩා ගංගාවලට කුඩා ගංගාවලට බැස මහ ගංගාවලට බසිත්. මහ ගංගාවලට බැස මහ මුහුදට මහා සාගරයට බසිත්. ඔව්හු එහිදී කයින් මහත් බවට විශාල බවට පැමිණෙත්. මහණෙනි. එසේම වනාහි මහණතෙම සීලය නිසා සීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ධර්මයන්හි මහත් බවට හා විශාල බවට පැමිණේ. මහණෙනි, මහණතෙම කෙසේ සීලය නිසා සීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ධර්මයන්හි මහත් බවට හා විශාල බවට පැමිණේද?

**3.** (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

**4.** "මහණෙනි, මෙසේ වනාහී මහණතෙම සීලය නිසා සීලයෙහි පිහිටා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ධර්මයන්හි වැඩීමට නැගීමට මහත් බවට පැමිණේයයි" වදාළසේක.

---

## 4. රුක්ඛ සූත්‍රය.

**2.** "යම්සේ මහණෙනි, පෙරදිගට නැමුනු පෙරදිගට හැරුණු පෙරදිගට බරවූ වෘක්ෂයතෙම මුල් කැපූ කල්හි කිනම් පැත්තකට වැටෙන්නේද?

"ස්වාමීනි, යම් දිගකට නැමුනේද? යම් දිගකට හැරුණේද යම් දිගකට බරව පවත්නේද? ඒ දිගට වැටෙයි."

"මහණෙනි, එසේම වනාහි මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත

වඩන්නේ නිවනට නැමුනේ නිවනට හැරුණේ නිවනට බරව පවත්නේ වේ. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ නිවනට නැමුනේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වේද?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වේයයි" වදාළසේක.

---

## 5. කුම්භ සූත්‍රය.

**2.** "යම්සේ මහණෙනි, යටිකුරුකල කළය ජලය වගුරුවයි. එහි ජලය නොරඳයි. මහණෙනි, එසේම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ලාමක අකුසල ධර්මයන් වමාරයි. ඒ අකුසල ධර්මයන් නොරඳයි. මහණෙනි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ ලාමක අකුසල ධර්මයන් වමාරාද, ලාමක අකුසල ධර්මයන් නොරඳාද?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, මෙසේ වනාහී මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ ලාමක අකුසල ධර්මයන් වමාරයි. ලාමක අකුසල ධර්මයන් නොරඳායයි" වදාළසේක.

---

## 6. සූක සූත්‍රය.

2. "යම්සේ මහණෙනි, මනාව කෙළින් තැබූ හැල් වී නණ්ඩුවක් හෝ යව වී නණ්ඩුවක් අතින් ඇල්ලූකල හෝ පයින් පෑගූ කල අත හෝ පය කැපෙයි. ලේ හෝ ගලයි යන මේ කාරණය විද්‍යමාන වෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, නණ්ඩුව මනාකොට තබනලද හෙයිනි. එමෙන්ම වනාහි ඒකාන්තයෙන් ඒ මහණතෙම මනාකොට තබනලද දෘෂ්ටියෙන් මනාකොට තබනලද මාර්ග භාවනාවෙන් අවිද්‍යාව සිඳියි. විද්‍යාව උපදවයි. නිවන ප්‍රත්‍යක්ෂ කරයි යන මේ කාරණය විද්‍යමානයි. ඊට හේතු කවරේද යත්. මහණෙනි, දෘෂ්ටිය මනාකොට තබනලද හෙයිනි. මහණෙනි, මනාකොට පිහිටුවන ලද දෘෂ්ටියෙන් මනාකොට පිහිටුවනලද මාර්ග භාවනාවෙන් මහණතෙම කෙසේ අවිද්‍යාව සිඳීද? විද්‍යාව උපදවයිද? නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම මනාකොට පිහිටුවනලද දෘෂ්ටියෙන් මනාකොට පිහිටුවන මාර්ග භාවනාවෙන් අවිද්‍යාව සිඳියි. විද්‍යාව උපදවයි. නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේයයි" වදාළසේක.

---

## 7. ආකාස විවෙක නිස්සිත සූත්‍රය

2. "මහණෙනි, යම්සේ අහසෙහි වාතයෝ හමත්ද, පෙරදිගින්ද වාතයෝ හමත්. අපරදිගින්ද වාතයෝ හමත්. උතුරුදිගින්ද වාතයෝ හමත්. දකුණු දිගින්ද වාතයෝ හමත්. දූලි සහිත වාතයෝද හමත්. දූලි රහිත වාතයෝද හමත්. සීත වාතයෝද හමත්. උෂ්ණ වාතයෝද හමත්. කුඩා වාතයෝද හමත්. මහත් වාතයෝද හමත්. මහණෙනි, එසේම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණහට සතර සතිපට්ඨානයෝද වැඩීමට සම්පූර්ණවීමට

පැමිණෙත්. සතර සම්‍යක් ප්‍රධාන වීර්‍යයෝද වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙත්. සතර ඍද්ධිපාදයෝද වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙත්. පඤ්චින්ද්‍රියෝද වැඩීමට සම්පුර්ණවීමට පැමිණෙත්. පඤ්ච බලයෝද වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙත්. සත්තබොජ්ඣංගයෝද වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙත්. ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණහට කෙසේ සතර සතිපට්ඨානයෝද, සතර සම්‍යක් ප්‍රධානයෝද, සතර ඍද්ධිපාදයෝද, පඤ්චින්ද්‍රියයෝද, පඤ්චබලයෝද, සත්තබොජ්ඣංගයෝද වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙත්ද?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණහට සතර සතිපට්ඨානයෝද, සතර සම්‍යක් ප්‍රධානයෝද සතර ඍද්ධිපාදයෝද, පඤ්චින්ද්‍රියයෝද, පඤ්ච බලයෝද, සත්තබොජ්ඣංගයෝද වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙත්යයි" වදාළසේක.

---

## 8. රජෝජල්ල සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ ගිම්හාන ඍතුයෙහි අවසාන (ඇසළ) මාසයෙහි දූවිලි කඳන් නගින්නේ වේද, ඒ දූවිලි කඳන් මහත් අකල් වැස්සකින් අතුරුදහන් කෙරේද සංසිඳවයිද, මහණෙනි, එමෙන්ම වනාහි ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම උපන් උපන් ලාමක අකුසල ධර්මයන් සම්පූර්ණයෙන් අතුරුදහන් කෙරෙයි. සංසිඳවයි. මහණෙනි, ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණ තෙම කෙසේ උපන් උපන් ලාමක අකුසල ධර්මයන් සම්පූර්ණයෙන් අතුරුදහන් කෙරේද? සංසිඳවයිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණ තෙම උපන් උපන් අකුසල ධර්මයන් සම්පූර්ණයෙන් අතුරුදන් කරයි. සංසිඳුවායි යයි" වදාළසේක.

---

## 9. මහාමෙඝ සූත්‍රය

3. "මහණෙනි, යම්සේ මහා වාතය තෙමේ හටගත් මහ වැස්ස අතරතුරදී අතුරුදහන් කෙරේද සංසිඳවයිද, මහණෙනි, එසේම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම උපන් උපන් ලාමක අකුසල ධර්මයන් අතරතුරදීම අතුරුදහන් කරයි. සංසිඳවයි. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ උපන් උපන් ලාමක අකුසල ධර්මයන් අතරතුරදී අතුරුදන් කරයිද සංසිඳුවයිද.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ උපන් උපන් ලාමක අකුසල ධර්මයන් අතරතුරදීම අතුරුදන් කරයි, සංසිඳවායයි" වදාළසේක.

---

## 10. නාවා සූත්‍රය

2. "මහණෙනි, යම් සේ වේවැල්වලින් බඳිනලද සය මාසයක් ජලයෙහි තිබුණු මුහුදෙහි ගමන්කරන ඔරුවක් හේමන්ත කාලයෙහි ගොඩබිමට අදනාලද්දේවේද එහි අවු සුළඟින් වියලීගිය බැමි වර්ෂා කාලයෙහි හටගත් මහා වැස්සෙන් ලෙහෙසියෙන් ලිහී යන්නේද, දිරා යන්නේද මහණෙනි, එසේම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය

නැවත නැවත වඩන මහණහුගේ සංයෝජනයෝ ලෙහෙසියෙන්ම සංසිඳී යත්, දිරා යත්. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණහුගේ සංයොජනයෝ කෙසේ සංසිඳීමට යත්ද දිරීමට යත්ද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණහුගේ සංයෝජනයෝ පහසුවෙන් සංසිඳීමට යත් දිරීමට යත්යයි" වදාළසේක.

---

## 11. ආගන්තුකාගාර සූත්‍රය

2. "මහණෙනි, යම්සේ ආගන්තුකාගාරයක් (ආගන්තුකයන් නවතින ගෙයක්) වේද? එහි පෙරදිගින්ද පැමිණ වාසය කරත්, පශ්චිම දිසාවෙන්ද පැමිණ වාසය කරත්. උතුරු දිගින් පැමිණ වාසය කරත්. දකුණු දිගින් පැමිණ වාසය කරත්. ක්ෂත්‍රියයෝද පැමිණ වාසය කරත්. බ්‍රාහ්මණයෝද පැමිණ වාසය කරත්. වෛශ්‍යයෝද පැමිණ වාසය කරත්. ශුද්‍රයෝද පැමිණ වාසය කරත්.

"මහණෙනි, එසේම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ යම් ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් පිරිසිඳ දැනගත යුත්තාහුද ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් පිරිසිඳ දැනගනී. යම් ධර්මකෙනෙක් විශෙෂඥානයෙන් පහකළ යුත්තාහුද ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් පහකරයි. යම් ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කරයි. යම් ධර්ම කෙනෙක් විශේෂ ඥානයෙන් වැඩිය යුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් වඩයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, කවර ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් පිරිසිඳ දැනගතයුත්තාහුද, පඤ්ඤා උපාදානස්කන්ධයෝයයි කිවයුතුයි. කවර පසෙක්ද? ඒ මෙසේයි. රූපඋපාදානස්කන්ධය වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යන මොහුයි.

"මහණෙනි, මේ ධර්මයෝ වනාහි විශෙෂ ඥානයෙන් පිරිසිඳ දැනගතයුත්තාහුය.

4. "මහණෙනි, කවර ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් පහකළයුත්තාහුද? මහණෙනි, අවිද්‍යාවද, භව තෘෂ්ණාවද යන මොහුයි. මහණෙනි, මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් පහකළ යුත්තාහුය.

5. "මහණෙනි, කවර ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කළයුත්තාහුද? මහණෙනි. මාර්ගඵල නිර්වාණ යන මොහුය. මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහුය.

6. "මහණෙනි, කවර ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් වැඩියයුත්තාහුද? මහණෙනි, සමථයද, විදර්ශනාවද වෙයි. මහණෙනි, මේ ධර්මයෝ විශෙෂ ඥානයෙන් වැඩිය යුත්තාහ. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම කෙසේ යම් ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් පිරිසිඳ දැනගතයුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් පිරිසිඳ දැනගන්නේද, යම් ඒ ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් පහකළ යුත්තාහුද ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් පහකරන්නේද? යම් ඒ ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් ප්‍රතක්ෂ්‍ය කටයුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කරන්නේද, යම් ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් වැඩියයුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් වඩන්නේද?

7. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

8. "මෙසේ වනාහි මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ යම් ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් පිරිසිඳ දතයුත්තාහුද ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් පිරිසිඳ දැනගනී. යම් ධර්ම කෙනෙක් විශෙෂ ඥානයෙන් පහකළ යුත්තාහුද? ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් පහකරයි. යම් ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කළයුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කරයි. යම් ධර්මකෙනෙක් විශෙෂ ඥානයෙන් වැඩිය යුත්තාහුද, ඒ ධර්මයන් විශෙෂ ඥානයෙන් වඩන්නේ යයි" වදාළසේක.

---

## 12. ගංගානදී සූත්‍රය

2. "මහණෙනි, යම්සේ ගංගානම් ගඟ පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට බරව පවත්නේ වේද? මෙසේ පවත්නා කල්හි මහජන සමූහයක් උදලු හා කූඩා රැගෙන 'අපි මේ ගංගා නදිය පශ්චිම දිශාවට නැමී පශ්චිම දිසාවට හැරී පශ්චිම දිසාවට බරව පවත්නක් කරන්නෙමුයි' එන්නේය.

"මහණෙනි, ඒ කුමකැයි සිතව්ද? ඒ මහජන සමූහයා ඒ ගංගානම් මහ නදිය පශ්චිම දිසාවට නැමී පශ්චිම දිසාවට හැරී පශ්චිම දිසාවට බරව පවත්නක් කරන්නේද?" "ස්වාමීනි, එය එසේ නොවේ."

"ඊට හේතුව කවරේද?"

"ස්වාමීනි, ගංගානම් නදිය පෙර දිගට නැමී, පෙරදිගට හැරී, පෙරදිගට බරව පවත්නීය. ඒ නදිය පශ්චිම දිසාවට නැමී පශ්චිම දිසාවට හැරී, පශ්චිම දිසාවට බරව පවත්නක් කිරීම ලෙහෙසි නැත. හුදෙක් ඒ මහජන සමූහයා ක්ලාන්ත බවට වෙහෙසීමට පැමිණෙන්නේය."

3. "මහණෙනි, එසේම මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත

වඩන්නේ රජවරු හෝ රජමහ ඇමතියෝ හෝ මිත්‍රයෝ හෝ අසල්වැස්සෝ හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ 'පින්වත් පුරුෂය, මෙසේ කුමක් හෙයින් නුඹ කසට වස්ත්‍ර දරන්නෙහිද? කුමක් හෙයින් හිස මුඩුකොට කබලක් ගත් අත් ඇතිව හැසිරෙන්නෙහිද?

'එව, ගිහියෙක්ව, භොග සම්පත්ද අනුභව කරව. පිංද කරවයි' කියන්නාහු නම් මහණෙනි, ඒකාන්තයෙන් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නාවූ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නාවූ ඒ මහණතෙම ශික්ෂාව (උපසම්පදාව) ප්‍රතික්ෂේපකොට ගිහි බවට පෙරළෙන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවෙයි. ඊට හේතුව කවරේද? මහණෙනි, යම් හෙයකින් ඔහුගේ සිත බොහෝ කලක් මුළුල්ලෙහි විවේකයට නැමුණු විවෙකයට හැරුණු විවේකයට බරවූ සිතක්වන්නේද එහෙයින් ඔහු ගිහිබවට පෙරළෙන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවෙයි.

මහණෙනි, මහණතෙම කෙසේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩාද? ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩාද?

4. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

5. "මහණෙනි, මෙසේ වනාහී මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩයි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩා යයි" වදාළසේක.

---

## 12. එසනා වර්ගය.

### 1. එසනා නිස්සිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින්

කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්හ. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, මේ සෙවීම් තුනකි. කවරනම් තුනක්ද? කාමයන්ගේ සෙවීම, භවයාගේ සෙවීම (මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත) බ්‍රහ්මචරියාවගේ සෙවීම කියායි. මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ එසනාවෝයි. (සෙවීම් තුනයි.) මහණෙනි, මේ ත්‍රිවිධ එසනාවන් දැනගැනීම පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සංකල්පය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මේ ත්‍රිවිධ සෙවීම් දැනගැනීම පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි.

---

## 2. එසනා පරිඤ්ඤා සූත්‍රය.

1. (මෙතැන් සිට ඇති මේ වර්ගයේ සියලු සූත්‍රවල 1 වෙනි ඡේදය මේ වර්ගයේ මුල් සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි)

2. “මහණෙනි, මේ සෙවීම් තුනකි. කවර නම් තුනක්ද? කාමයන්ගේ සෙවීම, භවයාගේ සෙවීම (මිථ්‍ය දෘෂ්ටි සංඛ්‍යාත) බ්‍රහ්මචර්යාවගේ සෙවීම කියායි. මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ සෙවීමය. මහණෙනි, මේ ත්‍රිවිධ සෙවීම් පිණිසද දැනීම පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. මහණෙනි, මේ ත්‍රිවිධ සෙවීම් පිරිසිඳ දැනීම පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි.

---

## 3. එසනා පරික්ඛය සූත්‍රය.

2. “මහණෙනි, මේ සෙවීම් තුනකි. කවරනම් තුනක්ද? කාමයන්ගේ සෙවීම භවයාගේ සෙවීම (මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත) බ්‍රහ්මචරියාවගේ සෙවීම කියායි. මහණෙනි, මේ වනාහි සෙවීම් තුනය. මහණෙනි, මේ ත්‍රිවිධ සෙවීම් ක්ෂය කිරීම පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුය. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. “මහණෙනි, මේ ත්‍රිවිධ සෙවීම් ක්ෂයකිරීම පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි.

---

## 4. එසනා පහාන සූත්‍රය.

2. "මහණෙනි, මේ සෙවීම් තුනකි. කවරනම් තුනක්ද? කාමයන්ගේ සෙවීම භවයාගේ සෙවීම (මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත) බ්‍රහ්මචරියාවගේ සෙවීම යනුයි. මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ සෙවීම්ය. මහණෙනි, මේ ත්‍රිවිධ සෙවීම් පහකිරීම පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මේ ත්‍රිවිධ සෙවීම් පහකිරීම පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි.

---

## 5. විධා සූත්‍රය.

2. "මහණෙනි, මේ මානය පිළිබඳ කොටස් තුනකි. කවරනම් තුනක්ද යත්, ශ්‍රෙෂ්ඨයෙක් වෙමි යන මාන කොටස, සමානයෙක් වෙමි යන මාන කොටස, හීනයෙක් වෙමි යන මාන කොටස යන මොහුයි. මේ වනාහී ත්‍රිවිධ මාන කොට්ඨාසයෝයි. මහණෙනි, මේ ත්‍රිවිධ කොට්ඨාසයන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මේ ත්‍රිවිධ මාන කොට්ඨාසයන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 6. ආසව සූත්‍රය.

2. "මහණෙනි, මේ ආසවයෝ තිදෙනෙකි. කවරනම් තිදෙනෙක්ද යත්? කාමාසවය, භවාසවය, අවිජ්ජාසවය යන මොහුය. මහණෙනි, මේ ආසවයන් තිදෙනාගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මේ ත්‍රිවිධ ආශ්‍රවයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 7. භව සූත්‍රය.

2. මහණෙනි, මේ භව තුනකි. කවරනම් තුනෙක්ද යත්? කාම භවය, රූප භවය, අරූප භවය කියායි. මහණෙනි, මේ වනාහි භව තුනයි. මහණෙනි, ත්‍රිවිධ භවයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මේ ත්‍රිවිධ භවයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි වදාළසේක.

---

## 8. දුක්ඛතා සූත්‍රය

2. "මහණෙනි, මේ දුක්ඛ ස්වභාවයෝ තුනෙකි. කවර නම් තුනෙක්ද යත්? දුක්ඛ දුක්ඛ ස්වාභාවය, සංඛාර දුක්ඛ ස්වභාවය, විපරිනාම දුක්ඛ ස්වභාවය කියායි. මහණෙනි, මේ වනාහි දුක්ඛ ස්වභාවයෝ තුනය. මහණෙනි, මේ ත්‍රිවිධ දුක්ඛ ස්වභාවයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මේ ත්‍රිවිධ දුක්ඛ ස්වභාවයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළ සේක.

---

## 9. ඛීල සූත්‍රය

2. "මහණෙනි, මේ හුල් තුනෙකි. කවර නම් තුනෙක්ද යත්? රාගය නැමැති හුල, ද්වෙශය නැමැති හුල, මෝහය නැමැති හුල කියායි. මහණෙනි, මේ වනාහි හුල් තුනයි. මහණෙනි, මේ ත්‍රිවිධ හුල් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, ත්‍රිවිධ උල් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 10. මල සූත්‍රය.

**2.** "මහණෙනි, මේ මල තුනකි. කවර නම් තුනක්ද යත්? රාග නමැති මලය, ද්වේෂය නමැති මලය, මෝහ නමැති මලය යන මොහුයි. මහණෙනි, මේ වනාහි මලයෝ තුනවේ. මහණෙනි, මේ ත්‍රිවිධ මලයන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

**4.** "මහණෙනි, මේ ත්‍රිවිධ මල දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 11. නීඝ සූත්‍රය.

**2.** "මහණෙනි, මේ උවදුරු තුනකි. කවරනම් තුනක්ද යත්? රාග නැමති උවදුර, ද්වෙෂ නැමති උවදුර, මෝහ නැමති උවදුර යන මොහුය. මහණෙනි, මේ වනාහි උවදුරු තුනයි. මහණෙනි, මේ ත්‍රිවිධ උවදුරු දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, මේ ත්‍රිවිධ උවදුරු දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 12. වෙදනා සූත්‍රය.

2. "මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර නම් තුනක්දයත්? සුඛ වෙදනාව, දුක්ඛ වෙදනාව, අදුක්ඛ අදුක්ඛම සුඛ වෙදනාව යන මොහුයි. මහණෙනි, මේ වනාහි වෙදනා තුනයි. මහණෙනි, මේ ත්‍රිවිධ වෙදනාවන්ගේ දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස, ක්ෂය කිරීම පිණිස, ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්දයත්?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මේ ත්‍රිවිධ වෙදනාවන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස, ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩියයුතු යයි" වදාළසේක.

---

## 13. තණ්හා සූත්‍රය.

2. "මහණෙනි, මේ තණ්හා තුනකි. කවරනම් තුනක්ද යත්? කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යන මොහුයි. මහණෙනි, මෙ වනාහි තණ්හා තුනයි. මහණෙනි, මේ තෘෂ්ණා තුන දැනීම පිණිස පිරිසිඳ දැනුම පිණිස, ක්ෂය කිරීම පිණිස, ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්දයත්?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මේ ත්‍රිවිධ තෘෂ්ණාවන්ගේ දැණීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුත්තේ යයි" වදාළසේක.

---

# 13. ඔඝ වර්ගය.

## 1. ඔඝ සූත්‍රය

1. (මේ වර්ගයේ සූත්‍ර සියල්ලම 12 වෙනි වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දෙශනා කරනලදී.)

2. "මහණෙනි, මේ ඕඝයෝ සතර දෙනෙකි. කවර නම් සතර දෙනෙක්දයත්? කාම ඔඝය, (පඤ්චකාමයෙහි ආශාව) භව ඔඝය (රූපාරූප භවයන්හි ආශාව) දිට්ඨි ඔඝය (අවිජ්ජා ඔඝය, (චතුස්සත්‍යයෙහි නොදැන්ම) මහණෙනි, මේ වනාහි ඔඝ සතරයි.

"මහණෙනි, මේ සතර ඔඝයන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩියයුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්දයත්?

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවෙකය ඇසුරුකළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සංකල්පය වඩයි. විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරු කළ, නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයි. විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරු කළ, නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවෙකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ, නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් ව්‍යායාමය වඩයි. විවෙකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයි. විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මේ සතර ඔඝයන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 2. යොග සූත්‍රය.

1. (මෙතැන් සිට මේ වර්ගයේ සියලු සූත්‍රවල 1 වෙනි ඡේද මේ වර්ගයේ මුල් සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, මේ යෝග (යෙදීම්) සතරකි. කවරනම් සතරක්ද යත්? කාම යෝගය, (පඤ්චකාම ආශාව), භව යෝගය (රූපාරූපභාවයන්හි ආශාව) දිට්ඨි යෝගය (දෙසැට දෘෂ්ටි) අවිජ්ජා යෝගය (මොහය) යනුයි. මහණෙනි, මේ වනාහි යෝග සතරයි. මහණෙනි, මේ සතර යෝගයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද?

(මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මේ සතර යෝගයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 3. උපාදාන සූත්‍රය.

2. "මහණෙනි, මේ උපාදානයෝ (තදින් අල්වාගැනීම්) සතරකි. කවරනම් සතරක්ද යත්? කාම උපාදානය, දිට්ඨි උපාදානය, සීලබ්බත උපාදානය, අත්තවාද උපාදානය යන මොහුයි. මහණෙනි, මේ වනාහි උපාදාන සතරයි. මහණෙනි, මේ සතර උපාදානයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මේ සතර උපාදානයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 4. ගන්ථ සූත්‍රය.

2. "මහණෙනි, මේ ග්‍රන්ථයෝ (ගැට) සතරකි. කවර නම් සතරක්ද යත්? අභිධ්‍යාකාය ග්‍රන්ථය, (චුති ප්‍රතිසන්ධි වශයෙන් ගැටගසන තණ්හාව) ව්‍යාපාද කාය ග්‍රන්ථය, (ද්වෙෂය) සීලබ්බතපරාමාස කාය ග්‍රන්ථය, (වැරදි සීලව්‍රත ගන්නා දෘෂ්ටිය) ඉදංසර්වවාභිනිවෙස කාය ග්‍රන්ථය (මෙයම සත්‍යයි ගන්නා වැරදි දෘෂ්ටිය) යන මොහුයි. මහණෙනි, මේ වනාහි ග්‍රන්ථ සතරයි. මහණෙනි, මේ ග්‍රන්ථ සතර දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවර නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මේ සතර ග්‍රන්ථයන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 5. අනුසය සූත්‍රය

2. "මහණෙනි, මේ අනුසය ධර්මයෝ සතකි. කවරනම් සතක්දයත්? කාමරාගානුසය, පටිඝානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, මානානුසය, භවරාගානුසය, සහ අවිජ්ජානුසයයි.

"මහණෙනි, මේ වනාහි අනුසය සතයි. මේ සප්ත අනුසය ධර්මයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම

පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩියයුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්දයත්?

(මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මේ සප්ත අනුසය ධර්මයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ග මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 6. කාමගුණ අභිඤ්ඤාවිවෙක නිස්සිත සූත්‍රය

2. "මහණෙනි, මේ කාමගුණ පසකි. කවරනම් පසක්ද යත්? චක්ෂුර්විඥානයෙන් දතයුතු ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ ඇලීම පිණිස පවත්නාවූ, ඇලිය යුතුවූ රූපයෝ වෙත්ද? සෝත විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, කාමය පිණිස පවත්නාවූ ඇලියයුතුවූ, ශබ්දයෝ වෙද්ද? ඝාණ විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, කාමය පිණිස පවත්නාවූ ඇලියයුතුවූ ගන්ධයෝ වෙද්ද? ජිව්හා විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, කාමය පිණිස පවත්නාවූ ඇලියයුතුවූ රසයෝ වෙද්ද, කාය විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රියස්වභාවවූ, කාමයපිණිස පවත්නාවූ, ඇලියයුතුවූ ස්පර්ශයෝ වෙද්ද, මනෝ විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, කාමය පිණිස පවත්නාවූ ධර්මයෝ වෙද්ද, මහණෙනි, මේ වනාහි පඤ්චකාම ගුණයෝයි.

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මේ පඤ්චකාම ගුණයන්ගේ දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩියයුතුයයි" වදාළසේක.

---

## 7. නීවරණ සූත්‍රය

2. "මහණෙනි, මේ නීවරණයෝ පසකි. කවර නම් පසක්දයත්? කාමච්ඡන්දනීවරණය, ව්‍යාපාදනීවරණය, ථිනමිද්ධ නීවරණය, උද්ධච්ච කුක්කුච්චනීවරණය, විචිකිච්ඡානීවරණය යනුයි. මහණෙනි, මේ වනාහි පඤ්චනීවරණයෝයි. මහණෙනි, මේ පඤ්චනීවරණයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්දයත්?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මේ පඤ්චනීවරණයන්ගේ දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස, ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතු යයි" වදාළසේක.

---

## 8. උපාදානස්ඛන්ධ සූත්‍රය.

2. "මහණෙනි, මේ උපාදානස්කන්ධ පසකි. කවර නම් පසක්ද? ඒ මෙසේයි. රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය විඤ්ඤාණ උපාදානස්කන්ධය කියායි. මහණෙනි, මේ වනාහි උපාදානස්කන්ධ පසයි. මහණෙනි, උපාදාන ස්කන්ධපඤ්චකයාගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි.

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මේ පඤ්ච උපාදානස්කන්ධයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 9. ඕරම්භාගිය සූත්‍රය.

2. "මහණෙනි, මේ ඕරම්භාගිය (යට කොට්ඨාශය නම්වූ එකොළොස් කාම භවයෙහි උපතට හේතුවූ) සංයෝජන පසකි. කවර නම් පසක්ද යත්? සක්කාය දෘෂ්ටිය, විචිකිච්ඡාව සීලබ්බතපරාමාසය, කාමච්ඡන්දය, ව්‍යාපාදය යන මොහුයි. මහණෙනි, මේ වනාහී ඕරම්භාගිය සංයෝජන පසයි. මහණෙනි, මේ පඤ්ච ඕරම්භාගිය සංයෝජනයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි.

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මේ පඤ්ච ඕරම්භාගිය සංයෝජනයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## 10. උද්ධම්භාගිය සූත්‍රය.

"මහණෙනි, මේ උද්ධම්භාගිය (උඩ කොට්ඨාශය වන රූපාරූප භවයෙහි උපතට හේතුවූ) සංයෝජන පසකි. කවර නම් පසක්ද යත්? රූප රාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිද්‍යාව යන මොහුයි. මහණෙනි, මේ වනාහී උද්ධම්භාගිය සංයෝජන පසයි. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පඤ්චකයාගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයෝජනයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කිරීම පිණිස මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

---

## පාචීනනින්න සූත්‍ර.

2. "මහණෙනි, යම්සේ ගංගානම් නදිය පෙරදිගට නැමුනි, පෙරදිගට හැරුණි, පෙරදිගට බරව පවත්නීද, මහණෙනි, එසේම වනාහි මහණතෙම ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන්නේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වෙයි. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණෙතෙම කෙසේ නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වෙයිද?

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් දෘෂ්ටිය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සංකල්පය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් වචනය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුනු සම්‍යක් ආජීවය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක්ව්‍යායාමය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සතිය වඩයි. විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුනු සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණ

තෙම නිවනට නැමුණෙක් නිවනට හැරුණෙක් නිවනට බරවූවෙක් වන්නේයයි” වදාළසේක.

(මෙසේ ගංගා පෙය්යාලයේ පටන් එසනා වර්ගය දක්වා ඇති සූත්‍ර 34 ද ඕඝ වර්ගයේ ප්‍රථම සූත්‍ර 10 ද පිළිවෙළින් මෙහිද යොදාගත යුතුයි.)

---

## විනය සූත්‍ර.

2. “මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසකි. කවර නම් පසක්දයත්? රූපරාගය, අරූපරාගය, මානය, උද්ධච්චය, අවිද්‍යාව යනුයි. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසයි. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පඤ්චකයාගේ දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස, ක්ෂය කිරීම පිණිස, ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාගික මාර්ගයක්ද යත්?

3. “මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම රාගය දුරු කිරීම කෙළවරකොට ඇති, දොසය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් දෘෂ්ටිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, දොසය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් සංකල්පය වඩයි. රාගය දුරුකිරීම කෙළවර කොට ඇති, දොසය දුරුකිරීම කෙළවරකොට ඇති මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, සම්‍යක් වචනය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, දොසය දුරුකිරීම කෙළවර කොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් කර්මාන්තය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, දොසය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරු කිරීම කෙළවරකොට ඇති. සම්‍යක් ආජීවය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, දොසය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් ව්‍යායාමය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති දොසය දුරුකිරීම කෙළවරකොට ඇති,

මොහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් සතිය වඩයි. රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, දොසය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජනයන්ගේ දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස, ක්ෂය කිරීම පිණිස ප්‍රහාණය පිණිස, මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක.

මෙසේ ගංගා පෙය්‍යාලයේ පටන් ඒසනා වර්ගය දක්වා ඇති සූත්‍ර 34 ද ඕඝ වර්ගයේ ප්‍රථම සූත්‍ර 10 ද මේ අනුසාරයෙන් මෙහිද යොදාගත යුතුයි.

---

## අමතොගධ සූත්‍ර.

2. "මහණෙනි, යම්සේ ගංගානම් නදිය පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට බරව පවත්නේවේද? මහණෙනි, එසේම වනාහි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණතෙම නිවනට නැමී නිවනට හැරී නිවනට බරව ඇත්තේය. මහණෙනි, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණෙතෙම කෙසේ නිවනට නැමී නිවනට හැරී නිවනට බරව ඇත්තේවේද?

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම නිවනට බැසගැනීම ඇති, නිවණ පිහිටකොට ඇති, නිවන කෙළවර කොට ඇති සම්‍යක් දෘෂ්ටිය වඩයි. නිවනට බැසගැනීම ඇති, නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, සම්‍යක් සංකල්පය වඩයි. නිවනට බැසගැනීම ඇති, නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, සම්‍යක් වචනය වඩයි. නිවනට බැසගැනීම ඇති, නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති සම්‍යක් කර්මාන්තය වඩයි. නිවනට බැස ගැනීම ඇති, නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, සම්‍යක්

ආජීවය වඩයි. නිවනට බැසගැනීම ඇති, නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, සම්‍යක් ව්‍යායාමය වඩයි. නිවනට බැස ගැනීම ඇති නිවන පිහිටකොට ඇති නිවන කෙළවරකොට ඇති, සම්‍යක් සතිය වඩයි නිවනට බැසගැනීම ඇති නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, එසේම වනාහි ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත වඩන මහණ තෙම නිවනට නැමී නිවනට හැරී, නිවනට බරව ඇත්තේයයි" වදාළසේක.

(මෙසේ ගංගා පෙය්යාලයේ පටන් ඒසනා වර්ගය දක්වා ඇති සූත්‍ර 34 ද ඕඝ වර්ගයේ ප්‍රථම සූත්‍ර 10 ද මේ අනුසාරයෙන් මෙහිද යොදාගත යුතුයි.)

---

## නිබ්බාණනින්න සූත්‍ර.

2. "මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පසකි. කවරනම් පසක්ද යත්? රූප රාගය, අරූප රාගය, මානය උද්ධච්චය, අවිද්‍යාවය. මහණෙනි, මේ වනාහි උද්ධම්භාගිය සංයොජන පසයි. මහණෙනි, මේ උද්ධම්භාගිය පඤ්ච සංයෝජනයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස ප්‍රහාණය පිණිස ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයි. කවරනම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයක්ද යත්?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නිවනට නැමී නිවනට හැරී නිවනට බරව පවත්නාවූ සම්‍යක් දෘෂ්ටිය වඩයි. නිවනට නැමී නිවනට හැරී නිවණට බරව පවත්නාවූ සම්‍යක් සංකල්පය වඩයි. නිවනට නැමී නිවනට හැරී නිවනට බරව පවත්නාවූ සම්‍යක් වචනය වඩයි. නිවනට නැමී නිවනට හැරී නිවනට බරව පවත්නාවූ සම්‍යක් කර්මාන්තය වඩයි. නිවනට නැමී නිවනට හැරී නිවනට බරව පවත්නාවූ සම්‍යක් ආජීවය වඩයි. නිවනට නැමී නිවනට හැරී නිවනට බරව පවත්නාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සම්‍යක් ව්‍යායාමය වඩයි. නිවනටනැමී නිවනට හැරී නිවනට බරව පවත්නාවූ සම්‍යක් සතිය වඩයි. නිවනට නැමී නිවනට හැරී නිවනට බරව පවත්නාවූ සම්‍යක් සමාධිය වඩයි.

4. "මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයෝජනයන්ගේ දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස ප්‍රහාණය පිණිස මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි" වදාළසේක. (1-10)

(මෙසේ ගංගා පෙය්යාලයේ පටන් ඒසනා වර්ගය දක්වා ඇති සූත්‍ර 34 ද ඕඝ වර්ගයේ ප්‍රථම සූත්‍ර 10 ද මේ අනුසාරයෙන් මෙහිද යොදාගත යුතුයි.)

**(මාර්ග සංයුත්තය නිමි.)**

---

# 2. බොජ්ඣංග සංයුත්තය

## 1. පබ්බත වර්ගය.

### 1. හිමවන්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා ඒ භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, හිමාලය පර්වතරාජයා නිසා නාගයෝ කය වඩත්. බලගන්වත්. ඔවුන් එහි කය වඩා, බලගන්වා කුඩා වලවලට බසිත්. කුඩා වලවලට බැස, මහවලවලට බසිත්. මහ වලවලට බැස, කුඩා ගංගාවලට බසිත්. කුඩා ගංගාවලට බැස, මහ ගංගාවලට බසිත්. මහ ගංගාවලට බැස, මහා සමුද්‍රයට-සාගරයට බසිත්. එහිදී ඔවුන් කයින් මහත් බවට විශාල බවට පැමිණෙත්.

3. "මහණෙනි, එසේම මහණතෙම වනාහි සීලය නිසා සීලයෙහි පිහිටා, සත්තබොජ්ඣංගයන් බහුලකරන්නේ, ධර්මයන්හි මහත් බවට විපුල බවට පැමිණෙයි. මහණෙනි, මහණතෙම කෙසේනම් සීලය නිසා, සීලයෙහි පිහිටා, සත්තබොජ්ඣංගයන් වඩන්නේ සත්තබොජ්ඣංගයන් බහුල කරන්නේ, ධර්මයන්හි මහත් විශාල බවට පැමිණෙයිද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, සති සම්බොජ්ඣංගය වඩාද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, ධම්මවිචය සම්බොජ්ඣගය වඩාද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ විරිය සම්බොජ්ඣංගගය වඩාද, විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ නිවනට නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩාද විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, පස්සද්ධි සම්බොජ්ඣංගය වඩාද, විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ, සමාධි සම්බෝජ්ඣංගය වඩාද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩාද,

5. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම සීලය නිසා, සීලයෙහි පිහිටා, සත්ත බොජ්ඣංගයන් වඩන්නේ, සත්ත බොජ්ඣංගයන් බහුල කරන්නේ ධර්මයන්හි බහුල බවට, මහත් බවට පැමිණේයයි" වදාළසේක.

---

## 2. ආහාරට්ඨිති කාය සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, මේ කය ආහාරය නිසා සිටියිද, ආහාරය නැතිව නොසිටීද, මහණෙනි, එසේ වනාහි පඤ්චනීවරණයෝ

ආහාර නැතිව නොසිටිත්. මහණෙනි, නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ කාමච්ඡන්දයාගේ බහුල භාවය පිණිස, මහත් භාවය පිණිස හෝ පවතින්නාවූ ආහාරය කවරේද?

3. "මහණෙනි, සුභ නිමිත්තක් ඇත්තේය. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, මෙය නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ කාමච්ඡන්දයාගේ බහුල භාවය පිණිස, මහත් භාවය පිණිස හෝ ආහාරය වේ.

4. "මහණෙනි, නූපන්නාවූ ව්‍යාපාදයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ ව්‍යාපාදයාගේ බහුල භාවය පිණිස, මහත් භාවය පිණිස හෝ පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි, පටිඝනිමිත්තක් ඇත්තේය. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, මෙය නූපන්නාවූ ව්‍යාපාදයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ ව්‍යාපාදයාගේ බහුල භාවය, මහත් භාවය පිණිස හෝ ආහාරය වේ.

5. "මහණෙනි, නූපන්නාවූ ථීන මිද්ධයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ ථීන මිද්ධයාගේ බහුලභාවය, මහත්භාවය පිණිස හෝ පවතින්නාවූ ආහාරය කවරේද? මහණෙනි, නොඇල්ම සිතේ අලස බව කයේ අලස බව බත් මදය සහ සිතේ හැකුළුණු බවක් ඇත්තේය. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, මෙය නූපන්නාවූ ථීන මිද්ධයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ ථීන මිද්ධයාගේ බහුල භාවය, මහත් භාවය පිණිස හෝ ආහාරයවේ.

6. "මහණෙනි, නූපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ බහුලභාවය මහත් භාවය පිණිස හෝ පවතින්නාවූ ආහාරය කවරේද? මහණෙනි, සිතේ නොසන් සිඳීමක් ඇත්තේය. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, මෙය නූපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ බහුල භාවය මහත් භාවය පිණිස හෝ ආහාරය වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "මහණෙනි, නූපන්නාවූ විචිකිච්ඡාවේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ විචිකිච්ඡාවේ බහුල භාවය, මහත්භාවය පිණිස හෝ පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි, සැකයට (විචිකිච්ඡාවට) ස්ථානවූ ධර්මයෝ ඇත්තාහ. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, මෙය නූපන්නාවූ විචිකිච්ඡාවේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ විචිකිච්ඡාවේ බහුල භාවය, මහත් භාවය පිණිස හෝ ආහාරය වේ. මහණෙනි, යම්සේ මේ කය වනාහි ආහාරයෙන් පවතින්නේ ආහාර නිසා සිටියිද, ආහාර නැතිව නොසිටියිද, මහණෙනි, එසේම මේ පඤ්චනීවරණයෝ වනාහි ආහාරයෙන් පවතින්නාහු ආහාරය නිසා සිටිත්. ආහාරය නැතිව නොසිටිත්.

8. "මහණෙනි, මේ කය වනාහි ආහාරයෙන් පවතින්නේ ආහාරය නිසා සිටීද, ආහාර නැතිව නොසිටීද, මහණෙනි, එසේම සත්තබොජ්ඣංගයෝ වනාහි ආහාරය නිසා පවතින්නාහු ආහාරය නිසා සිටිත්. ආහාරය නැතිව නොසිටිත්. මහණෙනි, නූපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස හෝ උපන්නාවූ සති සම්බොජ්ඣාංගය වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස හෝ පවතින්නාවූ ආහාරය කවරේද? මහණෙනි, සති සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත්තාහ. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, එය නූපන්නාවූ සතිසම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සතිසම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද ආහාරය වේ.

9. "මහණෙනි, නූපන්නාවූ ධම්ම විචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ධම්ම විචය සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද පවතින්නාවූ ආහාරය කවරේද? මහණෙනි, කුසලා'කුසල ධර්මයෝ සදොස් නිදොස් ධර්මයෝ කළු සුදු හා සමානවූ ධර්මයෝ ඇත්තාහ. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, එය නූපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ධම්මවිචය

සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද ආහාරය වේ.

10. "මහණෙනි, නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි, ආරම්භ ධාතුව (පටන්ගන්නා වීර්‍ය) (කුසිතකමින් නික්මෙන වීර්‍ය) නික්කම ධාතුව සහ පරක්කම ධාතුව (අතර නොනවත්න වීර්‍ය) ඇත්තේය. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, මෙය නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද ආහාරය වේ.

11. "මහණෙනි, නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණකිරීම පිණිසද, පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි, පීති සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත්තාහ. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, මෙය නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පීති සම්බොජ්ඣංගය වැඩීම පිණිසද සම්පූර්ණ කිරීම පිණිසද ආහාරය වේ.

12. "මහණෙනි, නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි, කාය පස්සද්ධිය සහ චිත්ත පස්සද්ධිය ඇත්තේය. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද මෙය නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද ආහාරය වේ.

13. "මහණෙනි, නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද, සමාධි සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි,

සිතේ සංසිඳීම ඇතිකරන්නාවූ සමථ නිමිත්ත ඇත්තේය. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල කොට පැවැත්මක් වේද, එය නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද ආහාරය වේ.

14. "මහණෙනි, නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි, උපෙක්ඛා සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත්තාහ. එහි නුවණින් මෙනෙහි කිරීම බහුලකොට පැවැත්මක් වේද, එය නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිසද සම්පූර්ණවීම පිණිසද ආහාරය වේ.

15. "මහණෙනි, යම්සේ මේ කය වනාහි ආහාරයෙන් පවත්නේ ආහාරය නිසා සිටීද, ආහාර නැතිව නොසිටීද, මහණෙනි එසේම මේ සත්ත සම්බොජ්ඣංගයෝ වනාහි ආහාරය නිසා පවත්නාහු, ආහාරය නිසා සිටිත්. ආහාරය නැතිව නොසිටිත්යයි" (වදාළසේක.)

---

## 3. සීලවන්ත දස්සන සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම් ඒ භික්ෂූහු සීලයෙන් යුක්තවූවාහුද ප්‍රඥාවෙන් යුක්තවූවාහුද විමුක්තියෙන් යුක්තවූවාහුද විමුක්ති ඥාන දර්ශනයෙන් යුක්තවූවාහුද, මහණෙනි, මම ඒ භික්ෂූන්ගේ දැකීමද බොහෝ උපකාර ඇත්තේයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන් ගැන ඇසීමද බොහෝ උපකාර ඇත්තේයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන් වෙත පැමිණීමද බොහෝ උපකාර ඇත්තේයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන් ආශ්‍රය කිරීමද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

බොහෝ උපකාර ඇත්තේයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන් ගැන සිහි කිරීමද බොහෝ උපකාර ඇත්තේයයි කියමි. මහණෙනි, මම ඒ භික්ෂූන් අනුව පැවිදිවීමද බොහෝ උපකාර ඇත්තේයයි කියමි. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, එබඳු භික්ෂූන්ගෙන් බණ අසා, කාය විවේකයෙන්ද චිත්ත විවේකයෙන්ද යන දෙවැදෑරුම් විවේකයෙන් යුක්තව වාසය කෙරෙයි. එසේ විවේකව වාසය කරන්නාවූ හෙතෙම ඒ ධර්මය සිහි කෙරෙයි. නැවත නැවත කල්පනා කෙරෙයි. මහණෙනි යම් කලෙක එසේ විවේකව වාසය කරන්නාවූ මහණතෙම ඒ ධර්මය සිහිකෙරෙයිද, නැවත නැවත කල්පනා කෙරෙයිද, එකල්හි ඒ මහණහුගේ සති සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේවෙයි. යම් කලක මහණ තෙම සති සම්බොජ්ඣංගය වඩයිද, එකල්හි මහණහුගේ සති සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. එසේ සිහියෙන් වාසය කරන්නාවූ ඒ මහණතෙම ඒ ධර්මය නුවණින් සොයයි. පරීක්ෂා කරයි. විමසීමට පැමිණෙයි.

4. "මහණෙනි, යම් කාලයක එසේ සිහියෙන් වාසයකරන්නාවූ මහණතෙම ඒ ධර්මය නුවණින් සොයාද පරීක්ෂා කරයිද විමසීමට පැමිණේද, එකල්හි ඒ මහණහුගේ ධර්මවිචය සම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. යම් කලක මහණතෙම ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, එකල්හි මහණහුගේ ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. ඒ ධර්මය නුවණින් සොයන්නාවූ, පරීක්ෂාකරන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ ඒ මහණහුගේ නොහැකිළෙන්නාවූ වීර්ය පටන් ගන්නා ලද්දේ වෙයි.

5. "මහණෙනි, යම් කලක ඒ ධර්මය නුවණින් සොයන්නාවූ, පරීක්ෂා කරන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ මහණහුගේ නොහැකිළෙන්නාවූ වීර්යය පටන් ගන්නා ලද්දේවේද, එකල්හි මහණහුගේ විරිය සම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේවෙයි. යම් කලෙක මහණතෙම විරිය සම්බොජ්ඣංගය වඩයිද, එකල්හි මහණහුගේ විරිය සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණවීමට

පැමිණෙයි. පටන් ගන්නා ලද වීර්යය ඇත්තාහට නිරාමිස ප්‍රීතිය උපදවයි.

"මහණෙනි, යම් කලක පටන් ගන්නා ලද වීර්යය ඇත්තාවූ මහණහට නිරාමිස ප්‍රීතිය උපදීද, එකල්හි මහණහුගේ පීති සම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. යම් කලක මහණතෙම පීති සම්බොජ්ඣංගය වඩයිද, එකල්හි මහණහුගේ පීති සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ වීමට පැමිණෙයි. පීති සිත ඇත්තාහුගේ කයද සංසිඳෙයි. සිතද සංසිඳෙයි.

"මහණෙනි, යම් කලක ප්‍රීති සිත ඇති මහණහුගේ කයත් සංසිඳෙයිද, සිතත් සංසිඳෙයිද, එකල්හි මහණහුගේ පස්සද්ධි සම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. යම් කලක මහණතෙම පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද එකල්හි මහණහුගේ පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. සංසිඳුණු කය ඇත්තාහට සැපය ඇතිවෙයි. සැප ඇත්තාහුගේ සිත එකඟවේ.

"මහණෙනි, යම්කලෙක සංසිඳුණු කය ඇත්තාවූ, සැප ඇත්තාවූ මහණහුගේ සිත එකඟවේද, එකල්හි මහණහුගේ සමාධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. යම් කලක මහණතෙම සමාධි සම්බොජ්ඣංගය වඩයිද, එකල්හි මහණහුගේ සමාධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. එසේ එකඟවූ සිත මනාකොට මැදහත් වන්නේ වෙයි.

"මහණෙනි, යම් කලක මහණහුගේ එසේ එකඟවූ සිත මනාකොට මැදහත්වේද, එකල්හි මහණහුගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. යම්කලක මහණතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, එකල්හි මහණහුගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි.

"මහණෙනි, මෙසේ වඩනලද්දාවූ, මෙසේ බහුලකරන ලද්දාවූ, සත්තබොජ්ඣංගයන්ගෙන් වනාහී ඵල සතක්, ආනිසංස සතක් කැමැති වියයුත්තාහුය. ඵලසත, ආනිසංස සත කවරේද?

මරණයට පෙර මේ ආත්මභාවයෙහිදීම රහත් බවට පැමිණෙන්නේ වෙයි. ඉදින් මරණයට පෙර, මේ ආත්මභාවයෙහිදීම රහත් බවට නොපැමිණෙන්නේ නම් මැරෙන කාලයෙහි රහත් බවට පැමිණෙන්නේ වෙයි. ඉදින් මරණයට පෙර, මේ ආත්ම භාවයෙහිදීම රහත්බවට නොපැමිණෙන්නේ නම්, ඉදින් මැරෙන කාලයෙහි රහත් බවට නොපැමිණෙන්නේ නම්, ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බඹලොවදී පිරිනිවන් පාන්නේ වන්නේය. ඉදින් මරණයට පෙර, මේ ආත්මභාවයෙහිදීම රහත් බවට නො පැමිණෙන්නේ නම්, ඉදින් මැරෙන කාලයෙහි රහත් බවට නොපැමිණෙන්නේ නම් ඉදින් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බඹලොවදී පිරිනිවන්පාන්නේ නොවන්නේ නම් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් පිරිනිවන් පාන්නෙක් වන්නේය. ඉදින් මරණයට පෙර, මේ ආත්මභාවයෙහිදීම රහත්බවට නොපැමිණෙන්නේ නම්, ඉදින් මැරෙන කාලයෙහි රහත්බවට නොපැමිණෙන්නේ නම්, ඉදින් ඔරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායි (සුද්ධාවාසයේදී කල්ප පන්සියයට ප්‍රථම රහත් වන්නෙක්) නොපාන්නේ නම් ඉදින් ඕරම්භාගි සංයෝජන පස ක්ෂය කිරීමෙන් උපහච්චපරිනිබ්බායි (සුද්ධාවාසයේ කල්ප පන්සියයකට පසුව රහත් වන්නේ) නොපාන්නේ නම් ඔරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් අසංස්කාර පරිනිබ්බායී (උත්සාහයක් නැතිව) රහත් වන්නෙක් වෙයි.

"ඉදින් මරණයට පෙර මේ ආත්මභාවයෙහිදීම රහත් බව නොලබන්නේ නම්, ඉදින් මැරෙන කාලයෙහි රහත් බව නොලබන්නේ නම්, ඉදින් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායී පුද්ගලයෙක් නොවන්නේ නම් ඉදින් ඕරම්භාගිය සංයොජන පස ක්ෂය කිරීමෙන් උප හච්චපරිනිබ්බායී පුද්ගලයෙක් නොවන්නේ නම් ඉදින් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂයකිරීමෙන් අසංස්කාර පරිනිබ්බායී පුද්ගලයෙක් පිරිනිවන් නොපාන්නේ නම්,

ඕරම්භාගිය සංයෝජන පස ක්ෂයකිරීමෙන් සසංඛාර පරිනිබ්බායී (උත්සාහ කිරීමෙන් රහත්වන්නෙක්) වෙයි.

"ඉදින් මරණයට පෙර මේ ආත්මභාවයෙහිදීම රහත්බව නොලබන්නේනම්, ඉදින් මැරෙන කාලයෙහි රහත්බව නොලබන්නේ නම්, ඉදින් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් අන්තරා පරිනිබ්බායි පුද්ගලයෙක් නොවන්නේ නම්, ඉදින් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් උපහච්ච පරිනිබ්බායී පුද්ගලයෙක් නොවන්නේ නම් ඉදින් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් අසංඛාර පරිනිබ්බායී පුද්ගලයෙක් නොවන්නේ නම්, ඉදින් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් සසංඛාර පරිනිබ්බායී පුද්ගලයෙක් නොවන්නේ නම් ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් උද්ධංසොත අකනිට්ඨගාමී (පිළිවෙළින් අකනිටා බඹලොවට පැමිණ රහත්වන්නෙක්) වෙයි.

"මහණෙනි, මෙසේ වඩනලද බහුල කරන ලද සත්ත බොජ්ඣංගයන් ගෙන් මේ ඵල සත, මේ ආනිසංස සත කැමති වියයුතු යයි වදාළසේක.

---

## 4. දුස්සයුගොපම සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ 'ඇවැත් මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ඇවැත්නියි' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ මෙය වදාළසේක. "ඇවැත්නි, මේ බොජ්ඣංගයෝ සතක් වෙති ඒ සත කවරහුද?

2. "සති සම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය සහ උපෙක්ඛා සම්බොජ්ඣංගයයි.

3. "ඇවැත්නි, මෙවුහු සත්ත බොජ්ඣංගයෝ වෙති. ඇවැත්නි, සත්ත බොජ්ඣංගයන්ගෙන් යම් යම් බොජ්ඣංගයකින් උදය කාලයෙහි වාසය කිරීමට කැමැත්තෙම් නම් ඒ ඒ බොජ්ඣංගයන්ගෙන් යුක්තව උදය කාලයෙහි වාසය කරමි. දවල් කාලයෙහි යම් යම් බොජ්ඣංගයකින් වාසය කිරීමට කැමැත්තෙම් නම් දවල් කාලයෙහි ඒ ඒ බොජ්ඣංගයන්ගෙන් යුක්තව වාසය කරමි. සවස් කාලයෙහි යම් යම් බොජ්ඣංගයකින් වාසය කිරීමට කැමැත්තේ නම් ඒ ඒ බොජ්ඣංගයන්ගෙන් සවස් කාලයෙහි වාසය කරමි.

"ඇවැත්නි, මාගේ සති සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන්ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ සති සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ සති සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ සති සම්බොජ්ඣංගය නැතිවේයයි දැන ගතිමි.

"ඇවැත්නි, මාගේ ධම්මවිචය සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන්ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ ධම්මවිචය සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ ධම්මවිචය සම්බොජ්ඣංගය නැතිවේයයි දැන ගතිමි.

"ඇවැත්නි, මාගේ විරිය සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන්ගන්නා ලද්දේයයි මට සිතේ සිටියාවූ විරිය සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ විරිය සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ විරිය සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

"ඇවැත්නි, මාගේ පීති සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ මනාකොට පටන්ගන්නා ලද්දේයයි මට

සිතේ. සිටියාවූ පීති සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ පීති සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ පීති සම්බොජ්ඣංගය නැතිවේයයි දැන ගතිමි.

"ඇවැත්නි, මාගේ පස්සද්ධි සම්බොජ්ඣංගය මෙසේයයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන්ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ පස්සද්ධි සම්බොජ්ඣංගය නැතිවේද මේහෙතුවෙන් මාගේ පස්සද්ධි සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

"ඇවැත්නි, මාගේ සමාධි සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන් ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ සමාධි සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ සමාධි සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ සමාධි සම්බොජ්ඣංගය නැතිවේයයි දැන ගතිමි.

"ඇවැත්නි, මාගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය මෙසේයයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන් ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය සිටීයයි දැන ගතිමි. ඉදින් මාගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

4. "ඇවැත්නි, යම්සේ වනාහි රජෙකුගේ හෝ රජ ඇමතියෙකුගේ හෝ නොයෙක් පාටින් යුත් පිරුණාවූ වස්ත්‍ර පෙට්ටියක් වේද, උදය කාලයෙහි යම් යම් වස්ත්‍ර දෙකක් පෙරවීමට කැමතිවේනම් උදය කාලයෙහි ඒ ඒ වස්ත්‍ර දෙක පොරවන්නේය. දවල් කාලයෙහි යම් යම් වස්ත්‍ර දෙකක් පෙරවීමට කැමතිවේනම්, දවල් කාලයෙහි ඒ ඒ වස්ත්‍ර දෙක පොරවන්නේය. සවස් කාලයෙහි යම් යම් වස්ත්‍ර දෙකක් පෙරවීමට කැමතිවේ නම් සවස් කාලයෙහි ඒ ඒ වස්ත්‍ර දෙක පොරවන්නේය. ඇවැත්නි, එසේම මම වනාහි මේ සප්ත බොජ්ඣංගයන්ගෙන් යම් යම් බොජ්ඣංගයකින් උදේ කාලයෙහි

වාසය කිරීමට කැමැත්තෙම් නම්, ඒ ඒ බොජ්ඣංගයන් උදේ කාලයෙහි වාසය කරමි. දවල් කාලයෙහි යම් යම් බොජ්ඣංගයකින් වාසය කිරීමට කැමැත්තෙම් නම් ඒ ඒ බොජ්ඣංගයන් දවල් කාලයෙහි වාසයකරමි. සවස් කාලයෙහි යම් යම් බොජ්ඣංගයකින් වාසයකිරීමට කැමැත්තෙම් නම්, ඒ ඒ බොජ්ඣංගයෙන් සවස් කාලයෙහි වාසය කරමි.

**5.** "ඇවැත්නි, මාගේ සති සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන් ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ සති සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ සති සම්බොජ්ඣංගය නැතිවේද, මේ හෙතුවෙන් මාගේ සති සම්බොජ්ඣංගය නැතිවේයයි දැන ගතිමි.

"ඇවැත්නි, මාගේ ධර්මවිචය සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන්ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ ධම්මවිචය සම්බොජ්ඣංගය නැතිවේද, මේ හේතුවෙන් මාගේ ධම්මවිචය සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

"ඇවැත්නි, මාගේ විරිය සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන්ගන්නා ලද්දේයයි මට සිතේ සිටියාවූ විරිය සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ විරිය සම්බොජ්ඣංගය නැතිවේද, මේ හෙතුවෙන් මාගේ විරිය සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

"ඇවැත්නි, මාගේ පීති සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ මනාකොට පටන් ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ පීති සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ පීති සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ පීති සම්බොජ්ඣංගය නැතිවේයයි දැන ගතිමි.

"ඇවැත්නි, මාගේ පස්සද්ධි සම්බොජ්ඣංගය මෙසේයයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන් ගන්නා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ලද්දේයයි මට සිතේ. සිටියාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ පස්සද්ධි සම්බොජ්ඣංගය නැතිවේද මෙහෙතුවෙන් මාගේ පස්සද්ධි සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

"ඇවැත්නි, මාගේ සමාධි සම්බොජ්ඣංගය මෙසේ යයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන් ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ සමාධි සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ සමාධි සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ සමාධි සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

"ඇවැත්නි, මාගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය මෙසේයයිද සිතේ. අප්‍රමාණයයි මට සිතේ. මනාකොට පටන් ගන්නා ලද්දේයයි මට සිතේ. සිටියාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය සිටීයයි දැනගතිමි. ඉදින් මාගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය නැතිවේද මේ හෙතුවෙන් මාගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය නැතිවේයයි දැනගතිමි.

## 5. බොජ්ඣංග පඤ්හ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. ස්වාමීනි, බොජ්ඣංගයෝ, බොජ්ඣංගයෝයයි කියනු ලැබෙත්. ස්වාමීනි, කොපමණකින් වනාහි බොජ්ඣංගයෝයයි කියනු ලැබෙත්ද?

2. "මහණ, නිර්වාණය අවබෝධ කිරීම පිණිස පවතින නිසා බොජ්ඣංගයෝයයි කියනු ලැබෙත්.

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, සති සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, ධම්මවිචය සම්බොජ්ඣගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ විරිය සම්බොජ්ඣංගගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩයිද විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, සමාධි සම්බෝජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩයිද, ඒ සප්ත බොජ්ඣංගයන් වඩන්නාවූ ඔහුගේ සිත කාමාශ්‍රවයන්ගෙන්ද මිදෙයි. භවාශ්‍රවයන්ගෙන්ද මිදෙයි. අවිද්‍යාශ්‍රවයන්ගෙන්ද මිදෙයි.

4. "මිදුණු කල්හි මිදුණේය යන ඤාණය ඇතිවෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර නිමවන ලදී. කළ යුත්ත කරන ලදී. මෙයින් මතු අනිත් කළයුත්තක් නැතැයි දැනගනියි. මහණ, නිර්වාණය අවබොධ කිරීමට හේතුවන නිසා බොජ්ඣංගයෝ යයි කියනු ලැබෙත් යයි" වදාළසේක.

---

## 6. කුණ්ඩලිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සාකේත නුවර මිගදාය සමීපයෙහි වූ අඤ්ජන වනයෙහි වාසය කරනසේක. ඉක්බිති කුණ්ඩලික නම් පරිබ්බාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටුවිය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමකර,

එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ කුණ්ඩලික පරිබ්බාජකතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි ආරාම නිසා වාසයකරමින් පිරිස්වල හැසිරෙන්නෙක්වෙමි. භවත් ගෞතමයන් වහන්ස දවල් ආහාර අනුභව කළාවූ, මාගේ සවස් කාලයෙහි මේ හැසිරීම වෙයි. ආරාමයෙන් ආරාමයට, උයනින් උයනට, ගමන් කරමි. ඒ මම එහිදී වාදයන්ගෙන් ජයගැනීම ආනිසංස කොට ඇත්තාවූද, වාදයන්ට දොස්කීම ආනිසංස කොට ඇත්තාවූද, කථා කථා කරන්නාවූ සමහර මහණ බමුණන් දකිමි. භවත් ගෞතමයන්වහන්සේ කුමක් ආනිසංස කොට වාසය කරනසේක්ද?

**2.** "කුණ්ඩලිය. තථාගතතෙමේ අවිජ්ජා විමුක්ති ඵලය (අර්හත් මාර්ග ඵලය) ආනිසංසකොට වාසය කරන්නේයයි" වදාළසේක.

"භවත් ගෞතමයන් වහන්ස, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ කිනම් ධර්මයෝ විජ්ජා විමුක්තිය සම්පූර්ණ කෙරෙත්ද?"

"කුණ්ඩලිය, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ, සත්ත බොජ්ඣංගයෝ වනාහි විජ්ජා විමුක්තිය සම්පූර්ණ කෙරෙත්.'

"භවත් ගෞතමයන් වහන්ස, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ, කිනම් ධර්මයෝ සත්ත බොජ්ඣංගයන් සම්පූර්ණ කෙරෙත්ද?

"කුණ්ඩලිය, වඩන ලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ සතර සතිපට්ඨානයෝ වනාහි සත්ත බොජ්ඣංගයන් සම්පූර්ණ කෙරෙත්."

"භවත් ගෞතමයන් වහන්ස, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ, කිනම් ධර්මයෝ සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරෙත්ද?"

"කුණ්ඩලිය, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ, ත්‍රිවිධ සුචරිතයෝ වනාහි සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරෙත්."

"භවත් ගෞතමයන් වහන්ස, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ කිනම් ධර්මයෝ ත්‍රිවිධ සුචරිතයන් සම්පූර්ණ කෙරෙත්ද?"

3. "කුණ්ඩලිය, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ ඉන්ද්‍රියසංවරය ත්‍රිවිධ සුචරිතයන් සම්පූර්ණකෙරේ. කුණ්ඩලිය, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ පුරුදුකරන ලද්දාවූ ඉන්ද්‍රිය සංවරය වනාහි ත්‍රිවිධ සුචරිතයන් සම්පූර්ණ කෙරෙත්ද? කුණ්ඩලිය, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක මනාපවූවකට ලෝභ නොකෙරෙයිද, නොවෙහෙසෙයිද, රාගය ඇතිනොකෙරෙයිද, ඔහුගේ නාම කය නැවතුණේද වෙයි. ඇතුළත මනාකොට සිටියාවූ, සිත මනාකොට මිදුනේවෙයිද, ඇසින්ම අමනාප රූපයක් දැක, මකු නොවෙයිද, ක්ලේශ වශයෙන් නොහැකුළුණ සිත් ඇත්තේ වෙයිද, අදීන සිත් ඇත්තේ වෙයිද, ඔහුගේ නාම කය නැවතුණේ වෙයි. ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයි.

"කුණ්ඩලිය නැවතද මහණතෙම කනින් ශබ්දයක් අසා මනාපවූවකට ලෝභ නොකෙරෙයිද, නොවෙහෙසෙයිද, රාගය ඇතිනොකෙරෙයිද, ඔහුගේ නාම කය නැවතුණේද වෙයි. ඇතුළත මනාකොට සිටියාවූ, සිත මනාකොට මිදුනේවෙයිද, කනින් අමනාප ශබ්දයක් අසා මකු නොවෙයිද ක්ලේශ වශයෙන් නොහැකුළුණ සිත් ඇත්තේ වෙයිද, අදීන සිත් ඇත්තේවෙයිද, ඔහුගේ නාම කය නැවතුණේ වෙයි. ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයි.

"කුණ්ඩලිය, නැවතද මහණතෙම නැහැයෙන් අමනාප ගඳක් ආඝ්‍රාණයකොට, මනාපවූවකට ලෝභ නොකෙරෙයිද නොවෙහෙසෙයිද, රාගය ඇතිනොකෙරෙයිද, ඔහුගේ නාම කය නැවතුණේද වෙයි. ඇතුළත මනාකොට සිටියාවූ සිත මනාකොට මිදුනේවෙයිද, නැහැයෙන් අමනාපගඳක් ආඝ්‍රාණය කොට මකුනොවෙයිද, ක්ලේශ වශයෙන් නොහැකුළුණ සිත් ඇත්තේ වෙයිද, අදීන සිත් ඇත්තේ වෙයිද, ඔහුගේ නාම කය නැවතුණේ වෙයි. ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේවෙයි.

"කුණ්ඩලිය, නැවතද මහණතෙම දිවෙන් අමනාපවූ රසයක් විඳ මනාපවූවකට ලෝභ නොකෙරෙයිද, නොවෙහෙසෙයිද, රාගය ඇති නොකෙරෙයිද, ඔහුගේ නාමය නැවතුණේද වෙයි. ඇතුළත මනාකොට සිටියාවූ සිත මනා කොට මිදුනේ වෙයිද, දිවෙන් අමනාපවූ රසයක් විඳ, මකු නොවෙයිද, ක්ලේශ වශයෙන් නොහැකුළුණ සිත් ඇත්තේ වෙයිද, අදීන සිත් ඇත්තේ වෙයිද, ඔහුගේ නාම කය නැවතුනේදවෙයි. ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයි.

"කුණ්ඩලිය, නැවතද මහණතෙම කයින් අමනාපවූ ස්පර්ශයක් ස්පර්ශකොට මනාපවූවකට ලෝභ නොකෙරෙයිද, නොවෙහෙසෙයිද, රාගය ඇති නොකෙරෙයිද, ඔහුගේ නාම කය නැවතුණේ වෙයි. ඇතුළත මනාකොට සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයිද, කයින් අමනාපවූ ස්පර්ශයක් ස්පර්ශ කොට මකු නොවෙයිද, ක්ලේශ වශයෙන් නොහැකුළුණ සිත් ඇත්තේ වෙයිද, අදීන සිත් ඇත්තේ වෙයිද, ඔහුගේ නාමකය නැවතුණේවෙයි. ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයි.

"කුණ්ඩලිය, නැවතද මහණතෙම සිතින් අමනාපවූ ධර්මයක් දැන මනාපවූවකට ලෝභ නොකෙරෙයිද, නොවෙහෙසෙයිද, රාගය ඇති නොකෙරෙයිද, ඔහුගේ නාම කය නැවතුණේ වෙයි. ඇතුළත මනාකොට සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයිද, සිතින් අමනාපවූ ධර්මයක් දැන මකු නොවෙයිද, ක්ලේශ වශයෙන් නොහැකුළුණ සිත් ඇත්තේ වෙයිද, අදීන සිත් ඇත්තේ වෙයිද, ඔහුගේ නාම කය නැවතුණේ වෙයි ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයි.

4. "කුණ්ඩලිය, යම්හෙයකින් ඇසින් රූපයක් දැක මනාප-අමනාපවූ රූපයන් කෙරෙහි මහණහුගේ නාමකය නැවතුණේවෙද, ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයිද,

"කනින් ශබ්දයක් අසා මනාප-අමනාපවූ ශබ්දයක් කෙරෙහි මහණහුගේ නාම කය නැවතුණේවේද, ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේවෙයිද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

“නහයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට මනාප-අමනාපවූ ගන්ධයන් කෙරෙහි මහණහුගේ නාම කය නැවතුණේවේද, ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේවෙයිද,

“දිවෙන් රසයක් විඳ මනාප-අමනාපවූ රසයන් කෙරෙහි මහණහුගේ නාමකය නැවතුණේවේද, ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේවෙයිද,

“කයින් ස්පර්ශයක්කොට මනාප-අමනාපවූ ස්පර්ශයන් කෙරෙහි මහණහුගේ නාම කය නැවතුණේවේද, ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේ වෙයිද,

“සිතින් ධර්මයක් දැන මනාප-අමනාපවූ ධර්මයන් කෙරෙහි මහණහුගේ නාමකය නැවතුණේවේද, ඇතුළත සිටියාවූ සිත මනාකොට මිදුනේවෙයිද,

“කුණ්ඩලිය, මෙසේ අසනලද, මෙසේ පුරුදුකරන ලද ඉන්ද්‍රිය සංවරය වනාහි ත්‍රිවිධ චරිතයන් සම්පූර්ණකෙරෙයි.

**5.** “කුණ්ඩලිය, කෙසේ වඩනලද්දාවූ කෙසේ පුරුදු කරන ලද්දාවූ ත්‍රිවිධ සුචරිතයෝ සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරෙත්ද? කුණ්ඩලිය, මේ ශාසනයෙහි මහණතෙම කාය දුශ්චරිතය හැර කාය සුචරිතය වඩයිද, වාක්දුශ්චරිය හැර, වාක් සුචරිතයද වඩයිද, මනෝ දුශ්චරිතය හැර මනෝ සුචරිතයද වඩයිද, කුණ්ඩලිය, මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ත්‍රිවිධ සුචරිතයෝ සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරෙත්.

**6.** “කුණ්ඩලිය, කෙසේ වඩනලද, කෙසේ පුරුදුකරන ලද සතර සතිපට්ඨානයෝ සත්ත සම්බොජ්ඣංගයන් සම්පූර්ණ කෙරෙත්ද? කුණ්ඩලිය, මේ ශාසනයෙහි මහණතෙම කයෙහි කය අනුව දක්නේ කෙළෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ, නුවණින් යුක්තවූයේ, සිහියෙන් යුක්තවූයේ ස්කන්ධ ලෝකයෙහි ලෝභ දොෂයන් දුරුකොට වාසය කෙරෙයිද,

“වේදනාවන්හි වේදනාවන් අනුව බලන්නේ කෙළෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ, නුවණින් යුක්තවූයේ, සිහියෙන්

යුක්තවූයේ ස්කන්ධලෝකයෙහි ලෝභ දොෂයන් දුරුකොට වාසය කෙරෙයිද,

"චිත්තයන්හි චිත්තයන් අනුව බලන්නේ කෙලෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ, නුවණින් යුක්තවූයේ, සිහියෙන් යුක්තවූයේ ස්කන්ධ ලෝකයෙහි ලෝභ දොෂයන් දුරුකොට වාසය කරයිද,

"ධර්මයන්හි ධර්මයන් අනුව බලන්නේ කෙලෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ, නුවණින් යුක්තවූයේ, සිහියෙන් යුක්තවූයේ ස්කන්ධ ලෝකයෙහි ලෝභ, දොෂයන් දුරුකොට වාසය කෙරෙයිද,

'කුණ්ඩලිය මෙසේ වඩනලද, මෙසේ පුරුදුකරනලද සතර සතිපට්ඨානයෝ සත්ත සම්බොජ්ඣංගයන් සම්පූර්ණකෙරෙත්.

7. "කුණ්ඩලිය, කෙසේ වඩන ලද, කෙසේ පුරුදු කරන ලද සප්ත බොජ්ඣංගයෝ විජ්ජා විමුක්තිය සම්පූර්ණ කෙරේද?

කුණ්ඩලිය. මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ, සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද,

"කුණ්ඩලිය, මෙසේ වඩන ලද, මෙසේ පුරුදු කරන ලද සත්ත බොජ්ඣංගයෝ විජ්ජාවිමුක්තිය සම්පූර්ණ කෙරේ.

8. "මෙසේ වදාළ කල කුණ්ඩලිය පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු හෝ කෙරේද, සැඟවූවක් විවෘත හෝ කෙරේද, මං මුළාවූවෙකුට මාර්ගය හෝ කියයිද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි, අන්ධකාරයෙහි තෙල් පහනක් හෝ දරාද, එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් දේශනා කරනලදී. ස්වාමීනි, ඒ මම අද පටන් දිවිහිමියෙන් භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණයමි. භවත් ගෞතමයන් වහන්සේ දිවිහිමිකොට සරණගිය උපාසකයෙකු කොට මා දරණ සේක්වා"

---

## 7. කූටාගාරොපම සූත්‍රය.

1. (මේ සූත්‍රය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම්සේ මුදුන් ගෙයක යම්කිසි ගොනැසි වෙත්ද ඒ සියල්ල මුදුනට නැමුණාහු, මුදුනට නැඹුරුවූවාහු, මුදුනට බරවූවාහු වෙත්ද මහණෙනි, එසේම සත්ත බොජ්ඣංගයන් වඩන්නාවූ සත්ත බොජ්ඣංගයන් පුරුදු කරන ලද්දාවූ මහණතෙම වනාහි නිවනට නැමුණේ නිවනට නැඹුරුවූයේ, නිවනට බරවූයේ වෙයි. මහණෙනි, සත්ත බොජ්ඣංගයන් වඩන ලද, පුරුදු කරන ලද මහණ තෙම කෙසේ නිවනට නැමුණේ, නිවනට නැඹුරුවූයේ, නිවනට බරවූයේ වේද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට බරවූ සති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට බරවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට බරවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට බරවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට බරවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට බරවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරෝධය ඇසුරු කළාවූ, නිවනට බරවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ වනාහි සප්ත බොජ්ඣංගයන් වඩන්නාවූ බහුල කරන්නාවූ මහණතෙම නිවනට නැමුණේ, නිවනට හැරුණේ නිවනට බරවූයේ වෙයි."

---

## 8. උපවාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් උපවාණ ස්ථවිරතෙමේද ආයුෂ්මත් අතිමුත්ත ස්ථවිරතෙමේද කොසඹෑනුවර සමීපයෙහිවූ ඝෝසිතාරාමයෙහි වාසය කෙරෙත්.

ඉක්බිති ආයුෂ්මත් අතිමුත්ත ස්ථවිරතෙම සවස් කාලයෙහි විවේකස්ථානයෙන් නැගීසිටියේ ආයුෂ්මත් උපවාණ ස්ථවිරයන් යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් උපවාණ ස්ථවිරයන් වහන්සේ හා සමග සතුටුවියයුතුවූ, සිහිකටයුතුවූ, කථාව කොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් අතිමුත්ත ස්ථවිරතෙම ආයුෂ්මත් උපවාණ ස්ථවිරයන්ට මෙය කීයේය.

2. "ආයුෂ්මත් උපවාණ ස්ථවිරයන් වහන්ස, 'නුවණින් මෙනෙහි කිරීමෙන් මෙසේ මනාකොට වඩනලද සත්ත සම්බොජ්ඣංගයෝ වනාහි මාගේ පහසු විහරණය පිණිස පවත්නාහු යයි' මහණතෙම තෙමේම දන්නේද?"

3. "ආයුෂ්මත් අතිමුත්තය, 'නුවණින් මෙනෙහි කිරීමෙන් මෙසේ මනාකොට වඩනලද සත්ත බොජ්ඣංගයෝ වනාහි මාගේ පහසු විහරණය පිණිස පවත්නාහුයයි' මහණ තෙම තෙමේම දන්නේය.

"ඇවැත්නි, මහණතෙම සති සම්බොජ්ඣංගය වඩන්නේම මාගේ සිතද මනාකොට මිදුනේය. මා විසින් ථීන මිද්ධය උදුරන ලදී. මාගේ උද්ධච්චකුක්කුච්චයද මනාකොට දුරුකරන ලදී. මාගේ වීර්ය පටන් ගන්නා ලදී. එය හැකුළුණේ නොවෙයි. ප්‍රයෝජන ඇතියක් කොට මෙනෙහි කරමියි' දනියි.

"ඇවැත්නි, මහණතෙම ධම්මවිචය සම්බොජ්ඣංගය වඩන්නේම 'මාගේ සිතද මනාකොට මිදුනේය. මා විසින් ථීන මිද්ධය උදුරනලදී. මාගේ උද්ධච්ච කුක්කුච්චයද මනාකොට දුරුකරනලදී. මාගේ වීර්ය පටන්ගන්නාලදී. එය හැකුළුණේ නොවෙයි. ප්‍රයෝජන ඇතියක්කොට මෙනෙහි කරමියි' දනියි.

"ඇවැත්නි, මහණතෙම විරිය සම්බොජ්ඣංගය වඩන්නේම 'මාගේ සිතද මනාකොට මිදුනේය. මා විසින් ථීන මිද්ධය උදුරනලදී. මාගේ උද්දච්චකුක්කුච්චයද මනාකොට දුරුකරන ලදී. මාගේ වීර්ය පටන්ගන්නාලදී. එය හැකුළුණේ නොවෙයි. ප්‍රයෝජන ඇතියක්කොට මෙනෙහි කරමියි' දනියි.

"ඇවැත්නි, මහණතෙම පීති සම්බොජ්ඣංගය වඩන්නේම 'මාගේ සිතද මනාකොට මිදුණේය. මා විසින් ථීනමිද්ධය උදුරනලදී. මාගේ උද්ධච්චකුක්කුච්චයද මනාකොට දුරුකරන ලදී. මාගේ වීර්ය පටන්ගන්නාලදී. එය හැකුළුණේ නොවෙයි. ප්‍රයෝජන ඇතියක්කොට මෙනෙහි කරමියි' දනියි.

"ඇවැත්නි, මහණතෙම පස්සද්ධි සම්බොජ්ඣංගය වඩන්නේම 'මාගේ සිතද මනාකොට මිදුනේය. මා විසින් ථීන මිද්ධය උදුරනලදී. මාගේ උද්ධච්චකුක්කුච්චයද මනාකොට දුරුකරනලදී. මාගේ වීර්ය පටන්ගන්නාලදී. එය හැකුළුණේ නොවෙයි. ප්‍රයෝජන ඇතියක්කොට මෙනෙහි කරමියි' දනියි.

"ඇවැත්නි, මහණතෙම සමාධි සම්බොජ්ඣංගය වඩන්නේම 'මාගේ සිතද මනාකොට මිදුනේය. මා විසින් ථීන මිද්ධය උදුරනලදී. මාගේ උද්දච්චකුක්කුච්චයද මනාකොට දුරුකරනලදී. මාගේ වීර්ය පටන්ගන්නාලදී. එය හැකුළුණේ නොවෙයි. ප්‍රයෝජනය ඇතියක්කොට මෙනෙහි කරමියි' දනියි.

"ඇවැත්නි, මහණතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩන්නේම මාගේ සිතද මනාකොට මිදුනේය. මා විසින් ථීනමිද්ධය උදුරනලදී. මාගේ උද්ධච්චකුක්කුච්චයද මනා කොට දුරුකරනලදී. මාගේ වීර්යය පටන්ගන්නාලදී. එය හැකුළුණේ නොවෙයි ප්‍රයෝජන ඇතියක්කොට මෙනෙහි කරමියි' දනියි.

4. "ආයුෂ්මත් අතිමුත්තය, මෙසේ වනාහි 'නුවණින් මෙනෙහි කිරීමෙන් මෙසේ මනාකොට, වඩනලද සත්ත සම්බොජ්ඣංගයෝ වනාහි මාගේ පහසු විහරණය පිණිස පවත්නාහුයයි' මහණතෙම තෙමේම දන්නේයයි" කීහ.

---

## 9. බොජ්ඣංගුප්පාද සූත්‍රය.

1. (මෙහි මුල් ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, වඩනලද, පුරුදුකරනලද, නූපන්නාවූ මේ සත්ත බොජ්ඣංගයෝ අර්හත් සම්මා සම්බුදු තථාගතයන්

වහන්සේගේ පහළවීමෙන් හැර අන් කාලයක නොඋපදිත්. ඒ සත කවරේද?

3. (මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, වඩනලද, පුරුදුකරනලද, නූපන් මේ සත්ත සම්බොජ්ඣංගයෝ අර්හත්, සම්මා සම්බුදු, තථාගතයන් වහන්සේගේ පහළ වීමෙන් හැර අන්කාලයක නොඋපදිත්යයි" වදාළසේක.

---

### 10. දුතිය බොජ්ඣංගුප්පාද සූත්‍රය.

1. (මෙහි මුල් ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මෙනි)

2. "මහණෙනි, වඩනලද, පුරුදුකරනලද, නූපන් මේ සත්ත සම්බොජ්ඣංගයෝ සුගතයන් වහන්සේගේ ශාසනය හැර අන්තැනක නොඋපදිත්. ඒ සත කවරේද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, වඩනලද, පුරුදුකරනලද, නූපන් මේ සත්ත බොජ්ඣංගයෝ සුගතයන් වහන්සේගේ ශාසනය හැර අන්තැනක නූපදිත්යයි' වදාළසේක.

**(පළමුවැනි පර්වතවර්ගය නිමි.)**

---

## 2. ගිලාන වර්ගය.

### 1. පාණොපම (ඉරියාපථොපම) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක.

'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්කිසි සත්වකෙනෙක් විවෙක යෑමද, විවෙක සිටීමද, විවෙක හිඳීමද, විවෙක සයනයද යන සතර ඉරියව් පවත්වත්ද ඒ සියලු සත්වයෝම යම්සේ පොළොව නිසා, පොළොවෙහි පිහිටාම ඒ සතර ඉරියව් පවත්වත්ද මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙමේ සීලය නිසා සීලයෙහි පිහිටා සප්ත බොධ්‍යංගයන් වඩයි. සප්ත බොධ්‍යංගයන් බහුල කරයි. මහණෙනි, කෙසේනම් මහණතෙමේ සීලය නිසා සීලයෙහි පිහිටා සප්ත බොධ්‍යංගයන් වඩයිද? සප්ත බොධ්‍යංගයන් බහුල කරයිද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ, සති සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ, විරිය සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ජංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මේ මහණතෙමේ විවේකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද,

4. "මහණෙනි, මෙසේ වනාහී මහණතෙමේ සීලය නිසා සීලයෙහි පිහිටා සප්ත බොධ්‍යංගයන් වඩයි. සප්ත බොධ්‍යංගයන් බහුල කරයි."

## 2. සුරියොපම සූත්‍රය. (1)

1. (2, 3 වෙනි සූත්‍ර මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දෙශනා කරනලදී.)

2. "මහණෙනි, යම් මේ අරුණෝද්ගමණයක් වේද, එය උදාවන සූර්යයාට පූර්වාංගම වෙයි. පූර්වනිමිත්ත වෙයි. මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුවගේ යම් ඒ කල්‍යාණ මිත්‍රයන් ඇති බවක් වේද එය සප්ත බොධ්‍යංගයන්ගේ ඉපදීමට පූර්වංගම වෙයි, පූර්ව නිමිත්ත වෙයි. මහණෙනි, කල්‍යාණ මිත්‍රයන් ඇති භික්ෂුව තමා සප්ත බොධ්‍යංගයන් වඩන්නේය. සප්ත බොධ්‍යංගයන් බහුල කරන්නේය යන මෙය කැමති විය යුතුයි. මහණෙනි, කෙසේ නම් කල්‍යාණ මිත්‍රයන් ඇති මහණතෙමේ සප්ත බොධ්‍යංගයන් වඩයිද, සප්ත බොධ්‍යංගයන් බහුල කරයිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයන් ඇති මහණතෙමේ සප්ත බොධ්‍යංගයන් වඩයි. සප්ත බොධ්‍යංගයන් බහුල කරන්නේයයි" වදාළේය.

## (3) දුතිය සුරියොපම සූත්‍රය

2. "මහණෙනි, යම් මේ අරුණොදයක්වේද, එය උදාවන සූර්යයාට පූර්වංගමය, පූර්ව නිමිත්තය මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුවගේ යම් මේ නුවණින් මෙනෙහි කිරීමක්වේද, එය සප්තබොධ්‍යංගයන් ඉපදීම පිණිස පූර්වංගමය, පූර්වනිමිත්තය මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාවූ භික්ෂුව තමා සප්ත බොධ්‍යංගයන් වඩන්නේය. සප්තබොධ්‍යංගයන් බහුල

කරන්නේය යන මෙය කැමතිවිය යුතුයි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාවූ මහණතෙම කෙසේ සප්ත බොධ්‍යංගයන් වඩයිද? සප්තබොධ්‍යංගයන් බහුල කරයිද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි මෙසේ වනාහි නුවණින් මෙනෙහි කිරීමෙන් යුක්තවූ මහණතෙමේ සප්ත බොධ්‍යංගයන් වඩයි. සප්තබොධ්‍යංගයන් බහුල කරන්නේ යයි" වදාළසේක.

---

## 4. මහා කස්සපත්ථෙර බොජ්ඣංගසූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාපනම්වූ වෙළුවනාරාමයෙහි වැඩවාසය කරනසේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේ ලෙඩින් පෙළුනේ, දුකට පැමිණියේ දැඩි ගිලන්වූයේ පිප්ඵලි ගුහාවෙහි වැඩ වාසය කරන්නාහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණිසේක. පැමිණ පනවනලද අස්නෙහි වැඩහුන්හ. හිඳ වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහාකස්සප ස්ථවිරයන් වහන්සේට මේ කාරණය වදාළසේක.

3. "කිමෙක්ද? කස්සප ඔබට ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? (ශරීරය පවත්වන්ට හැකිද?) කිම දුක් වේදනාවෝ පිරිහෙත්ද? අඩුවෙත්ද? කිම දියුණු නොවෙත්ද? ඒ දුක් වේදනාවන්ගේ කෙළවරක් නොපෙනෙත්දැයි (විචාළ සේක) ස්වාමීනි, මට ඉවසිය නොහැකිය, සතර ඉරියව්වෙහි සිරුර පැවැත්විය නොහැකිය. මාගේ දුක් වේදනාවෝ බලවත්හ, වැඩෙන්නාහ. දුක්වෙදනාවන්ගේ වැඩීම පෙනෙයි. අඩුවක් නොපෙනෙයි' යයි (පිළිතුරු දුන්හ.)

3. "කාශ්‍යපය, මා විසින් මොනවට ප්‍රකාශකරන ලද, වඩනලද, බහුල වශයෙන් කරනලද, මේ සත්වැදෑරුම් බොධ්‍යංග

ධර්මයෝ මා විසින් චතුස්සත්‍ය අවබෝධය පිණිස, නිවන් පිණිස පවතිත්. ඒ සප්තබොධ්‍යංගයෝ කවරහුදයත්? කාශ්‍යපය, මා විසින් මොනවට කියනලද, වඩනලද, බහුල කරනලද සති සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, චතුස්සත්‍යයන් අවබොධය පිණිසද, නිවන් පිණිසද, පවතියි. කාශ්‍යපය, මා විසින් මොනවට කියන ලද, ධර්මවිචය සම්බොජ්ඣංගය (එය) චතුස්සත්‍යයන් දැනීම පිණිසද, අවබොධය පිණිසද, නිවන් පිණිසද, පවතියි. කාශ්‍යපය, මා විසින් මොනවට කියන ලද. වඩනලද, බහුල කරනලද, විරිය සම්බොජ්ඣංගය සතර චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, අවබොධ පිණිසද, නිවන් පිණිසද පවතියි කාශ්‍යපය, මා විසින් මොනවට කියනලද වඩනලද, බහුල කරනලද, පීති සම්බොජ්ඣංගය, චතුස්සත්‍යය දැනගැනීම පිණිසද අවබොධය පිණිසද නිවන් පිණිසද පවතියි. කාශ්‍යපය මා විසින් මොනවට කියනලද, වඩනලද, බහුල වශයෙන් කරනලද, පස්සද්ධි සම්බොජ්ඣංගය චතුස්සත්‍ය දැනගැනීම පිණිසද, අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි. කාශ්‍යපය, මා විසින් මොනවට කියනලද, වඩනලද, බහුල කරනලද, සමාධි සම්බොජ්ඣංගය, චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, අවබොධය පිණිසද, නිවන් පිණිසද, පවතියි. කාශ්‍යපය, මා විසින් මොනවට කියනලද, වඩනලද, බහුල කරනලද, උපෙක්ඛා සම්බොජ්ඣංගය, චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි. කාශ්‍යපය, මේ මා විසින් මොනවට කියනලද, වඩනලද, බහුල කරනලද සප්ත බෝධ්‍යංගයෝ චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, අවබොධය පිණිසද, නිවන් පිණිසද, පවතිත් යයි" (වදාළසේක).

4. "භාග්‍යවතුන් වහන්ස, බොධ්‍යංග ධර්මයෝ මැනව, සුගතයන් වහන්ස, බොධ්‍යංග ධර්මයෝ ඒකාන්තයෙන් මැනවැයි' මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ දැන්වූහ.) භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළසේක. සතුටුවූ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවූහ. ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන්

වහන්සේ ඒ රෝගයෙන් නැගීසිටියහ. ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ ඒ ආබාධය (යම්සේ නූපදීද) එසේ පහව ගියේය.

---

## 5. මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග (ගිලාන 2) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ඇසුරුකොට කලන්දක නිවාප නම්වූ වෙළුවනයෙහි වැඩ වසන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේ හටගත් ආබාධ ඇත්තේ හටගත් දුක් ඇත්තේ දැඩි ගිලන්වූයේ ගිජ්ඣකූළ පව්වෙහි වැඩ වාසය කරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවෙක සැපයෙන් නැගී සිටියේ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරුන් යම්තැනකද එතැන්හි වැඩිසේක. වැඩමවා පනවනලද අස්නෙහි වැඩහුන්සේක. හිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරුන්ට මේ කාරණය වදාළසේක.

"කිම? මොග්ගල්ලානය, ඔබට ඉවසිය හැකිද? කිම, ඉරියව් පැවැත්විය හැකිද, කිම දුක්ඛවේදනාවෝ දුරුවෙත්ද? නොනැගෙත්ද? අඩුවීම පෙනේද? වැඩිවීම නොපෙනේද? "ස්වාමීනි, මට ඉවසිය නොහැක්කේය. යැපිය නොහැක්කේය. මාගේ බලවත් දුක් වේදනාවෝ වැඩෙන්නාහ. අඩු නොවන්නාහ. වැඩිවන බව පෙනෙයි. අඩුවන බව නොපෙනෙයි."

2. "මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියන ලද්දාවූ, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, මේ සප්ත බොජ්ඣංගයෝ චතුස්සත්‍යයන්ගේ දැනගැනීම පිණිසද අවබොධය පිණිසද, නිවන් පිණිසද, පවතිත්. ඒ සත කවරහුද යත්. මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියන ලද වඩනලද බහුල කරනලද සතිසම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, අවබෝධය පිණිසද, නිවන් පිණිසද පවතිත්. මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියනලද වඩන ලද බහුල කරන ලද

ධම්මවිචය සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, අවබෝධය පිණිසද නිවන් පිණිසද පවතියි. මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියන ලද වඩනලද බහුල කරනලද විරිය සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද අවබෝධය පිණිසද නිවන් පිණිසද පවතිත් මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියනලද වඩන ලද බහුල කරන ලද ප්‍රීති සම්බොජ්ඣංගය චතුස්සත්‍යයෙන් දැනගැනීම පිණිසද අවබෝධය පිණිසද නිවන් පිණිසද පවතියි. මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියන ලද වඩනලද බහුල කරන ලද පස්සද්ධි සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද අවබෝධය පිණිසද නිවන් පිණිසද පවතියි. මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියන ලද වඩන ලද බහුල කරන ලද සමාධි සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද අවබෝධය පිණිසද නිවන් පිණිසද පවතියි. මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියන ලද වඩන ලද බහුල කරන ලද උපෙක්ෂා සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද අවබෝධය පිණිසද නිවන් පිණිසද පවතියි. මොග්ගල්ලානය, මා විසින් මනාකොට කියනලද වඩනලද බහුල කරන ලද මේ සප්ත සම්බොජ්ඣංගයෝ (එය) චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද අවබෝධය පිණිසද නිවන් පිණිසද පවතිත්.

3. "භාග්‍යවතුන් වහන්ස, බොජ්ඣංගයෝ ඒකාන්තයෙන් සත්‍යයහ. සුගතයන් වහන්ස, බොජ්ඣංගයෝ ඒකාන්තයෙන් සත්‍යයහ."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට සතුටුවිය. මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ ඒ රෝගයෙන් නැගිට්ටේය. මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේගේ ඒ රෝගය (නැවත නූපදීද) එපරිද්දෙන් දුරුවූයේ විය.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 6. මහා චුන්දත්ථෙර බොජ්ඣංග (ගිලාන 3) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩවාසය කරනසේක. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ ගිලන්වූවෝ, දුකට පැමිණියෝ, දැඩි ගිලන් බවට පැමිණියෝ වූහ. ඉක්බිති ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසක හුන්නේය. එක් පසක හුන්නාවූ ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "චුන්දය, බොජ්ඣංග ධර්මයෝ තොපට වැටහෙත්වා."

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද, වඩන ලද, බහුල කරන ලද මේ සප්ත බොධ්‍යංග ධර්මයෝ චතුස්සත්‍යයන් දැන ගැනීම පිණිසද අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතිත්. ඒ සත කවරහුද යත්? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද, වඩන ලද, බහුල කරන ලද සති සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනීම පිණිසද, අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට කියන ලද, වඩන ලද, බහුල කරන ලද ධම්මවිචය සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද, වඩන ලද, බහුල කරන ලද විරිය සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැන ගැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද, වඩන ලද, බහුල කරන ලද පීති සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැනගැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද, වඩන ලද, බහුල කරන ලද පස්සද්ධි සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැන ගැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද, වඩන ලද, බහුල කරන ලද සමාධි සම්බොජ්ඣංගය චතුස්සත්‍යයන් දැන ගැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනා කොට දෙශනා කරනලද, වඩනලද, බහුල කරනලද උපෙක්ඛා සම්බොජ්ඣංගය චතුස්සත්‍යය දැනගැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි.

3. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද, වඩන ලද, බහුල කරන ලද මේ සප්ත බොජ්ඣංගයෝ චතුස්සත්‍යයන් දැන ගැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතිත්." "චුන්දය, බොධ්‍යංග ධර්මයෝ ඒකාන්තයෙන් සත්‍යයහ" - චුන්දය, බොධ්‍යංග ධර්මයෝ එකාන්තයෙන් සත්‍යයහයි" (වදාළසේක)

4. "ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේ මේ ධර්මය වදාළහ. බුදුරජාණන් වහන්සේ මනාකොට අනුදැන වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ ආබාධයෙන් නැගීසිටිසේක්මය භාග්‍යවතුන් වහන්සේගේ ඒ ආබාධය නැවත නූපදනා පරිද්දෙන් ප්‍රහීණ වූයේමය.

---

## 7. අපාරාපාරගමන සූත්‍රය

(7, 8, 9, 10 යන සූත්‍ර සතරද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දෙශනා කරන ලදී.)

2. "මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ මේ බොධ්‍යංග ධර්මයෝ සත්දෙනෙක් (සසර සයුරෙන්) මෙතරින් එතෙරවූ නිවනට යෑම පිණිස පවතිත්. කවර සත්දෙනෙක්දයත්?

3. (මේ ඡෙදය පර්වත වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි. 2689 පිට බලන්න.)

4. "මහණෙනි, වඩන ලද්දාවූ බහුලකරන ලද්දාවූ මේ බොධ්‍යංගයෝ (සත්දෙනා සසර සයුරෙන්) මෙතරින් එතෙරවූ නිවනට යෑම පිණිස පවතින්නේයයි" වදාළේය.

**5.** "භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක. සුගතවූ ශාස්තෲන් වහන්සේ මෙය වදාරා, නැවත මෙසේද වදාළසේක.

"මිනිසුන් අතුරෙහි යම් ජනයෝ පරතෙරට හෙවත් නිවනට යන්නාහු වෙත්ද, එබඳු ජනයෝ ස්වල්පයහ. නැවත අන්‍යවූ ප්‍රජාතොමෝ (සක්කාය නමැති) මෙතරටම නැවත නැවත දුවන්නීය."

"යම් කෙනෙක් වනාහි මනාකොට වදාළ ධර්මයෙහි ධර්මයට අනුව පවතින්නෝ වෙත්ද, ඒ ජනයෝ එතෙර වීමට ඉතා දුෂ්කරවූ කෙලෙස් මරුට අයත්වූ ත්‍රෛභූමක වෘත්තය (ඉක්මවා) නිවනට පැමිණෙන්නාහුය."

"නුවණැත්තේ අකුසල ධර්මය හැර කුසල ධර්මය වඩන්නේය. ආලයෙන් හෙවත් ගිහි ගෙයින් නික්ම ගෙයක් නැති පැවිද්දට පැමිණ යම් තැනක කැමති වීමට දුෂ්කරද,

ඒ නිවනෙහි කැමතිවන්නේය නුවණැත්තේ කාමයන් දුරුකොට රාගය කිසි පළිබොධයක් නැත්තෙක්ව තමන් සිත කිලුටුකරන ධර්මයන්ගෙන් පිරිසිදු කරන්නේය.

"යම් කෙනෙකුන්ගේ සිත සම්බොධි අංගයන්හි මනාකොට වඩනලදද, (කිසිවක් සිතින්) දැඩිසේ නොගෙන ග්‍රහණයට විරුද්ධවූ නිවනෙහි යම් රහත් කෙනෙක් ඇලුනාහුද කාන්තිමත්වූ, නැතිකළ ආශ්‍රව ඇති ඒ උත්තමයෝ ලොකයෙහි පිරිනිවියාහු නම් වෙත්" යනුයි.

---

## 8. අරියමග්ග විරද්ධ සූත්‍රය.

**2.** "මහණෙනි, යම් කිසි කෙනෙකුන් විසින් සප්ත බොධ්‍යංග ධර්මයෝ පටන් නොගන්නා ලද්දාහුද, ඔවුන් විසින් මනාකොට දුක් නැතිකිරීම පිණිස පවතින්නාවූ ආර්‍ය මාර්ගය පටන්නොගන්නා ලද්දේය. මහණෙනි, යම්කිසි කෙනෙකුන් විසින් සප්ත බොධ්‍යංග ධර්මයෝ වඩන ලද්දාහුද ඔවුන් විසින් මනාකොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ආර්‍ය මාර්ගය තෙම වඩන ලද්දේය. ඒ සත කවරේද යත්?

3. (මේ ඡේදය පර්වත වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි. 2689 පිට බලන්න.)

4. "මහණෙනි, යම් කිසිවෙකු විසින් මේ සප්ත බොධ්‍යංග ධර්මයෝ පටන්නොගන්නා ලද්දාහුද, ඔවුන් විසින් දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ආර්‍ය මාර්ගය පටන් නොගන්නා ලද්දේය. මහණෙනි, යම් කිසිවෙකු විසින් මේ සප්ත බොධ්‍යංගමයෝ පටන්ගන්නාලද්දාහුද, ඔවුන් විසින් දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ආර්‍ය මාර්ගය තෙම පටන් ගන්නා ලද්දේය" යනුයි.

---

## 9. අරිය බොජ්ඣංග සූත්‍රය.

2. "මහණෙනි, වඩනලද්දාවූ, බහුල කරන ලද්දාවූ, ආර්‍යවූ, නෛර්‍යානිකවූ මේ සප්ත බොධ්‍යංගයෝ එය කරන්නහුගේ දුක් මනාකොට නැතිකිරීමට පමුණුවත්. ඒ සත කවරේදයත්,

3. (මේ ඡේදය පර්වත වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි. 2689 පිට බලන්න)

4. "මහණෙනි, වඩනලද්දාවූ, බහුල කරන ලද්දාවූ ආර්‍යවූ නෛර්‍යානිකවූ එය කරන්නහුගේ දුක් මනාකොට ඇති කිරීමට පමුණුවත්" යනුයි.

---

## 10. නිබ්බිදා බොජ්ඣංග සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සප්තබොජ්ඣංගයෝ ඒකාන්තයෙන් කලකිරීම පිණිස, නොඇලීම පිණිස දුක් නැති කිරීම පිණිස සංසිඳීම පිණිස, මනාකොට දැනගැනීම පිණිස, මනාකොට අවබෝධය පිණිස, නිවන් පිණිස පවතිත්. ඒ සත කවරේදයත්?

3. (මේ ඡේදය පර්වත වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි. 2689 පිට බලන්න.)

4. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ බොජ්ඣංග සත ඒකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස, දුක් නැති කිරීම පිණිස, සන්සිඳීම පිණිස, මනාකොට දැනගැනීම පිණිස, මනාකොට අවබෝධය පිණිස පවතිත්" යනුයි.

(දෙවෙනි ගිලාන වර්ගය නිමි.)

---

## 3. උදායි වර්ගය.

### 1. බොධාය සංවත්තන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු සිටුහු විසින් කරවන ලද විහාරයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ඒ මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. 'ස්වාමීනි, බොජ්ඣංගයෝ බොජ්ඣංගයෝයි කියනු ලැබෙත්. ස්වාමීනි, කෙතෙක් කරුණකින් බොජ්ඣංගයෝයයි කියනු ලැබෙත්ද?" යනුයි.

2. "මහණ, අවබොධය පිණිස පවතිත්ද එබැවින් බොජ්ඣංගයෝ යයි කියනු ලැබෙත්. මේ ශාසනයෙහි මහණ තෙමේ විවෙකය ඇසුරුකළාවූ, නොඇලීම ඇසුරුකළාවූ නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ සති සම්බොජ්ඣංගය වඩයි. මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළාවූ, නො ඇලීම ඇසුරුකළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ, ධම්ම විචය සම්බොජ්ඣංගය වඩයි. මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරුකළාවූ නො ඇලීම ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ විරිය සම්බොජ්ඣංගය වඩයි. මේ ශාසනයෙහි මහණතෙමේ

විවෙකය ඇසුරුකළාවූ, නොඇලීම ඇසුරුකළා වූ නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩයි. මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයි. මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරුකළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ සමාධි සම්බොජ්ඣංගය වඩයි. මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරුකළාවූ, නොඇලීම ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, උපෙක්ඛා-සම්බොජ්ඣංගය වඩයි. මහණ, අවබොධය පිණිස පවතින එබැවින් බොජ්ඣංගයෝයයි කියනු ලැබෙත් යයි" වදාළසේක.

---

## 2. බොජ්ඣංග දෙශනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතුසේක. ස්වාමීනියි කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ සප්තබොධ්‍යංගයන් දෙශනාකරන්නෙමි. එය මනාකොට අසව්. මහණෙනි, සප්තබොධ්‍යංගයෝ කවරහුදයත්?

3. (මේ ඡෙදය පර්වත වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි. 2689 පිට බලන්න.)

4. "මහණෙනි, මොවුහු වනාහි සප්ත බොධ්‍යංගයෝයි.

---

## 3. කාමරාගද්ධානිය සූත්‍රය.

(මෙතැන් සිට මේ සූත්‍ර සියල්ලේම මුල් ඡෙද 2 වෙනි සූත්‍රයේ මෙනි.)

**2.** මහණෙනි, කාමරාගයට හේතුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ කාමයෙහි අශාවද උපදියි. උපන්නාවූ කාමච්ඡන්දය ද බහුලබව පිණිස, විපුලබව පිණිසද පවතියි. මහණෙනි, ක්‍රොධයට හේතුවූ අරමුණු මෙනෙහිකිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ ක්‍රොධයද උපදියි. උපන්නාවූ ක්‍රොධයද බහුල බව පිණිස, මහත් බව පිණිසද පවතියි. මහණෙනි, සිතේ හා චෛතසිකයන්ගේ අලසබවට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ සිතේ හා චෛතසිකයන්ගේ අලසබවද උපදියි. උපන්නාවූ සිතේ හා චෛතසිකයන්ගේ අලසකම බහුලබව පිණිස මහත් බව පිණිසද පවතියි.

**3.** "මහණෙනි, සිතේ නොසන්සුන්බවට හා පසුතැවීමට හේතුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ සිතේ නොසන්සුන්බව හා පසුතැවීමද උපදියි. උපන්නාවූ සිතේ නොසන්සුන් බව හා පසුතැවීම බහුලබව පිණිස, මහත් බව පිණිසද පවතියි. මහණෙනි, බුද්ධාදී අටතැන සැකයට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ බුද්ධාදි අටතැන සැකයද උපදියි. උපන්නාවූ බුද්ධාදී අටතැන සැකය බහුල බව පිණිස මහත්බව පිණිසද පවතියි.

**4.** "මහණෙනි, සති සම්බොජ්ඣංගයට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ සති සම්බොජ්ඣංගයද උපදියි. උපන්නාවූ සති සම්බොජ්ඣංගයද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. ධම්මවිචය සම්බොජ්ඣංගයට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ ධම්ම විචය සම්බොජ්ඣංගයද උපදියි. උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. විරිය සම්බොජ්ඣංගයට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගයද උපදියි. උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. පීති සම්බොජ්ඣංගයට

කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයද උපදියි. උපන්නාවූ පීති සම්බොජ්ඣංගයද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. පස්සද්ධි සම්බොජ්ඣංගයට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයද උපදියි. උපන්නාවූ පස්සධි සම්බොජ්ඣංගයද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. සමාධි සම්බොජ්ඣංගයට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින්, නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයද උපදියි. උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. උපෙක්ඛා සම්බොජ්ඣංගයට කරුණුවූ අරමුණු මෙනෙහි කිරීම බහුලකොට ඇති බැවින් නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයද උපදියි. උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයද වැඩීමට සම්පූර්ණබවට පැමිණෙයි" යනුයි.

---

## 4. අයොනිසොමනසිකාර සූත්‍රය.

2. "මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නාවූ කාමයෙහි ආශාවද උපදියි. උපන්නාවූ කාමයෙහි ආශාවද බහුල බව පිණිස, මහත් බව පිණිස පවතියි. නූපන්නාවූ ක්‍රොධයද උපදියි. උපන්නාවූ ක්‍රොධයද බහුල බව පිණිස මහත් බව පිණිස පවතියි. නූපන්නාවූ ථීන මිද්ධයද (සිතේ හා චෛතසිකයන්ගේ අලසකම) උපදියි. උපන්නාවූ ථීන මිද්ධයද බහුලබව පිණිස මහත් බව පිණිස පවතියි. නූපන්නාවූ සිතේ නොසන්සුන් බව හා පසුතැවීම (උද්ධච්චකුක්කුච්චය) උපදියි. උපන්නාවූ සිතේ නොසන්සුන් බව හා පසුතැවීමද මහත් බව පිණිස පවතියි. නූපන්නාවූ බුද්ධාදි අට තැන සැකයද උපදියි. උපන්නාවූ බුද්ධාදි අටතැන සැකයද බහුල බව පිණිස මහත් බව පිණිස පවතියි. නූපන්නාවූ සතිසම්බොජ්ඣංගයද නූපදියි උපන්නාවූ සති සම්බොජ්ඣංගයද නැතිවෙයි. නූපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයද නූපදියි. උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයද නැතිවෙයි. නූපන්නාවූ විරිය

සම්බොජ්ඣංගයද නූපදියි. උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයද නැතිවෙයි. නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයද නූපදියි උපන්නාවූ පීති සම්බොජ්ඣංගයද නැතිවෙයි. නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයද නූපදියි. උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයද නැතිවෙයි නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයද නූපදියි. උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයද නැතිවෙයි. නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයද නූපදියි. උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයද නැතිවෙයි.

3. "මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නාවූ කාමච්ඡන්දය නූපදියි. උපන්නාවූ කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි. නූපන්නාවූ ව්‍යාපාදය නූපදියි. උපන්නාවූ ව්‍යාපාදය ප්‍රහීණවෙයි. නූපන්නාවූ ථීනමිද්ධය නූපදියි. උපන්නාවූ ථීන මිද්ධය ප්‍රහීණවෙයි. නූපන්නාවූ උද්ධච්චකුක්කුච්චය නූපදියි. උපන්නාවූ උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණවෙයි. නූපන්නාවූ විචිකිච්ඡාව නූපදියි. උපන්නාවූ විචිකිච්ඡාව ප්‍රහීණවෙයි. නූපන්නාවූ සති බොජ්ඣංගය උපදියි. උපන්නාවූ සති සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. නූපන්නාවූ ධම්ම විචය සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ විරිය සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. නූපන්නාවූ පීති සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ පීති සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි" යනුයි. නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣඞගය උපදියි. උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 5. අපරිහානිය ධම්ම සූත්‍රය.

2. "මහණෙනි, (මම) නුඹලාට අපරිහානිය (පිරිහීම ඇති නොකරන) ධර්ම සතක් කියන්නෙමි. එය මැනවින් අසව්. මහණෙනි, ඒ අපරිහානිය ධර්ම සත කවරහුදයත්, යම් මේ බොධ්‍යංග ධර්ම සතෙක් වෙත්ද, (ඔව්හුය.) ඒ ධර්මසත කවරහුද යත්?

3. (මේ ඡෙදය පර්වත වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි 2689 පිට බලන්න)

4. "මහණෙනි, මොව්හු අපරිහානිය ධර්ම සත්දෙන වෙති."

---

## 6. තණ්හක්ඛය පටිපදා සූත්‍රය

2. "මහණෙනි, යම් මාර්ගයක්, යම් පිළිවෙතක් තෘෂ්ණාව නැති කිරීම පිණිස පවතීද ඒ මාර්ගය ඒ පිළිවෙත වඩව්. මහණෙනි, කවර මාර්ගයක්, කවර පිළිවෙතක් තෘෂ්ණාව නැති කිරීම පිණිස පවතීද? යම් මේ බොධ්‍යංගයෝ සත්දෙනෙක් වෙත්ද, (ඔව්හුය) ඒ සත කවරහුදයත්?

3. (මේ ඡෙදය පබ්බත වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි. 2689 පිට බලන්න)

4. මෙසේ කීකල්හි ආයුෂ්මත් උදායී ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. 'ස්වාමීනි, කෙසේ වඩනලද්දාවූ, මෙසේ නැවත නැවත පුරුදුකරන ලද්දාවූ සප්ත තෘෂ්ණාව නැතිකිරීම පිණිස පවතිත්ද?"

5. "උදායි, මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරුකළාවූ, නොඇලීම ඇසුරුකළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ, මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ ව්‍යාපාද රහිතවූ සති සම්බොජ්ඣංගය වඩයිද, ඒ විවෙකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ වඩන්නාවූ ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ, මහත්වූ, මහත් බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද රහිතවූ, ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළ, නිවනට නැමුණාවූ, මහත්වූ මහත් බවට ගියාවූ, අප්‍රමාණවූ ව්‍යාපාද රහිතවූ ධම්මවිචය සංබොජ්ඣංගය වඩන්නාවූ ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණවෙයි.

"මහණෙනි, මහණතෙම විවෙකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ, මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද රහිතවූ, විරිය සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළ, නිවනට නැමුණාවූ, මහත්වූ මහත් බවට ගියාවූ, අප්‍රමාණවූ ව්‍යාපාද රහිතවූ විරිය සංබොජ්ඣංගය වඩන්නාවූ ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණවෙයි.

"මහණෙනි, මහණතෙම විවෙකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ, මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද රහිතවූ, පීති සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ ව්‍යාපාද රහිතවූ, පීති සම්බොජ්ඣංගය වඩන්නාවූ ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණවෙයි.

"මහණෙනි, මහණතෙම විවෙකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ, මහත්වූ, මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද රහිතවූ, පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද රහිතවූ, පස්සද්ධි සම්බොජ්ඣංගය වඩන්නාවූ ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණවෙයි.

"මහණෙනි, මහණතෙම විවෙකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ, මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද රහිතවූ, සමාධි සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ මහත්බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද

රහිතවූ, විරිය සම්බොජ්ඣංගය වඩන්නාවූ ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණවෙයි.

"මහණෙනි, මහණතෙම විවෙකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ, මහත් බවට ගියාවූ, අප්‍රමාණවූ, ව්‍යාපාද රහිතවූ, උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ, මහත්වූ, මහත් බවට ගියාවූ, අප්‍රමාණවූ ව්‍යාපාද රහිතවූ, උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩන්නාවූ ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණවෙයි. තෘෂ්ණාව ප්‍රහීණවීම නිසා කර්මය ප්‍රහීණවෙයි. කර්මය ප්‍රහීණවීම නිසා දුක ප්‍රහීණවෙයි. උදායි! මෙසේ වනාහි තෘෂ්ණාව, ක්ෂයවීමෙන් කර්මය ක්ෂයවෙයි. කර්මය ක්ෂයවීමෙන් දුක ක්ෂයවේයයි" වදාළසේක.

---

## 7. තණ්හා නිරොධ සූත්‍රය

**2.** "මහණෙනි, යම් මාර්ගයක්, යම් පිළිවෙතක් තෘෂ්ණාව නැතිකිරීම පිණිස පවතීද ඒ මාර්ගය, ඒ පිළිවෙත වඩව්. මහණෙනි, කවර මාර්ගයක්, කවර පිළිවෙතක් තෘෂ්ණාව නැතිකිරීම පිණිස පවතීද? යම් මේ බොජ්ඣංග ධර්මයෝ සත්දෙනෙක් වෙත්ද, (ඔව්හුය) ඒ සත කවරහුද?

**3.** "සති සම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය, උපෙක්ඛා සම්බොජ්ඣංගය යන මොහුයි.

**4.** "මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ බොජ්ඣංගයෝ සත්දෙන තෘෂ්ණාව නැතිකිරීම පිණිස පවතිත්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණාවූ සති සම්බොජ්ඣංගය වඩයිද, විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ නිවනට නැමුණාවූ

ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ නිවනට නැමුණාවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද, විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුණ වූ පීති සම්බොජ්ඣංගය වඩයිද විවෙකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ නිවනට නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ නිවනට නැමුණාවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද, විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ නිවනට නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ, මෙසේ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ බොධ්‍යංගයෝ සත්දෙන තෘෂ්ණාව නැති කිරීම පිණිස පවතිත් යයි" වදාළසේක.

---

## 8. නිබ්බේධ භාගිය සූත්‍රය.

**2.** "මහණෙනි, නුඹලාට කෙලෙස් බිඳ දැමීම් පක්ෂයෙහි සිටි (නිබ්බේධ භාගිය) මාර්ගය දෙශනා කරන්නෙමි, එය මනා කොට අසව්. මහණෙනි, කෙලෙස් බිඳ දැමීම පක්ෂයෙහි සිටි මාර්ගය කවරේද? යම් මේ බොජ්ඣංගයෝ සත්දෙනෙක්වෙත්ද? (ඔව්හුය) ඒ සත කවරහුද යත්?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි. 2722 වෙනි පිට)

**4.** මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "ස්වාමීනි, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ, බොජ්ඣංගයෝ සත්දෙන කෙලෙස් බිඳ දැමීම පිණිස පවත්නාහුද" යනුයි.

**5.** "උදායී, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, මහත්වූ, මහත්

බවට ගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාද රහිත සති සම්බොජ්ඣංගය වඩයිද හෙතෙම සති සම්බොජ්ඣංගය වඩනලද සිතින් පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද ලොභ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද පෙර නොපලන ලද ද්වෙෂ සමූහය බිඳ දමයි. පලාදමයි. පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද මොහ සමූහය බිඳ දමයි, පලා දමයි.

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ මහත්වූ, මහත් බවට ගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාද රහිත ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම ධම්මවිචය සම්බොජ්ඣංගය වඩන ලද සිතින් පෙර නොබිඳින ලද පෙර නොපලනලද ලොභ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද පෙර නොපලන ලද ද්වෙෂ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද මොහ සමූහය බිඳ දමයි. පලා දමයි.

"විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ මහත්වූ, මහත් බවට ගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාද රහිත විරිය සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම විරිය සම්බොජ්ඣංගය වඩන ලද සිතින් පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද ලොභ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද පෙර නොපලන ලද ද්වෙෂ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද මොහ සමූහය බිඳ දමයි. පලා දමයි.

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ මහත්වූ, මහත් බවට ගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාද රහිත පීති සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම පීති සම්බොජ්ඣංගය වඩන ලද සිතින් පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද ලොභ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද පෙර නොපලන ලද ද්වෙෂ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද මොහ සමූහය බිඳ දමයි. පලා දමයි.

"විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ මහත්වූ, මහත් බවට ගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාද

රහිත පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම පස්සද්ධි සම්බොජ්ඣංගය වඩන ලද සිතින් පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද ලොභ සමූහය බිඳ දමයි පලා දමයි පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද ද්වෙෂ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද මොහ සමූහය බිඳ දමයි. පලා දමයි.

"විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ මහත්වූ, මහත් බවට ගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාද රහිත සමාධි සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම සමාධි සම්බොජ්ඣංගය වඩන ලද සිතින් පෙර නොබිඳිනලද, පෙර නොපලන ලද ලොභ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද පෙර නොපලන ලද ද්වෙෂ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද මොහ සමූහය බිඳ දමයි. පලා දමයි.

"විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ මහත්වූ, මහත් බවට ගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාද රහිත උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩන ලද සිතින් පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද ලොභ සමූහය බිඳ දමයි. පලා දමයි පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද ද්වෙෂ සමූහය බිඳ දමයි. පලා දමයි. පෙර නොබිඳින ලද, පෙර නොපලන ලද මොහ සමූහය බිඳ දමයි. පලා දමයි.

**5.** උදායි, මෙසේ වඩන ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ, සප්ත බොධ්‍යංගයෝ නිවන් පිණිස පවතින්නාහ යනුයි"

---

## 9. ඒකධම්ම බොජ්ඣංග සූත්‍රය.

2. "මහණෙනි, යම් ධර්ම කෙනෙක් වඩන ලද්දාහු නැවත නැවත පුරුදු කරන ලද්දාහු සත්වයන් සසර බැඳ තබන (සංයොජනීය) ධර්මයන්ගේ අරමුණු නැතිකිරීම පිණිස පවතිත්ද? මහණෙනි, මේ බොධ්‍යංග ධර්මයෝ සත්දෙන යම්සේද එබඳු

අන් එකම ධර්මයකුදු මම නුවණැසින් නොදකිමි. ඒ සත කවරේදයත්?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි. 2722 පිට)

4. "මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ බහුල කරන ලද්දාවූ මේ බොධ්‍යංග ධර්මයෝ සත්දෙන සත්වයන් සසර බැඳ තබන ධර්මයන්ගේ අරමුණු නැතිකිරීම පිණිස පවතිත්ද?

5. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ සති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද,

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද,

6. "මහණෙනි මෙසේ වඩන ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ බොජ්ඣංගයෝ සත්දෙන සත්වයන් සසර බැඳ තබන

ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස පවතිත්. මහණෙනි, සසර බැඳ තබන ධර්මයන්ගේ අරමුණු (සංයෝජනිය ධර්මයෝ) කවරහුද? මහණෙනි, ඇස සංයොජනීය ධර්මයකි. මේ ඇසෙහි ඒ සංයොජනයයි කියන ලද සත්වයන් සසර බැඳ තබන්නාවූ ඉතා තදින් අල්ලා ගන්නාවූ ධර්මයෝ උපදිත්.

"මහණෙනි, කන සංයොජනයට අරමුණු වන්නාවූ ධර්මයකි. එහි සංයොජනයන්ගෙන් බැඳ ගැනීම් බැස ගැනීම් උපදිත්, මහණෙනි, නාසය සංයොජනයට අරමුණු වන්නාවූ ධර්මයකි. එහි සංයොජනයන්ගෙන් බැඳ ගැනීම බැස ගැනීම් උපදිත්. මහණෙනි, දිව සංයොජනයන්ට අරමුණු වන්නාවූ ධර්මයකි. එහි සංයොජනයන්ගෙන් බැඳ ගැනීම් බැස ගැනීම් උපදිත්. මහණෙනි, කය සංයොජනයන්ට අරමුණුවන ධර්මයකි. එහි සංයොජනයන්ගෙන් බැඳ ගැනීම් බැස ගැනීම් උපදිත්. මහණෙනි, සිත සංයොජනයන්ට අරමුණුවන ධර්මයකි. එහි සංයොජනයන්ගෙන් බැඳීම් බැසගැනීම් උපදිත්. මහණෙනි, මොව්හු සංයොජනයන්ට අරමුණු වන ධර්මයෝ යයි කියනු ලැබෙත්."

---

## 10. උදායි බහුකත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සුම්භ ජනපදයෙහි සුම්භයන්ගේ සේදංක නම් නියම් ගමක් වෙයි. එහි වැඩ වාසය කරන සේක. එකල්හි වනාහි ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසක හුන්නේය. එක්පසක හුන්නාවූ ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දන්වා සිටියේය.

2. "ස්වාමීනි, යම්තාක් මා විසින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රෙමයද, ගෞරවයද, ලජ්ජාවද භයද බුහුමන් වශයෙන් කරන ලද්දේද? ස්වාමීනි, (එය) ආශ්චර්යයකි. ස්වාමීනි, එය

අද්භූතයකි. ස්වාමීනි, මම වනාහි පෙර ගිහියෙක් වූයේම ධර්මය කෙරෙහි නොකරන ලද බුහුමන් ඇත්තේ වීමි. සංඝයා කෙරෙහි නොකරන ලද බුහුමන් ඇත්තේ වීමි, ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රේමයද, ගෞරවයද, ලජ්ජාවද, භයද දකිමින් ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවීමි.

3. "භාග්‍යවතුන් වහන්සේ ඒ මට මේ රූපය, මේ රූපයාගේ පහළවීමට හේතුවය, මේ රූපය දුරුකිරීමය. මේ වේදනාවය මේ වේදනාවගේ පහළවීමට හේතුවය, මේ වේදනාව දුරුකිරීමය. මේ සංඥාවය, මේ සංඥාවගේ පහළවීමට හේතුවය, මේ සංඥාව දුරුකිරීමය. මේ සංස්කාරයන්ය, මේ සංස්කාරයන්ගේ පහළවීමට හේතුවය, මේ සංස්කාරයන් දුරුකිරීමය මේ විඥානය, මේ විඥානයාගේ පහළවීමට හේතුවය, මේ විඥානයාගේ දුරුකිරීම යයි ධර්ම දෙශනා කළසේක.

ස්වාමීනි, ඒ මම වනාහි ජනයාගෙන් තොර හිස් තැනකට ගියේ, මේ උපාදානස්කන්ධ පසෙහි ඇතිවීම හා නැතිවීම පෙරළා බලන්නේ මේ දුකයයි තත්වූ පරිද්දෙන් දැනගතිමි. මේ දුක් ඉපදීමේ හේතුවයයි තත්වූ පරිද්දෙන් දැනගතිමි. මේ දුක් නැතිකිරීමයයි තත්වූ පරිද්දෙන් දැනගතිමි. මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තත්වූ පරිද්දෙන් දැනගතිමි.

4. "ස්වාමීනි, මා විසින් විදර්ශනා ධර්මයද අවබොධ කරන ලද්දේය. විදර්ශනා මාර්ගයද ලබන ලද්දේය. මා විසින් යමක් වඩන ලදද බහුල වශයෙන් කරන ලදද එය ඒ ඒ ආකාරයෙන් වාසය කරන්නාහ. යම්සේ ජාතිය (ඉපදීම) ක්ෂය විය, බඹසර වැස නිමවන ලදී. කටයුතු දෙය කරන ලදී. මින්මතු ආත්ම භාවයක් නැතැයි මම දැනගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

5. "ස්වාමීනි, මා විසින් සති සම්බොජ්ඣංගයක් ලබන ලදී. මා විසින් යම් සති සම්බොජ්ඣංගයක් වඩන ලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂය විය. බඹසර වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මින්මතු ආත්මභාවයක් නැතැයි මම දැන ගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

"ස්වාමීනි, මා විසින් ධම්මවිචය සම්බොජ්ඣංගය ලබනලදී. මා විසින් යම් ධර්මවිචය සම්බොජ්ඣංගයක් වඩන ලදද බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මින්මතු ආත්මභාවයක් නැතැයි මම දැන ගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

"ස්වාමීනි, මා විසින් විරිය සම්බොජ්ඣංගය ලබන ලදී. මා විසින් යම් විරිය සම්බොජ්ඣංගයක් වඩන ලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මින්මතු ආත්ම භාවයක් නැතැයි මම දැන ගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

"ස්වාමීනි, මා විසින් පීති සම්බොජ්ඣංගය ලබන ලදී. මා විසින් යම් පීති සම්බොජ්ඣංගයක් වඩන ලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂයවිය බඹසර වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මින්මතු ආත්මභාවයක් නැතැයි මම දැනගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

"ස්වාමීනි, මා විසින් පස්සද්ධි සම්බොජ්ඣංගය ලබන ලදී. මා විසින් යම් පස්සද්ධි සම්බොජ්ඣංගයක් වඩන ලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂවිය. බඹසර වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මින්මතු ආත්මභාවයක් නැතැයි මම දැනගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

"ස්වාමීනි, මා විසින් සමාධි සම්බොජ්ඣංගය ලබන ලදී. මා විසින් යම් සමාධි සම්බොජ්ඣංගයක් වඩනලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂ විය. බඹසර වැස නිමවනලදී. කළයුතු දෙය කරනලදී. මින් මතු ආත්මභාවයක් නැතැයි මම දැනගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"ස්වාමීනි, මා විසින් උපෙක්ඛා සම්බොජ්ඣංගය ලබනලදී. මා විසින් යම් උපෙක්ඛා සම්බොජ්ඣංගයක් වඩන ලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂවිය. බඹසර වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මින්මතු ආත්මභාවයක් නැතැයි මම දැන ගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය.

6. "ස්වාමීනි, මා විසින් මේ මාර්ගය ලබන ලදී. මා විසින් යම් ධර්මයක් වඩන ලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ ඉපදීම ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කටයුතු දෙය කොට නිමවන ලදී. මින්මතු ආත්මභාවයක් නැතැයි දැනගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය යනුයි."

7. "උදායි, මැනවි. මැනවි. උදායි, නුඹ විසින් යම් මාර්ගයක් වඩන ලදද, බහුල වශයෙන් කරන ලදද, ඒ ඒ ආකාරයෙන් වසන්නහු යම්සේ මම ඉපදීම ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මින්මතු ආත්මභාවයක් නැතැයි දැන ගන්නෙම්ද, ඒ බැව් පිණිස පමුණුවන්නේය යන මේ මාර්ගය නුඹ විසින් ලබන ලදැයි" වදාළේය.

(තුන්වැනි උදායි වර්ගය නිමි.)

---

## 4. නීවරණ වර්ගය.

### 1. අප්පමාද මූලක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, කුසල කොට්ඨාසයට අයත්වූ කුසල පාක්ෂිකවූ යම්කිසි කුසල ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තාහ. අප්‍රමාදය හැසිරීම කොට ඇත්තාහ. අප්‍රමාදය ඒ ධර්මයන්ට ප්‍රධානයයි කියනු ලැබේ. මහණෙනි, අප්‍රමාදවූ භික්ෂුව සප්තබොධ්‍යංගයන් වඩන්නේය. සප්ත බොධ්‍යංගයන් නැවත නැවත පුරුදු කරන්නේය යන මෙය කැමතිවිය යුතුය. මහණෙනි, අප්‍රමාදවූ මහණතෙම කෙසේ සප්ත බොධ්‍යංගයන් වඩයිද? නැවත නැවත පුරුදු කරයිද?

3. "මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවන් පිණිස නැමුණාවූ සති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවන් පිණිස නැමුණාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවන් පිණිස නැමුණාවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවන් පිණිස නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවන් පිණිස නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවන් පිණිස නැමුණාවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවන් පිණිස නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, මෙසේ වනාහි අප්‍රමාදවූ මහණතෙමේ සප්ත බොධ්‍යංගයන් වඩයි. සප්ත බොධ්‍යංගයන් නැවත නැවත පුරුදු කෙරේයයි" වදාළසේක.

---

## 2. යොනිසොමනිසිකාර මූලක සූත්‍රය.

1. (මේ වර්ගයේ සූත්‍ර සියල්ලම පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, කුසල කොට්ඨාශයෙහිවූ, කුසල පාක්ෂිකවූ යම්කිසි කුසල ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ල නුවණින් මෙනෙහි කිරීම මුල්කොට ඇත්තාහ. නුවණින් මෙනෙහි කිරීම හැසිරීම්කොට ඇත්තාහ. නුවණින් මෙනෙහි කිරීම ඒ ධර්මයන්ට ප්‍රධානයයි කියනු ලැබේ. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාවූ භික්ෂුව සප්ත බොධ්‍යංගයන් වඩන්නේය. සප්ත බොධ්‍යංගයන් නැවත නැවත පුරුදු කරන්නේය යන මේ කාරණය කැමතිවිය යුතුය. නුවණින් මෙනෙහි කිරීමෙන් යුක්තවූ මහණතෙම කෙසේ සප්ත බොධ්‍යංගයන් වඩන්නේද? සප්ත බොධ්‍යංගයන් නැවත නැවත පුරුදු කරන්නේද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වනාහි නුවණින් මෙනෙහි කිරීමෙන් යුක්තවූ මහණතෙම සප්ත බොජ්ඣංගයන් වඩන්නේය. සප්ත බොධ්‍යංගයන් නැවත නැවත පුරුදු කරන්නේය."

---

## 3. පඤ්චෝපක්කිලෙස සූත්‍රය.

2. "මහණෙනි, යම් කෙළෙසීමකින් කිලිටුවූ ස්වර්ණය මෘදුනොවේද, කටයුත්තට යොග්‍ය නොවේද, බැබලීමක් නැත්තේද, බිඳෙන සුලුද, පහසුවෙන් වැඩකළ නොහැකිද එවැනි කිලුටු පසක් ස්වර්ණයට (රන්වලට) ඇත්තේය. ඒ පස කවරේදයත්? මහණෙනි, යකඩ ස්වර්ණයාගේ කිලුටකි. එයින්

කිලුටුවූ ස්වර්ණය මෘදුද නොවෙයි, කර්මණ්‍යද නොවෙයි. බැබලීම නැත. බිඳෙන සුලුය, වැඩ කිරීමට පහසු නොවෙයි. මහණෙනි, ලොහය ස්වර්ණයාගේ කිලුටකි. එයින් කිලුටුවූ ස්වර්ණය මෘදුද නොවෙයි, කර්මණ්‍යද නොවෙයි. බැබලීමක්ද නැත. බිඳෙන සුලුය, වැඩට පහසු නොවෙයි. මහණෙනි, සුදු ඊයම් ස්වර්ණයාගේ කිලුටකි. එයින් කිලුටුවූ ස්වර්ණය මෘදු නොවෙයි. බැබලීමක් නැත. බිඳෙන සුලුය, වැඩට පහසු නැත. මහණෙනි, කලු ඊයම් ස්වර්ණයාගේ කිලුටකි. එයින් කිලුටුවූ ස්වර්ණය මෘදුද නොවෙයි. කර්මණ්‍යද නොවෙයි. බැබලීමක්ද නැත බිඳෙන සුලුය. වැඩට පහසු නැත. මහණෙනි රිදී ස්වර්ණයාගේ කිලුටකි. එයින් කිලුටුවූ ස්වර්ණය මෘදුද නොවෙයි, කර්මණ්‍යද නොවෙයි. බැබලීමක්ද නැත. බිඳෙන සුලුය, වැඩට පහසු නොවේ. මහණෙනි, මෙම පස ස්වර්ණයාගේ උපක්ලෙශයෝය. මේ පසින් කිලුටුවූ ස්වර්ණය මෘදුද නොවේද, කර්මණ්‍යද නොවේද, බැබලීමක් නැත්තේද, බිඳෙන සුලුද, වැඩට නොපහසුද, මහණෙනි, එපරිද්දෙන් යම් කෙලෙසුන්ගෙන් කිලුටුවූ සිත මෘදුන් නොවේද, කර්මණ්‍ය නොවේද, පිරිසිදු නොවේද, අරමුණෙහි සුණුවිසුණු වන හෙයින් බිඳෙන සුලුද, ආශ්‍රවයන් නැතිකිරීම පිණිස මනාකොට සිත එකඟ නොවේද එවැනි සිත කිලුටු කරන්නාවූ ධර්මයෝ මේ පසකි. ඒ පස කවරේදයත්?

"මහණෙනි, කාමච්ඡන්දය සිතේ කිලුටකි. එයින් කිලුටුවූ සිත මෘදු නොවෙයි, කර්මණ්‍ය නොවෙයි, පිරිසිදු නොවෙයි, අරමුණෙහි නොරඳන බැවින් බිඳෙයි, ආශ්‍රවයන්ගේ නැති කිරීම පිණිස සිත එකඟ නොවෙයි.

"මහණෙනි, ව්‍යාපාදය සිතේ කිලුටකි. එයින් කිලුටුවූ සිත මෘදු නොවෙයි, කර්මණ්‍ය නොවෙයි, පිරිසිදු නොවෙයි, අරමුණෙහි නොරඳන බැවින් බිඳෙයි, ආශ්‍රවයන්ගේ නැති කිරීම පිණිස සිත එකඟ නොවෙයි.

"මහණෙනි, කයේ හා සිතේ අලස ගතිය (ථීනමිද්ධය) සිතේ කිලුටකි. එයින් කිලුටුවූ සිත මෘදු නොවෙයි, කර්මණ්‍ය නොවෙයි,

පිරිසිදු නොවෙයි, අරමුණෙහි නොරඳන බැවින් බිඳෙයි, ආශ්‍රවයන්ගේ නැතිකිරීම පිණිස සිත එකඟ නොවෙයි.

"මහණෙනි, සිතේ නොසන්සුන් ගතිය හා පසුතැවීම් (උද්ධච්චකුක්කුච්චය) සිතේ කිලුටකි. කිලුටුවූ සිත මෘදු නොවෙයි, කර්මණ්‍ය නොවෙයි, පිරිසිදු නොවෙයි, අරමුණෙහි නොරඳන බැවින් බිඳෙයි, ආශ්‍රවයන්ගේ නැතිකිරීම පිණිස සිත එකඟ නොවෙයි.

"මහණෙනි, බුද්ධාදී අට තැන්හි සැකය සිතේ කිලුටකි. එයින් කිලුටුවූ සිත මෘදු නොවෙයි, කර්මණ්‍ය නොවෙයි, පිරිසිදු නොවෙයි, අරමුණෙහි නොරඳන බැවින් බිඳෙයි, ආශ්‍රවයන්ගේ නැතිකිරීම පිණිස සිත එකඟ නොවෙයි.

"මහණෙනි, මේ පස වනාහි චිත්තයාගේ උපක්ලෙශයෝය. ඒ උපක්ලෙශයන්ගෙන් කිලුටුවූ සිත මෘදු නොවෙයි, කර්මණ්‍ය නොවෙයි, පිරිසිදු නොවෙයි, අරමුණෙහි නොරඳන බැවින් බිඳෙන සුලුය, ආශ්‍රවයන්ගේ නැතිකිරීම පිණිස මනා කොට සිත එකඟ නොවේයයි" වදාළසේක.

---

## 4. අනුපක්කිලෙස සූත්‍රය.

**2.** "මහණෙනි කුසල ධර්මයන් ආවරණය නොකරන්නාවූ කුසල ධර්මයන් නොවසන්නාවූ, සිත කිලිටු නොකරන්නාවූ, වඩන ලද්දාවූ, නැවත නැවත පුරුදු කරන ලද්දාවූ, අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නාවූ බොජ්ඣංග ධර්ම සතක් වෙත්. ඒ සත කවරේද යත්?

**3.** "මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ සති සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ ධම්මවිචය

සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ විරිය සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ පීති සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ සමාධි සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ කුසල් නොවසන්නාවූ මේ බොධ්‍යංග ධර්ම සත අර්හත් මාර්ගඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 5. අයොනිසො මනසිකාර සූත්‍රය.

2. "මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නාවූ කාමච්ඡන්දය උපදියි. උපන්නාවූ කාමච්ඡන්දයාගේ

බහුලබව පිණිස මහත්බව පිණිස පවතියි. නූපන්නාවූ ව්‍යාපාදය (ක්‍රොධය) උපදියි. උපන්නාවූ ව්‍යාපාදයාගේ බහුල බව පිණිස, මහත්බව පිණිස පවතියි. නූපන්නාවූ ථිනමිද්ධය උපදියි. උපන්නාවූ ථිනමිද්ධයාගේ බහුලබව පිණිස, මහත්බව පිණිස පවතියි. නූපන්නාවූ උද්ධච්චකුක්කුච්චය උපදියි. උපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ බහුලබව පිණිස, මහත්බව පිණිස පවතියි. නූපන්නාවූ විචිකිච්ඡාව උපදියි. උපන්නාවූ විචිකිච්ඡාවේ බහුල බව පිණිස, මහත් බව පිණිස පවතියි.

3. "මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නාවූ සති සම්බොජ්ඣංගය උපදවයි. උපන්නාවූද සති සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණබවට පැමිණෙයි. නූපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණබවට පැමිණෙයි. නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූද විරියසම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණබවට පැමිණෙයි. නූපන්නාවූ පීති සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ පීති සම්බොජ්ඣංග වැඩීමට සම්පූර්ණබවට පැමිණෙයි. නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණබවට පැමිණෙයි. නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය උපදියි. උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණේයයි" වදාළසේක.

---

## 6. අපරිහාන සූත්‍රය.

2. "මහණෙනි, වඩනලද්දාවූ නැවත නැවත පුරුදුකරන ලද්දාවූ මේ බොජ්ඣංග සත දියුණුව පිණිස නොපිරිහීම පිණිස පවතිත්. ඒ සත කවරේද යත්?

3. "සති සම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය විරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි

සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය සහ උපෙක්ඛා සම්බොජ්ඣංගය යන සතය. මහණෙනි, වඩන ලද පුරුදු කරන ලද මේ සප්ත බොජ්ඣංගයෝ දියුණුව පිණිස, නොපිරිහීම පිණිස පවතිත් යයි" වදාළසේක.

---

## 7. ආවරණ සූත්‍රය.

2. "මහණෙනි, කුසල් ආවරණය කරන්නාවූ කුසල් වසන්නාවූ, සිත කෙලෙසන්නාවූ, නුවණ දුර්වල කරන්නාවූ, ධර්මයෝ පසක්වෙත්. ඒ පස කවරේදයත්, මහණෙනි, කාමච්ඡන්ද කුසල් ආවරණය කරන්නාවූ, කුසල් වසන්නාවූ සිතකෙළසන්නාවූ නුවණ දුර්වලකරන්නාවූ ධර්මයකි. ව්‍යාපාදය කුසල් ආවරණය කරන්නාවූ, කුසල් වසන්නාවූ සිත කෙළසන්නාවූ, ප්‍රඥාව දුර්වලකරන්නාවූ, ධර්මයකි.

"මහණෙනි, ථිනමිද්ධය කුසල් ආවරණය කරන්නාවූ, කුසල් වසන්නාවූ, කෙළසන්නාවූ, ප්‍රඥාවදුර්වල කරන්නාවූ ධර්මයකි.

"මහණෙනි; උද්ධච්චකුක්කුච්චය කුසල් ආවරණය කරන්නා වූ කුසල් වසන්නාවූ සිත කෙලසන්නාවූ ප්‍රඥාව දුර්වලකරන්නා වූ ධර්මයකි.

"මහණෙනි, විචිකිච්ඡාව කුසල් ආවරණය කරන්නාවූ කුසල් වසන්නාවූ, සිත කෙලසන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ ධර්මයකි. මහණෙනි, මොව්හු පස්දෙන කුසල් ආවරණය කරන්නාවූ, කුසල් වනසන්නාවූ, ප්‍රඥාව දුර්වලකරන්නාවූ ධර්මයෝවෙති.

3. "මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ සිත නොකෙලෙසන්නාවූ, වඩන ලද්දාවූ, නැවත නැවත පුරුදුකරන ලද්දාවූ මේ බොධ්‍යංග ධර්ම සත අර්හත් මාර්ගඵල පිණිස පවතිත්. ඒ කවර සත්දෙනෙක්ද යත්;

"මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ, සිත නොකෙලසන්නාවූ, වඩනලද්දාවූ, නැවත

නැවත පුරුදු කරනලද්දාවූ, සති සම්බොජ්ඣංගය අර්හත් මාර්ග ඵල පිණිස පවතිත්.

"මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ, සිත නොකෙලසන්නාවූ, වඩන ලද්දාවූ, නැවත නැවත පුරුදුකරන ලද්දාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල පිණිස පවතිත්.

"මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ, සිත නොකෙලෙසන්නාවූ, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ විරිය සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල පිණිස පවතිත්.

"මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ, සිත නොකෙලෙසන්නාවූ, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ පීති සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල පිණිස පවතිත්.

"මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ, සිත නොකෙලෙසන්නාවූ, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදුකරන ලද්දාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල පිණිස පවතිත්.

"මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ, සිත නොකෙලෙසන්නාවූ, වඩනලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ, සමාධි සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල පිණිස පවතිත්.

"මහණෙනි, කුසල් ආවරණය නොකරන්නාවූ, නොවසන්නාවූ, සිත නොකෙලෙසන්නාවූ, වඩනලද්දාවූ, නැවත නැවත පුරුදුකරන ලද්දාවූ, උපෙක්ඛා සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල පිණිස පවතිත්.

"මහණෙනි, වඩනලද්දාවූ, බහුලකරන ලද්දාවූ, කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත නොකෙලෙසන්නාවූ, මේ බොධ්‍යංග ධර්ම සත, අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්" යනුයි.

---

## 8. ආවරණනාවරණ සූත්‍රය.

2. "මහණෙනි, ආර්යශ්‍රාවක තෙමේ යම් කලෙක අර්ථයෙන් යුක්තව මෙනෙහිකොට මුළු සිත යොමුකොට කන්යොමා ධර්මය අසයිද, එකල ඔහුට පඤ්ච නීවරණයෝ නොවෙත්. එකල්හි සප්ත සම්බොජ්ඣංගයෝ වැඩීමෙන් සම්පූර්ණ වීමට පැමිණෙත්. ඔහුට එකල්හි කවර පඤ්ච නීවරණ කෙනෙක් නොවෙත්ද? කාමච්ඡන්ද නීවරණය එකල්හි නැත ව්‍යාපාද නීවරණය එකල්හි නැත. ථීන මිද්ධ නීවරණය එකල්හි නැත. උද්ධච්චකුක්කුච්ච නීවරණය එකල්හි නැත. විකිකිච්ඡා නීවරණය එකල්හි නැත. මේ පඤ්ච නීවරණයෝ එකල්හි නොවෙත්.

3. "කවර සප්ත බොධ්‍යංග කෙනෙක් වැඩීමට සම්පූර්ණ වීමට පැමිණෙද්ද? සති සම්බොජ්ඣංගය එකල්හි වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. ධම්මවිචය සම්බොජ්ඣංගය එකල්හි වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. විරිය සම්බොජ්ඣංගය එකල්හි වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. පීති සම්බොජ්ඣංගය එකල්හි වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. පස්සද්ධි සම්බොජ්ඣංගය එකල්හි වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. සමාධි සම්බොජ්ඣංගය එකල්හි වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි. උපෙක්ඛා සම්බොජ්ඣංගය එකල්හි වැඩීමට සම්පූර්ණවීමට පැමිණෙයි.

4. "මහණෙනි, ආර්යශ්‍රාවකතෙම යම් කලෙක අර්ථයෙන් යුක්තව මෙනෙහිකොට මුළු සිතින් යොමුකොට කන් යොමා ධර්මය අසයිද, ඔහුට එකල්හි මේ පඤ්ච නීවරණයෝ ඇති නොවෙත්. එකල්හි මේ සප්ත බොධ්‍යංගයෝ වැඩීමට සම්පූර්ණ වීමට පැමිණෙත්.

---

## 9. මහාරුක්ඛොපම සූත්‍රය.

2. "මහණෙනි, යම් ගසක් යටකර ගෙන වැඩුණාහුද ඒ ගස නැමී පාත්වී වැටීයේද එවැනි කුඩා බීජ ඇත්තාවූ මහත් කඳ ඇත්තාවූ ගස් යටකරගන්නාවූ මහා වෘක්ෂයෝ වෙත්.

මහණෙනි, ඒ මහා වෘක්ෂයෝ කවරහුද? ඇසටුය, නුගය, පුලිලය, ඉඹුල්ය, කච්ඡකය, කපිත්ථනය (වඳුරු තන හා සමාන ඵල ඇති ගස් වර්ගයක්) යන මොහුය. මහණෙනි, මේ කුඩා බීජ ඇත්තාවූ මහත් කය ඇත්තාවූ ගස් යට කරන්නාවූ මහා වෘක්ෂයන් විසින් යටකරන ලද ගස් නැමී පාත්වී ඇදවැටෙත්ද මහණෙනි, එපරිද්දෙන් මෙහි යම් කුලපුත්‍රයෙක් යම්බඳුවූ කාමයන් හැරදමා ගිහිගෙයින් නික්ම පැවිදි වෙයිද, හෙතෙම එවැනිවූ කාමයන්ගෙන් හෝ ඊට වැඩිතරම් කාමයන්ගෙන් හෝ යටකරන ලදුව නැමී පාත්වී ඇදවැටෙන්නේය.

3. "මහණෙනි, සිත යටකරන්නාවූ ආවරණය කරන්නාවූ වසන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ ධර්මයෝ පස්දෙනෙක් වෙත්. ඒ පස කවරේදයත්, මහණෙනි, කාමච්ඡන්දය සිත යට කරන්නාවූ ආවරණය කරන්නාවූ නුවණ දුර්වල කරන්නෙකි. මහණෙනි, ව්‍යාපාදය සිත යට කරන්නාවූ ආවරණය කරන්නාවූ වසන්නාවූ නුවණ දුර්වල කරන්නෙකි. මහණෙනි, ථීන මිද්ධය සිත යට කරන්නාවූ ආවරණය කරන්නාවූ වසන්නාවූ නුවණ දුර්වල කරන්නකි. මහණෙනි, උද්ධච්ච කුක්කුච්චය සිත යට කරන්නාවූ ආවරණය කරන්නාවූ වසන්නාවූ නුවණ දුර්වල කරන්නකි. මහණෙනි, විචිකිච්ඡාව සිත යටකරන්නාවූ ආවරණය කරන්නාවූ වසන්නාවූ නුවණ දුර්වල කරන්නකි. මහණෙනි, මේ පස් දෙන සිත යට කරන්නාවූ ආවරණය කරන්නාවූ වසන්නාවූ නුවණ දුර්වල කරන්නාහුය.

4. "මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ සිත යට නොකරන්නාවූ ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ මාර්ගඵල ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නාවූ මේ බොධ්‍යංග ධර්ම සතකි. ඒ සත කවරේද යත්?

"මහණෙනි, වඩනලද්දාවූ බහුලව කරනලද්දාවූ, සිත මැඩගෙන නොසිටින්නාවූ, සතිසම්බොධ්‍යංගය අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂකිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩනලද්දාවූ, බහුලවකරන ලද්දාවූ, සිත මැඩගෙන නොසිටින්නාවූ, ධම්මවිචය සම්බොධ්‍යංගය අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, වඩනලද්දාවූ, බහුලවකරන ලද්දාවූ, සිත මැඩගෙන නොසිටින්නාවූ, විරිය සම්බොධ්‍යංගය අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩනලද්දාවූ, බහුලව කරන ලද්දාවූ සිත මැඩගෙන නොසිටින්නාවූ, පීති සම්බොධ්‍යංගය අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ බහුලව කරන ලද්දාවූ, සිත මැඩගෙන නොසිටින්නාවූ, පස්සද්ධි සම්බොධ්‍යංගය අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුලව කරන ලද්දාවූ, සිත මැඩගෙන නොසිටින්නාවූ, සමාධි සම්බොධ්‍යංගය අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුලව කරන ලද්දාවූ, සිත මැඩගෙන නොසිටින්නාවූ, උපෙක්ඛා සම්බොධ්‍යංගය අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"මහණෙනි, වඩන ලද්දාවූ බහුලව කරනලද්දාවූ, ආවරණයක් නොවූ, වැසීමක් නොවූ, සිත මැඩගෙන නොසිටින්නාවූ මේ සප්ත බොධ්‍යාංගයෝ අර්හත් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්" යනුයි.

---

## 10. නීවරණ අන්ධකරණ සූත්‍රය.

**2.** "මහණෙනි, අන්ධභාවය ඇති කරන්නාවූ, නුවණැස නැති කරන්නාවූ, අඥාන බව ඇති කරන්නාවූ, ප්‍රඥාව නැති කරන්නාවූ, දුක්ඛ පාක්ෂිකවූ, නිවන් පිණිස නොපවත්නාවූ මේ නීවරණ ධර්මයෝ පස්දෙනෙක් වෙත්. ඒ පස කවරේදයත්?

"මහණෙනි, කාමච්ඡන්ද නීවරණය අන්ධභාවය ඇතිකරන්නකි. නුවණැස නැතිකරන්නකි. අඥාන බව ඇතිකරන්නකි. ප්‍රඥාව දුරුකරන්නකි. දුක්ඛ පාක්ෂිකය. නිවන් පිණිස නො පවතින්නකි.

"මහණෙනි, ව්‍යාපාද නීවරණය අන්ධභාවය ඇතිකරන්නකි. නුවණැස නැති කරන්නකි. අඥානබව ඇතිකරන්නකි. ප්‍රඥාව දුරුකරන්නකි. දුක්ඛපාක්ෂිකය. නිවන් පිණිස නොපවතින්නකි.

"මහණෙනි, ථිනමිද්ධ නීවරණය අන්ධභාවය ඇතිකරන්නකි. නුවණැස නැතිකරන්නකි. අඥානබව ඇතිකරන්නකි. ප්‍රඥාව දුරුකරන්නකි. දුක්ඛපාක්ෂිකය. නිවන් පිණිස නොපවතින්නකි.

"මහණෙනි, උද්ධච්චකුක්කුච්ච නීවරණය අන්ධභාවය ඇතිකරන්නකි. නුවණැස නැතිකරන්නකි. අඥානබව ඇතිකරන්නකි. ප්‍රඥාව දුරුකරන්නකි. දුක්ඛපාක්ෂිකය. නිවන් පිණිස නොපවතින්නකි.

"මහණෙනි, විචිකිච්ඡා නීවරණය අන්ධභාවය ඇතිකරන්නකි. නුවණැස නැති කරන්නකි. අඥානබව ඇතිකරන්නකි. ප්‍රඥාව දුරුකරන්නකි. දුක්ඛ පාක්ෂිකය. නිවන් පිණිස නොපවතින්නකි.

"මහණෙනි, මේ නීවරණයෝ පස්දෙන වනාහි අන්ධභාවය ඇතිකරන, නුවණැස නැති කරන, අඥානබව ඇතිකරන ප්‍රඥාව නැතිකරන දුක්ඛපාක්ෂිකවූ නිවන් පිණිස නොපවත්නාවූ ධර්මයෝවෙති.

3. "මහණෙනි, නුවණැස ඇතිකරන, ඥානය ඇතිකරන ප්‍රඥාව දියුණුකරන, දුක්ඛ පාක්ෂිකනොවූ නිවන් පිණිස පවත්නාවූ මේ බොධ්‍යංගයෝ සත්දෙනෙක් වෙත්. ඒ සත කවරේදයත්;

"මහණෙනි, සති සම්බොජ්ඣංගය නුවණැස ඇතිකරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂික නොවූ නිවන් පිණිස පවතින ධර්මයකි.

"මහණෙනි, ධම්මවිචය සම්බොජ්ඣංගය නුවණැස ඇතිකරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂික නොවූ නිවන් පිණිස පවතින ධර්මයකි.

"මහණෙනි, විරිය සම්බොජ්ඣංගය නුවණැස ඇතිකරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂික නොවූ, නිවන් පිණිස පවතින ධර්මයකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, පීති සම්බොජ්ඣංගය නුවණැස ඇතිකරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂිකනොවූ, නිවන් පිණිස පවතින ධර්මයකි.

"මහණෙනි, පස්සද්ධි සම්බොජ්ඣංගය නුවණැස ඇතිකරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂිකනොවූ, නිවන් පිණිස පවතින ධර්මයකි.

"මහණෙනි, සමාධි සම්බොජ්ඣංගය නුවණැස ඇතිකරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂික නොවූ නිවන් පිණිස පවතින ධර්මයකි.

"මහණෙනි, උපෙක්ඛා සම්බොජ්ඣංගය නුවණැස ඇති කරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂික නොවූ නිවන්පිණිස පවතින ධර්මයකි.

"මහණෙනි, මේ බොධ්‍යාංගයෝ සත්දෙන නුවණැස ඇති කරන, ඥානය ඇතිකරන, ප්‍රඥාව දියුණුකරන, දුක්ඛපාක්ෂික නොවූ නිවන් පිණිස පවතින ධර්මයෝ වෙත්යයි" වදාළසේක.

(සතරවෙනි නීවරණ වර්ගය නිමි.)

---

## 5. චක්කවත්ති වර්ගය

### 1. විධාපජහන සූත්‍රය.

1. (මේ වර්ගයේ 1, 2, 3, 8, 9, 10 සූත්‍රවල 1 වෙනි ඡේද නීවරණ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මෙනි. 2730 පිට)

2. "මහණෙනි, අතීතයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ වූවාහුද, (ඔව්හු) තුන්වැදෑරුම් මානය දුරුකළාහුය. ඒ සියල්ලෝම සත්වැදෑරුම් බොධ්‍යංගයන් වඩනලද බැවිනි. නැවත නැවත පුරුදුකරනලද බැවිනි. මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ වෙත්ද (ඔවුහු) තෙවැදෑරුම් මානය දුරුකරන්නාහ. ඒ සියල්ලෝ

සත්වැදෑරුම් බොධ්‍යංගයන් වඩනලද බැවිනි. නැවත නැවත පුරුදුකරනලද බැවිනි. මහණෙනි, දැන් යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ වෙත්ද, (ඔව්හු) තෙවැදෑරුම් මානය දුරු කරත්. ඒ සියල්ලෝ සත්වැදෑරුම් බොධ්‍යංගයන් වඩනලද බැවිනි. නැවත නැවත පුරුදුකරනලද බැවිනි.

3. "කවර සතක්දයත්? සතිසම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය උපෙක්ඛා සම්බොජ්ඣංගය යන මොවුන්ය.

4. "මහණෙනි, යම් කිසි අතීත කාලයෙහි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ වූවාහුද (ඔව්හු) තෙවැදෑරුම් මානය දුරුකළාහුය. ඒ සියල්ලෝ මේ බොධ්‍යංගයන් සත්දෙන වඩන ලද බැවිනි. නැවත නැවත පුරුදු කරන ලද බැවිනි. අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ වෙත්ද, (ඔව්හු) තෙවැදෑරුම් මානය දුරු කරන්නාහ. ඒ සියල්ලෝ මේ බොධ්‍යංගයන් සත්දෙන වඩනලද බැවිනි. නැවත නැවත පුරුදු කරන ලද බැවිනි. මේ කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ වෙත්ද, (ඔව්හු) තෙවදෑරුම් මානය දුරුකෙරෙත්. මේ සියල්ලෝ මේ සප්ත බොජ්ඣංගයන් වඩන ලද බැවිනි. නැවත නැවත පුරුදු කරන ලද බැවිනි'යි වදාළ සේක.

---

## 2. චක්කවත්ති රතන සූත්‍රය.

2. "මහණෙනි, සක්විති රජුගේ පහළවීමෙන් සප්ත රත්නයන්ගේ පහළවීම වෙයි. කවර සප්තරත්නයක්හුගේද? චක්‍රරත්නයාගේ පහළවීම වෙයි. හස්ති රත්නයාගේ පහළවීම වෙයි. අශ්වරත්නයාගේ පහළවීම වෙයි. මාණික්‍ය රත්නයාගේ පහළවීම වෙයි. ස්ත්‍රී රත්නයාගේ පහළවීම වෙයි. ගෘහ පතිරත්නයාගේ පහළවීම වෙයි. පරිනායක (පුත්‍ර) රත්නයාගේ පහළවීම වෙයි. මහණෙනි, සක්විති රජුගේ පහළවීමෙන් මේ සප්ත රත්නයාගේ පහලවීම වෙයි.

"මහණෙනි, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේගේ පහළවීමෙන් සත් වැදෑරුම් බොධ්‍යංග රත්නයන්ගේ පහළවීම වෙයි.

3. කවර සතක්හුගේද යත්, සති සම්බොධ්‍යංග රත්නයාගේ පහලවීම වෙයි. ධම්ම විචය සම්බොජ්ඣංග රත්නයාගේ පහළවීම වෙයි. වීර්ය සම්බොධ්‍යංග රත්නයාගේ පහළවීමවෙයි. ප්‍රීති සම්බොධ්‍යංග රත්නයාගේ පහළවීමවෙයි. පස්සද්ධි සම්බොධ්‍යංග රත්නයාගේ පහළවීම වෙයි. සමාධි සම්බොජ්ඣංග රත්නයාගේ පහළවීම වෙයි. උපෙක්ඛා සම්බොධ්‍යංගරත්නයාගේ පහළවීම වෙයි. මහණෙනි, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේගේ පහළවීමෙන් මේ සත් බොධ්‍යංගරත්නයාගේ පහළවීම වේයයි" වදාළේය.

---

## 3. මාරසෙනප්පමද්දන සූත්‍රය.

2. "මහණෙනි, මම නුඹලාට මරසෙනග මඩින මාර්ගය කියන්නෙමි. එය මනාකොට අසව්. මහණෙනි, මරසෙනග මඩින මාර්ගය කවරේද? යම් මේ සප්ත බොධ්‍යංග කෙනෙක් වෙත්ද? (ඔව්හුය.)

(3. මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මේ මරසෙනග මඩින මාර්ගයයි" වදාළ සේක.

---

## 4. දුප්පඤ්ඤ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්

වහන්සේ වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි, කෙලතොළු මෝඩයා, කෙලතොළු මෝඩයා' යයි කියනු ලැබේ. ස්වාමීනි, කෙතෙක් කරුණකින් කෙලතොළු මෝඩයෙකැයි කියනු ලැබේද?"

"මහණෙනි, සප්තබොධ්‍යාංගයන් නොවඩන ලද බැවින් නැවත පුරුදු නොකරනලද බැවින් කෙලතොළු මෝඩයෙකැයි කියනුලැබේ.

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණ, මේ බොධ්‍යාංග සත්දෙනා නොවඩනලද බැවින් නැවත නැවත පුරුදුනොකරනලද බැවින් කෙලතොළු මෝඩයෙකැයි" කියනුලැබේ.

---

## 5. පඤ්ඤාවන්ත සූත්‍රය.

1. (5, 6, 7 වෙනි සූත්‍ර මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයමෙන් ජේතවනාරාමයේදී දෙශනා කරනලදී.)

2. "ස්වාමීනි, කෙලතොළු නොවූ නුවණැති පුද්ගලයා නුවණැති පුද්ගලයා යයි කියනු ලැබේ. ස්වාමීනි, කෙතෙක් කරුණකින් කෙලතොළු නොවූ නුවණැති පුද්ගලයා යයි කියනුලැබේද?"

"මහණ, සප්ත බොධ්‍යාංගයන් වඩනලද බැවින් නැවත නැවත පුරුදුකරනලද බැවින් කෙලතොළු නොවූ නුවණැති පුද්ගලයායි" කියනුලැබේ.

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණ, මේ බොධ්‍යාංග සත්දෙනා වැඩීමෙන් නැවත නැවත පුරුදු කිරීමෙන් කෙලතොළු නොවූ නුවණැති පුද්ගලයායයි" කියනු ලැබේ.

---

## 6. දළිද්ද සූත්‍රය.

2. "ස්වාමීනි, දිළින්දා, දිළින්දා යයි කියනු ලැබේ. ස්වාමීනි, කරුණු කීයකින් දිළින්දායයි කියනුලැබේද?"

"මහණ, සප්ත සම්බොධ්‍යංගයන් නොවඩනලද බැවින් නැවත නැවත පුරුදු නොකරන ලද බැවින් දිළින්දායයි කියනුලැබේ.

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. "මහණ, මේ සප්ත බොධ්‍යාංගයන් නොවඩන ලද බැවින් නැවත නැවත පුරුදු නොකරනලද බැවින් දිළින්දායයි කියනුලැබේ යයි" වදාළසේක.

---

## 7. අදළිද්ද සූත්‍රය.

2. "ස්වාමීනි, නොදිළින්දා, නොදිළින්දා යයි කියනු ලැබේ. ස්වාමීනි, කරුණු කීයකින් නොදිළින්දා යයි කියනු ලැබේද?"

"මහණ, සප්ත බොධ්‍යංගයන් වඩනලද බැවින් නැවත නැවත පුරුදු කරනලද බැවින් නොදිළින්දා යයි කියනු ලැබේ."

3. (මේ ඡෙදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණ, මේ සප්ත බොධ්‍යාංගයන් වඩන ලද බැවින් නැවත නැවත පුරුදුකරනලද බැවින් නොදිළින්දා යයි කියනු ලැබේ.

---

## 8. ආදිච්ච සූත්‍රය.

2. "මහණෙනි, යම් මේ අරුණ නැගීමක්වේද, එය උදාවන්නාවූ සූර්යයාගේ පෙරටුව ඇතිවන්නකි. ඒ පෙරනිමිත්තකි. මහණෙනි, එපරිද්දෙන් වනාහි යම් මේ

කල්‍යාණමිත්‍රයන් ඇතිබවක් වේද, ඒ භික්ෂුවහට සප්ත බොධ්‍යංගයන් ඉපදීමට පූර්වංගම එය පෙරනිමිත්තකි. මහණෙනි, සප්ත බොධ්‍යාංගයන් වැඩෙන්නේය. සප්ත බොධ්‍යාංගයන් නැවත නැවත පුරුදුකරන්නේය යන මෙය කල්‍යාණ මිත්‍රයන් ඇති භික්ෂුවට කැමතිවිය යුතුය.

මහණෙනි, කෙසේ නම් කල්‍යාණ මිත්‍රයන් ඇති මහණ තෙම සප්ත බොධ්‍යාංගයන් වඩයිද, නැවත නැවත පුරුදු කරයිද?

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ සතිසම්බොජ්ඣාංගය වඩයි.

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ ධම්මවිචය සම්බොධ්‍යංගය වඩයි.

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ විරිය සම්බොධ්‍යංගය වඩයි.

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ පීති සම්බොධ්‍යංගය වඩයි.

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ පස්සද්ධි සම්බොධ්‍යංගය වඩයි.

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ සමාධි සම්බොධ්‍යංගය වඩයි.

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ, නිවනට නැමුණාවූ උපෙක්ඛා සම්බොධ්‍යංගය වඩයි.

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයන් ඇති මහණතෙම සප්ත බොධ්‍යංගයන් වඩයි, නැවත නැවත පුරුදු කරයි."

---

## 9. අජ්ඣත්තිකංග සූත්‍රය.

2. "මහණෙනි, අධ්‍යාත්මික අංගයක් වශයෙන් සප්ත බොධ්‍යාංගයන් ලැබීම පිණිස මේ නුවණින් මෙනෙහි කිරීම යම්සේද එබඳුවූ අන් එකම අංගයකුදු මම නුවණැසින් නොදකිමි. මහණෙනි, සප්ත බොධ්‍යාංගයන් වඩන්නේය. බහුල කරන්නේය. යන මෙය නුවණින් මෙනෙහි කිරීමෙහි යෙදුනු භික්ෂුවටම කැමති විය යුතුය. මහණෙනි, කෙසේ නම් නුවණින් මෙනෙහි කිරීමෙන් යුක්තවූ මහණතෙම සප්ත බොධ්‍යංගයන් වඩයිද? සප්ත බොධ්‍යාංගයන් බහුල කරයිද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ අටවෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මෙසේ වනාහි නුවණින් මෙනෙහි කිරීමෙන් යුත් මහණතෙමේ සප්ත බොධ්‍යාංගයන් වඩයි. සප්ත බොධ්‍යාංගයන් බහුලකෙරේයයි" වදාළසේක.

---

## 10. බාහිරංග සූත්‍රය.

2. "මහණෙනි, බාහිර අංගයක් වශයෙන් සප්ත බොධ්‍යාංගයන් ඉපදීම පිණිස මේ කල්‍යාණ මිත්‍රයන් ඇතිබව යම්සේද? එබඳුවූ අන් එකම අංගයක් නුවණැසින් මම නොදකිමි. මහණෙනි, සප්ත බොධ්‍යාංගයන් වඩන්නේය. සප්ත බොධ්‍යාංගයන් බහුල කරන්නේය යන මෙය කල්‍යාණ මිත්‍රයන් ඇති භික්ෂුවටම කැමති විය යුතුය. මහණෙනි කෙසේ නම් කල්‍යාණ මිත්‍රයන් ඇති භික්ෂුතෙම සප්ත බොධ්‍යාංගයන් වඩන්නේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි, මෙසේ වනාහි කල්‍යාණ මිත්‍රයන් ඇති මහණතෙම සත් බොධ්‍යාංගයන් වඩයි. බහුල කෙරේයයි" වදාළසේක.

(පස්වෙනි චක්‍රවර්ති වර්ගය නිමි.)

---

## 6. සාකච්ඡා (බොජ්ඣංග) වර්ගය

### 1. නීවරණා'හාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මම නුඹලාට පඤ්ච නීවරණයන්ගේද සප්ත බොධ්‍යංගයන්ගේද ආහාරයද (හෙතුවද) අනාහාරයද (හෙතුවනොවන්නද) දෙශනා කරන්නෙමි. එය මනකොට අසව්. මහණෙනි, නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ කාමච්ඡන්දයාගේ බහුල බව පිණිසද, මහත් බව පිණිසද පවත්නාවූ ආහාරය කවරේද? මහණෙනි, සුභ වශයෙන් ගන්නා අරමුණක් ඇත. ඒ සුභාරම්මණයෙහි බහුල කොට නුනුවණින් මෙනෙහි කිරීමක් වේද, මෙය නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ කාමච්ඡන්දයාගේ බහුල බව පිණිසද මහත් බව පිණිසද ආහාරය වෙයි. මහණෙනි, නූපන්නාවූ ව්‍යාපාදයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ ව්‍යාපාදයාගේ බහුල බව පිණිසද මහත් බව පිණිසද පවත්නා ආහාරය කවරේද?

"මහණෙනි, ක්‍රොධය උපදින අරමුණක් ඇත. මහණෙනි, ඒ ක්‍රොධ (පටිඝ) නිමිත්තෙහි නුනුවණින් මෙනෙහි කිරීමක් වේද, මෙය නූපන්නාවූ ක්‍රොධයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ක්‍රොධයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ ථීන මිද්ධයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ථීන මිද්ධයාගේ බහුල බව මහත් බව පිණිසද පවත්නා ආහාරය කවරේද? මහණෙනි, කුශලයෙහි නොඇල්මද, අලස ගතියද, ඇඟමැලි කැඩීමද, බත් මතද සිතේ හැකුළුනු බවද ඇත. එහි බහුලකොට නුනුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ ථීනමිද්ධයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ථීනමිද්ධයාගේ බහුල බව පිණිසද මහත් බව පිණිසද ආහාරය වෙයි.

"මහණෙනි, උද්ධච්ච කුක්කුච්ච නීවරණයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උද්ධච්ච කුක්කුච්ච නීවරණයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද ආහාරය කවරේද? මහණෙනි, සිතේ නොසන්සුන් බවක් ඇත. එහි බහුලවූ නුනුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ උද්ධච්චකුක්කුච්ච නීවරණයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උද්ධච්චකුක්කුච්ච නීවරණයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ විචිකිච්ඡාවගේ ඉපදීම පිණිසද උපන්නාවූ විචිකිච්ඡාවගේ බහුල බව මහත් බව පිණිසද ආහාරය කවරේද? මහණෙනි, විචිකිච්ඡාවට කරුණුවූ ධර්මයෝ ඇත. එහි බහුලව නුනුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ විචිකිච්ඡාවගේ ඉපදීම පිණිසද උපන්නාවූ විචිකිච්ඡාවගේ බහුල බව පිණිසද මහත් බව පිණිසද ආහාරය වෙයි.

3. "මහණෙනි, නූපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය කවරේද? මහණෙනි, සති සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ සති

සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය කවරේද? මහණෙනි, කුසල හා අකුසල ධර්මයෝද, වරද සහිතව හා වරද රහිත ධර්මයෝද හීන ප්‍රණීත ධර්මයෝද, යහපත් අයහපත් විපාක ඇත්තාවූ ධර්මයෝද ඇත. එහි නුවණින් බහුලකොට මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණ වීම පිණිසද ආහාරය කවරේද? මහණෙනි, පටන්ගැන්මේ වීර්යයද, කුසීතකමින් නික්මීමේ වීර්යයද දැඩි වීර්යයද ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද මේ ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය කවරේද? මහණෙනි, පීති සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද මේ ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය කවරේද? මහණෙනි,

චෛතසිකයන්ගේ සන්සිඳීමක් හා සිතේ සන්සිඳීමක් ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය කවරේද? මහණෙනි, සමථ අරමුණක්, සිත එකඟ බවට පමුණුවන අරමුණක් ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය කවරේද? මහණෙනි, උපෙක්ෂා සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උපෙක්ෂා සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාරය වෙයි.

4. "මහණෙනි, නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ කාමච්ඡන්දයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි, අසුභ නිමිත්තක් ඇත. එහි නුවණින් බහුලව මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ කාමච්ඡන්දයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද මේ ආහාරය (හෙතුව) නොවෙයි.

"මහණෙනි, නූපන්නාවූ ව්‍යාපාදයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ව්‍යාපාදයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි, මෛත්‍රී සහගත

සමාධියක් ඇත. එහි බහුලව නුවණින් මෙනෙහි කිරීමක් වේද, එය නූපන්නාවූ ව්‍යාපාදයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ව්‍යාපාදයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද අනාහාරය වෙයි.

"මහණෙනි, නූපන්නාවූ ථීන මිද්ධයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ථීන මිද්ධයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද ආහාර නුවූයේ කුමක්ද? මහණෙනි, පටන් ගන්නාලද වීර්යය කුසීතකමින් නික්මීමේ වීර්යය, දැඩි වීර්යය ඇත එහි බහුල කොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ ථීන මිද්ධයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ථීන මිද්ධයාගේ බහුල බව මහත් බව පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ උද්ධච්ච කුක්කුච්චනීවරණයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උද්ධච්ච කුක්කුච්ච නීවරණයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද ආහාර නුවූයේ කුමක්ද? මහණෙනි, සිතේ සන්සිඳීමක් ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද, එය නූපන්නාවූ උද්ධච්ච කුක්කුච්චයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උද්ධච්ච කුක්කුච්චයාගේ බහුල බව මහත් බව පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ විචිකිච්ඡා නීවරණයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විචිකිච්ඡානීවරණයාගේ බහුල බව මහත් බව පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි කුසල හා අකුසල ධර්මයෝද, වරද සහිතවූ හා වරද රහිතවූ ධර්මයෝද, හීන ප්‍රණීත ධර්මයෝද යහපත් විපාක හා අයහපත් විපාක ඇති ධර්මයෝද ඇත. එහි බහුලකොට නුවණින් මෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ විචිකිච්ඡා නීවරණයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විචිකිච්ඡානීවරණයාගේ බහුල බව පිණිස මහත් බව පිණිසද මේ ආහාර නොවන්නේ වෙයි.

**6.** "මහණෙනි, නූපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි, සති සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත. එහි

බහුලකොට නොමෙනෙහි කිරීමක් වේද, එය නූපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ සති සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි කුසල අකුසල ධර්මයෝද, වරද නිවරද ධර්මයෝද හීන ප්‍රණීත ධර්මයෝද, යහපත් අයහපත් විපාක ඇති ධර්මයෝද ඇත. එහි බහුලකොට නොමෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි පටන්ගත් වීර්යයද කෙලෙසුන්ගෙන් නික්මීමේ වීර්යයද දැඩි වීර්යයද ඇත. එහි බහුලකොට නොමෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ විරිය සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණ වීම පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි, පීති සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත එහි බහුලකොට නොමෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ පීති සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ වැඩීම

සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි, චෛතසිකයන්ගේ සන්සිඳීමක් හා සිතේ සන්සිඳීමක් ඇත. එහි බහුලකොට නොමෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද, උපන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි, සමථ අරමුණක්, සිත එකඟ බවට පමුණුවන අරමුණක් ඇත. එහි බහුලකොට නොමෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ සමාධි සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ වෙයි.

"මහණෙනි, නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ කුමක්ද? මහණෙනි, උපෙක්ඛා සම්බොජ්ඣංගයට කරුණුවූ ධර්මයෝ ඇත. එහි බහුලකොට නොමෙනෙහි කිරීමක් වේද එය නූපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ වැඩීම සම්පූර්ණවීම පිණිසද ආහාර නොවන්නේ වෙයි."

---

## 2. පරියාය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. එකල්හි වනාහි බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙන සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියාහුය. ඉක්බිති ඒ භික්ෂූන්ට මෙබඳු අදහසක් පහළවිය.

'තවම සැවැත්නුවර පිඬු පිණිස හැසිරීමට කල් වැඩිය. අපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනකද එතැනට පැමිණෙන්නමෝ නම් යහපති' කියායි. ඉක්බිති ඒ භික්ෂූහු අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනකද එතැනට ගියාහුය. ගොස් ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවූවාය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාවකොට නිමවා එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූන්ට අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ මේ කාරණය කීහ.

3. "ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ ශ්‍රාවකයන්ට මෙසේ දහම් දෙසයි." 'මහණෙනි, එව්, නුඹලා නුවණ දුර්වල කරන සිත කිලුටු කරන පංච නීවරණයන් දුරුකොට සප්ත බොධ්‍යංගයන් ඇති සැටියෙන් වඩව්' යනුයි. ඇවැත්නි, අපිද ශ්‍රාවකයන්ට මෙසේ දහම් දෙශනා කරන්නෙමු. 'ඇවැත්නි, එව්, නුඹලා නුවණ දුර්වල කරන සිත කිලුටුකරන පංචනීවරණයන් දුරුකොට සප්ත බොධ්‍යංගයන් ඇති සැටියෙන් වඩව්' කියායි.

'ඇවැත්නි, මෙහි ශ්‍රමණ ගෞතමයාගේ අනුශාසනාව හා අපගේ අනුශාසනාවේද ඇති වෙනස කුමක්ද, වෙනස් අදහස කුමක්ද? නානත්වය කුමක්ද? යනුයි.

4. ඉක්බිති ඒ භික්ෂූහු ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ වචනය පිළිගත්තාහුද නොවූහ ප්‍රතික්ෂෙප කළාහුද නොවූහ. සතුටුද නොවී ප්‍රතික්ෂෙපද නොකොට භාග්‍යවතුන් වහන්සේ වෙතින් මේ කීමේ අර්ථය දැනගන්නෙමුයි" අස්නෙන් නැගිට ගියාහුය.

5. ඉක්බිති ඒ භික්ෂූහු සැවැත්නුවර පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි ගියාහුය. ගොස් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසක හුන්නාහුය. එක් පසක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීහ. "ස්වාමීනි, අපි මේ පෙරවරු කාලයෙහි හැඳපොරවා පා සිවුරු ගෙන සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියෙමු. ස්වාමීනි, ඒ අපට මෙබඳු සිතෙක් විය. 'සැවැත්නුවර පිඬුපිණිස හැසිරීමට තවම ඉතා

උදෑසනය. (කල් වැඩිය.) අපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනකද එතැන්හි යන්නමෝ නම් හොඳය යනුයි. ඉක්බිති ස්වාමීනි, අපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනකද එතැනට ගියෙමු. ගොස් ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටුවූවෙමු. සතුටුවිය යුතු සිහිකටයුතු කථාවකොට ඉක්මවා එක්පසක හුන්නෙමු. ස්වාමීනි එක්පසක හුන්නාවූ අපට ඒ අන්‍යතීර්ථක පිරිවැජියෝ මෙසේ කීහ. 'ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙමේ ශ්‍රාවකයන්ට මෙසේ දහම් දෙසයි (කෙසේද)

'මහණෙනි, එව්, නුඹලා නුවණ දුර්වල කරන, සිත කිලුටු කරන පංච නීවරණයන් දුරුකොට සප්ත බොධ්‍යංගයන් ඇති සැටියෙන් වඩව්' කියායි. ඇවැත්නි, අපිද ශ්‍රාවකයන්ට මෙසේ දහම් දෙසමු (කෙසේද)

'ඇවැත්නි, එව්, නුඹලා නුවණ දුර්වල කරන සිත කිලුටු කරන, පංච නීවරණයන් දුරුකොට සප්ත බොධ්‍යංගයන් ඇති සැටියෙන් වඩව්' කියායි. 'ඇවැත්නි, මෙහි ශ්‍රමණ ගෞතමයන්ගේ ධර්ම දෙශනාව හා අපගේ ධර්මදේශනාවේද ශ්‍රමණ ගෞතමයන්ගේ අනුශාසනාව හා අපගේ අනුශාසනාවේද ඇති වෙනස කුමක්ද වෙනස් අදහස කුමක්ද? නානත්වය කුමක්ද? යනුයි. එකල්හි වනාහි ස්වාමීනි, අපි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ වචනය පිළිගත්තාහුද නොවෙමු. ප්‍රතික්ෂෙප කළාහුද නොවෙමු. පිළිනොගෙන බැහැර නොකොට භාග්‍යවතුන් වහන්සේ වෙතින් මේ කීමේ තේරුම දැනගන්නෙමුයි' ආසනයෙන් නැගිට ගියෙමු.'

**6.** "මහණෙනි, මෙසේ කියන්නාවූ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කියයුතුය. 'ඇවැත්නි, යම් ක්‍රමයකින් නීවරණ පස දහයක් වෙත්ද, බොධ්‍යංග සත, දහහතරක් වෙත්ද, එබඳු ක්‍රමයක් ඇත්තේදැයි' ඇසීය, මහණෙනි, මෙසේ අසන ලද අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ නොදක්නාහුය. වඩා වෙහෙසට පැමිණෙන්නාහ. ඊට හෙතු කවරේද? විෂය නොවූවෙක්හි අසන ලද ප්‍රශ්නයක් බැවිනි. මහණෙනි, දෙවියන් සහිතවූ, මරුන්

සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ, ලොකයෙහි මහණ බමුණන් සහිත ප්‍රජාව කෙරෙහි දෙව් මිනිසුන් කෙරෙහි තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයකු හෝ මේ ශාසනයෙහි ඇසුවෙක් හෝ හැර යමෙක් මේ ප්‍රශ්න විසඳීමෙන් සිත්ගන්නේ වේද, එබඳු කෙනෙකු මම නොදකිමි.

**7.** "මහණෙනි යම් ක්‍රමයකින් නීවරණ පස දශයක් වෙත්ද ඒ ක්‍රමය කවරේද? මහණෙනි, තමාගේ පංචස්කන්ධයන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේද, එයද නීවරණයකි. අනුන්ගේ පංචස්කන්ධයන් කෙරෙහි යම් කාම තෘෂ්ණාවක් වේද, එයද නීවරණයකි. මේ දෙකම කාමච්ඡන්ද නීවරණ යන සංඛ්‍යාවට පැමිණෙත්. මේ ක්‍රමයෙන් කාමච්ඡන්දනීවරණය දෙකක් වෙයි. මහණෙනි, තමාගේ අත්පා ආදීන්කෙරෙහි යම් ක්‍රොධයක්වේද, එයද නීවරණයකි. අනුන්ගේ අත් පා ආදිය කෙරෙහි යම් ක්‍රොධයක්වේද, එයද නීවරණයකි. මේ දෙකම ව්‍යාපාද නීවරණ යන සංඛ්‍යාවට පැමිණෙයි. මේ ක්‍රමයෙන් ව්‍යාපාද නීවරණය දෙකක් වෙයි.

**8.** "මහණෙනි, සිතේ යම් අලසකමක්වේද, එයද නීවරණයකි චෛතසිකයන්ගේ යම් අලසකමක්වේද, එයද නීවරණයකි. මේ දෙකම ථිනමිද්ධ නීවරණ යන සංඛ්‍යාවට පැමිණෙයි. මේ ක්‍රමයෙන් ථිනමිද්ධ නීවරණය දෙකක් වෙයි. මහණෙනි, යම් සිතේ නොසන්සුන්කමක්වේද, එයද නීවරණයකි. යම් පසුතැවීමක්වේද, එයද නීවරණයකි. මේ දෙකම උද්ධච්ච කුක්කුච්ච නීවරණයයි උදෙසීමට පැමිණෙයි. මේ ක්‍රමයෙන් උද්ධච්ච කුක්කුච්ච නීවරණය දෙකක් වෙයි.

"මහණෙනි, තමාගේ ස්කන්ධයන්හි යම් සැකයක් වේද, එයද නීවරණයකි මේ දෙකම විචිකිච්ඡා නීවරණ සංඛ්‍යාවට පැමිණෙයි මේ ක්‍රමයෙන් විචිකිච්ඡා නීවරණය දෙකක් වෙයි. මහණෙනි යම් ක්‍රමයකින් නීවරණ පස දශයක් වෙත්ද, මේ ඒ ක්‍රමයයි.

**9.** "මහණෙනි, යම් ක්‍රමයකින් බොධ්‍යංග සත දහහතරක් වෙත්ද, ඒ ක්‍රමය කවරේද? මහණෙනි, තමාගේ ස්කන්ධයන්

කෙරෙහි යම් සිහියක්වේද, එයද සති සම්බොධ්‍යංගයයි. අනුන්ගේ ස්කන්ධයන් කෙරෙහි යම් සිහියක්වේද, එයද සති සම්බොධ්‍යංගයයි. මේ දෙකම සති සම්බොධ්‍යංග යන සංඛ්‍යාවට පැමිණෙයි මේ ක්‍රමයෙන් සති සම්බොධ්‍යංගය දෙකක් වෙයි.

10. "මහණෙනි, අධ්‍යාත්මික ධර්මයන් කෙරෙහි යමක් නුවණින් (ඒ ඒ ධර්මයන්ගේ ලක්ෂණ) සොයයිද, (එහි නුවණ) හසුරවයිද, විමසීමට පැමිණෙයිද එයද ධම්මවිචය සම්බොධ්‍යංගයයි. බාහිර ධර්මයන් කෙරෙහි නුවණින් යමක් සොයයිද, හසුරුවයිද, විමසීමට පැමිණෙයිද, එයද ධම්මවිචය සම්බොධ්‍යංගයයි මේ දෙකම ධම්මවිචය සම්බොධ්‍යංග යන සංඛ්‍යාවට පැමිණෙයි. මේ ක්‍රමයෙන් ධම්මවිචය සම්බොධ්‍යංගයද දෙකක් වෙයි. මහණෙනි, යම් කායිකවීර්යයක් වේද, එයද විරිය සම්බොධ්‍යංගයයි. යම් චෛතසික වීර්යයක් වේද, එයද විරිය සම්බොධ්‍යංගයයි මේ දෙකම විරිය සම්බොධ්‍යංග යන සංඛ්‍යාවට පැමිණෙයි. මේ ක්‍රමයෙන් විරිය සම්බොධ්‍යංගයද දෙකක් වෙයි.

11. "මහණෙනි, විතර්ක සහිතවූ විචාරසහිතවූ යම් ප්‍රීතියක් වේද එයද පීති සම්බොධ්‍යංගයයි. විතර්ක රහිතවූ, විචාර රහිතවූ යම් ප්‍රීතියක්වේද, එයද පීති සම්බොධ්‍යංගයයි. මේ දෙකම පීති සම්බොධ්‍යංග යන සංඛ්‍යාවට පැමිණෙයි. මේ ක්‍රමයෙන් පීති සම්බොධ්‍යංගයද දෙකක් වෙයි. මහණෙනි, චෛතසිකයන්ගේ සන්සිඳීමක් වේද, එයද පස්සද්ධි සම්බොධ්‍යංගයයි. සිතේ යම් සන්සිඳීමක් වේද එයද පස්සද්ධි සම්බොධ්‍යංගයයි. මේ දෙකම පස්සද්ධි සම්බොධ්‍යංග යන සංඛ්‍යාවට පැමිණෙයි. මේ ක්‍රමයෙන් පස්සද්ධි සම්බොධ්‍යංගද දෙකක් වෙයි.

12. "මහණෙනි, විතර්ක රහිතවූ, විචාර සහිතවූ යම් සමාධි සම්බොධ්‍යංගයක්වේද, එයද සමාධි සම්බොධ්‍යංගයයි. විතර්ක රහිතවූ, විචාර රහිතවූ, යම් සමාධි සම්බොධ්‍යංගයක් වේද, එයද සමාධි සම්බොධ්‍යංගයයි. මේ දෙකම සම්බොධ්‍යංගයයි. උදෙසීමට පැමිණෙයි. මේ ක්‍රමයෙන් සමාධි සම්බොධ්‍යංගයද දෙකක් වෙයි.

**13.** "මහණෙනි, අධ්‍යාත්මික ධර්මයන්හි යම් උපෙක්ෂාවක්වේද, එයද උපෙක්ඛා සම්බොධ්‍යංගයයි. බාහිර ධර්මයන්හි යම් උපෙක්ෂාවක්වේද, එයද උපෙක්ඛා සම්බොධ්‍යංගයයි. මේ දෙකම උපෙක්ෂා සම්බොධ්‍යංගයයි උදෙසීමට පැමිණෙයි. මේ ක්‍රමයෙන් මේ උපෙක්ඛා සම්බොධ්‍යංගය දෙකක් වෙයි. මහණෙනි, යම් ක්‍රමයකින් බොධ්‍යංග සත, දස සතරක් වෙත්ද, මේ ඒ ක්‍රමයයි" යනුයි.

---

## 3. භාවනා කාල සූත්‍රය.

(1, 2, 3, 4, 5 මේ ඡෙද, මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 1, 2, 3, 4, 5 ඡෙද මෙන් වේ.)

**6.** "මහණෙනි, මෙසේ කියන්නාවූ පරිබ්‍රාජකයන්ට මෙසේ කියයුතුය. ඇවැත්නි, යම් වේලාවක සිත හැකුලුණේ වෙයිද, එකල්හි කවර බොධ්‍යංගයන් වැඩීමට කාලය නොවේද? එකල්හි කවර බොධ්‍යංගයන් වැඩීමට කාලය වේද? ඇවැත්නි, යම් කාලයක සිත විසිරගියේ වේද, එකල්හි කවර බොධ්‍යංගයන් වැඩීමට කාලය නොවේද? එකල්හි කවරබොධ්‍යංගයන් වැඩීමට කාලය වේද? මහණෙනි, මෙසේ අසන ලද්දාහු අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ පිළිතුරු නොසපයන්නාහුය. වඩාත් වෙහෙසට පැමිණෙන්නාහ. ඊට හේතු කවරේද? විෂය නොවූවෙක්හි අසන ලද ප්‍රශ්නයක් බැවිනි. මහණෙනි, දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ ලොකයෙහි, මහණ බමුණන් සහිත ප්‍රජාව කෙරෙහි දෙව් මිනිසුන් කෙරෙහි තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයකු හෝ මේ ශාසනයෙන් ඇසුවකු හෝ හැර යමෙක් මේ ප්‍රශ්න විසඳීමෙන් සිත් ගන්නේද එබඳු කෙනෙකු මම නොදකිමි.

**7.** "මහණෙනි. යම් කාලයක සිත හැකුලුණේ වේද, එකල්හි පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවේ. සමාධි සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවේ. උපෙක්ෂා සම්බොජ්ඣංගයගේ වැඩීමට කාලය නොවේ. ඊට හේතු

කවරේද? මහණෙනි, සිත හැකුළුණේ වෙයි. ඒ හැකුලුණ සිත මේ ධර්මයන්ගෙන් නගාසිටුවීමට දුෂ්කර වෙයි.

"මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම ස්වල්ප ගින්නක් දල්වනු කැමැත්තේ වේද, හෙතෙම එහි අමු තණකොළද දමන්නේය. අමු ගොමද දමන්නේය. අමු දරද දමන්නේය. තෙත වාතයද දෙන්නේය. පස්ද දමන්නේය. ඒ පුරුෂ තෙම ස්වල්ප ගින්න දල්වන්නට හැකිවන්නේද?" "ස්වාමීනි, එය නොවේමය."

"මහණෙනි, එපරිද්දෙන් යම් වේලාවක සිත හැකුලුණේද, එකල්හි පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවෙයි. සමාධි සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවෙයි. උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවෙයි. ඊට හේතුව කවරේද? මහණෙනි, සිත හැකුළුණේ වෙයි. ඒ හැකුළුණු සිත මේ ධර්මයන්ගෙන් නගාසිටුවීමට නොහැකි වෙයි.

8. "මහණෙනි, යම් කාලයක සිත හැකුලුණේ වේද, එකල්හි ධර්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. විරිය සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. පීති සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, සිත හැකුළුණේ ඒ හැකුළුණු සිත මේ ධර්මයන්ගෙන් මනාකොට නගාසිටුවන්නේ වෙයි.

"මහණෙනි, යම්සේ වනාහි පුරුෂතෙම ස්වල්ප ගින්නක් දල්වනු කැමැත්තේ වෙයිද, හෙතෙම එහි වියලි තණද දමන්නේය. වියලුණ ගොමද දමන්නේය. වියලුණ දරද දමන්නේය. මුඛ වාතයද දෙන්නේය. පස් නොදමන්නේය. ඒ පුරුෂතෙම ස්වල්ප ගින්න දල්වන්නට හැක්කේද?" "ස්වාමීනි එසේය."

"මහණෙනි, එපරිද්දෙන් යම් කාලයක සිත හැකුලුණේ වේද එකල්හි ධම්ම විචය සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. විරිය සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. පීති සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. ඊට හෙතු කවරේද? මහණෙනි, සිත හැකුළුණේය. ඒ හැකුළුණු සිත මේ ධර්මයන්ගෙන් මනාකොට නගාසිටුවීමට හැකි වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** "මහණෙනි, යම් කාලයක සිත විසිරගියේ වේද, එකල්හි ධම්ම විචය සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවේ. විරිය සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවේ. පීති සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවේ. ඊට හේතු කවරේද? මහණෙනි, සිත විසිර ගියේය. ඒ විසිරගිය සිත මේ ධර්මයන්ගෙන් සන්සිඳවීමට දුෂ්කර වෙයි.

"මහණෙනි, යම්සේ වනාහි මහත් ගිනි කඳක් නිවනු කැමැත්තේ වෙයිද හෙතෙම එහි වියලි තණද දමන්නේය. වියලි ගොමද දමන්නේය. වියලි දරද දමන්නේය. මුඛ වාතයද දෙන්නේය. පස් නොදමන්නේය. ඒ පුරුෂතෙම මහත් ගිනිකඳ නිවීමට හැකිවේද? - "ස්වාමීනි එය නොවේමය."

"මහණෙනි, එපරිද්දෙන්ම යම් කාලයක සිත විසිරගියේ වේද, එකල්හි ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වැඩීමට කාලය නොවේ. විරිය සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවේ. පීති සම්බොජ්ඣංගය වැඩීමට කාලය නොවේ. ඊට හේතු කවරේද? මහණෙනි, සිත විසිර ගියේය. ඒ විසිරගිය සිත මේ ධර්මයන්ගෙන් සන්සිඳවීමට දුෂ්කරවෙයි.

**10.** "මහණෙනි, යම් කාලයක සිත විසිරගියේ වේද එකල්හි පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. සමාධි සම්බොජ්ඣංගය වැඩීමට කාලයවෙයි. උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, සිත විසිරගියේය. ඒ විසිර ගිය සිත මේ ධර්මයන්ගෙන් මනාකොට සන්සිඳුනේ වෙයි. මහණෙනි, යම්සේ වනාහි පුරුෂතෙම මහත් ගිනිකඳක් නිවනු කැමැත්තේ වන්නේද, හෙතෙම එහි අමු තණකොළද දමන්නේය. අමු ගොමද දමන්නේය. අමු දරද දමන්නේය. තෙත වාතයද දෙන්නේය. පස්ද විසුරුවන්නේය. ඒ පුරුෂතෙම මහත් ගිනි කඳක් නිවන්ට හැක්කේ වේද?" - "එසේය ස්වාමීනි."

"මහණෙනි, එපරිද්දෙන් වනාහි යම් කාලයක සිත විසිරගියේ වේද, එකල්හි පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. සමාධි සම්බොජ්ඣංගය වැඩීමට කාලයවෙයි.

උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට කාලය වෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, සිත විසිර ගියේය. ඒ විසිරගිය සිත මේ ධර්මයන්ගෙන් මනාකොට සන්සිඳුනේ වෙයි. මහණෙනි, සිහිය වනාහි සියළුතන්හි කැමතිවිය යුතුයයි මම කියමි.”

---

## 4. හලිද්දවසන (මෙත්තා) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොලිය ජනපදයෙහි කොලියවංශිකයන්ගේ හලිද්දවසන නම් නියම් ගමක්වීද එහි වැඩවාසය කරන සේක.

2. එකල්හි වනාහි බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙන හලිද්දවසන නම් නියම් ගමට පිඬු පිණිස ගියාහුය. එකල්හි වනාහි ඒ භික්ෂූන්ට මෙබඳු සිතක් විය. ‘හලිද්දවසනයෙහි පිඬු පිණිස හැසිරීමට තවම උදෑසන වැඩිය. අපි අන්‍යතීර්ථක පිරිවැජියන්ගේ ආරාමය යම් තැනකද එතැන්හි යන්නෙමු නම් යහපති’ කියායි. ඉක්බිති අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ ආරාමය යම් තැනකද එතැන්හි ගියාහුය. ගොස් ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටු වූවාහුය. සතුටු වියයුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමවා එකත්පසක හුන්හ. එකත්පසක හුන් කල්හි ඒ භික්ෂූන්ට ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කීහ.

“ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙමේ ශ්‍රාවකයන්ට මෙසේ දහම් දෙසයි. ‘මහණෙනි, තෙපි එව්.

3. “සිත කෙලෙසන නුවණ දුර්වලකරන පංචනීවරණයන් දුරුකොට මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරව්. එපරිද්දෙන් දෙවෙනි දිශාවද, එපරිද්දෙන් තුන්වෙනි දිශාවද, එපරිද්දෙන් සතරවෙනි දිශාවද, පතුරුවා වසව්. මෙසේ උඩ යට අනුදිග යන සියළු තන්හි සියළු සත්වයන් තමා මෙන් කොට සිතීමෙන් සියළු සත්වලෝකයා කෙරෙහි මහත්වූ, මහද්ගතවූ, අප්‍රමාණවූ, අවෛරවූ, ව්‍යාපාද රහිතවූ, මෛත්‍රී සහගත සිත පතුරුවා වාසය කරව්.

**4.** "කරුණා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරව්. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන්වෙනි දිශාවද එසේම සතරවෙනි දිශාවද පතුරුවා වසව්. මෙසේ උඩ යට අනුදිගයන සියළුතන්හි සියළු සත්වයන් තමා මෙන්කොට සිතීමෙන් සියළු සත්වලෝකයා කෙරෙහි මහත්වූ මහද්ගතවූ, අප්‍රමාණවූ, අවෛරවූ, ව්‍යාපාද රහිතවූ, කරුණා සහගත සිත පතුරුවා වාසය කරව්.

**5.** "මුදිතා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරව් එසේම දෙවෙනි දිශාවද එසේම තුන්වෙනි දිශාවද එසේම සතරවෙනි දිශාවද පතුරුවා වාසය කරවු. මෙසේ උඩ යට අනුදිග යන සියළුතන්හි සියළු සත්වයන් තමාමෙන් සිතීමෙන් සියළු සත්ව ලෝකයා කෙරෙහි මහත්වූ මහත්ගතවූ, අප්‍රමාණවූ අවෛරවූ, ව්‍යාපාද රහිතවූ, මුදිතාසහගත සිත පතුරුවා වාසය කරවු.

**6.** "උපෙක්ඛා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරව්. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන්වෙනි දිශාවද, එසේම සතරවෙනි දිශාවද, පතුරුවා වාසයකරවූ, මෙසේ උඩ යට අනුදිග සියළු තන්හි සියළු සත්වයන් තමාමෙන් සිතීමෙන් සියළු සත්වලෝකයා කෙරෙහි මහත්වූ මහද්ගතවූ, අප්‍රමාණවූ, අවෛරවූ, ව්‍යාපාද රහිතවූ, උපෙක්ෂා සහගත සිත පතුරුවා වාසය කරව්."

"ඇවැත්නි, අපිදු ශ්‍රාවකයන්ට මෙසේ දහම් දෙශනා කරන්නෙමු" ඇවැත්නි, තෙපි එව්.

7, 8, 9, 10, (මේ ඡෙදද මේ සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡෙද මෙනි)

**11.** ඇවැත්නි, ශ්‍රමණ ගෞතමයන්ගේ හා අපගේ යම් ධර්මදේශනාවක් වේද, යම් අනුශාසනාවක් වේද, මෙහි කවර වෙනසක්වේද, කවර වෙනස් අදහසක්වේද කවර නානත්වයක් වේද?"

**12.** (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි)

13. ඉක්බිති ඒ භික්ෂූහු හලිද්දවසනයෙහි පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්හ. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි, අපි මෙහි පෙරවරු කාලයෙහි හැඳ පෙරවා පා සිවුරුගෙන හලිද්දවසනයට පිඬු පිණිස ගියෙමු ස්වාමීනි, ඒ අපට මෙබඳු සිතක් විය.

'හලිද්දවසනයෙහි පිඬු පිණිස හැසිරීමට තවම උදෑසන වැඩිය. අපි අන්‍යතීර්ථක පිරිවැජියන්ගේ ආරාමය යම්තැනකද එතැනට යන්නෙමුනම් හොඳය කියායි. ස්වාමීනි එකල්හි වනාහි අපි අන්‍යතීර්ථක පිරිවැජියන්ගේ ආරාමය යම් තැනකද එතනට ගියෙමු. ගොස් ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන් සමග සතුටු වූයෙමු. සතුටුවියයුතුවූ, සිහිකටයුතුවූ, කථාවකොට නිමවා එක් පසක හුන්නෙමු. ස්වාමීනි, එක් පසක හුන්කල්හි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ අපට මෙය කීහ. 'ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙමේ ශ්‍රාවකයන්ට මෙසේ දහම් දෙසයි. මහණෙනි, තෙපි එව්,

14-17. (මේ ඡේද මේ සූත්‍රයේ 3, 4, 5, 6 වෙනි ඡේද මෙනි.)

18-21. (මේ ඡේද මේ වර්ගයේ 3, 4, 5, 6 වෙනි ඡේද මෙනි.)

22. (මේ ඡේදය මේ සූත්‍රයේ 11 වෙනි ඡේදය මෙනි.)

23. "ඉක්බිති ස්වාමීනි, අපි ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ගේ කීමට සතුටුද නොවීමු. ප්‍රතික්ෂෙපද නොකෙළෙමු. සතුටුද නොවී ප්‍රතික්ෂෙපද නොකොට අස්නෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේ වෙතින් මේ කීමේ තේරුම දැනගන්නෙමුයි ගියෙමු" යනුයි.

24. "මහණෙනි, මෙසේ කියන්නාවූ, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට මෙසේ කිය යුතුය. 'ඇවැත්නි, කෙසේ වඩන ලද මෛත්‍රී සමාධිය කිනම් නිපදවීමක් ඇත්තේද? කුමක් පරමකොට ඇත්තේද, කුමක් අනුසස්කොට ඇත්තේද, කුමක් අවසානයකොට ඇත්තේද? කෙසේ වඩනාලද කරුණා සමාධිය කුමක් නිපදවීමකොට ඇත්තේද? කුමක් පරමකොට ඇත්තේද?

කුමක් අනුසස්කොට ඇත්තේද? කුමක් අවසානය කොට ඇත්තේද? කෙසේ වඩනාලද මුදිතා සමාධිය කුමක් නිපදවීමකොට ඇත්තේද? කුමක් පරමකොට ඇත්තේද? කුමක් අනුසස්කොට ඇත්තේද? කුමක් අවසානයකොට ඇත්තේද? කෙසේ වඩනලද උපෙක්ෂා සමාධිය කුමක් පරමකොට ඇත්තේද? කුමක් අනුසස්කොට ඇත්තේද? කුමක් අවසානයකොට ඇත්තේද? කියායි.

**25.** "මහණෙනි, මෙසේ අසනලද අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ පිළිතුරු සැපයීමට නොහැකි වන්නාහ. වඩාත් වෙහෙසට පැමිණෙන්නාහ. ඊට හේතුව කවරේද? මහණෙනි, එය ඔවුන්ට අවිෂය බැවිනි. මහණෙනි, දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, ලෝකයෙහි, මහණ බමුණන් සහිත ප්‍රජාව අතුරෙහි, දෙව් මිනිසුන් අතුරෙහි තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ මේ සාසනයෙන් ඇසුවක් හෝ හැර යමෙක් මේ ප්‍රශ්න විසඳන්නේ නම් (එබඳුකෙනෙකු) මම නුවණැසින් නොමදකිමි.

**26.** "මහණෙනි, කෙසේ වඩනා ලද මෛත්‍රී සමාධිය කුමක් නිපදවීම කොට ඇත්තේද, කුමක් පරම කොට ඇත්තේද, කුමක් අනුසස් කොට ඇත්තේද, කුමක් අවසානකොට ඇත්තේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විවෙකය ඇසුරුකළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරුකළ නිවනට නැමුණු මෛත්‍රී සහගත සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මෛත්‍රී සහගත ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ නිවනට නැමුණු මෛත්‍රී සහගත විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මෛත්‍රී සහගත පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මෛත්‍රී සහගත පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මෛත්‍රී සහගත සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මෛත්‍රී සහගත උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩයිද,

"ඉදින් හෙතෙම පිළිකුල් නොවූවෙහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේ නම්, එහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරයි. ඉදින් හෙතෙම පිළිකුල් වූවෙහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් සංඥාව නැතිව වාසය කරයි. ඉදින් පිළිකුල් නොවූවෙහිද, පිළිකුල් වූවෙහිද පිළිකුල් හැඟීම ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරයි. ඉදින් පිළිකුල් වූවෙහිද, පිළිකුල් නොවූවෙහිද පිළිකුල් හැඟීම නැතිව වාසය කරයි. ඉදින් පිළිකුල් නොවුවද පිළිකුල් වුවද යන ඒ දෙක දුරුකොට සිහි ඇතිව මනා නුවණැතිව උපෙක්ෂා ඇත්තේව වාසය කරන්නෙමියි කැමැත්තේ නම් එහි සිහි ඇතිව, නො නුවණැතිව උපෙක්ෂා ඇතිව වාසය කරයි. සුභවූ විමොක්ෂයට හෝ පැමිණ වාසය කරයි. මහණෙනි, මම ලොකොත්තර ධර්මය අවබොධ නොකළාවූ මහණහට සුභය කෙළවරකොට ඇති මෛත්‍රී සමාධිය කියමි.

**27.** "මහණෙනි, කෙසේ වඩනා ලද කරුණා සමාධිය කුමක් නිපදවීම කොට ඇත්තේද, කුමක් පරමකොට ඇත්තේද, කුමක් අනුසස් කොට ඇත්තේද, කුමක් කෙළවර ඇත්තේද? මහණෙනි, මෙ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු කරුණා සහගත සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු කරුණා සහගත ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු කරුණා සහගත විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු කරුණා සහගත පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු කරුණා සහගත පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු කරුණා සහගත සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු කරුණා සහගත උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩයිද, ඉදින් හෙතෙම පිළිකුල් නොවූවෙහි පිළිකුල් හැඟීම ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරයි. ඉදින් පිළිකුල් වූවෙහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරන්නෙමියි කැමැත්තේ නම් එහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරයි. ඉදින් පිළිකුල් නොවූවෙහිද පිළිකුල් වූවෙහිද පිළිකුල් හැඟීම ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් හැඟීම ඇතිව වාසය කරයි. ඉදින් පිළිකුල් වූවෙහිද පිළිකුල් නොවූවෙහිද පිළිකුල් නැත්තේය යන හැඟීම ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි නොපිළිකුල් හැඟීම ඇතිව වාසය කරයි ඉදින් පිළිකුල් නොවූවද පිළිකුල් වුවද යන දෙක දුරුකොට සිහි ඇතිව මනා නුවණැතිව උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි සිහි ඇතිව මනා නුවණැතිව උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරයි. සියළු ආකාරයෙන්ම රූප

සංඥාවන්ගේ දුරලීමෙන් හැපීම් සහිත රූප සංඥාවන්ගේ බැහැරලීමෙන් නානත්ත සංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, මම ලොකොත්තර ධර්මය අවබොධ නොකරන්නාවූ මහණහට ආකාසානඤ්චායතනය කෙළවරකොට කරුණා චෙතො විමුක්තිය කියමි.

28. "මහණෙනි, කෙසේ වඩන ලද මුදිතා සමාධිය කුමක් නිපදවීම කොට ඇත්තේද? කුමක් පරම කොට ඇත්තේද? කුමක් අනුසස් කොට ඇත්තේද? කුමක් කෙළවර කොට ඇත්තේද? මහණෙනි, මේ ශාසනයෙහි විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මුදිතා සහගත සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මුදිතා සහගත ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මුදිතා සහගත විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මුදිතා සහගත පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මුදිතා සහගත පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මුදිතා සහගත සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු මුදිතා සහගත උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩයිද,

"ඉදින් හෙතෙම පිළිකුල් නොවූවෙහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරයි. ඉදින් හෙතෙම පිළිකුල්වූවෙහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් සංඥාව නැතිව වාසය කරයි. ඉදින් පිළිකුල් නොවූවෙහිද, පිළිකුල් වූවෙහිද පිළිකුල් හැඟීම ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරයි. ඉදින් පිළිකුල් වූවෙහිද පිළිකුල් නොවූවෙහිද පිළිකුල් හැඟීම නැතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරයි.

"ඉදින් පිළිකුල් නොවූවද, පිළිකුල් වුවද යන දෙක දුරු කොට සිහි ඇතිව මනා නුවණැතිව උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි සිහි ඇතිව මනා නුවණැතිව උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරයි. සියළු ආකාරයෙන්ම ආකාසානඤ්චායතනය දුරුකොට විඥානය අනන්තයයි විඥානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, මම ලොකොත්තර ධර්මය අවබොධ නොකරන්නාවූ මහණහට විඥානඤ්චායතනය කෙළවර කොට ඇති මුදිතා චෙතො විමුක්තිය කියමි.

**29.** "මහණෙනි, කෙසේ වඩනා ලද උපෙක්ෂා චෙතො විමුක්තිය කුමක් නිපදවීම කොට ඇත්තේද? කුමක් පරම කොට ඇත්තේද? කුමක් අනුසස් කොට ඇත්තේද? කුමක් කෙළවර කොට ඇත්තේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, නිවනට නැමුණාවූ උපෙක්ෂා සහගත සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණාවූ උපෙක්ෂා සහගත ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරෝධය ඇසුරුකළ නිවනට නැමුණාවූ උපෙක්ඛා සහගත විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණාවූ උපෙක්ෂා සහගත පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණාවූ උපෙක්ෂා සහගත පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණාවූ උපෙක්ෂා සහගත සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, කෙලෙස් නැතිකිරීම ඇසුරු කළ නිවන් පිණිස නැමුණාවූ උපෙක්ෂා සහගත උපෙක්ෂා සම්බොජ්ඣංගය වඩයිද, ඉදින් හෙතෙම පිළිකුල් නොවූවෙහි පිළිකුල් හැඟීම ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් හැඟීම ඇතිව වාසය කරයි. ඉදින් පිළිකුල් වූවෙහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරයි. ඉදින් පිළිකුල් නොවූවෙහිද පිළිකුල් වූවෙහිද පිළිකුල් හැඟීම ඇතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් හැඟීම ඇතිව වාසය කරයි. ඉදින් පිළිකුල් වූවෙහිද පිළිකුල් නොවූවෙහිද පිළිකුල් හැඟීම නැතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි පිළිකුල් හැඟීම නැතිව වාසය කරයි. ඉදින් පිළිකුල් නොවූවද, පිළිකුල් වුවද යන ඒ දෙක හැර සිහි ඇතිව මනා නුවණැතිව වාසය කරන්නෙමියි කැමැත්තේනම් එහි සිහි ඇතිව මනා නුවණැතිව උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරයි. සියළු ආකාරයෙන් වනාහි විඥානඤ්චායතනය දුරුකොට කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, ලොකොත්තර ධර්මය අවබොධ නොකරන්නාවූ මහණහට උපෙක්ෂා සමාධිය ආකිඤ්චඤ්ඤායතනය කෙළවරකොට ඇතැයි මම කියමියි වදාළේය.

---

## 5. සංගාරව සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

2. එකල්හි වනාහි සංගාරව බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමවා එක්පසක හුන්නේය. එක්පසක හුන්නාවූ සංගාරව බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය. "භවත් ගෞතමය, යම් හෙයකින් ඇතැම් දිනක පළමුව නොහදාරන ලද මන්ත්‍රයෝ බොහෝ වේලාවක් හදාරන ලද්දේ නමුදු නොවැටහෙත්. මෙයට හේතු කවරේද? මෙයට කාරණා කවරේද? භවත් ගෞතමය, යම් හෙයකින් ඇතැම් දිනක පළමුව නොහදාරන ලද මන්ත්‍රයෝ බොහෝ වේලාවක් නොහදාරන ලද්දාහු නමුදු වැටහෙත්. මෙයට හේතු කවරේද? මෙයට ප්‍රත්‍ය කවරේද?"

3. "බ්‍රාහ්මණය, යම් කාලයක කාමරාගයෙන් මඩනා ලද කාමරාගයෙන් යුක්තවූ සිතින් වාසය කරයිද, උපන්නාවූ කාමරාගයාගේ දුරුකිරීම තත්වූ පරිද්දෙන් නොදනීද, එකල්හි තමාගේ අර්ථයද තත්වූ පරිදි නොදනියි. නොදකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි නොදනියි. නොදකියි. එකල්හි උභයාර්ථයම තත්වූ පරිදි නොදනියි. නොදකියි. පළමුව නොහදාරන ලද මන්ත්‍රයෝ බොහෝ වේලාවක් හදාරන ලද්දාහුද නොවැටහෙත්.

'බ්‍රාහ්මණය, යම්සේ වනාහි ලාකඩ පාටින් හෝ කහ පාටින් හෝ නිල් පාටින් හෝ මදටිය පාටින් හෝ මිශ්‍ර කරන ලද දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිසෙක් සිය මුහුණේ සටහන බලන්නේ ඇතිසැටි නොදන්නේය. නොදක්නේය බ්‍රාහ්මණය, එසේම යම් කාලයක කාමරාගයෙන් මඩනා ලද කාමරාගයෙන් යුක්තවූ සිතින් වාසය කෙරේද, උපන්නාවූ කාමරාගයාගේ දුරුකිරීම ඇතිසැටි නොදනියිද එකල්හි තමාගේ අර්ථයද ඇතිසැටි නොදනියි. නොදකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි

නොදනියි. නොදකියි. උභයාර්ථයම එකල්හි තත්වූ පරිදි නොදනියි. නොදකියි. බොහෝ කාලයක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත්. නොහදාරන ලද මන්ත්‍රයන් කියනුම කවරේද?

**4.** "බ්‍රාහ්මණය, නැවතද අනිකක් කියමි. යම් කාලයක ක්‍රොධයෙන් මඩනා ලද, ක්‍රොධ සිතින් වාසය කෙරේද, උපන් ක්‍රොධයාගේ නිවීම තත්වූ පරිදි නොදනියිද, එකල්හි තමාගේ අර්ථයද තත්වූ පරිදි නොදනියි. නොදකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි නොදනියි. නොදකියි. එකල්හි උභයාර්ථයද තත්වූ පරිදි නොදනියි. නොදකියි. බොහෝ කාලයක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත්. නොහදාරන ලද මන්ත්‍රයන් කියනුම කවරේද?

"බ්‍රාහ්මණය, යම්සේ වනාහි ගින්නෙන් උණුවූ කකියන බුබුලු නගින දියබඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් මුවසටහන බලන්නේ ඇතිසැටි නොදන්නේය, නොදක්නේය, බ්‍රාහ්මණය, එසේම යම් කාලයක ක්‍රොධයෙන් මඩනලද ක්‍රොධයෙන් යුත් සිතින් වාසය කරයිද, උපන්නාවූ ක්‍රොධයාගේ නිවීම ඇතිසැටි නොදනීද, නොදකීද, එකල්හි තමාගේ අර්ථයද ඇතිසැටියෙන් නොදනියි. නොදකියි. එකල්හි පරාර්ථයද නොදනී, ඇති සැටි නොදකී, එකල්හි උභයාර්ථයම ඇති සැටි නොදනියි. නොදකියි බොහෝ කාලයක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත්. නොහදාරන ලද මන්ත්‍රයන් කියනුම කවරේද?

**5.** "බ්‍රාහ්මණය, නැවතද අනිකක් කියමි. යම් කාලයක ථීන මිද්ධයෙන් මඩන ලද ථීන මිද්ධයෙන් යුත් සිතින් වාසය කෙරේද, උපන් ථීන මිද්ධයාගේ නිවීම ඇතිසැටි නොදනීද එකල්හි ආත්මාර්ථයද ඇතිසැටි නොදනියි, නොදකියි. එකල්හි පරාර්ථයද ඇතිසැටි නොදනියි නොදකියි. එකල්හි උභයාර්ථයද ඇතිසැටියෙන් නොදනියි. නොදකියි. බොහෝ කාලයක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත්. නොහදාරන ලද මන්ත්‍රයන් කියනුම කවරේද?

"බමුණ, යම්සේ වනාහි දිය සෙවලින් වැසුණාවූ දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් ස්වකීය මුව සටහන බලන්නේ

ඇතිසැටියෙන් නොදන්නේද නොදක්නේද බ්‍රාහ්මණය, එපරිද්දෙන් වනාහි යම් කාලයක ථීන මිද්ධයෙන් මඩනා ලද ථීන මිද්ධයෙන් යුත් සිතින් වාසය කෙරේද, උපන් ථීන මිද්ධයාගේ නිවීම ඇතිසැටි නොදනියිද නොදකියිද, එකල්හි ආත්මාර්ථයද ඇතිසැටියෙන් නොදනියි නොදකියි. එකල්හි පරාර්ථයද ඇතිසැටියෙන් නොදනියි නොදකියි. එකල්හි උභයාර්ථයද ඇතිසැටියෙන් නොදනියි, නොදකියි. බොහෝ කලක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත්. නොහදාළ මන්ත්‍රයන් කියනුම කවරේද?

**6.** "බ්‍රාහ්මණය, නැවතද අනිකක් කියමි. යම් කලක උද්ධච්ච කුක්කුච්චයෙන් මඩනා ලද උද්ධච්ච කුක්කුච්චයෙන් යුත් සිතින් වාසය කෙරේද, උපන් උද්ධච්ච කුක්කුච්චයාගේ නිවීම ඇතිසැටියෙන් නොදනීද එකල්හි ආත්මාර්ථයද තත්වූ පරිදි නොදනියි නොදකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි නොදනියි නොදකියි. එකල්හි උභයාර්ථයද තත්වූ පරිදි නොදනියි නොදකියි. බොහෝ කාලයක් හදාළ මන්ත්‍රයෝද නොවැටහෙත් නොහදාළ මන්ත්‍රයන් කියනුම කිම?

"බමුණ යම්සේ වනාහි වාතයෙන් කැලඹුණු - සැලුණු භ්‍රමණයවුණු රළ ගසන දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් ස්වකීය මුව සටහන බලන්නේ ඇතිසැටි නොදන්නේද නොදක්නේද බමුණ එපරිද්දෙන් යම් කාලයක උද්ධච්ච කුක්කුච්චයෙන් මඩනා ලද උද්ධච්ච කුක්කුච්චයෙන් යුත් සිතින් වාසය කෙරේද, උපන් උද්ධච්ච කුක්කුච්චයාගේ නිවීම තත්වූ පරිදි නොදනියිද නොදකියිද එකල්හි ආත්මාර්ථයද ඇතිසැටියෙන් නොදනියි, නොදකියි. එකල්හි පරාර්ථයද ඇතිසැටියෙන් නොදනියි නොදකියි. එකල්හි උභයාර්ථයද ඇතිසැටියෙන් නොදනියි, නොදකියි. බොහෝ කාලයක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත්. නොහදාරන ලද මන්ත්‍රයන් කියනුම කිම.?

**7.** "බමුණ, නැවතද අනිකක් කියමි. යම් කාලයක විචිකිච්ඡාවෙන් මඩනා ලද විචිකිච්ඡාවෙන් යුත් සිතින් වාසය

කෙරේද, උපන් විචිකිච්ඡාවගේ නිවීම ඇතිසැටි නොදනීද එකල්හි ආත්මාර්ථයද නොදනියි නොදකියි. එකල්හි පරාර්ථයද නොදනියි, නොදකියි. එකල්හි උභයාර්ථයද නොදනියි නොදකියි. බොහෝ කාලයක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත් නොහදාළ මන්ත්‍ර ගැන කියනුම කවරේද?

"බ්‍රහ්මණය, යම්සේ නොපැහැදුනු කැළඹුනු මඩවූ අඳුරු තැනක තබන ලද දිය බඳුනක් වේද එහි ඇස් ඇති මිනිහෙක් ස්වකීය මුහුණ බලන්නේ ඇතිසැටි නොදන්නේද නොදක්නේද, බමුණ එපරිද්දෙන් විචිකිච්ඡාවෙන් මඩනාලද විචිකිච්ඡාවෙන් යුත් සිතින් වාසය කෙරේද, එකල්හි ආත්මාර්ථයද ඇතිසැටි නොදනියි. නොදකියි. එකල්හි පරාර්ථයද ඇතිසැටි නොදනියි. නොදකියි. එකල්හි උභයාර්ථයද ඇතිසැටි නොදනියි නොදකියි. බොහෝ කාලයක් හදාරන ලද මන්ත්‍රයෝද නොවැටහෙත්. නොහදාළ මන්ත්‍ර ගැන කියනුම කිම?

"බ්‍රාහ්මණය, යමක් හෙතුකොට ගෙන නොහදාළ මන්ත්‍ර පමණක් නොව බොහෝ කලක් හදාරන ලද මන්ත්‍ර පවා නොවැටහෙයි නම් මේ එයට හෙතුවයි, මේ එයට ප්‍රත්‍යයයි.

8. "බ්‍රාහ්මණය, යම් කාලයක වනාහි කාමරාගයෙන් නොමඩනා ලද කාමරාගයෙන් යුක්ත නොවූ සිතින් වාසය කරයිද, උපන් කාමරාගයාගේ නිවීමද ඇතිසැටියෙන් දනීද එකල්හි ආත්මාර්ථයද තත්වූ පරිදි දනියි. දකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි දනියි. දකියි. එසමයෙහි උභයාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාරන ලද මන්ත්‍ර කියනුම කවරේද?

"බ්‍රාහ්මණය, යම්සේ වනාහි ලාකඩ පාටින් හෝ කහ පාටින් හෝ නිල් පාටින් හෝ මදටිය පාටින් හෝ මිශ්‍ර නොකරන ලද දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් තමාගේ මුව සටහන බලන්නේ ඇතිසැටියෙන් දන්නේය, දක්නේය. බමුණ, එපරිද්දෙන් යම් කාලයක කාමරාගයෙන් නොමඩනා ලද කාමරාගයෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද උපන් කාමරාගයාගේ නිවීම ඇතිසැටියෙන් දනියි. එකල්හි

ආත්මාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. එසමයෙහි උභයාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාරන ලද මන්ත්‍ර කියනුම කවරේද?

**9.** "බ්‍රාහ්මණය, නැවතද අනිකක් කියමි. යම් කාලයක ක්‍රොධයෙන් නොමඩනා ලද ක්‍රොධයෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් ක්‍රොධයාගේ නිවීම ඇතිසැටියෙන් දනියිද, එකල්හි ආත්මාර්ථයද ඇතිසැටියෙන් දනියි දකියි. එකල්හි පරාර්ථයද ඇතිසැටියෙන් දනියි, දකියි. එකල්හි උභයාර්ථයද ඇතිසැටියෙන් දනියි, දකියි. බොහෝ කලක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාරන ලද මන්ත්‍ර කියනුම කිම? බ්‍රාහ්මණය, යම්සේ ගින්නෙන් රත්නොවූ කැකෑරීමක් නැති උණුසුම් නොවූ දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් තමාගේ මුව සටහන බලන්නේ ඇතිසැටියෙන් දන්නේය. දක්නේය. බමුණ, එපරිද්දෙන් යම්කාලයක කාමරාගයෙන් නොමඩනා ලද කාමරාගයෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් කාමරාගයාගේ නිවීම ඇතිසැටියෙන් දනියි. එකල්හි ආත්මාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. එසමයෙහි උභයාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාරන ලද මන්ත්‍ර කියනුම කවරේද?

**10.** "බ්‍රාහ්මණය, නැවතද අනිකක් කියමි. යම් කාලයක ථීන මිද්ධයෙන් නොමඩනා ලද ථීන මිද්ධයෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් ථීන මිද්ධයාගේ නිවීම ඇතිසැටියෙන් දනියිද, එකල්හි ආත්මාර්ථයද ඇතිසැටියෙන් දනියි, දකියි. එකල්හි පරාර්ථයද ඇතිසැටියෙන් දනියි, දකියි, එකල්හි උභයාර්ථයද ඇතිසැටියෙන් දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. නොහදාළ මන්ත්‍ර ගැන කියනුම කිම?

"බ්‍රාහ්මණය, යම්සේ වනාහි දිය සෙවලින් නොවැසුණු දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් තමාගේ මුව සටහන

බලන්නේ ඇතිසැටියෙන් දන්නේය, දක්නේය. බමුණ, එපරිද්දෙන් යම් කාලයක ථීන මිද්ධයෙන් නොමඩනා ලද ථීන මිද්ධයෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් ථීන මිද්ධයාගේ නිවීම ඇතිසැටියෙන් දනියි. එකල්හි ආත්මාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි එසමයෙහි උභයාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාරන ලද මන්ත්‍ර කියනුම කවරේද?

11. "බ්‍රාහ්මණය, නැවතද අනිකක් කියමි. යම් කාලයක උද්ධච්ච කුක්කුච්චයෙන් නොමඩනා ලද සිතින් උද්ධච්ච කුක්කුච්චයෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් උද්ධච්ච කුක්කුච්චයාගේ නිවීම තත්වූ පරිදි දනියිද, එකල්හි ආත්මාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. එකල්හි පරාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. එකල්හි උභයාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාළ මන්ත්‍ර ගැන කියනුම කිම?

"බ්‍රාහ්මණය, යම්සේ වනාහි වාතයෙන් කම්පා නොවූ නොසැලුණු භ්‍රමණය නොවූ රළ හටනොගන්නාවූ දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් තමාගේ මුව සටහන බලන්නේ ඇතිසැටියෙන් දන්නේය, දක්නේය. බමුණ, එපරිද්දෙන් යම් කාලයක උද්ධච්ච කුක්කුච්චයෙන් නොමඩනා ලද උද්ධච්ච කුක්කුච්චයෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් උද්ධච්ච කුක්කුච්චයාගේ නිවීම ඇති සැටියෙන් දනියි. එකල්හි ආත්මාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි, එකල්හි පරාර්ථයද තත්වූ පරිදි දනියි. දකියි. එසමයෙහි උභයාර්ථයද තත්වූ පරිදි දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාරන ලද මන්ත්‍ර කියනුම කවරේද?

12. "බ්‍රාහ්මණය, නැවතද අනිකක් කියමි. විචිකිච්ඡාවෙන් නොමඩනා ලද විචිකිච්ඡාවෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් විචිකිච්ඡාවෙන් නිවීම ඇතිසැටියෙන් දනීද, එකල්හි ආත්මාර්ථයද ඇතිසැටියෙන් දනියි. දකියි. එකල්හි

පරාර්ථයද ඇතිසැටියෙන් දනියි, දකියි. එකල්හි උභයාර්ථයද ඇතිසැටියෙන් දනියි, දකියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. හදාරන ලද මන්ත්‍ර කියනුම කිම? බ්‍රාහ්මණය, යම්සේ වනාහි පිරිසිදුවූ නිර්මලවූ නොකැළඹුනාවූ එලිමහනක තබනලද දිය බඳුනක් වේද, එහි ඇස් ඇති මිනිහෙක් සිය මුව සටහන බලන්නේ ඇතිසැටියෙන් දන්නේද දක්නේද, බ්‍රාහ්මණය, එපරිද්දෙන් වනාහි යම්කලක විචිකිච්ඡාවෙන් නොමඩනා ලද විචිකිච්ඡාවෙන් යුක්ත නොවූ සිතින් වාසය කෙරේද, උපන් විචිකිච්ඡාවගේ නිවීම ඇතිසැටියෙන් දනියිද, එකල්හි ආත්මාර්ථයද ඇතිසැටියෙන් දනියි. එකල්හි පරාර්ථයද ඇතිසැටියෙන් දනියි. එකල්හි උභයාර්ථයද ඇතිසැටියෙන් දනියි. බොහෝ කාලයක් නොහදාරන ලද මන්ත්‍රයෝද වැටහෙත්. යම්හෙයකින් ඇතැම් කාලයක පළමුව හදාරන ලද මන්ත්‍රයෝ බොහෝ කාලයක් නොහදාරන ලද්දාහුද වැටහෙත්. බ්‍රාහ්මණය මේ (එයට) හේතුවයි. මේ (එයට) ප්‍රත්‍යයි.

13. "බ්‍රාහ්මණය, කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත කිලුටුනොකරන්නාවූ මේ බොධ්‍යාංගයෝ සත්දෙන වඩන ලද්දාහු බහුල වශයෙන් නැවත නැවත පුරුදු කරන ලද්දාහු අර්හත් මාර්ග ඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. ඒ සත කවරේදයත්.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත කිලුටු නොකරන්නාවූ සති සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂකිරීම පිණිස පවතිත්.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත කිලුටු නොකරන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත

කිලුටු නොකරන්නාවූ විරිය සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත කිලුටු නොකරන්නාවූ පීති සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදුකරන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත කිලුටු නොකරන්නාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ නැවත නැවත පුරුදුකරන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත කිලුටු නොකරන්නාවූ සමාධි සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ නැවත නැවත වඩන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතියි.

"බ්‍රාහ්මණය, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ කුසල් ආවරණය නොකරන්නාවූ නොවසන්නාවූ සිත කිලුටු නොකරන්නාවූ මේ සප්ත බොජ්ඣංගයෝ අර්හත් මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, ලබාගැනීම පිණිස පවතිත්" යනුයි.

**14.** මෙසේ වදාළ කල්හි සංගාරව බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරුකරන ලද්දක් උඩුකුරු හෝ කෙරේද, සැඟවූවක් විවෘත හෝ කෙරේද, මංමුළාවූවෙකුට මාර්ගය හෝ කියයිද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි, අන්ධකාරයෙහි තෙල් පහනක් හෝ දරාද, එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් දේශනා

කරන ලදී. ස්වාමීනි, ඒ මම අද පටන් දිවි හිමියෙන් භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණයමි. භවත් ගෞතමයන් වහන්සේ දිවිහිමිකොට සරණගිය උපාසකයෙකු කොට මා දරණ සේක්වා.”

---

## 6. අභය කුමාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩවාසය කරන සේක. ඉක්බිති අභයරාජ කුමාරයා භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ අභයරාජ කුමාරයා භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. “ස්වාමීනි, පූරණ කාශ්‍යප තෙමේ මෙසේ කීයේය.

“නොදැනීමට නොදැක්මට හේතුවක් නැත. කාරණයක් නැත. හේතුවක් නැතිව කාරණයක් නැතිව නොදැනීම නො දැක්ම වෙයි. නුවණින් දැකීමටද හේතුවක් නැත. කාරණයක් නැත. හේතුවක් නැතිව කාරණයක් නැතිව නුවණින් දැකීම වෙයි.’ භාග්‍යවතුන් වහන්සේ මෙහිලා කුමක් වදාරණ සේක්ද?” යනුයි.

2. “රාජකුමාරය, නොදැනීමට නොදැකීමටද හේතුවක් ඇත, කාරණයක් ඇත. හේතු සහිතව කාරණ සහිතව නොදැනීම නොදැකීම වෙයි. රාජ කුමාරය, නුවණින් දැකීමටද හේතුවක් ඇත. කාරණයක් ඇත. හේතු සහිතව කාරණ සහිතව නුවණින් දැකීම වෙයි” යනුයි.

3. “ස්වාමීනි, නොදැනීමට නොදැකීමට හේතු කවරේද? කරුණු කවරේද? කෙසේ හේතු සහිතව කරුණු සහිතව නොදැනීම නොදැකීම වෙයිද?”

“රාජ කුමාරය, යම් කාලයෙක කාමරාගයෙන් වඩනා ලද කාම රාගයෙන් යුත් සිතින් වාසය කෙරේද. උපන් කාමරාගයාගේ නිවීම ඇති සැටියෙන් නොදනියිද, නොදකියිද,

"රාජ කුමාරය, නොදැනීමට නොදැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නොදැනීම නොදැකීම වෙයි.

**4.** "රාජකුමාරය, නැවත අනිකක්ද කියමි. යම් කාලයක ක්‍රෝධයෙන් වඩනාලද ක්‍රෝධයෙන් යුත් සිතින් වාසය කෙරේද, උපන් ක්‍රෝධයාගේ නිවීම ඇති සැටියෙන් නොදනීද, නොදකීද, රාජ කුමාරය, නොදැනීමට නොදැකීමට මෙයද හේතුවකි, මෙයද කාරණයකි. මෙසේද හේතු සහිතව කරුණු සහිතව නොදැනීම නොදැකීම වෙයි.

**5.** "රාජ කුමාරය, නැවත අනිකක්ද කියමි. යම් කාලයක ථිනමිද්ධයෝ මඩනා ලද ථීන මිද්ධයෙන් යුත් සිතින් වාසය කෙරෙයිද, උපන් ථිනමිද්ධයාගේ නිවීම ඇති සැටියෙන් නොදනියිද නොදකියිද, රාජකුමාරය, නොදැනීමට නොදැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නොදැනීම නොදැකීම වෙයි.

**6.** "රාජකුමාරය, නැවත අනිකක්ද කියමි. යම්කාලයක උද්ධච්චකුක්කුච්චයෙන් මඩනා ලද උද්ධච්චකුක්කුච්චයෙන් යුත් සිතින් වාසය කෙරේද, උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නිවීම ඇති සැටියෙන් නොදනියි, නොදකීද, රාජකුමාරය, නොදැනීමට නොදැකීමට මෙයද හේතුවකි මෙසේ හේතු සහිතව කරුණු සහිතව නොදැනීම නොදැකීම වෙයි.

**7.** "රාජකුමාරය, නැවතද අනිකක්ද කියමි. යම්කාලයක විචිකිච්ඡාවෙන් මඩනා ලද, විචිකිච්ඡාවෙන් යුත් සිතින් වාසය කෙරේද, උපන් විචිකිච්ඡාවගේ නිවීම ඇති සැටියෙන් නොදනීද, නොදකියිද, රාජ කුමාරය, නොදැනීමට නොදැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නොදැනීම නොදැකීම වෙයි."

**8.** "ස්වාමීනි, මේ කිනම් ධර්ම ක්‍රමයක් වේද?"

"රාජකුමාරය, මොව්හු නීවරණයෝ නම් වෙත්."

"භාග්‍යවතුන් වහන්ස, ඒකාන්තයෙන්ම නීවරණයෝ වෙත්. සුගතයන් වහන්ස, ඒකාන්තයෙන්ම නීවරණයෝ වෙත්. ස්වාමීනි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එක එක නීවරණයෙකින් මඩනා ලද්දේ නමුදු ඇති සැටි නොදනියි. නොදකියි. නීවරණ පසෙන්ම මඩනා කල්හි කියනුම කවරේද?”

9. ස්වාමීනි, නුවණින් දැකීමට හේතු කවරේද, කරුණු කවරේද? කෙසේ හේතු සහිතව ප්‍රත්‍ය සහිතව නුවණින් දැකීම වේද?”

10. “රාජකුමාරය, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණාවූ සති සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම සති සම්බොජ්ඣංගය වඩනා ලද සිතින් ඇති සැටියෙන් දනියි. දකියි. රාජකුමාරය, නුවණින් දැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නුවණින් දැකීම වෙයි.”

11. “රාජකුමාරය, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ නිවනට නැමුණාවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම ධම්මවිචය සම්බොජ්ඣංගය වඩන ලද සිතින් ඇති සැටියෙන් දනියි දකියි. රාජකුමාරය, නුවණින් දැනීමට දැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නුවණින් දැකීම වෙයි.”

12. “රාජකුමාරය, මේ ශාසනයෙහි මහණෙතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ නිවනට නැමුණාවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම විරිය සම්බොජ්ඣංගය වඩනා ලද සිතින් ඇති සැටියෙන් දනියි. දකියි. රාජ කුමාරය, නුවණින් දැකීමට මෙයද හේතුවකි, මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නුවණින් දැකීම වෙයි.”

13. “රාජකුමාරය, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම පීති

සම්බොජ්ඣංගය වඩනා ලද සිතින් ඇති සැටියෙන් දනියි. දකියි. රාජකුමාරය, නුවණින් දැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නුවණින් දැකීම වෙයි."

**14.** "රාජකුමාරය, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම පස්සද්ධි සම්බොජ්ඣංගය වඩනා ලද සිතින් ඇති සැටියෙන් දනියි. දකියි. රාජකුමාරය, නුවණින් දැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නුවණින් දැකීම වෙයි."

**15.** "රාජකුමාරය, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණාවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම සමාධි සම්බොජ්ඣංගය වඩනා ලද සිතින් ඇති සැටියෙන් දනියි. දකියි. රාජකුමාරය, නුවණින් දැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නුවණින් දැකීම වෙයි."

**16.** "රාජකුමාරය, නැවත අනිකක්ද කියමි. විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, හෙතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩනා ලද සිතින් ඇති සැටි දනියි. දකියි. රාජකුමාරය, නුවණින් දැකීමට මෙයද හේතුවකි. මෙයද කාරණයකි. මෙසේ හේතු සහිතව කරුණු සහිතව නුවණින් දැකීම වෙයි."

**17.** "ස්වාමීනි, මේ කිනම් ධර්ම ක්‍රමයක්ද?"

"රාජකුමාරය, මොවුහු බොජ්ඣංගයෝ නම් වෙත්"

"භාග්‍යවතුන් වහන්ස, ඒකාන්තයෙන්ම බොජ්ඣංගයෝය. සුගතයන් වහන්ස, ඒකාන්තයෙන්ම බොජ්ඣංගයෝය. ස්වාමීනි එක් එක් බොජ්ඣංගයකින් යුක්තවූයේ නමුදු ඇති සැටි දනියි.

දකියි. බොජ්ඣංගයන් සත්දෙනාගෙන් යුක්තවූයේ නම් කියනුම කවරේද? ස්වාමීනි, ගිජ්ඣකූට පර්වතයට නගින්නාවූ මට ශරීරයේ යම් වෙහෙසක් වීද, සිතේ යම් වෙහෙසක් වීද, මගේ ඒ වෙහෙසද සන්සිඳුනේය. මට ධර්මයද අවබොධ වූයේයයි" කීය.

(සවෙනි බොජ්ඣංග වර්ගය නිමි.)

---

# 7. ආනාපාන වර්ගය.

## 1. අට්ඨික සඤ්ඤා සූත්‍රය.

1. (මේ සූත්‍ර සියල්ලේම 1 වෙනි ඡෙද බොජ්ඣංග වර්ගයේ 1 සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ අට්ඨික සඤ්ඤාව (ඇටය යන හැඟීම) මහත් ඵල ඇත්තී වෙයි. මහත් අනුසස් ඇත්තීවෙයි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨික සඤ්ඤාව මහත්ඵල ඇත්තී වෙයිද, මහත් අනුසස් ඇත්තී වෙයිද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුක්තවූ සති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුක්තවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුක්තවූ විරිය සම්බොජ්ඣංගය වටයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුක්තවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුක්තවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුක්තවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුක්තවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාව මහත්ඵල ඇත්තී වෙයි. මහත් අනුසස් ඇත්තීවෙයි.

**4.** "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාවෙන් ඵල දෙකක් අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවිය යුතුය. මේ ආත්මභවයේදීම රහත්බව හෝ පංචස්කන්ධය ඉතිරිව ඇතිකල්හි අනාගාමි බව හෝ වෙයි. මහණෙනි, අට්ඨිකසඤ්ඤාව කෙසේ වැඩීමෙන් කෙසේ බහුල කිරීමෙන් මේ ආත්ම භාවයෙහි රහත්බව හෝ පඤ්චස්කන්ධය ඉතිරිව ඇතිකල්හි අනාගාමි බව හෝ යන ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවිය යුතුද?

**6.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් සති සම්බොජ්ඣංගය වඩයිද,

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් ධර්ම විචය සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අඨිකසඤ්ඤාවෙන් යුත් පීති සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළ විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ වඩනා ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාවෙන් මේ ආත්මභාවයෙහිදීම රහත් බව පඤ්චස්කන්ධය ඉතිරිව ඇති කල්හි අනාගාමි බව හෝ යන ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුය.

7. "මහණෙනි, වඩන ලද්දාවූ බහුලකරන ලද්දාවූ අට්ඨික සඤ්ඤාව මහත්වූ අර්ථය පිණිස පවතිත්. මහණෙනි, කෙසේ වඩනලද්දාවූ කෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාව මහත්වූ අර්ථය පිණිස පවතියිද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් ධර්ම විචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාව මහත්වූ අර්ථය පිණිස පවතියි'

8. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ අඨික සඤ්ඤාව මහත්වූ සතරයොගයන්ගෙන් මිදීම පිණිස පවතියි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාව මහත්වූ සතරයොගයන්ගෙන් මිදීම පිණිස පවතියිද?

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙමේ විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට

නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් ධර්ම විචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අඨික සඤ්ඤාවෙන් යුත් උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ කරන ලද අට්ඨික සඤ්ඤාව මහත්වූ සතර යෝගයන් ගෙන් මිදීම පිණිස පවතියි" යනුයි.

**9.** "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරණ ලද්දාවූ අට්ඨික සඤ්ඤාව මහත්වූ සංවේගය පිණිස පවතියි. මහණෙනි, කෙසේ වඩනා ලද කෙසේ බහුල වශයෙන් කරන ලද අට්ඨික සඤ්ඤාව මහත්වූ සංවේගය පිණිස පවතියිද?

"මහණෙනි මේ සස්නෙහි මහණතෙම විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් ධර්ම විචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ වඩනා ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාව මහත්වූ සංවේගය පිණිස පවතියි.

**10.** "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාව මහත්වූ පහසු විහරණය පිණිස පවතියි. මහණෙනි, කෙසේ වඩන ලද, කෙසේ බහුල කරන ලද අට්ඨික සඤ්ඤාව මහත්වූ පහසු විහරණය පිණිස පවතියිද?

"මහණෙනි මේ සස්නෙහි මහණතෙමේ විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් ධර්ම විචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨිකසඤ්ඤාවෙන් යුත් පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණාවූ අට්ඨික සඤ්ඤාවෙන් යුත් උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ අට්ඨිකසඤ්ඤාව මහත්වූ පහසු විහරණය පිණිස පවතියි."

---

## 2. පුළවක සඤ්ඤා සූත්‍රය.

මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ අට්ඨික සංඥාව වෙනුවට පුළවක සඤ්ඤාව (පණුවන් පිරුණාවූ මළසිරුර යන හැඟීම) යෙදිය යුතුයි.

---

## 3. විනීලක සඤ්ඤා සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) විනීලක සඤ්ඤාව (වෙනස්වූ වර්ණ ඇති මළ සිරුර යන හැඟීම) යෙදිය යුතුයි.

---

## 4. විච්ඡිද්දක සඤ්ඤා සූත්‍රය.

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) විච්ඡිද්දක සඤ්ඤාව (දෙකඩකොට වෙන්කරන ලද මළසිරුරය යන හැඟීම) යෙදිය යුතුය.

---

## 5. උද්ධුමාතක සඤ්ඤා සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට 'උද්ධුමාතක සඤ්ඤාව' (ඉදිමුනු මළසිරුර යන හැඟීම) යෙදිය යුතුයි.

---

## 6. මෙත්තා මහානිසංස සූත්‍රය.

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) 'මෛත්‍රිය' යෙදිය යුතුයි.

---

## 7. කරුණා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) 'කරුණාව' යෙදිය යුතුය.

---

## 8. මුදිතා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) 'මුදිතාව' (සුඛිත සත්වයන් දැක සතුටුවීම) යෙදිය යුතුයි.

---

## 9. උපෙක්ඛා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) 'උපෙක්ඛා' (සියළු සත්වයන් කෙරෙහි මැදහත් බව) යෙදිය යුතුයි.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

### 10. ආනාපාන සති මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව වෙනුවට) 'ආනාපාන සතිය' (ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ සිහිය) යෙදිය යුතුයි.

---

## 8. නිරොධ වර්ගය.

### 1. අසුභ සඤ්ඤා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට 'අසුභ සඤ්ඤාව' යෙදිය යුතුයි.)

---

### 2. මරණ සඤ්ඤා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට 'මරණ සඤ්ඤාව' යෙදිය යුතුයි.)

---

### 3. පටික්කූල සඤ්ඤා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට 'ආහාරයෙහි පිළිකුල් සඤ්ඤාව' යෙදිය යුතුයි.)

---

### 4. අනභිරත සඤ්ඤා මහානිසංස සූත්‍රය.

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට සියළු ලොකයෙහි 'නොඇලෙන සඤ්ඤාව' යෙදිය යුතුයි.)

---

### 5. අනිච්ච සඤ්ඤා මහානිසංස සූත්‍රය.

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට සියල්ල 'අනිත්‍යය යන සඤ්ඤාව' යෙදිය යුතුයි)

---

## 6. දුක්ඛසඤ්ඤා මහානිසංස සූත්‍රය.

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට 'අනිත්‍යයෙහි දුක යන හැඟීම' යෙදිය යුතුයි.)

---

## 7. අනත්ත සඤ්ඤා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) දුකෙහි අනාත්මය යන හැඟීම යෙදිය යුතුයි.

---

## 8. පහාන සඤ්ඤා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) කෙලෙස් දුරුකිරීමේ හැඟීම යෙදිය යුතුයි.)

---

## 9. විරාග සඤ්ඤා මහානිසංස සූත්‍රය

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 'අට්ඨික සඤ්ඤාව' වෙනුවට) නොඇලීමේ හැඟීම යෙදිය යුතුයි.

---

## 10. නිරොධ සඤ්ඤා මහානිසංස සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් කරන ලද්දාවූ නිරොධ සඤ්ඤාව මහත් ඵල ඇත්තී වෙයි. මහත් අනුසස් ඇත්තී වෙයි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල කරන ලද්දාවූ නිරොධ සඤ්ඤාව මහත්ඵල ඇත්තී වෙයිද, මහත් අනුසස් ඇත්තී වෙයිද?

3. "මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ සති සම්බොජ්ඣංගය වඩයිද

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ නිරොධ සඤ්ඤාව මහත් ඵල ඇත්තීවෙයි. මහත් අනුසස් ඇත්තී" වෙයි.

"මහණෙනි, නිරොධ සඤ්ඤාව වැඩීමෙන් බහුල කිරීමෙන් ඵල දෙකක් අතරෙන් එක් ඵලයක් කැමතිවිය යුතුයි. මේ ආත්මභාවයෙහිදීම රහත්වීම හෝ පඤ්චස්කන්ධය ඉතිරිව ඇතිකල්හි අනාගාමි බව හෝ යන දෙකයි.

4. "මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුලකරන ලද්දාවූ නිරොධ සඤ්ඤාවෙන් මේ ආත්මභාවයෙහිදීම රහත්වීම හෝ පඤ්චස්කන්ධය ඉතිරිව ඇතිකල්හි අනාගාමිබව හෝ යන දෙකින් එකක් කැමතිවිය යුතුයි. මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ සතිසම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු නිරොධ සඤ්ඤාවෙන් යුක්තවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ නිරොධ සඤ්ඤාවෙන් මේ ආත්මභාවයෙහිදීම රහත්වීම හෝ පංචස්කන්ධය ඉතිරිව ඇතිකල්හි අනාගාමි බව හෝ යන ඵල දෙකින් එක්තරා ඵලයක් කැමතිවිය යුතුය.

"මහණෙනි, වඩනා ලද්දාවූ බහුල කරන ලද්දාවූ නිරොධ සඤ්ඤාව මහත්වූ අර්ථය පිණිස පවතියි. මහත්වූ යොගයන්ගේ ක්ෂය කිරීමයයි කියන ලද නිවන් පිණිස පවතියි. මහත්වූ සංවේගය පිණිස පවතියි. මහත්වූ පහසු විහරණය පිණිස පවතියි. කෙසේ වඩනා ලද කෙසේ බහුල කරන ලද නිරොධ සඤ්ඤාව මහත්වූ අර්ථය පිණිස පවතීද, මහත්වූ යොගයන්ගේ ක්ෂය කිරීම පිණිස පවතීද, මහත්වූ සංවේගය පිණිස පවතීද, මහත්වූ පහසු විහරණය පිණිස පවතීද?

"මහණෙනි, මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ නිරොධ සඤ්ඤාවෙන් යුත් සති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ නිරොධ සඤ්ඤාවෙන් යුත් ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ නිරොධ සඤ්ඤාවෙන් යුත් විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ නිරොධ සඤ්ඤාවෙන් යුත් පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ නිරොධ සඤ්ඤාවෙන් යුත් පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවෙකය ඇසුරු කළ, විරාගය අසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ නිරොධ සඤ්ඤාවෙන් යුත් සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"මේ සස්නෙහි මහණතෙම විවෙකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරු කළ, නිවන් පිණිස නැමුණාවූ නිරොධ සඤ්ඤාවෙන් යුත් උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද මහණෙනි, මෙසේ වඩනා ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ නිරොධ සඤ්ඤාව මහත්වූ අර්ථය පිණිස පවතියි. මහත්වූ යොගයන්ගේ ක්ෂය කිරීමයයි කියන ලද නිවන් පිණිස පවතියි. මහත්වූ සංවේගය පිණිස පවතියි. මහත්වූ පහසු විහරණය පිණිස පවතියි"

**නිරොධ වර්ගය නිමි.**

---

මග්ග සංයුත්තයේ තිබෙන මෙහි පහත දක්වන වර්ගයන්හි ඇති ආර්ය අෂ්ටාංගික මාර්ගය වෙනුවට සත්තබොජ්ඣංගය යොදා විස්තර කළයුතුයි.

## 9. ගංගාපෙය්‍යාල වර්ගය (2)

මග්ගසංයුත්තයේ ගංගාපෙය්‍යාල වර්ගයේ මෙන් මෙහි සූත්‍ර දොළසක් වෙත්.

---

## 10. අප්පමාද වර්ගය (2)

මග්ගසංයුත්තයේ අප්පමාදවර්ගයේ මෙන් මෙහි සූත්‍ර දහයක් වෙත්.

---

## 11. බලකරණීය වර්ගය (2)

මග්ගසංයුත්තයේ බලකරණීය වර්ගයේ මෙන් මෙහි සූත්‍ර දොළසකි.

---

## 12. එසනා වර්ගය (2)

මග්ගසංයුත්තයේ මෙන් මෙහි සූත්‍ර දොළොසකි. බොජ්ඣංග සංයුත්තයාගේ එසනා පෙය්‍යාලය විවෙකනිශ්‍රිත වශයෙන් විස්තර කටයුතුය.

---

## 13. ඔඝ වර්ගය (2)

මග්ගසංයුත්තයේ මෙන් මෙහි සූත්‍ර දොළොසකි.

---

## 14. ගංගා පෙය්‍යාල වර්ගය (3)

මග්ගසංයුත්තයේ තිබෙන පහත දැක්වෙන වර්ගයන්හි ඇති සූත්‍රයෙහි 18 වෙනි වර්ගයේ ඇති දහවෙනි සූත්‍රය මෙන් යොදාගත යුතුයි.

මග්ගසංයුත්තයේ මෙන් මෙහි සූත්‍රදොළොසක් වෙති. බොජ්ඣංග සංයුත්තයේ ගංගාපෙය්‍යාලය රාග විනය වසයෙන් විස්තර කටයුතුයි.

---

## 15. අප්පමාද වර්ගය (3)

මග්ගසංයුත්තයේ මෙන් සූත්‍ර දහයකි.

බොජ්ඣංග සංයුත්තයේ අප්‍රමාද වර්ගය රාග විනය වශයෙන් විස්තර කටයුතුයි.

---

## 16. බලකරණීය වර්ගය (3)

බොජ්ඣංගසංයුත්තයේ බලකරණීය වර්ගය රාග විනය වශයෙන් විස්තර කටයුතුයි. මග්ගසංයුත්තයේ මෙන් මෙහි සූත්‍ර දොළොසක් වෙති.

---

## 17. ඒසනා වර්ගය (3)

මග්ගසංයුත්තයේ මෙහි සූත්‍ර දහයකි. බොජ්ඣංග සංයුත්තයේ එසනා වර්ගය රාග විනය වශයෙන් විස්තර කටයුතුයි.

---

## 18. ඕඝ වර්ගය (3)

මග්ගසංයුත්තයේ මෙන් මෙහි සූත්‍ර දහයක් වෙත්.

"මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජනයෝ පස්දෙනෙකි. ඒ පස කවරේදයත්. රූප රාගය අරූප රාගය මානය, උද්ධච්චය, අවිජ්ජාව, යන මොහුයි. මහණෙනි, මේ පස උද්ධම්භාගීය සංයොජනයෝ වෙත්. මහණෙනි, මේ පස්වැදෑරුම් උද්ධම්භාගීය සංයෝජනයන්ගේ දැනගැනීම පිණිස, විසෙසින් දැනීම පිණිස, නැති කිරීම පිණිස, සප්ත බොධ්‍යංගයෝ වැඩිය යුත්තාහ.

3. ඒ සත කවරහුදයත්. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රාගය දුරුකිරීම කෙළවර කොට ඇති, ද්වෙෂය දුරුකිරීම කෙළවරකොට ඇති මොහය දුරුකිරීම කෙළවර කොට ඇති, නිවන ඇතුළත් කොට ඇති නින පිහිටකොට ඇති නිවන කෙළවරකොට ඇති නිවනට නැමුනු නිවනට අවනත, නිවණට බරවූ සති සම්බොජ්ඣංගය වඩයිද,

"රාගය දුරුකිරීම කෙළවර කොට ඇති, ද්වෙෂය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, නිවන ඇතුළත්කොට ඇති, නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, නිවනට නැමුනු, නිවනට අවනත, නිවණට බරවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, ද්වෙෂය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති,

නිවන ඇතුළත්කොට ඇති, නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, නිවනට නැමුනු, නිවනට අවනත, නිවනට බරවූ විරිය සම්බොජ්ඣංගය වඩයිද,

"රාගය දුරුකිරීම කෙළවරකොට ඇති, මොහය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, නිවන ඇතුළත්කොට ඇති, නිවන පිහිටකොට ඇති, නිවනට නැමුනු නිවනට අවනත, නිවනට බරවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"රාගය දුරුකිරීම කෙළවර කොට ඇති ද්වෙෂය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති නිවන ඇතුළත්කොට ඇති, නිවන පිහිටකොට ඇති නිවන කෙළවරකොට ඇති, නිවනට නැමුනු නිවනට අවනත, නිවනට බරවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"රාගය දුරුකිරීම කෙළවර කොට ඇති, ද්වෙෂය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති නිවන ඇතුළත්කොට ඇති, නිවන පිහිටකොට ඇති, නිවනට නැමුනු, නිවනට අවනත, නිවනට බරවූ සමාධි සම්බොජ්ඣංග වඩයිද

"රාගය දුරුකිරීම, කෙළවරකොට ඇති, ද්වෙෂය දුරු කිරීම කෙළවරකොට ඇති, මොහය දුරුකිරීම කෙළවරකොට ඇති, නිවන ඇතුළත්කොට ඇති නිවන පිහිටකොට ඇති, නිවන කෙළවරකොට ඇති, නිවනට නැමුනු, නිවනට අවනත, නිවනට බරවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මේ පස් වැදෑරුම් උද්ධම්භාගිය සංයෝජනයන්ගේ අවබොධය පිණිස, වෙහෙසින් දැනගැනීම පිණිස, නැතිකිරීම පිණිස, දුරුකිරීම පිණිස, මේ සප්තබොධ්‍යංගයෝ වැඩිය යුත්තාහ'යි

**(බොජ්ඣංග සංයුත්තය නිමි.)**